

**සියලු අමාත්‍යාංශ තොරතුරු සඳහා**

පිටු 10-11


# සිළුමිණ

சிழுமின The Silumina

■ ආරම්භය - 1930 මාර්තු 30 ■ ප්‍රවෘත්ති පත්‍රයක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී ■ 91 වැනි කාණ්ඩය 34 වැනි පත්‍රය ★

■ ශ්‍රී බුධ වර්ෂ 2564ක් වූ සිංහ රවි 07 භාග බිනර පුර විසේනිය ඉරිදා ■ වර්ෂ 2020ක් වූ අගෝස්තු මස 23 වැනි ඉරිදා මිල රු 70.00




**ඉන්දු - ලංකා ගිවිසුමට එරෙහිව මන්ත්‍රීකම අත්හළ කථානායක**

පිටුව 13



**අපස්මාරයට දුන් බෙහෙතින් අසාධ්‍ය වූ ලෙනින්**

පිටුව 03



**රිදුණු පයට තණ පලසක්**

නුපුහුණු ශ්‍රමිකයන් ලක්ෂයකට රැකියා දීම ඇරැඹේ

පිටුව 05

**රාජ්‍ය යාන්ත්‍රණයට උපාධිධාරීන් 60,000ක්**




පිටුව 07



**සැදෑ සමයේ වෙන්දේසිවන පොලිස් නිල සුනඛයෝ**

පිටුව 16

# ඖෂධ මෙරටදීම නිපදවීමට සැලසුම්



විශාල මුදලක් ඉතිරි කරගැනීම පිණිස සියලු ඖෂධ මෙරටදීම නිෂ්පාදනය ආරම්භ කිරීමට කටයුතු යොදන බවත් මේ වසර තුළදීම මෙරටට අවශ්‍ය සේලයින් නිෂ්පාදනය කිරීම සඳහා කර්මාන්තශාලාවක් ආරම්භ කරන බවද මහාචාර්ය ජයසුමන ප්‍රකාශ කෙළේය.

(තාරක වික්‍රමසේකර)

**විදේශවලින් ආනයනය කෙරෙන බොහෝ ඖෂධ ඉදිරි පස්වසරෙන් පසු ආනයනය සම්පූර්ණයෙන්ම නැවැත්වීමට කටයුතු යොදන බව ඖෂධ නිෂ්පාදනය, සැපයීම හා නියාමන රාජ්‍ය අමාත්‍ය මහාචාර්ය චන්න ජයසුමන සිළුමිණට කීය. මෙරට භාවිතා වන ඖෂධවලින් 15%කට ආසන්න ප්‍රමාණයක් හැරෙන්නට ඉතිරි සියල්ල ආනයනය කරන බව අවධාරණය කළ ඇමැතිවරයා එම බහුතරයක් ඖෂධ මෙරටදීම නිෂ්පාදනය කළ හැකි බව පෙන්වා දුන්නේය.**

මේ නිසා විදේශ කරා ඇදීයන අති-

මෙරටට විදේශ රටවලින් ඖෂධ ආනයනය වසර 5කට පසුව මුළුමනින්ම නැවැත්වීමට කටයුතු යොදන ලෙස ජනාධිපතිවරයා උපදෙස් ලබා දී ඇතැයි පෙන්වා දුන් ඇමැතිවරයා ඒ සඳහා අදියර 3ක් යටතේ සැලසුම් සකස් කර ඇතැයිද කීවේය. ඒ අනුව රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව හරහා ඖෂධ නිෂ්පාදනයට පියවර ගැනෙන අතර රාජ්‍ය හා පෞද්ගලික අංශ ඒකාබද්ධව ඖෂධ නිෂ්පාදනය කිරීම දෙවන ක්‍රමවේදය බවද කීවේය.

එමෙන්ම සම්පූර්ණයෙන්ම මෙරට පෞද්ගලික අංශය ඖෂධ නිෂ්පාදනයට දිරි ගන්වා අවශ්‍ය පහසුකම් ලබාදීමෙන් සියලු ඖෂධ මෙරටදීම නිෂ්පාදනයට කටයුතු යොදන බවද ඇමැති මහාචාර්ය ජයසුමන වැඩිදුරටත් පෙන්වා දුන්නේය.





සේයාරුව-සුලෝචන ගමගේ

වසර 1977 මහ මැතිවරණයේදී එජාපයට 5/6ක බලයක් හිමි විය. ඉන් දශක 4කට පසු පාර්ලිමේන්තුවේ 2/3ක බහුතර බලයක් හිමිකර ගැනීමට ශ්‍රී ලංකා පොදුජන පෙරමුණට ඉකුත් මහ මැතිවරණයේදී හැකි විය. අභිනව පාර්ලිමේන්තුවට පත් වූ ජනතා නියෝජිතයන්ගේ සහභාගිත්වයෙන් 9 වැනි පාර්ලිමේන්තු සැසිවාරය ඉකුත් 19 වැනි බ්‍රහස්පතින්දා ඉතා ගාම්භීරව එහෙත් චාම් අයුරින් ආරම්භ විය. මෙහි වම් පස ඡායාරූපයේ දැක්වෙන්නේ නව රජයේ අගමැති ලෙස යළිත් පත් වූ මහින්ද රාජපක්ෂයන් පාර්ලිමේන්තුවට පැමිණෙද්දී මාධ්‍යවේදීන්ට සිය සතුට ප්‍රකාශ කළ අයුරුය. දකුණු පස සේයාරුවේ දැක්වෙන්නේ එදින පස්වරුවේ පැවැති පාර්ලිමේන්තු සැසිවාරයේදී ජනාධිපති ගෝඨාභය රාජපක්ෂයන් රාජාසන කතාව ඉදිරිපත් කළ අවස්ථාවය.

# ඉදිරි අයවැයේ මුල්තැන දේශීය නිපැයුම්වලට

(ජයසූරිය උඩුකුඹුර)

**දේශීය වශයෙන් නිෂ්පාදනය කළ හැකි සියලු නිෂ්පාදන සඳහා ඉදිරි අය වැයේදී ප්‍රමුඛතාවය ලබාදීමට රජය කටයුතු කර ඇතැයිද එම කර්මාන්ත සඳහා දේශීය හා විදේශීය ආයෝජකයන්ට වැඩි සහන ලබාදී ආයෝජන දිරිමත් කිරීම උදෙසා සවිබල ගන්වන බවද මුදල්, ප්‍රාග්ධන වෙළෙඳ පොළ සහ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය ඇමැති අජිත් නිවාඩ් කබ්රාල් මහතා සිළුමිණට ප්‍රකාශ කෙළේය.**

විදේශ විනිමය ඉහළ නංවා ගැනීම සඳහා දේශීය නිෂ්පාදන අපනයනය කිරීම කෙරෙහි රජය ප්‍රමුඛතාව ලබාදී ඇති අතර, විශේෂයෙන් මෙරට පාරම්පරික කර්මාන්ත ප්‍රවර්ධනය කර ඊට ගැළපෙන ලෝක වෙළෙඳ පොළක් නිර්මාණය කර ගැනීමෙන් මෙරට පාරම්පරික කර්මාන්තකරුවන්ගේ නිෂ්පාදන සඳහා ඉහළ ඉල්ලුමක් ඇතිකර ගැනීම රජයේ අරමුණ වී ඇතැයිද ඇමැති කබ්රාල් අවධාරණය කෙළේය.

4 වැනි පිටුවට






# පාතාල ප්‍රබලයන් 35ක් අත්අඩංගුවට

(අමිල මලවිසූරිය)

**පාතාල සාමාජිකයන්, මත් ද්‍රව්‍ය ජාවාරම්කරුවන් ඇතුළු රටපුරා විසිරී සිටින වරෙන්තුකරුවන් අත්අඩංගුවට ගැනීම සඳහා අඛණ්ඩව පසුගිය තෙමසකට ආසන්න කාලය පුරා රජය ක්‍රියාත්මක කර ඇති වැඩපිළිවෙළ තුළදී පොලිසිය සහ විශේෂ කාර්ය බළකාය එක්ව සිදුකළ මෙහෙයුම්වලදී ප්‍රබල ගණයේ පාතාල සහ මත් ජාවාරම්වලට සම්බන්ධ 35 දෙනෙක් අත්අඩංගුවට ගෙන ඇති අතර ඊට කාන්තාවන්ද 10කට ආසන්න පිරිසක්ද අයත් වේ.**



එමෙන්ම හෙරොයින්, ගංජා, අයිස් ඇතුළු මත්ද්‍රව්‍ය කිලෝග්‍රෑම් 889ක ප්‍රමාණයක් සමඟ සැකකරුවන් 30,315 දෙනෙක්ද අපරාධවලට සම්බන්ධ වරෙන්තුකරුවන් 26,121 දෙනෙක්ද අත්අඩංගුවට ගෙන ඇති බව පොලිස් මූලස්ථානය සඳහන් කරයි.

4 වැනි පිටුවට

# දවසකට 600ක් ත්‍රිරෝදයට සමුදෙයි

(තාරක වික්‍රමසේකර)

**ත්‍රිරෝද රථ හිමිකරුවන් 600ක් පමණ දිනපතා තම රථ අලෙවි කිරීම සිදු කරන බව මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව පවසයි. පසුගිය වසර තුළදී පමණක් ත්‍රිරෝද රථ හිමිකරුවන් විසින් ත්‍රිරෝද රථ 219,506ක් අලෙවි කර ඇති බව එම දෙපාර්තමේන්තුව පෙන්වා දෙයි.**

එසේ වුවත් අලුතින් ත්‍රිරෝද රථ ලියාපදිංචියේ අඩුවක් පෙන්නුම් කර ඇති අතර පසුගිය 2019 වසර තුළදී අලුතින් ත්‍රිරෝද රථ ලියාපදිංචි කර ඇත්තේ 14,378ක් පමණක් බවද දෙපාර්තමේන්තුව පවසයි. ඒ අනුව දිනකට අලුතින් පාරට බසින ත්‍රිරෝද රථ සංඛ්‍යාව 40ක් පමණ වේ.






# ‘යහපාලන’ ආණ්ඩු සමයේ රාජ්‍ය සේවක පළිගැනීම් 9,847ක්

(ජයසූරිය උඩුකුඹුර)

**වසර 2015 සිට 2019 වසර දක්වා දේශපාලන පළිගැනීමට ලක් වූ රාජ්‍ය සේවකයන් සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා පත් කර ඇති ජනාධිපති විමර්ශන කමිටුවට මේ වන විට දේශපාලන පළිගැනීමට ලක් වූ රාජ්‍ය සේවකයන් 9,847 දෙනෙකුගෙන් පැමිණිලි ලැබී ඇති අතර එම පැමිණිලිවලින් 1734ක් දැනටමත් විමර්ශනය කර අවසන් ව ඇත.**

ඒ යටතේ ඉතා අසාධාරණ ලෙස රාජ්‍ය සේවයෙන් නෙරපා සිටි 56 දෙනෙකු යළිත් සේවයේ පිහිටුවා ඇති අතර තවත් 164 දෙනෙකු සේවයේ පිහිටුවීමට ඇති හැකියාව පිළිබඳව කරුණු අධ්‍යයනය කරගෙන යයි.

වැටුප් වර්ධක ලබා නොදීම, අසාධාරණ ලෙස ස්ථානමාරුවීම් ලබාදීම සේවයෙන් පහත දැමීම ආදි විවිධාකාරයෙන් දේශපාලන පළිගැනීම් වලට ලක්ව ඇති ඇතැම් රාජ්‍ය සේවකයන් සිදුව ඇති අසාධාරණ ඉවසා ගත නොහැකිව මානසික රෝගීන් බවට පත්ව සිටින බවද කියනු ලැබේ.

ඇතැම් රාජ්‍ය සේවකයන් කිසිදු චෝදනා පත්‍රයක් හෝ නොමැතිව සේවා ස්ථානයෙන් නෙරපා හැර ඇති අවස්ථා සම්බන්ධයෙන් ද විමර්ශනයේදී කරුණු හෙළිවී තිබේ.

**සිම්පල් මෑන්**



“අන්න ලොක්කම වැඩේට බැහැල රස්සා දෙනවලු.
දැන් ඉතිං අපි උද්ඝෝෂණ කරලා වැඩ පෙන්නලත් ඉවරයි”

# මහ මුහුදේදී අමානුෂික ලෙස පහර කෑ ශෙෂාන්ගේ නොකී කතාව



● ජයසිරි ජේදුරුආරච්චි
ගන්දර සමූහ

**අභිමානවත් මාතරට මිරිස්ස යන නාමය එක්කර තිබුණේ ඉහළ ආර්ථික වටිනාකමකි. මිරිස්ස කී සැණින් සැමගේ මතකයට නැඟෙන්නේ සුන්දර සංචාරක ප්‍රදේශයයි. එහෙත් එම සුන්දර බවට අසුන්දරත්වයක් මෙන්ම හා මාතර අභිමානයට කැළලක් එක්වූයේ ඉකුත් පහළොස් වැනිදාය. ඒ මාධ්‍ය වාර්තා මඟින් හෙළිවූ ඈත දියඹේදී බාලවයස්කාර දරුවෙකුට අමානුෂික ලෙස වද හිංසා පැමිණවීම පිළිබඳ කතාවත් සමඟය. එය පසුගිය සතිය මුළුල්ලේම කා අතරත් කතාබහට ලක්වූ පුවතක් බවට පත්ව තිබුණේ එහි වූ ආකාරුණික බව නිසාමය.**

මෙරට සිදුවූ තවත් බාල අපචාරයක් ලෙස පොලිස් පොතට මෙම සිදුවීම එක්වූයේ පසුගිය මාස දහ අට තුළ නීතිපතිවරයා විසින් ළමා අපයෝජන සිද්ධීන් දොළොස්දහස් නවසිය හැට අටක විමර්ශන අවසන් කර නඩු අටසිය පනස් එකක් දක්වා අඩුකර තිබියදීය.

ඒ ඉකුත් සෙනසුරාදා (15දා) දිනයයි. මෙරට රූපවාහිනී නාළිකාවල මධ්‍යහන පුවත් හා රාත්‍රී පුවත් මඟින් ප්‍රචාරය වූ නෙතට කඳුළක් එක්කළ පුවත් වාර්තාවකින් කියැවුණේ මිරිස්ස බණ්ඩරමුල්ල ප්‍රදේශයේ බාලවයස්කාර දරුවකු මුහුදු රැකියාව සඳහා ගෙනගොස් ඈත දියඹ මුහුදේදී දින හතළිස් පහක් පුරා අමානුෂික ලෙස පහරදීමට ලක්කර සිරුර පුරා තුවාල සිදු කර ඇති බවයි. අදාළ දරුවා ගොඩබිමට පැමිණීමෙන් පසු දැඩි ලෙස රෝගී තත්ත්වයෙන් පසුවූ නිසා මවුපියන් විසින් මාතර රෝහලට ඇතුළත් කර ඇති බව ද ඉන් කියැවිණි.

මහ මුහුදේදී ධීවරයන්ගේ අමානුෂික පහරදීම්වලට එලෙස ලක්ව සිටියේ මිරිස්ස බණ්ඩරමුල්ල පදිංචි ශෙෂාන් ප්‍රමෝද් නම් වයස අවුරුදු දහසයයි මාසයක් පමණ වූ බාලවයස්කාර දරුවෙකි. දින හතළිස්පහක් පුරා මහ මුහුදේ කඳුළු අතර ජීවත් වූ ශෙෂාන් යළි ගොඩබිමට පැමිණ ඇත්තේ ඉකුත් 12 වැනිදා ය. අදාළ පහරදීම පිළිබඳ ශෙෂාන්ගේ පියා කොටවිල පොලිසියට පැමිණිලි කරන්නේ අගෝස්තු මස 13 දින රාත්‍රී 10.15 ට පමණය. ඒ වන විට දරුවා මාතර රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ලබමින් සිටියේය.

ලද පැමිණිල්ල මත පොලිස් පරීක්ෂණ අරඹන කොටවිල පොලිසියේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක රොෂාන් චමින්ද හෙට්ටිආරච්චි මහතා දරුවාගෙන් ලබාගත් තොරතුරු මත වහා පරීක්ෂණ අරඹද්දී ශෙෂාන්ට පහර දුන් සැකකරුවන් ප්‍රදේශයෙන් පලා යන්නට උත්සාහ දරමින් සිට ඇත. තමන්ට ලද තොරතුර පිළිබඳ ප්‍රධාන පොලිස් පරීක්ෂක හෙට්ටිආරච්චි මාතර කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී චන්දන හේරත් සහ දකුණු පළාත් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති රොහාන් යන අයට දැනුම් දීමෙන් පසු සැකකරුවන් සොයා පොලිස් කණ්ඩායම් පහක් මෙහෙයුම් සඳහා යෙදවිණ.

පොලිස් පරීක්ෂණ කඩිනම් වෙද්දී බාලවයස්කාර දරුවාට අමානුෂික ලෙස පහරදුන් සැකකරුවන් හතරදෙනා සහ බෝට්ටුවේ හිමිකරු ද පොලිස් අත්අඩංගුවට පත්වූයේ සූක්ෂම මෙහෙයුමක ප්‍රතිඵලයක් ලෙසිනි. ඒ අතර මාතර කොට්ඨාස ළමා හා කාන්තා කාර්යාංශයේ ස්ථානාධිපතිනි, ප්‍රධාන පොලිස් පරීක්ෂිකා රසිකා දමයන්ති ප්‍රමුඛ පොලිස් කණ්ඩායමක් පහරදීම පිළිබඳ අදාළ දරුවාගෙන් තොරතුරු විමසමින් සිටියහ.

මාතර කොට්ඨාස ළමා හා කාන්තා කාර්යාංශයේ පොලිස් සැරයන් චන්දනගේ මනෝවිද්‍යාත්මක මඟපෙන්වීම ඔස්සේ ශෙෂාන් පොලිසියට ලබාදුන් තොරතුරුවලට අනුව ඔහු මුහුදු රැකියාව සඳහා පොළඹවාගෙන ඇත්තේ බෝට්ටුවේ ස්කීපර් ලෙස කටයුතු කළ සැකකරුය. 2004 ජූලි මස 01 දින මාතර මහ රෝහලේදී ඉපදී ඇති ශෙෂාන්ගේ වයස අනුව මුහුදු රැකියාව සඳහා යොදවාගත නොහැකි බැවින් ස්කීපර් විසින් උප්පැන්න සහතිකයේ උපත 2001 ජූලි මස 01 දින ලෙස වෙනස්කර අවශ්‍ය නීත්‍යානුකූල පසුබිම සකස්කර දී ඇත. ඒ අනුව ශෙෂාන් ඇතුළු පස්දෙනෙකුගෙන් සමන්විත කණ්ඩායම බහුදින ධීවර යාත්‍රාවකින් මුහුදු රැකියාව සඳහා මිරිස්ස ධීවර වරායෙන් පිටව ගොස් ඇත්තේ පසුගිය ජූනි මස 28 වැනිදා රාත්‍රී නවයයි තිහට පමණය.



නිවෙසට ගොස් සොයා බලන මහජන නියෝජිතයන් වන මහින්ද යාපා අබේවර්ධන, කංචන විජේසේකර හා පියල් නිශාන්ත

දින දෙකක දීර්ඝ මුහුදු ගමනකින් පසු ගැඹුරු මුහුදට පැමිණ ඇති ධීවර කණ්ඩායම මසුන් ඇල්ලීමට පටන්ගෙන ඇත. ඒ ජූලි මස පළමුවැනිදාය. ධීවර රැකියාවේදී ශෙෂාන්ට පවරා ඇත්තේ මුහුදට දැල් දැමීම, මන්ද ගැසීම හා මන්ද ඇදීමයි. මාළු අල්ලාගැනීමට එළූ දැල නැවත බෝට්ටුවට අදිමින් සිටියදී කිලෝ අටක තරම් බර බල මාළුවකු ශෙෂාන්ගේ අතින් ගිලිහී නැවත මුහුදට වැටී ඇති අතර ඉන් කේන්ති ගත් ධීවරයන් ශෙෂාන්ට පහරදීමට පටන්ගෙන ඇත. එදා සිට දින හතළිස් පහක් පුරා මහ මුහුදේ ගතකරද්දී ශෙෂාන් දිගින් දිගටම පහරදීම්වලට ලක්ව ඇති අතර ඇතැම් අවස්ථාවලදී කුඹ ගසේ ගැටගසා පද්දමින් සිට ඇත. අවස්ථා කීපයක් මුහුදට ද දමා ඇත.



ශෙෂාන්ගේ දෙමවුපියන්, සහෝදර සහෝදරියන් හා ඔවුන් ජීවත්වන නිවෙස

“මගේ පුතා මුහුදු ගියේ ගෙදර තිබූ අගහිඟකම් නිසා. ගෙයක් හදාගන්න එයාට ලොකු ආශාවක් තිබුණා. අනේ දුප්පත්කමට ගියාම මෙහෙම වධ හිංසා කරනවද? මගේ පුතාගෙ අතින් බලයා මාළු කූරියෙක් මුහුදට වැටුණා කියලා තමයි ගහන්න පටන් අරන් තියෙන්නේ. දැල් වලින්, මාළුන්ගෙන් පවා ගහලා තියෙනවා. වැඩියෙන් කෑවා කියා නැඹිලියකින් ඔළුවටත් ගහලා. අනේ ළමයි බිස්කට්වලට ආසයිනේ. බඩගින්නට චොක්ලට්, බිස්කට් එකක් කෑව කියල කටට අතදාල දෙපැත්තට ඇදලා; කටත් තුවාලයි; පුතා ගෙදර ආවේ ගිය විදියට නොවෙයි; ඇවිදගන්නවත් බැරුව.මගේ පුතාට පුදුම දුකක් දීල තියෙන්නේ” ශෙෂාන්ගේ මව වූ චන්දිමා ප්‍රියදර්ශනී හැඬූ කඳුළින් පැවසුවාය.

රෝහල් ගතකර සිටින ශෙෂාන්ට ප්‍රතිකාර කරන අතර පොලිසිය ඊළඟට සැකයේ ඇස යොමුකර තිබුණේ දරුවාට ලිංගික හිංසනයක් ද සිදුව ඇති ද ගැනය. ඒ සම්බන්ධයෙන් මාතර මහ රෝහලේ අධිකරණ වෛද්‍ය නිලධාරී මඟින් පරීක්ෂණයක් කළ ද එවැනි ලිංගික හිංසනයක් සිදුව නැති බව කොටවිල පොලිසිය පැවසුවේය.

ශෙෂාන් පස් දෙනෙකුගෙන් සමන්විත පවුලේ වැඩිමහල් දරුවාය. ඔහුට එක් මල්ලී කෙනෙකු හා නංගිලා තිදෙනෙකු සිටිති. තාත්තාට ස්ථිර රැකියාවක් නැත.

ශෙෂාන්ට සිදුව ඇති අමානුෂික පහරදීම පිළිබඳ මාධ්‍ය වාර්තා පළවීමත් සමඟ ඇතිවී තිබෙන තත්ත්වය පිළිබඳ සොයාබැලීම සඳහා රාජ්‍ය අමාත්‍යවරුන් වන කංචන විජේසේකර සහ පියල් නිශාන්ත මහත්වරු හා පොලිස් මූලස්ථානයේ ළමා හා කාන්තා අපයෝජන නිවාරණ කාර්යාංශයේ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිණී බිම්ෂානි ජාසිංහආරච්චි පසුගිය (16) දින මාතර මහ රෝහලට පැමිණියහ. එහිදී ශෙෂාන්ට සිදුකර ඇති අමානුෂික ප්‍රහාර පිළිබඳ සොයා බැලූ අමාත්‍යවරු ශෙෂාන් රැකියාව සඳහා මුහුදු ගිය ධීවර යාත්‍රාවේ බලපත්‍රය අහෝසි කිරීමටත් එම වරදකරුවන් අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කිරීමටත් අවශ්‍ය පියවර ගෙන ඇති බවත් පැවසූහ. දරුවාගේ ප්‍රතිකාර කටයුතු සහ අවශ්‍යතා පිළිබඳ කටයුතු සිදු කිරීමටත් මෙවැනි සිදුවීම් ඉදිරියට සිදු නොවීමට අවශ්‍ය පියවර ගන්නා බවත් අමාත්‍යවරු එහිදී වැඩිදුරටත් පැවසූහ.

අනතුරුව අමාත්‍ය පියල් නිශාන්ත, පාර්ලිමේන්තු මන්ත්‍රී මහින්ද යාපා අබේවර්ධන දරුවා ජීවත්වන මිරිස්ස බණ්ඩරමුල්ලේ නිවසටද ගොස් පරීක්ෂා කර බලා එම පවුලේ අනාගත සුරක්ෂිතතාව සම්බන්ධයෙන් කළ හැකි ආධාර උපකාර පිළිබඳව ද සොයා බැලූ අතර, එහිදී පියල් නිශාන්ත අමාත්‍යවරයා කියා සිටියේ නව නිවසක් ඉදිකර ගැනීමට හා දරුවන්ගේ ඉදිරි අධ්‍යාපන කටයුතු සඳහා උපකාර කරන බවයි.



## ලංකා බැංකුව

## වටිනා ඉඩම් විකිණීම

| දේපළ අංකය | නගරය | ඉඩම පිහිටි ස්ථානය | ඉඩමේ ස්වභාවය | ප්‍රමාණය |
|---|---|---|---|---|
| 342 | අම්බලන්තොට | ගහ පාර, මාමඩල, වලවේවත්ත නැගෙනහිර, අම්බලන්තොට. | හිස් ඉඩම | රූඩ් 2 පර්. 20 |
| 403 | රුවන්වැල්ල | නිව් ක්ලිනික්, රුවන්වැල්ල. | පෙර පැවති සිරිනිමා නර්සිං හෝම්ස් පිහිටි ඉඩම හා ගොඩනැගිල්ල | පර්. 7.4 |
| 417 | මහියංගනය | හඳගනාවයාය අංක 25/6, රන්දෙනිගල පාර, හඳගනාව. | පෙර පැවති සිතුම් රයිස් මිල්ස් පිහිටි ඉඩම හා ගොඩනැගිල්ල | අක්. 1 රූඩ් 2 |
| 431 | රත්මලාන | අංක 30, විමලසිරි මාවත, මාලිගාව පාර, තෙලවල, රත්මලාන. | පෙර පැවති ට්‍රයි ස්ටාර් ඇපරල් ආයතනය පිහිටි ඉඩම හා කර්මාන්ත ශාලා ගොඩනැගිල්ල (වැඩිම ඉල්ලුම්කරු තීරණය කරනු ලබන්නේ උසාවි නියෝගයට අනුව බව කරුණාවෙන් සලකන්න) | අක්. 1 රූඩ් 2 පර්. 32.0 |
| 444 | වාරියපොල | අඹගහමුල වත්ත, විලකටුපොත, වාරියපොල. | පෙර පැවති ජයලංකා ගාමන්ට් කර්මාන්ත ශාලාව සමග යන්ත්‍රෝපකරණ | රූඩ්. 2 පර්. 37.30 |
| 447 - III | අවිස්සාවේල්ල | මනමේන්ද්‍ර මාවත, අවිස්සාවේල්ල. | පෙර පැවති ඩීබී එක්සිම් (පුද්ගලික) සමාගම පිහිටි ඉඩම හා ගොඩනැගිල්ල | පර්. 34.0 |
| 447 - I | මාලඹේ | මිහිඳු මාවත, මාලඹේ. | පෙර පැවති ඩීබී එක්සිම් (පුද්ගලික) සමාගම පිහිටි ඉඩම හා ගොඩනැගිල්ල | පර්. 10.0 |
| 453 | අවිස්සාවේල්ල | 4බී, තුම්මෝදර පාර, අවිස්සාවේල්ල. | පෙර පැවති මැක්රාටා ප්ලයිවුඩ් (පුද්ගලික) සමාගම පිහිටි ඉඩම හා ගොඩනැගිල්ල | අක් 1 රූඩ්. 2 පර්. 39.0 |
| 454 | අනුරාධපුරය | අනුරාධපුරය, මිහින්තලය පාර, නුවරවැව ග්‍රාමය අංක 07 හි පිහිටි බඳුවත්තේගොඩ ඉඩම. | පෙර පැවති කැන්ඩි හොලිඩේ රෙසෝට් ඉඩම හා ගොඩනැගිල්ල | රූඩ් 2 පර්. 12.87 |
| ට්‍රයිස්ටාර් - ඊ | ගල්ගමුව | ගල්ගමුව, පාලු ආඩිගම, වෙහෙරගොඩ යාය පිහිටි වඩුගමයාය ඉඩම. | පෙර පැවති ජයලංකා ගාමන්ට් කර්මාන්ත ශාලාව පිහිටි ඉඩම හා ගොඩනැගිල්ල (වැඩිම ඉල්ලුම්කරු තීරණය කරනු ලබන්නේ උසාවි නියෝගයට අනුව බව කරුණාවෙන් සලකන්න) (1998.08.01 දින සිට වසර 30 ක බදු හිමිකම් අයිතිය) | අක්. 1 පර්. 35.3 |
| ට්‍රයිස්ටාර් - එෆ් | බුත්තල | මීගහවෙල, බුත්තල. | පෙර පැවති ට්‍රයි ස්ටාර් ඇපරල් කර්මාන්ත ශාලාව (1991.12.01 දින සිට වසර 99 ක බදු හිමිකම් අයිතිය) (වැඩිම ඉල්ලුම්කරු තීරණය කරනු ලබන්නේ උසාවි නියෝගයට අනුව බව කරුණාවෙන් සලකන්න) | අක්. 2 රූඩ්. 2 පර්. 33.3 |
| කමල් කේබල්ස් | රත්මලාන | අංක 56, කඳවල මාවත, රත්මලාන. | පෙර පැවති කමල් කේබල්ස් පිහිටි ඉඩම හා ගොඩනැගිල්ල සමග යන්ත්‍රෝපකරණ | අක්. 2 රූඩ් 2 පර්. 11.5 |

ඉහත සඳහන් දේපළ මිලදී ගැනීමට උනන්දුවක් දක්වන්නන්ගෙන් (ගැනුම්කරුවන්ගෙන් පමණක්) මිල ගණන් කැඳවනු ලැබේ.

ඉල්ලුම්පත්‍ර 2020.09.07 වැනි දින දක්වා ලබාගත හැකි අතර, ඒ සඳහා ආපසු නොගෙවනු ලබන රු. 2,000.00 ක මුදලක් සහ ආපසු ගෙවනු ලබන රු. 50,000.00 ක ගෙවීමකින් සිදු කළ යුතුය. එය ලංකා බැංකුවේ ඕනෑම ශාඛාවක තැන්පත් කළ හැක.

නිසි පරිදි සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 'දේපළ/05/2020' සහ දේපළ අංකය සඳහන් කළ කවරයක බහා 2020.09.08 දින පෙ.ව. 10.00 ට පෙර පහත සඳහන් ලිපිනයට ලැබීමට සැලැස්විය යුතුයි. 2020.09.08 දින පෙරවරු 10.00 ට සිදු කරන ටෙන්ඩර් විවෘත කිරීමේ අවස්ථාවට සහභාගි වන ලෙස ඉල්ලුම්කරුවන් වෙත ඇරයුම් කෙරේ.

ටෙන්ඩර්කරුවන් විසින් ඉදිරිපත් කරන මිල ගණන් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ලංකා බැංකුව සතුවේ.

*වැඩි විස්තර සඳහා*

**ලංකා බැංකුව**


BANK OF CEYLON
ලංකා බැංකුව இலங்கை வங்கி

**ජාතියේ මහා පහන් ටැඹ**

**ලංකා බැංකුව, පවරාගත් දේපළ අංශය,**
**03 වන මහල, ප්‍රධාන කාර්යාලය, ලංකා බැංකු චතුරස්‍රය,**
**අංක 01, ලංකා බැංකු මාවත, කොළඹ 01.**
**දුරකථන අංක : සහකාර මහා කළමනාකරු - 011-2203410 / 011-2386080**
**ප්‍රධාන කළමනාකාරිණී - 011-2203443 / 011-2391984 / 076-4851823**
**ජ්‍යෙෂ්ඨ කළමනාකාරිණී - 011-2321170 / 011-2203429 / 076-9627068**
**සහකාර කළමනාකරු - 011-2203470 / 071-8418898**
**ෆැක්ස් අංක - 011-2446816 / 2389130**
*** www.boc.lk වෙබ් අඩවියට පිවිස විශේෂ දැන්වීම් යටතේ දේපළ විකිණීම බලන්න.**


# ඇතැම් දේශපාලඥයන්ගේ ‘පොරටෝක්’

හිරු



● මුරුත්තෙට්ටුවේ ආනන්ද හිමි

**අභිනව ආණ්ඩුවේ කැබිනට් ඇමතිවරුන් සහ රාජ්‍ය ඇමතිවරුන් හැම දෙනෙක්ම පාහේ ඉකුත් දෙසතිය තුළ තම තමන්ගේ අමාත්‍යාංශයන්හි රාජකාරි කටයුතු ආරම්භ කර තිබුණහ. ඔවුන් අතරින් ඇතැමකු කල්තියා සූදානම් කර තිබූ සුබ නැකැත් අනුවද, තවත් කීපදෙනෙකු තමන්ගේ හිතූමතයට ද එම ඇමතිධූරවල දිවුරුම් දීම සිදු කර තිබුණේ කඩිනමින් එම සේවා කටයුතු ඇරඹිය යුතු යැයි ජනාධිපතිතුමා උපදෙස් දී තිබුණ බැවිනි.**

කෙසේ වෙතත් අභිනව ඇමතිවරුන් තමන්ගේ රාජකාරි කටයුතු ඇරඹීමේ උත්සවයන්හිදී ලොකු කතා කීම මෙවර ද සුපුරුදු ලෙස දකින්නට ලැබුණේය. නගරබද සහ අර්ධ නාගරික පෙදෙස් වල වෙසෙන කෙළිලොල් තරුණ පිරිස කියන අන්දමට නම් ඒවා පොරටෝක් ය. අලුතින් පත්වූ ඇමතිවරුන් වැඩිදෙනෙකු එලෙස පොරටෝක් දී තිබුණේ තම අමාත්‍යාංශ හරහා ඔවුන් විසින් සිදුකිරීමට යන වැඩ කන්දරාව ගැනය. ඒ අතර ඉකුත් යහපාලන ආණ්ඩුවේ අකාර්යක්ෂම කළමනාකරණය නිසා මෙරට ජනතාවට අන්ත අසරණ තත්ත්වයකට පත්වීමට සිදුවී ඇතැයි කියමින් බැණ වැදීමට ඔවුහු අමතක නොකළහ.

එක් ආණ්ඩුවක් පැරදී තවත් ආණ්ඩුවක් බලයට පත්වූ විට එලෙස කලින් පැවති ආණ්ඩුවට බැණ වැදීම දැන් අපේ ජාතික ප්‍රතිපත්තියක් බවට පත්වී තිබෙන්නේ වසර තිස් හතළිස් ගණනකටත් පෙර සිටය. අලුතින් පත්වූ හැම ආණ්ඩුවකම මැති ඇමතිවරුන් එසේ කරන්නේ තමන් බලයට පත්වූයේ ඊට පෙර පැවති ආණ්ඩුවේ වැරදි නිසා බව මොහොතකට අමතක කරමිනි.

1947 වසරේදී පත්වූ මෙරට පළමුවැනි පාර්ලිමේන්තුවෙන් පසු මේ දක්වා කාලය තුළ බලයට පැමිණි හැම ආණ්ඩුවක්ම තම රාජකාරි කටයුතු අරඹන ලද්දේ ඊට පෙර පැවති ආණ්ඩුවේ ක්‍රියාකලාපය දැඩි ලෙස විවේචනය කරමින් බව ද අපට මතකය. අන්තිමේ දී ඔවුන් විසින් සිදුකරනු ලබන්නේ ද ඊට පෙර බලයට පත්ව සිටි ආණ්ඩුව කළ කී දෑම බව මෙහිදී විශේෂයෙන්ම සඳහන් කළ යුතුය. අතීත සිදුවීම් යළි යළිත් ප්‍රතිරූපණය වීමේ මුග්ධ ක්‍රියාදාමයට දැන්වත් නැවතීමේ තිත තැබිය යුතුය. එසේ නොමැති වුවහොත් සිදුවන්නේ රටේ නූපන් පරපුර පවා අන්ත අසරණ ලෙස ණය උගුල්වලට පැටළීමය.

එහෙයින් අද රටට අවශ්‍ය වී ඇත්තේ කියන දෑ කරන සහ කරන දෑ කියන ආණ්ඩුවකි. මෙරට සමස්ත ජනතාව අතරින් 2/3 කටත් වැඩි පිරිසක් ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා කෙරෙහි අකලංක විශ්වාසයක් තබා දෙවැනි වරටත් එතුමාට විජයග්‍රහණයක් ලබාදී ඇත්තේ දහසකුත් එකක් බලාපොරොත්තු රඳවාගෙනය.

ඉකුත් සතියේ තම මැති ඇමැති ධූරයන්හි රාජකාරි කටයුතු ආරම්භ කළ හැමදෙනෙකුම හමුවේ පවතින්නේ සුළුපටු අභියෝගයක් නොවේ. එම බරපතළ අභියෝගය ඇතැම් කටවාචාල මැති ඇමැතිවරුන්ගේ "පොර ටෝක්" වලින් දියාරු හෝ අවතක්සේරු කළ නොහැකිය. එසේම ඉකුත් සතියේ එම කටවාචාල දේශපාලඥයන් විසින් දී ඇති "පොරටෝක්" යථාර්ථයක් බවට පත්කිරීම ද ඔවුන් සතු වගකීමකි.

2019 වසරේ පාස්කු ඉරිදා මෙරට කතෝලික දේවස්ථාන සහ තරුණ පන්තියේ හෝටල් කිහිපයකට එල්ලවූ ආගමික උම්මත්තකයන්ගේ බෝම්බ ප්‍රහාර හමුවේ රට ආර්ථික වශයෙන් කඩා වැටුණේය. එම තත්ත්වය යන්තමින් හෝ සමනය වෙමින් තිබියදී මේ වසරේ ඇතිවූ කොරෝනා උවදුර හමුවේ රට යළිත් වරක් බරපතළ කඩාවැටීමකට ලක්වූයේ කිසිවකු හෝ නොසිතූ පරිදිය. ඒ බරපතළ පසුබෑම හමුවේ අද මුළු මහත් ශ්‍රී ලංකාවම වැටී ඇත්තේ සිතා ගැනීමට පවා අපහසු ආර්ථික ආගාධයකට ය. එවන් කඩා වැටීමකට ලක්වී සිටින ශ්‍රී ලංකාව යළි ගොඩගැනීම වත්මන් ජනාධිපතිතුමා සහ අගමැතිතුමා ප්‍රමුඛ මුළු මහත් ආණ්ඩුව සතුව පවතින බරපතළ අභියෝගයයි. ගතවූ කොරෝනා උවදුරෙන් මුළු රටම බේරාගත් අයුරින් මෙරට ආර්ථික අර්බුදයෙන් ද රට ගොඩ ගැනීම ඔවුන් දෙපළට හැකිබව බහුතර ජනතාවකගේ විශ්වාසය වී ඇත. ඉකුත් මහ මැතිවරණයේදී ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ආණ්ඩුවක් පත්කර ගැනීමට මෙරට බහුතර ජනතාව දෙවරක් නොසිතා තීරණය කර තිබුණේ ද එබැවිනි.

ඒ අනුව දැන් අවශ්‍ය කරන්නේ අභිනව ආණ්ඩුවේ ඇමැති මණ්ඩලය ද එක්සත්ව සහ එක්සිත්ව එම සටනට පූර්ණ සහයෝගය දැක්වීමයි.

මේ අතර ආණ්ඩුවේ ඇතැම් මැති ඇමැතිවරුන් මෙන්ම හිටපු ඇමැතිවරුන් ද මුහුණ එල්ලා ගෙන සිටින බවක් පෙනෙන්නට තිබුණේය. තවත් කීපදෙනෙකු කොතරම් අපේක්ෂා භංගත්වයට පත්ව සිටියා දැයි කිවහොත් නව ඇමැති මණ්ඩලයේ සමූහ ඡායාරූපයට පෙනී සිටීම පවා ප්‍රතික්ෂේප කර ආපසු ගොස් ඇතැයි ද අසන්නට ලැබුණේය. ඇතැම්විට ඔවුන් එසේ කරන්නට ඇත්තේ තමන්ට ඊට වඩා වැදගත් කර්තව්‍යයක් ඒ මොහොතේ යෙදී තිබීම නිසා විය හැකිය. එසේත් නැත්නම් ඇමතිධූරයක් ලැබුණ පමණින් සමූහ ඡායාරූපයකට පෙනී සිටීම පිස්සු වැඩක් ලෙස සිතුණු නිසා වීමට ද පුළුවන.

කෙසේ වෙතත් තමන් බලාපොරොත්තු වූ ඇමැතිධූර ලැබුණු පිරිස සිටින්නේ සතුටු සිතිනි. තමන් බලාපොරොත්තු වූවාට වඩා අඩු මට්ටමේ ඇමතිධූර ලැබුණු අයත්, කිසිම ඇමැති ධූරයක් නොලැබුණු අයත් පසුවන්නේ උකටලීවය; නැතහොත් නොසතුටුවය. එහෙත් ඔවුන් නැණවතුන් නම් ඇමතිධූරයක් නොලැබීම ගැන එලෙස කලකිරීම සහ මුලින්ම නුසුදුසු ක්‍රියාවකි. අප එසේ කියන්නේ ඒ ගැන කම්පා නොවී රටට තම හැකියාව පෙන්විය හැකි නම් මීළඟට සිදුකෙරෙන ප්‍රථම ඇමැති මණ්ඩල සංශෝධනයේදී ඔවුන්ටත් ඇමැතිධූරයකින් පිදුම් ලැබීමේ වාසනාව හිමිවිය හැකි බැවිනි.

අනෙක් අතට අද අපේ රටට අවශ්‍ය වී ඇත්තේ කටවාචාලයන් නොව නොකඩවා වැඩ කළ හැකි හොඳ වැඩකාරයන් පිරිසකි. මන්ද අද අපේ රට ආර්ථික වශයෙන් දැඩි පසුබෑමකට ලක්වී ඇති බැවිනි. එහෙයින් ඉකුත් දෙසතිය තුළ නව ඇමති ධූරයන් හි දිවුරුම් දී හා පුරා කියා රාජකාරි කටයුතු ඇරඹූ සියලුම මැති ඇමතිවරුන් තමන්ගේ කතා පෙට්ටි වසා දමා තම සේවය අනලස්ව ඉටු කිරීමට අධිෂ්ඨාන කරගත යුතුය. අභිනව ආණ්ඩුවේ ප්‍රධාන නියමුවන් වන ජනාධිපතිතුමා මෙන්ම අගමැතිතුමා ඇතුළු මුළු මහත් ශ්‍රී ලංකාවාසී ජනතාවම ඔවුන්ගෙන් උදක්ම බලාපොරොත්තු වන්නේ එවන් උදාරතර මෙහෙවරකි. රට යළි ගොඩ නැගීමේ සටනට අවශ්‍ය වන්නේ කම්මැලි නිදිමතයන් නොව දවසේ පැය විසි හතර පුරාම ජනතාව වෙනුවෙන් සේවයට කැපවී සිටින වැඩකාරයන්ය.

කෙසේ වෙතත් තමන් බලාපොරොත්තු වූ ඇමතිධූරය නොලැබීම නිසා උකටලීව සිටින දේශපාලනඥයන්ට මෙන්ම තමන් බලාපොරොත්තු වූ අයුරින්ම ඇමැතිධූර ලැබූ දේශපාලනඥයන්ටත් එක දෙයක් මතක් කළ යුතුය. එනම් වැඩකරන සහ නොකරන තත්ත්වයේ තිබෙන සියලුම කතා පෙට්ටි වසා දමා රට ගොඩනැගීමේ සටනට එකාවන්ව උරදිය යුතු බවය.



# අපස්මාරයට ගත් බෙහෙත් අසාත්මික වී දෙනෙත් අන්ධ වූ ලෙනින්

## බෙහෙත් මාරු කිරීම ගැන රෝගියා දැනුම්වත් කර නැහැ

## සති 2ක් බෙහෙත් බොනකොට ඇස්වලින් ලේ ගැලුවා

## රෝහලේ හදිසි දුරකථන අංකයට කතා කරලා නැහැ

● හර්ෂා සුගතදාස

**අපස්මාර රෝගයට මීරිගම මූලික රෝහලෙන් සායනික ප්‍රතිකාර ලැබූ පාසල් සිසුවකුගේ දෙනෙත් අන්ධ වීම පිළිබඳ පුවතක් පසුගිය දින කීපය පුරා විවිධ මාධ්‍ය මඟින් ප්‍රචාරය වීම හේතුවෙන් අප මීරිගම බලා පිටත්වූයේ එහි තොරතුරු සොයා බැලීමේ අටියෙනි.**

මීරිගම හිරිවල වැවහේනවත්තේ අංක 37 දරන නිවසට අප යන විට 16 හැවිරිදි ලෙනින් නිරෝෂන් කුමාර ඇඳේ ගුලි වී නිසොල්මනේ සිටියේ රැයක් දවාලක් ගැන නිනව් නැතිවය. අනිල් කපිල කුමාර සහ සුජාතා මැණිකේ යන මාපිය යුවළ වික්ෂිප්තව බලා සිටින්නේ සිය එකම පුතුට සිදු වූ විපත ගැන දරා ගත නොහැකි වේදනාවෙනි.

"මගේ පුතා දැන් අවුරුද්දක විතර ඉඳලා අපස්මාරයට මීරිගම රෝහලේ සායනයෙන් මාස් පතා බෙහෙත් බොනවා. කොරෝනා කාලේ ඇඳිරි නීතිය නිසා සායනයට යන්න බැහැනේ. ඒ කාලේ සංවර්ධන නිලධාරි ගෙවල්වලට ඇවිත් ක්ලිනික් පොත් එකතු කරගෙන මීරිගම රෝහලට ගෙනිහින් දුන්නා. මීරිගම රෝහලෙන් තැපැල් මඟින් බෙහෙත් එව්වා. අපේ පුතාගේ පොතත් මාර්තු අග දවසක ගෙනිච්චා. අපිට තැපෑලෙන් බෙහෙත් ලැබුණේ අප්‍රේල් 11 වැනිදා. පුතාට ක්ලිනික් එකෙන් වෙනදා දීපු බෙහෙත් පෙති නෙමෙයි අප්‍රේල් 11 වැනිදා එවලා තිබුණේ. පුතාගේ පරණ බෙහෙත් පෙති ඉවර වුණාට පස්සේ අලුත් බෙහෙත් පෙති බොන්න පටන් ගත්තා. ඒ බෙහෙත් බොනකොට පුතාගේ ඇඟේ පළු දැම්මා. ඇස් රතු වෙලා ඉදිමුණා. ඒ දවස්වල පුතා අන්නාසි, සැමන්, අච්චාරු එහෙම කෑවා. අපි හිතුවෙ ඒවායේ සැරට පළු දැම්මා කියලා. එන්න එන්න පුතාට අමාරු වුණා. බෙහෙත් ගන්න යන්නවත් තැනක් නැහැ. ළඟ ඉන්නවා වතුපිටිවල ඉස්පිරිතාලේ වැඩ කරන ප්‍රසන්න කියලා දොස්තර මහත්තයෙක්. අපි එයා ළඟට පුතාව අරන් ගියා. ප්‍රසන්න දොස්තර මහත්තයා කිව්වා ඉක්මනට වතුපිටිවල ඉස්පිරිතාලේට ගෙනියන්න කියලා. ඒ වෙනකොට පුතාගේ ඇස් පෙනීමත් නැතිවෙලා තිබුණේ." යනුවෙන් සිය පුතුට සිදු වූ විපත විස්තර කළේ ඔහුගේ මව වන සුජාතා මැණිකේ ය.



මීරිගම මූලික රෝහලේ වෛද්‍ය අධිකාරි ජයන්ත අබයරත්න

වෛද්‍ය උපදෙස් අනුව වතුපිටිවල රෝහලට රැගෙන යන ලෙනින් නිරෝෂන්ව එම රෝහලෙන් බාර ගැනීමට කැමති වන්නේ නැත. එහෙත් ලෙනින්ගේ පියා ප්‍රසන්න වෛද්‍යවරයාට දුරකථනයෙන් කතා කළ විට ඔහු වහාම රෝගියාව ඇතුළුකර ගන්නා ලෙස රෝහල් කාර්යය මණ්ඩලයට උපදෙස් දී තිබේ. ඒ අනුව ලෙනින් නිරෝෂන්ව වතුපිටිවල රෝහලට ඇතුළත් කරනු ලැබුවේ මැයි 01 වැනිදාය.

මෙහිදී අප්‍රේල් 11 වැනිදා සිට මැයි 01 වැනිදා තෙක් කාලය රෝගී තත්ත්වයෙන් ම නිවසේ ගත කිරීම සම්බන්ධයෙන් අකමැත්තෙන් වුවද විමසා නොසිටිය නොහැකිය. තම පුතුට තැපෑලෙන් එවා තිබුණේ සායනයෙන් වෙනදා ලබා දෙන ඖෂධ නොවන බව ලෙනින්ගේ පියා පවසයි. ඔහු සඳහන් කර සිටින්නේ පුතුට රෝහලෙන් වැරදි ඖෂධයක් එවා ඇති බවයි. එසේ නම් තැපෑලෙන් ඖෂධ එව් කවරයේ සඳහන් හදිසි දුරකථන අංකයෙන් ඒ පිළිබඳව විමසීමක් නොකළේ මන්ද යනුවෙන් අපට අසන්නට සිදු වේ. හදිසි දුරකථන අංකයට කතා නොකළ බව සුජාතා මැණිකේ ද පිළිගනියි. අනෙක් කාරණාව වන්නේ සති 2ක් මුළුල්ලේ රෝගී ලක්ෂණ උත්සන්න වනවිටදීත් දරුවාව මීරිගම රෝහලට රැගෙන නොගොස් පෞද්ගලික ඩිස්පෙන්සරි ගැන විපරම් කිරීමයි. වතුපිටිවල රෝහලේ සේවය කරන ප්‍රසන්න නම් වෛද්‍යවරයා ඒ රෝහලට ඇතුළත් කරන ලෙස පවසන තුරු ඔවුන් දරුවා රෝහලට රැගෙන යාමට උනන්දුවක් දක්වා නොතිබීම කනගාටුවට කරුණකි.

ප්‍රසන්න නම් වෛද්‍යවරයා ලෙනින්ට ඖෂධ ආසාත්මිකතාවක් ඇති වී තිබෙන බව වහාම හඳුනාගෙන ඇත. ලෙනින්ව රෝහල්ගත කිරීමට ක්ෂණිකව පියවර ගෙන තිබෙන්නේ එබැවිනි.

වතුපිටිවල රෝහලේ දැඩි සත්කාර ඒකකයේ පුතා දවස් 12ක් හිටියා. ඒ දවස්වල පුතා මැරිලා වගේ හිටියේ. පුතා යම් තත්ත්වයකට ආපුවාම 5 වාට්ටුවට දැම්මා. පුතාගේ බඩවැල්වල, මොළයේ පවා පළු ඇවිත් තිබුණු බව වෛද්‍යවරුන්ගෙන් දැනගන්න ලැබුණා. ඇස්, තොල් රතු වෙලා ලේ ගැලුවා. පුතාගේ නියපොතු හැළුණා. ඒ සේරම ක්‍රමක්‍රමයෙන් හොඳ වුණා. 5 වාට්ටුවේ මාස 2 1/2ක් හිටියා. මේ වෙලාවේ ඒ වාට්ටුවේ හිටපු තරංගි වෛද්‍යවරිය ගැන විශේෂයෙන් සඳහන් කරන්නම ඕනෑ. ඒ දොස්තර නෝනා පුතාව බැලුවෙ තමුන්ගේම පුතාව රැක බලා ගන්නවා වගෙයි. ඒ දොස්තර නෝනාගේ කැපවීම නිසා පුතා සනීප වුණා. හැබැයි ඇස් දෙකේ පෙනීම ගන්න බැරි වුණා. වතුපිටිවල රෝහලේත් පුතාට ඔපරේෂන් කීපයක් කළා. ඒත් වැඩක් වුණේ නැහැ. පස්සේ පුතාව කොළඹ අක්ෂි රෝහලට යැව්වා." යනුවෙන් ලෙනින්ගේ පියා වන අනිල් කපිල කුමාර විස්තර කළේය.

කොළඹ අක්ෂි රෝහලේ 15 වැනි වාට්ටුවේ ප්‍රතිකාර ලැබූ ලෙනින්ගේ දකුණු ඇසට ශල්‍යකර්මයක් සිදු කරනු ලැබුවේ තොලේ සියුම් පටක ඇසට බද්ධ කිරීමෙනි. මේ වන විට සැත්කම කළ ඇසට බෙහෙත් දැමීම සිදු කෙරේ. ඔහුගේ වම් ඇසේ සැත්කම සිදු කිරීමට ඔහු නැවතත් මේ මස 19 වැනිදා අක්ෂි රෝහලේ 15 වැනි වාට්ටුවට ඇතුළත් විය.

ලෙනින් නිරෝෂන් දරුවාට වැරදි ඖෂධයක් ලබා දුන්නාද, එම ඖෂධය ආසාත්මික වූවාද යන්න පැහැදිලි කර ගත හැකි වන්නේ මීරිගම මූලික රෝහලෙනි. එහි වෛද්‍ය අධිකාරි ජයන්ත අබයරත්න හමු වීමට ගියේ එබැවිනි.

"මේ දරුවාට අපස්මාරය වෙනුවෙන් සායනයෙන් නිකුත් කළේ sodium valproate ඖෂධය. ඒත් ඒ ඖෂධය රෝහලේ තිබුණේ නැති නිසා ඒ වෙනුවට ආදේශකයක් වශයෙන් phenytion sodium ඖෂධය අප්‍රේල් මාසේ නිකුත් කළා. එය වැරදි බෙහෙතක්වත් වෙන කාගෙවත් බෙහෙතක් මාරුවෙලා දීමක්වත් නොවෙයි. ආදේශක ඖෂධයක්. ඒ ඖෂධය ලෙනින් පුතාට ආසාත්මික වෙලා. සති ගණන් එක දිගට ඒ ඖෂධය ගැනීම නිසා තත්ත්වය දරුණු වුණා. මුල් සතියෙම රෝහලට දුරකතනයෙන් කතා කළා නම්, දරුවාව රෝහලට රැගෙන ආවා නම් නරක තත්ත්වයට හැරෙන එක වළක්වා ගන්න තිබුණා." යනුවෙන් මීරිගම මූලික රෝහලේ වෛද්‍ය අධිකාරි ජයන්ත අබයරත්න සඳහන් කළේය.

සායනයෙන් නිකුත් කෙරෙන ඖෂධ මාරු කිරීමේදී රෝගීන්ට ඒ බව දැනුම් දීම සාමාන්‍ය පිළිවෙතයි. එහෙත් තැපැල් මාර්ගයෙන් ඖෂධ නිකුත් කළ නිසා එය මඟ හැරුණා විය හැකිය. සායනයේ බෙහෙත් මාරු කළ බව රෝගියාට දැනුම් දී තිබුණා නම් මීට වඩා යහපත් තත්ත්වයක් උදා වීමට ඉඩ තිබිණි.

"ලෙනින් නිරෝෂන් දරුවාගේ අම්මා දවසක් මාව හමුවන්න ආවා. ඇවිල්ලා පුතාගේ අසනීපය ගැන මට කිව්වා. දරුවාගේ ඇස් අන්ධ වී ඇති බවත් කිව්වා. ඒ ගැන පරීක්ෂණයක් කරන්න අවශ්‍ය නිසා මම අම්මාට කිව්වා පැමිණිල්ල ලිඛිතව ඉදිරිපත් කරන්න කියලා. එයා මැයි 26 දාතමින් මට ලිඛිතව පැමිණිල්ල බාර දුන්නා. ඊටපස්සෙ මම එය ප්‍රාදේශීය සෞඛ්‍ය අධ්‍යක්ෂ වෙත යොමු කළා. ජූනි 29 වැනිදා ප්‍රාදේශීය සෞඛ්‍ය අධ්‍යක්ෂවරයා විශේෂඥ වෛද්‍යවරුන්ගෙන් සමන්විත කමිටුවක් දැම්මා. මෙම කමිටුව පරීක්ෂණ කටයුතු සිදු කළා. එහි අවසන් වාර්තාව ඉදිරියේදි මාධ්‍ය වෙත ලබා දීමට සූදානම් වෙනවා." යනුවෙන් තවදුරටත් විස්තර කළේ මීරිගම මූලික රෝහලේ වෛද්‍ය අධිකාරි ජයන්ත අබයරත්න ය.



ලෙනින් නිරෝෂන්ගේ දෙමාපියන්

මේ වන විට ඖෂධ නිෂ්පාදනය, සැපයුම් හා නියාමනය පිළිබඳ රාජ්‍ය ඇමති මහාචාර්ය චන්න ජයසුමන රෝගී දරුවාව පරීක්ෂා කර බැලීමට දරුවාගේ නිවසට පැමිණ තිබේ. දරුවාට ලබා දී ඇති ඖෂධ පරීක්ෂා කළ මහාචාර්යවරයා බෙහෙත් වර්ගය මාරු කර ඇත්තේ ඇයිද යන්න සොයා බැලිය යුතු බවත්, එසේ ලබා දුන් බෙහෙත් වර්ගය නිසා මෙම ආසාත්මිකතාව ඇති වූ බවට සැක පහළ කළ හැකි බවත් පැවසීය. එමෙන්ම රෝගියා පරීක්ෂාවට ලක් නොකර ඖෂධ වර්ග වෙනස් කිරීම සම්බන්ධයෙන් අමාත්‍යාංශ මට්ටමින් නිසි පරීක්ෂණයක් පැවැත්වීමට කටයුතු කරන බව ද සඳහන් කළේය.

ලෙනින් නිරෝෂන්ගේ පවුල සමෘද්ධිලාභී පවුලක් බැවින් සමාජ ආරක්ෂණ අරමුදල මඟින් ලබා දිය හැකි සියලුම උපකාර ලබා දීමට පියවර ගන්නා බව පැවසුවේ මීරිගම ප්‍රාදේශීය ලේකම් ප්‍රභාත් ඉන්දිකය. ඖෂධ නිෂ්පාදනය සැපැයුම් හා නියාමන රාජ්‍ය අමාත්‍ය චන්න ජයසුමන ලෙනින්ගේ සුවදුක් බැලීමට පැමිණීම දරුවාගේ පවුලේ සියලු දෙනා කෘතවේදීව සිහිපත් කරති.

ඡායාරූප - කැලුම් ලියනගේ




# මරා එල්ලුවා ද? එල්ලිලා මැරුණා ද?

## සවුදියේ අබිරහස් ලෙස මියගිය රත්ගම ප්‍රියන්තගේ කතාව



ප්‍රියන්ත සවුදි අරාබියේදී

● **ලලිත් චාමින්ද** - ගාල්ල

**"සඳා මේ බස් ඩ්‍රයිවර් රස්සාව කරලා හරියන්නේ නැහැ. රට යන්න මගේ අදහසක් තියෙනවා. " ප්‍රියන්ත තම බිරිඳ වූ සඳමාලි ඇමතුවේය.**



ප්‍රියන්තගේ වියෝව අසා නිවසට පැමිණි අසල්වාසීන් කම්පා වෙද්දී

අකමැත්තෙන් වුවත් තම සැමියාගේ විදේශ ගමනට සඳමාලි කැමැත්ත පල කළාය.

ඒ අනුව පළමුවරට 2008 වර්ෂයේ දි ප්‍රියන්ත සවුදි ආරාබියේ රැකියාවකට ගියේය. හේ එම රටේ පුද්ගලික සමාගමක එස්කවේටර් රියදුරකු ලෙසය. . ප්‍රියන්තගේ එකම බලාපොරොත්තුව වුයේ සිය දරුපවුලේ අනාගතය සැපවත් කිරීමය. ඔහු වරින්වර මෙරටට පැමිණ යළි විදේශගත විය.



ප්‍රියන්තගේ බිරිඳ සඳමාලි

ප්‍රියන්ත තම සහකාරිය වූ අනුරුද්ධිකා සමඟ ඇති කරගත් ප්‍රේම සම්බන්ධතාවයකින් අනතුරුව විවාහ විය. ප්‍රියන්තගේ උපන්ගම මාතර යටියන ප්‍රදේශයේ වුවද විවාහවීමෙන් ඔවුන් රත්ගම ප්‍රදේශයට පදිංචියට පැමිණෙන ලදී. ප්‍රියන්ත කාලයක් බස්රථ රියදුරකු ලෙස රැකියාව කළේය. දරුපවුලේ බඩවියත රැකගැනිම සඳහා ඔහු දැඩි අරගලයක නිරතව සිටියේය.

රත්ගම, අලුත්පාරේ අංහන්දියේ පදිංචිව සිටි 42 හැවිරිදි කන්දගේ ප්‍රියන්ත තිදරු පියෙකි. ප්‍රියන්තගේ බිරිද අනුරුද්ධිකා සඳමාලිය. ඇය තිස්පස් හැවිරිදිය. මොවුන්ගේ වැඩිමහල් පුතු මතිෂ සාරංග (14 )රත්ගම දේවපතිරාජමහා විද්‍යාලයේ 10 වසරේ අකුරු කරන්නේය. පවුලේ මද්දුමයා සිතුම් මිහිරංග (08) රත්ගම සිරිසුමන විද්‍යාලයේ දෙවැනි වසරේ ඉගෙනුම ලබන්නේය. පවුලේ බාලයා වන අභිෂෙක් හසරංග අවුරුදු දෙකහමාරක සිගිත්තෙකි.

ප්‍රියන්ත මෙරටට පැමිණි එක් අවස්ථාවකදි යළි විදේශගත නොවි මෙරට සිට ස්වයං රැකියාවක් කිරිමට අදිටන් කරගත්තේය. ඔහු දක්ෂ විදුලිකාර්මිකයකි. ඔහු ජේනරේටර් දෙකක් හා ඒ සඳහා අවශ්‍ය උපකරණ මිලදීගෙන උත්සව සඳහා විදුලි ආලෝකකරණ කටයුතු කිරිමේ නිරත වූයේය. කපුමුල්ලේ තොරණ සඳහා විදුලි ආලෝකය ප්‍රියන්ත විසින් සපයනු ලැබිය. එපමණක් නොව එක අවස්ථාවකදී ඔහු සිනිගම දේවාලයේ පෙරහරක මාර්ගය විදුලි ආලෝකයෙන් බැබළවිමට කටයුතු කළේය. සමාජ සේවා වැඩිවීම නිසා එම ව්‍යාපාරය සාර්ථක වූයේ නැත. ඔහු හතර අත ණය විය. පසුව ඔහු හෝටලයක්ද පවත්වාගෙන ගියේය. එයද අසාර්ථක විය.

එම නිසා ලබාගත් ණය පියවිම සඳහා යළි විදේශගතවිමට තිරණය කළේය. ''ගත්තු ණය ටික බේරන්න තියෙනවා. එකම විසඳුම රට යන එක විතරයි. '' ප්‍රියන්ත සිය සහකාරියට කීවේය. විදේශගතවිම සඳහා ප්‍රියන්ත සතුව මුදල් නොවිය. තමන් පදිංචිව නිවස උගස් කිරීමට අවසානයේ ප්‍රියන්ත තීරණය කළේය. ඒ සඳහා සිය බිරිදගේ ද කැමැත්තද හිමිවිය. පදිංචි නිවස හා ඉඩම රුපියල් ලක්ෂ 7ක මුදලකට උගස් කෙළේය. ඉන් කොටසක් ණය තුරුස් පියවිමට කටයුතු කළ ප්‍රියන්ත පසුගිය වර්ෂයේ මැයි මස 12 වැනිදින යළි විදේශගතවිය. හේ සවුදි අරාබියේ දමාම් නගරයේ පෞද්ගලික සමාගමක එස්කවේටර් රියදුරකු ලෙස යළි රැකියාව ගියේය.

ප්‍රියන්ත මිතුරන් පිරිසක් හා දමාම්හි කාමරයක නතරවි සිටි අතර ඔහු ණය පියවිම සඳහා මාසිකව බිරිඳට මුදල් එවනු ලැබිය. බිරිඳ එම මුදලින් ණය පොලී ගෙවිම සඳහා වැඩි ප්‍රමාණයක් යෙදවූ අතර අත ඉතිරි වූ සොච්චම් මුදල පවුලේ නඩත්තු කටයුතු සදහා මෙන්ම දරුවන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා යෙදවිය. ප්‍රියන්ත බිරිඳ සමග සැම දිනකම පාහේ දුරකථනයෙන් කථා කළේය. ප්‍රියන්ත සමඟ සිටි මිතුරන් ඔහු සිය බිරිඳ සමඟ කථාබස් කරන දේ සිය කාමරයේ තිබු දුරකථනයකට සම්බන්ධ කොට අසාගෙන සිටියහ. මේ ගැන ප්‍රියන්ත පසුව දැනගත්තේය. ඔහු ඒ නිසා මිතුරන් සමඟ එතරම් ඇයි හොදැයියකින් නොදැක්වීය. ඔහු මිතුරන් සමඟ ආරවුලක් ඇතිකර ගත්තේ ඒ හේතුව නිසාය.



එල්ලී මිය ගිය යැයි කියන ප්‍රියන්ත

පසුගිය ජූලි මාසයේ දිනක ප්‍රියන්තට සිය මිතුරන් මත්පැන් පානය කිරිම සඳහා කථා කොට තිබේ. එහෙත් ප්‍රියන්ත ඒ සඳහා සිය අකමැත්ත ප්‍රකාශ කළේය.

''උඹ බොන්න එන්නේ නැද්ද කියා මිතුරන් ප්‍රියන්තට බැණ වැදී පහරදී ඇත.'' ඒ කථාව ගැන බිරිද අනුරුද්ධිකා සඳමාලි මෙසේ කීවාය.

''මහත්තයා යාළුවොත් එක්ක මත්පැන් පානය කිරීමට ගිහින් නැහැ. ඊට පස්සේ මේ අය අතර ආරවුලක් ඇතිවෙලා තියෙනවා. මහත්තයාට ගහලා තියෙනවා. පසුව මහත්තයාත් පහරදීල තියෙන බව ආරංචියි, එහිදී මාවනැල්ලේ අයකුගේ අත කැපිලා මහත්තයට දින 24ක් සිරගතවෙලා ඉදලා තියෙනවා''

ප්‍රියන්ත නිදහස්ව පැමිණ සඳමාලිට කථා කළේය. හේ සිදු වු සියල්ල අකුරක් නෑර සිය බිරිඳ සමඟ කීවේය. මේ අතර හිරෙන් නිදහස්ව පැමිණීමෙන් පසු ප්‍රියන්තට අවශ්‍ය ආහාරපාන මෙන්ම අනිකුත් අවශ්‍යතා එරට රැකියාව කරන සිය මිතුරකු විසින් සපයා දීමට කටයුතු කළේය ප්‍රියන්ත අවසන් වතාවට පසුගිය 15 වැනිදින දහවල් සඳමාලි සමඟ කථා කළේය.

'' සඳා මට මේ අයගෙන් තර්ජන තියෙනවා. මාව ඉක්මන්ට ගෙන්වා ගන්න කටයුතු කරන්න. තුවාල වෙච්ච කෙනා මගෙන් ලක්ෂ 25ක වන්දි මුදලක් ඉල්ලනවා. ඒ මුදල අපි කොහොම හරි ගෙවලා මේ කරදරයෙන් නිදහස් වෙමු. ඉඩම විකුණලා මේ සල්ලි හොයාගන්න. ඔයා දරුවොත් එක්ක අම්මාගේ ගෙදර පදිංචියට යන්න. මොනවා හරි කරලා අපි ගෙයක් හදා ගනිමු. මට ඉක්මනට සල්ලි එවන්න''

එදින පස්වරුවේ සඳමාලි ප්‍රියන්තගේ අපල උපද්‍රව දුරුවිම සඳහා දේවාලයකට ගොස් භාරයක් ද වුවාය. දේවාලයේ සිට ප්‍රියන්තට සඳමාලි දුරකථන ඇමතුම් කිහිපයක් ගත් අතර ප්‍රියන්තගේ දුරකථනය නාද වුවද ප්‍රතිචාරයක් නොවිය.

තම සැමියා කථා නොකිරිම සඳමාලිට ලොකු ගැටලුවක් විය. ඇය දසඅතේ කල්පනා කළාය. ප්‍රියන්ත දිවිහානි කරගෙන ඇති බව සඳමාලිට දැන ගන්නට ලැබුණි. ඇයට මේ සිද්ධිය අදහා ගැනීමට නොහැකි විය. ප්‍රියන්ත එල්ලී සිටින ආකාරයේ ඡායාරූප පෙළක්ද ඔවුන්ට ලැබි තිබුණි.

''මගේ මහත්තයාට එල්ලිලා මැරෙන්න කිසිම වුවමනාවක් තිබුණේ නැහැ. මහත්තයාට ගහලා මරලා එල්ලුවා ද කියලා අපිට ලොකු සැකයක් තියෙනවා. මහත්තයාගේ මරණය ගැන අපක්ෂපාතී පරීක්ෂණයක් පවත්වන්න කියලා ඉල්ලා සිටිනවා. අපි විදේශ සේවා කාර්යංශයෙන් ඉල්ලා සිටිනවා මේ ගැන අපක්ෂපාති පරීක්ෂණයක් පවත්වා අපිට සාධාරණත්වය ඉෂ්ටකරලා දෙන්න කියලා. මහත්තයාගේ මළ සිරුර මෙරටට කඩිනමින් ගෙන්වා දෙන්න කටයුතු කරණ ලෙසත් මා රජයෙන් ඉල්ලා සිටිනවා. මම දරු තිදෙනා එක්ක තනිවුණා. ලොකු පුතා මේ සිද්ධිය දැන ගත්ත දවසෙ ඉදලා කැම කන්නේ නැහැ. දැන් ඉන්න හිටින තැනක් අපිට නැති වෙන්නයි යන්නෙ. දරුවන්ගේ අධ්‍යාපන කටයුතු කරගෙන යන්න ඕන. පවුලේ එදිනෙදා වියදම් පියවාගන්න ඕන. අපි අන්ත අසරණ තත්ත්වයට පත්වෙලා ඉන්නේ'' සදමාලි හැඩූ කඳුළින් යුතුව කීවාය.

මොවුන් පදිංචිව සිටින නිවසේ තවමත් වැඩ අවසන් වි නැත. පවුලේ අගහිගකම් නිසා රන් කහවනු සොයා විදේශගත වු ප්‍රියන්තට අවසානයේ සිය ජීවිතයද අහිමි විය. මේ සිදුවීමට සම්බන්ධ සවුදියේ රැකියා කරණ ශ්‍රිලාංකිකයින් 04 දෙනෙකු එරට පොලිසිය මඟින් අත්අඩංගුවට ගෙන ඇත. මියගිය ප්‍රියන්තගේ මළ සිරුරු කඩිනමින් මෙරටට ගෙන්වා දීමට අවශ්‍ය කටයුතු කරන බව සවුදි අරාබියේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය දන්වා සිටී.

# ජනතාව අඳුරේ තැබූ 'විදුලියේ' අර්බුදය



විදුලිය ඇණ හිටීම නිසා ඉටිපන්දම් එළියෙන් කොණ්ඩය කපන කරණවෑම්යෙක් *(සේයාරුව - අන්තර්ජාලයෙනි)*

● **තාරක වික්‍රමසේකර**

**දකුණු ආසියාවේ පැය 24ම සමස්ත රටටම විදුලිය සැපයූ පළමු රට ලෙස අපි උදම් ඇනුවෙමු. එහෙත් 2009 වසරේ අපි විදුලිය සම්බන්ධයෙන් එවන් තවත් වාර්තාවක් තැබුවේ වාර්තා පොතේ පිටුපසිනි. ඒ සමස්ත දිවයිනටම පැයකට අධික කාලයක් විදුලිය විසන්ධි වූ රටවල් අතරට යෑමෙනි. එමෙන්ම ඒ වාර්තාව අලුත් කරන්නට 2015 වසරේත් 2016 වසරේදීත් අපි සමත් වුණෙමු. ඒ වාර්තාව වසර 4කට පසුව අලුත් කෙළේ ලෝක වාර්තාවක් තබන තත්ත්වයකටදැයි සිතන්නට පුළුවන. ඒ පසුගිය 17 වැනිදා දහවල් 12.35 සිට පැය 7 ½කට අධික කාලයක් දිවයිනටම විදුලි බලය ඇණ හිටි නිසාය.**

2015 වසරේ මෙවන් දරුණු තත්ත්වයක් ඇති වූ අතර එයට නිසි විසඳුම් ලබා දෙන්නට අපේ විදුලි ඉංජිනේරුවෝ අසමත් වූහ. එම නිසා 2016 වසරේදීද එවන් තත්ත්වයක් ඇති විය. ඊට වසර 4කට පසුව වාර්තාගත ලෙසින් පැය 7 ½ක පමණ කාලයක් මෙලෙස විදුලිය ඇණ හිටියේ නම් අපේ විදුලි පද්ධතියේ කොතැනක හෝ විශාල දෝෂයක් තිබිය යුතුය. අපේ රටේ මහජනයා හා සම්බන්ධ වන ආයතන අතර වැඩිම ඉංජිනේරුවන් පිරිසක් ඉන්නා ආයතන 5 අතර විදුලි බල මණ්ඩලයද තිබෙන අතර මෙවන් තත්ත්වයක් මේ ලෙසින් දිගින් දිගටම සිදුවන්නේ නම් එහි වගකීමේ වැඩි කොටසක් ඔවුන් විසින් දැරිය යුතුමය.

පසුගිය 17 වැනිදා සිදුවූ විදුලිය බිඳ වැටීම සම්බන්ධව දිගින් දිගටම ආ කරුණු විභාග කර බැලීමේදී පෙනී යන්නේ මෙහි අලගිය වැලගිය තැන් සොයා ගැන්මට පවා විදුලි ඉංජිනේරුවන්ට නොහැකි වූ බවයි. පත්‍රය පාඨකයා අතට පත්වන විට එහි නිවැරැදි හේතුව සොයා ගන්නට හැකි වී තිබෙන්නට පුළුවන. එහෙත් මේ තත්ත්වය දිගින් දිගටම සිදු වන්නේ නම් ඒ සඳහා නිසි විසඳුමක් සපයා දිය යුත්තේ කවුද?

විදුලි බල මණ්ඩලය කාලයක් තිස්සේ විවිධ මාෆියාවන් සම්බන්ධව කතාබහට ලක්ව ඇති ආයතනයකි. වරෙක ගල් අඟුරු මාෆියාවක් ගැන කරුණු එළියට ආවේය. තවත් විටෙක පෞද්ගලික විදුලි බලාගාරවලින් විදුලිය මිලයට ගැනීම ගැන අක්‍රමිකතා එළියට ආවේය. මේ අතර විදුලි ඉංජිනේරුවන්ගේ විවිධ මාෆියාවන් ගැනද කරළියට ආ අවස්ථා අපමණය. විදුලි ජනක යන්ත්‍ර සම්බන්ධ දූෂණයන් ගැනද වෘත්තීය සමිති විසින් චෝදනා නඟා තිබුණි.

කෙසේ හෝ පසුගියදා රටම දැඩි අපහසුතාවකට පත් කරමින් සිදු වූ මේ විදුලිය ඇණ හිටීමේ වගකීම ගන්නට කිසිවෙක් මේ දක්වා ඉදිරිපත්ව නැත. විදුලි බල මණ්ඩලයේ සභාපතිවරයාගේ සිට සියලු දෙනාම ඇඟ බේරා ගැනීමට හේතු සාධක ඉදිරිපත් කරනවා විනා මේ සිදුවීම වූයේ කෙසේද? නැවත එවැන්නක් ඇති නොවීමට කටයුතු කරන්නේ කෙසේද? යන්නට නම් විසඳුමක් සොයන බවක් නොපෙනේ. කෙරවලපිටිය නඩත්තු කටයුත්තක් අතරතුර සම්ප්‍රේෂණ පද්ධතියේ සිදු වූ දෝෂයක් නිසා දහවල් 12.35ට විදුලිය විසන්ධි වූ බව විදුලි බල මණ්ඩලයේ සභාපති විජිත හේරත් පළමුව පැවසීය. එහෙත් පසුගිය 19 වැනිදා ඔහු පැවසුවේ කෙරවලපිටියේ සිදුවූ අත්වැරැද්දකින් එය සිදුවූ බවයි.

බලාගාරයේ සිදු වූ එම අත්වැරැදීම නිසා පද්ධතියේ වූ බිඳ වැටීමක් නිසා මේ තත්ත්වය හටගෙන ඇති බව ඔහු පෙන්වා දුන්නේය. එම බිඳවැටීම නිසා නොරොච්චෝලෙ තාප විදුලි බලාගාරයේ සමතුලිතතාවයද බිඳ වැටී සමස්ත පද්ධතියම අක්‍රිය වූ බව ඔහු පවසයි.

කෙසේ වුවත් එදිනම රාත්‍රී 8.00 පමණ වන විට කොළඹ, ගම්පහ, කුරුණෑගල හා දකුණු පළාතේ බොහෝ ප්‍රදේශවලට විදුලිය සැපයීමට හැකි වූ බව ද ඔහු පවසයි. සෙසු ප්‍රදේශවලට විදුලිය සැපයීමට හැකි වූයේ රාත්‍රී 10.00ට පමණ බවද ඔහු කීය. කෙසේ වුවත් නොරොච්චෝලෙ බලාගාරය යථා තත්ත්වයට පත් වන තුරු විදුලිය අඛණ්ඩව සැපයීමක් කළ නොහැකි බව පවසන හේරත් මහතා අනිවාර්යෙන්ම පැයක කාලයක් විදුලිය බලය අත්හිටුවීමට සිදුවන බව කීවේය.

මේ සම්බන්ධව අදහස් දක්වමින් ලංකා විදුලි බල මණ්ඩලයේ පොදු සේවක සංගමයේ සභාපති මාලක වික්‍රමසිංහ සිළුමිණට පැවසුවේ විදුලි බල පාලන පද්ධතියක් පවා ස්ථාපිත කර ඇති අවස්ථාවක මෙවන් සිදුවීමක් ඇති වීම කිසිසේත්ම සුළුකොට නොතැකිය හැකි බවයි. එවන් තත්ත්වයක් ඇති වන්නේ නම් විදුලි ඉංජිනේරුවන්ගේ සේවය කුමකටද යන පැනය ඔහු විමසා සිටියේය. මෙවන් ක්‍රියා තාක්ෂණික හොරකම් බව පෙන්වා දුන් ඔහු පවසන්නේ මේ සම්බන්ධව ජනාධිපති කොමිසමක් පත් කර විසඳුම් සොයා ගත යුතු බවයි.

එහෙත් මණ්ඩලයේ නිදහස් පොදු සේවක සංගමයේ සභාපති ප්‍රියන්ත ප්‍රභාත් පවසන්නේ මෙය කඩාකප්පල්කාරී ක්‍රියාවක් නොවන බවත් එය බිඳවැටීමක ප්‍රතිඵලයක් බවයි. කෙරවළපිටිය අක්‍රිය වූ විට නොරොච්චෝල පද්ධතියේ බිඳ වැටීමක් සිදුව ඇති බවත් එහි පාලනය ගිලිහී මේ තත්ත්වය ඇති වූ බවත් ඔහු පැවසුවේය.

නොරොච්චෝල තාප විදුලි බලාගාරයේ අක්‍රිය වීමක් ඇති වුවහොත් එය සමස්ත විදුලි බල පද්ධතියටම දැඩි සේ බලපවත්වනු ඇත. එයට හේතු වන්නේ සමස්ත විදුලි බල සැපයුමෙන් 32.66%ක් එනම් 1/3ක් පමණ විදුලිය ලබා දෙන්නේ නොරොච්චෝලෙ ලක්විජය බලාගාරයෙන් වීමයි. මෙරට සමස්ත විදුලිබලයෙන් 50.21%ක් ජලවිදුලියෙන් නිපදවන අතර ඩීසල් ඉන්ධන භාවිතයෙන් 4.15%ක්ද සුළං බලයෙන් 0.58%ක්ද නිපදවනු ලැබේ. නොරොච්චෝලෙ විදුලි බලාගාරයෙන් දිනකට මෙගාවොට් පැය 810ක (900ක්) පමණ විදුලි උත්පාදනයක් සිදු කෙරෙන අතර මෙරට දෛනික විදුලි බල නිෂ්පාදනය ගිගාවොට් පැය 35.44ක් වන අතර දෛනික (කාර්යබහුල) විදුලි ඉල්ලුම මෙගාවොට් පැය 2203.44ක් වේ.

එම නිසා යම් හෙයකින් නොරොච්චෝල බලාගාරය බිඳ වැටීමක් සිදුවුවහොත් සමස්ත ශ්‍රී ලංකාවටම එය බලපානා බව මෙයින් පැහැදිලිය.

නොරොච්චෝල බලාගාරයේ විදුලි ජනක යන්ත්‍ර 3ම මේ සිදුවීමත් සමගම අක්‍රිය වී ඇත. යම් හෙයකින් මේ බලාගාරය අක්‍රිය වුවහොත් අක්‍රිය වූ හේතුව සෙවීමට පවා දින 3ක් පමණ ගත වන්නේ බලාගාරයේ අධික තාපය නිසා ඒ අසලටවත් යාමට නොහැකි වීම නිසයි. නොරොච්චෝල ලක්විජය බලාගාරය සිසිල්ව ඒ අසලට යාමට නම් දින 3ක් පමණ ගත වේ. එය ක්‍රියාකාරී තත්ත්වයට පත් කළ හැකි වන්නේ සිසිලනය කිරීමෙන්ද පසුවය. බලාගාර 3ම යථා තත්ත්වයට පත් කිරීමට නම් සතියක පමණ කාලයක් ගත වනු ඇත.

විදුලිය සැපයීම බිඳ වැටීම සම්බන්ධයෙන් විමර්ශනයට 7 දෙනෙකුගෙන් සමන්විත කමිටුවක් පත් කළ අතර එහි ප්‍රධානත්වය මහාචාර්ය රාහුල අතලගේ දරන මේ කමිටුව පසුගියදා කෙරවලපිටිය ග්‍රිඩ් උපපොළ වෙත ගොස් විදුලිය විසන්ධි වීමට හේතු වූ බව කියන ස්ථානය නිරීක්ෂණ කරන ලදී. එම කමිටුව ලබන සඳුදා වනවිට සිය වාර්තාව ලබාදෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. එමෙන්ම මේ විදුලිය විසන්ධි වීමට හේතුවූ කරුණු සම්බන්ධව විමර්ශනයක් පවත්වා දින තුනක් ඇතුළත වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිසම විසින්ද ලංකා විදුලි බල මණ්ඩලයට දැනුම් දී ඇත. කෙරවලපිටිය ප්‍රධාන විදුලි උපපොළේ නඩත්තු කටයුත්තක දී විදුලි අධිකාරිවරයෙකුගෙන් සිදුවූ අත්වැරදීමක් හේතුවෙන් විදුලිය විසන්ධි වීම සිදුවූ බව ලංකා විදුලිබල මණ්ඩලයේ අතිරේක සාමාන්‍යාධිකාරි (සම්ප්‍රේෂණ) ආචාර්ය සුසන්ත පෙරේරා සිකුරාදා පස්වරුවේ නිල වශයෙන් නිවේදනව කෙළේය.

විදුලිබල අමාත්‍ය ඩලස් අලහප්පෙරුම මහතා පසුගියදා විදුලිබල මණ්ඩලයේ පද්ධති පාලන ඒකකයේ හදිසි නිරීක්ෂණ චාරිකාවකට සහභාගීවූ අතර එහිදී ඇමැතිවරයා උපදෙස් ලබා දී ඇත්තේ පද්ධති පාලන ඒකකයේ ආරක්ෂාව වහාම ක්‍රියාත්මක වන පරිදි තර කරන ලෙසයි.

සමස්ත දිවයිනේම විදුලිබල සැපයුමේ ස්ථායිතාවය සුරැකෙන ප්‍රධානතම ස්ථානය වන පද්ධති පාලන මධ්‍යස්ථානය නිරන්තරයෙන් සුරක්ෂිත විය යුතු අතර රටේ අඛණ්ඩ විදුලි සැපයුම සම්බන්ධයෙන් අතිශය තීරණාත්මක හා සංවේදී මධ්‍යස්ථානයක් නිසි අයුරින් රැකගැනීම ජාතික වගකීමක් බවත් අමාත්‍යවරයා මෙහිදී පවසා ඇත. ඒ අනුව දැනට පද්ධති පාලන මධ්‍යස්ථානයේ ආරක්ෂාව සඳහා යොදවා සිටින නිලධාරීන්ට අමතරව විශේෂ කාර්ය බළකායේ නිලධාරීන් යෙදවීම සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් ආරක්ෂක ලේකම් මේජර් ජනරාල් (විශ්‍රාමික) කමල් ගුණරත්න මහතාගෙන් ඉල්ලීමක් කර තිබේ. කෙසේ වෙතත් විදුලිය ඇණ හිටීම නිසා කෝටි 500කට අධික පාඩුවක් සිදුව ඇති බවට මේ වන විට ගණන් බලා තිබේ. අවම වශයෙන් බත්තරමුල්ලේ ඉදි කර ඇති විදුලි බල පද්ධති පාලන මධ්‍යස්ථානයෙන් කරන්නේ කුමක්ද යන්න ජනතාවටද පැනයකි.

කෙසේ හෝ විදුලිය අර්බුදය තවමත් විසඳී නැත. මේ එහි පීල්ලෙන් ඉවතට ගිය එක් සිදුවීමක් පමණි. ජනතාවට පවා විදුලි සැර වැදීමට මණ්ඩලයේ මේ ක්‍රියාමාර්ග හේතු වී ඇත.



ලේක්හවුස් ආයතනයේ රාජ්‍ය සබඳතා දෙපාර්තමේන්තුව විසින් 2020 මහ මැතිවරණය වෙනුවෙන් ක්‍රියාත්මක කළ විශේෂ ප්‍රචාරණ ව්‍යාපෘතියට අදාළ වාර්තාව රාජ්‍ය සබඳතා ප්‍රධානි / කළමනාකරණ කර්තෘ සමන්ත කරුණාසේකර විසින් ලේක්හවුස් ආයතනයේ සභාපති ජනාධිපති නීතිඥ ඩබ්ලිව්. දයාරත්න මහතා ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පිළිගැන්වූ අවස්ථාව. ලේක්හවුස් ආයතනයේ මූල්‍ය අධ්‍යක්ෂ ජනක රණතුංග මහතාද මෙහි සිටී.

# උසස් පෙළටත් පෙළ පොත්!

**(තාරක වික්‍රමසේකර)**

උසස් පෙළ විෂයන් සඳහා පෙළපොත් ක්‍රමයක් ඇති කරනු ලබන බව අධ්‍යාපන අමාත්‍ය මහාචාර්ය ජී. එල්. පීරිස් පවසයි.

උසස් පෙළ පන්ති සඳහා විෂයන් ගණනාවකට පෙළපොත් නොමැති වීම හේතුවෙන් පාසල්වල පැනනැගී ඇති ගැටලුකාරී තත්වය සම්බන්ධයෙන් අවධානය යොමුකර මෙම ක්‍රියාමාර්ග ගන්නා බවද අමාත්‍යවරයා එහිදී පවසා ඇත. විශේෂයෙන්ම ග්‍රාමීය පාසල්වල මේ තත්ත්වය වඩාත් උග්‍ර වී ඇති බව අමාත්‍යවරයාට කරුණු පෙන්වා දීමෙන් පසුව මේ සම්බන්ධයෙන් කටයුතු කිරීමට අවධානය යොමු කර තිබේ.

පසුගිය 20 වැනිදා ප්‍රධාන පාසල් කිහිපයක විදුහල්පතිවරුන් සමග අමාත්‍යංශයේ පැවති සාකච්ඡාවක දී මේ සම්බන්ධව අවධානය යොමු කර ඇති අතර ඉදිරියේදී පාසල් විෂය මාලාව නවීකරණයට හා සංවර්ධනයට ඉදිරියේ දී නව කැබිනම් පත්‍රිකාවක් ඉදිරිපත් කරන බව ඇමැතිවරාය පවසා තිබේ.

පළමු වැනි පිටුවෙන්...

## ඉදිරි අයවැයේ...

මේ අනුව මෙරට මැටි ආශ්‍රිත කර්මාන්ත, වේවැල් කර්මාන්ත, මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්ත, ලී කැටයම් ඇතුළු දේශීය කර්මාන්ත නංවාලීම කෙරෙහි රජයේ වැඩි අවධානය යොමුව ඇති අතර ඉදිරි අයවැයෙන් මෙම කර්මාන්ත සඳහා විශාල ප්‍රතිපාදනයක් වෙන් කර දීමට ද රජයේ අවධානය යොමුව තිබේ.

## පාතාල ප්‍රබලයින්

නවීන පන්නයේ ගිනිඅවි වන ටී56 සහ ටී81 ඇතුළු ගිනි අවි 397ක්ද ඒවාට යොදන සජීවි පතොරම් 2,013ක් සැකකරුවන් 397 දෙනෙක් අත්අඩංගුවට ගැනීමටද පොලිසිය සමත්ව තිබේ.

එයට අමතරව අධිබලැති පුපුරණ ද්‍රව්‍ය ග්‍රෑම් 570ක්, ඩෙටනේටර් 28ක්, ජීව අත්බෝම්බ 45ක් සැකකරුවන් 38 දෙනෙක් සමඟ අත්අඩංගුවට පත්ව ඇති බවත් නීතිවිරෝධි මත්පැන් ලීටර් 598,578ක්ද පොලිසිය බාරයට ගෙන ඇත්තෙ සැකකරුවන් 26,811 දෙනෙක් සමඟ බවත් වෙනත් වැරැදි සඳහා අත්අඩංගුවට ගෙන ඇති සැකකරුවන් සංඛ්‍යාව 50,360ක් බවද පොලිස් මූලස්ථානය ප්‍රකාශකයෙක් හෙළි කෙළේය.

# රිදුණු පයට තණ පලසක්


## නුපුහුණු ශ්‍රමිකයන් ලක්ෂයකට රැකියා දීමේ වැඩ පිළිවෙළ ඇරඹේ


● නිහාල් පී අබේසිංහ


රාජ්‍ය ඇමැති අජිත් නිවාඩ් කබ්රාල්


මේජර් ජනරාල් නන්ද මල්ලවආරච්චි


මහාචාර්ය සරත් කොටගම


වෛද්‍ය හරිත අලුත්ගේ


මහාචාර්ය හේමන්ති රණසිංහ


වෛද්‍ය වින්යා ආරියරත්න

**අපේ රටේ 1971 දී හා 1988 – 89 වකවානුවේදී තරුණ කැරලි හා නැගිටීම් දෙකක් සිදුවිය. ඊට ප්‍රධාන හේතුව තරුණ අසහනය හා විරැකියාවයි. විශේෂයෙන් අඩු ආදායම්ලාභී දුප්පත් තරුණ තරුණියන්ට ගමේත් රටේත් නිසි පිළිගැනීමක් නොමැතිවීමත් ඔවුන්ට මූල්‍ය ශක්තියක් නොතිබීමත් අතදීමට මනා තාක්ෂණික පුහුණුවක් දීමට කවුරුවත් ඉදිරිපත් නොවීමත් නිසා මෙම තරුණ නැගිටීම් හා විප්ලව ඇති වූ බව සමාජ විශ්ලේෂකයන්ගේ අදහසයි.**

පසුගිය කාලයේ පැවැති රජයන් තරුණ අසහනයට විවිධ පැලැස්තර විසඳුම් දැමුවත් ස්ථිරසාර විසඳුමක් ලබාදීමට අසමත් විය. මේ නිසා තරුණ අසහනය වර්ධනය වන්නට ද විය.

නමුත් වත්මන් ජනපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ හා වත්මන් අගමැති මහින්ද රාජපක්ෂ මහතාගේ සුසංයෝගයෙන් යුත් වත්මන් රජය මෙරට තරුණ අසහනය අවම කිරීමට හා ඔවුන්ට හොඳ අනාගතයක් උදාකර දී සමෘද්ධිමත් රටක් ගොඩ ගැනීමට නව වැඩපිළිවෙළක් යෝජනා කර තිබේ.

ඒ අනුව මෙරට ප්‍රථම වරට අපොස සාමාන්‍ය පෙළ අසමත් ගමේ දරිද්‍රතාවයෙන් අන්තයටම පත්ව සිටින පවුල්වල තරුණ තරුණියන් ලක්ෂයකට රජයේ ස්ථිර විශ්‍රාම වැටුප් සහිත රැකියා ලබාදීමේ වැඩපිළිවෙළක් දැන් ක්‍රියාත්මක කර තිබේ.

### නව ශ්‍රම බළකායේ නිපුණතාව මගින් සමෘද්ධිමත් රටක් ඉක්මනට හදනවා

රාජ්‍ය අමාත්‍ය
අජිත් නිවාඩ් කබ්රාල්

‘සෞභාග්‍යයේ දැක්ම’ ප්‍රතිපත්ති ප්‍රකාශනය යථාර්ථයක් කරමින් ජනතා කේන්ද්‍රීය ආර්ථිකයක ඉහළ සමාජ සුබසාධනයක් උදෙසා අඩු ආදායම්ලාභී පවුල්වල අඩු අධ්‍යාපනයක් සහිත තරුණ තරුණියන්ට ස්ථාවර ආදායම් මාර්ගයක් ලබාදීම පිණිස මෙම වැඩපිළිවෙළ යටතේ තරුණයින් ලක්ෂයකට රැකියා ලබාදීම ඉදිරි මස සිට ඇරැඹීමට රජය කටයුතු කරයි.

මෙම අඩු ආදායම්ලාභී රැකියා ලක්ෂය ලබාදීම සඳහා සුදුස්සන් තේරීමේදී සෑම ග්‍රාම නිලධාරි වසමකම දරිද්‍රතාවයෙන් ඉහළම කොටස තෝරා ගැනීමට පියවර ගත යුතු බව ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා අදාළ නිලධාරීන්ට නියෝග කර ඇත.

මෙම වැඩපිළිවෙළේ ප්‍රධාන පරමාර්ථය සෞභාග්‍ය දැක්මේ ‘දිළිඳු බවින් තොර ශ්‍රී ලංකාවක් බිහි කිරීම’ බවත් එම සංකල්පය යටතේ එක් තිරසර හා ප්‍රධාන උපාය මාර්ගයක් ලෙස අඩු ආදායම්ලාභී පවුල්වල සිටින සාපෙ අසමත් අයට විධිමත් වෘත්තීය පුහුණුවක් ලබාදීමෙන් පසු රජයේ රැකියාවක් ලබාදීම සිදුකරන බවත් මෙම වැඩසටහන සම්බන්ධීකරණය කරන ජනාධිපති බහුකාර්ය සංවර්ධන කාර්ය බළකායේ අධ්‍යක්ෂ ජනරාල් විශ්‍රාමික මේජර් ජනරාල් නන්ද මල්ලවආරච්චි මහතා පවසයි.

ඒ අනුව මේ තරුණ පිරිස් තෝරා ගැනීම පිණිස දැන් සියලු කටයුතු ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා ජනාධිපති කාර්යාලය මගින් සිදු කරනු ලැබේ.

මෙම වැඩපිළිවෙළට අදාළව දැනට ඉල්ලුම්පත් ලක්ෂ 6 ½ ක් ලැබී ඇති බවත් ජනාධිපතිතුමාගේ උපදෙස් අනුව කිසිම දේශපාලන බේදයකින් තොරව ගම්වල සිටින වැඩිම දරිද්‍රතාවයෙන් අන්ත අසරණවූ සමෘද්ධි ආධාර නොලබන තරුණ පිරිස මේ සඳහා තෝරා ගෙන ලබන 2දා සිට පත්වීම් ලබාදෙන බවත් නන්ද මල්ලවආරච්චි මහතා පවසයි.

### ලක්ෂ 6 ½ ක් ඉල්ලුම් කළා. දේශපාලනය නැතිව දුප්පත්ම අය තෝරා ගන්නවා.

කාර්ය සාධක බළකා අධ්‍යක්ෂ
ජනරාල් මේජර් ජනරාල්
නන්ද මල්ලවආරච්චි

ඒ මහතා තව දුරටත් පවසන පරිදි මේ වැඩපිළිවෙළේදී වයස්ගත රෝගාතුර දෙමාපියන් හෝ ආබාධිත පුද්ගලයන් සිටින පවුලක කිසිම රැකියාවක් නොකරන තරුණ අයට මෙහිදී ප්‍රමුඛත්වය ලැබේ. එමෙන් ම සමෘද්ධි ආධාර ලැබීමට සුදුසු නමුත් නොලැබෙන තරුණ පිරිස පිළිබඳවත් මෙහිදී වැඩි අවධානය යොමුවේ.

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා ජනාධිපතිවරයා බවට පත්වීමෙන් පසු 2020 ජනවාරි - පෙබරවාරිවලදී මෙම රැකියා ලක්ෂය ලබාදීම පිණිස ඉල්ලුම්පත් කැඳවුවත් 2020 පාර්ලිමේන්තු මැතිවරණය ප්‍රකාශයට පත් කිරීමෙන් පසු මැතිවරණ කොමිසමේ නියමය අනුව එම වැඩසටහන ක්‍රියාත්මක කිරීම නැවැත්වීමට සිදුවිය. දැන් නව රජය පිහිටුවීමෙන් පසු ජනාධිපතිවරයා මේ අඩු ආදායම්ලාභී අයට විවිධ ක්ෂේත්‍ර 25 ක් යටතේ මනා පුහුණුවක් ලබාදී රැකියා ලක්ෂයක් ලබාදීමේ වැඩපිළිවෙළ දැන් ක්‍රියාවට නංවා ඇත.

පසුගිය ජනවාරි පෙබරවාරි මාසවල මේ සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට ලබාදුන් අයදුම්පත්‍රවල විස්තර අනුව ඒවා පිළිබඳව සොයා ලබන මස සිට පත්වීම් ලබාදීම සිදුකරනු ලැබේ.

මෙම රැකියා ලබාදීමෙන් පසු එම පවුල් දිළිඳු බවින් මුදවා ගැනීම හා ශ්‍රම බළකායේ නිපුණතා මගින් සමෘද්ධිමත් රටක් ගොඩනැගීමේ කාර්යයට සඵලදායි ලෙස මේ පිරිස දායක කර ගැනීමට කටයුතු කරන බවත් බහු කාර්ය සංවර්ධන කාර්ය සාධක බළකායේ අධ්‍යක්ෂ ජනරාල් නන්ද මල්ලවආරච්චි මහතා පවසයි.

### දුප්පත්, තරුණ පරපුරට අභිමානයක් ඇති කරන අවස්ථාවක්

මහාචාර්ය සරත් කොටගම

එක පවුලකින් ඉහත සුදුසුකම් සපුරා ඇති වයස 18 - 40 අතර එක් ඉල්ලුම්කරුවෙකු ගැන පමණක් සලකා බලනු ලැබේ. අයදුම්කරුවන් පදිංචි ගම් ආශ්‍රිත ප්‍රදේශවල පවතින රැකියා අවස්ථා සහ අයදුම්කරුවන් ඉල්ලා ඇති පුහුණු ක්ෂේත්‍ර සියල්ලම සැලකිල්ලට ගෙන අදාළ පත්වීම් කරනු ලැබේ.

තමා පදිංචි ප්‍රදේශ තුළ හෝ ආසන්න ප්‍රදේශවල ඇති පුහුණු මධ්‍යස්ථානවල දී මෙම පුහුණු සිදු කරනු ලැබේ. මෙම පුහුණුව බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බළකා දෙපාර්තමේන්තුව මගින් විධිමත් අයුරින් ලබාදෙනු ලැබේ.

සාර්ථක පුහුණුවකින් පසු පදිංචි ප්‍රදේශයේ හෝ ආසන්න ප්‍රදේශවල රැකියාවල නිරත කිරීමට අපේක්ෂිතය. ඒ අයට මාස හය (06) ක අඛණ්ඩ පුහුණු කාලය තුළ මසකට රුපියල් 22500 ක දීමනාවක් ගෙවනු ලැබේ. සාර්ථක පුහුණුවීමකින් පසුව තමාට ලැබෙන ක්ෂේත්‍රයට අදාළව, තමාගේ ස්ථිර පදිංචි ප්‍රදේශය තුළ රජයේ අනුමත ප්‍රාථමික ශිල්පීය නොවන (PL 1) රජයේ ස්ථිර තනතුරකට පත්වීමට පුහුණුලාභීන්ට අවස්ථා ලැබේ.

වසර 10 ක සතුටුදායක අඛණ්ඩ සේවා කාලයක් සපුරාලීමෙන් පසුව රජයේ විශ්‍රාම වැටුප් හිමිකම ලැබෙන බව ජනාධිපති කාර්ය සාධක බළකාය පවසයි. ජාතික ආධුනිකත්ව මණ්ඩලය පුහුණු වැඩපිළිවෙළ මෙහෙයවයි.

මේ වැඩපිළිවෙළ පිළිබඳව අපට අදහස් දැක්වූ මුදල් හා ප්‍රාග්ධන වෙළෙඳ පොළ ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍ය අජිත් නිවාඩ් කබ්රාල් මහතා පවසන්නේ රැකියා ලක්ෂයේ වැඩපිළිවෙළ මගින් දුප්පත් පවුල්වලට සිය ශක්තියෙන් ම නැගී සිටීමට අවස්ථාවක් ලැබෙන බවයි. එමෙන් ම මේ නව ශ්‍රම බළකායේ නිපුණතාව මගින් සමෘද්ධිමත් රටක් බිහිවනු ඇති බව ද ඇමැතිවරයා පවසයි.

දුප්පත් පවුල්වලට සමෘද්ධිය ලබාදීමට වඩා ඔවුන්ට තම පවුලේ සාමාජිකයකුට රැකියාවක් ලබාදීම මගින් ඔවුන්ට දිගටම දියුණුවක් ඇති කර ගන්නට පුළුවන්. සමෘද්ධිය ලබාදෙන විට යැපුම් මානසිකත්වය ඇතිව අනුන් මත යැපෙන්නට මේ පවුල්වල තරුණ පරපුරටත් සිදුවෙනවා. නමුත් රැකියාවක් දුන් විට ඒ ගැටලුව අවම ස්වශක්තියෙන් නැගී සිටීමට අවස්ථාව ලැබෙනවා. එවිට පවුලේ ආර්ථික ප්‍රවර්ධනයක් ඇතිවේවි. මෙය තරුණ පිරිසට ලැබුණු හොඳ අවස්ථාවක්. අපේ රටේ සාමාන්‍ය පෙළ අසමත් තරුණ තරුණියන් බොහොම දෙනෙක් අසහනයකින් සිටින්නේ ඒ ඒ අයට රජයේ තබා පෞද්ගලික ආයතනවලටත් රැකියා නැති කමින් කොරෝනා උවදුරත් සමඟ ඒ තත්ත්වය තවත් දරුණු වුණා. ඒ නිසා මේ අවස්ථාව අපේ තරුණ පරපුරට ලැබුණු ස්වර්ණමය අවස්ථාවක්. ඔවුන් කළ යුත්තේ අදාළ පුහුණුව හරියට ලබාගෙන අදාළ රැකියාව හරියට සිදුකර ඒ ඒ ආයතනවල ස්ථිර පත්වීම් ලබාගෙන තම පවුල දුප්පත්කමින් මුදවාගෙන රටට ජනතාවට උපරිම සේවයක් සිදු කිරීමයි.

මේ වැඩපිළිවෙළ පිළිබඳව ජනාධිපතිතුමා ඉතා උනන්දුවෙන් කටයුතු කරනවා. එතුමට අවශ්‍ය මේ යටතේ සුදුසුම පිරිස තෝරා ඒ අයට රැකියා ලක්ෂය ලබාදීම බව ද කබ්රාල් මහතා පැවසීය. මේ වැඩසටහන පිළිබඳව අදහස් දක්වන කොළඹ විශ්වවිද්‍යාලයේ පරිසර විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ සම්මානිත මහාචාර්ය සරත් කොටගම මහතා පවසන්නේ මේ වැඩපිළිවෙළ මගින් මෙතෙක් කල් අභිමානයක් නැතිව තිබූ තරුණ පිරිසකට සමාජ අභිමානයක් මෙන් ම නැගී සිටීමට අත හිත දීමක් සිදුවෙන බවයි.

### මේ මගින් රටේ තිරසර සංවර්ධන සමාජ දර්ශක ඇති කරනවා

රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ
සංගමයේ හිටපු ලේකම් හා
සංස්කාරක
වෛද්‍ය හරිත අලුත්ගේ

“මේ අයට අධ්‍යාපනය නොතිබුණාට ලොකු සහජ හැකියාවන් උපන් දක්ෂකම් තිබෙන්න පුළුවන්. ඒ දක්ෂතාව දියුණු කළ හැකි, ඔවුන් කැමැති වෘත්තියක් තුළින් ඉහළට ගොස් ඉදිරියේදී ඒ ක්ෂේත්‍ර ඔස්සේ නැගිටීමටත් මේ වැඩපිළිවෙළ උපයෝගි වෙනවා.

මෙහිදී මේ ලක්ෂයට ඇතුළත් වන සමහරු දේශපාලන හිතවත්කම් අනුව පත්වීම් ලබන්න පුළුවන්. නමුත් ඒ අය කළ යුත්තේ ඒ සම්බන්ධකම් හා අඩු ආදායම් මට්ටම් වෙනස්කර ජීවිතය ජය ගැනීමට කටයුතු කිරීමයි. ඒ සඳහා ඔවුන්ගේ මනසේ වර්ධනයක් ඇති කර පුහුණුවක් ලබාදීමත් වැදගත්.

මෙතෙක් කල් මේ තරුණ පිරිසට කවුරුවත් හරියට සැලකුවේ නැහැ. ඒ වගේ ම මේ අයට හොඳ වෘත්තිය පුහුණුවක් දුන්නෙත් නැහැ. ඒ නිසා ඒ අය ත්‍රිරෝද රියදුරු වගේ දියුණුවක් නැති රැකියාවල ද නිරත වෙන්න ඇති. නමුත් ඒවාට වඩා මේ වැඩපිළිවෙළ ඒ තරුණ පිරිසගේ ජීවිත ඉදිරි ගමනට ඉමහත් ප්‍රයෝජනයක් වන බව ද මහාචාර්ය කොටගම පවසයි.

මේ පිළිබඳව කරුණු දක්වන රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමයේ හිටපු ලේකම් හා සංස්කාරක වෛද්‍ය හරිත අලුත්ගේ මහතා පවසන්නේ මේ වැඩපිළිවෙළ මගින් රට තුළ තිරසර සංවර්ධන සමාජ දර්ශක ඇති කළ හැකි බවයි.

### තෝරා ගැනීම උපරිම සුදුසුකම් අනුව පමණක්ම සිදුවිය යුතුයි

මහාචාර්ය හේමන්ති රණසිංහ

අද අපේ රටේ ශ්‍රම බළකායේ පුරප්පාඩු රැසක් පවතිනවා. ඒ සමගම විරැකියාවක් තිබෙනවා. මේ වැඩසටහන මගින් අපේ රටේ විරැකියාවත් අඩු වී ශ්‍රම බළකාය වැඩිවී රටේ සංවර්ධනය වැඩි වනවා. හැබැයි මේ වැඩපිළිවෙළට පසු විපරමක් අත්‍යවශ්‍යයි.

අද අපේ රටේ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ පුරප්පාඩු රැසක් පවතිනවා. අද රෝහලක ටැප් එකක් ලයිට් එකක් කැඩුණාම හදාගන්න කෙනෙක් නැහැ. නමුත් මේ ලක්ෂයට අයත් පුහුණුව ලැබූ පුද්ගලයකු මගින් එවැනි විවිධ රෝහල්වල පවතින අඩු පාඩු සකස් කිරීමට යෙදවිය හැකියි.

රජය අදහස් කරන්නේ විශේෂයෙන් මේ අයට සාත්තු සේවා පවිත්‍රතා සේවා සහායක, ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධන සහායක, විදුලි කාර්මික, ජල නළ කාර්මික යන ක්ෂේත්‍රවලට අදාළ පුහුණුව දී රැකියාවලට යොමු කිරීමටයි. ඒ අනුව මේ වැඩපිළිවෙළ හරියට නියාමනය කළොත් සෞඛ්‍ය නියාමනය ක්ෂේත්‍රයේ ආයතනවලටත්, රටටත් ලොකු සහනයක්.

මේ වැඩපිළිවෙළ පිළිබඳව කරුණු දක්වන ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ වන විද්‍යා හා පාරිසරික විද්‍යා මහාචාර්ය හේමන්ති රණසිංහ මහත්මිය පවසන්නේ මෙම වැඩපිළිවෙළ මෙරට තරුණ ප්‍රශ්න හා තරුණ අසහනය අවම කිරීමට ඉතා හොඳ වැඩපිළිවෙළක් බවයි.

නමුත් මෙම වැඩපිළිවෙළ දේශපාලනීකරණය වීම වැළැක්විය යුතු ය. දේශපාලන බේදයෙන් තොරව සුදුසුම දුප්පත්ම අය මීට තෝරා ගැනීම ජනාධිපති කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ ලොකු වගකීමක්.

නැත්නම් මේ තරුණ තරුණියන් රැකියාවට ඇවිත් තම දේශපාලන අවශ්‍යතා හා පුළුවන්කාරකම් මත රාජකාරි අතපසු කිරීම හෝ නොකර සිටීම කළහොත් මේ වැඩපිළිවෙළේ පරමාර්ථ ඉටු වෙන්නේ නෑ.

මේ වැඩපිළිවෙළ මගින් රැකියා දෙන පිරිස කරන කටයුතු පිළිබඳව නිසි පසු ඇගැයීමක් හා අධීක්ෂණයක් සිදුකිරීම අත්‍යවශ්‍ය බවත් කිව යුතුයි.

විශ්ව විද්‍යාලවලට පසුගිය කාලයේ පත්වීම් ලැබ පැමිණි සමහර අය තම දේශපාලන මතිමතාන්තර හිතේ තබාගෙන කටයුතු කිරීම නිසා පරිපාලනයට බාධා එල්ල වුණු බවත් මේ පත්වීම් ලබන අය එසේ නොකළ යුතු බවත් මහාචාර්යවරිය පෙන්වා දෙන්නේය.

ශ්‍රී ලංකා යෞවන සමාජ සම්මේලනය පරිපාලන ලේකම් තරුණ සේවා සභාවේ සහකාර අධ්‍යක්ෂ (විශේෂ ව්‍යාපෘති) චන්න ගුණරත්න මහතා පවසන්නේ මේ වැඩපිළිවෙළ ඉතා කාලෝචිත වැඩපිළිවෙළක් බවයි.

පවුල් ඒකකවල මෙතෙක් කල් තිබුණු නොවිසඳුණු ගැටලු විසඳා ගැනීමටත් පවුලේ ආර්ථික ප්‍රවර්ධනයටත් මේ වැඩපිළිවෙළ හේතු වෙනවා.

ඒ සමගම මෙතෙක් කල් සමාජ පිළිගැනීමක් නැතිව තිබූ තරුණ පිරිසට අදාළ වෘත්තිය පිළිබඳව පුහුණුවත් සමඟ සමාජ පිළිගැනීමත් මේ මගින් ලැබෙනවා.

තරුණ අසහනය නැති කිරීමට මෙතෙක් කල් තරුණ සේවා සභාව මගින් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කළත් මේ තරම් තරුණ පරපුරේ දියුණුවට කෙළින් ම ඉවහල් වන මෙවැනි වැඩපිළිවෙළක් මෙතෙක් ක්‍රියාත්මක වුණේ නැහැ. වත්මන් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ අදහසක් අනුව මහින්ද රාජපක්ෂ අගමැතිවරයා ඇතුළු රජය ක්‍රියාත්මක කරන මේ වැඩපිළිවෙළ අපේ යෞවන සමාජවල ක්‍රියාකාරී සාමාජිකයින් වන තරුණ තරුණියන්ගේ රැකියා විරහිත බව නැති කිරීමට ද ඉවහල් වන බව ද චන්න ගුණරත්න මහතා පවසයි.

### මේ අය ව්‍යවසායකයන් බවටත් පත්කළ යුතුයි

සර්වෝදය සභාපති
විශේෂඥ වෛද්‍ය
වින්යා ආරියරත්න

මේ පිළිබඳව අපට කරුණු දැක්වූ සර්වෝදය ව්‍යාපාරයේ සභාපති විශේෂඥ වෛද්‍ය වින්යා ආරියරත්න මහතා පවසන්නේ මෙය ඉතා හොඳ වැඩපිළිවෙළක් බවයි.

මේ අය විභාගවලින් සමත් නොවුණත් මේ හැම තරුණයකුටම තරුණියකටම කිසියම් ක්ෂේත්‍රයක් ගැන කුසලතාවක් තිබෙනව; තිබෙන්න පුළුවන්. අද තිබෙන තත්ත්වය අනුව ඒ අයගේ තිබෙන දක්ෂකම් හා නිර්මාණශීලිත්වය අනුව සේවා ආර්ථික අවස්ථාවකට යොමු වෙන්න පුළුවන්. ඒ අනුව සාම්ප්‍රදායික රජයේ රැකියාවලට මේ අය ගන්න එකට එහා ගිහිල්ලා සැලසුම් සහගතව එක එක අයදුම්කරුවන්ගේ තිබෙන කුසලතාවන් හා හැකියාවන් තක්සේරු කරලා ඒ අය නව ව්‍යවසායකයන් මට්ටමට යොමු කළ යුතුයි.

රජයෙන් ලැබෙන රස්සාවකට එහා ගිය වැඩපිළිවෙළක් මේ සමග ක්‍රියාත්මක විය යුතුයි. රජයේ රැකියා දැන් සංතෘප්ත වෙලා තිබෙන්නේ. මේ අයට සුදුසු පුහුණුව දී අලුතින් රැකියා උත්පාදනය කිරීම සඳහා මේ අය අලුත් ව්‍යවසායකයෝ ලෙස සමාජයට ලබාදෙන්න පුළුවන් නම් ඉතා වැදගත්.

ඒ මගින් අපේ වැටුණු ආර්ථිකය ඉහළ නංවන්න දායකත්වයක් ලැබිය යුතුයි.

### දුප්පත් තරුණයන්ට සමාජ පිළිගැනීමක් ඇතිකරන වැඩ පිළිවෙලක්

ශ්‍රී ලංකා යෞවන සමාජ
සම්මේලනයේ
පරිපාලන ලේකම්
චන්න ගුණරත්න

මේ තරුණ පිරිස සිටින භූගෝලීය ප්‍රදේශයේ සම්පත් පිළිබඳව බද්ධ කරලා තොරතුරු තාක්ෂණය එකතු කරලා කරන අලුත්ම රැකියා උත්පාදන වැඩසටහනක් බවට මෙය පත් කරන්න පුළුවන් නම් රටට තවත් සෙතක් වේවි. මේ අවස්ථාවේදී දෙන පුහුණුවත් විවිධ තරුණයන්ගේ දක්ෂතා හා ප්‍රදේශයේ තිබෙන අවශ්‍යතා අනුව සුදුසු ලෙස ලබාදිය යුතු බව ද වින්යා ආරියරත්න මහතා පවසයි.

ශ්‍රී ලංකා යෞවන සමාජ සම්මේලනයේ හිටපු ලේකම් ෂෙහාන් කෝෂිල කන්නන්ගර මහතා පවසන්නේ මේ වැඩපිළිවෙළ මගින් අපේ රටේ දුප්පත් අඩු අධ්‍යාපන සුදුසුකම් ඇති තරුණ පරපුරේ අනාගතය සුරක්ෂිත හා වැඩදායි බවට පත් කරන බවයි.

අපේ රටේ අද සමහර තරුණයන්ට අඩු අධ්‍යාපන මට්ටම් හා අඩු ආදායම් තත්ත්ව නිසා සමාජ විරෝධී කටයුතුවලට යොමුවී තිබෙනවා. මත්ද්‍රව්‍යවලට යොමු වෙලා. ඒවා විකුණන ඇතැම් තරුණයින් ඊට යොමු වෙන්නේ ඒ අයට හරි ආදායමක් ජීවන වෘත්තියක් හා වෘත්තීය පුහුණුවක් නැති නිසා. ඒ අනුව මේ නව වැඩපිළිවෙළ අපේ තරුණ පරපුරට හොඳ පුහුණුවක් දී රැකියා දෙනවා. එවිට තම ජීවිත ගැටලු අවම කර ගැනීමට ලොකු පිටුබලයක් වෙනවා. ගමත් රටත් දියුණුවට එයත් රුකුලක්.

අපේ යෞවන සමාජවල සිටින වැඩිපුර ක්‍රියාශීලී සමහර තරුණ තරුණියන්ට රස්සාවල් නැහැ. අධ්‍යාපනයත් අඩුයි. නමුත් ඒ අය ක්‍රියාශීලීයි. මේ අනුව මේ වැඩපිළිවෙළ මගින් එවැනි ක්‍රියාශීලී තරුණ පරපුරක් ඇති ශ්‍රම බළකායක් අපේ රාජ්‍ය සේවයට යොමුවීම මගින් ඒ පිරිසේ පමණක් නොව රටේත් දියුණුව ස්ථිරයි” ඔහු කීය.

## ප්‍රවීණ මාධ්‍යවේදී රොහාන් වැලිවිට අගමැති මාධ්‍ය ලේකම් ලෙස යළිත් පත්වෙයි

අගමැති මහින්ද රාජපක්ෂ මහතාගේ මාධ්‍ය ලේකම් ලෙස ප්‍රවීණ මාධ්‍යවේදී රොහාන් වැලිවිට මහතා පත්කර ඇත. ඊට අදාළ පත්වීම් ලිපිය අගමැති ලේකම් ගාමිණී සෙනරත් මහතා විසින් අග්‍රාමාත්‍ය කාර්යාලයේදී රොහාන් වැලිවිට මහතාට ලබා දුන්නේය.

ස්වාධීන රූපවාහිනී සේවයේ වැඩසටහන් කළමනාකාර හා ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ධූරයේ කටයුතු කළ රොහාන් වැලිවිට මහතා 2000 වර්ෂයේ දී ඉන් ඉවත්ව අග්‍රාමාත්‍ය මාධ්‍ය උපදේශක ධූරයට පත්විය.

2000 වර්ෂයේදී අගමැති මහින්ද රාජපක්ෂ මහතා ධීවර අමාත්‍යවරයා ලෙස සිටි සමයේ ඔහුගේ මාධ්‍ය උපදේශක ලෙස කටයුතු කරනු ලැබූ රොහාන් වැලිවිට මහතා, පසුව මහින්ද රාජපක්ෂ මහතා විපක්ෂ නායක ධූරය දරන කාලයේදී ද ඔහුගේ මාධ්‍ය ලේකම්වරයා විය.

2004 වර්ෂයේ මහින්ද රාජපක්ෂ මහතා අගමැති ධූරයට පත් වූ අවස්ථාවේ අගමැති මාධ්‍ය ලේකම් ලෙස හා 2005 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා ජනාධිපති සම්බන්ධීකරණ ලේකම් ලෙස ද ඒ මහතා කටයුතු කළේය.

2015 සිට මහින්ද රාජපක්ෂ මහතා විපක්ෂයේ කටයුතු කරන සමයේ ද අනතුරුව විපක්ෂ නායක ධූරය දරන කාලයේදී ද ඔහුගේ මාධ්‍ය ලේකම් ලෙස කටයුතු කළේ ද රොහාන් වැලිවිට මහතාය.

එමෙන්ම, 2018 වර්ෂයේ පත් වූ දින 52 ආණ්ඩුව සමයේ අගමැති මාධ්‍ය ලේකම්වරයා ද 2019 වර්ෂයේ පත් වූ නව රජය යටතේ, අගමැති කාර්යය මණ්ඩල ප්‍රධානීගේ මාධ්‍ය ලේකම් ධූරයේ ද රොහාන් වැලිවිට මහතා කටයුතු කළේය.


ප්‍රවීණ පරිපාලන නිලධාරී හා අගමැති ලේකම් ගාමිණී සෙනරත් මහතා විසින් රොහාන් වැලිවිට මහතාට අගමැති මාධ්‍ය ලේකම් තනතුරට අදාළ පත්වීමේ ලිපිය පිරිනැමූ අවස්ථාව.

## මාතලේ මහතලා සම්මාන උලෙළට ඉල්ලුම්පත් කැඳවයි

මාතලේ දිස්ත්‍රික් සාහිත්‍ය කලා සංසදය, එක්ව මහතලා සාහිත්‍ය අනුකමිටුව සංවිධානය කරන මහතලා සාහිත්‍ය කලා මහෝත්සවය 2020 එළැඹෙන සැප්තැම්බර් 25, 26,27 තෙදින තුළ මාතලේ නගරය කේන්ද්‍ර කොටගෙන අති උත්කර්ශවත් අයුරින් පැවැත්වේ.

මෙම සාහිත්‍ය උලෙළට සමගාමී මාතලේ දිස්ත්‍රික්කයේ නිර්මාණකරුවන් අතර විවෘත සාහිත්‍ය නිර්මාණ තරගාවලියක් පැවැත්වීමට කටයුතු සංවිධානය කොට තිබේ. ඒ අනුව පද්‍ය, ගීත, කෙටිකතා වශයෙන් නිර්මාණ අංශ තුනක් යටතේ නිර්මාණ කැඳවීම මේ දිනවල සිදු කෙරේ. නිර්මාණකරුවන්ට තමන් අභිමත තේමාවක් යටතේ එක් අංශයකට එක් නිර්මාණයක් ඉදිරිපත් කිරීමේ පදනම මත තරග අංශ තුනටම ඉදිරිපත් විය හැකි ය. ඉදිරිපත් කරනු ලබන නිර්මාණ මින් පෙර ජයග්‍රහණ හිමි වූ හෝ මුද්‍රණයෙන් පළ නොවූ ඒවා විය යුතු ය. ආරම්භයක් වශයෙන් මෙම තරගය සිංහල මාධ්‍යයෙන් පමණක් පැවැත්වේ.

ඉදිරිපත් කරනු ලබන සෑම නිර්මාණයක් ම නිර්මාණකරුවාගේ නම, ලිපිනය සහ දුරකතන අංක සහිතව තමා විසින් ම සකස් කළ අයදුම්පත්‍රයක් සමඟ 2020 සැප්තැම්බර් 10 දිනට ප්‍රථම ලිපි කවරයේ වම් කෙළවර මහතලා සාහිත්‍ය නිර්මාණ තරගය - (පද්‍ය/ගීත/කෙටිකතා) ලෙස සටහන් කර ලේකම්, දිස්ත්‍රික් සාහිත්‍ය කලා සංසදය, සංස්කෘතික මධ්‍යස්ථානය, මාතලේ යන ලිපිනයට තැපැල් මගින් එවිය යුතු ය. ජයග්‍රාහිකයන්ට මහතලා සාහිත්‍ය කලා මහෝත්සවයට සමගාමීව සැප්තැම්බර් මස 27 දින මාතලේ සංචාරක හෝටල් පාසල් ශාලාවේ පැවැත්වෙන මහතලා සාහිත්‍ය උලෙළේදී මහතලා සාහිත්‍ය සම්මාන, සහතික සහ ත්‍යාග පිරිනැමේ. තරගයේ ප්‍රථම දෙවන තුන්වන ස්ථානවලට අමතරව සෑම අංශයක් සඳහා ම කුසලතා සහතික 10 බැගින් ද ප්‍රදානය කිරීමට නියමිතය.

තරගයට ඉදිරිපත් කෙරෙන නිර්මාණ අතරින් මුද්‍රණයට සුදුසු මට්ටමේ නිර්මාණ ප්‍රකාශයට පත් කිරීමට මහතලා සාහිත්‍ය අනුකමිටුව අපේක්ෂා කරයි. මාතලේ දිස්ත්‍රික් සාහිත්‍ය කලා සංසදයේ සහ මහතලා සාහිත්‍ය අනුකමිටුවේ සාමාජිකයන්ට මෙම තරගය සඳහා ඉදිරිපත්වීමට නොහැකිය. මේ පිළිබඳ වැඩිදුර විස්තර සඳහා 0715907383 ගාමිණී නිශාන්ත කරුණාරත්න - සභාපති, සෝමරත්න හරස්ගම - ලේකම් 0714639393 යන අය අමතන ලෙස ඉල්ලීමක් කෙරේ.



ජනාධිපතිවරයා හා එම ආර්යාව පාර්ලිමේන්තුවට සම්ප්‍රාප්ත වූ අවස්ථාව



තේ පැන් සංග්‍රහයේදී අගමැතිතුමා මන්ත්‍රීන් පිරිසක් සමඟින්

**ජනපති වෙනුවෙන් චාම් පිළිගැනීමක්**

**දේශපාලන පක්ෂ 12 ක මහජන නියෝජිතයන් 222**

**වසර 73 කට පසු එජාප මන්ත්‍රීවරයකු නොසිටි පාර්ලිමේන්තුවක්**

● සුභාෂිණී ජයරත්න

# පාර්ලිමේන්තුවට අභිමානයක් ගෙන දුන් මංගල සැසිය

**මෙරට ව්‍යවස්ථාදායකයේ කේන්ද්‍රස්ථානය වූ පාර්ලිමේන්තු සංකීර්ණය පසුගියදා සැදි පැහැදි සිටියේ තවත් පස් වසරක ප්‍රජාතන්ත්‍රවාදී පරිච්ඡේදයක සමාරම්භය සනිටුහන් කරන්නටය. පසුගිය 20 වැනිදා දින ගණනාවක විවේකයෙන් අනතුරුව පාර්ලිමේන්තුව නැවතත් පණ ලබන්නට වූයේ 9 වැනි පාර්ලිමේන්තුවේ පළමු මංගල සැසිවාරයටය.**

මෙවර මැති සබය නියෝජනය කරන විවිධ පක්ෂ පාටින් යුතු දිදුලන ධජ පතාක වලින් පාර්ලිමේන්තු පිවිසුම් මඟ අභිමානවත් විය. වෙනදා නොතිබූ නිහඬත්වය මඳකට වෙනස් කරමින් සැවොම සැදි පැහැදී සිටියේ නවවැනි පාර්ලිමේන්තුවට තේරී පත්වූ නවක මැති ඇමැතිවරුන් පිළි ගන්නටය. මෙදා පාර්ලිමේන්තුව නියෝජනය සඳහා පැමිණි බොහෝ දෙනෙක් නවක යන් වූ නිසාම ඒ අත්දැකීම සමීප කර ගන්නට ඔවුන් පැමිණ සිටියේ සිය සමීප හිතවතුන් සමඟය. මේ නිසා වෙනදාටත් වඩා පාර්ලිමේන්තු සංකීර්ණය මෙදා අතිශයින්ම කාර්ය බහුල විය. උදෑසන 9.30 ට ගණ පූරණ සීනුව නාද වීමෙන් අනතුරුව නව වැනි පාර්ලිමේන්තු සභා ගර්භය වෙනදා නොතිබූ උද්යෝගයකින් මැති ඇමැතීන්ගෙන් පිරෙන්නට වූයේ නව රාජකාරි රැසක ආරම්භය සනිටුහන් කරමිනි.

මෙවර පාර්ලිමේන්තුවට තේරී පත්වූ බොහෝ දෙනෙක් තරුණ මන්ත්‍රීවරු විය. මේ අතර පාර්ලිමේන්තුවට නුහුරු අලුත් මුහුණු 81 ක් විය. මෙවර කාන්තා මන්ත්‍රීවරියන් 12 දෙනෙක් තේරී පත් වූ අතර ඔවුන් සියල්ලම මෙවර මැති සබයට පැමිණ සිටිනු දක්නට ලැබුණි. පාර්ලිමේන්තු ආරම්භක දින මන්ත්‍රීවරුන්ට අසුන් පැනවීමේදී කිසිදු විශේෂත්වයක් සිදු නොවූයෙන් ඔවුහු තම හිතමිතුරන් සමඟ රිසි ස්ථාන වල අසුන් ගත්හ.

උදෑසන 9.30 පාර්ලිමේන්තු ගණ පූරණ සීනුව නාද වීමත් සමඟ පාර්ලිමේන්තුවේ ආරම්භය සනිටුහන් වූයේ සුපුරුදු පරිදි වේත්‍රධාරි විසින් සභා ගැබට සෙංකෝලය ගෙන ඒමත් සමඟය.

සෙංකෝලය පහළ අසුනේ තැන්පත් කෙරුණේ ඒ වන විටත් නව කථානායක පත් කර නොතිබූ හෙයිනි. පාර්ලිමේන්තු මහ ලේකම් ධම්මික දිසනායකගේ නිවේදන වලින් අනතුරුව නව පාර්ලිමේන්තු සැසි වාරයේ අතිශයින්ම වැදගත් කටයුත්ත වූ නව කථානායකවරයා පත්කර ගැනීම පෙ.ව 9.40 ට සිදුවිය. 9 වැනි පාර්ලිමේන්තුවේ අභිනව කතානායකවරයා තෝරා පත්කර ගැනීම නිවේදනය කිරීමෙන් අනතුරුව ඇමැති දිනේෂ් ගුණවර්ධන නැගී සිටිමින් නව කතානායකවරයා ලෙස පාර්ලිමේන්තු මන්ත්‍රි මහින්ද යාපා අබේවර්ධනගේ නම යෝජනා කළ අතර ස්ථිර කිරීම සමගි ජන බලවේගයේ රංජිත් මද්දුමබණ්ඩාර විසින් සිදු කළේය. වෙනත් නම් නොතිබුණෙන් 9 වැනි පාර්ලිමේන්තුවේ 26 වන නව කථානායවරයා ලෙස මහින්ද යාපා අබේවර්ධන පත්වූ අතර පාර්ලිමේන්තු මහ ලේකම් ධම්මික දසනායක විසින් නව කථානායකවරයා ලෙස මහින්ද යාපා අබේවර්ධනගේ නම ප්‍රකාශයට පත් කළේ සියලු දෙනාගේ අත්පොළසන් මධ්‍යයේය. අනතුරුව යෝජනා ස්ථිර කළ මන්ත්‍රීවරුන් දෙපළ විසින් නව කථානායකවරයා කථානායක අසුන වෙත කැඳවාගෙන යාම සම්ප්‍රදායට මුල් තැන දෙමින් සිදුවිය.



නව කථානායක මහින්ද යාපා අබේවර්ධන අසුනට කැඳවා ගෙන යමින්

## නව කථානායකගේ නොසැලෙන දේශපාලන දිවියට පක්ෂ නායකයන්ගේ පැසසුම්

නව කථානායක මහින්ද යාපා අබේවර්ධනට පාර්ලිමේන්තුවේ සිවු දෙසින්ම සුබ පැතුම් ගලා එන්නට විය. මුලින්ම සුබ පැතුම් එක්කළේ අගමැතිවරයාය. ඉන් අනතුරුව සමගි ජන බලවේගයෙ නායක සජිත් ප්‍රේමදාස, දෙමළ ජාතික සංධානයේ නායක ආර්. සම්බන්ධන් , මුස්ලිම් කොන්ග්‍රස් නයක රවුෆ් හකීම්, ඊළාම් ජනතා පක්ෂයේ ඩග්ලස් දේවානන්ද, ජනතා විමුක්ති පෙරමුණු නායක අනුර කුමාර දිසානායක, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වෙනුවෙන් මෛත්‍රිපාල සිරිසේන, ඇමැතිවරුන් වන විමල් වීරවංශ, උදය ගම්මන්පිල ,සමස්ත ලංකා මුස්ලිම් කොංග්‍රසය වෙනුවෙන් රිෂාඩ් බදියුදීන්, ප්‍රජාතාන්ත්‍රික වාමාංශික පෙරමුණ වෙනුවෙන් වාසුදේව නානායක්කාර, සිවනේෂතුරේයි චන්ද්‍රකාන්ත හෙවත් පිල්ලෙයාන්, මෙන්ම සි.වී විග්නේශ්වරම් ඇතුළු පාර්ලිමේන්තු පක්ෂ නියෝජිතයින් රැසකගේ සුභාශිංසන පැයක කාලයක් පුරාවටම පිරිනැමුණි.

නවවන පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය කථානායකවරයා ලෙස පාර්ලිමේන්තු මන්ත්‍රි රංජිත් සියඹලාපිටිය පත් කරගත්තේ ඉන් අනතුරුවය.

ඇමැති මහින්ද අමරවීර විසින් ඔහුගේ නම යෝජනා කළ අතර රාජ්‍ය ඇමැති නිමල් ලන්සා විසින් ඒ යෝජනාව ස්ථිර කරන ලදී. නිමල් සිරිපාල ද සිල්වා සහ දුමින්ද දිසානායක යන මන්ත්‍රීවරුන්ගේ යෝජනා ස්ථිරත්වයෙන් නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා ලෙස පාර්ලිමේන්තු මන්ත්‍රී අංගජන් රාමනාදන් පත්විය. පළමු සැසි වාරයේ පළමු දින පාර්ලිමේන්තු ඉතිහාසයට සුවිශේෂි දිනයකි. දේශපාලන පක්ෂ 12 ක මහජන නියෝජිතයින් 222 දෙදෙනෙක් මෙදා පළමු සැසි වාරයට එක්විය. මේ වන විට බන්ධනාගාර ගතව සිටින රත්නපුර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රි ප්‍රේමලාල් ජයසේකර පාර්ලිමේන්තුවට පැමිණ නොසිටි අතර එක්සත් ජාතික පක්ෂයෙන් හා අපේ ජන බල පක්ෂයෙන් ජාතික ලැයිස්තු මන්ත්‍රීධුර පත් කර නැති නිසා ඒ අඩුවත් පැහැදිලිව පෙනෙන්නට විය. කෙසේ වෙතත් වසර 73 කට පසු එක්සත් ජාතික පක්ෂ මන්ත්‍රීවරයෙකු නොසිටි පාර්ලිමේන්තුවක් දක්නට ලැබීම පාර්ලිමේන්තු ඉතිහාසයේ සුවිශේෂි ලක්ෂණයක් විය. මේ අතර රක්ෂිත බණ්ධනාරගතව සිටින සිවනේෂතුරේයි චන්ද්‍රකාන්ත හෙවත් පිල්ලෙයාන් පාර්ලිමේන්තුවට පැමිණ සභා ගැබ ඇමතීම සුවිශේෂිය.

9 වැනි පාර්ලිමේන්තුවේ මංගල සැසිය ආරම්භ වූයේ සවස 2.45 ටය. ආචාර වෙඩි මුර ඇතුළු අනවශ්‍ය වියදම් අවම කරමින් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂයන් හා එම මැතිනියගේ සම්ප්‍රාප්තිය සිදුවූයේ චාම හා අභිමානවත් අන්දමින් පාර්ලිමේන්තු සම්ප්‍රදාය සුරකිමිනි. 9 වැනි පාර්ලිමේන්තුවේ මංගල සැසිය සඳහා සපැමිණි ජනාධිපතිවරයා පිළිගනු ලැබූයේ නව කතානායකවරයා විසින් මඟුල් බෙර මධ්‍යයේය. මෙවර විශේෂත්වය වූයේ ජනාධිපතිවරයා වෙනුවෙන් කිසිදු අශ්වාරෝහක කණ්ඩායමක් හෝ අමතර වාහන කිසිවක් සහභාගි කර නොගැනීමයි.

9 වැනි පාර්ලිමේන්තුවේ මංගල සැසිය උත්සවාකාරයෙන් විවෘත කිරීමේ අවස්ථාව සනිටුහන් වූයේ පස්වරු 3 ටය. ඒ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපතිවරයා විසින් නව රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමත් සමඟය. මුලින්ම නව තනතුරුවලට පත්වූ කථානායක ඇතුළු පිරිසට සුබ පැතුම් එක් කළ ජනාධිපතිවරයා කොවිඩ් වසංගත කාලයේ ලොව සියලු රටවල් පරදවමින් එම අභියෝගයට රජය සාර්ථකව මුහුණ දුන් ආකාරය ප්‍රකාශ කළේය. ඉන් අනතුරුව නව රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශය ඉදිරිපත් කරමින් කතා කළ ජනාධිපතිවරයා රටේ සැම අංශයක්ම ආවරණය කරමින් ඉදිරියේදි ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සංවර්ධන සැලැස්ම විස්තර කළේය.

නව සැසිවාරයේ කටයුතු අවසන් වූයේ සතුටු සාමිචි මැද ගෙවුණු තේ පැන් සංග්‍රහයකින් අනතුරුවය.

මේ අතර පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 114 හි විධිවිධාන ප්‍රකාරව නව වැනි පාර්ලිමේන්තුවේ පළමු සභාවාරයේ සේවය කිරීම සඳහා කථානායක මහින්ද යාපා අබේවර්ධන ගේ සභාපතීත්වයෙන් සාමාජිකයන් 12 දෙනෙකුගෙන් සමන්විත තේරීම් කාරක සභාවක් පත්විය. නිමල් සිරිපාලද සිල්වා, දිනේෂ් ගුණවර්ධන , ජොන්ස්ටන් ප්‍රනාන්දු, ඩග්ලස් දේවානන්ද, ඩලස් අලහප්පෙරුම, විමල් වීරවංශ, ප්‍රසන්න රණතුංග, ලක්ෂ්මන් කිරිඇල්ල, ගයන්ත කරුණාතිලක, රවුෆ් හකීම්, විජිත හේරත්, සෙල්වම් අඩෛක්කලනාදන් යන මැති ඇමැතිවරු මීට ඇතුළත්ය. මේ අතර සමගි ජන බලවේගයේ පාර්ලිමේන්තු මන්ත්‍රි මනූෂ නානායක්කාර කථානායකවරයාගෙන් ඉල්ලා සිටියේ මන්ත්‍රී සී. වි විග්නේශ්වරම් කතාවේ ඇතුළත් ජාතිවාදී කොටස් හැන්සාඩ් ගත කිරීමෙන් වළකින ලෙසයි.

ඡායාරූ - ගයාන් පුෂ්පික, දුෂ්මන්ත මායාදුන්න, සුලෝචන ගමගේ

● ජයසූරිය උඩුකුඹුර

# ‘අපි කැපවීමෙන් කටයුතු කළොත් අභියෝග ජය ගන්න පුළුවන්’

**මුදල්, ප්‍රාග්ධන වෙළඳපොළ සහ ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍ය**
**අජිත් නිවාඩ් කබ්රාල්**

■ **රාජ්‍ය සේවයෙන් දේශපාලනයට ඇවිල්ලා මැතිවරණයකදී තරඟ නොකර ඔබට ලැබුණ රාජ්‍ය අමාත්‍ය ධුරය පිළිබඳව මොනවද හිතන්නේ?**

අපේ රටේ දුර්වල වී තිබෙන ආර්ථික ක්ෂේත්‍ර ගණනාවක් තිබෙනවා. ඒ හැම අංශයක්ම ගොඩ ගන්න ඕන. ඒ කාර්යය අපට කරන්න පුළුවන් කියන විශ්වාසයෙන් තමයි ජනාධිපතිවරයා අපිට වගකීම් පවරලා තිබෙන්නෙ. ජනාධිපතිවරයා දැනටමත් ප්‍රකාශයට පත් කර තිබෙන සෞභාග්‍යයේ දැක්ම වැඩ සටහනේ කොටසක් තමයි මේ අමාත්‍ය ධුර හරහා අපට පවරලා තිබෙන්නේ. ඒ නිසා අපි උපරිම උත්සහයෙන් ඒ කාර්යය සාර්ථක කර ගන්න තමයි කටයුතු කර ගෙන යන්නේ. ජනාධිපතිතුමා අපේක්ෂා කරන ආකාරයට අපි කැපවීමෙන් කටයුතු කළොත් පමණයි අපිට මේ අභියෝග ජය ගන්න පුළුවන්නෙ.

■ **ඔබ මහ බැංකුවේ හිටපු අධිපතිවරයා හැටියට ඒ රාජකාරි අත්දැකීම මේ අමාත්‍ය ධුරයත් එක්ක ගළපා ගන්න පුළුවන්ද?**

මහ බැංකුවේ වගකීම තමයි මූල්‍ය ක්ෂේත්‍රයේ ස්ථායීභාවය රැක ගැනීම. රුපියලේ අගය රැකගනිමින් අපේ රටේ ආර්ථිකය සමබරව පවත්වා ගැනීම මහ බැංකුවට පැවැරෙන වගකීම්. මුදල් අමාත්‍යාංශයට පැවැරෙන වගකීම ඊට වඩා හුගක් පුළුල් කියලයි මම හිතන්නෙ. රටේ ආර්ථික වර්ධනය සඳහා යම් පිබිදීමක් ඇති කිරීම තමයි අමාත්‍යාංශයට පැවැරෙන වගකීම. මහ බැංකුව මුදල් අමාත්‍යාංශයේ එක් ආයතනයක් විතරයි. ඒ අනුව ගත්තාම මුදල් අමාත්‍යාංශයේ සංයුතිය හුගක් විශාලයි. ඒ කටයුතු කරන්න මට මහ බැංකුවේ අධිපතිවරයා හැටියට ලැබුණු අත්දැකීම් බෙහෙවින් ප්‍රයෝජනවත් වෙනවා.

■ **සාම්ප්‍රදායික දේශපාලනඥයෙක් නොවන ඔබ රාජ්‍ය සේවයෙන් දේශපාලනයට පැමිණි අයෙක්. මේ ගැන ඔබට තිබෙන්නේ මොන වාගේ හැඟීමක්ද?**

ජනාධිපති හා අගමැතිවරයාත් මෙවර විශාල අවධානයක් යොමු කර තිබෙනවා වෘත්තීයමය අත්දැකීම් සහිත වියතුන් පිරිසක් පාර්ලිමේන්තුවට පත් කර ගන්න. ඒ අනුව මැතිවරණ ව්‍යාපාරය තුළ එතුමලා කළ ඉල්ලීමට ඇහුම් කන් දුන් ජනතාව සාම්ප්‍රදායික ජ්‍යෙෂ්ඨ දේශපාලනඥයන් පස්සට තල්ලු කර අලුත් වියතුන් පිරිසක් පත් කර එවා තිබෙනවා. ඒ වාගේම මෙවර ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ජාතික ලැයිස්තුවත් සකස්වෙලා තිබුණේ විවිධ වෘත්තීය කුසලතා ඇති වියතුන් ගෙන්. ඒ අනුව තමයි මටත් පාර්ලිමේන්තුව නියෝජනය කරන්න අවස්ථාව ලැබුණේ.



ජනතාව පසුගිය කාලය පුරාවටම කියපු ප්‍රධාන කාරණයක් තමයි ජරා දේශපාලනයක් තියෙන්නෙ කියලා. ඒක යම් ප්‍රමාණයකට වෙනස් කරල දේශපාලන ක්ෂේත්‍රයේ නැවුම් බවක් ඇති කරල ජනතාව තුළ අලුත් බලාපොරොත්තුවක් ඇති කරන්න මේ නායකයන් සමත් වෙලා තිබෙනවා. ඔබත් දන්නවා, ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ මන්ත්‍රී කණ්ඩායමෙන් 60%ක්ම අලුත් මුහුණු. ජනාධිපති, අගමැති හා බැසිල් රාජපක්ෂ යන නායකයන් දැන් ඒ අලුත් හා අත්දැකීම් බහුල පැරණි කණ්ඩායමත් එකතු කරගෙන රට අලුතින් ගොඩ නගන්න පෙරමුණ ගෙන තිබෙනවා.

■ **ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ කියල තිබුණා, මම මගේ වගකීම ඉටු කරන්නම්; ඔබ ඔබේ යුතුකම ඉටු කරන්න කියලා. ජනතාව ඒ යුතුකම ඉටුකරලා තිබෙනවා නේද?**

ඔව්, ඇත්ත වශයෙන්ම ජනතාව ඔවුන් ගේ යුතුකම උපරිමයෙන් ඉටුකරල තිබෙනවා. ඒ වාගේම ජනාධිපතිවරයාත් ඔහු ගේ වගකීම ඉතාමත්ම නිවැරදිව ඉටුකරන්න පුළුවන් අමාත්‍ය මණ්ඩලයක් පත් කරල ශ්‍රී ලංකා දේශපාලන ඉතිහාසයේ මෙතෙක් නොදැකපු නොකෙරුණු ආකාරයට ඉලක්ක ගතව අමාත්‍යාංශයන්ට වගකීම් පවරලා තිබෙනවා. ඒ වාගේම ඒ හැම අමාත්‍යවරයකුටම ඉලක්කයක් ලබා දී තිබෙනවා. මෙමඟින් කෙටි කාලයක් ඇතුළත ජනතාවට දැනෙනාකාරයට යම් සංවර්ධනයක් කරන්න පුළුවන් වෙනවා කියලයි මම හිතන්නෙ.

■ **ඔබලා නිරතුරුව සඳහන් කළ ආකාරයට යහපාලනය විනාශ කළ ආර්ථිකය කොවිඩ් 19 නිසා තවත් පහළට වැටුණා. මේ අර්ථිකය ගොඩ ගැනීමේ අභියෝගයට ඔබලා මුහුණ දෙන්නෙ කොහොමද?**

අපේ රටේ ආර්ථිකය ඉකුත් පස්වසර තුළ දිගින් දිගටම පිරිහෙමින් බලා සිටියදීම රට අභාග්‍ය සම්පන්න තත්ත්වයට පත් වුණා. පාස්කු ප්‍රහාරය හා කොවිඩ් 19 වසංගත තත්ත්වය රටේ ආර්ථිකය තවත් බරපතළ ලෙස අර්බුදයකට තල්ලු කලා.මේ නිසා අපේ අලුත් ආණ්ඩුවට බරපතළ ගැටලු රාශියකට මුහුණ දෙන්න සිද්ධ වී තිබෙනවා.නමුත් අපිට ඒවා ගැන කතා කරමින් අඬ අඬා ඉන්න බෑ.අපි දැන් ඒ අභියෝගය ජය ගත හැකි ක්‍රමවේද කෙරෙහි අවධානය යොමු කරල ඊට අදාළ සැලසුම් සකස් කරමින් ඉන්නවා.

**රජය වැරදි නම් ඒක පෙන්වා දෙන්න ජනතාවට අයිතියක් තියෙනවා**

■ **ජනතාවට පීඩාවක් නොදී රටේ ආර්ථිකය ගොඩ ගන්නවා කියන්නේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වැනි ආයතනවල රටට නොගැළපෙන කොන්දේසිවලට යට වෙලා ණයට මුදල් ගැනීමකට යොමු වීමක්ද?**

ඔබ ඔය ප්‍රශ්නයට පසුබිම් කර ගන්නේ යහපාලන ආණ්ඩුවේ ආර්ථික වැඩ පිළිවෙළ වෙන්න ඕනේ. නමුත් අපි ඒ ආකාරයට ජනතාව රවටලා රටට හානිවන කිසිම දෙයක් කරන්නෙ නෑ. ඔබ දන්නවා, මෙරට පැවැති යුද්ධය නිම කරන අවස්ථාවේ ලෝකයේම තිබුණු ආර්ථික අවපාතය අපටත් බලපෑවා. ඒ වෙලාවෙදිත් අපි ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ණය ගත්තා. හැබැයි කොන්දේසි වලට යට වෙලා නොවෙයි. අපේ ආණ්ඩුව ගැන ජාත්‍යන්තරය තුළ විශාල පිළිගැනීමක් තිබෙනවා. ඒ නිසා අපිට ජාත්‍යන්තර සහයෝගය කොන්දේසි විරහිතව මිත්‍රශීලීව ලබා ගන්න පුළුවන්. අනෙක අපි විදෙස් ගනුදෙනුවලදී එක ක්‍රමයක් ගැන විශ්වාසය නොතබා විකල්පයන් රැසක් කෙරෙහි අවධානය යොමු කර අපිට ගැළපෙන ආකාරයට පමණයි කටයුතු කරන්නේ.

■ **මෙවර අමාත්‍ය මණ්ඩලය පත් කිරීමේදී ඒ ඒ අමාත්‍යවරුන්ට විෂයන් බෙදා දීම සමහර අයගේ සමච්චලයට ලක්වෙලා.ඒ ගැන මොනවද හිතන්නේ?**

මෙවර අමාත්‍ය මණ්ඩලය නම් කිරීමේදී කිසිම ඇමතිවරයෙකුට මඟ හැර යා නොහැකි ලෙස වගකීම් පවරලා තිබෙනවා. ඒ වාගේම රටේ ජනතාවටත් තමන් ගේ ගැටලු ඉදිරිපත් කරන්න නිශ්චිත පුද්ගලයන් හා ආයතන ඇති කරල තිබෙනවා.බුලත් ගොවියාට,මැටි කර්මාන්ත කරුවාට තඹ කර්මාන්ත කරුවා වැනි දේශිය කර්මාන්ත කරුවන්ට දැන් තමන් ගේ ගැටලුවලට විසඳුම් ලබා ගන්න රටේ එක එක අය පිටිපස්සේ යන්න වුණ කාලය නිමා කරල තිබෙනවා. මේ නිසා රටතුළ දේශිය නිෂ්පාදන ක්ෂේත්‍රයේ වේගවත් දියුණුවක් අපේක්ෂා කරන්න පුළුවන්. ඒකට මම එක උදාහරණයක් පෙන්වන්නම්. මහවැලි යෝජනා ක්‍රමය පටන් ගත්තාම ඒ ව්‍යාපෘතිය අයත් වන්නේ වාරිමාර්ග විෂයටයි. නමුත් වාරිමාර්ග විෂයෙන් වෙන් කරල මහවැලි සංවර්ධන අමාත්‍යාංශයක් වෙනම ස්ථාපිත කිරීම නිසා තමයි ඒ ව්‍යාපෘතිය සාර්ථකකර ගෙන කෙටි කාලයකදී ප්‍රතිඵල නෙළා ගන්න පුළුවන් වුණේ. ඒ අනුව තමයි මෙවර අමාත්‍ය මණ්ඩලයට දේශීය නිෂ්පාදන ඉලක්ක කර ගෙන විෂයයන් බෙදලා තිබෙන්නේ. මෙහි ඇති විශේෂත්වය තමයි ඇමති මණ්ඩලයේ සාමාජික සංඛ්‍යාවත් සීමා කරමින් මේ කාර්ය කිරීම ගැන අපි සතුටු වෙන්න ඕනෑ.

**මහ බැංකුවේ සිදු වූ මූල්‍ය වංචාවට සම්බන්ධ බවට චෝදනා එල්ල වූ සියලු දෙනාටම ජනතාව හොඳ පාඩමක් උගන්වලා තිබෙනවා**

■ **රජය රැකියා විරහිත උපාධිධාරීන්ට මෙන්ම අඩු ආදායම්ලාභී පවුල්වල ලක්ෂයකට රැකියා දෙන්න කටයුතු කරමින් ඉන්නේ මැතිවරණයේ කෙලෙහි ගුණ සලකන්නද?**

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂයන් ගේ මේ අව්‍යාජ උත්සහය දෙස කවුරු හරි දේශපාලන කෝණයකින් බලලා ඒක විවේචනය කරනවා නම් ඒ ගැන ඒ අයම ලජ්ජා වෙන්න ඕන. මොකද රැකියා විරහිත උපාධිධාරීන් පාරේ ඇවිදිමින් අරගල කරද්දී එදත් කිසිදු බේදයකින් තොරව රැකියා ලබා දුන්නේ මහින්ද රාජපක්ෂ රජයෙන්. අද මේ රජය කරන්නෙත් ඒකමයි. අනෙක රැකියා වරප්‍රසාද අහිමිව ඉන්න පවුල් තෝරා ගෙන ඔවුන්ටත් රජයේ රැකියාවක් සඳහා අවස්ථාව දීම වරදක්ද?

■ **අපක්ෂපාතීව මේ කාර්ය සිදු නොවන බවට චෝදනා එල්ල වෙනවා.?**

මේ වැඩ පිළිවෙළේදී කාට හරි අසාධාරණයක් අකටයුත්තක් සිදුව තිබෙනවා නම් ඒ ගැන තමන් පදිංචි දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් හරහා ජනාධිපති ලේකම් වරයාට පැමිණිලි කරන්න පුළුවන්. එවැනි පැමිණිලි ගැන අවධානය යොමු කරලා ජනාධිපති ලේකම් කාර්යාලය ඒවාට විසඳුම් ලබා දෙන්න පියවර ගන්නවා.




'යහපාලන' ආණ්ඩු සමයේ රැකියා විරහිත උපාධිධාරී පිරිස් උද්ඝෝෂණයන්හි නිරතවූ අයුරු



රැකියා විරහිත උපාධිධාරීන් සමඟ ජනාධිපති ඉකුත් බ්‍රහස්පතින්දා සංවාදයේ යෙදෙන අයුරු

**ප්‍රථමවරට ජනාධිපතිවරයෙක් උද්ඝෝෂකයන් හමුවට එයි**

**නව පත්වීම්ලාභීන්ට අනිවාර්යෙන් වසරක පුහුණුවක්**

**නව රාජ්‍ය අමාත්‍යාංශවල ඉලක්ක සපුරා ගැනීමටද උපාධිධාරී රැකියාලාභීන් යොමු කිරීමේ වැඩපිළිවෙළක්**

# රාජ්‍ය යාන්ත්‍රණය ශක්තිමත් කිරීමට උපාධිධාරීන් 60,000 කට රජයේ රැකියා

● රසික කොටුදුරගේ

**ජනාධිපතිවරණයට පෙර සිටම රැකියා විරහිත උපාධිධාරීන් වෙනුවෙන් රැකියා ලබා දීමට ලබා දුන් පොරොන්දුව අනුව මේ වසරේ පෙබරවාරි මාසයේ සිට උපාධිධාරීන්ට හා අඩු ආදායම්ලාභීන්ට රැකියා ලබාදීමට කටයුතු ආරම්භ කළද පාර්ලිමේන්තු මහ මැතිවරණය හේතුවෙන් එම වැඩපිළිවෙළ තාවකාලිකව අත්හිටුවීමට ආණ්ඩුවට සිදු විය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 8 වැනි පරිච්ඡේදයේ විධිවිධාන ප්‍රකාරව, ව්‍යවස්ථාදායකය ස්ථාපනය කිරීමට ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා පියවර ගැනීමත් සමඟ මැතිවරණයට ප්‍රථම පොරොන්දු වූ පරිදි සුදුසුකම් සපිරූ රැකියා විරහිත උපාධිධාරීන් 51,135ක් සේවා නියුක්ත කිරීම පසුගියදා ආරම්භ විය. ඒ අනුව තෝරා ගනු ලැබූ රැකියාලාභී උපාධිධාරීන්ගේ නාම ලේඛනය රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ වෙබ් අඩවියේ පළ කෙරිණ.**

පාසල් අධ්‍යාපනයට යොමුවන සෑම ශිෂ්‍යයකුගේම එකම බලාපොරොත්තුව සරසවි වරම් ලැබීමය. ඒ අරමුණ කරා යාමට පෙළගැසෙන සිසු දරුවෝ තරගකාරී විභාගවලට මුහුණ දෙති. සාමාන්‍යයෙන් මෙරට පළමු ශ්‍රේණිය සඳහා වසරකට ළමයින් 3,40,000ක් පමණ ඇතුළත් වන අතර, ඉන් උසස් පෙළ විභාගය සමත් වී විශ්වවිද්‍යාලයට පිවිසෙන්නේ 23,000 – 25,000ත් අතර පිරිසකි. විවෘත විශ්වවිද්‍යාලය ද ඇතුළත්ව මෙරට පිහිටුවා ඇති විශ්වවිද්‍යාල සංඛ්‍යාව 18කි. පීඨ සංඛ්‍යාව 80කි. දෙපාර්තමේන්තු ගණන 460 කි. සාමාන්‍යයෙන් මෙම විශ්වවිශ්වවිද්‍යාල පද්ධතිය තුළ අධ්‍යාපනය හදාරණ සිසුන්ගෙන් 20,000ට අසන්න පිරිසක් වාර්ෂිකව උපාධිධාරීන් ලෙස සමාජගත වේ.

දහසක් බලාපොරොත්තු සිත්හි දරාගෙන සරසවි වරම් ලබා ගන්නා මේ තරුණ තරුණියෝ නව ජීවිතයකට ආසාවෙන් උපාධිය සම්පූර්ණ කරති. ඒ සඳහා තරගකාරී විභාග රැල්ලට මුහුණ දෙන විශ්වවිද්‍යාල විද්‍යාර්ථීහු ඒ සඳහා රෑ නිදි නිදිවරා වෙහෙස මහන්සි වෙති. මෙලෙස දැඩි ආර්ථික අපහසුතා මධ්‍යයේ වසර කිහිපයක් උසස් අධ්‍යාපනය හදාරන විද්‍යාර්ථීන්ට එකම පිහිට වන්නේ මහපොළ ශිෂ්‍යාධාරය හා විශ්වවිද්‍යාල නේවාසිකාගාරය. ඒත් මේ පහසුකම් පවා නොලබන ශිෂ්‍ය ශිෂ්‍යාවෝද විශ්වවිද්‍යාල පද්ධතියේ සිටිති.

මෙතරම් දුෂ්කරතා මධ්‍යයේ වසර තුන හතරක් අධ්‍යාපනය හදාරා උපාධිය ලබා විශ්වවිද්‍යාලයෙන් පිටවන්නේ පසු උපාධියට සරිලන රැකියාවක් ලැබීමේ අපේක්ෂාවෙනි. ඒත් ඒ බලාපොරොත්තු එලෙසින් ඉටු නොවී එම උපාධිය ද තබාගෙන කුඩා පෞද්ගලික ආයතනවල ඡායා පිටපත් කිරීමට, පරිගණක අකුරු ඇමිණීමට සිදුවන්නේ නම් උගත් බුද්ධිමත් තාරුණ්‍යයට අත්වන ඉරණම කුමක්ද? එවන් රටකට අත්වන ඉරණම කුමක් ද?

මෙරට උගත් බුද්ධිමත් පරපුර වෙනුවෙන් රැකියා අවස්ථා පිරිනැමීමේ ඉතිහාසය දෙස බලන විට 1960 දශකයේ දී පිහිටුවා තිබූ රැකීරක්ෂා කාර්යාලය ගැන අවධානය යොමු කළ හැකිය. එකල අධ්‍යාපනය පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ හා උසස් පෙළ විභාගවලට ඉදිරිපත් වූවන් හා ඒ විභාගවලින් සමත් වූවන් මෙම රැකියා කාර්යාංශයේ ලියාපදිංචි වූ පසු ඔහුට හෝ ඇයට කාඩ්පතක් හිමි විය. එම ලියාපදිංචිය අනුව පුරප්පාඩු ඇති වූ විට රැකියා ලබා දෙන ලදී. රැකියා නොලබන පිරිස සෑම වර්ෂයක ම තමන්ට රැකියා නොලැබුණු බව රැකියා කාර්යාලයට දැනුම් දුන් පසු තමන්ට හිමි කාඩ් පතේ මුද්‍රාවක් සටහන් කරනු ලැබිණි. ඒ අනුව වර්ෂයෙන් වර්ෂයට කාඩ් පතේ සටහන්වන මුද්‍රා ප්‍රමාණය රැකියාවක් ලබා ලබා ගැනීමට සුදුසු කමක් විය. එහෙත් උපාධිධාරීන්ට රැකියා දීමේ නිසි ප්‍රතිපත්තියක් නොවීම උපාධිධාරීන්ට කරනු ලබන අසාධාරණයකි. එය රටක් අසමත් වූ අවස්ථාවකි.

1976 සමගි පෙරමුණු රජය උපාධිධාරීන්ට රැකියා යම් ප්‍රමාණයක් ලබා දීමට කටයුතු කළේය. පසුව 1977 දී එවක ජනාධිපතිව සිටි ජේ. ආර්. ජයවර්ධන ගේ උපදෙස් අනුව සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයේ කොටසක් ලෙස රැකියා බැංකුවක් පිහිටුවනු ලැබුවද ඉන් මන්ත්‍රීවරුන්ගේ නිර්දේශ මත පමණක් රැකියා ලබා දුන්නේය. විධායක නොවන තනතුරුවලට පත් කිරීම ද මෙම රැකියා බැංකුවෙන් සිදු විය. එතැන් සිට 1983 දක්වා උපාධිධාරීන්ට රැකියා ලබාදීමට පැහැදිලි වැඩපිළිවෙළක් ක්‍රියාත්මක වී නොතිබුණි. පසුව මහාචාර්ය ජී. එල්. පීරිස්ගේ ප්‍රධානත්වයෙන් තරුණ අසහන කොමිසන් සභාව පිහිටුවා මේ පිළිබඳව නිර්දේශ ඉදිරිපත් කළ අතර, රැකියා ලබාගැනීම සඳහා කම්කරු අමාත්‍යාංශයේ ලියාපදිංචි වීම ක්‍රියාත්මක කෙරිණි. ඒ අනුව යමින් 1999 දී එකවර රැකියා 10,000ක් උපාධිධාරීන්ට ලබා දීමට කටයුතු කළේය. අනතුරුව 2002 දී තරුණ තරුණියන්ට බ්‍රේෂ්ලට් දාන චුයින්ගම් කන යුගයක් උදා කරන බවට වහසි බස් දොඩමින් බලයට පත් වූ එක්සත් ජාතික පෙරමුණ ආණ්ඩුව එකදු පත්වීමක් හෝ ලබා නොදී උපාධිධාරීන් නොසලකා හැරියේය. ඉන් නොනැවතුණු එම රජය 2002 වසරේ මැයි 23 වැනිදා නිකුත් කළ ගැසට් නිවේදනයකින් රජයේ රැකියා ලබාදීම නතර කිරීමට කටයුතු කළේය. වරින්වර 'තරුණ අරුණ', 'රැකියා පියස', 'සරසවි සවිය' ආදී මාතෘකා දේශපාලන අවශ්‍යතා මත කරළියට පැමිණියද උපාධිධාරීන් තුළ ඇති කළේ ඉටු නොවන බලාපොරොත්තු ගොන්නක් පමණි. උපාධිධාරීන් මහ මග රස්තියාදු විය.

**සුදුසුකම් සපුරා ඇති සියලු උපාධිධාරීන් හට ඔවුන් විසින් හදාරා ඇති විෂය මාලාව අනුව අදාළ ක්ෂේත්‍රයේ රැකියා සඳහා යෙදවීමට පියවර ගන්නා ලෙස ජනාධිපතිතුමා විෂය භාර නිලධාරීන්ට උපදෙස් දී ඇත. රාජ්‍ය සේවයේ ඇති දුර්වලතා සහ අඩු පාඩු මග හැරෙන ලෙස රැකියාගත පුහුණුවක් ලබාදීමේ අවශ්‍යතාවද මෙහිදී ජනාධිපතිතුමා අවධාරණය කළේය.**

පසුව 2005 ජනාධිපතිවරණයෙන් බලයට පැමිණි මහින්ද රාජපක්ෂ ආණ්ඩුව උපාධිධාරීන් 42,000 කට එකවර නව රැකියා අවස්ථා හිමි කර දුන්නේය. ඒ එදා මෙදාතුර කිසියම් ආණ්ඩුවක් විසින් උපාධිධාරීන්ට ලබාදුන් වැඩිම රැකියා අවස්ථා ප්‍රමාණය හිමි කර දෙමිනි.

පසුව 2011 වර්ෂයේ උපාධිධාරී අභ්‍යාසලාභීන් ලෙස පරිපාලන දිස්ත්‍රික්ක 25ම ආවරණය වන පරිදි 53,000 පිරිසක් රාජ්‍ය සේවයට බඳවා ගනු ලැබිණි. ඉන් වැඩි පිරිසක් කුරුණෑගල දිස්ත්‍රික්කය නියෝජනය කරන උපාධිධාරීන් විය. එය සංඛ්‍යාත්මක වශයෙන් 6,778කි. මීට අමතරව ගාල්ල දිස්ත්‍රික්කයෙන් 4,169ක් ද, මාතර දිස්ත්‍රික්කයෙන් 4,083 ක්ද යාපනය දිස්ත්‍රික්කයෙන් 1,778 ආදි වශයෙන් බඳවා ගනු ලැබීය. එකවර පනස් දහස ඉක්ම වූ උපාධිධාරීන් පිරිසකට රජයේ රැකියා ලබාදීම තමන්ට විශාල අභියෝගයක් වූ බවත්, එය ජනාධිපති මහින්ද රාජපක්ෂයන්ගේ පූර්ණ ආශිර්වාදය නිසා ජය ගැනීමට හැකි වූ බව එවක විෂයභාර අමාත්‍යවරයා ලෙස සිටි ඩබ්ලිව්. ඩී. ජේ සෙනවිරත්න කියා සිටියේය.

ඒ උපාධිධාරීන් වෙනුවෙන් ආණ්ඩු කටයුතු කළ ආකාරයයි. දැන් සෞභාග්‍යයේ යුගය ඇරඹී ඇත. ඒ අනුව 2020 පෙබරවාරි - මාර්තු මාසවල රැකියා සඳහා සුදුසුකම් ලබා සිටි උපාධිධාරීන්ට රැකියා ලබා දීම වෙනුවෙන් පසුගියදා කටයුතු කෙරිණි. එහෙත් එය උපාධිධාරීන්ට ගැටලුවක් විය. මැතිවරණයට පෙර නිකුත් කළ ලේඛනයේ ඇතැම් නම් ලේඛනයෙන් ඉවත් කර ඇතැයි චෝදනාවක් නැඟිණි. අප මේ පිළිබඳව රාජ්‍ය සේවා, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් ජේ. ජේ. රත්නසිරිගෙන් විමසූ විට ඔහු පවසා සිටියේ "ඇතැමුන් විශ්වවිද්‍යාල කොමිසන් සභාව විසින් අනුමත නොකළ විශ්වවිද්‍යාලවලින් උපාධි ලබා තිබීමත්, ඉල්ලුම් කළ දිනයට පසුව උපාධිය ලබාතිබීමත්, වයස අවුරුදු 45 පසු කර තිබීමත්, සේවක අර්ථසාධක අරමුදලේ සක්‍රිය ලෙසින් තිබීමත් (රැකියාවක් කරන බව තහවුරු වීම) වැනි කරුණු අනුව පෙර ලේඛනයේ පත්වීම් ලබා දුන් ඇතැමුන් ඉවත් කර තිබූ බවය. කිසියම් අයකුට අසාධාරණයක් සිදු වී ඇත්නම් ඒ පිළිබඳව දැනුම් දෙන ලෙස පැවසූ බවත්, ඔහු කීවේය. එහෙත් අගතියට පත් වූවා යැයි කියන උපාධිධාරීන් වැඩි පිරිසක් සිදු කෙළේ උද්ඝෝෂණයේ නිරත වීමය. එහෙත් පසුගිය 19 වැනිදා උද්ඝෝෂණයේ නිරතව සිටි පිරිස සිටි ස්ථානයට ගිය ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා ඔවුන් අමතමින් පැවසුවේ 'තවත් උපාධිධාරීන් 10,000ක් වෙනුවෙන් රැකියා අවස්ථා ලබාදීමට කැබිනට් අනුමැතිය ලැබුණු' බවයි. 'අච්චේ වේලෙමින් නොසිට නිවෙස් කරා යන්නැයි' ඔවුන්ට දැන්වීය. ජනාධිපතිවරයෙක් උද්ඝෝෂකයන් හමුවට ආ ප්‍රථම අවස්ථාව එයයි.

මේ පිළිබඳව උපාධිධාරී ජාතික මධ්‍යස්ථානයේ කැඳවුම්කරු චන්දන සූරියආරච්චිගෙන් කළ විමසීමේදී ඔහු පවසා සිටියේ " මුල සිටම පොරොන්දු ඉටු කරන රජයක් ලෙස වත්මන් රජය යම් පූර්වාදර්ශයක් සපයමින් උපාධිධාරීන්ට රැකියා ලබාදීමට කටයුතු කිරීම අගය කරන බවයි.

උපාධිධාරීහු 51,135ක් පත් වීම් සඳහා සුදුසුකම් සපුරා තිබුණ අතර ඉන් 50,000ක් දෙනා රැකියා නියුක්ත කිරීමට මූලිකවටයේදී රජය පියවර ගෙන තිබුණි. පසුව ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා කැබිනට් මණ්ඩලය හමුවී සාකච්ඡා කර තවත් 10000ක් ඊට එක්කිරීමට පියවර ගත්තේය. ඒ අනුව ඉතිරි ව සිටි සුදුසුකම් ලාභීන් 1,135 ද ඇතුළත්ව රැකියා විරහිත උපාධිධාරීන් 60,000 ට රැකියා අවස්තා හිමි වේ

අයේෂා සේනානායක ප්‍රකාශ කර සිටියේ මෙය රජය විසින් ගත් ප්‍රශස්ත ක්‍රියාමාර්ගයක් බවයි. තමන් වැනි මේ රටේ නිදහස් අධ්‍යාපනයෙන් ඉහළට පැමිණි බොහෝදෙනාට රට වෙනුවෙන් තම යුතු කම ඉටු කිරීමට මෙවැනි අවස්ථාවක් වත්මන් රජය විසින් ලබාදීම ස්තුති පූර්වකව බාරගන්නා බවත්, මෙය තමන්ට ලැබුණු වරප්‍රසාදයක් සේ නොසලකා තම යුතුකම රට වෙනුවෙන් ඉටු කිරීමට හැම පෙරට ආයුතු බවත් ඇය කියා සිටියාය. එසේම අනෙකුත් සියලුම උපාධිධාරීන්ට රැකියා අවස්ථා ලබාදී ශක්තිමක් රාජ්‍ය සේවයක් ස්ථාපිත කිරීමට වත්මන් රජය පියවර ගනු ඇතැයි ඈ සිය විශ්වාසය පළ කළාය.

මේ වනවිට සුදුසුකම් සපුරා ඇති සියලු උපාධිධාරීන් හට ඔවුන් විසින් හදාරා ඇති විෂය මාලාව අනුව අදාළ ක්ෂේත්‍රයේ රැකියා සඳහා යෙදවීමට පියවර ගන්නා ලෙස ජනාධිපතිතුමා විෂය බාර නිලධාරීන්ට උපදෙස් දී ඇත. රාජ්‍ය සේවයේ ඇති දුර්වලතා සහ අඩු පාඩු මග හැරෙන ලෙස රැකියාගත පුහුණුවක් ලබාදීමේ (on the Job Training) අවශ්‍යතාවද මෙහිදී ජනාධිපතිතුමා අවධාරණය කළේය. ඒ අනුව තරගකාරී ආකාරයට පෞද්ගලික අංශය සමඟ කටයුතු කළ හැකි ලෙස පෞද්ගලික අංශයේ පුහුණුව සඳහා ද මේ අය යොමු කිරීමට නියමිතය. මීට අමතරව නායකත්වය, ඉලක්ක සපුරා ගැනීම, විශ්වාසී හැඟීම යන කරුණුවල ප්‍රමුඛතාව ලබාදෙමින් අදාළ පුහුණුව වසරක කාලයකට යටත් කෙරේ.

නව රාජ්‍ය අමාත්‍යාංශවල ඉලක්ක සපුරා ගැනීමටද උපාධිධාරී රැකියාලාභීන් යොමු කිරීමේ වැදගත්කම ජනාධිපතිවරයා අවධාරණය කර තිබේ. මහ මැතිවරණය වෙනුවෙන් දිස්ත්‍රික්ක රැසක තමා කළ චාරිකාවලදී බොහෝ දෙනා පාසල්වල ගුරු හිඟය පිළිබඳව තමා දැනුවත් කළ බවත්, නව පත්වීම්ලාභීන්ගෙන් පිරිසක් ඒ සඳහා පත්කිරීමට කටයුතු කරන ලෙසත් අදාළ බලධාරීන්ට උපදෙස් දීමට ජනාධිපතිවරයා කටයුතු කර තිබේ. ඒ අනුව තෝරාගනු ලබන පිරිස අධ්‍යාපන අමාත්‍යාංශය (ග්‍රාමීය හා වතු පාසල්) වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ගොවිජන සේවා දෙපාර්තමේන්තුව, වනජීවී දෙපාර්තමේන්තුව, දේශීය ආයුර්වේද දෙපාර්තමේන්තුව, සෞඛ්‍ය අමාත්‍යාංශය (ග්‍රාමීය රෝහල් / කුඩා බෙහෙත් ශාලා), මිනුම්දෝරු දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, සුළු අපනයන භෝග දෙපාර්තමේන්තුව, තක්සේරු දෙපාර්තමේන්තුව, ආගමන විගමන දෙපාර්තමේන්තුව ආදී ක්ෂේත්‍රවල සේවාවන්හි නියුක්ත කිරීමට නියමිතය.

සාමාන්‍යයෙන් රටේ රාජ්‍ය සේවකයන්ගේ සංඛ්‍යාව ලක්ෂ 13 ½ ඉක්මවයි. විශ්‍රාමිකයන්ගේ සංඛ්‍යාව ලක්ෂ පහමාරකට වැඩිය. කෙසේ නමුත් දළ වශයෙන් ලක්ෂ 20ක් පමණ රජයේ වැටුප් සහ දීමනා ලබන්නෝ වෙති . රටේ ජනගහනය මිලියන 21 කි ඒ අනුව ජනගහනයෙන් දහයෙන් එකක් දළ වශයෙන් රාජ්‍ය සේවය ප්‍රතිලාභ ලබන බවද පෙනී යයි.මේ වන විට රජයේ සේවක වැටුප් සහ වේතන, විශ්‍රාමික දීමනා සඳහා රජයට රුපියල් බිලියන 1000 කට ආසන්න මුදලක් වැය කිරීමට සිදුවන අතර එය වසර 2020 දී රුපියල් බිලියන 1115 ත් 1120 ත් අතර අතිවිශාල ප්‍රමාණයකට ඉහළ යන බව ගණන් බලා තිබේ. මෙලෙස රජයේ ආදායමෙන් අතිවිශාල මුදලක් වැය කරමින් රාජ්‍ය සේවය පවත්වාගෙන යන අතර, ඉන් ජනතාවටත් තම සේවා තෘප්තිමත්ව ලබාදීමට රජයේ සේවකයන්ගේ වගකීම වේ.

වැටුප් වැඩි වීමට සාපේක්ෂව ලක්ෂ 14කට ආසන්න සමස්ත රාජ්‍ය අංශයේ සේවකයන්ගේ අතිකාල දීමනා ද වැඩි වේ. තවද මේ නව වැඩි වීම් සියල්ල මූලික වැටුපට එකතු කරන බැවින් වැටුපට සමාන මුදලේ එකතුවක් ලෙස ආපදා ණය හා දේපළ ණය ලබාගැනීමේදී ද දැනට ලබාගන්නා ප්‍රමාණයට වඩා වැඩි ප්‍රමාණයක් ණය වශයෙන් ලබාගැනීමට රාජ්‍ය සේවකයන්ට වරප්‍රසාද හිමි වේ.

2015 වසරේදී රුපියල් බිලියන 562ක්ව පැවැති රාජ්‍ය සේවයේ වැටුප් ගෙවීම් මේ වන විට රුපියල් බිලියන 750 දක්වා වැඩිවී ඇත. විශ්‍රාම වැටුප් වියදම 2015 වසරේදී රුපියල් බිලියන 157ක්ව පැවැති අතර මේ වන විට එය රුපියල් බිලියන 225ක් දක්වා වැඩි වී ඇත. වැඩි කළ මේ නව වැටුප 2020 ජනවාරි සහ 2021 ජනවාරි සිට සමාන ප්‍රමාණයකින් ලබාදීමට රජය තීරණය කළහොත් ඒ සඳහා රු. බිලියන 240ක් පමණ අතිරේකව වැය වනු ඇත. මෙවැනි අභියෝග රැසක් මධ්‍යයේ මෙලෙස රාජ්‍ය සේවයට රැකියා විරහිත උපාධිධාරීන් 60,000ක් දෙනා බඳවා ගැනීම විශාල අභියෝගයකි.

එහෙත් රජයේ ඉදිරි වැඩ පිළිවෙළ අනුව සෞභාග්‍යවත් දේශයක් නිර්මාණය කිරීමේදී මේ උගත් බුද්ධිමත් පිරිසගේ දායකත්වය අත්‍යවශ්‍යය. එනිසා මෙලෙස රැකියා ලබා ගන්නා සියලු දෙනාට භාර දූර වගකීමක් පැවරී තිබෙන බව සිත්හි තබාගත යුතුය. ඒ වගකීම උදෑසන 8.00ට සේවයට පැමිණ පස්වරු 4.30ට කාර්යාලයෙන් බැහැර වීමට වඩා එහා ගිය ජනතා වගකීමක් බව තේරුම් ගත යුතුය.



රාජ්‍ය සේවා, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් ජේ. ජේ. රත්නසිරි



උපාධිධාරී ජාතික මධ්‍යස්ථානයේ කැඳවුම්කරු චන්දන සූරියආරච්චි



නව පත්වීම් ලාභිනියක වූ අයේෂා සේනානායක


## පසුගාමී වූ ව්‍යාපාර නගාසිටුවීම

නාගරික සංවර්ධන සහ නිවාස අමාත්‍යාංශය
නාගරික සංවර්ධන අධිකාරිය

**"සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්තිවලට සමගාමීව කොවිඩ් 19 වසංගතයෙන් ව්‍යාපාර කටයුතු අඩාල වූ නාගරික සංවර්ධන අධිකාරියේ ව්‍යාපෘති වල මාසික කුලී පදනම මත පදිංචි ව්‍යාපාරිකයින් සඳහාපහත සඳහන් සහන ක්‍රියාත්මක කිරීමට තීරණය කර ඇත.**

1. කොළඹ හා ගාල්ල ලන්දේසි රෝහල්, නිදහස් චතුරශ්‍ර සාප්පු සංකීර්ණය, තුරග තරග පිටිය, කොළඹ රත්තරං අලෙවි මධ්‍යස්ථානය සහ පාවෙන වෙළඳ සංකීර්ණය සඳහා 2020 මාර්තු මස සිට දෙසැම්බර් මස දක්වා 50% කින් මාසික කුලිය අඩු කිරීම.
2. වාණිජ ව්‍යාපාති සඳහා 2020 මාර්තු, අප්‍රේල් සහ මැයි මාසයන්සඳහා සම්පූර්ණ මාසික කුලීගෙවීමෙන් නිදහස් කිරීම.
3. නාගරික පුනර්ජීවන නිවාස ව්‍යාපෘතිවල පදිංචිකරුවන් සඳහා 2020 මාර්තු, අප්‍රේල් සහ මැයි මාස සඳහා නියමිත වාරික අයකිරීම පමාකිරීම.
4. භාවිතය වෙනස් කිරීම සඳහා ගාස්තු ගෙවා වාර්ෂිකව අවසරය ලබාගන්නා පෞද්ගලික දේපල හිමියන් සඳහා 2020 මාර්තු, අප්‍රේල් සහ මැයි මාස සඳහා ගාස්තු ගෙවීමෙන් නිදහස් කිරීම.

ඉහත සහන ලබාගැනීම සඳහා වන ඉල්ලීම් 2020.03.01 දිනට පවතින හිඟ කුලී මුදල් ගෙවීමෙන් අනතුරුව 2020.09.30 දිනට ප්‍රථමප්‍රධාන හෝ දිස්ත්‍රික් කාර්යාලවලට කඩිනමින් ඉදිරිපත් කරන ලෙස කාරුණිකව ඉල්ලමි.

අධ්‍යක්ෂ ජනරාල්,
නාගරික සංවර්ධන අධිකාරිය

සිළුමිණ
35, ඩී. ආර්. විජයවර්ධන මාවත, ලේක්හවුස්, කොළඹ 10.
දුරකථන පොදු: 011-2429429, 011-2421181, 011-2331181
කර්තෘ: 011-2429261 ජ්‍යෙෂ්ඨ සම කර්තෘ: 011-2429263
කර්තෘ මණ්ඩලය: 011-2429262-3-4-5
ෆැක්ස්: 011-2429260 (සිළුමිණ)
ඊ-මේල්: edmediaunit@gmail.com
දැන්වීම් කළමනාකරු: 011-2429351
ලුහුඬු දැන්වීම් කළමනාකරු: 011-2429341-2
වෂී 2020ක් වූ අගෝස්තු මස 23 වැනිදා ඉරිදා

# උඩුගං බලා පිහිනන රාජ්‍ය සේවය

'හොඳම දේ දරුවන්ට ය' යනුවෙන් පැවසුයේ 1917 දී සාර් රජුගේ පාලනය පෙරළා දමා සමාජවාදී සෝවියට් දේශය නිර්මාණය කිරීමේ පුරෝගාමියා වූ ව්ලැඩිමීර් ඉලිච් ලෙනින් ය. බොහෝ රටවල් විසින් ඔහුගේ කියමන යථාර්ථයක් බව පසක් කොට ගැනීමෙන් අනතුරුව ප්‍රතිපත්ති සම්පාදනයේ දී උපයුක්ත කර ගන්නා ලදී.

හොඳම දේ තමාටත් තමාගේ බෑබිලා ටත් පමණක් උරුම කරදීම වෙනුවෙන් සදාකාලිකව බලයේ රැඳී සිටීමේ අති බහුතර දේශපාලකයන්ගේ ස්වභාවය වෙනස් කරමින් අලුත් මාවතකට නව රජය පියනඟා තිබේ. ඒ මඟ මල් අතුරා නැති බව පැහැදිලිව පෙනෙන බොහෝ දෑ හා ක්‍රියා සිදුවෙමින් පවතී. නමුත් ඒ සියල්ලට ද යථාවාදී පිළිතුරු ලැබෙමින් තිබේ. වෙනදා ලැබෙන කඳුළු ගෑස් වෙනුවට මෙදා උද්ඝෝෂණ භූමියටම ගොස් ප්‍රතිඥා දෙන නායකත්වයක් අපට හිමිය.

මේ සැප්තැම්බර් 2 වැනිදා වනවිට රාජ්‍ය සේවයට එක්ලක්ෂ හැටදහසකට වැඩියෙන් නව මුහුණු එක්වෙති. එතරම් විශාල ප්‍රමාණයකට රැකියා ලැබෙන ප්‍රථම අවස්ථාව මෙයයි. රජයේ රැකියාවක් යනු බොහෝ දෙනකුගේ සිහිනයකි. ඒ සිහිනය බොහෝ ඈත තිබුණු බොහොමයකට මෙවර රජයේ රැකියා හිමිවීම ඓතිහාසික කරුණකි. මේ පිරිස තෝරන්නේ කිසිම දේශපාලන බලපෑමකින් තොරව වීම එයට වඩාත් ගෞරවනීය බවක් එක්කර තිබේ. උස අය සිකියුරිටි, මිටි අය කම්කරු කියා තම පාක්ෂිකයන් පවා බෙදූ කාලයක් පසු කර විත් ඇති බැවින් මේ එළැඹුම වඩාත් වටින්නේය. තරුණ ශ්‍රමයට වටිනාකමක් එක්කරමින්, තරුණ ශ්‍රමයෙන් හැකි උපරිම ඵල ප්‍රයෝජන ගැනීම මෙහි අරමුණයි.

මනුෂ්‍යයන් ගැන සිතන දේශපාලන විද්‍යාවක් ද, මිනිසුන්ගේ වටිනාකම් මැන බලන ආර්ථික විද්‍යාවක් ද අද අපට අවශ්‍ය වේ. ඒ දෙකෙහි ම පෙරමුණ ගත යුත්තේ දේශපාලන නායකයෝ ය. ශ්‍රී ලංකාවේ රාජ්‍ය නායකයා ඉහත කී සාධක දෙක කෙරෙහි ම අවධානය යොමු කරමින් සිය කාර්ය සාධනයෙහි නිරත වන බව පෙනෙයි. එය සිදුවන්නේ ශ්‍රී ලංකාවේ දේශපාලන ඉතිහාසයෙහි විප්ලවීය වෙනසක් හැටියට ය. උපාධිධාරීන්ට පමණක් නොව අ.පො.ස.සා/පෙළ අසමත් තරුණ පිරිසට රාජ්‍ය අංශයේ සුදුසු රැකියා ලබාදීම මේ වැඩසටහනෙහි කැපී පෙනෙන අංශ දෙකක් හැටියට සැලකෙන්නේ ඒ නිසාය.

කිසියම් රාජ්‍යයක උපාධිධාරීන්ගේ රැකියා විරහිත වීම ගැන පැමිණිල්ලක් තිබේ නම්; එය රජයේ ආර්ථික සැලසුම් වල වැරැද්දකි. එලෙස ම සංවර්ධන ව්‍යාපෘතිවල මන්දගාමී හා අවිධිමත් බව එයින් සනාථ වෙයි. තරුණ පිරිස වල්මත් වී ඇත්නම් එය ද මීට සමගාමී ප්‍රතිඵල පෙන්වයි. එය වෙනස් කිරීමට වත්මන් රජයේ තැත වඩාත් වැදගත් වන්නේ මේ ප්‍රවේශයේ සිට බලත්දීය. වත්මන් ජනාධිපතිවරයාගේ හා අගමැති ප්‍රමුඛ දේශපාලන නායකත්වයේ ඉලක්කය වී ඇත්තේ තරුණ ශ්‍රම හමුදාවේ උපරිම ශ්‍රම දායකත්වය රටේ සංවර්ධනය සඳහා යොදා ගැනීමය.

මේ වන විට සුදුසුකම් සපුරා ඇති සියලු උපාධිධාරීන් හට ඔවුන් විසින් හදාරා ඇති විෂය මාලාව අනුව අදාළ ක්ෂේත්‍රයේ රැකියා සඳහා යෙදවීමට පියවර ගන්නා ලෙස ජනාධිපතිවරයා විෂය බාර නිලධාරීන්ට උපදෙස් දී ඇත. රාජ්‍ය සේවයේ ඇති දුර්වලතා සහ අඩු පාඩු මඟ හැරෙන ලෙස රැකියාගත පුහුණුවක් ලබාදීමේ අවශ්‍යතාවද මෙහිදී ජනාධිපතිවරයා අවධාරණය කළේය. ඒ අනුව තරගකාරී ආකාරයට පෞද්ගලික අංශය සමඟ කටයුතු කළ හැකි ලෙස පෞද්ගලික අංශයේ පුහුණුව සඳහා ද මේ අය යොමු කිරීමට නියමිතය.

එපමණක් නොවේ, ඉතිහාසයේ ප්‍රථම වරට අපොස සාමාන්‍ය පෙළ අසමත් අයට ද රැකියා ලක්ෂයක් දීම පෙර නොවූ විරූ ක්‍රියාවකි. මෙතෙක් බලයේ පැවැති රජයන් තරුණ අසහනයට විවිධ පැලැස්තර විසඳුම් දැමුවත් ස්ථිරසාර විසඳුමක් ලබාදීමට අසමත් විය. මේ නිසා තරුණ අසහනය ද වර්ධනය වූ අතර විවිධ අසම්මත දෑ සඳහා ඔවුහු යොමු වීමක්ද දක්නට ලැබිණි. ඒ අනුව මෙරට ප්‍රථම වරට අපොස සාමාන්‍ය පෙළ අසමත්, ගමේ දරිද්‍රතාවෙන් අන්තයටම පත්ව සිටින පවුල්වල තරුණ තරුණියන් ලක්ෂයකට 'සෞභාග්‍යයේ දැක්ම' ප්‍රතිපත්ති ප්‍රකාශනය යථාර්ථයක් කරමින් රජයේ ස්ථිර විශ්‍රාම වැටුප් සහිත රැකියා ලබාදීමේ වැඩපිළිවෙළක් දැන් ක්‍රියාත්මක කර තිබේ.

ජපානය වෙත පරමාණු බෝම්බ හෙළා හිරෝෂිමා හා නාගසාකී නගර බිමට සමතලා වෙද්දී හැඩු ජපන් පාලකයන් පසුව රටෙහි වත්මන් දියුණුව උදා කරගනු ලැබුයේ අන් කිසිවකින් නොව දුර දිග බලා සිදුකරන ලද සැලසුම් හේතුවෙනි. ඒ සැලසුම් අතර මතු පරපුරෙහි අධ්‍යාපනය දියුණු කිරීම උදෙසා රජය විසින් මුදල් ආයෝජනය කිරීම පුළුල් කිරීම විශේෂයෙන් දැකගත හැකි විය. අද වන විට ඔවුහු එහි ප්‍රතිලාභ අත් විඳිති. කියුබාවේ සේම වෙනිසියුලාවෙහි ද, පැවති සෝවියට් දේශයේ ද මේ තත්ත්වය මැනැවින් දැකගත හැකි විය. එහෙත් ලංකාවේ විටින් විට පත්වන පාලකයන් ගේ අභිමතාර්ථය වී ඇත්තේ රට සංවර්ධනය කිරීම හෝ ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිය නඩත්තු කර ගුණාත්මක අයුරින් පවත්වාගෙන යෑම හෝ නොව ඉදිරි මැතිවරණය ජයගන්නේ කෙසේදැයි තුන් කල්හිම කල්පනා කරමින් ඒ උදෙසා කටයුතු කිරීමය. මේ ආකල්ප වෙනස් වී රට වෙනුවෙන් සිතන, පතන පාලකයන් පත්වීම දැයේ භාග්‍යයක් බැව් කිව යුතුය.

"යුගයේ දැවැන්තම ඛේදවාචකය වනුයේ නපුරු මිනිසුන්ගේ නපුරු වැඩ නොව හොඳ මිනිසුන්ගේ නිහැඬියාවයි" යනුවෙන් වරක් මාටින් ලූතර් කිං විසින් ප්‍රකාශ කරන ලද්දේ ද මෙවන් තත්ත්ව ඉදිරියේ ගොලුවත් රකින්නන් ස්වකීය හෘදය සාක්ෂිය ඇතුළතම වැරදිකරුවන් වන බව දැක්වීමට ය. හිසේ රුදාවට කොට්ටය මාරු කළාක් මෙන් මෙතෙක් අප කළේ අර්බුදය විවේචනය කිරීම විනා අර්බුදයට පිළියම් කිරීම නොවේ. පැලැස්තර විසඳුම් වලින් විනිර්මුක්තව සාධනීය වෙනසක් උදෙසා කඩිසරව, එක් සිත්ව හා එක්සත්ව ක්‍රියා කළ යුතු බව අප දැන්වත් අවබෝධ කරගත යුතුව තිබේ.

රාජ්‍ය සේවයට ඉතිහාසයේ වැඩිම පිරිසක් එක්වන මේ මොහොතේ ඒ සැමට කියන්නට අපට යමක් තිබේ.

**මේ ඔබට ලැබෙන අවස්ථාව ඉතිහාසයේ කිසි කලෙක කිසිවකුට මෙලෙස මල් වට්ටියක තබා පිළිගන්වා නැත. ඔබ ඉදිරියේ ඇත්තේ ඒ වෙනුවට රටට කළ හැකි සහ ඔබෙන් විය යුතු යුතුකම ඉටු කිරීමය; ඒ සඳහා නොපමාව, නොපැකිළ ව පෙළ ගැසීමය.**

---

• සුභද්‍රා දේශප්‍රිය

# 'ජනවරමෙහි අරුත ජනතාවාදී ආණ්ඩුවක්'

## පොදුජන පෙරමුණේ පාර්ලිමේන්තු මන්ත්‍රී මහාචාර්ය චරිත හේරත්

**ජනාධිපතිවරයා විසින් ඉදිරියට ගෙන යන නව වැඩපිළිවෙළ කෙරෙහි සහ එම නායකත්වය සම්බන්ධයෙන් විශාල ජනතා අපේක්ෂා තිබූ බව ඉතා පැහැදිලියි. මේ නැවුම් ජනවරම ලැබීමට ප්‍රධානතම හේතු සාධකයක් වන්නේ සෞභාග්‍යයේ දැක්ම වැඩපිළිවෙළෙහි අන්තර්ගතයයි. පසුගිය 2019 නොවැම්බර් 16 ජනාධිපතිවරණයෙන් අනතුරුව ආරම්භ කරන ලද ඒ වැඩපිළිවෙළ ඉදිරියට ගෙන යෑමට මෙවර මැතිවරණයෙන් ජනතාව විශාල වශයෙන් අනුමැතිය ලබා දී ඇත.**

සෞභාග්‍යයේ දැක්ම ජනාධිපති ගෝඨාභය රාජපක්ෂයන් මුල් කරගත් මහින්ද රාජපක්ෂ අගමැතිවරයා සමඟ ඉදිරියට යන පුළුල් වැඩසටහනකි. ඒ වැඩසටහනේ ප්‍රධාන ධාරා දෙකක් ඉදිරිපත් කර ඇත. සමාජය එක් ධාරාවක් මඟින් කියැවෙන අතර රටේ සංවර්ධනය පිළිබඳ නව ආකල්පයක් සහ නව සිතීමක් අවශ්‍ය බව අනෙක් ධාරාවෙන් කියැවේ. 2015 වසරේ ඇතිවූ යහපාලන රජය විසින් කරන ලද ආර්ථික ඝාතන නිසා මෙන්ම විශේෂයෙන් ගෝලිය අර්බුදයක් වූ කොරෝනා වසංගතයත් සම්බන්ධයෙන් ඇතිවූ ආර්ථික කඩාවැටීම නිසා මෙරට ආර්ථිකයේ විශාල කඩා වැටීමක් ඇති විය. ඒ බලපෑමෙන් ඉදිරියට යන්නේ කෙසේද? ඒ බලපෑම අතික්‍රමණය කරමින් එයින් එළියට යන්නේ කෙසේද? එහිදී සංවර්ධන සැලැස්ම විවර කරගන්නේ කෙසේද? යන කාරණා මතුවී තිබේ. ඒ අනුව නව සංවර්ධන දැක්මක් අවශ්‍යයි කියන කථිකාව සමාජය තුළ ඇති විය. ඒ රික්තකය පිරවීම සඳහා නව සංවර්ධන උපාය මාර්ග රැසක් සෞභාග්‍යයේ දැක්මෙන් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂයන් ඉදිරිපත් කළේය. ඒ සෞභාග්‍යයේ දැක්මේ වුයේද ජනතාව අපේක්ෂා හෙයින් ජනතාව එය වැළඳගනු ලැබීය. රටට නව ආණ්ඩු ක්‍රමයක් අවශ්‍යයි යන කරුණද සෞභාග්‍යයේ දැක්ම තුළ තිබූ බැවින් එම මතයට විශාල ජනවරමක් ලැබිණි.


මේ ජනවරමේ අර්ථය ලඝු කර දැක්වුවහොත් සංවර්ධන අභියෝගයක් සහ ආණ්ඩුකරණ අභියෝගයක් ජයගන්නට ඉදිරිපත් වූ ජනවරමක් ලෙසත් වෙනත් ආකාරයකින් පැහැදිලි කළහොත් සංවර්ධන අභියෝගයක් සහ රටට අවැසි ආණ්ඩුකරණ අභියෝගයක් ජයගැනීම සඳහා ඉදිරිපත් වූ ජනවරමක් ලෙස මේ අති දැවැන්ත ජනවරම හැඳින්විය හැකිය. කෙටිකාලයක් තුළ මේ ආණ්ඩුව අභියෝග ජයගත් ආකාරය පිළිබඳව ජනතාව විශාල ලෙස පැහැදී සිටින බවද මේ අති දැවැන්ත ජනවරමින් පැහැදිලි වෙයි.

පසුගිය යහපාලන ආණ්ඩුව සම්බන්ධයෙන් ජනතාව ඉතා කෙටි කාලයක් තුළදී කලකිරීමට පත් විය. මැතිවරණ කල් දැමූ එම ආණ්ඩුව පැවැත්වූ පළමුවැනි පළාත් පාලන මැතිවරණයේදී එවකට නව පක්ෂයක් වූ පොදුජන පෙරමුණ විශාල ජනවරමක් ලබාගත් බව ඉතා පැහැදිලිය. දුර්වල යහපාලන ආණ්ඩුව රටේ විශාල ආර්ථික අර්බුද රැසක් මතු කළේය. ඔවුන් නැවත නව රජයට මේ රට බාර දුන්නේ සියයට 6.7 පමණ වූ ආර්ථික වර්ධන වේගය 2.3 දක්වා පහත දමමිනි. මහ දවල් සිදු කළ මහ බැංකු මංකොල්ලයෙන් රටේ ආර්ථිකට විශාල බලපෑමක් ඇතිවිය. ඔවුන් විදෙස් රටවලින් විශාල ණය කන්දරාවක් ලබා ගත්තද කිසිදු සංවර්ධන ව්‍යාපෘතියක් සිදු කළේ නැත. මාධ්‍ය සන්දර්ශන සිදුකරමින් හොරු ඇල්ලීමට කොමිෂන් සභා පත්කරමින් ජනතාව නොමඟ යැවූහ. ජාත්‍යන්තර වශයෙන් අපේ රටේ අනන්‍යතාවට, භෞමික අඛණ්ඩත්වයට හානි වන ආකාරයට යහපාලන රජය විදෙස් ප්‍රතිපත්ති අනුගමනය කරනු ලැබිණි. ඇමරිකාව, එංගලන්තය වැනි රටවල් අපේ රටට විරුද්ධව ජිනීවාවල යෝජනා ගෙන එන විට එවකට සිටි මෙරට විදෙස් ඇමැතිවරයා ඒ යෝජනාවල යෝජකයකු ලෙස අත් ඔසවමින් පෙනී සිටීමට කැමැත්ත ප්‍රකාශ කළේය. ඒ ද්‍රෝහී ප්‍රතිපත්ති නිසා මේ රටේ ජාත්‍යන්තර තත්ත්වය ඉතාමත් දුර්වල අඩියකට ඇද වැටිණ.

එපමණක් නොව යහපාලන ආණ්ඩුව නිසා රටේ ජාතික ආරක්ෂාව විශාල අර්බුදයකට ලක්විය. අන්තවාදීන්ගේ පාස්කු ප්‍රහාරයත් සමඟ ඉතා විශාල පිරිසක් මරණයට පත්විය. මරණ බියෙන් තැති ගත් ජනතාව ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ ආගමනයත් සමඟ නැවත ජීවය ලබන්නට විය. ආරක්ෂාව පිළිබඳ තිබූ අවිනිශ්චිත භාවය තුරන් විය. ජනතාව නිදහසේ නැවත හුස්ම ගැනීමට පටන් ගත්හ. ජාතික ආරක්ෂාව සම්පූර්ණයෙන් බිඳ වැටීම තුළ විශ්වසනීය ආණ්ඩුවක් තුළ ජාතික ආරක්ෂාව ස්ථාපිත කරගැනීම මේ ජනවරමේ තවත් අර්ථයකි.

අපේ රටේ ජාතික වශයෙන් පිළිගත් සංස්කෘතිකමය හරපද්ධතියක් විය. ඒ හර පද්ධතීන් අපහාසයට ලක්කරමින් බටහිර ගැති සමහර සංස්කෘතික ලක්ෂණ වැරදි අසම්මත සංස්කෘතික අංග, වැරදි සමාජ ක්‍රමයන් මේ රටට එන්නත් කිරීමට යහපාලන ආණ්ඩුව උත්සාහයක යෙදිණ. නමුත් සංස්කෘතිය අගයන ජනතාව ඊට කිසිදු ප්‍රසාදයක් නොදැක්වූහ. ඒ ක්‍රමවේදයන් වෙනස් කිරීමට මෙරට ප්‍රගතිශීලී ජනතාව යුහුසුළු වුයේද එහෙයිනි.

ඒ අනුව රටේ ජාතික ආර්ථිකය, ජාතික ආරක්ෂාව, ජාතික සංස්කෘතිය, ජාතික සමගිය සම්මුතිය සම්බන්ධයෙන් මෙන්ම ජාත්‍යන්තර කීර්තිය සම්බන්ධයෙන්ද විශාල හානියක් කළ ආණ්ඩුවක් ලෙස මිත්‍යාව වපුරමින් බොරු යහපාලනයක් ගෙනගිය බෝඩ් ලැල්ලකට සීමා වූ යහපාලන ආණ්ඩුවට එරෙහිව පියවර ගත්හ. කණ්ඩායම රටට පෙන්නුම් කළ වැරදි දේශපාලනික ක්‍රමවේදයන් සම්බන්ධයෙන් වූ ජනතා කලකිරීම මේ ජනවරමේ තවත් අර්ථයක් විය. මේ වැරදි දේශපාලන ක්‍රියාකාරීත්වය මේ ජනවරමට පදනම් වූ තවත් කරුණකි. රටේ ගැටලු අලුත් මුහුණුවරකින් කියවා ගැනීමට හැකි ජනාධිපතිතුමා සමඟ එම වැඩපිළිවෙළ ඉදිරියට ගෙන යෑමට එතුමා සමඟ වැඩකරන අනෙක් පිරිසටද හැකිවිය. රට ඉදිරියට ගෙන යෑමට අලුත් ඇහැකින් බැලීම සම්බන්ධයෙන් ජනතාව තුළ ප්‍රසාදයක් ගොඩනැගිණි. මේ සියල්ලේම සමාන්තර ඇගැයීමක් මේ ජනවරමේදී ලබාදී ඇත. මේ ජයග්‍රහණය සම්බන්ධයෙන් කතා කිරීමේදී ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ දේශපාලන ධාරාව නිර්මාණය වීම සහ එහි ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් විශේෂයෙන් ඇගැයිය යුතුය. බැසිල් රාජපක්ෂයන් මේ රටේ දේශපාලනයට පාඩම් රැසක් කියා දුන් නායකයෙකි. රටට අලුත් පක්ෂයක්, අලුත් ජනාධිපතිවරයෙක්, ආණ්ඩුවක් හැදීමට පසුබිම සකස් කළේ වසර හතරක් වැනි කෙටි කාලයකිනි. අලුතින් මේ රටේ ඉතිහාසය ලිවීමට හැකි තැනකට මේ රට තල්ලු කරන්නට බැසිල් රාජපක්ෂයන්ගේ යාන්ත්‍රණයට හැකිවිය. මෙරට දේශපාලනයට මෑත ඉතිහාසයේ පහළ වූ සුවිශේෂ දේශපාලන චරිතයක් ලෙස බැසිල් රාජපක්ෂයන් හැඳින්විය හැකිය. මේ නව දේශපාලනික ක්‍රියාකාරීත්වය ගොඩනැගීමට බැසිල් රාජපක්ෂ මහතාගේ නව දේශපාලන ප්‍රවාහය ඉවහල් වූවා යැයි සඳහන් කළ හැකිය. මේ පුළුල් මෙහෙයවීම මෙන්ම මෙරට වසර තිහක කුරිරු ත්‍රස්තවාදයෙන් බැට කෑ ජනතා සිත්සතන් තුළ මහින්ද රාජපක්ෂ සහ ගෝඨාභය රාජපක්ෂ මහතා කෙරෙහි තිබූ ආදරය නිසා ඇතිවූ විශ්වාසය නිසා ජනතා බලවේගය ඔවුන් දෙසට කේන්ද්‍ර ගත වීමද තවත් හේතුවකි. සමාජය තුළ සදාචාරාත්මක සහ දේශපාලනික වශයෙන් මෙවැනි විශාල විශ්වාසයක් ගොඩනැගීමට හැකියාව තිබෙන්නේ මහින්ද රාජපක්ෂ වැනි නායකත්වයකට පමණි. මෙවැනි කාරණා රාශියක එකතුවකින් මේ ජනවරම තුනෙන් දෙකකට වඩා එහා ගිය අති දැවැන්ත ජනවරමක් බවට පත්විය. දේශපාලනික වශයෙන් මේ ජනමතය සමඟ ගැටගැසුණු කරුණු කාරණා රාශියක් ඇත. මේ වනවිට කැබිනට් ඇමැතිවරුන් සහ රාජ්‍ය ඇමැතිවරුන් කණ්ඩායමක් පත් කර ඇත. ඒ කණ්ඩායම්වල විවිධ දක්ෂතා ඇති අය සිටියි. එමෙන්ම මන්ත්‍රීවරුන් අතරත් ඉතා ඉහළ තලයේ දක්ෂතා ඇති අය සිටියි. ඊළඟ වසර කිහිපය තුළ මේ රටේ ජනතාවගේ ගැටලු සියල්ලට පිළිතුරු සෙවිය හැකි රාජ්‍ය යාන්ත්‍රණයක්, පාලනයක් ඇතිකර ගැනීමට හැකිවෙතැයි අපි විශ්වාස කරමු. මේ ආණ්ඩුව ආර්ථික සංවර්ධනය සහ ආණ්ඩුකරණය සම්බන්ධයෙන් නව කියවීමක්, අලුත් සිතීමක් ඇති කළ ආණ්ඩුවකි. මේ දේශපාලනික වෙනස සහ සංවර්ධනය සම්බන්ධයෙන් නව කියවීම පිළිබඳව සඳහන් කළ හැකි වන්නේ පසුගිය කාලය පුරා ගෝලීය අර්බුදයක් බවට පත් වූ කොරෝනා වසංගතයි. ඒ සමඟ ගෝලිය ආර්ථික ක්‍රමයේ අර්බුදයක් ඇතිවිය. ඒ නිසා රට තුළ දේශීය ආර්ථිකය ගොඩනැගීමට අලුතින් සිතන දේශපාලනික දර්ශනයක් ඇති කිරීම සුවිශේෂී කාරණාවකි. රටේ ආර්ථිකය ගැන නැවත සිතීමට හැකියාව මේ රජයට තිබිණි. ඒ නව දේශපාලනික කියවීමට විශාල පිළිගැනීමක්ද ජනතාව තුළ ඇති වීම සුවිශේෂී කරුණකි. කොරොනා වසංගත අවස්ථාවේදී මෙන්ම විශේෂයෙන් දිළිඳුකම තුරන් කිරීමේ වැඩ පිළිවෙළේදී ජනාධිපති කාර්ය සාධක බළකාය තුළ බැසිල් රාජපක්ෂයන් අතිවිශාල මෙහෙයුමක් සිදු කළේය. පශ්චාත් කොරෝනාවෙන් පසු ලොව පුරා අලුත් ගෝලීය ආර්ථික මොඩලයක් බිහිවෙතැයි උපකල්පනය කළ හැකිය. ඒ සඳහා මුහුණ දීමට අලුත් ආර්ථික මොඩලයක් ඇති කිරීමට නව රජයට හැකියාව ලැබෙනු ඇත යන්න අපේ විශ්වාසයයි.



> “මේ ආණ්ඩුව ආර්ථික සංවර්ධනය සහ ආණ්ඩුකරණය සම්බන්ධයෙන් නව කියැවීමක්, අලුත් සිතීමක් ඇති කළ ආණ්ඩුවක්”


> “මේ ජයග්‍රහණය සම්බන්ධයෙන් කතා කිරීමේදී පොදුජන පෙරමුණේ දේශපාලන ධාරාව නිර්මාණය වීම සහ එහි ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් විශේෂයෙන් ඇගැයිය යුතුයි.”

13 සහ 19 වැනි සංශෝධනය රට විශාල ආර්ථික දේශපාලනික අර්බුදයකට පත් කර ඇත. මේ අර්බුදයට ගිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රති සංවිධානය සහ ප්‍රතිසංස්කරණය කිරීමට වැඩපිළිවෙළක් ගෙන ආ යුතුය. මේ ජනවරම ලබා දීමේදී ජනතාවගේ එක් අපේක්ෂාවක් ඒ තුළ කේන්ද්‍රගත වි ඇති බව ඉතා පැහැදිලිය.

අද වන විට විපක්ෂය විසිරී ඇති තත්ත්වයකට පත් වී ඇත. විපක්ෂය සෝදාපාළුවට ලක්වන තත්ත්වයකට පත්වීමට පසුගිය කාලයේ පැවැති විපක්ෂයේ ක්‍රියාකාරීත්වය හේතු වී ඇත. විපක්ෂය ප්‍රගතිශිලි ක්‍රියාකාරීත්වයකින් ජනතා හිතවාදී යෝජනාවලින් කටයුතු කරයි යන ජනතා අපෙක්ෂාව විනිර්මුක්ත වීමට හේතුව පසුගිය කාලයේ විපක්ෂයේ හැසිරීමයි. එම පක්ෂවල අභ්‍යන්තරයේ හෝ කිසිදු දේශපාලන ස්ථාවරයක් නැති විම නිසා විපක්ෂය සම්බන්ධයෙන් ජනතාවගේ සම්පූර්ණ විශ්වාසය බිඳ වැටී ඇත. එය මේ ජනවරමේ තවත් සුවිශේෂත්වයකි. විපක්ෂයක් පිළිබඳ කිසිදු ජනතා අපේක්ෂාවක් නැති බවක් මෙයින් තහවුරු වෙයි. විපක්ෂය දේශපාලනික අර්බුදයකට පත්වීමට සහ දුර්වල වීමට හේතු ගණනාවක් ඇත. 2015 ජනාධිපති මැතිවරණයෙන් පසු එජාපය සුළු සමාජ කාණ්ඩායමක, දේශපාලනික යාන්ත්‍රණයක අත්අඩංගුවට පත්වීම, කොළඹ සිවිල් සමාජයේ සුළු පිරිසක් එකතු වී එක්සත් ජාතික පක්ෂයේ ඉහළින් සිටින යාන්ත්‍රණයක් ලෙස සිවිල් සමාජ යාන්ත්‍රණය තුළ ක්‍රියා කිරීම, ඔවුන් විසින් එජාප දේශපාලනික යාන්ත්‍රණය මෙහෙයවීම ආදී කරුණු නිසා එජාපයේ කඩාවැටීම සහ ජනතා විශ්වාසය නැති වී යෑම සිදු විය.

මේ අනුව පොදු ජන පෙරමුණ ශක්තිමත් වීම සහ එජාපයේ කඩා වැටීමත් සමාන්තරව සිදු විය.

එක්සත් ජාතික පක්ෂය නෛසර්ගික දේශපාලනික ධාරාවෙන් මිදී එයින් එළියට විසිවීම 2015 සිටම ආරම්භ විය. දේශපාලනික දර්ශනයේ ගැඹුරක් නැති නිසා සමගි ජන බලවේගය මේ මොහොතේ යම් බලපෑමක් කිරීමට උත්සාහ කළද එය දීර්ඝකාලීන නොවන අතර එජාපය ඉතා පහත් අඩියකට ඇදවැටී තිබිණ. සජිත් මහතාට විශාල දේශපාලනික කියැවීමක් හෝ හැකියාවක් ඇතැයි සිතිය නොහැකිය. විපක්ෂයේ දුර්වල වීම ප්‍රජාතන්ත්‍රවාදී රටකට අහිතකර වන්නේ ආණ්ඩු පක්ෂයේ ක්‍රියාකාරීත්වය රටකට නුසුදුසු වුවහොත් පමණයි. මෙතරම් ජනවරමක් ලබා දීමට හේතුව වන්නේ මේ නව රජයට ජනතාවගේ ඇති ප්‍රසාදය සහ විශ්වාසයයි. ශක්තිමත් විපක්ෂයක් පිළිබඳ අපේක්ෂා නොකර ජනතාව මෙවැනි විශාල ජනවරමක් ලබාදී ඇත්තේද ජනතාවාදී ආණ්ඩුව පිළිබඳ ඇති දැඩි විශ්වාසය නිසා බව ඉතා පැහැදිලිය.



# තීරණයක් නැතිව ළතවෙන රනිල්




## රාජකීය හැල්ල

වසුප්‍රිය උඩුකුඹුර කියයි... ejournalists@gmail.com

**ශ්‍රී ලංකාවේ නව වන පාර්ලිමේන්තුව ඉකුත් බ්‍රහස්පතින්දා පෙ.ව 9.30 ට රැස්විය. සාම්ප්‍රදායානුකූලව පාර්ලිමේන්තු මහ ලේකම්වරයා විසින් දෛනික වැඩ සටහන ප්‍රකාශයට පත් කිරීමෙන් පසුව නවවන පාර්ලිමේන්තුවේ නව කථානායක ධුරයට මාතර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී මහින්ද යාපා අබේවර්ධනයන් ගේ නම යෝජනා කරන ලද්දේ මහජන එක්සත් පෙරමුණේ නායක දිනේෂ් ගුණවර්ධන විසිනි. මෙවර කතානායකවරයාට පක්ෂ විපක්ෂ සියලු දෙනා ගේ ප්‍රසාදය ඇති බව අඟවමින් දිනේෂ්ගේ යෝජනාව ස්ථිර කරනු ලැබුවේ සමගි ජන බලවේගයේ මහ ලේකම් පාර්ලිමේන්තු මන්ත්‍රී රංජිත් මද්දුම බණ්ඩාරයන්ය. පාර්ලිමේන්තු සම්ප්‍රදාය අනුව කථානායකවරයා සඳහා මන්ත්‍රීවරයකුගේ නමක් යෝජනා කරන අය ඔහු පිළිබඳ හැඳින්වීම කළ යුතු වුවද මෙවර ඒ කටයුත්ත සිදු වූයේ කථානායකවරයා ලෙස මහින්ද යාපා අබේවර්ධන කථානායක අසුනේ අසුන් ගැනීමෙන් අනතුරුව අගමැති මහින්ද රාජපක්ෂයන් විසිනි.**

මෙදින උදය වරුවේ පාර්ලිමේන්තුවේ අසුන් පැනවීමක් සිදුව නොතිබු බැවින් මන්ත්‍රීවරුන්ට තමන් කැමති තැන්වල අසුන් ගැනීමට අවස්ථාව තිබුණි. අගමැති මහින්ද රාජපක්ෂයන් සමඟ දිනේෂ් හා ජෝන්ස්ටන් ප්‍රනාන්දු අසුන් ගෙන සිටි අතර හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන, අතාවුල්ලා ඩලස් අලහප්පෙරුම හා පිල්ලෙයාන් ඉදිරිපෙළ අසුන් ගෙන සිටිනු දක්නට ලැබුණි. ආණ්ඩු පක්ෂය සඳහා වෙන් කර තිබු කථානායකවරයා ගේ දකුණු පස කොටසේ ආසන 120ක් තිබුණද මෙවර ආණ්ඩුව නියෝජනය කරන මන්ත්‍රී සංඛ්‍යාව 152 ක් වූයෙන් කථානායකවරයා ගේ වම්පසින් විපක්ෂයට වෙන්කර තිබු ආසනවලද ආණ්ඩු පක්ෂ මන්ත්‍රීවරුන් වාඩි වී සටිනු දක්නට ලැබුණි. විමල් වීරවංශ හා අමාත්‍ය මණ්ඩලයේ ළාබාලම අමාත්‍යවරයා වූ නාමල් රාජපක්ෂයන්ද අසුන් ගෙන සිටියේ විපක්ෂයේ මන්ත්‍රීවරුන් සඳහා වෙන් වු කොටසේය. සිනමා නළුවකු වන රංජන් රාමනායක මෙන්ම නිළියක වන ඩයනා ගමගේ විපක්ෂයේ එක ළඟ අසුන්වල අසුන් ගෙන සිටීමද විශේෂත්වයකි.



නවවන පාර්ලිමේන්තුවට පත්ව සිටින මන්ත්‍රීවරුන් ගෙන් බහුතරයක් නවකයන් නිසා ඔවුන්ට පාර්ලිමේන්තුව හුරුපුරුදු තැනක් නොවීය. නවක මන්ත්‍රීවරුන් එදින උදේ අටේ සිටම සිය බිරින්දෑවරු දෙමාපියන් හා නෑදෑ හිතවතුන් සමඟ මහජනයා සඳහා පාර්ලිමේන්තුවට ඇතුළු වීමේ අවසරපත් ලබා ගැනීම සඳහා තෙරෙපෙන අයුරු දක්නට ලැබුණි. මේ අතර කොට්ටේ නගරාධිපතිවරයාද මෙවර පාර්ලිමේන්තුවට ප්‍රථම වතාවට පත්ව කෝට්ටේ සිට පාර්ලිමේන්තුවට බෝට්ටුවකින් පැමිණීමද විශේෂත්වයකි. ඔහුට බෝට්ටුවකින් පාර්ලිමේන්තුවට පැමිණීම සඳහා ඉඩහසර සලසා දීම සම්බන්ධයෙන් ජනාධිපතිවරයාට කෘතඥ වන බවද මුහුණු පොතේ සටහනක් තබා ප්‍රකාශ කර තිබුණි.

මෙදින ජනාධිපතිවරයා ගේ ප්‍රතිපත්ති කතාව පැවැත්වීමට නියමිතව තිබුණේ ප.ව.3.30ටය. එතෙක් පාර්ලිමේන්තුව කල්තැබූ නිසා මන්ත්‍රීවරුන්ට පාර්ලිමේන්තුවේ කාර්ය මණ්ඩල සාමාජිකයන්ට මෙන්ම මාධ්‍යවේදීන්ටද එකිනෙකා සමඟ සුහදව කතා බහ කරන්නට ඉඩක් ලැබී තිබුණි. පාර්ලිමේන්තුව කල් තැබීමෙන් පසුව සභා ගැබෙන් පිටතට යමින් සිටි අගමැති මහින්ද රාජපක්ෂයන් වෙත ගිය නවකයන් මෙන්ම පැරන්නෝද දැත් එක්කොට හිස නමා ආචාර කරනු දක්නට ලැබුණි. ඒ අතර අභිනව විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස වෙත ගිය පාර්ලිමේන්තුවේ සභානායක දිනේෂ් ගුණවර්ධන ඔහුට අතට අත දී සුබ පැතීය.

සභානායක ලෙස පත් වු දිනේෂ් ගුණවර්ධන එදින උදේ සිය පාර්ලිමේන්තු කාර්යාලයට භික්ෂූන් වහන්සේ තුන්නමක් වැඩම කරවා ගෙන බෞද්ධාගමික වතාවත් සිදු කර පළමු රාජකාරිය ලෙස නවවන පාර්ලිමේන්තුවට පැමිණි අගමැති මහින්ද රාජපක්ෂ පාර්ලිමේන්තුවේ අමුත්තන් ගේ ප්‍රවේශ දොරටුව අබියසදී පිළි ගත්තේය.

> **අභිනව විපක්ෂ නායක සජිත්ට, සභානායක දිනේෂ් සුබ පතයි**

රාජාසන කතාව පවත්වන වෙලාව එළඹෙන තෙක් පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරු පාර්ලිමේන්තුවේ තැනින් තැන සුහද කතාවල යෙදෙනු දක්නට ලැබුණි. කෙහෙළිය රඹුක්වැල්ල ජනමාධ්‍ය අමාත්‍යවරයා හා සමගි ජන බලවේගයේ ජාතික සංවිධායක තිස්ස අත්තනායක සුහදව කතා කරමින් මාධ්‍යවේදීන් සිටි දෙසට පැමිණෙමින් සිටියදී "මන්ත්‍රීතුමා ආයෙත් මේ පැත්තට එන්නද හදන්නේ" යනුවෙන් මාධ්‍යවේදියකු තිස්ස ගෙන් විමසද්දී "අනේ නෑ ආයෙත් ඉතින් මම කොහෙටවත් යන්නේ නෑ" තිස්ස සිනාවෙමින්ම උත්තර දුන්නේය.

විජේදාස රාජපක්ෂ, සුසිල් ප්‍රේම්ජයන්ත, හා අනුර යාපාට ඇමති තනතුරු නොලැබීම ගැන සමාජයේද කතා බහක් නිර්මාණය වී ඇත. අනුර හා සුසිල් පාර්ලිමේන්තු සමාරම්භ සැසියට සහභාගි වී වැඩිපුර කාලය ගත කළේද හුදකලාවය. "එකවර මෙරටේ ප්‍රධාන දේශපාලන පක්ෂ දෙකක් බිමට සමතලා කරපු කෙනා ඒ ශාපයෙන්ම ඔය අසරණ වෙලා ඉන්නේ. එයාටත් ඔහොමම තමයි ඉන්න වෙන්නෙ." සුසිල් කීවේ වේදනාවෙන්ය. අපි දරදිය ඇද්දා; ආණ්ඩුව හැදුවා. ඒ ගැන අපිට සතුටක් තියෙනවා" සුසිල් හිඳ සිටි පුටුවෙන් නැගිටින ගමන් කීවේය.

ජනාධිපතිවරයාගේ රාජාසන කතාවෙන් පසුව පැවැති ටී පාටියේදී පක්ෂ විපක්ෂ බොහෝ දෙනෙකු විජේදාස රාජපක්ෂ වට කරගෙන සිටියේය. කබීර් හෂීම්, ජෝන්ස්ටන් ප්‍රනාන්දු ද ඒ අතර විය. "මට වැඩ කරන්නයි ඕන. එකට සුදුසු දෙයක් ලැබුණොත් ගන්නවා "විජේදාස කියද්දී " නෑ නෑ ජනාධිපතිතුමා ඔබතුමාට නොසකා හරින්නෙ නෑ" යැයි ඔහු අසල සිටියවුන් කීවෝය. තේ පාටියේදී ජනාධිපති අගමැති දෙන්නා වෙන වෙනම එහි පැමිණි පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරු තානාපතිවරු හා හිතවතුන් සමඟ පැයකට ආසන්න කාලයක් සුහදව කතා බහ කෙළේය. එහිදී වැඩි දෙනා ගේ උනන්දුව තිබුණේ මේ නායකයින් සමඟ සෙල්ෆි ගැනීමටය. අගමැතිවරයා සියලු දෙනාට කතා කරමින් යන අතරේ වාසුදේව නානායක්කාර හා විග්නේෂ්වරම් දෙමස්සිනෝ එක්ව කතා බහ කරමින් සිටිනු දැක එතැන ගොස් දෙදෙනානේ කරට මහින්ද තම අත් දමා ගෙන දැන් ඉතින් උතුරු දකුණු ප්‍රශ්න තියෙන්න විදියක් නෑ. දෙන්නම පාර්මේන්තුවේ නිසා යැයි කීවේ මහ හඬින් සිනා සෙමිනි.

යදාමිණී ගුණවර්ධන, නාමල් රාජපක්ෂ ප්‍රමිත තෙන්නකෝන් හා ශෂීන්ද්‍ර රාජපක්ෂ සමාජවාදි දේශපාලන අරගලයේ තුනවන පරපුර නියෝජනය කරන්නන්ය. මොවුන් ගෙන් නාමල් හැර අන් තිදෙනෙක්ම මෙවර ප්‍රථමයෙන් පාර්ලිමේන්තුවට පැමිණි අය වීමද විශේෂය. තේ පාටියේදී යදාමිණී අසලට ගිය අගමැතිවරයා "අප්පච්චිලා ගේ අරගලය අත නොහැර ඉදිරියට ගන්න ඉන්න අලුත් පරපුරනෙ මේ" යැයි කියමින් යදාමිණීගේ පිටට තට්ටුවක් දමා සුබ පැතීය.

සමගි ජන බලවේගයෙන් මෙවර පාර්ලිමේන්තුවට පත්වූ මන්ත්‍රීවරුන් හා හිටපු මන්ත්‍රීවරු සහභාගී කරගෙන පසුගිය සතියේදී දේශපාලන වැඩමුළුවක් පැවැත්වුනේ කොළඹදීය. පක්ෂයේ ඉදිරි වැඩ කටයුතු ගැන මෙන්ම පාර්ලිමේන්තුවේ කටයුතු ගැන ස්ථිර වැඩපිළිවෙලක් සකස් කරගැනීම මෙම වැඩමුළුවේ අරමුණ වී තිබුණි.

වැඩ මුළුව ආරම්භ වූයේම පැමිණි මන්ත්‍රීවරු කණ්ඩායම් අටකට වෙන් කරමිනි. එක් එක් කණ්ඩායමට ඉදිරි වැඩපිළිවෙල ගැන අදහස් ඉදිරිපත් කිරීමේ අවස්ථාව ලබා දුන්නේය. මන්ත්‍රීවරු තමන්ගේ පෞද්ගලික අදහස් සාකච්ඡා කර කණ්ඩායමක් ලෙස පොදු ඉදිරිපත් කිරීමකට සූදානම් වන විටම සජිත් වැඩමුළුව පැවැත්වූ ශාලාවට පැමිණියේය. ඒ ඔහු පැමිණීමට සැලසුම් කර තිබූ නියමිත වේලාවටමය. සජිත් පැමිණ මේසයෙන් මේසයට ගොස් මන්ත්‍රීවරුන්ගේ අදහස් ලබා ගත්තේය. මුලින්ම ඔහු ගියේ මයන්ත දිසානායක, බුද්ධික පතිරණ, රෝහිණී කවිරත්න ඇතුළු මන්ත්‍රීවරු සිටි මේසයටය. ඉන් පසුව ඉම්තියාස් බකීර් මාකර්, තලතා අතුකෝරළ, හරින් ප්‍රනාන්දු, මනුෂ නානායක්කාර සිටි මේසයට සජිත් ආවේය. මනුෂ සිය කණ්ඩායමේ අදහස් ඉදිරිපත් කළේ විශාල ප්‍රමාණයේ කොළවල අදහස් ලියා පෙන්වමිනි.

කණ්ඩායම් ඉදිරිපත් කිරීමෙන් පසුව කිහිප දෙනෙක් කලින් සූදානම් කරගෙන පැමිණි ඉදිරිපත් කිරීම් කළේය. කබීර් හෂීම්, එරාන් වික්‍රමරත්නය හර්ෂ ද සිල්වා ෆීල්ඩ් මාර්ෂල් සරත් ෆොන්සේකා, රාජිත සේනාරත්න ඒ අතර විය.

"හොඳට දුවන කෙනාට, දක්ෂ කෙනාට කොන්දේසි විරහිතව මම තැන දෙනවා" සජිත් මෙහිදී කීවේය.

සමගි ජන බලවේගයේ මංගල පාර්ලිමේන්තු කණ්ඩායම් රැස්වීම පැවැත්වුණේ මේ වැඩමුළුවෙන් පසුවය.

"පාර්ලිමේන්තුව රැස්වුණාට පස්සේ කතානායකවරයෙක් පත් කිරීමේ අවස්ථාව විශේෂිතයි. අපි මේ ගැන අවධානය යොමු කළ යුතුයි"තිස්ස අත්තනායක කීවේය.

"ආණ්ඩුවට කැමැති අයෙක්ට කථානායකධූරය ලබා දෙන්න කියමු. අපි ඒ සඳහා අවස්ථාව දෙමු" මහලේකම් රංජිත් මද්දුමබණ්ඩාර කීවේ පාර්ලිමේන්තු සම්ප්‍රදාය අනුව කටයුතු කළ යුතු බව අවධාරණය කරමිනි.

"ඒ වුණාට පාර්ලිමේන්තුවේ විපක්ෂයට හිමිවිය යුතු වැදගත් තනතුරු කිහිපයක් තිබෙනවා. ඒවාට ආණ්ඩුවට අවශ්‍ය ආකාරයට පත්වීම් කරන්න දෙන්න බෑ. කෝප් කමිටුවේ සහ කෝපා කමිටුවේ බහුතරය තියෙන්නේ විපක්ෂය අතේ. ඒ නිසා අපි ඒ අවස්ථාව ලබාගත යුතුයි" මන්ත්‍රීවරුන් බහුතරයකගේ අදහස සජිත් ද අනුමත කරමින් කීවේය.

නව වැනි පාර්ලිමේන්තුවේ ආරම්භයට බොහෝ වේලාවකට පෙර සජිත් පාර්ලිමේන්තුවට පැමිණියත් විපක්ෂ නායක කාර්යාලයට නොගියේය. එහෙත් වෙනත් අමුත්තන් දෙදෙනෙක් විපක්ෂ නායක කාර්යාලට පැමිණියේය. ඒ ආණ්ඩු පක්ෂයේ ඇමැතිවරු දෙදෙනෙකි. නිමල් ලංසා සහ පියල් නිශාන්ත සභා ගර්භයේ සිට කතා බස් කරමින් විපක්ෂ නායක කාර්යාලය දෙසට පැමිණියේ පරණ පුරුද්දටමය. ඔවුන් දෙදෙනා කාර්යාලයේ දොරින් ඇතුළුවත්ම නුහුරු නුපුරුදු කණ්ඩායමක් එහි සිටිනු දුටුවෝය. තමන් දැන් සිටින්නේ ආණ්ඩු පක්ෂයේ බව ඔවුන් දෙදෙනාටම වැටහුණේ ඒ වෙලාවේදීය. විපක්ෂ නායක කාර්යාලයට පැමිණ ඇති බව තේරුම් යෑමත් සමග ඔවුන් දෙදෙනාගේ ඇස් උඩගොස් ආපසු හැරුණේ "අපි මේ වැරදි තැනකට ඇවිත් නේ" කියමිනි. පහුගිය සඳුදා රාත්‍රියේ ඇමති ප්‍රසන්න රණතුංගට හදිසි දුරකථන ඇමතුමක් ලැබුණි ඒ ජනාධිපතිවරයා ගෙනි." ප්‍රසන්න සංචාරකයෝ ලංකාවට ගෙන්වා ගන්න වැඩ පිළිවෙල ඉක්මන් කරන්න ඕනෑ."

"ඔව්, සර් මම ඒ ගැන ප්ලෑන් එකක් හදනවා. එයාර්පෝට් එක ඉක්මනින් විවෘත කර ගත්තොත් හොඳයි." ප්‍රසන්න කීවේය. "එයාර්පෝට් එක ඉක්මනින් විවෘත කරන්න ඕන. පිටරටවල ඉන්න අපේ අයව ඉක්මනින් ගෙන්වා ගන්නත් ඕනෑ. මේවා ගැන ඔයා කැබිනට් එකට පේපර් එකක් දාන්න" ජනාපතිවරයා ප්‍රසන්නට උපදෙස් දුන්නේය.

ආණ්ඩු පක්ෂ කණ්ඩායම් රැස්වීම පැවැත්වුණේ බදාදා සවසය. එයද ජනාධිපතිවරයාගේ ප්‍රධානත්වයෙන් ජනාධිපති ලේකම් කාර්යාලයේ දී පැවැත්විණ." පසුගිය ආණ්ඩුවේ මැති ඇමතිවරු පාර්ලිමේන්තුවට ආවේ නෑ. විපක්ෂ මන්ත්‍රීවරුන් ගේ ප්‍රශ්න වලට උත්තර දුන්නෙත් නෑ. හැම තිස්සේම පාර්ලිමේන්තු රැස්වීම්වල ඉදිරි පෙළ හිස්වෙලා තිබුණේ. අපේ ආණ්ඩුවේ අපේ පාර්ලිමේන්තුවේ එහෙම වෙන්න දෙන්න බෑ. පාර්ලිමේන්තුව පැවැත්වෙන දිනවල හැමෝම පාර්ලිමේන්තුවට එන්න ඕනේ" අගමැතිවරයා කීවේ උපදේශාත්මකවය.

> **මම ආයෙත් කොහෙටවත් යන්නේ නෑ තිස්ස කියයි**

පසුගියදා සිරිකොතට භික්ෂූන්වහන්සේලා පහළොස්නමක් පමණ හදිසියේම වැඩම කර රනිල්ට ලිපියක් බාර දුන්නේය. රනිල් වික්‍රමසිංහයන් භික්ෂූන් වහන්සේලා තමන් හමුවට එන බව දැන සිටියත් ඒ කුමක් සඳහා දැයි දැන සිටියේ නැත. භික්ෂූන් වහන්සේලා රනිල්ට බාර දුන් ලිපියේ සඳහන් වූවේ එජාප නායකත්වයෙන් රනිල් ඉවත්ව එය කරු ජයසූරියට බාර දෙන ලෙසය. එහිදී ඇති වු කතාබහ අතර සමහර භික්ෂූන් වහන්සේලා එතැනින් ඉවත්ව ගිය අතර තිනියාවල පාලිත, බෝපිටියේ ධම්මිස්සර යන හිමිවරුන් ඇතුළු කීප දෙනෙකු පසුව මාධ්‍ය හමුවක් පවත්වා රනිල් වික්‍රමසිංහයන් දැඩි විවේචනයට ලක් කරමින් කියා සිටියේ එජාපයට සම්බන්ධ සියලු භික්ෂූන් සමඟ නව ආණ්ඩුවට සහය දෙන බවය. එජාප නායකත්ව අර්බුදය මෙන්ම එජාප ජාතික ලැයිස්තු මන්ත්‍රී ධුරයද දැන් එජාපයේ දැඩි අර්බුදයක් බවට පත්ව ඇත. මේ අතර රනිල් වික්‍රමසිංහ තවදුරටත් පක්ෂ නායකත්වයේ රැඳී සිටීමටත් ජාතික ලැයිස්තු මන්ත්‍රී ධුරය එජාප මහ ලේකම් අකිලට ලබා දිමට උත්සහයක් පවතින බවටත් එජාපයේ පරාජිතයන් අතරේ කතාබහට ලක්ව ඇත.

ජනාධිපතිවරයා ඉකුත් සතිය යොදා ගත්තේ අලුතින් පත් වු අමාත්‍යවරුන් ගේ කාර්යභාරය ගැව කතා කරන්නටය.මුලින්ම ප්‍රවාහන අමාත්‍ය හා එහි රාජ්‍ය අමාත්‍යවරුන් සමඟ සාකච්ඡා කරමින් ජනාධිපතිවරයා "පුංචි දේකින් ලොකු වෙනසක් කරන්න පුළුවන්. බස් රථ සෝදන තැනින් ප්‍රවාහන කටයුතු දියුණු කරන්න පටන් ගන්න" ජනාධිපතිවරයා කීවේ වෙනත් උදාහරණයන්ද සමඟය. අනතුරුව මැටි, වේවැල්, තඹ ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යවරයා සමඟ සාකච්ඡා කළ ජනාධිපතිවරයා "මොන බාධක ආවත් දේශිය කර්මාන්ත අභාවයට යන්න දෙන්න එපා. මේ කර්මාන්ත දියුණු කරගෙන අපිට හොඳ විදේශ විනිමයක් උපයන්න පුළුවන්."කීවේය.


වෙළඳ අමාත්‍යාංශය

## සමුපකාර තොග වෙළඳ සංස්ථාව



**කොළඹ කොටුව පිහිටි ඓතිහාසික වටිනාකමකින් යුක්ත නිග්‍රීස් ගොඩනැගිල්ල බදු පදනම මත ලබා දීම**

වර්ග අඩි 21,326 කින් යුක්ත භූගත මහල, බිම් මහල සහ මහල් තුනක් (03) සහිත කොළඹ 01, යෝර්ක් වීදියේ පිහිටි සතොස ආයතනය සතු ගොඩනැගිල්ල බදු පදනම මත ලබා දෙනු ලැබේ.
ඒ අනුව,

01. **ගෙවීමට අපේක්ෂිත මාසික කුලිය**
02. **නවීකරණ කිරීම සඳහා ආයෝජන කිරීමට අපේක්ෂිත මුදල**
03. **ආරම්භ කිරීමට අපේක්ෂිත ව්‍යාපාරයේ ස්වභාවය සහ හිමිකම (නෛතික පුද්ගලභාවය)**
04. **ගෙවීමට අපේක්ෂිත තැන්පතු මුදල**
05. **ගොඩනැගිල්ල බදු පදනම මත ලබා ගැනීමට අපේක්ෂිත කාල සීමාව**
06. **ව්‍යාපෘති යෝජනාව**

යන කරුණු ඇතුලත් අයදුම් පත මුදල් අයකැමි වෙත ආපසු නොගෙවනු ලබන රු.1,000.00ක ගාස්තුවක් ගෙවීමෙන් ප්‍රසම්පාදන අංශය වෙතින් ලබාගත හැකිය. ටෙන්ඩර් ඉදිරිපත් කිරීමේදී රු.30,000.00ක ආපසු ගෙවන ටෙන්ඩර් තැන්පතුවක් 2020.09.14 වන දින පෙ.ව.12.00ට පෙර ගෙවිය යුතුය.

ටෙන්ඩර් අයදුම් පත් 2020.09.14 වන දින 14.30 පැයට ප්‍රථම අංක 01 දරණ ටෙන්ඩර් පෙට්ටියට බහා ලීමට කටයුතු කළ යුතු අතර එම අවස්ථාවේදීම මිල ගණන් විවෘත කරනු ලැබේ. එම අවස්ථාවට අයදුම්කරුට හෝ ඔහුගේ බලය ලත් එක් නියෝජිතයෙකුට සහභාගි විය හැකිය.

ගොඩනැගිල්ල පරීක්ෂා කිරීම 2020.08.24 වන දින සිට 2020.09.11 වන දින දක්වා රජයේ කාර්යාල වැඩ කරන දින තුල පෙ.ව. 9.00 සිට ප.ව. 5.00 දක්වා සිදු කළ හැකිය. අවසන් තීරණය ටෙන්ඩර් මණ්ඩලය සතුය.

**සභාපති, ප්‍රසම්පාදන කමිටුව, සමුපකාර තොග වෙළඳ සංස්ථාව, අංක 27, වෝක්ෂෝල් වීදිය, කොළඹ 02.**

# කැබිනට් / රාජ්‍ය ඇමැතිවරු, ඔවුන්ට අයත් ආයතන සහ එම ආයතනයන්හි ලිපින


● රජිත බස්නායක

ජනාධිපතිවරයා සහ අග්‍රාමාත්‍යවරයාගේ විෂය පථයට අයත් අමාත්‍යාංශ ඇතුළු අමාත්‍යාංශ 28ක් සහ රාජ්‍ය අමාත්‍යාංශ 39කින් සමන්විත නව රජයේ අමාත්‍ය ව්‍යුහය ජනාධිපති ලේකම් කාර්යාලය විසින් අගෝස්තු 9 වැනිදා ප්‍රකාශයට පත්කළේය.

එම අමාත්‍යාංශ සැකසීමේ දී ජාතික ප්‍රමුඛතා, ප්‍රතිපත්තිමය වගකීම් සහ කාර්යයන් සැලකිල්ලට ගෙන ඇති අතර, එක් එක් අමාත්‍යාංශයේ පුළුල් විෂය පථයට අනුව විශේෂ ප්‍රමුඛතා සාක්ෂාත් කර ගැනීම සහ අදාළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැලසීම සඳහා රාජ්‍ය අමාත්‍යාංශ ව්‍යුහගත කර ඇත. ඒ අනුව පසුගිය 9 වැනිදා ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා ඉදිරියේ දී දිවුරුම් දුන් එම කැබිනට් / රාජ්‍ය අමාත්‍යවරු, ඔවුන්ට අයත් අමාත්‍යාංශ සහ ඒවායේ ලිපිනයන් මෙසේය.

## ආරක්ෂක අමාත්‍යාංශය

15/5 බාලදක්ෂ මාවත, කොළඹ 03



### 01. ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ

- ආරක්ෂක කාර්ය මණ්ඩල ප්‍රධානී කාර්යාලය
- ශ්‍රී ලංකා ත්‍රිවිධ හමුදාව
- රක්නා ලංකා ආරක්ෂක ආයතනය
- රසායනික අවි ක්‍රියාත්මක කිරීමේ සම්මුතිය සඳහා ජාතික අධිකාරිය
- සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව
- රාජ්‍ය බුද්ධි සේවය
- ශ්‍රී ලංකා වෙරළාරක්ෂක බලකාය
- ජාතික අන්තරාදායක ඖෂධ පාලන මණ්ඩලය
- ශ්‍රී මත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය
- ආරක්ෂක සේවා විද්‍යාලය
- ජාතික ශිෂ්‍ය භට බලකාය
- ආරක්ෂක සේවා අණ සහ කාර්ය මණ්ඩල විදුහල
- ජාතික ආරක්ෂක අරමුදල
- පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය
- ජාතික ආරක්ෂක අධ්‍යයන ආයතනය
- රණවිරු සේවා අධිකාරිය
- අපි වෙනුවෙන් අපි අරමුදල
- බහු සංවර්ධන දෙපාර්තමේන්තුව සංවර්ධන කාර්ය සාධක බලකාය
- පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
- මූල්‍ය අධ්‍යන දෙපාර්තමේන්තුව




1.1. රාජ්‍ය අමාත්‍ය අභ්‍යන්තර කටයුතු ආරක්ෂාව, ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණය

**චමල් රාජපක්ෂ**

- සියලුම දිස්ත්‍රික්ක කොට්ඨාස ලේකම් කාර්යාල
- ශ්‍රී ලංකා පොලීසිය
- ජාතික පොලිස් ඇකඩමිය
- රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
- පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව
- ආගමන සහ විගමන දෙපාර්තමේන්තුව
- ජාතික මහලේකම් කාර්යාලය සහ රජයේ ආයතන
- ජාතික කළමනාකරණ ව්‍යසන සභාව
- ව්‍යසන කළමනාකරණ මධ්‍යස්ථානය
- ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය
- කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
- ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය

## මුදල් අමාත්‍යාංශය

ලෝටස් පාර, කොළඹ



### 02. අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ

**මහා භාණ්ඩාගාරය**

- ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව
- රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
- ජාතික අයවැය දෙපාර්තමේන්තුව
- කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව
- විදේශ සම්පත් දෙපාර්තමේන්තුව
- රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව
- භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව
- රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව
- වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
- තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව
- නීති කටයුතු දෙපාර්තමේන්තුව
- කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව
- සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව
- කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය

**රාජ්‍ය ආදායම් කළමනාකරණය**

- දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
- ශ්‍රී ලංකා රේගුව
- සුරාබදු දෙපාර්තමේන්තුව
- ජාතික ලොතරැයි මණ්ඩලය
- සංවර්ධන ලොතරැයි මණ්ඩලය
- තක්සේරු දෙපාර්තමේන්තුව
- ආනයන අපනයන දෙපාර්තමේන්තුව

**බැංකු, මූල්‍ය ම හා ප්‍රාග්ධන ප්‍රතිපත්ති නියාමන කටයුතු**

- ශ්‍රී ලංකා මහ බැංකුව
- සියලුම රාජ්‍ය බැංකු, මූල්‍ය, රක්ෂණ හා ඒවායේ පාලිත සමාගම් හා ආශ්‍රිත ආයතන
- ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය
- ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව හා එහි පාලිත සමාගම් සහ අනුබද්ධ සමාගම්
- ණය තොරතුරු කාර්යාංශය
- සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව
- ශ්‍රී ලංකා සුරැකුම් පත් හා විනිමය කොමිසම
- ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය
- ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව
- ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව

**සංඛ්‍යානමය තොරතුරු සහ අධ්‍යයන**

- ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
- ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය
- තිරසර සංවර්ධන සභාව

**සුභසාධනය සහ සමාජ ආරක්ෂාව**

- ශ්‍රී ලංකා ප්‍රතිලාභ මණ්ඩලය

**අරමුදල් ප්‍රතිපාදන**

- ලෝහෝර් ආර්යා අරමුදල.
- වර්ජන, කෝලහාල, සිවිල් කලබල හා ත්‍රස්තවාදය පිළිබඳ අරමුදල.
- ජාතික රක්ෂණ භාර අරමුදල.
- සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල.
- දරුවන් සුරකිමු ජාතික භාර අරමුද.ල.
- ශ්‍රම වාසනා අරමුදල.
- ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල
- වකුගඩු අරමුදල
- තේ ශක්ති අරමුදල
- කප්රුක අරමුදල
- රාජ්‍ය සේවා විශ්‍රාමිකයන්ගේ භාර අරමුදල
- බුද්ධ ශාසන අරමුදල
- බෞද්ධ පුනරුද අරමුදල
- සීමාසහිත නිපුණතා සංවර්ධන අරමුදල
- දේශීය ණය සහ සංවර්ධන අරමුදල
- නිමැයුම්කරුවන්ගේ අරමුදල
- තුරුසවිය අරමුදල
- මධ්‍යම සංස්කෘතික අරමුදල



2.1 රාජ්‍ය අමාත්‍යංශය මූල්‍ය හා ප්‍රාග්ධන වෙළෙඳපොළ සහ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ

**අජිත් නිවාඩ් කබ්රාල්**

- කළමනාකරණ සහ අධීක්ෂණ ව්‍යපෘති දෙපාර්තමේන්තුව
- ජාතික මෙහෙයුම් මද්‍යස්ථානය
- ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව
- රාජ්‍ය උකස් සහ ආයෝජන බැංකුව
- ආයතන සතු ලේකම් විසින් භාණ්ඩාගාරයට පුනර්ජීවනය යටතේ ප්‍රේරණ ක්‍රියාකාරීත්වය ව්‍යවසාය න් හෝ ඌන උපයෝජිත වත්කම්



2.2. රාජ්‍ය අමාත්‍යංශය සමෘද්ධි, ක්ෂුද්‍ර මූල්‍ය ණය, ස්වයං රැකියා, සහ ව්‍යාපාර සංවර්ධනය සහ ඌන උපයෝජිත රාජ්‍ය සම්පත් සංවර්ධනය

**ෂෙහාන් සේමසිංහ**

- රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාව
- සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
- ප්‍රාදේශීය සංවර්ධන බැංකුව
- ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය
- කුඩා හා මධ්‍යම ව්‍යවසාය ප්‍රාග්ධන සමාගම
- කුඩා හා මධ්‍යම ව්‍යවසාය අධිකාරිය
- ග්‍රාම ශක්ති කාර්යාංශය
- ජාතික සමාජ ආයතනය සංවර්ධනය
- ග්‍රාමීය සංවර්ධනය
- පුහුණු සහ පර්යේෂණ ආයතනය
- සමාජ ආරක්ෂණ මණ්ඩලය
- ආබාධ සහිත පුද්ගලයන් සඳහා ජාතික සභාව
- ආබාධ සහිත පුද්ගලයින් සඳහා ජාතික ලේකම් කාර්යාලය

## බුද්ධ ශාසන ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යංශය

135,ශ්‍රීමත් අනගාරිකා ධර්මපාල මාවත, කොළඹ 7

### 03. අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ

- බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව
- හින්දු ආගමික සහ සංස්කෘතික දෙපාර්තමේන්තුව
- ක්‍රිස්තියානි ආගමික සබඳතා දෙපාර්තමේන්තුව
- මුස්ලිම් ආගමික සහ සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව
- සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව
- ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව
- මහජන කාර්ය සාධන මණ්ඩලය
- ජාතික ලේඛනාගාර දෙපාර්තමේන්තුව
- ජාතික චිත්‍රපට සංස්ථාව
- බණ්ඩාරනායක ජාතික අනුස්මරණය පදනම
- ජේ.ආර්. ජයවර්ධන මධ්‍යස්ථානය



3.1. ජාතික උරුමයන්, ප්‍රාසාංගික කලා, සහ ජන කලා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍ය

**විදුර වික්‍රමනායක**

- ශ්‍රී ලංකා කලා මණ්ඩලය
- ශ්‍රී ලංකා ග්‍රාමෝදය මණ්ඩලය
- ජන කලා මධ්‍යස්ථානය
- ගාලු උරුමය
- ටවර් හෝල් පදනම
- මහින්ද රාජපක්ෂ ජාතික ටෙලි සිනමා උද්‍යානය
- කලා රඟහල (නෙළුම් පොකුණ)

## නාගරික සංවර්ධනය හා නිවාස රාජ්‍ය නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය

සුහුරුපාය, 17 සහ 18 වන මහල, බත්තරමුල්ල

### 04. ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ

- ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව, හෝටල් සංවර්ධන(ලංකා PLC)



4.1. නාගරික රාජ්‍ය අමාත්‍යාංශය සංවර්ධන, වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැර කිරීම සහ ප්‍රජා පවිත්‍රතා

**ආචාර්ය නාලක ගොඩහේවා**

- නාගරික සංවර්ධන අධිකාරිය
- ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධන සංස්ථාව සහ එහි අනුබද්ධිත ආයතන
- සහදිපත්‍ය කළමනාකරණ අධිකාරිය (පොදු පහසුකම් මණ්ඩලය)
- සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය
- වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව



4.2. ග්‍රාමීය නිවාස ඉදිකිරීම සහ ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්තය රාජ්‍ය අමාත්‍යාංශය

**ඉන්දික අනුරුද්ධ**

- ජාතික නිවාස සංවර්ධන අධිකාරිය
- ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව
- සීමාසහිත රජයේ කර්මාන්තශාලා ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය
- රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව
- රාජ්‍ය සංවර්ධන හා ඉදිකිරීම් සංස්ථාව
- ජාතික උපකරණ හා යන්ත්‍රෝපකරණ සංවිධානය
- සාගර දර්ශන සංවර්ධන සමාගම



4.3. වතු නිවාස හා ප්‍රජා යටිතල පහසුකම් පිළිබඳ රාජ්‍ය අමාත්‍ය

**ජීවන් තොණ්ඩමන්**

- වතු කලාපය සඳහා නව ගම්මාන සංවර්ධන අධිකාරිය
- වතු මානව සංවර්ධන භාරය
- සෞම්‍යමූර්ති තොන්ඩමන් අනුස්මරණ පදනම

## අධිකරණ අමාත්‍යාංශය

උපරමාධිකරණ උසාවි සංකීර්ණය, අධිකාරණ මාවත, කොළඹ 10



### 05. අලි සබ්රි

- නීතිපති දෙපාර්තමේන්තුව
- නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව
- ණය සම්මුති මණ්ඩලය රජයේ විශ්ලේෂක දෙපාර්තමේන්තුව
- ශ්‍රේෂ්ටාධිකරණයේ රේජිස්ට්‍රාර් කාර්යාලය
- ශ්‍රී ලංකාවේ නීති කොමිෂන් සභාව
- උසස් අධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලය
- ශ්‍රීලංකාවේ නීති ආධාර කොමිෂන් සභාව
- සමථ මණ්ඩල කොමිෂන් සභාව
- නීති අධ්‍යාපන කවුන්සිලය
- මහජන භාරකාර දෙපාර්තමේන්තුව
- ශ්‍රී ලංකාවේ වාණිජ සමථකරණ මධ්‍යස්ථානය
- ශ්‍රීලංකා ජාත්‍යන්තර බේරුම්කරණ මධ්‍ය ස්ථානය
- අපරාධ හා වින්දිතයින් ආරක්ෂා කිරීමේ ජාතික අධිකාරිය
- ශ්‍රීලංකා ජාත්‍යන්තර ගලවාගැනීමේ මද්‍යස්ථානය
- එක්සත් ජාතීන්ගේ ජාතික සමගිය සඳහා කාර්යාලය සහ ප්‍රතිසන්ධානය
- පුද්ගලයන් අතුරුදන් වීමේ කාර්යාලය
- වන්දි ගෙවීමේ කාර්යාලය




5.1 බන්ධනාගාර ප්‍රතිසංස්කරණ සහ සිරකරුවන් පුනරුත්ථාපන රාජ්‍ය අමාත්‍ය

**සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ**

- බන්ධනාගාර දෙපාර්තමේන්තුව
- විගණකාධිපති දෙපාර්තෙමේන්තුව
- තරුණ වැරදිකරුවන් සඳහා වන දෙපාර්තමේන්තු පුහුණු පාසල
- කොමසාරිස් ජනරාල් පුනරුත්ථාපන කාර්යාංශය


## විදේශ කටයුතු අමාත්‍යාංශය

ජනරජ ගොඩනැගිල්ල, 1, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත, කොළඹ 1



### 06. දිනේෂ් ගුණවර්ධන

- විදේශගත රාජ්‍ය දූත මණ්ඩල
- ජාතික සමුද්‍ර කටයුතු කාරක සභා ලේකම් කාර්යාලය
- වාණිජ දෙපාර්තමේන්තුව
- ලක්ෂ්මන් කදිර්ගාමර් ජාත්‍යන්තර සබඳතා හා ක්‍රමෝපාය අධ්‍යයන ආයතනය



6.1 කලාපීය සහයෝගීතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය

**තාරක බාලසූරිය**

- ලක්ෂ්මන් කදිර්ගාමර් ජාත්‍යන්තර ආයතන
- සබඳතා සහ උපායමාර්ගික අධ්‍යයනය

## රාජ්‍ය සේවා පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

පළාත් සභා සහ පළාත් පාලන ආයතන නිදහස් චතුරශ්‍රය, කොළඹ 7



### 07. ජනක බණ්ඩාර තෙන්නකෝන්

- විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
- රාජ්‍ය සේවා අන්‍යෝන්‍ය අර්ථසාධක සංගමය
- ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය
- ඩිස්ටන්ස් ලර්නිං සෙන්ටර් ලිමිටඩ්
- රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව
- රාජ්‍ය භාෂා කොමිසම
- මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව
- භාෂා අධ්‍යාපන හා පුහුණුව පිළිබද ජාතික ආයතනය
- පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය



7.1 පළාත් සභා සහ පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය

**සරත් වීරසේකර**

- ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනය


## අධ්‍යාපන අමාත්‍යාංශය

ඉසුරුපාය, බත්තරමුල්ල



### 08. මහාචාර්ය ජී.එල් පීරිස්

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සබාව කොමිෂන් සභාව (යූජීසී)
- සියලුම රාජ්‍ය විශ්වවිද්‍යාල
- පශ්චාත් උපාධි ආයතන සහ වෙනත් ආයතන
- UGC යටතේ අධ්‍යාපන විද්‍යාල
- ගුරු පුහුණු විද්‍යාල
- විභාග දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා ජාතික
- යුනෙස්කෝ කොමිසම,
- අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තෙමේන්තුව
- ශ්‍රී ලංකා ග්‍රන්ථ සංවර්ධන මණ්ඩලය, ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය,
- රාජ්‍ය මුද්‍රණ සංස්ථාව
- අධ්‍යාපන අද්‍යක්ෂවරුන්ගේ කාර්යාල



8.1 කාන්තා සහ ළමා සංවර්ධන, පෙර පාසල් සහ ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් සහ අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය


**පියල් නිශාන්ත සිල්වා**

- පරිවාස හා ළමා රැකවරණ සේවා දෙපාර්තමේන්තුව
- ජාතික ළමා ආරක්ෂණ අධිකාරිය
- ළමා ලේකම් කාර්යාලය
- ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය
- කාන්තා ජාතික කමිටුව

8.2 අධ්‍යාපනය ප්‍රතිසංස්කරණ, විවෘත විශ්ව විද්‍යාල සහ දුරස්ථ අධ්‍යාපනය රාජ්‍ය අමාත්‍යාංශය

(2020 අගෝස්තු 14 වන විට තනතුර පුරප්පාඩු වී ඇත)


- ජාතික අධ්‍යාපන ආයතනය
- ජාතික අධ්‍යාපන කොමිසම



8.3 නිපුණතා සංවර්ධන, වෘත්තීය පුහුණු, පර්යේෂණ සහ නවෝත්පාදනය රාජ්‍ය අමාත්‍යාංශය

**විශේෂඥ වෛද්‍ය සීතා අරඹෙපොල**

- ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අද්‍යාපන ආයතනය
- ජාතික ව්‍යාපාර කළමනාකරණ ආයතනය සහ අනුබද්ධිත ආයතන
- වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය
- ධීවර හා සමුද්‍ර විද්‍යාව පිළිබඳ ජාතික පුහුණු හා අධ්‍යාපන ආයතනය (ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය)
- ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය
- ජාතික ආධුනික හා කාර්මික පුහුණු අධිකාරිය
- ලංකා - ජර්මානු තාක්ෂණික පුහුණු ආයතනය
- ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය
- කාර්මික අධ්‍යාපන හා පුහුණු කාර්මික තාක්ෂාණ ආයතනය
- ශ්‍රී ලංකාවේ නැනෝතාක්ෂණික ආයතනය (පුද්ගලික) සමාගම
- ජාතික මූලික අධ්‍යාපන ආයතනය
- විද්‍යා, තාක්ෂණ හා නවෝත්පාදන තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ සම්බන්ධීකරණ ලේකම් කාර්යාලය
- ජාතික විද්‍යා පදනම
- ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව
- ශ්‍රී ලංකා ග්‍රහලෝකාගාරය
- ආතර් සී. ක්ලාක් නවීන තාක්ෂණ ආයතනය



8.4. දහම් පාසල්, භික්ෂු අධ්‍යාපන, පිරිවෙන් සහ බෞද්ධ විශ්වවිද්‍යාල රාජ්‍ය අමාත්‍යංශය

**විජිත බේරුගොඩ**

- භික්ෂු විද්‍යාල
- බෞද්ධ හා පාලි විද්‍යාල
- පිරිවෙන් අධ්‍යාපන මණ්ඩලය

## සෞඛ්‍ය අමාත්‍යාංශය

385, බද්දේගම විමලවන්ස හිමි මාවත, කොළඹ 10



### 09. පවිත්‍රා වන්නිආරච්චි

- ජාතික සෞඛ්‍ය සභාව
- වෛද්‍ය පර්යේෂණ ආයතනය
- ජාතික සෞඛ්‍ය විද්‍යායතනය
- ශ්‍රී ලංකා වෛද්‍ය සභාව
- ශ්‍රී ලංකා වෛද්‍ය විද්‍යාල සභාව
- පෞද්ගලික වෛද්‍ය නියාමන අධිකාරිය
- සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව
- සියලුම ජාතික ශික්ෂණ හා නිශ්චිත රජයේ රෝහල්.
- ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල
- විජය කුමාරතුංග අනුස්මරණ රෝහල
- අෂ්රොෆ් අනුස්මරණ රෝහල
- වෛද්‍ය රසායනාගාර තාක්ෂණ පාසල
- ජාතික වෘක්ක්වෙ දී, කාන්ද පෙරීම හා බද්ධ කිරීමේ ආයතනය
- දුම්කොළ සහ මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය
- 1990 සුවසැරිය පදනම
- සමාජ සේවා දෙපාර්තමේන්තුව
- වැඩිහිටි තැනැත්තන් සඳහා වන ජාතික සභාව සහ ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය



9.1 ඖෂධ නිෂ්පාදන, සැපයුම් හා නියාමන අමාත්‍යාංශය

**මහාචාර්ය චන්න ජයසුමන**

- රාජ්‍ය ඖෂධ සංස්ථාව
- ඖෂධ නිෂ්පාදන සංස්ථාව
- ජාතික ඖෂධ නියාමන අධිකාරිය




9.2. දේශීය වෙදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය සහ ආයුර්වේද රෝහල් සංවර්ධන හා ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යාංශය

**සිසිර ජයකොඩි**

- ආයුර්වේද දෙපාර්තමේන්තුව
- ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍යි සභාව
- ජාතික ආයුර්වේද වෛද්‍ය සංගමය
- ආයුර්වේද විද්‍යාලය සහ රෝහල් මණ්ඩලය
- ආයුර්වේද ඉගැන්වීම සහ පර්යේෂණ රෝහල්
- හෝමියෝපති රෝහල- වැලිසර ශ්‍රී ලංකා හෝමියෝපති වෛද්‍යය සංගමය


## කම්කරු අමාත්‍යාංශය

කිරුළ පාර, කොළඹ 5



### 10. නිමල් සිරිපාල ද සිල්වා

- කම්කරු දෙපාර්තමේන්තුව
- ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය
- සේවක අර්ථසාධක අරමුදල
- ජාතික වෘත්තීය සුරක්ෂිතතා සහ සෞඛ්‍ය ආයතනය
- කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය
- ජාතික එළදායිතා ලේකම් කාර්යාලය



10.1 විදේශ රැකියා ප්‍රවර්ධන සහ වෙළඳපොළ විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යංශය

**ප්‍රියංකර ජයරත්න**

- ශ්‍රී ලංකා විදේශ රැකියා කාර්යාංශය
- ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සිය

## පරිසර අමාත්‍යාංශය

සොබාදම් පියස, අංක 416 / සී / 1, රොබට් ගුණවර්ධන මාවත, බත්තරමුල්ල



### 11. මහින්ද අමරවීර

- මධ්‍යම පරිසර අධිකාරිය
- භූවිද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය
- සීමාසහිත ජී.එස්.එම්.බී. තාක්ෂණික සේවා පෞද්ගලික සමාගම
- වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව

## වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යංශය

811 / ඒ ජයන්තිපුර ප්‍රධාන පාර, බත්තරමුල්ල



### 12. සී.බී. රත්නායක

- රාජ්‍ය දැව සංස්ථාව.
- වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව.
- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව.



12.1 වන සංරක්ෂණ, අලි වැටවල් සහ අගල් ඉදිකිරීම, වන වගාව සහ වන සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

**විමලවීර දිසානායක**

- වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව

## කෘෂිකර්ම අමාත්‍යාංශය

"ගොවි ජන මන්දිරය", රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල



### 13. මහින්දානන්ද අලුත්ගමගේ

- කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය
- කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
- අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
- සීමාසහිත ඇල්කඩුව වැවිලි සමාගම
- ප්‍රාදේශීය ආර්ථික මධ්‍යස්ථාන
- වී අලෙවි මණ්ඩලය
- ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව. හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු ආයතන
- ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව
- ජාතික පසු අස්වනු කළමනාකරණ ආයතනය
- ජාතික පොහොර ලේකම් කාර්යාලය
- මාංශ භෝග හා ධාන්‍ය පර්යේෂණ සහ නිෂ්පාදන අධිකාරිය
- සීමාසහිත ලංකා පොහොර සමාගම
- කොළඹ කොමර්ෂල් පොහොර සමාගම
- සීමාසහිත ජනතා ෆර්ටිලයිසර් එන්ටර්ප්‍රයිසස්
- ජාතික කෘෂිකාර්මික විවිධාංගීකරණය හා ජනාවාස අධිකාරිය
- ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය
- සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
- ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය හා ආශ්‍රිත සමාගම්
- මිල්කෝ (ප්‍රයිවට්) ලිමිටඩ්
- සීමාසහිත මහවැලි ලයිව්ස්ටොක් එන්ටර්ප්‍රයිස් සමාගම



13.1 වී, ධාන්‍ය, කාබනික ආහාර, එළවළු, පලතුරු, මිරිස්, ලූනු සහ අර්තාපල් වගා ප්‍රවර්ධන, බීජ නිෂ්පාදන සහ ඉහළ කෘෂි තාක්ෂණික රාජ්‍ය අමාත්‍යාංශය

**ශෂීන්ද්‍ර රාජපක්ෂ**

- වී අලෙවිකරණ මණ්ඩලය
- ගොවිජන සේවා දෙපාර්තමේන්තුව
- හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිජන පර්යේෂණ සහ පුහුණු ආයතනය
- අදාල ආර්ථික මධ්‍යස්ථාන
- කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති පිළිබඳ ශ්‍රී ලංකා කවුන්සිලය
- පසු අස්වනු ජාතික තාක්ෂණ ආයතනය



13.2. පොහොර නිෂ්පාදන සහ සැපයුම්, රසායනික පොහොර සහ පළිබෝධනාශක නියාමන රාජ්‍ය අමාත්‍යාංශය

**මොහාන් ද සිල්වා**

- ජාතික පොහොර සංස්ථාව
- රනිල කුලයට අයත් බෝග පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය
- සීමාසහිත ලංකා පොහොර සමාගම
- කොළඹ වාණිජ පොහොර සමාගම
- ජනතා පොහොර එන්ටර්ප්‍රයිසස් ලිමිටඩ්
- ජාතික කෘෂිකාර්මික බෝග විවිධාංගීකරණය සහ බේරුම්කරණ අධිකාරිය



13.3. පශු සම්පත්, සත්ත්ව පාලන ගොවිපොළ ප්‍රවර්ධන, කිරි සහ බිත්තර ආශ්‍රිත කර්මාන්ත පිළිබඳ රාජ්‍ය අමාත්‍යාංශය

**ඩී.බී. හේරත්**

- සත්ත්ව නිෂ්පාදනය සහ සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
- ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය
- මිල්කෝ (පුද්) සමාගම.
- මහවැලි පශු සම්පත් සමාගම

## වාරිමාර්ග අමාත්‍යාංශය

අංක 11, ජාවත්ත පාර, කොළඹ 05.



### 14. චමල් රාජපක්ෂ

- වාරිමාර්ග දෙපාර්තමේන්තුව
- උමා ඔය, මොරගහකන්ද වේල්ල, කළු ගඟ, ගිං ගඟ, නිල්වලා ගඟ මල්වතු ඔය ඇතුළු ප්‍රධාන වාරිමාර්ග යෝජනා ක්‍රම
- මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශය සහ එහි අනුබද්ධිත ආයතන
- ශ්‍රී ලංකාවේ ඉංජිනේරු සභාව
- ජල සම්පත් මණ්ඩලය



14.1. මහවැලි කලාප ආශ්‍රිත ඇලවේලි සහ ජනාවාස පොදු යටිතල පහසුකම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

**සිරිපාල ගම්ලත්**

- ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය



14.2. ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත වැව්, ජලාශ හා වාරිමාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

**අනුරාධ ජයරත්න**

- ගොවිජන සංවර්ධන හා වාරිමාර්ග දෙපාර්තමේන්තු සහ අනුබද්ධ ආයතනය

## ඉඩම් අමාත්‍යාංශය

මිහිකතමැදුර, ඉඩම් ලේකම් කාර්යාලය, අංක 1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල



### 15. එස්.එම්. චන්ද්‍රසේන

- ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
- ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව
- ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව
- මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය
- ඉඩම් මැනුම් සභාව
- ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව
- ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව



15.1. ඉඩම් කළමනාකරණය සහ රාජ්‍ය ව්‍යවසාය ඉඩම් සංවර්ධන සහ දේපළ රාජ්‍ය අමාත්‍යාංශය

**රොෂාන් රණසිංහ**

- ඉඩම් පරිභෝජන ප්‍රතිපත්ති සැලසුම් කිරීමේ දෙපාර්තමේන්තුව
- ඉඩම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව

## ධීවර අමාත්‍යාංශය

මාලිගාවත්ත පාර, කොළඹ 01



### 16. ඩග්ලස් දේවානන්ද

- ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුව
- නෝර්ත් සී ලිමිටඩ්
- ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය
- ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව
- සීමාසහිත සීනෝර් පදනම
- ලංකා ධීවර සංස්ථාව
- ජාතික ජලජ සම්පත් පර්යෙෂණ හා සංවර්ධන ආයතනය



16.1. රාජ්‍ය අමාත්‍යාංශය විසිතුරු මසුන්, මිරිදිය මත්ස්‍ය සහ නිෂ්පාදන, ධීවර වරාය නිෂ්පාදනය, බහු- දින ධීවර යාත්‍රා කටයුතු සහ මත්ස්‍ය අපනයන

**කාංචන විජේසේකර**

- ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය
- ධීවර වරාය
- සී-නොර් ෆවුන්ඩේෂන් ලිමිටඩ්
- ලංකා නැව් සංස්ථාව
- ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන ඒජන්සිය

## වැවිලි අමාත්‍යාංශය

8,10 සහ11 මහල, සෙත්සිරිපාය අදියර II, බත්තරමුල්ල



### 17. වෛද්‍ය රමේෂ් පතිරණ

- තේ, රබර් හා පොල් වතු කැබලි කිරීම පාලන මණ්ඩලය
- ශ්‍රී ලංකා තේ මණ්ඩලය
- කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය
- තේ පර්යේෂණ ආයතනය
- ජනතා වතු සංවර්ධන මණ්ඩලය
- ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව
- ජාතික වැවිලි කළමනාකරණ ආයතනය
- සීමාසහිත කළුබෝවිටියන තේ කර්මාන්ත ශාලාව
- සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම
- සීමාසහිත හලාවත වැවිලි සමාගම
- තල් සංවර්ධන මණ්ඩලය
- රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව
- රබර් පර්යේෂණ ආයතනය
- ශ්‍රී ලංකා රබර් නිෂ්පාදන සහ අපනයන සංස්ථාව
- පොල් වගා කිරීමේ මණ්ඩලය
- පොල් සංවර්ධන අධිකාරිය
- පොල් පර්යේෂණ ආයතනය
- ශ්‍රී ලංකා කජු සංස්ථාව
- සීමාසහිත හිඟුරාන සීනි කර්මාන්ත සමාගම
- සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගම
- කන්තලේ සීනි සමාගම
- උක් පර්යේෂණ ආයතනය
- ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගම
- කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදන අලෙවි මණ්ඩලය



17.1. තේ කම්හල නවීකරණය සහ අපනයන විවිධාංගීකරණය කිරීම රාජ්‍ය වැවිලි අමාත්‍යාංශය

**කනක හේරත්**


- ජාතික ආයතනය
- වතු කළමනාකරණය
- කලුබෝවිටියාන තේ කම්හල



17.2. වැවිලි කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය

**අරුන්දික ප්‍රනාන්දු**

- කුරුණෑගල වැවිලි සමාගම
- චිලව් ප්ලාන්ටේෂන්
- තල් සංවර්ධන මණ්ඩලය
- රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව
- ශ්‍රී ලංකා රබර් පර්යේෂණ ආයතනය
- ශ්‍රී ලංකා රබර් නිෂ්පාදනය සහ සීමාසහිත අපනයන සංස්ථාව
- පොල් වගා මණ්ඩලය
- පොල් සංවර්ධන අධිකාරිය
- පොල් පර්යේෂණආයතනය



17.3. උක්, බඩ ඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබු නැටි, කුඩා වැවිලිභෝග සඳහා අදාළ රාජ්‍ය අමාත්‍යාංශය

**ජනක වක්කුඹුර**

- ශ්‍රී ලංකා කජු සංස්ථාව
- හිගුරාණ සීනි ඉන්ඩස්ට්‍රීස් ලිමිටඩ්
- ලංකා සීනි සමාගම(පුද්) සමාගම
- කන්තලේ සීනි කර්මාන්ත ශාලාව
- උක් පර්යේෂණ ආයතනය
- ගල් ඔය වැවිලි (පුද්) සමාගම
- කුළුබඩු සහ ආශ්‍රිත නිෂ්පාදන අලෙවිකරණය

## ජල සම්පාදන අමාත්‍යාංශය

35, 'ලක් දිය මැදුර', නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල



### 18. වාසුදේව නානායක්කාර

- ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය.
- ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව.



18.1. ග්‍රාමීය ජලසම්පාදන සැපයුම් ව්‍යාපෘති රාජ්‍ය අමාත්‍යාංශය

**සනත් නිශාන්ත**

- ජාතික ප්‍රජා ජල දෙපාර්තමේන්තුව

## විදුලිබල අමාත්‍යාංශය

අංක 72, ආනන්ද කුමරාස්වාමි මාවත, කොළඹ 7



### 19. ඩලස් අලහප්පෙරුම

- ලංකා විදුලිබල මණ්ඩලය සහ එහි පරිපාලිත සමාගම්
- LTL හෝල්ඩිංග්ස් (පුද්ගලික) සමාගම
- ලංකා විදුලිබල (පුද්) සමාගම
- ලංකා ගල් අඟුරු සමාගම (පුද්) සමාගම



19.1. සූර්ය බල, සුළං හා විදුලි ජනන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යය

**දුමින්ද දිසානායක**

- ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය
- ශ්‍රී ලංකා පරමාණුක බලශක්තිය නියාමන සභාව
- ශ්‍රී ලංකා පුනර්ජනනීය බලශක්ති අධිකාරිය

## බලශක්ති අමාත්‍යාංශය

අංක 72, ආනන්ද කුමරාස්වාමි මාවත, කොළඹ 7



### 20. උදය ගම්මන්පිල

- ලංකාව ඛනිජ තෙල් සංස්ථාව
- ලංකා ඛනිජ තෙල්
- ගබඩා ටර්මිනල්ස් ලිමිටඩ්
- ඛනිජ තෙල් සම්පත් සංවර්ධන කාර්යාලය
- පොලිප්ටෝ ලංකා (පුද්) සමාගම

## වරාය හා නාවික අමාත්‍යාංශය

19, 1 චෛත්‍ය පාර, කොළඹ



### 21. රෝහිත අබේගුණවර්දන

- ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ අනුබද්ධ උප සමාගම්
- ලංකා නැව්ගත කිරීමේ සංස්ථා සමාගම
- වෙළඳ නැව්ගත කිරීමේ කාර්යාලය



21.1. ගබඩා පහසුකම්, පර්යන්ත, වරාය පහසුකම් සහ නැව් කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය

**ජයන්ත සමරවීර**

## මහාමාර්ග අමාත්‍යාංශය

මැකලම් පාර, කොළඹ 1



### 22. ජොන්ස්ටන් ප්‍රනාන්දු

- මාර්ග සංවර්ධන අධිකාරිය සහ එහි පාලිත සමාගම් හා ආශ්‍රිත සමාගම්




22.1. ග්‍රාමීය මාර්ග සහ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය

**නිමල් ලන්සා**

- මග නැගුම

## ප්‍රවාහන අමාත්‍යාංශය

7 මහල, අදියර දෙක, සෙත්සිරිපාය, බත්තරමුල්ල



### 23. ගාමිණී ලොකුගේ

- ජාතික ගමනාගමන කොමිෂන් සභාව
- මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව
- ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තුමේන්තුව
- සීමාසහිත ලක්දිව ඉංජිනේරු සමාගම
- ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය
- ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය
- මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව



23.1. වාහන නියාමනය, මගී ප්‍රවාහන සේවය (බස්), දුම්රිය මැදිරි, සහ මෝටර් වාහන කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය

**දිලුම් අමුණුගම**

- ලක්දිව ඉංජිනේරු(පුද්) සමාගම.
- ශ්‍රී ලංකා ප්‍රවාහන මණ්ඩලය.
- ජාතික ප්‍රවාහන සේවය
- වෛද්‍ය ආයතනය
- මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

## තරුණ කටයුතු සහ ක්‍රීඩා කටයුතු අමාත්‍යාංශය

අංක 9, පිලිප් ගුනවර්දන මාවත, කොළඹ 1



### 24. නාමල් රාජපක්ෂ

- ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව
- ක්‍රිකට් පාලක මණ්ඩලය
- ජාතික තරුණ සේවා සභාව
- ජාතික යොවුන් සේනාංකය
- සී/ස ජාතික තරුණ සේවා සමුපකාරය
- නායකත්ව සංවර්ධන ජාතික මධ්‍යස්ථානය
- මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව
- ස්මාර්ට් ශ්‍රී ලංකා ආයතනය
- ජාතික ක්‍රීඩා විද්‍යායතනය
- ජාතික ක්‍රීඩා සභාව
- සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය
- ක්‍රීඩා වෛද්‍ය ආයතනය
- ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජිතායතනය



24.1. රාජ්‍ය අමාත්‍යාංශය. ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් සංවර්ධනය

**තේනුක විදානගමගේ**

- ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය
- ජාතික ක්‍රීඩා සභාව
- සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණය අධිකාරිය
- ජාතික ක්‍රීඩා වෛද්‍ය ඒකකය
- ශ්‍රී ලංකා මත්ද්‍රව්‍ය නාශක විරෝධී ආයතන

## සංචාරක අමාත්‍යාංශය

අංක 80, ගාලු පාර, කොළඹ 03



### 25. ප්‍රසන්න රණතුංග

- ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය
- ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය
- ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය
- ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය
- ජාතික සත්ත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව
- ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව
- සිවිල් ගුවන්සේවා අධිකාරිය
- සීමාසහිත ගුවන් තොටුපළ හා ගුවන්සේවා (ශ්‍රී ලංකා) සමාගම
- සීමාසහිත ශ්‍රී ලන්කන් එයාර් ලයන් සහ එහි පාලිත සමාගම්



25.1. ගුවන් සේවා සහ අපනයන කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

**ඩී.වී. චානක**

- සිවිල් ගුවන් සේවා අධිකාරිය
- ගුවන්තොටුපල සහ ගුවන් (සේවා) ශ්‍රී ලංකා ලිමිටඩ්
- ශ්‍රීලංකන් ගුවන් සේවය සහ පාලිත සමාගම්


## වෙළඳ අමාත්‍යාංශය

වොක්ෂෝල් වීදිය, කොළඹ 2



### 26. ආචාර්ය බන්දුල ගුණවර්ධන

- අපනයන සංවර්ධනය මණ්ඩලය
- ලංකා සතොස ලිමිටඩ්
- ලංකා පොදු වෙළඳාම
- සීමිත සමාගම
- සමුපකාර තොග පිහිටුවීම
- මිනුම් ඒකක, ප්‍රමිති සහ සේවා දෙපාර්තමේන්තුව
- ආහාර කොමසාරිස් දපාර්තෙමින්තුවේ
- ශ්‍රී ලංකා අනුකූලතා මණ්ඩලය තක්සේරුව
- ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය
- ජාතික බුද්ධිමය දේපල කාර්යාලය
- මහපොළ භාර අරමුදල



26.1. සමුපකාර සේවා අලෙවි සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

**ලසන්ත අලගියවන්න**

- පාරිභෝගික කටයුතු අධිකාරිය
- ජාතික සමුපකාර සංවර්ධන ආයතනය
- සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව (රෙජිස්ට්‍රාර් සමුපකාර සමිති)
- සමුපකාර සේවක කොමිෂන් සභාව

## කර්මාන්ත අමාත්‍යාංශය

73/1 ගාලු පාර, කොළඹ 3



### 27 විමල් වීරවංශ


- ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය
- ලංකා ලේලන්ඩ් ලිමිටඩ්
- ලංකා අශෝක් ලේලන්ඩ් ලිමිටඩ්
- සීමාසහිත ජාතික කඩදාසි සංස්ථාව
- සීමාසහිත කහගොල්ල ඉංජිනේරු සේවා සමාගම
- මාන්තායි සෝල්ට් ලිමිටඩ්
- අලිමංකඩ ලුණු ලේවාය
- රොබෝ තාක්ෂණය සඳහා වන විශිෂ්ටතා මධ්‍යස්ථානය
- සීමාසහිත ලංකා සිමෙන්ති සමාගම
- ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව
- ලංකා ඛනිජ වැලි සමාගම
- පරන්තන් කෙමිකල්ස් ලිමිටඩ්
- කහටගහ ග්‍රැෆයිට්
- සීමාසහිත ලංකා පොස්පේට් සමාගම
- ලංකා පිඟන් සංස්ථාව (ගඩොල් සහ උළු අංශය)
- සිමාසහිත බී.සී.සී.සමාගම
- ශ්‍රී ලංකා පේෂ කර්මාන්ත හා ඇඟලුම් ආයතනය
- පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව
- ලංකා ටෙක්ස්ටයිල් මිල්ස් එම්පෝරියම් ලිමිටඩ්
- ලංකා සළුසල ලිමිටඩ්
- ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය (ලක්සල)
- ජාතික මෝස්තර මධ්‍යස්ථානය
- ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය
- මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ ආයතනය
- දැව ආශ්‍රිත නිර්මාණ මධ්‍යස්ථානය
- විද්‍යාතා මධ්‍යස්ථාන
- ජාතික ශිල්ප සභාව



27.1. බතික් අත්යන්ත්‍ර හා දේශීය ඇඟලුම් කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය

**දයාසිරි ජයසේකර**


- ශ්‍රී ලංකා රෙදිපිළි හා ඇඟලුම් ආයතනය
- රෙදිපිළි කර්මාන්ත දෙපාර්තමේන්තුව
- ලංකා රෙදිපිළි කම්හල් එම්පෝරියම් ලිමිටඩ්
- ලංකා සළුසල
- ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය (ලක්සල)
- ජාතික සැලසුම් මධ්‍යස්ථානය



27.2. මැණික් සහ ස්වර්ණාභරණ සහ ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය

**ලොහාන් රත්වත්තේ**

- ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය.
- මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා පුහුණු ආයතනය



27.3. ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන සහ වේවැල් පිත්තල, මැටි, ගෘහ භාණ්ඩ රාජ්‍ය අමාත්‍යාංශය

**ප්‍රසන්න රණවීර**

- දැව සැලසුම් මධ්‍යස්ථාන
- විද්‍යාතා මධ්‍යස්ථානය
- ජාතික ශිල්ප සභාව

## ජනමාධ්‍ය අමාත්‍යාංශය

අංක.163. ඇසිදිසි මැදුර, කිරුලපන මාවත, කොළඹ 05



### 28. කෙහෙළිය රඹුක්වැල්ල

- තොරතුරු දැන ගැනීමේ අයිතිය
- තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව
- රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව
- ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
- ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය
- ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව
- ස්වාධීන රූපවාහිනී ජාලය
- ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව
- සීමාසහිත ලංකා එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම
- ලංකා පුවත් ආයතනය
- සැලසිනේ රූපවාහිනී ආයතනය
- ශ්‍රී ලංකා පදනම
- තැපැල් දෙපාර්තමේන්තුව



28.1. තැපැල් සේවා සහ ජනමාධ්‍ය වෘත්තීය සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

**සතාසිවම් වියලේන්ද්‍රන්**

- තැපැල් දෙපාර්තමේන්තුව

● තාරක වික්‍රමසේකර

# අනතුරු ඇඟවීම් 97ක් හමුවේ සැඟවුණු පාස්කු ප්‍රහාරයේ සුළමුල

**ලෝකයේ මෙතෙක් නොසැලකිලිමත්කමින් සිදු වූ දරුණුම ත්‍රස්ත ප්‍රහාරය වන්නේ ශ්‍රී ලංකාවේ පාස්කු ඉරු දින ප්‍රහාරය බව ජෝර්ජ්ටවුන් විශ්වවිද්‍යාලයේ ආරක්ෂක අධ්‍යයන මධ්‍යස්ථානයේ සහකාර මහාචාර්ය රීටා පර්සි පසුගියදා පවසා තිබුණි. ඔහු පවසා තිබුණේ පාසල් දරුවකුට පහර දීමට තවත් පාසල් දරුවකු උත්සාහ කරන බව දැන ගන්නට ලැබුණහොත් ආරක්ෂාව පිණිස කුමන හෝ ක්‍රියා මාර්ගයක් ගැනීමට තරම් දැනුමක් තිබෙන බවයි.**

නමුත් 2019 වසරේ පාස්කු ඉරිදා ශ්‍රී ලංකාවේ සිදුවූයේ අනතුරු ඇඟවීමකදී පාසල් සිසුවකුට ඇති දැනුමවත් නොතිබුණු ආකාරයේ ඉතාම ඛේදනීය තත්ත්වයක් බවත් ඔහු පෙන්වා දී තිබුණි. 1983 වසරේ සිට 2009 දක්වා වූ කාලය ඇතුළත ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වූ බෙදුම්වාදී යුද්ධය මැඬ පවත්වන්නට ශ්‍රී ලංකා හමුදාව කටයුතු කෙළේ බුද්ධි අංශ ලබා දුන් තොරතුරු මූලික කරගෙන බවත් පාස්කු ඉරිදා ප්‍රහාරය සිදුවූයේ බුද්ධි අංශ අනතුරු නොසලකා හැරීම නිසා බවද ඔහු පෙන්වා දී තිබුණි.

පාස්කු ප්‍රහාරය පිළිබඳ පසුගිය සතියේ ලබා දුන් සාක්ෂි අනුව හෙළිව තිබුණේ ප්‍රහාරයට පෙර අනතුරු ඇඟවීම් සියයකට ආසන්න සංඛ්‍යාවක් ලැබී ඇති බවයි.

එසේම මේ ප්‍රහාරය සම්බන්ධව සාක්ෂි ලබාදෙමින් අන්තර්ජාතික යුද විශ්ලේෂකයකු යෙන්ම ආරක්ෂක විෂය සම්බන්ධයෙන් ප්‍රවීණයකු වන මහාචාර්ය රොහාන් ගුණරත්න මහතා පවසා තිබුණේ ප්‍රහාරය සිදුවන දිනය සහ වේලාව පවා ඉන්දීය ඔත්තු සේවා විසින් ලබා දී තිබියදීත් ප්‍රහාරය වළක්වා නොගැනීම මෙරට ආරක්ෂක අංශ සිදුකළ වරදක් බවයි. විශේෂයෙන්ම නිශ්චිත බුද්ධි තොරතුරු බරපතළ ලෙස භාර නොගෙන කටයුතු කිරීම මේ ව්‍යසනයට මුල් වූ බව මහාචාර්ය වරයා පවසා සිටියේය.

## මහාචාර්යවරයාගේ අනතුරු ඇඟවීම

මහාචාර්යවරයා 'සිළුමිණ' පුවත්පතට වසර කිහිපයකට පෙර අවස්ථා දෙකකදී සම්මුඛ සාකච්ඡා ලබා දෙමින් පවසා සිටියේ අන්තවාදී සංවිධාන මෙරට ඉදිරියේදී ක්‍රියාත්මක වන බවයි. ඔහු 2016දී ලබා දුන් සම්මුඛ සාකච්ඡාවකදී පවසා තිබුණේ ශ්‍රී ලංකාව තුළ අයි.එස්. සංවිධානයට සහාය දක්වන විශාල පිරිසක් සිටින බවයි.

එබැවින් එම අන්තවාදී පිරිස් කණ්ඩායමක් ලෙස සංවිධාන වී ප්‍රහාර එල්ල කරන තෙක් බලා නොසිට රජය ඒ සඳහා පියවර ගත යුතු බව මහාචාර්ය රොහාන් ගුණරත්න 2016 වසරේදී ප්‍රකාශ කර තිබුණි. 'අයිඑස්අයිඑස්' සංවිධානයේ ඉලක්කයක් ලෙස ශ්‍රී ලංකාව පත් විය හැකි බවට යුද විශ්ලේෂකයකු නිල වශයෙන් ප්‍රථම වරට පවසා තිබුණේ එම සාකච්ඡාවේදීය.

ඊට පෙර 'සිළුමිණ' පුවත්පතේ 'අයිඑස්අයිඑස්' අවසානයක්ම වේවා! යන සිරස්තලයෙන් දක්වා තිබුණේ ගලේවෙල ප්‍රදේශයේ මුස්ලිම් ජාතිකයකු 'අයිඑස්අයිඑස්' සංවිධානයට බැඳී කටයුතු කරමින් සිටියදී සිරියාවේදී මිය යාමෙන් පසුවය. එම නිසා 'අයිඑස්අයිඑස්' ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් එතැනින් නැවතිය යුතු බවද එම ලිපියෙන් දක්වා තිබුණි. එසේ වුවද ඒ සම්බන්ධව පොලිසියේ හෝ බුද්ධි අංශ ක්‍රියාකාරීන්ගේ අවධානයක් යොමුව නොතිබුණි.

මාධ්‍ය මඟින් මේ අයුරින් කෙතරම් අවදානම ප්‍රකාශ කළද ඒ සම්බන්ධව අවධානයක් යොමු වූයේ නැත. පාස්කු ප්‍රහාරය පිළිබඳ විමර්ශනය සම්බන්ධව පත් කළ ජනාධිපති කොමිසම විසින් මේ සම්බන්ධව අනතුරු ඇඟවූ මාධ්‍යවේදීන් කැඳවා කරුණු විමසන්නේ ප්‍රහාරයෙන් වසරකට පමණ පසුය. පසුගිය සතියේ ජාතික පුවත්පතක ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදියකු ගෙන්වා ඔහු විසින් 2014 වසරේ ලියන ලද කෘතියක් පිළිබඳව විමසා තිබුණි. ඔහු පැය 3ක් ප්‍රකාශ ලබා දී තිබුණි.

ඊට පෙර මවිසින් 2015 වසරේ සිට අවස්ථා 8කදී පමණ මේ අවදානම සම්බන්ධව ලියන ලද ලිපි පිළිබඳව හා ප්‍රහාරය සිදු වූ කාලයේ යුද හමුදාපතිවරයා ලෙස කටයුතු කළ ලුතිනන් ජනරාල් මහේෂ් සේනානායක මහතා හා කළ සාකච්ඡාවකදී විමර්ශනාත්මක ලෙසින් විමසන ලද ප්‍රශ්නයක් සම්බන්ධව කරුණු විමසන ලදී. කොමිසම විසින් පසුගිය මස 27 වැනිදා ප්‍රකාශ ලබා දෙන ලෙස දන්වන ලද අතර මවිසින් පැය 5ක් (පෙ.ව. 9.30 සිට ප.ව. 2.30 දක්වා) ප්‍රකාශ ලබා දෙන ලදී. ඊට පෙරද අවස්ථා දෙකකදී මාධ්‍යවේදීන් දෙදෙනකුගෙන්ද කරුණු විමසන ලදී.

## පළමු බුද්ධි තොරතුර

පාස්කු ප්‍රහාරය පිළිබඳව පළමු බුද්ධි තොරතුර රාජ්‍ය බුද්ධි සේවා අධ්‍යක්ෂ නිලන්ත ජයවර්ධනට ලැබෙන්නේ 2019 වසරේ අප්‍රේල් 04 වැනිදාය. ඔහු එම තොරතුරු ජාතික බුද්ධි ප්‍රධානී සිසිර මෙන්ඩිස්ට ලබා දෙන අතර සිසිර මෙන්ඩිස් එය පොලිස්පතිවරයාට යොමු කර තිබේ.

සහරාන් සහ ඔහුගේ කණ්ඩායම මරාගෙන මැරෙන ප්‍රහාරයක් සැලසුම් කරන බවත්, එම ප්‍රහාරයන්ගේ ඉලක්ක වී ඇත්තේ කතෝලික දේවස්ථාන ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලය බවත් සුපිරි සංචාරක හෝටල් මේ ඉලක්කයේ තවත් ඉලක්ක විය හැකි බවට තොරතුරු ලැබී තිබුණි.

එම තොරතුර නිලන්ත ජයවර්ධන විසින් රහසිගතව අප්‍රේල් 09 දින ජාතික බුද්ධි ප්‍රධානීට, පොලිස්පතිට සහ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට යවා ඇති බවට වාර්තා වේ. මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාර, ආයුධ ප්‍රහාර ඇතුළු ප්‍රහාර මීට ඇතුළත් බවද එය සිදුකරන සහරාන් ඇතුළු මරාගෙන මැරෙන ත්‍රස්තයන්ගේ නම්ද එම ලිපියේ සඳහන්කර තිබීමෙන් බුද්ධි තොරතුරු කෙතරම් සූක්ෂ්ම ලෙසින් ලැබී ඇත්ද යන්න මෙයින් තහවුරු වේ.

එවන් ත්‍රස්තවාදී ප්‍රහාරයක් ගැන විශ්වසනීයත්වයෙන් යුතු බුද්ධි තොරතුරක් තිබියදීත් අප්‍රේල් 16 දා වනතුරු බුද්ධි අංශ රැස්වීමක් කැඳවා නැති බවද පාස්කු ප්‍රහාරය සම්බන්ධ වූ විශේෂ කාරක සභාවේදී අනාවරණය විය.

අප්‍රේල් 16 වැනිදා සහරාන්ගේ අනුගාමිකයින් කාත්තන්කුඩියේදී යතුරු පැදියක් පුපුරුවා හරින ලද්දේ දුරස්ථ පාලකයක් මඟිනි. ඒ අධික වැසි හා අකුණු පවතින අවස්ථාවකය. කාත්තන්කුඩියේ පොල්වත්තකදී එම අත්හදාබැලීම සිදු කළ බවට නැඟෙනහිර යුද හමුදා අනු ඛණ්ඩයක් විසින් දන්වන ලද තොරතුරු අනුව එය ආරක්ෂක



අගරදගුරු මැල්කම් රංජිත් කාදිනල් හිමිපාණන් පාස්කු ප්‍රහාරයෙන් තුවාල ලැබූ කාන්තාවකගෙන් සුව දුක් විමසූ අවස්ථාව

අංශවල ඉහළටම ගිය තොරතුරක් බවට පත් ව තිබේ. එසේ වුවත් ඒ ගැන අවධානය යොමු කර නැත. එය විනාශකාරී ක්‍රියාවක අත්හදාබැලීමක් බවත් නුදුරු දිනකදීම විනාශකාරී ක්‍රියාවක් විය හැකි බවට එම අංශවලින් අනතුරු ඇඟවීම් ලැබී තිබුණද ඒ සම්බන්ධව කිසිදු ආකාරයක විධිමත් පරීක්ෂණයක් සිදු කර නොමැති බවද ඒ වන විට අනාවරණය වී තිබේ.

පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් විමර්ශනය කෙරෙන කොමිසම හමුවේ සාක්ෂි ලබා දුන් බස්නාහිර දකුණ භාර නියෝජ්‍ය පොලිස්පති වසන්ත වික්‍රමසිංහයන් (ඔහු 2019 වසරේ අප්‍රේල් මස 19 වැනිදා සිට 21 වැනිදා දක්වා බස්නාහිර උතුර දිසාව භාරව වැඩ ආවරණය කරන නියෝජ්‍ය පොලිස්පතිවරයා විය) පවසා සිටියේ පාස්කු ප්‍රහාරය සම්බන්ධව තොරතුරු දැක්වෙන ලේඛනයක් VPN තාක්ෂණය ඔස්සේ 2019.04.09 දින තමන්ට ලැබුණු බවයි. අදාළ ලේඛනයේ දැක්වුණේ කතෝලික දේවස්ථාන කිහිපයකට සහ ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය ඇතුළු ස්ථාන කිහිපයකට මරාගෙන මැරෙන ප්‍රහාරයක් එල්ල වීමට ඉඩ ඇති බවට තොරතුරු වාර්තා වී ඇති බවයි. එම ප්‍රහාරයට සම්බන්ධව සහරාන් හෂීන් හා මොහොමඩ් රිල්වාන් අයගේ නම් ගම් ඡායාරූප හා හැඳුනුම්පත් අංක පවා එහි සඳහන්ව තිබූ බවත් ඔහු පවසන ලදී.

## ප්‍රහාරයට පෙර දිනත් අනතුරු ඇඟවීමක්

එසේම අප්‍රේල් 20 වැනිදා රාත්‍රී ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නන්දන මුණසිංහ තමා අමතා සහරාන් විසින් ප්‍රහාරය එල්ල කිරීම සම්බන්ධව ලැබී ඇති තොරතුරු තහවුරු වී ඇති බව රාජ්‍ය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂ නිලන්ත ජයවර්ධන ස්ථිර කළ බව පැවසීය.

එමෙන්ම මීට පෙර ප්‍රකාශ ලබා දුන් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් පැවසුවේ ඉන්දීය රෝ බුද්ධි අංශ විසින් 2019 වසරේ ජනවාරි 23 වැනිදා ප්‍රහාරය පිළිබඳ සියලු තොරතුරු ලබා දී තිබූ බවයි. ජාතික බුද්ධි සේවාව, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව, ආරක්ෂක අමාත්‍යාංශය මෙන්ම සමස්ත පොලිස් දෙපාර්තමේන්තුවම ඒ සම්බන්ධයෙන් නොසැලකිලිමත් ලෙසින් කටයුතු කර ඇති බව ඔහු පැවසුවේය.

එවකට මීගමුව කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයා වූ චන්දන අතුකෝරළ සාක්ෂි දෙමින් පැවසුවේ ප්‍රහාරයක් ගැන තොරතුරු ලැබී තිබුණද මෙතරම් බරපතළ සිදුවීමක් වනු ඇතැයි අපේක්ෂා නොකළ බවත්ය.

වර්තමානයේ පොලිස් සුබසාධක කොට්ඨාසයේ නියෝජ්‍ය පොලිස්පතිවරයා ලෙස කටයුතු කරන චන්දන අතුකෝරළගෙන් කොමිසම විමසා සිටියේ ප්‍රහාරයක් එල්ල වන බවට දැනුවත් වූයේ කවදාද යන්නයි. ඔහුගේ පිළිතුර වූයේ 2019 වසරේ අප්‍රේල් 12 වැනිදා සවස පණිවුඩකරුවකු හරහා තමන්ට ලැබුණු ලිපියක් මඟින් බවයි. එය එවා තිබුණේ එවකට කොළඹ උතුර බාරව සිටි නියෝජ්‍ය පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් බවද ඔහු පැවසීය.

එවකට කොළඹ මධ්‍යම පොලිස් කොට්ඨාසය බාරව කටයුතු කළ පොලිස් අධිකාරි ශාන්ත වික්‍රමසිංහගෙන් කොමිසමට පැවසුවේ අප්‍රේල් 12 වැනිදා තමන්ට මේ ප්‍රහාරය ගැන තොරතුරු ලැබුණු බවයි. එවක කොළඹ මධ්‍යම නියෝජ්‍ය පොලිස්පති ධූරය දැරූ ශාන්ත පතිනායකගෙන් 2019 වසරේ අප්‍රේල් 20 වැනිදා රාත්‍රී 7.30ට පමණ ප්‍රහාරය එල්ල වන බවට ස්ථිර කළ තොරතුරක් ලැබුණු බවද ඔහු පැවසීය. එදිනම රාත්‍රියේ කොටුව පොලිසියේ කාර්යභාර නිලධාරි ලෙස සේවය කළ පොලිස් පරීක්ෂක ශාන්ත වික්‍රමසිංහගෙන් ප්‍රහාරය ගැන පණිවුඩයක් ලැබුණු පවද ඔහු පැවසීය.

කොමිසම හමුවේ පෙනී සිටි එවකට බස්නාහිර බුද්ධි කොට්ඨාසය බාරව සිටි සහකාර පොලිස් අධිකාරි බී. අයි. අයි. ප්‍රසන්න පැවසුවේ විජේදාස රාජපක්ෂ මන්ත්‍රීවරයා පාර්ලිමේන්තුවේ කළ 'ඉස්ලාම් අන්තවාදයක් මෙරට ක්‍රියාත්මක බව' ප්‍රකාශය අනුව දර්ගා නගරයේදී අබ්දුල් අමීන් නැමැත්තකු අත්අඩංගුව ගත් බවත් ඔහු 'ඉස්ලාමයේ අඳුරු අසිපත කොළඹ අහසේ ළෙලදෙනවා' - මීට අයිඑස් අයි එස් ශ්‍රී ලාංකික - යනුවෙන් ඔහුගේ මුහුණු පොතේ සඳහන් කර තිබූ බවයි. තමා ඒ පිළිබඳව එවකට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා ලෙස කටයුතු කළ පූජිත් ජයසුන්දර දැනුවත් කළ බවයි. එමෙන්ම රාජ්‍ය බුද්ධි අංශ මේ සම්බන්ධයෙන් වැඩි දුර පරීක්ෂණ මෙහෙය වූ අතර ජාතික ආරක්ෂාවට ඉස්ලාම් අන්තවාදීන්ගෙන් තර්ජන එල්ල විය හැකි බවට සාකච්ඡා කෙරුණු බවද ඔහු කීවේය. ඒ අනතුරු ඇඟවීම ගැන කිසිවකු අවධානය යොමු කෙළේ නැත.

## ප්‍රහාරය දින උදෑසනත් අනතුරු ඇඟවීමක්

නිලන්ත ජයවර්ධනට අප්‍රේල් 21 වැනිදා , එනම් පාස්කු ප්‍රහාරය සිදුවුණු දිනද පෙරවරු 8.27 ටද ප්‍රහාරය ගැන පණිවුඩයක් ලැබී ඇත.

පාස්කු ප්‍රහාරය පිළිබඳ විමර්ශනය කෙරෙන ජනාධිපති කොමිසමේ පොලිස් විමර්ශන ඒකකයට පසුගියදා 18 වැනි අඟහරුවාදා පැමිණි හිටපු ආරක්ෂක රාජ්‍ය අමාත්‍ය රුවන් විජයවර්ධන මහතා විසින් පැය 5ක පමණ ප්‍රකාශයක් ලබා දෙන ලදී. එදිනම කොමිසම හමුවේ 13 වැනි දිනටත් සාක්ෂි ලබා දුන් නිලන්ත ජයවර්ධන මහතා පැවසුවේ කිසිදු අවස්ථාවක බුද්ධි අංශ දුර්වල නොවූ බවයි. ප්‍රහාරයට දෙසතියකට පෙර තොරතුරු ලබා දුන් බවත් 21 වැනිදා උදෑසනද ප්‍රහාරය එල්ල වන බව දන්වා ඇතැයිද ඔහු කොමිසමට පැවසීය. එමෙන්ම බෝම්බ 6ක් පිපිරුණු විට තවත් බෝම්බ දෙකක් පුපුරුවා හැරීමට තිබෙන බවත් බෝම්බ ලොරියක් පල්ලියක් ලඟ නවතා ඇති බවත් හෙළි කළ බව ඔහු කීය. බුද්ධි අංශ ලබා දුන් එම තොරතුරු නිසා දෙවන ප්‍රහාරයක් වැළකී ගිය බවද ඔහු පෙන්වා දුන්නේය.

බුද්ධි අංශ ප්‍රධානී සිසිර මෙන්ඩිස් විසින් අප්‍රේල් 8 වැනිදා තමාට පිළිතුරු ලිපියක් එවමින් සහරාන් ගැන සියලු තොරතුරු ලබා දුන් බවත් ඔහු අත්අඩංගුවට ගැනීමට වරෙන්තු නිකුත් කර තිබියදී ඔහුට මන්නාරමේ සිට බෝට්ටු මාර්ගයෙන් ඉන්දියාවට පලා යාමට අවස්ථාව සලසා දී ඇත්තේ හිටපු අමාත්‍ය රිෂාඩ් බද්යුද්දීන්ගේ සොහොයුරකු වන රික්වාන් බද්දුයද්දීන් බවත් කොමිසම හමුවේ අනාවරණය කෙළේය. ඉන්දියාවේ කාෂ්මීර් ප්‍රදේශයේ අන්තවාදී මත පතුරවමින් සිටි සහරාන් 2018 වසරේ මෙරටට පැමිණ කොම්පඤ්ඤවීදියේ රහසිගතව සැඟව සිටි බවට තොරතුරු ලැබුණු බවද ඔහු කීවේය. එදිනම රක්ෂිත බන්ධනාගාරගත කර ඇති අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රධානී ශානි අබේසේකරගෙන්ද කොමිසමේ පොලිස් ඒකකය විසින් පැය 6කට අධික කාලයක් ප්‍රකාශ ලබා ගන්නට කටයුතු කර තිබේ.

මේ අතර ලබන 26 වැනිදා හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතාට කොමිසම වෙත පැමිණෙන ලෙසද දන්වා ඇත. ඉන්දීය බුද්ධි අංශ පමණක් නොව මාධ්‍යවේදීන් මෙන්ම යුද විශ්ලේෂකයින් ඇතුළු පිරිස් විසින් මේ ප්‍රහාරය ගැන අනතුරු ඇඟවීම් 97ක් කර තිබියදී එය වළක්වා නොගැනීම ගැන මේ වන විට ඉතා පැහැදිලිව පෙනෙන්නට ඇත. එමෙන්ම සහරාන්ට පැන යාමට අවකාශ සලසා දුන් අය කවුරුන්ද යන්නද මේ වන විට හෙළිවී ඇත. ජනාධිපති කොමිසම හමුවේ තව තවත් කරුණු හෙළි වනු ඇත. හොඳ හොඳ සෙල්ලම් එළිවෙන ජාමෙට බව අප අමතක නොකළ යුතුය.





● භක්ති මෙන්ඩිස් විසිනි
bakthid@gmail.com

### ● කොළ පාටියේ මූලස්ථානය වටලද්දී නායකයා මාරු වෙලා

මහ මැතිවරණයෙන් පසු කොළ පාටියේ නායකයන් අතර මත ගැටුම් තවත් වැඩි වෙලා. දියවන්නාවට රිංග ගන්න බැරි වුණු බොහෝ දෙනකු නායකතුමන්ට මෙන් ම කොළ පාටියේ කෙරුමන් දෙදෙනකුට හොඳටම දෙහි කපනවලු.

කොළ පාටියේ ප්‍රධාන කාර්යාලයේ නිතර නිතර සාකච්ඡාවන් පවත්වනවලු. කොළ පාටියේ නායක තැන ගන්න උත්සාහ කරන බොහෝ පිරිස් මේ අතර කියලයි ආරංචිය. කොළ පාටියේ නායක තැනට දැන්වත් නායකත්වයෙන් ඉල්ලා අස්වෙන්න කියන උද්ඝෝෂකයනුත් හරි හරියට කොළ පාටියේ කාර්යාල වට කරනවා කියන්නේ.


ඉකුත් සතියේ දිනක සංඝයා වහන්සේ ඇතුළු පිරිසක් කොළ පාටියේ ප්‍රධාන කාර්යාලය වට කරාලු; ඒ අස්සේ නායක තුමා කොහාටද මාරු වුණාලු.



### ● බතික් ඇඳුමෙන්ම ඉන්න බතික් ඇමැති

නව අමාත්‍යාංශවල විෂයයන් වෙන් කිරීමත් සමඟ ඇමැතිවරුන්ට නොයෙක් නොයෙක් උපහාස සමාජ ජාලාවල දැකගත හැකිය.

මේ අතර එලෙස පත්වූ ඇමැතිවරුන් ඔවුනොවුන්ට උසුළු විසුළු කරගන්නවාලු. මේ අතර වැඩි වශයෙන් ම මැටි කර්මාන්තය සහ බතික් කර්මාන්තය සම්බන්ධ ඇමැතිවරු දෙදෙනාට නිතර නිතර දුරකතන ඇමතුම් පවා ලැබෙනවාලු මේ සම්බන්ධව. ඇමැතිකම ලැබුණු දවසේ සිට ඔහු බතික් ඇඳුමෙන් සැරසෙන අතර මෙවර දියවන්නාවට පැමිණි මුල් ම දිනයේ ද බතික් ඇඳුමකින් සැරසී පැමිණීමට වග බලා ගත්තලු.



### ● පුතාණෝ පුතාණෝටම ප්‍රශංසා කරගන්නවලු

කොළ පාටියෙන් පුතාණෝගේ පාටියට පැනගත් බොහෝ දෙනකුට දියවන්නාවට ගොඩවීමට හැකිවීම පිළිබඳව ඔවුන් ආඩම්බර පසුවෙනවා කියලයි කියන්නේ.කොළ පාටියෙන් මැතිවරණ සටනට ගිය තමන්ගේ මිතුරන්ට හරි හරියට මොවුන් උසුළු විසුළු කරනවාලු.

කොළ පාටියේ නායකතුමන් මෙන් ම ජ්‍යෙෂ්ඨයන් කිහිප දෙනෙකුටම මුහුණු පොත යොදාගෙන මඩ ප්‍රහාර එල්ල කිරීමට පුතාණෝට සම්බන්ධ කණ්ඩායමක් කටයුතු කරනවා කියලයි ආරංචිය.

පුතාණෝගේ පාටිය ලැබූ ජයග්‍රහණයට ප්‍රශංසා කරමින් පුතාණෝගේ නායකත්වය පිළිබඳව ප්‍රශංසා කරමින් තමන්ටම ප්‍රශංසා කරගන්නා වැඩසටහනක් පුතාණෝට සම්බන්ධ පිරිසක් සිදු කරගෙන යන බව කියලයි ආරංචිය.

### ● පුලතිසිපුර හිටපු රජුන් කැමරාවට බය වෙලාද?

පුලතිසිපුර හිටන් රජුන් නිරන්තරයෙන් ම කතා මවන්නෙක් බවට පත් වෙලාලුනේ. ඔහු ගායනා කරපු ගීත තුන හතරක් ම මේ දිනවල මුහුණු පොතේ හුවමාරු වෙනවා කියලයි ආරංචිය. දියවන්නාවේ මංගල සැසිය ආරම්භ කිරීමට පෙර දින කිහිපයක සිට මාධ්‍යවේදීන් පුලතිසිපුර හිටපු රජුන් කතා බහට අල්ල ගන්න උත්සාහ කරාලු.

රටේ රජුන් හැටියට ක්‍රියා කරන අවස්ථාවේ මාධ්‍යයට බොහෝ අදහස් දැක්වූ මොහු දැන් දැන් මාධ්‍ය මඟ හරින්න අලුත් ක්‍රමවේද භාවිතා කරන්නත් පුරුදු වෙලා කියලයි කියන්නේ.

උත්සව අවස්ථාවලට පැමිණෙන අවස්ථාවේ මෙන් ම නික්මෙන අවස්ථාවල හොර රහසේ ම පිටත්ව යන්න කටයුතු කරනවාලු.



### ● දියවන්නාවට යන්න ඇඳුම් දෙකක් ම ඇඳලා

අලි පාටියෙන් දියවන්නාවට පැනගෙන සිටි නිතර නිතර කාගෙත් කතා බහට ලක්වූ නළු චරිතය අපූරු අපූරු වැඩ කරනවා කියලයි කියන්නේ. අලි පාටියෙන් පුතාණෝගේ පාටියට පැනලා මෙවර දියවන්නා සටනින් ජයගන්න මේ චරිතයට පුළුවන් වුණාලු.

දියවන්නාවේ පළමු සැසියට පැමිණෙන්නට පෙර නළු චරිතය පෙරහුරු කිහිපයක්ම කරාලු. කවුරු මොන මොන විදියේ මඩ ප්‍රහාර එල්ල කරත් කුමන චෝදනා එල්ල කරත් තමන් නිවැරැදි මෙන් ම කා හටවත් බිය නොවන බව නළු චරිතය දිගින් දිගටම කියනවා කියලයි ආරංචිය. මෙවර දියවන්නාවට පැමිණෙන මුල් ම දවසේ ජාතික ඇඳුමෙන් සැරසෙන්න නළු චරිතය ක්‍රියා කරාලු.

එහෙත් දියවන්නාවට නොගොස් නැවත සිය නවාතැනට පැමිණි ඔහු බටහිර ඇඳුමෙන් සැරසී නැවත දියවන්නාවට ගියයි කියලයි ආරංචිය.



### ● පක්ෂ නායකයෙක් ආණ්ඩුවට පනින්න උද්ඝෝෂණයක

පුතාණෝගේ පාටියෙන් මෙවර දියවන්නාවට පැමිණි නැගෙනහිර පළාතේ පක්ෂ නායකයෙකු තම බලය වැඩි කර ගැනීම සඳහා නොයෙක් ක්‍රම සොයනවලු.


තමන් නායකත්වය දරන පාටිය අතහැර කොළ පාටියට එක්වී නැවත පුතාණෝට සම්බන්ධ මොහු ඉකුත් සමයේ දැඩි කතා බහට ලක් වෙච්ච චරිතයක්ලු.

පොහොට්ටු පාටියටත් කොක්කක් ගහන්න කිහිප සැරයක් ම මෙම දියවන්නා සාමාජිකයා උත්සාහ දරා ඇතත් බලවත් විරෝධ හේතුවෙන් පොහොට්ටු පාටියෙන් ඈත්ව ගියයි කියලයි කියන්නේ.

තමන්ගේ ම හිතවත් පුද්ගලයන් මෙන් ම පාක්ෂිකයන් එක්කර උද්ඝෝෂණයක් කරන්න මොහු සැලසුම් කරාලු.

එහිදී උද්ඝෝෂකයන් මෙම පක්ෂ නායකයාට රජයට සහය දෙන්න කියලා බල කරන්න කටයුතු කරනවා කියලයි ආරංචිය.

# ඉන්දු ලංකා ගිවිසුමට එරෙහිව මන්ත්‍රීකම අත්හළ මහින්ද යාපා



## අභිනව පාර්ලිමේන්තුවේ නව කථානායක

● ජයසූරිය උඩුකුඹුර

**ශ්‍රී ලංකාවේ නව වන පාර්ලිමේන්තුවේ නව කථානායකවරයා ලෙස ඉකුත් බ්‍රහස්පතින්දා රාජකාරී ආරම්භ කළ මහින්ද යාපා අබේවර්ධන 1978 ව්‍යවස්ථාව ස්ථාපිත කර ගැනීමෙන් පසුව මෙරට ක්‍රියාත්මක වන පාර්ලිමේන්තුවේ 11 වැනි කථානායකවරයාය. ඉතා නිහතමානි සහ චාම් ගතිගුණ ඇති නව කථානායකවරයාගේ පැටිකිරිය රටේ ජනතාවට කියන්නට සිතාගෙන අප පෙරේදා කොළඹදී මහින්ද යාපා හමුවන විට බොහෝ රෑ බෝ වී තිබුණද අපේ අවශ්‍යතාවට ඇහුම්කන් දුන් නව කථානායකවරයා වෙහෙස මහන්සිය නොබලාම පැය දෙකකට ආසන්න කාලයක් අප සමඟ සතුටු සාමීචියේ යෙදුණේය. එවෙලේ අප ඔහු සමඟ කතා කළ බොහෝ දේ අතුරෙන් මහින්ද යාපාගේ අතීතය, වර්තමානය හා අනාගත අපේක්ෂාවන් පිළිබඳවත් ඔහුගේ පවුලේ තොරතුරු පිළිබඳවත් මෙලෙස සටහන් කරන්නේ නව වන පාර්ලිමේන්තුවේ නව කථානායකවරයා ලෙස මහින්ද යාපා අබේවර්ධනයන් පත්කිරීම කෙතරම් යුක්ති සහගත දැයි තක්සේරු කර ගැනීම ඔබට ම බාර කරමිනි.**

මාතර මාකඳුර මහ විද්‍යාලයෙන් පස් වැනි පන්තිය දක්වා අධ්‍යාපනය හැදෑරූ මහින්ද යාපා අබේවර්ධනයන් ඉන්පසු ද්විතීයික අධ්‍යාපන කටයුතු සඳහා මාතර රාහුල විද්‍යාලයට ඇතුළත් වී ඇත. උසස් පෙළ විභාගය සමත්ව කොළඹ විශ්වවිද්‍යාලයට ඇතුළත් වූ ඔහු කලා විෂයන්ගෙන් උපාධියක් දිනා ගත්තේය. හෙතෙම එකල සිටම දේශපාලනයට වැඩි ඇල්මකින් කටයුතු කළේය. ඉඩම්හිමි වැවිලිකරුවකු වූ මහින්ද යාපාගේ පියා එම ප්‍රදේශයේ ගම්සභාවේ උප සභාපතිවරයකු ලෙසද කටයුතු කර ඇත. මහින්ද යාපා අබේවර්ධනයන්ගේ බාප්පාද (පියාගේ සොහොයුරා) එකල එම ප්‍රදේශයේ ගම්සභාවේ උප සභාපතිවරයකු ලෙස කටයුතු කර ඇති බවද ඒ කාලය තමන්ට එතරම් මතක ඇති කාලයක් නොවන බවද මහින්ද යාපා සඳහන් කළේය. ගැහැනු සහෝදරියන් සිවු දෙනෙකු හා පිරිමි සහෝදරයන් සිවු දෙනෙකුගෙන් යුත් පවුලේ වැඩිමලා වුයේද මහින්ද යාපාය. මහින්ද යාපාගේ බාල සොහොයුරකු වන සරත් යාපා අබේවර්ධන දකුණු පළාත් සභාවේ මන්ත්‍රීවරයකු ලෙස කටයුතු කර ඇති ව්‍යාපාරිකයෙකි. තවත් බාල සහෝදරයකු නීතිඥයකු ලෙස කටයුතු කරන අතර අනෙක් සහෝදරයා ගේදොර වතුපිටි රැකබලා ගනිමින් කටයුතු කරන බව මහින්ද යාපා සිහිපත් කළේ සහෝදර ප්‍රේමයෙනි.

විශ්වවිද්‍යාල ශිෂ්‍යයකු ලෙස එකල ශිෂ්‍ය සංගම්වලට සම්බන්ධ වී දේශපාලනයට අවතීර්ණය වූ මහින්ද යාපාට සිය පියාගෙන් ලැබුණ දේශපාලන ආභාසයද ඔහු වෘත්තීය දේශපාලනඥයකු කරන්නට ඉවහල් වී තිබේ. එකල මාතර දිස්ත්‍රික්කයේ පාර්ලිමේන්තු මන්ත්‍රී සිරිසේන හෙට්ටිගේ මහින්ද යාපාගේ කිට්ටු නෑදෑයෙකි. ඔහුගේ දේශපාලන කටයුතුවලට උදවු කරන්නට ගොස් ලැබූ දේශපාලන පන්නරයද මහින්ද යාපා සිහිපත් කරන්නේ අභිමානයෙනි. මහින්ද යාපාගේ මිතුරන් අතරින් වැඩි දෙනෙකුද දේශපාලනයට සම්බන්ධ වීම මොහුගේ දේශපාලන ගමන ශක්තිමත් කිරීමට හේතු වී ඇත. එදා තරුණ මහින්ද යාපා ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිවරයාගේ දේශපාලන දර්ශනය සමඟ අත්වැල් බැඳගත්තේ සිය මිතුරු සමූහයේ ඒකමතික තීන්දුවකට අනුවය. ඒ තීන්දුවත් සමඟ 1983 වසරේ හක්මන මැතිවරණ බලප්‍රදේශයේ අතුරු මැතිවරණයට මුහුණ දීමට මහින්ද යාපාට අවස්ථාව උදා විය. හා හා පුරා කියමින් හක්මන අතුරු මැතිවරණයේ එජාප අපේක්ෂකයකු ලෙස ඉදිරිපත් වූ මහින්ද යාපා අබේවර්ධනයන්ට බහුතරයගේ සහාය ලැබීම නිසා හක්මන ආසනයේ මන්ත්‍රීවරයා වන්නට වාසනාව ලැබුණි.

පාර්ලිමේන්තුවේදී මෙන්ම ඉන් පිටතදීද තම ආසනයේ ජනතා ගැටලු විසඳීමට හඬ නැගූ මහින්ද යාපා චචනයේ පරිසමාප්තියෙන් ම දේශප්‍රේමියකු බව ඔප්පු කරමින් කටයුතු කිරීම ඔහුගේ දේශපාලන හිතවාදීන්ට මහත් අභිමානයක් විය. එය වඩාත් කැපී පෙනුණේ 1987දී ජේ.ආර්.ජයවර්ධන ජනාධිපතිවරයා ඉන්දියාව සමඟ අත්සන් කළ ඉන්දු ශ්‍රී ලංකා ගිවිසුමට අත්සන් ලබාගත් අවස්ථාවේදීය. ඒ මොහොත මහින්ද යාපා අදත් සිහිපත් කරන්නේ ඉමහත් කනස්සල්ලෙනි.

"ජේ.ආර් අපෙන් අහලා අපිව දැනුවත් කරල නොවෙයි ඉන්දු ලංකා ගිවිසුම සුදානම් කළේ. ඒ ඔක්කොම ඒ අයට හිතවත් පිරිසක් එක්ක කරලා අන්තිමට අපිට අත්සන් කරන්න කිව්වා. අපේ අනෙක් මන්ත්‍රීවරු ඒකට අත්සන් කළා. නමුත් මම ඒ ගිවිසුමට එරෙහිව ඒක අත්සන් කළේ නෑ. මමත් එක්ක තවත් දෙන්නෙක් ඒකට අත්සන් කිරීමෙන් වැළකී සිටියා. එදා අපිට හිතුණා මේ ගිවිසුම රටට අහිතකර, රට පාවා දෙන ගිවිසුමක් කියලා. මේ රටේ ඉපිද මේ රටේ හැදුණු වැඩුණු අය විදියට මේ රට කාටවත් පාවා දෙන්න අපි සූදානම් නෑ. එහෙම කරන්න කාටවත් ඉඩ දෙන්නත් බෑ." මහින්ද යාපා ඒ අම්හිරි අතීතය ආවර්ජනය කළේ එසේය. මේ සිදුවීමෙන් පසුව මහින්ද යාපා සිය මන්ත්‍රී ධුරයෙන් ඉල්ලා අස්වන බව ලිපියක් මඟින් ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිවරයාට දැන්වීය. ඒ ලිපිය ආපසු හරවා එවූ ජේ.ආර්, මහින්ද යාපා පාර්ලිමේන්තුවෙන් නෙරපා හැරීමට කටයුතු කළේද ඒකාධිපති වියරුවෙන්ය."ඒ අවධිය රට තුළ ජවිපෙ මිනී මරණ අවධියක්. රට පුරා තිබුණේ මහ භීෂණකාරී තත්ත්වයක්. එහෙම වුණත් රට පාවා දෙන්න මගේ අත එසවුණේ නෑ. බියක් චකිතයක් ඒ වෙලාවේ තිබුණත් ඊට වඩා මට මගේ රට ගැන හැඟීමක් තිබුණා. මගේ ජීවිතයට මොනවා වුණත් කමක් නෑ කියලා තමයි මම ඉන්දු ලංකා ගිවිසුමට විරුද්ධ වුණේ"

ත්‍රාසය භීතිය පොදි බැඳගෙන රට වෙනුවෙන් රට පැත්තේ හිටගත් මහින්ද යාපා එදායින් පසුව එජාපයට එරෙහිව ශ්‍රීලනිපය සමඟ දේශපාලනයට අවතීර්ණය වූයේ සිය ආධාරකරුවන් සියලු දෙනාගේම ආශිර්වාදය සමඟය. ඉන්පසුව පැවැති හැම මැතිවරණයකදීම ජයග්‍රහණය කළ මහින්ද යාපා අබේවර්ධනයන් 2000 වසරේ පැවැති පළාත් සභා මැතිවරණයේදී දකුණු පළාත් සභාවට තරග කර එය ජය ගෙන දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යවරයා ලෙසද කටයුතු කළේය. මුලදී හක්මන ආසනය නියෝජනය කළ ඔහු පසුව වැලිගම ආසනයට පැමිණියද පැවැති කිසිදු මැතිවරණයකදී පරාජය වූයේ නැත. වසර තිහකට ආසන්න කාලයක් කිසිවිටෙක ජනතාව අත් නොහල මහින්ද යාපා අබේවර්ධනයන් වරක් කෘෂිකර්ම අමාත්‍යවරයා ලෙසද කටයුතු කළේය. එකල කෘෂිකාර්මික දියුණුව උදෙසා හොඳ බීජ නිෂ්පාදනයට මුල් තැන දුන් හෙතෙම ගුණාත්මක බීජ ගොවියාට ලබා දී වැඩි අස්වැන්නක් ලබා ගත හැකි පසුබිමක් නිර්මාණය කළේය. දකුණු පළාත තුළ වඩාත් ප්‍රචලිතව ඇති කුරුඳු, ගම්මිරිස්, තේ වැනි බෝග සම්බන්ධයෙන්ද මහින්ද යාපා පාර්ලිමේන්තුව තුළ මෙන්ම ඉන් පිටතදීද විශාල අරගල කරමින් ඒ නිෂ්පාදන සඳහා සාධාරණ මිලක් ගොවියාට ලබා දීමට නිරතුරු වෙහෙස ගත්තේය.



1983 වසරේ සිට සෑම මැතිවරණයකදීම මහින්ද යාපා අබේවර්ධනයන් පරිහරණය කරන ජීප් රථය



මහින්ද යාපා අබේවර්ධනයන් සිය බිරිඳ සහ දූ දරුවන් සමඟ

ඉකුත් යහපාලන ආණ්ඩුවට එරෙහිව මහින්ද රාජපක්ෂයන් සමඟ එක්ව ඒකාබද්ධ විපක්ෂය ලෙස කටයුතු කරමින් මහින්ද යාපා ගම්මිරිස් ප්‍රතිඅපනයන ක්‍රියාවලියකට යොමුව දේශීය ගම්මිරිස් හා අනෙකුත් කුළුබඩු වර්ගවල ප්‍රමිතිය හෑල්ලු කර ඇති ආකාරය විටින් විට පෙන්වා දෙමින් දේශීය කුළුබඩුවල ගුණාත්මක බව රැකගැනීමේ වැයමක නිරත වූ ආකාරයද කිසිවකුටත් අමතක කළ නොහැකිය.

මහින්ද යාපා අබේවර්ධනයන් දරුවන් පස් දෙනෙකුගේ පියෙකි. එක් දියණියක් හා පුතණුවන් සිවු දෙනෙකු සිටින ඔහුගේ බිරිඳද නීතිඥවරියකි. දියණිය පෞද්ගලික ආයතනයක ගණකාධිකාරිණියකි. පුතණුවන් දෙදෙනකු වෛද්‍යවරුන්ය. එක් පුතකු බැංකු නිලධාරියකු වන අතර අනෙක් පුතා ඉංජිනේරුවරයෙකි. මේ අනුව මහින්ද යාපාට දේශපාලනයෙන් හරිහම්බ කර ගන්නට දෙයක් නැත. ඒ නිසාම ඔහුගේ දේශපාලන භූමිකාව අවංකය; පරාර්ථකාමීය.

ඔහු කතානායක ධුරය ගැන මෙසේ කියන්නේය.

ලෝකයේ කිසිම රටක කථානායක ධුරය කවුරුත් කැමැත්තෙන් බාරගෙන තිබෙන අවස්ථා ඉතාම විරලයි. නමුත් මම කථානායක ධුරය බාර ගන්න කැමති වුණා. ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කරන්න මේ තනතුරෙන් ලොකු සේවයක් කරන්න පුළුවන්." මහින්ද යාපා සඳහන් කළේ අධිෂ්ඨානශීලිවය. මන්ත්‍රීවරයකු, ප්‍රධාන අමාත්‍යවරයකු, ඇමතිවරයකු, නියෝජ්‍ය ඇමතිවරයකු, කාරක සභා සභාපතිවරයකු ලෙස තනතුරු දරා ඇති මහින්ද යාපාට කථානායක ධුරය අභියෝගයක් විය නොහැකිය. එංගලන්ත පාර්ලිමේන්තුවේ ප්‍රථම කථානායකවරයාද පත්කර ඇත්තේ බලහත්කාරයෙන් බව සිහිපත් කරන මහින්ද යාපා අබේවර්ධනයන් තමන් කැමත්තෙන් බාරගත් මෙම තනතුර සමඟ තමන්ගේ දිස්ත්‍රික්කයේ ජනතාවට සේවය කිරීමට අනෙකුත් අමාත්‍යවරුද තමන්ට සහාය ලබා දෙන බවට එකඟත්වය පළ කර ඇති බවද සිහිපත් කළේය.

ශ්‍රී ලංකා ජන සමාජයේ තුන්වැනි පුරවැසියා ලෙස සැලකෙන්නේ කථානායකවරයාය. එමෙන්ම එම තනතුර දරන්නාට විශේෂ ගෞරවයක්ද හිමිය. පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් සුවිශාල වගකීමක් පැවැරෙන කථානායකවරයා පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ගේ විනය පවත්වා ගෙන යෑම ගැනද වගකිව යුතුය. පාර්ලිමේන්තු විවාදවලදී ඒ ඒ දේශපාලන පක්ෂය සඳහා කාලය බෙදාදීම වර්තමාන සම්ප්‍රදාය වුවද ඉදිරියේදී පක්ෂ නායකයන් සමඟ සාකච්ඡා කර මන්ත්‍රීවරුන් පදනම් කරගෙන කතා කාලය වෙන් කර දීමට තමන් අපේක්ෂා කරන බවද මහින්ද යාපා සඳහන් කළේය.

දේශපාලනය විනෝදාංශයක් කරගත් මහින්ද යාපා ලැබෙන විවේකයේදී පිහිනීමට යොමු වන බවද කැකුළු හාලේ බත් සමඟ කිරි හොද්ද තම ප්‍රියතම ආහාරය බවද අප සමඟ කීවේ සිනාසෙමිනි. මන්ත්‍රීවරුන්ට පාර්ලිමේන්තුවේදී ලැබෙන රස බොජුන් පිළිබඳව සමාජයේ පවතින කතාබහ සම්බන්ධයෙන් අදහස් දැක්වූ නව කථානායකවරයා " ඔය අවලාද නඟන අයට මම ගාණේ පාර්ලිමේන්තුවේ කෑම මාසයක් ලබා දෙන්න මම කැමතියි. කාලා බලන්න කියන්නකෝ ඔය කියන තරම් රස බොජුන්ද කියල" යැයිද කීවේය. විදේශ රටවල් හැටකට ආසන්න ප්‍රමාණයක සංචාරය කර ඇති බව කියන මහින්ද යාපා අබේවර්ධනයන් එම රටවලදී ලබාගත් අත්දැකීම් කථානායකවරයා ලෙස තම කටයුතුවලට වඩාත් ප්‍රයෝජනයට ගත හැකි බවද සිහිපත් කළේය. මෙවර පාර්ලිමේන්තුවේ බහුතරයක් නවකයන් බැවින් ඔවුන්ට පාර්ලිමේන්තු සම්ප්‍රදාය විනය හා පාර්ලිමේන්තු කටයුතු පිළිබඳව විධිමත් පුහුණුවක් ලබාදීමේ කටයුතු ලබන 26 දා සිට ආරම්භ කරන බවද පැවසීය."පාර්ලිමේන්තුවේ විපක්ෂය මෙන්ම ආණ්ඩු පක්ෂය රටේ ඒකීය භාවය, ස්වෛරීත්වය ආරක්ෂා කොට රට සෞභාග්‍යවත් හා සදාචාර සම්පන්නව ගොඩ නැඟීමට කැපවෙනු ඇතැයි තමන් විශ්වාස කරන බවද ආණ්ඩු පක්ෂයට පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකේ බහුතර බලයක් තිබුණත් රටට ජනතාවට අහිතකර කිසිවක් නොකරනු ඇතැයිද එවැන්නක් කරන්නට ඉඩක් නොලැබෙනු ඇතැයිද නව කථානායක මහින්ද යාපා අබේවර්ධනයන් පැවසුවේය.



# අපරාධ මැඬලීමේ මෙහෙයුම

● අමිල මලවිසූරිය

**පසුගිය සති දෙකක පමණ කාලයේදී බස්නාහිර පළාතෙන් අත්අඩංගුවට ගැනුණු මහා පරිමාණ මත් ජාවාරම්කාරයන් 45 දෙනෙකුගේ බැංකු ගිණුම්වල රුපියල් කෝටි 220කට ආසන්න මුදලක් සංසරණය වී ඇති බවට ද පොලිසිය අනාවරණය කරගෙන තිබේ. මෙකී ජාවාරම්කරුවන්ගේ අනාවරණ අනුව මෙරටේ මේ වන විට මත්ද්‍රව්‍ය හිඟයක් පවතින බවටද සැලවේ.**

මේ අතරේ පසුගිය 17 වැනිදා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මෙරට ජාතික පුවත්පතක නිදහස් මාධ්‍යවේදියකු ලෙස කටයුතු කළ අයෙකු අත්අඩංගුවට ගැනිණි. 30 හැවිරිදි එකී මාධ්‍යවේදියා, හම්බන්තොට, මැදමුලන, අඹකොළවැව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි. ඔහු පසුගිය ජූනි 29 වැනිදා හෝමාගම, පිටිපන, පස් මහල් ගොඩනැගිල්ලක කාමරයක සඟවා තිබියදී මෙරට අපරාධකාරයන් සතුව තිබී සොයා ගත් වැඩිම ගිනිඅවි තොගය ලෙස සැලකෙන ටී56 ගිනිඅවි 11ක් සහ ටී 81 ගිනිඅවිය ඇතුළු තවත් ගිනිඅවි ප්‍රමාණයක් ප්‍රවාහනය කිරීමට සහාය දී ඇති බවට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව කළ සියුම් විමර්ශනවලදී අනාවරණය වී තිබෙන බවකි.

ගිනිඅවි තොගයේ වැඩිදුර විමර්ශන අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තු බාරයට පත්වීමත් සමඟ එම ගිනිඅවි පිළිබඳව හෝඩුවාව දී තිබූ නාරාහේන්පිට ප්‍රදේශයේ වෙසෙන අමිල නමැති තොරතුරුකරු අත්අඩංගුවට ගැනුණේ පසුගිය මාසයේයි. ගිනිඅවි තොගය අයත් බවට සැලවූ කොස්ගොඩ තාරක ඇතුළු පාතාල සාමාජිකයන් බොහෝ දෙනෙක් සමඟ සමීප ඇසුරක් පවත්වාගෙන ගොස් ඇති මෙකී තොරතුරුකරු පාතාල සාමාජිකයන්ගේ ඕනෑ එපාකම් වෙනුවෙන් පොලිසියේ ඇතැම් නිලධාරින් පිළිබඳව පසුගිය කාලයේ අසත්‍ය තොරතුරු මාධ්‍ය නාළිකාවලටද ලබා දුන් පුද්ගලයෙක් ලෙසටද සැලකේ. මොහුගෙන් සිදු කළ ප්‍රශ්න කිරීම්වලදී ගිනි අවි තොගයේ බොහෝ තොරතුරු හෙළිදරව් වී තිබේ.

ඒ අනුව ඔහු අනාවරණය කර ඇත්තෙ කොරෝනා වසංගතය උත්සන්නව පැවැති පසුගිය අප්‍රේල් මාසයේ දඹුල්ල ප්‍රදේශයේ සිට එම ගිනිඅවි තොගය කුලියට ගත් වෑන් රථයකින් හෝමාගම ඇතුළු කොළඹ ප්‍රදේශයේ ස්ථාන කීපයකට ප්‍රවාහනය කර ඇති බවයි.

එදින තමාද ගමන් ගත් එම වෑන් රථයේ ඉදිරිපස 'මීඩියා' යනුවෙන් පුවරුවක්ද ප්‍රදර්ශනය කරමින් රථයේ ඉදිරිපස අසුනේ අත්අඩංගුවට පත් මාධ්‍යවේදියාද ගමන් කළ බවයි. කොරෝනා නිසා ඇඳිරිනීති පනවා තිබූ හෙයින් ස්ථාන කීපයකදී රථය නතර කළත් ඉදිරිපස අසුනේ ගමන් කළ මාධ්‍යවේදියා සිය මාධ්‍යවේදී හැඳුනුම්පත ඉදිරිපත්කොට ඒ සෑම ස්ථානයකදීම රථය කිසිදු පරීක්ෂාවකින් තොරව කොළඹට රැගෙන ඒමට සමත් වූ බවයි.

## මාධ්‍යවේදියෙක් සහ එස්. ටී. එෆ්. නිලධරයෙකු අත්අඩංගුවට

අනතුරුව එකී තොරතුරුකරු පවසන්නෙ සත්‍යයක්ද යන්න අනාවරණය කරගැනීමට ඒ දිනවල ඔවුන් සැරිසරා තිබූ ප්‍රදේශවල දුරකථන කුලුනු දත්ත ඔස්සෙ සිදු කළ විමර්ශනවලදී තහවුරු වී ඇත්තෙ ඔහු පවසන්නෙ සත්‍යයක් බවයි. ඒ අනුව මාධ්‍යවේදියා හෝමාගම, පිටිපන ප්‍රදේශයට නීති විරෝධි ගිනිඅවි රැගෙන ඒමට සහාය දී ඇති බවටත් එම ගිනිඅවි පාතාල අපරාධකාරයන්ට ලබාදීමට ආධාර අනුබල දීම යන කරුණු මත අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අත්අඩංගුවට පත්ව රැඳවුම් නියෝග මත රඳවාගෙන මේ වන විට වැඩිදුර විමර්ශන සිදු කරමින් සිටී.

වාර්තා වන ආකාරයට මාධ්‍යවේදී හැඳුනුම්පත අවභාවිත කරමින් එකී මාධ්‍යවේදියා පාතාල අපරාධකාරයන්ට සහාය දී ලක්ෂ ගණනින් මුදල්ද හම්බ කර ඇති බවයි. ඉතිහාසයේ කිසිදු අවස්ථාවක පාතාල අපරාධකාරයන්ට හෝ කිසිදු අපරාධකාරයකුට ආධාර අනුබල නොදුන් මාධ්‍යවේදීන්ගේ මාධ්‍ය වෘත්තියද හෑල්ලුවට ලක්කළ මෙකී මාධ්‍යවේදියා සමස්ත මාධ්‍ය වෘත්තියටම සිදුකර ඇත්තෙ අවමානයක් බව සඳහන් කළ යුතුමය.

මේ අතර මහා පරිමාණ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් සමඟ එක්ව මත්ද්‍රව්‍ය ජාවාරම් කිරීම ඇතුළු චෝදනා රැසක් සම්බන්ධයෙන් අත්අඩංගුවට පත්ව සිටින පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශ නිලධාරින්ගෙන් හෙළි වූ කරුණු මත පොලිස් විශේෂ කාර්ය බළකායේ ඇතැම් නිලධාරින්ද ඊට සම්බන්ධ බවට හෙළි විණි.

එම විමර්ශන සිදුකරන අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පසුගිය 18 වැනිදා පොලිස් විශේෂ කාර්ය බළකායේ සංවිධානාත්මක අපරාධ මර්දන ඒකකයට අනුයුක්තව රාජකාරි කළ උපපොලිස් පරීක්ෂකවරයකු කැඳවා දීර්ඝ ලෙස ප්‍රශ්න කිරීමෙන් පසු එදින රාත්‍රී 10.30ට පමණ ඔහුව අත්අඩංගුවට ගැනිණි.

මත්ද්‍රව්‍ය වැටලීම් වෙනුවෙන් පසුගිය කාලයේ සම්මාන ගරු බුහුමන් බොහෝ සේ ලද එම නිලධාරියාට ලැබුණු තොරතුරක් මත 2016 වසරේදී ඔරුගොඩවත්ත රේගු අංගණයේදී මෙරටින් අත්අඩංගුවට පත් විශාලම කොකේන් මත්ද්‍රව්‍ය තොගයද වන කිලෝග්‍රෑම් 85ද සේම 2018 දෙසැම්බර් මාසයේ බේරුවලදී අත්අඩංගුවට ගැනුණු හෙරොයින් කිලෝග්‍රෑම් 231 සහ ඊට දින කීපයකට පසු දෙහිවලදී අත්අඩංගුවට ගත් එවකට අත්අඩංගුවට පත් වැඩිම හෙරොයින් ප්‍රමාණය වූ කිලෝග්‍රෑම් 278 මෙන්ම පසුගිය වසරේ පෙබරවාරි මාසයේ කොල්ලුපිටියේ මහල් නිවාසයකදී ඇමෙරිකන් ජාතිකයන් දෙදෙනෙකු සමඟ අත්අඩංගුවට ගැනුණු හෙරොයින් කිලෝග්‍රෑම් 95 ද වේ. එලෙස මත්ද්‍රව්‍ය වැටලීම් සිදු කළ මෙකී නිලධාරියාට ලද තොරතුරක් අනුව කොස්ගොඩ තාරකගේ ගිනිඅවි තොගයද අත්අඩංගුවට ගැනුණු බවටද සැල වේ.

මත්ද්‍රව්‍ය මෙරටින් තුරන් කිරීමට තිබෙන ප්‍රධානතම ආයතනවල වගකිවයුතු රාජකාරියන්හි නිරත නිලධාරින් රැසක්ම මත් ජාවාරම්කරුවන්ගේ ග්‍රහණයට නතුව ආයතන මෙන්ම තමන්ගේ ජීවිතද විනාශ කරගනිද්දී රජයේ තවත් වගකිවයුතු ආයතනයක් වන රස පරීක්ෂක දෙපාර්තමේන්තු සේවකයන් දෙදෙනෙක්ද පසුගියදා මත්ද්‍රව්‍ය සමඟ අත්අඩංගුවට පත් වූයේය. ඒ, පසුගිය 16 වැනිදා අලුයම් කාලයේදී හා 17 වැනිදා රාත්‍රියේදීය.


විශ්‍රාම වැටුප් සහිත සුමේධ විදුහලේ
රජයේ ගුරුවරයෙකු වීමට ඔබට අවස්ථාවක්

ගුරු පුහුණු වැඩසටහන
(වසර 2ක) - (රජය අනුමත)
සුමේධ විද්‍යාලය අනුබද්ධිත
(Ed.dep.ASN 1290 / Ed.Ex. 08449)

- පුහුණු කාලය තුළ ගමන් දීමනාවක් ගෙවනු ලැබේ.
- අවුරුදු 30ට නොවැඩි විය යුතුය.
- වැඩි විස්තර අගෝස්තු 23, 30 සහ සැප්තැම්බර් 06 දිනවල පළ වන ලක්මව ජාතික පුවත්පත හරහා සහ පහත වෙබ් අඩවියට පිවිස ලබා ගත හැකිය. www.scg.ydc.lk
- ඔබට මාර්ගගත ආකාරයෙන් (Online Registration) අපගේ වෙබ් අඩවිය (web site) හරහා ලියාපදිංචි විය හැකිය. scg.ydc.lk/teachertraining
- එමෙන්ම සකස් කරන ලද සම්පූර්ණ අයදුම්පතක් සුමේධ විද්‍යාලයේ කාර්යාලයට ගෙනවිත් වුවද බාර දිය හැකිය.
- අයදුම්පත් භාරගන්නා අවසන් දිනය: 2020 සැප්තැම්බර් 20



විමසීම්: 070 317 1011/ 071 040 5760
033 222 2635/ 033 222 2941
077 766 3625/ 071 244 3460

සුමේධ විදුහල, 62/1, විශාකා පාර, ගම්පහ.
e-mail: gampaha@ydc.lk web: www.ydc.lk

# අපේ මැතිවරණ ඉතිහාසයේ වැඩිම ඡන්ද - වැඩිම ආසන මෙවර පොහොට්ටුවට

## වැඩි ඡන්ද ලක්ෂ 41යි! මන්ත්‍රීවරු 145යි

● නිහාල් පී. අබේසිංහ

**අපේ රටේ 1947 සිට මහ මැතිවරණ 16ක් පවත්වා ඇත. 1982 සිට ජනාධිපතිවරණ 8ක් පවත්වා ඇත. ඒ මැතිවරණ සියල්ලේදී ජයග්‍රාහක පක්ෂය ලබාගත් වැඩි ඡන්ද හා මන්ත්‍රී ආසන ගණන පිළිබඳව පරීක්ෂා කරන විට 2020 මහ මැතිවරණය, ඊට කලින් මෙරට තිබුණු සියලුම මැතිවරණ හා ජනාධිපතිවරණවලට වඩා වැඩිම වැඩි ඡන්ද ලැබුණු මහ මැතිවරණය ලෙස ඉතිහාසගත වෙනු ඇතැයි මැතිවරණ විශ්ලේෂකයෝ පෙන්වා දෙති.**

ඒ අනුව 2020 මහ මැතිවරණයේදී ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණු වසර 73ක් පැරණි අපේ මැතිවරණ ඉතිහාසයේ වැඩිම වැඩි ඡන්ද ප්‍රමාණය වාර්තා කර ඇත. ඒ අනුව මෙවර මැතිවරණයේදී ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ වැඩි ඡන්ද 40,81,709ක් ලබා ඇත. මෙහිදී පොහොට්ටුව ලබාගත් ඡන්ද 68,53, 690ක් ලැබුණු අතර දුරකථනයට ලැබී ඇත්තේ ඡන්ද 27,71,984ක් පමණි.

එමෙන්ම මෙරට 1947 සිට පැවැති සියලුම මහ මැතිවරණ අනුව එක් පක්ෂයක් ලබා ගත් වැඩිම ආසන ගණන ලබාගෙන ඇත්තේ 2020 මැතිවරණයෙන් ශ්‍රී ලංකා පොදුජන පෙරමුණයි. ඒ ආසන ගණන 145කි. මෙය දෙවැනි වන්නේ 2010 මහින්ද රාජපක්ෂ අගමැතිවරයාගේ නායකත්වය යටතේ එක්සත් ජාතික නිදහස් සන්ධානය ලැබූ මන්ත්‍රී ආසන 144 ජයග්‍රහණයට පමණි. එහිදී එක්සත් ජනතා නිදහස් සන්ධානය වැඩි ඡන්ද ලක්ෂ 25ක් (2489331) ලැබූ අතර එය 2020 ට පෙර මෙරට මැතිවරණ ඉතිහාසයේ පක්ෂයක් ලැබූ වැඩිම වැඩි ඡන්ද ප්‍රමාණයයි.

කෙසේ වුවත් 2020 මහ මැතිවරණය පැරණි ආසන ක්‍රමයට තැබුවේ නම් ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණට ආසන 201ක් ලැබීමට ඉඩ තිබිණ. ඊට අමතරව පැරණි ආසන ක්‍රමයට මහ මැතිවරණය තිබ්බේ නම් සජිත්ගේ සමගි ජන බලවේගයට ලැබීමට ඉඩ ඇත්තේ ආසන 11ක් පමණි. ඒ කොළඹ දිස්ත්‍රික්කය ආසන 7ක්, දිගාමඩුල්ලේ ආසන 3ක් හා ත්‍රිකුණාමලයේ එක් ආසනයක් පමණි. ඒ අනුව ද්‍රවිඩ හා මුස්ලිම් පක්ෂවලට ආසන 13ක් ලැබීමට ද ඉඩ තිබුණි. නමුත් සමානුපාතික ක්‍රමයට පින් සිදුවන්නට මෙවර සමගි ජන බලවේගයට ආසන 54ක් ලැබී ඇත.

1947 දී මෙරට ප්‍රථම මහ මැතිවරණය පැවැත්විණි. ඒ සඳහා ප්‍රධාන ලෙස තරග කළේ එක්සත් ජාතික පක්ෂය හා ලංකා සමසමාජ පක්ෂයයි. ඒ අනුව එජාපය ලැබූ ඡන්ද ගණන 744054 කි. ලැබූ ආසන ගණන 42කි. ලංකා සමසමාජ පක්ෂයට ඡන්ද 204220ක් ලැබූ අතර ලැබුණු ආසන ගණන 10කි. එජාපය ඒ මැතිවරණයේදී එජාපය වැඩි ඡන්ද 5,39,839ක් ලබා සිය රජය පිහිටුවිය.

ඊළඟ මැතිවරණය පැවැත්වූයේ 1952 දීය. එජාපයට එහිදී ඡන්ද 10,2,6005ක් ලැබුණු අතර ආසන 54ක් ලැබුණි. ප්‍රතිවාදියා වූ සමසමාජ පක්ෂයට ඡන්ද 305133ක් ලැබුණත් හිමි වූයේ ආසන 9ක් පමණි. මේ අතර ඒ මැතිවරණයේදී ශ්‍රීලනිපය ද ඡන්ද 361250ක් ලබා ආසන 9ක් දිනාගනු ලැබීය. මේ අනුව මේ ඡන්දයේදී එජාපය ශ්‍රීලනිපයට වඩා වැඩි ඡන්ද 664755ක් ලබා ගත්තේය.

1956 දි එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක මහතා මහජන එක්සත් පෙරමුණ යටතේ 56 විප්ලවයත් සමඟ ඡන්ද 1045725ක් ලබා ගත්තේය. ආසන 51ක්ද ලැබුණි. ප්‍රතිවාදියා වූ ලංකා සමසමාජ පක්ෂය ඡන්ද 2,74,204 ලබා ගත් අතර මන්ත්‍රීවරු 14ක් ඔවුන්ට ලැබුණි. ඒ අනුව මහජන එක්සත් පෙරමුණ 771521ක වැඩි ඡන්ද සංඛ්‍යාවක් ද ලබා සිය රජය පිහිටුවිය.

1960 වසරේ මහ මැතිවරණ දෙකක් පැවැත්විණි. ඒ අනුව 1960 මාර්තු මැතිවරණයේදී එජාපයට ආසන 50ක් ලැබුණි. ලැබුණු ඡන්ද ගණන 908996ක. එම ඡන්දයේදී ශ්‍රීලනිපය ඡන්ද 648094ක් ලබාගත් අතර ඔවුන්ට ලැබුණු ආසන ගණන 46කි. මේ අනුව 1960 මැතිවරණයේදි ශ්‍රීලනිපයට වඩා එජාපයට වැඩි ඡන්ද 260902ක් ලබාගන්නට හැකිවිය.

1960 ජූලි මාසයේ ද මැතිවරණයක් පැවැත්විණි. ඒ 1960 මාර්තු මස එජාපය පිහිටපු රජය දින 32කින් අවසන් වූ නිසාය. ඒ අනුව 1960 දි ලොව ප්‍රථම අගමැතිනිය වූ සිරිමාවෝ බණ්ඩාරනායක මහත්මිය අපේ රටින් බිහිවුණ මහ ඡන්දය පැවැත්විණි.

එහිදි සිදුවූ අරුම පුදුම දේ වන්නේ ශ්‍රීලනිපය මෙම ඡන්දයෙන් ආසන 75ක් ලබාගෙන රජය පිහිටුවුවත් එජාපය මෙම මැතිවරණයේදි ලබාගත් ඡන්ද ගණන ශ්‍රීලනිපයට වඩා වැඩිවීමයි. ඒ අනුව 1960 ජූලි මැතිවරණයේදි ශ්‍රීලනිපය ලැබූ ඡන්ද ගණන 10,22,154කි. එජාපය ලැබූ ඡන්ද ගණන 11,43,290කි. නමුත් එජාපයට ලබාගත හැකි වූයේ ආසන 30ක් පමණි. මෙලෙස එජාපයට වැඩි ඡන්ද ගණනක් ලබා ගන්නට හැකි වූයේ එම මැතිවරණයට එජාපය ආසන 128කට තරග කිරීමයි. ශ්‍රීලනිපය තරග කළේ ආසන 98කට පමණි.

1965 මැතිවරණයේදි එජාපය ලැබූ ඡන්ද ගණන 1579181කි. ආසන 66ක්ද එජාපයට ලැබුණි. ශ්‍රීලනිපයට ඡන්ද 1226833ක් ලබා ආසන 41ක් දිනා ගන්නට අවස්ථාව ලැබුණි. ඒ අනුව 1965දි එජාපය ශ්‍රීලනිපයට වඩා වැඩි ඡන්ද 352348ක් ලබා 1965 දි රජය පිහිටුවිය.

සමගි පෙරමුණ යටතේ 1970 දි සිරිමාවෝ බණ්ඩාරනායක මහත්මිය නව රජයක් පිහිටුවිය. ඒ අනුව 1970දි ශ්‍රීලනිපයට ආසන 91ක් ලැබුණි. ලබාගත් ඡන්ද 18,12,849ක් විය. එජාපය එහිදීද ශ්‍රීලනිපයට වඩා ඡන්ද ගණනක් ලැබූ නමුත් ඔවුනට ලැබුණු ආසන ගණන 17ක් විය. 1970 දි එජාපය ලබාගත් ඡන්ද ගණන 18,76,956කි. සමසමාජ පක්ෂය ද මෙහිදී ඡන්ද 433224ක් ලබා ආසන 19ක් ජයගෙන තිබුණි.

එක්සත් ජාතික පක්ෂයට මෙරට මැතිවරණ ඉතිහාසයේ වැඩිම බලය හා වැඩිම ආසන ගණන ලැබුණේ ජේ.ආර්ගේ ප්‍රධානත්වයෙන්. 1977 දීය. ලැබුණු ආසන ගණන 140කි. ලැබුණු ඡන්ද ගණන 31,79,221කි. ශ්‍රීලනිපය මෙම මැතිවරණයේදි ආසන 8කට පසුබැස තිබුණි. ලැබූ ඡන්ද ගණන 18,55,331ක් පමණක් විය. ඒ අනුව එජාපය 1977 ලැබූ වැඩි ඡන්ද ගණන 13,23,890ක් ලබා බලගතු රජයක් පිහිටුවිය. එය 5/6ක බලයක් ලැබුණ අවස්ථාවක් විය.

1989දි මෙරට සමානුපාතික ක්‍රමය යටතේ පැවැත්වුණු ප්‍රථම මැතිවරණය පැවැත්විය. එහිදි එජාපය ඡන්ද 28,38,005ක් ලබා ආසන 125ක් ලබාගත් අතර ශ්‍රීලනිපයට ලැබුණේ ඡන්ද 17,85,369ක් පමණි. ඔවුන්ට ලැබුණු ආසන ගණන 58කි. එජාපයට ලැබුණු වැඩි ඡන්ද ගණන 10,52,636කි.

1994දි පොදු ජන එක්සත් පෙරමුණට චන්ද්‍රිකා බණ්ඩාරනායක මහත්මියගේ නායකත්වය යටතේ ඡන්ද 38,87,823ක් ලබා ආසන 105ක් ජයගෙන රජයක් පිහිටුවීමට අවස්ථාව ලැබුණි. එජාපය ඡන්ද 3498370ක් ලබා ආසන 94ක් දිනා ගත්තේය. ලැබුණු වැඩි ඡන්ද ගණන 3,85,453කි.

2000 මහ මැතිවරණයේදි පොදුජන පෙරමුණ ආසන 107ක් ලබා ගත් අතර එජාපය ලබාගත් ආසන ගණන 89කි. එහිදී පොදු ජන පෙරමුණ ලැබූ වැඩි ඡන්ද ගණන 423131කි.

2000 රජයේ පිරිසක් එජාපයට එක්වීම නිසා පැවැති 2001 මැතිවරණ ජය එජාපයට හිමිවිය. එජාපයට 2001දි ඡන්ද 40,86,026ක් ලැබුණු අතර ආසන 109ක් ලැබුණි. පොදු ජන එක්සත් පෙරමුණට වඩා එජාපය මේ ඡන්දයේදි වැඩි ඡන්ද 755216ක් ලබා ගත්තේය.

පොදු ජන එක්සත් පෙරමුණ 2005 මහ මැතිවරණයට තරග කළේ එක්සත් ජනතා නිදහස් සන්ධානය නමිනි. ඒ අනුව 2004දි එ.ජ.නි.ස. ඡන්ද 42,23,970ක් ලබා ආසන 105ක් ලබා රජය පිහිටුවිය. එහිදි එජාපයට වඩා එජනිස ලැබූ වැඩි ඡන්ද ගණන 719770ක් විය.

2010 මහ මැතිවරණය මෙරට සුවිශේෂ මැතිවරණයක් විය. ඒ එම මැතිවරණයේදි මහින්ද රාජපක්ෂ මහතාගේ නායකත්වය යටතේ එජනිස වැඩි ඡන්ද ලක්ෂ 25ක් (24,89,331ක්) ලැබූ බැවිනි. මෙහිදි එජනිස ලැබූ ආසන ගණන 144ක් වූ අතර ලැබූ ඡන්ද ගණන 48,46,388ක් විය. එජාප ලැබූ ඡන්ද ගණන 23,57,057කි. ඔවුන්ට ලැබුණේ ආසන 60ක් පමණි.

කෙසේ වුවත් 2015 මහ මැතිවරණයේදි ජය ගත්තේ එජාපයයි. ඒ අනුව එජාපය ලබාගත් ඡන්ද ගණන 50,98,916කි. ලැබූ ආසන ගණන 106කි. එජනිස ට ඡන්ද 4732684ක් ලැබුණි. එජාපය ලැබූ වැඩි ඡන්ද ගණන 366232ක් විය.

මෙරට මැතිවරණ ඉතිහාසයේ වැඩිම වැඩි ඡන්ද වාර්තාව පිහිටවූවේ 2020 මහ මැතිවරණයේදීය. එය තවත් සුවිශේෂ වූවේ මෙම මැතිවරණ ජය ලැබුවේ වසර 3ක් පමණ වයසක් ඇති ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ වීමයි. බැසිල් රාජපක්ෂ මහතා නිර්මාණය කළ පොදු ජන පෙරමුණ මෙම මැතිවරණයේදි ලබාගත් ඓතිහාසික වැඩි ඡන්ද ගණන 4081709කි. මෙහිදී පොදු ජන පෙරමුණට ආසන 145ක් ලැබුණි. එය මෙරට එක් පක්ෂයක් ලැබූ වැඩිම ආසන ගණන ලෙස ද ඉතිහාස ගතවේ. සමගි ජන බලවේගය අලුත්ම පක්ෂයක් ලෙස එජාපය පරදවා ආසන 54ක් හා ඡන්ද 27,71,984ක් ලබා ගැනීමත් සුවිශේෂ කරුණකි.

1982 සිට මෙරටදී ජනාධිපතිවරණ 8ක් පැවැත්විණි. ජනාධිපතිවරණ වලදි ලක්ෂ 10කට වඩා වැඩි ඡන්ද ලැබූ අවස්ථා ඇත්තේ 3ක් පමණි. ඒ 1994, 2010 හා 2019 ජනාධිපතිවරණ වලදීය.

1994 පැවැත්වූ ජනාධිපතිවරණය විශේෂිත වේ. එයට ඉදිරිපත්වූ චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මහත්මිය ඡන්ද 4709205ක් ලබා ගත්තේය. ප්‍රතිවාදියා වූ විජිත ශ්‍රීමා දිසානායක (ගාමිණී දිසානායක මහතාගේ බිරිඳ) ට ලබා ගත හැකි වූයේ ඡන්ද 27,15,283ක් පමණි. ඡන්දයට දින 3කට පෙර කොටි ත්‍රස්තවාදි බෝම්බයකින් චන්ද්‍රිකා මහත්මියගේ ඇසකට තුවාල සිදුවිය.

ඒ අනුව මෙම ජනාධිපතිවරණයේදි වැඩි ඡන්ද 19,93,922කදි චන්ද්‍රිකා බණ්ඩාරනායක ජය ගත්තාය.

ඊට පසු 2010 දි පැවැත්වූ ජනාධිපතිවරණයේ මහින්ද රාජපක්ෂ මහතා වැඩි ඡන්ද 18,42,749ක් ලබා ජය ගත්තේය. එහිදී මහින්ද මහතා ලැබූ ඡන්ද සංඛ්‍යාව 60,15,934කි. ප්‍රතිවාදියා වූ නව ප්‍රජාතන්ත්‍රවාදි පෙරමුණේ සරත් ෆොන්සේකා ලැබූ ඡන්ද ගණන 41,73,185කි.

2019දි ගෝඨාභය රාජපක්ෂ මහතා, සජිත් ප්‍රේමදාස මහතා වැඩි ඡන්ද 13,60,016කින් පරදා ජනපති බවට පත්විය.

මෙම මැතිවරණයේදි ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා ඡන්ද 6924255ක් ලබා ගත් අතර සජිත් ප්‍රේමදාසට ලබා ගන්නට හැකි වූයේ ඡන්ද 5569239ක් පමණි.


කෙසේ වුවත් මෙවර 2020 මහ මැතිවරණයේදි සජිත් ප්‍රේමදාසගේ නායකත්වයෙන් යුත් සමගි ජන බලවේගයට ලබා ගන්නට හැකි වූයේ ඡන්ද 27,71,980කි. එය 2019 ජනාධිපතිවරණයට වඩා ඡන්ද ලක්ෂ 28කට (2797259) වඩා එනම් සියයට 50ක අඩුවීමකි.


ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ


අගමැති මහින්ද රාජපක්ෂ


සිරිමාවෝ බණ්ඩාරනායක


ජේ.ආර්. ජයවර්ධන


රනිල් වික්‍රමසිංහ


චන්ද්‍රිකා බණ්ඩාරනායක

### 1947 න් පස්සේ වැඩිම මන්ත්‍රීවරු ගණනක් ලැබුණෙත් මෙවර පොදුජන පෙරමුණට

### 2010 ජනපතිවරණයේදි මහින්දගේ වැඩි ඡන්ද ගණන ලක්ෂ 18.5යි

### 1960 ජූලිවලත් 1970 දිත් ශ්‍රීලනිප දිනුවත් වැඩි ඡන්ද එජාපයටයි

### 2010 මහ මැතිවරණයේදි මහින්දගේ නායකත්වයෙන් එජනිස ආසන 144ක් ලැබුවා; වැඩි ඡන්ද ලක්ෂ 25ට ආසන්නයි

### ආසන ක්‍රමයට මෙවර මැතිවරණය තිබ්බා නම් පොහොට්ටුවට 201යි; සජිත්ට ආසන 11යි

### 2019 ජනාධිපතිවරණයට වඩා 2020 මහ ඡන්දයේදි සජිත්ගේ ඡන්ද ලක්ෂ 28ක් අඩුවෙලා

# තොණ්ඩමන් මාලිගාවේ ගින්න ගැන සැකයක්....

● ටී.චන්ද්‍රසේකර

**තොණ්ඩමන් පරපුරේ පාරම්පරික උරුමයක් වූ නුවරඑළිය, රම්බඩ, වැවන්ඩන් බංගලාවේ පසුගිය අඟහරුවාදා පෙරවරු 2.30 ට පමණ ඇතිවූ ගින්නකින් විනාශ විය. එම නිවසේ තිබූ වසර 150 කටත් වඩා පැරණි ලීබඩු ඇතුළු දේපළ සියල්ලම අළු බවට පත්විය.**

බ්‍රිතාන්‍ය ජාතීන් මෙරට පාලනය කළ අවදියේ 1883 දී මෙම බංගලාව ඉදිකර ඇත. ඉන්දියාවේ සිට කුලී කම්කරුවකු ලෙස ශ්‍රී ලංකාවට පැමිණි 13 හැවිරිදි කුමාරවේල් තොණ්ඩමන් හෙවත් කරුපයියා තොණ්ඩමන්ගේ දහඩිය කඳුළේ ප්‍රතිඵලයක් ලෙස ඉදිවී තිබුණු මෙම බංගලාව තොණ්ඩමන් පරපුරේ ඉතිහාසගත ගොඩනැගිල්ලකි.

ඒ කාලයේ කුලී කම්කරුවන් සමඟ මෙරටට පැමිණි කරුපයියා තොණ්ඩමන් ආරම්භයේ වෙළඳ සැලක සේවකයකු ලෙසත් පසුව තමන්ගේම ව්‍යාපාරයක් ආරම්භ කර වැවන්ඩන් වතුයායේ කංකානි (කම්කරු වැඩ පරීක්ෂක) ලෙස සේවයට එක්ව ප්‍රධාන කංකානි ලෙසත් කටයුතු කරමින් පසු කලෙක වැවන්ඩන් වතුයායත්, බංගලාවත් අයිතිකරගෙන ඇත.

වැවන්ඩන් බංගලාව ඉංග්‍රීසින්ගේ පාලන සමයේ ඉදිකරන ලද්දකි. එම වතුයායේ අයිතිකාරිණිය වන එංගලන්ත ජාතික ඕවන් මෙනවියගෙන් කරුපයියා තොණ්ඩමන් මෙම බංගලාව සහ වතුයාය මිලදී ගෙන ඇත. එදා පටන් ඔහුගේ පරිපාලන ගොඩනැගිල්ල ලෙස කරුපයියා තොන්ඩමන් පවත්වාගෙන යන අතරතුර 11 වැනි වියෙහි පසු වූ සෞම්‍යමූර්ති තොණ්ඩමන් 1924 දී ශ්‍රී ලංකාවට පැමිණ ඇත. කරුපයියා තොණ්ඩමන් රෝගාතුරව 1940 දී මිය යැමෙන් පසු එම වතුයායේ පාලනය ඔහුට බාර විය.

මේ රටේ රජුන් තනන්නා ලෙස ප්‍රචලිත සෞම්‍යමූර්ති තොණ්ඩමන් මේ රටේ ආණ්ඩු පිහිටුවීම සඳහා දේශපාලන සාකච්ඡා රැසක් පවත්වා ඇත්තේ ද මේ බංගලාවේදීය. දේශපාලන මෙන්ම වෘත්තීය අරගල රැසක තීන්දු තීරණ රැසක් ගත් වතු කම්කරු ජනතාවගේ දෛවය වෙනස්කළ මාලිගාවක් ලෙස වතුකරයේ ජනතාව මෙම බංගලාව හඳුන්වයි.

මෙම බංගලාවේ ගින්න ඇති වූ සැණින් එහි සේවකයන් වහාම රාජ්‍ය ඇමති ජීවන් තොණ්ඩමන්ටත්, සෙන්දිල් තොණ්ඩමන්ට හා පාර්ලිමේන්තු මන්ත්‍රී මරුදපාන්ඩි රාමේෂ්වරන්ටත් දැනුම් දී ඇති අතර මේ සියල්ලන්ම උදෑසන 5.30 ට පෙර එම ස්ථානයට පැමිණ තිබේ. ඒ වනවිටත් ගිනි නිවන හමුදාව, පොලිසිය හා හමුදාව එක්ව ගින්න පාලනය කර තිබිණි.

වසර 150 කට අධික කාලයක් පැරණි මෙම බංගලාව ගිනි ගැනීමට හේතු වූ කරුණ සොයන්නට විවිධ පාර්ශ්වයන් පරීක්ෂණ ආරම්භ කර තිබේ. තොණ්ඩමන් යන නාමය වතු වෘත්තීය සමිති ක්ෂේත්‍රයේ ප්‍රධානියා වන අතර ලංකා කම්කරු කොංග්‍රසය නැමති එම වෘත්තීය සමිතිය හා ගැටෙන වෙනත් වෘත්තීය සංවිධාන රාශියකි. එවන් ගැටුමක් මුල් කරගෙන සිදුකරන ලද සාපරාධි ක්‍රියාවක්ද යන්නත් විමර්ශනවල එක් පියවරක් වනු ඇත.

මෙසේ ගිනිගත් බංගලාවේ සියලු මේස පුටු අල්මාරි රෙදිපිළි ඇතුළු සියලු දේ සහිත කාමර සියල්ලක්ම පාහේ විනාශ වුවද එහි දේව යාඥා කාමරයට හෝ කුස්සියට කිසිඳු හානියක් සිදුව නැත. එතුළින් පැහැදිළි වන්නේ මෙම ගින්න කුස්සියෙන් හෝ දේව කාමරයෙන් හටගත් එකක් නොවන බවයි.

කෙසේ වෙතත් මෙම ඉතිහාසගත බංගලාව විනාශවීම ගැන කා තුළත් ඇත්තේ දුකකි, වේදනාවකි. හේතුව එය පුරාවිද්‍යාත්මක වටිනාකමක් හා සමාන දේපළක් වූ නිසා පමණක් නොව වතු කම්කරුවන්ගේ දෛවය වෙනස් කරන්නට අවශ්‍ය තීන්දු තීරණ රැසක් ගන්නට ඉවහල් වූ ස්ථානයක් නිසාවෙනි.







### ගින්න ඇති වූ සැණින් එහි සේවකයන් වහාම රාජ්‍ය ඇමති ජීවන් තොණ්ඩමන්ටත්, සෙන්දිල් තොණ්ඩමන්ටත් හා පාර්ලිමේන්තු මන්ත්‍රී මරුදපාන්ඩි රාමේෂ්වරන්ටත් දැනුම් දී ඇති අතර, මේ සියල්ලන්ම උදෑසන 5.30 ට පෙර ඒ ස්ථානයට පැමිණ ඇත.

### වැවන්ඩන් බංගලාව ඉංග්‍රීසින්ගේ පාලන සමයේ ඉදිකරන ලද්දක්

### එය වතු කම්කරුවන්ගේ දෛවය වෙනස් කළ තීරණ රැසක් ගත් ස්ථානයක්

### වසර 150කටත් වඩා පැරණි ලීබඩු ඇතුළු දේපළ සියල්ලම අළු වෙලා

# සංචාරක අමාත්‍යාංශය

# ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය

# 2020 සහ 2021 භාණ්ඩ, සේවා සහ ක්‍රියා (වැඩ) සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම

ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනය 2020/2021 වසරට තොරතුරු තාක්ෂණය ඇතුළුව පහත දැක්වෙන භාණ්ඩ, සේවා සහ ක්‍රියා (වැඩ) සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම උදෙසා අදාළ සැපයුම්කරුවන්ගෙන්/සේවා ප්‍රතිපාදකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනය (කොළඹ ප්‍රධාන කාර්යාලය ඇතුළුව) පහත දැක්වෙන ප්‍රාදේශීය හෝටල් පාසල් 8 ට ආසන්නව සිටින සැපයුම්කරුවන්හට/සේවා ප්‍රතිපාදකයන්හට මෙමගින් ලියාපදිංචි කිරීමට ප්‍රමුඛත්වයක් ලබාදෙන අතර, අයදුම් කිරීමේදී තමන් කැමති ස්ථානය/ස්ථාන කරුණාකර සටහන් කරන්න.**

- මහනුවර, කුණ්ඩසාලේ
- අනුරාධපුර, ශ්‍රී මහා බෝධි මාවත
- කොග්ගල, හබරාදූව
- බණ්ඩාරවෙල, ගොල්ෆ් ලින්ක් පාර, ජාතික නිවාස නිවේශන පරිශ්‍රය
- රත්නපුර, කොළඹ පාර, නව නගරය
- කුරුණෑගල, බෝගහගේ, මහුරුණිය වත්ත
- පාසිකුඩා, වාලච්චේන, කෙලින් වීදිය
- යාපනය, චුන්නාකම්, කෙලින් වීදිය

1. භාණ්ඩ

| අයිතම් සංකේතය | අයිතම |
|---|---|
| 1.1. | ලිපි ද්‍රව්‍ය - සියලුම වර්ගයේ ලිපි ද්‍රව්‍ය (ඡායා පිටපත් කඩදාසි, අනු පිටපත් කඩදාසි, පොත් බැඳුම් ද්‍රව්‍ය, ෆයිල් කවර, පෑන්සල්, ලිපින උපකරණ, මකන කෑලි ආදිය) |
| 1.1.1. | මුද්‍රණ යන්ත්‍ර ආශ්‍රිත ද්‍රව්‍ය - ටෝනර් කාට්‍රිජ්, රිබන්, හිස් CD සහ DVD, රබර් සීල් යනාදිය |
| 1.2. | ප්‍රකාශන (පොත්, සඟරා, පුවත්පත්) |
| 1.3. | ගෘහ භාණ්ඩ - සියලුම වර්ගයේ ගෘහ භාණ්ඩ (දැව, ප්ලාස්ටික්, ෆයිබර්ග්ලාස්, මෙලමයින්, වානේ) (කාර්යාල ගෘහ භාණ්ඩ, ආපනශාලා ගෘහ භාණ්ඩ, පංතිකාමර ගෘහ භාණ්ඩ, මුළුතැන්ගෙයි ගෘහ භාණ්ඩ යනාදිය) |
| 1.4. | තොරතුරු තාක්ෂණ (IT) උපකරණ සහ උපාංග - සියළුම වර්ගයේ IT උපකරණ සහ උපාංග (ඩෙස්ක්ටොප්, ලැප්ටොප්, මුද්‍රණ යන්ත්‍ර, ස්කෑනර්, UPS, ප්‍රක්ෂේපණ, පෙන්ඩ්‍රයිව්, මවුස්, කී බෝඩ්, වෙනත් උපාංග යනාදිය |
| 1.5. | කාර්යාල උපකරණ |
| 1.5.1. | ඡායාපිටපත් යන්ත්‍ර, බයින්ඩින් යන්ත්‍ර, ෆැක්ස් යන්ත්‍ර සහ වෙනත් අදාළ උපකරණ |
| 1.5.2. | TV සහ ආශ්‍රිත අදාළ ද්‍රව්‍ය |
| 1.5.3. | දුරකථන පද්ධති |
| 1.5.4. | කැමරා කාච |
| 1.6. | වායු සමීකරණ - සියලුම වර්ගයේ වායු සමීකරණ සහ අමතර කොටස් |
| 1.7. | වාහන අමතර කොටස් - ටයර්, ටියුබ්, බැටරි යනාදිය (සැපයීම සහ සවිකිරීම) |
| 1.8. | රෙදි (Linen) සහ රෙදිපිළි (Textiles) නිෂ්පාදන |
| 1.8.1 | නිල ඇඳුම් ද්‍රව්‍ය සහ කරපටි (Tie) යනාදිය |
| 1.8.2 | ඇඳ ඇතිරිලි, කොට්ට, කොට්ට උර, රෙදි අයිතම්, සිරි රෙදි යනාදිය |
| 1.9. | පාවහන් (මැණික්ලිත පාවහන්, මුළුතැන්ගෙයි පාවහන් යනාදිය) |
| 1.10. | මුළුතැන්ගෙයි උපකරණ/ආහාර සහ පාන (F & B) උපකරණ - සියළුම වර්ගයේ මුළුතැන්ගෙයි/F & B උපකරණ මුළුතැන්ගෙයි කැපුම්පිහි ආදිය, පිඟන් කෝප්ප ආදිය, හැඳි ගෑරුප්පු පිඟාන ආදිය, වීදුරු බඩු, පේස්ට්‍රි හා බේකරි යනාදිය) |
| 1.11. | ගෘහ පාලන උපකරණ - සියළුම වර්ගයේ ගෘහ පාලන උපකරණ |
| 1.12. | ලොන්ඩ්‍රි උපකරණ (රසායන ද්‍රව්‍ය සහ ලොන්ඩ්‍රි ආශ්‍රිත උපකරණ) |
| | 1.12.1 සියළුම වර්ගයේ ලොන්ඩ්‍රි උපකරණ/රසායන ද්‍රව්‍ය ලොන්ඩ්‍රි ආශ්‍රිත උපකරණ |
| | 1.12.2 අමතර කොටස් සහ ආශ්‍රිත අයිතම් |
| 1.13. | ආහාර අයිතම් - පළතුරු, මාළු, මස්, වියළි ආහාර ද්‍රව්‍ය, එළවළු, කිරිආශ්‍රිත පැකට්, සිල්ලර බඩු අයිතම්, ආනයනික ආහාර අයිතම්, බේක්/බේකරි රසකාරක ද්‍රව්‍ය යනාදිය |
| 1.14. | පිරිසිදු කිරීමේ ද්‍රව්‍ය - සියළුම වර්ගයේ පිරිසිදු කිරීමේ ද්‍රව්‍ය සහ රසායනික ද්‍රව්‍ය |
| 1.15. | උත්පාදක යන්ත්‍ර (Generators) සියළුම වර්ගයේ උත්පාදක යන්ත්‍ර සහ අමතර කොටස් |
| 1.16. | මෙවලම් - සියළුම වර්ගයේ වැඩ සහ සවිකිරීම් |
| 1.17. | විදුලි ආලෝක මෙවලම් සහ පාරිභෝගික භාණ්ඩ - සියළුම වර්ගයේ විදුලි ආලෝක මෙවලම් සහ උපාංග යනාදිය |
| 1.18. | පයිප්ප සහ මෙවලම් - සියළුම වර්ගයේ පයිප්ප සහ මෙවලම් (වතුර පොම්ප, වැල්ව්, කරාම, සනීපාරක්ෂක මෙවලම්, පයිප්ප සහ මෙවලම් යනාදිය) |
| 1.19. | ලෝහ භාණ්ඩ අයිතම් (සෙලූ බ්‍රෂ්, යොදු, පොළ මාත්තු කිරීම (Mob), කුණු බඳුන්, අගුල සහ මුරපිටි, පොලිතීන් ද්‍රව්‍ය, වැසිකිළි සහ පොලිෂ් අයිතම් ආදිය |
| 1.20. | මල් සැරසිලි (කැපුම් මල්, මල් කළඹ යනාදිය) |
| 1.21. | ජල පෙරන (Water filter), ඩිස්පෙන්සර් සහ බෝතල් ජල බෝතල් (ජල පෙරන සහ ලීටර් 19, 21 ඇතුළුව සියළුම ප්‍රමාණවල බෝතල් ජල බෝතල් |
| 1.22. | ගිනි අනතුරු හදුනාගැනීමේ පද්ධති (ගිනි නිවන උපකරණ සහ ආශ්‍රිත අයිතම්) |
| 1.23. | LP ගෑස් සැපයුම්කරුවන් |

| 2. | සේවා |
|---|---|
| 2.1 | අළුත්වැඩියා කිරීම සහ නඩත්තු කටයුතු |
| 2.1.1 | තොරතුරු තාක්ෂණ (IT) උපකරණ (පරිගණක සෙර්වර්ස්, ඩෙස්ක්ටොප්, ලැප්ටොප්, මුද්‍රණ යන්ත්‍ර, ස්කෑනර්, UPS යනාදිය |
| 2.1.2 | කාර්යාල උපකරණ (ෆැක්ස් යන්ත්‍ර, විදුලි සහ ඉලෙක්ට්‍රොනික උපකරණ, ඡායා පිටපත් යන්ත්‍ර, පංකා, දුරකථන, කැමරා, සන්නිවේදන උපකරණ, දුරකථන පද්ධති, ආලෝකකරණ අයිතම්) |
| 2.1.3 | ගෘහ භාණ්ඩ (කාර්යාල ගෘහ භාණ්ඩ පොලිෂ් කිරීම, අළුත්වැඩියා කිරීම යනාදිය) |
| 2.1.4 | වාහන අළුත්වැඩියා කිරීම (වාහන සේවා, වින්කරිස් සහ පින්තාරු කිරීම, ඇතුළත පිරිසිදු කිරීම, පිටත පිරිසිදු කිරීම, එන්ජිම ඇතුළු අනෙකුත් අළුත්වැඩියා කටයුතු සහ අදාළ සේවාවන්) |
| 2.1.5 | ගොඩනැගිලි නඩත්තුව |
| | 2.1.5.1. විදුලි වැඩ (වයරින්, විදුලි ආලෝක මෙවලම් සහ පාරිභෝගික භාණ්ඩ, පරිශ්‍ර විදුලි ආලෝක කිරීම යනාදිය) |
| | 2.1.5.2. ජල සැපයුම් පද්ධති (ජල කාන්දුවීම් සොයාගැනීම, අලුත්කිරීම, අළුත්වැඩියා කිරීම යනාදිය) |
| | 2.1.5.3. වායු සමීකරණ සේවාවන් (සියළුම වායු සමීකරණ ආශ්‍රිත සාමාන්‍ය නඩත්තු සේවාවන්) |
| | 2.1.5.4. ගිනි නිවාරණ සහ ගිනි අනාවරණ පද්ධති (ගිනි අනාවරණ පද්ධතිවල සාමාන්‍ය නඩත්තු සේවා සහ ගිනි නිවාරණ උපකරණ නැවත පිරවීම) |
| | 2.1.5.5. කාර්යාලයේ සාමාන්‍ය නඩත්තුව (පින්තාරු වැඩ, දොර ජනෙල් සැපයීම සහ සවිකිරීම යනාදිය) |
| | 2.1.5.6. සුළු නඩත්තු කටයුතු (සේවා ස්ථාන වෙන්කර වෙන්කිරීම් වැඩ, පින්තාරු කිරීම, බිම කබොලෑලි සැපයීම යනාදිය) |
| 2.2. | භෞමික නඩත්තුව (මල් සහිත පෝච්චි සැපයීම, භෞමික අලංකරණය (Land scape) සඳහා මල් සහ පැළෑටි මල්) |
| 2.3. | උත්සව අවස්ථා කළමනාකරණය (Event Management) (සහ ආශ්‍රිත අයිතම් (ඩිජිටල් ප්‍රදර්ශන පුවරු, දැන්වීම් පුවරු (Hoardings), විදුලි ආලෝක සංඥා පුවරු, නාම පුවරු, නියොන් සංඥා පුවරු, ආයතන ප්‍රචාරක පුවරු, (Signage), Pull ups, ප්‍රකාශන (Exponents, A පුවරු, වායු (Wind) කොඩි, සැඳුම් සන්ධ්‍යාම, Disk Jockeys, ධ්වනි රථ, සංගීත කණ්ඩායම් සහ විනෝදාත්මක අංග, විශාල කූඩාරම් (Marquees), විදුලි උත්පාදක (Generator) සැපයුම්කරුවන්, ප්‍රදර්ශන කුටි, ස්ථාන ආලෝකකරණය සහ ශබ්ද පද්ධති යනාදිය) |
| 2.4. | මුද්‍රණ / Offset |
| | 2.4.1. පොත් - මුද්‍රණය, බැඳීම, කුඩා පොත් (Brochures), පොත් පිංච (Booklet), නාම පත් (Visiting card), පෝස්ටර්, වාර්තා, සඟරා, ලිපි ශීර්ෂ, මුද්‍රිත කවර යනාදිය) |
| | 2.4.2. බැනර්, සහතික පත්, එළිය පුවරු, සැලසුම්පත් සහ පොලිතීන් මුද්‍රණ යනාදිය |
| 2.5. | DVD, CD, ලුමින් DVD සමග Dockets |
| 2.6. | ඡායාරූප ශිල්පීන්, වීඩියෝ කැමරා ශිල්පීන් සහ වීඩියෝ සංස්කාරකයන් |
| 2.7. | පුද්ගලයන් සහ භාණ්ඩ ප්‍රවාහනය සහ කුලියට දීම සඳහා කාර්, වෑන්, ලොරි, බස් (ආසන 45 බස් වායුසමීකරණ සහිත සහ සමීකරණයෙන් තොර සහිත- යනාදිය |
| 2.8. | කුරියර් සේවාවන් |
| 2.9. | පිඟන් කෝප්ප, හැඳි, ගෑරුප්පු, පිඟාන සහ වුවන් අයිතම් කුලියට දීම |
| 2.10. | ප්‍රවර්ධන සේවාවන් (Promotional Services) |
| | 2.10.1. වෙළඳ දැන්වීම්, ආටවර්ක් යනාදිය |
| | 2.10.2. විද්‍යුත් අලෙවිකරණය (e-marketing) සමාජජාලා කළමනාකරුවන් යනාදිය |
| 2.11. | හෝටල්වල නවාතැන් පහසුකම් - අනුරාධපුර, පොළොන්නරුව, මහනුවර, සීගිරිය යනාදී ස්ථානවල |
| 2.12. | දිවා ආහාර සැපයීම - මාතලේ, දඹුල්ල, මහනුවර, ගාල්ල ස්ථානවල |
| 2.13. | ආරක්ෂක සේවා |
| 2.14. | පවිත්‍රතා සේවා (Janitorial services) |
| 2.15. | රක්ෂණ සේවා (වාහන, ගොඩනැගිලි, ගිනි යනාදිය) |
| 2.16. | සෞඛ්‍ය දැනුම්දීමමින් සෞඛ්‍ය ආහාරපාන සැපයීම |
| 2.17. | නිල ඇඳුම් කට්ටල මැසීම |
| 2.18. | අභ්‍යන්තර අලංකරණ (Interior Decorators) |
| 2.19. | විදුලි උත්පාදක (Generators) කුලියට සැපයීම/නඩත්තු/සේවා සිදුකිරීම |
| 2.20. | විදුලි පෝෂක සේවා/නඩත්තුව |
| 2.21. | ආහාරපාන (F & B) උපකරණ, වාණිජ බේකරිය/මුළුතැන්ගෙයි උපකරණ සේවා/නඩත්තුව (ශීත කාමරය, අධි ශීතකරණ, මිකර්, මික්සර්, ද්විත්ව බොයිලේරු (Bain mares), Salamanders, මිල්කෂේක්, අයිස් කැට යන්ත්‍රය සහ සියළුම වර්ගයේ ආහාරපාන (F & B) සහ මුළුතැන්ගෙයි /බේකරි උපකරණ යනාදිය) |

| 3. | වැඩ/ කටයුතු |
|---|---|
| 3.1. | ගොඩනැගිලි ඉදිකිරීම් (අදාළ ICTAD/CIDA ලියාපදිංචිය අවශ්‍යය) (ගොඩනැගිලි ඉදිකිරීම්/වැඩිදියුණු කිරීම්/පෙදරේරු වැඩ/වයරින්/වඩු වැඩ/ඇලුමිනියම් වැඩ සහ ජනෙල්/ පින්තාරු වැඩ යනාදිය) |
| 3.2. | අභ්‍යන්තර අලංකරණ වැඩ සහ සේවා ස්ථාන බෙදීම (Partitioning) සහ අළුත්වැඩියා කිරීම |
| 3.3. | ප්‍රවර්ධන අවස්ථා සඳහා සැරසිලි (වෙළඳ කුටි සැදීම, විදුලි ආලෝකකරණය, වේදිකා ආලෝකකරණය, ප්‍රදර්ශන පුවරු, මල් සැරසිලි යනාදිය) |

පහත දැක්වෙන ආකෘතියට අනුව අයදුම්පත සකස් විය යුතු අතර එම අයදුම්පත සමග ලියාපදිංචි වීමට අපේක්ෂා කරන භාණ්ඩ, සේවා හෝ වැඩවලට අදාළ සියලු අයිතම සංකේත අංක තීරණය කරන සැපයුම් හෝ සේවාවන් වෙනුවෙන් එක් එක් අංකයකට රු. 300.00 (රු. තුන්සියය) බැගින් වූ ආපසු නොගෙවන ලියාපදිංචි ගාස්තු මුදලක් ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනයේ සාමිචාර (මුදල් අංශය) වෙත හෝ ලංකා බැංකුවේ ආයතනික (corporate branch) ශාඛාවෙහි ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනයේ ගිණුම් අංක 7120156 ට බැර කිරීමෙන් ලැබෙන රිසිට් පත අමුණා එවිය යුතුය. පෞද්ගලික චෙක්පත් මගින් ලියාපදිංචියේදී, කිසිදු ගෙවීමක් පිළිගනු නොලැබේ.

අයදුම්පත සමග, ව්‍යාපාර ලියාපදිංචි සහතිකයේ සහතික කරන ලද පිටපතක් සහ සමාගම් හෝ සේවා පළපුරුද්දට අදාළ ලියකියවිලි එවිය යුතුය. තුන්දෙනා අයදුම්කරුවන් ගෙවන ලද ලියාපදිංචි මුදල නැවත නොගෙවනු ලැබේ. දෙපාර්තමේන්තු, මණ්ඩල, සංස්ථා හෝ රාජ්‍ය - අර්ධ රාජ්‍ය ආයතන විසින් ව්‍යාපාර ලියාපදිංචි සහතික ඉදිරිපත් කිරීම අනවශ්‍යවේ. ලියාපදිංචිවීමේ මුදල් සිකුරාදා දිනයන් පෙ.ව. 9.00 සහ ප.ව. 12.00 සහ ප.ව. 1.00 සහ ප.ව. 3.00 අතර කාලය තුළදී ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනයේ සාමිචාර වෙත ගෙවීමට හැකිය. මේ සඳහා චෙක්පත් හෝ මුදල් ඇණවුම් භාර නොගන්නා බව කරුණාවෙන් සලකන්න.

"අධ්‍යක්ෂක (මුදල)" මුදල් අංශය, ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනය, නො. 78, ගාලු පාර, කොළඹ 03 ලිපිනයට යොමු කළ යුතු අයදුම්පත් බහාලන කවරයේ "2020 සහ 2021 සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම" යනුවෙන් ඉහළ වම් කෙළවරෙහි සටහන් කර 2020 සැප්තැම්බර් 15 දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් ලැබීමට සැලැස්විය යුතුය. අයදුම්කරුවනු එක් අයිතම් සංකේත අංකයකට වඩා ලියාපදිංචි වීමට බලාපොරොත්තු වේනම් (රු. 300.00 x අයදුම්කරනා අයිතම් සංකේත අංක සංඛ්‍යාව) ගෙවිය යුතු අතර එම ගෙවීම සිදු කිරීමෙන් ලැබෙන රිසිට් පත හෝ බැංකුවේ සහතික කළ /මුල්පිටපත අයදුම්පත සමග අමුණා එවිය යුතුය. එසේ එවනු ලබන භාණ්ඩ/සේවාවන්හි ලියකියවිලිවල වලංගුභාවය ඒ වෙනුවෙන් පත්කළ කමිටුව මගින් සිදුකරනු ලබන අතර තෝරා ගැනීම් ඒ අනුව සිදු කෙරෙනු ඇත.

මිල ගණන් ඉදිරිපත් කිරීමට ආරාධනා කළ විට එය ඉදිරිපත් නොකරන හෝ අදාළ භාණ්ඩ ලබා නොදෙන හෝ වේලාවට සේවාව නොසපයන හෝ අදාළ පිරිවිතර වලට පටහැනිව කටයුතු කරන සැපයුම්කරුවන්ව පෙර දැනුම්දීමකින් තොරව ලියාපදිංචි ලේඛනයෙන් ඉවත් කරනු ලැබේ. සාමාන්‍යයෙන් මිල ගණන් ඉදිරිපත් කිරීම සඳහා ආරාධනා කරනුයේ ලියාපදිංචි අයදුම්කරුවන් හට පමණක් වුවද අවශ්‍ය ප්‍රමාණයට සැපයුම්කරුවන්/කොන්ත්‍රාත්කරුවන් නොමැති අවස්ථාවක වෙනත් සැපයුම්කරුවන්/කොන්ත්‍රාත්කරුවන් ගෙන් මිල ගණන් කැඳවීමේ අයිතිය ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනය සතුවේ.

මිල ගණන් කැඳවීමේදී සාමාන්‍යයෙන් නිර්දේශිත 2006 මාර්ගෝපදේශ 3, 4 රෙරස් ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් එය සිදුකරනු ලබන අතර ලැබුණු මිල ගණන් ඇගයීමෙන් පසු තෝරාගනු ලබන පිළිගත යුතු ප්‍රතිචාරාත්මක අවම මිල ගණන් ඉදිරිපත් කළ සැපයුම්කරුව තෝරාගනී. මීට අදාළ වැඩි විස්තර සහකාර අධ්‍යක්ෂක - මුදල, ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනය, නො. 78, ගාලු පාර, කොළඹ 03 ලිපිනයේ දුරකථන අංක 011-2208341 වෙතින් ලබාගත හැක.

**පහත දැක්වෙන පිටපත් එවීමට ඔබ අපොහොසත් වුවහොත් ඔබේ අයදුම්පත ප්‍රතික්ෂේප කරනු ඇත.**

**01. ව්‍යාපාර ලියාපදිංචි පිටපත**
**02. සමාගම් ව්‍යවස්ථාව (සීමාසහිත වගකීම් සහ පොදු සමාගමක් නම්)**
**03. VAT ලියාපදිංචිය (අදාළනම්)**
**04. ICTAD/CIDA ලියාපදිංචිය (අදාළනම්)**
**05. රිසිට් පත හෝ බැංකු පිටපතේ මුල් පිටපත**

**සැපයුම්කරුවන් ලියාපදිංචිකිරීම් පෝරමයේ ආකෘති පත්‍රය අපගේ නිල වෙබ් අඩවිය http://slithm.edu.lk/notice මිස්සන් හෝ අපගේ ලඟම ආයතනික ස්ථානයෙන් ලබාගත හැක.**

## 2020 සහ 2021 සඳහා සැපයුම්කරු ලියාපදිංචි කිරීමේ පෝරමය

**සාමාන්‍ය සමාගම් තොරතුරු**

| | | |
|---|---|---|
| 01. | සමාගමේ නම (නිත්‍යානුකූල නම) | :........................ |
| 02. | ව්‍යාපාර ලිපිනය | :........................ |
| 03. | හිමිකරුගේ නම/බලයලත් නිළධාරියා | :........................ |
| 04. | දුරකථන /ජංගම අංකය | :........................ |
| 05. | ෆැක්ස් අංකය | :........................ |
| 06. | විද්‍යුත් ලිපිනය | :........................ |
| 07. | වෙබ් අඩවි ලිපිනය | :........................ |
| 08. | ව්‍යාපාර ලියාපදිංචි අංකය (පිටපත) | :........................ |
| 09. | VAT ලියාපදිංචි අංකය | :........................ |
| 10. | ICTAD ලියාපදිංචි අංකය (අදාළනම්) | :........................ |
| 11. | සමාගම් ව්‍යවස්ථාව | :........................ |
| 12. | පෙර පළපුරුද්ද | : ඇත / නැත |
| 13. | සැක්සතුලුව රිසිට් පත හෝ බැංකු සැක්සතුලුව සහතික කළ / මුල් පිටපත් මේ සමඟ අමුණා ඇති / නැති වන | : ඇත / නැත |
| 14. | කිසියම් නියෝජිත හෝ වෙළඳ නියෝජිත තත්වය (ඇත නම් කරුණාකර සහතික කළ පිටපත් අමුණන්න) | : ඇත / නැත |
| 15. | මුදල් ගෙවූ සිට්ටිපත අමුණුම | : ඇත / නැත |
| 16. | බැංකු සැක්සතුලුව මුල් පිටපත අමුණුම | : ඇත / නැත |
| 17. | රිසිට් පත් අංකය | :........................ |

**කැමති ස්ථාන/(ය)** - (අදාළ කොටුවේ සලකුණ කරන්න)

| | | |
|---|---|---|
| ☐ කොළඹ | ☐ මහනුවර | ☐ රත්නපුර |
| ☐ බණ්ඩාරවෙල | ☐ අනුරාධපුර | ☐ කොග්ගල |
| ☐ කුරුණෑගල | ☐ පාසිකුඩා | ☐ යාපනය |

**ඉදිරිපත් වෙන භාණ්ඩ / සේවාවන් / වැඩ පිළිබඳ ලැයිස්තුව** අදාළ අයිතම් සංකේත අංකය ඉදිරියේ සලකුණු කරන්න.

| | | | | |
|---|---|---|---|---|
| ☐ 1.1 | ☐ 1.1.1 | ☐ 1.2 | ☐ 1.3 | ☐ 1.4 |
| ☐ 1.5.1 | ☐ 1.5.2 | ☐ 1.5.3 | ☐ 1.5.4 | ☐ 1.6 |
| ☐ 1.7 | ☐ 1.8.1 | ☐ 1.8.2 | ☐ 1.9 | ☐ 1.10 |
| ☐ 1.11 | ☐ 1.12.1 | ☐ 1.12.2 | ☐ 1.13 | ☐ 1.14 |
| ☐ 1.15 | ☐ 1.16 | ☐ 1.17 | ☐ 1.18 | ☐ 1.19 |
| ☐ 1.20 | ☐ 1.21 | ☐ 1.22 | ☐ 1.23 | ☐ 2.1.1 |
| ☐ 2.1.2 | ☐ 2.1.3 | ☐ 2.1.4 | ☐ 2.1.5.1 | ☐ 2.1.5.2 |
| ☐ 2.1.5.3 | ☐ 2.1.5.4 | ☐ 2.1.5.5 | ☐ 2.1.5.6 | ☐ 2.2 |
| ☐ 2.3 | ☐ 2.4.1 | ☐ 2.4.2 | ☐ 2.5 | ☐ 2.6 |
| ☐ 2.7 | ☐ 2.8 | ☐ 2.9 | ☐ 2.10.1 | ☐ 2.10.2 |
| ☐ 2.11 | ☐ 2.12 | ☐ 2.13 | ☐ 2.14 | ☐ 2.15 |
| ☐ 2.16 | ☐ 2.17 | ☐ 2.18 | ☐ 2.19 | ☐ 2.20 |
| ☐ 2.21 | ☐ 3.1 | ☐ 3.2 | ☐ 3.3 | |

**ප්‍රසම්පාදන කමිටු සභාපති**
**ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය,**
**අංක 78, ගාලු පාර, කොළඹ 03.**
**සාමාන්‍ය විමසීම්: 011 220 8300 දිගුව: 318/319/341**







# සැදෑ සමයේ වෙන්දේසි වන පොලිස් නිල සුනඛයෝ

## පොලිස් නිල සුනඛ අංශයේ වෙන්දේසියකදී වැඩිම මිලකට විකිණුන සුනඛයා බ්‍රීත්

## එක් සුනඛයකු නඩත්තු කිරීම සඳහා මාසයකට රුපියල් 80,000ක මුදලක් වැයවෙයි

● අසේල කුරුළුවංශ

**ගහට පොත්ත මෙන් ඇලී ජීවිතය බෙදා ගත් දෙදෙනෙකුගේ වෙන්වීම සිදුවන ඒ මොහොත අතිශයින් හැඟුම්බරය. ලංසු තබන්නා හඬ නගා මිලක් නියම කරත්දී සුනඛයාගේ ගෙල බැඳි කර පටියේ කෙළවර අල්ලාගෙන සිටින ස්වාමියා දෙනෙතට නැඟෙන කඳුළු කැට පිටතට යා නොදී රඳවා ගන්නට දරන ආයාසය ඔවුන් දෙදෙනාගේ බැඳීමේ තරම කදිමට කියාපායි. ජීවිත කාලය පුරා කිසිදු දිනක මුහුණ නොදුන් මොකක්දෝ නුහුරු යමක් සිදුවන්නට යන බව ඉවෙන් මෙන් දැනගත් සුනඛයා ස්වාමියාට කිට්ටු වන්නට වෙර දරයි. මේ දෙදෙනා අතර පවත්නා බැඳීම පිළිබඳ කිසිවක් නොදන්නා ඉල්ලුම්කරුවන් මොනර කොළ ගණනින් ලංසු තබන්නේ සුනඛයාගේ හිමිකාරත්වය දිනා ගැනීමටය. "ඇවරයි, දැවරයි,**

තුන් ඇවරයි. තීන්දුයි.." දස වසරක් හෝ ඊට කිට්ටු කාලයක් සුනඛයා හා උගේ ස්වාමියා අතර පැවැති සබඳතාව හමාර වන්නේ එසේය. එතෙක් වේලා ස්වාමියාගේ ඇස් තුළ තෙරපෙමින් තිබූ කඳුළු කැට පිටතට පනින්නේ තවදුරටත් වේදනාව දරා ගැනීමට ශක්තියක් ඔහුට නැති බැවිනි. කඳුළු පිරි දෙනෙතින් ස්වාමියා දෙස අවසන් බැල්ම හෙළන සුනඛයාගේ ගෙල බැඳි කරපටියේ කෙළවර අලුත් ස්වාමියා අතට පත්වන්නේ කෙනකුට සතුටත් තවකකුට වේදනා කන්දකුත් තුරුලු කරමිනි.

මහනුවර පොලිස් නිල සුනඛ කොට්ඨාසයේදී පසුගියදා සිදු කෙරුණු සුනඛ වෙන්දේසියේ පිටතට නොපෙණුනු හැඟුම්බර කතාව එයයි. එම කොට්ඨාසයට අනුයුක්තව රාජකාරි කළ සුනඛයන් 25 දෙනෙකු වෙන්දේසි කිරීම සමාජය තුළ දැඩි කතිකාවක් ඇති කිරීමට හේතු දෙකක් බලපෑවේය. එකක් නම් අපරාධ මැඩලීම පිණිස පොලිස් දෙපාර්තුමේන්තුවට විශාල දායකත්වයක් ලබාදුන් මෙම සතුන් ඔවුන්ගේ ස්වාමීන්ගෙන් වෙන්කර වෙන්දේසි කිරීම සම්බන්ධයෙන් හැඟුම්බර අදහස් සමාජ මාධ්‍ය තුළ පළ වීමය. අනෙක් කාරණය නම්, 1948 වසරේ පොලිස් නිල සුනඛ අංශය ඇති කළදා පටන් පැවැති කිසිදු වෙන්දේසියකදී නොවිකුණුනු මිලකට මෙහිදී සුනඛයකු අලෙවි වීමයි. සාමාන්‍ය වෙළෙඳපොළ වටිනාකම රුපියල් 40,000ක් පමණ වන ලැබ්‍රඩෝර් (Labrador) වර්ගයේ සුනඛයකු මෙම වෙන්දේසියේදී අලෙවි වූයේ රුපියල් 10,1000ටය. බ්‍රීත් නැමැති මෙම සුනඛයා මීට මාස හයකට පමණ ඉහතදී පොලිස් නිල සුනඛ කොට්ඨාසයට ලැබුණේ මහජන පරිත්‍යාගයක් ලෙසය. වයස අවුරුදු දෙකක් පමණ වන බ්‍රීත් පොලිස් රාජකාරි සඳහා පුහුණු කිරීමට අසීරු වීම නිසා වෙන්දේසි කිරීමට තීරණය කර තිබේ. සිම්බා නැමැති ලැබ්‍රඩෝර් වර්ගයේම සුනඛයකු රුපියල් 50,000ටත් රෙක්ස් නැමැති බෙල්ජියම් මැලනොයින් සුනඛයා රුපියල් 23,000ටත් රෙජී නැමැති රොට්වයලර් සුනඛයා රුපියල් 17,500ටත් ලිලී නැමැති ඩැල්මේෂන් සුනඛයා රුපියල් 16,000ටත් මෙහිදී වෙන්දේසි විය. අඩුම මිලකට වෙන්දේසි වූයේ රෝසි නැමැති ලැබ්‍රඩෝර් වර්ගයේ බැල්ලය. වයස අවුරුදු 10 ඉක්මවා සිටි ඇයට නියම වූ මිල වූයේ රුපියල් 1,100කි. මොවුන් ඇතුළු සුනඛයන් 25 දෙනා වෙන්දේසි කිරීමෙන් පොලිස් දෙපාර්තුමේන්තුවට ලැබී තිබුණු මුදල රුපියල් 3,15,800කි.

"වෙන්දේසියට යොමුකරන ලද බෙල්ජියම් මෙලනොයින් වර්ගයට අයත් හීරෝස් අනුරාධපුර පොලිස් නිල සුනඛ ඒකකයට අනුයුක්තව වසර 10ක පමණ කාලයක් සේවය කර තිබෙනවා. අපරාධ පරීක්ෂණවලට මෙන්ම මත්ද්‍රව්‍ය අත්අඩංගුවට ගැනීම් 400කට පමණ හීරෝස් දායකත්වය ලබාදී තිබෙනවා. මේ අතර සිටි ඇල්වින්ද ඉතා දක්ෂ ලෙස රාජකාරී කළ සත්ත්වයෙක්. හොරණ පොලිස් නිල සුනඛ ඒකකයේ සේවය කරමින් ඇල්වින් අපරාධ පරීක්ෂණ සිද්ධීන් 200ක් පමණ නිරාකරණය කිරීමට සහාය දක්වා තිබෙනවා.බෙට්කා කොම්පඤ්ඤවීදියේ නිල සුනඛ ඒකකයේ සේවය කළා. එයත් අපරාධ පරීක්ෂණ සිදුවීම් 110ක් පමණ කර තිබෙනවා. මේ වෙන්දේසි කළ සුනඛයන් අතරින් සිම්බා,බ්‍රැන්ඩෝ,එමා ,ජෙරාඩ්,බ්‍රීත්,නික්ස් කියන සතුන් නිල සුනඛ කොට්ඨාසයට මේ රටේ ජනතාව පරිත්‍යාග කළ අයයි. ලිලී කියන්නේ අපේ මූලස්ථානයේ උපන් කෙනෙක්. අවුරුද්දක් පමණ වන ලිලී පුහුණුවට යොමු කිරීම අසීරුයි. අනිත් සතුන් සියලු දෙනා බෙල්ජියමෙන් ආනයනය කළ අයයි. කොච්චර කීවත් යමක් කියා දුන්න විදිහට නොකරන මිනිස්සු ඉන්නවා නේද?.ඒ වගේම කියන දේ නොතේරෙන බල්ලොත් ඉන්නවා. එයාලව පුහුණු කරන්න බැහැ. ඒ නිසා තමයි වෙන්දේසියට යොමු කරන්නේ" මහනුවර පොලිස් නිල සුනඛ කොට්ඨාසයේ උප පොලිස් පරීක්ෂක සුගත් විජේසිංහ පවසයි.

පුහුණුව සඳහා සුනඛයකු වයස අවුරුද්දක් සම්පූර්ණ වීමට ප්‍රථම යොමු කළ යුතුය. මාස හයක පමණ කාලයක් මූලික පුහුණුව ලබා දීමෙන් පසු බල්ලාගේ විශේෂ දක්ෂතා හඳුනා ගැනීමක් සිදුකරයි. ඒ ඔස්සේ නිල සුනඛයා මත්ද්‍රව්‍ය සෙවීමේ රාජකාරිවලද අපරාධ මැඩලීමේ රාජකාරිවලද නැතහොත් ප්‍රභූ ආරක්ෂක රාජකාරිවලද යොදවන්නේ යන්න තීරණය කෙරෙයි. පුහුණුව ආරම්භයේ සිට රාජකාරි දිවිය අවසන් වනතුරු සුනඛයා රැක බලා ගැනීම පැවරෙන්නේ එකම නිලධාරියකුටය. මේ නිසාම වෙන්දේසියේදී හිතවතකු යොදවා තමන් පුහුණු කළ බල්ලා කීයකට හෝ මිලට ගැනීමට පසුබට නොවන නිලධාරියෝද සිටිති. බල්ලාගේ ලන්සු මුදල ඉහළ යනවිට ඒ සඳහා මුදල ගැන නොසිතා බිට් කරමින් මෙවරද නිලධාරීන් සිවු දෙනෙකුම තමන්ගේ බල්ලා තමන් ළඟම තියා ගන්නට කටයුතු කර තිබිණි.

"සමහර බල්ලෝ පුහුණු කරන්න බැහැ. කියන දේ අහන්නේ නැහැ. තවත් අය අසනීපයි. මහන්සි කරන්න අමාරුයි. වසර 10ක් පමණ අඛණ්ඩව සේවය කරලා ශරීර සෞඛ්‍ය දුර්වල වීම නිසා තවදුරටත් ජවයෙන් යුතුව සේවය කිරීමට නොහැකි අයත් ඉන්නවා. පොලිස් නිල සුනඛ කොට්ඨාසයේ පශු වෛද්‍යවරයා මේ සුනඛයන් නිරීක්ෂණය කරලා ඔවුන් සේවයෙන් ඉවත් කිරීමට නිර්දේශ ලබා දෙනවා. අපි මේ ලැයිස්තුව පොලිස්පතිතුමා වෙත යොමු කරනවා. එතුමාගේ නිර්දේශ මත පොලිස් මූලස්ථානයේ ස්ථාපිත දේපොළ කළමනාකරණ අංශයෙන් වෙන්දේසි කරන්න අවසර ලැබෙන සුනඛයන්ගේ නම් ගැසට් කරනවා. වෙන්දේසි කරන්න පැයකට විතර කලින් ඔවුන් මිලට ගන්න ඇවිත් ඉන්න අයට බල්ලෝ ටික පෙන්වනවා. එයාලගේ වර්ගය, තියෙන අසනීප,වයස ආදි සෑම කරුණක්ම පහදා දීමෙන් පස්සේ තමයි විවෘත වෙන්දේසිය පවත්වන්නේ. පොලිස් දෙපාර්තමේන්තුව මඟින් වෙන්දේසි මණ්ඩලයක් පත්කරනවා. මෙවර අධීක්ෂණ නිලධාරියා ලෙස කටයුතු කළේ සහකාර පොලිස් අධිකාරී පලහවඩනයි. මහනුවර පොලිස් නිල සුනඛ කොට්ඨාසයේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ප්‍රියන්ත කුලසේකර පැවසුවේය.

මහනුවර පොලිස් නිල සුනඛ කොට්ඨාසයට අනුබද්ධව නිල සුනඛයන් 280 දෙනෙකු පමණ මේ වන විට සේවය කරති. මොවුන් ප්‍රභූ ආරක්ෂක කටයුතුවල මෙන්ම දිවයින පුරා පිහිටි පොලිස් නිල සුනඛ ඒකක 58කට අනුයුක්තව නොයෙකුත් අපරාධ මැඩලීමේ ක්‍රියාවන්හි නිරතව සිටිති. එක් සුනඛයකු නඩත්තු කිරීම සඳහා එම සතා මෙහෙයවන නිලධාරියාගේ වැටුපද සමඟ මාසයකට රුපියල් 80,000ක පමණ මුදලක් වැයවන බව පොලිස් දෙපාර්තමේන්තුව පවසයි. සුනඛයාගේ ආහාරවලට පමණක් දිනකට වැය කරන මුදල රුපියල් 1,000කට ආසන්නය. රාජකාරියේ නිරත කාලයේදී හදිසි අසනීප තත්ත්වයක් මතුවී මරණයට පත්වුවහොත් එම සුනඛයාගේ අවසන් කටයුතු සිදු කරන්නේ පොලිස් ගෞරව සහිතවය.

රුපියල් 1,01,000ක මුදලකට බ්‍රීත් මිලට ගත් මහනුවර ධම්මික වෙඩික්කාර අදහස් දක්වමින් මෙසේ පැවසුවේය."මගේ ළඟ ජර්මන් ෂෙපර්ඩ් බල්ලෝ දෙන්නෙක් හිටියා.ඒ අය අවුරුදු 14ක් විතර ජීවත් වුණා. බල්ලෙක් ඕන කියලා ළමයි නිතරම කිව්වා. ඒ නිසා තමයි මේ ඔක්ෂන් එකට ආවේ පුහුණු කළ බල්ලෙක් ගන්න. මේ බල්ලව දැක්ක ගමන් ළමයි එයාව ඕන කිව්වා. මුලින් රුපියල් 5,000ක අවම ලන්සුවකට තමයි බ්‍රීත්ව වෙන්දේසියට ඉදිරිපත් කළේ. ළමයි කිව්වා කොහොම හරි අපි ගමු කියලා. ඒ නිසා මමත් ගණන වැඩිකරලා ඉල්ලුවා. අන්තිමට ලක්ෂයත් පැනලා මිල ඉහළ ගියා. පොලිස් නිල සුනඛ අංශයේ වෙන්දේසියකදී බල්ලෙක් මේ වගේ මිලකට ගිය පළවෙනි අවස්ථාව මේක කියලා දැන ගත්තේ පසුවයි."

ඡායාරූප - රුවන් මීගම්මන

---

# කොරෝනාවෙන් හිස්වුණු මැනිං මාර්කට් එකේ සවාරියක්

● නිෂානි හේරත් බන්නැහැක

**සමාජයේ ජීවත්වන ලොකු කුඩා කොයි කාටත් එදිනෙදා ජීවත්වීමට අවශ්‍ය කරන එළවළු පලතුරු, හාල්, තුනපහ, මස්, මාළු ආදී අත්‍යවශ්‍ය භාණ්ඩවල වෙළෙඳපළේ මිල උච්චාවචනය කාටත් වැදගත් වන්නේ දින දෙක තුනකට වරක් නිරන්තරයෙන් ඒවා මිලට ගත යුතු නිසයි.**

කොරෝනා සමයෙන් පස්සෙ පැවැත්වූ මහ ඡන්දයක් සමඟ කොළඹ මැනිං වෙළෙඳපළේ එළවළු පලතුරු මිල ගණන් පිළිබඳව සොයා බලන්න පසුගියදා අපි එහි සංචාරය කළේ කොළඹ 1 – 15 දක්වා වැඩි පිරිසක් එළවළු පලතුරු සිල්ලරට මෙන්ම තොග මිලට ගන්න පිටකොටුව මැනිං මාකට් එකට යන නිසයි. මැනිං වෙළෙඳපළින් තොගේට මිලට ගන්නා එළවළු පලතුරු වෙනත් කොළඹ හා තදාසන්න ප්‍රදේශවලට ගෙන ගොස් සිල්ලරට කෙරෙන වෙළෙඳාමෙන් තමයි මේ රෝල දිවවෙන්නේ.

මුලින් ම අපි ගියේ කෙසෙල් තොග වෙළෙඳපොළට. එහිදී හමුවූ පිළියන්දල රත්නපාල රංචාගොඩ මහතා (63) මෙසේ පැවසීය. කෝලිකුට්ටු, ඇඹුල් කෙසෙල්, සීනි කෙසෙල්, ඇම්බුන්, ආනමාලු විවිධ ප්‍රදේශවල ඉඳලා අපට එවනවා. අකුරැස්ස, ඇඹිලිපිටිය වගේ ප්‍රදේශවල ඉඳලා මේ දිනවල ටිකක් වෙළෙඳාම අඩුයි. කොරෝනා නිසා හුගාක් පාරිභෝගිකයෝ කොළඹ එන්නෙත් නෑ. කොරෝනාවලට කලින් සාමාන්‍ය වෙළෙඳාමක් තිබුණා. දැන් ටිකක් අඩුයි. ඉස්සර මාතර, අවිස්සාවේල්ල, පුත්තලම වගේ ප්‍රදේශවලින් වෙළෙන්දෝ ආවා. ටිකෙන් ටික සීමාව පටුවෙලා දැන් කොළඹ නගර සභා බල ප්‍රදේශයේ අය පමණයි බඩුගන්නේ. වැස්සක් වැටුණොත්, ඇඳිරි නීතිය ආවොත් කෙසෙල් මිල අඩු වෙනවා. අනිද්දාට වැඩියි. මේ දිනවල තොග මිල ගත්තොත් ඇඹුල් රු. 70, කෝලිකුට්ටු රු. 150, ඇම්බුන් රු. 130, සීනි 50 -70 වගේ වෙනවා සිල්ලර මිල ඇඹුල් රු. 110, කෝලි කුට්ටු රු. 250, ඇම්බුම් රු. 180, සීනි 80 වෙනවා.

සමහර වෙලාවට ඉතුරුවෙලා, නරක්වෙලා අහකදානවා. නැත්නම් කීයට හරි දීලා දානවා. අපි කොමිස් පිටනේ වෙළෙඳාම් කරන්නේ.

කඩවත, ජී.එච්. මහින්ද (55) කෙසෙල් වෙළෙඳාමේ යෙදෙන්නෙක් සෙනඟ ටිකක් අඩුයි. පසුගිය ටිකේ වෙළෙඳපළට ආවේ අඩුවෙන්. දැන් බඩු එනවා. වෙළෙඳාම අඩුයි බඩු ටිකක් මිලයි. ඒ නිසා විකිණෙන්නේ අඩුවෙන්. ඇඹිලිපිටිය, රුවන්වැල්ල, බළන්ගොඩ, මොනරාගල, යාපනය ඇතුළු හැම පළාතකින් ම කෙසෙල් ලැබෙනවා. තොග මිල ගණන් ගතහොත් කෝලිකුට්ටු රු. 200, සීනි කෙසෙල් 80, ඇම්බුන් 130, රත්කෙහෙල් 200, ඇඹුල් 60 වගේ මිලට යන්නේ. අපි ඉදෙන්න එත්‍රල් කියන බෙහෙත ගහනවා. ඒ සම්බන්ධ නම් ගැටලු තිබුණා. ඒත් අනිත් අය ඒක භාවිතා කරනවා. ඒ නිසා අපිත් භාවිතා කරනවා. කෙසෙල්වල සිල්ලර මිල ගණන් ගතහොත් කෝලිකුට්ටු 250, සීනි කෙසෙල් 100, ඇම්බුන් 150, රත්කෙහෙල් 250, ඇඹුල් 90 – 100 විතර වෙනවා.

මැනිං මාකට් එකේ ගස්ලබු වෙළෙඳාම් කරන කමල් රණසිංහ (අවු. 50) සිළුමිණට මෙසේ අදහස් දැක්වීය.

අපේ වෙළෙඳපළේ මිල තීරණය වන්නේ වෙන වෙන හේතු හින්දා නෙමෙයි. ගස්ලබු වැඩි කාලෙට මිල අඩුයි. ගස්ලබු අඩු කාලෙට මිල වැඩියි. අපට ලැබෙන පැපොල් කුරුණෑගල, වවුනියාව සිට අනුරාධපුරය, යාපනය දක්වා වැවෙනවා. දකුණු පළාතේ ගස්ලබු



නසාර් සවුකන් අලි

කොළඹට එනවා අඩුයි. සංචාරක පැත්ත පසුබාලා තියෙන නිසා අලෙවිය අඩුයි. ඒ නිසා මිලත් පහළ යනවා. සංචාරක කර්මාන්තය දියුණු වුණාම ගස්ලබුවලට හොඳ මිලක් ලැබෙනවා. ගිය සතියේ කිලෝවක් 30 – 40 ගියා. අද 50, 60,70. සමහරදාට කුණු වෙනවා. ගස්ලබු වර්ග ටැනින්, රෙඩ් ලේඩි, සන්රයිස්, සිත්තා කියලා වර්ග කීපයක් තියනවා. හෝටල්වලට ගෙනියන්නේ රතුපාට නිසා රෙඩ් ලේඩියි. සිල්ලර වෙළෙඳපළේ හොඳ ඉල්ලුමක් තියෙන්නේ ටැනින් වලට.

රුවන් හේමන්ත (55) අන්නාසි වෙළෙඳාමේ යෙදෙන්නේ අවු. 25 ඉඳලා. ගම්පහ, කිරිඳිවැල, රඳාවාන, ගිරිඋල්ල, කුලියාපිටිය වගේ ප්‍රදේශවලින්



පියසිරි මාරපන

අන්නාසි මිලට ගන්නේ. තොගේට කිලෝව රු. 120 ගන්නේ. සිල්ලර මිල 130, 150, 200. හෝටල් ක්ෂේත්‍රයේ පසුබෑම තමයි අන්නාසි වෙළඳොම අඩුවීමටත් හේතුව. දවස ගානේ අපි පිටකොටුවට එනවා. ඒත් සමහරදාට වෙළෙඳාම හොඳ මදි.

හැට හැවිරිදි චන්දන තල්පාවිල සිල්ලර වෙළෙඳාමේ යෙදෙන්නේ එළවළු, පලාවර්ග, තක්කාලි, පචෝඩි වගේ චයිනීස් අයිටම්, කොරෝනා නිසා 50 ට අඩු වුණා. ඒ මදිවට, චන්දෙත් ආවා. අපේ බිස්නස් වැටුණා. තක්කාලි ඉක්මනට නරක් වෙනවා වතුර වැටුණාම. පචෝඩි ගෙනියන්නේ සුප්වලට.

**පියසිරි මාරපන (60)** මිරිස්, බටු, බෝංචි, කැරට්, පිපිඤ්ඤා, රාබු, දඹල, පතෝල, ගෝවා, අලු කෙසෙල්, දෙහි අලෙවි කරන්නෙක් එම එළවළුවල තොග හා සිල්ලර මිල සඳහන් කළා.

එළවළුවල සිල්ලර මිලයි, තොග මිලයි කියලා ලොකු වෙනසක් නැහැ. අපි අවුරුදු 30 විතර මේ වෙළෙඳාම කරගෙන යන්නේ.

මාතර ප්‍රියන්ත සාගරත් එළවළු වෙළෙඳාම සිදු කරගෙන යන අයෙක්. මෙහෙන් අරගෙන තමයි අපි එළවළු විකුණන්නේ.

ලීක්ස්, බෝංචි වගේ එළවළුත් වැස්ස වැඩි වුණාම ගාන අඩුවෙනවා. බෝංචි තොග මිල රු. 200, සිල්ලරේට විකුණන්නේ රු. 220.

මාලඹේ ඩබ්.එල්. චන්ද්‍රරත්න (55) විකුණන්නේ කැරට්, ලීක්ස්, පමණයි. එක එක දවසට එක එක මිල. ස්ථාවර මිලක් නැහැ. අවුරුදු 30 වෙළෙඳාම් කරලා තිබෙනවා. ගෙවල් දොරවල් හදාගෙන දරුවන්ට උගන්නගෙන ඉන්නවා. මේ දවස්වල එළවළු අලෙවිය අඩුවීමට හේතුව, විදේශ රටවලට එළවළු නොයැවීම හා සංචාරක හෝටල්වලට එළවළු මිලට නොගැනීමයි.



එන්.එස් ප්‍රේමසිරි

දුමින්ද සමන්කුමාර මැනිං මාකට් එකේ තොග වෙළඳාමේ යෙදෙන්නේ. මුරුංගා, බණ්ඩක්කා, බතල, ඇඹරැල්ලා වගේ එළවළුයි. මන්නාරම් කල්පිටි, ලොරිවලින්. මිලට අරගෙන සාමාන්‍ය කොමිස් මුදලක් තියාගෙන විකුණනවා. ලාභයක් ලැබෙනවා. පාඩුවෙන වෙලාවලුත් තියනවා. මන්නාරමේ කල්පිටි මුරුංගා රසයි ඇඹිලිපිටි මුරුංගාවලට වඩා තොග කිලෝව රුපියල් 70 වෙනවා. සිල්ලරේට රුපියල් 80 – 100 විකිණෙනවා.

**ප්‍රියන්ත සාගර මාතර** (52) අලුපුහුල්, වම්බටු, වැටකොළු, කරවිල, බීට්රූට් අලෙවි කරනවා. ඒවායේ තොග මිල ගත්තොත් පතෝල රු. 90, වැටකොලු රු. 70, වම්බටු රු. 70 ක්, කරවිල රු. 140ක්, අලුපුහුල් 30 විතර වෙනවා. සිල්ලර මිල ගත්තාම පතෝල 120, වැටකොලු 100, වම්බටු 100, කරවිල 160, අලුපුහුල් 50 පමණ වෙනවා.

මැනිං මාර්කට් එකේ කෙළවරක ගල් සියඹලා විකුණන එන්.එස්. ප්‍රේමසිරි (57) ළඟ බුලත් - පුවක් හුණු, දුම්කොළ, සාදික්කා, වසාවාසි, කරඳමුංගු, කරාබුනැටි හේමත් මිලදී ගත හැකියි. පහුගිය කාලේ වෙළෙඳාම හොඳටම අඩුවුණා. දැන් ටිකක් වැඩියි. අම්පාරෙන් තමයි ගල්සියඹලා ගේන්නේ කිලෝව රු. 200 ට. ග්‍රෑම් 100 රු. 80 ට විකුණන්නේ කවරවල දාලා.

මැනිං මාර්කට් එක සමීපයේ රඹුටන් යායක් තිබුණා. නසාර් සවුකන් අලිමොහොමඩ් (47) එහි අලෙවිකරු මල්වානෙන් තමයි රඹුටන් ගෙනත් තිබුණේ. "දවසකට ගෙඩි 3000 විතර ගේනවා. ගෙඩි 25 ක් 100 ට දෙන්නේ. රු. 1500 විතර ලාභයක් තියනවා හවස් වෙද්දී ගෙඩි ටික විකුණලා ඉවරවෙනවා. කලින් මම මැංගුස්ටින් විකුණුවා. ඒ ඒ කාලෙට වැඩිපුර තියන දෙයක් අලෙවි කරනවා, උදේ ඉඳලා හවස් වෙනකම් වෙළෙඳාම් කරනවා. කොහොම හරි අපිට ජීවත්වෙන්න වියදමක් හොයාගන්න පුළුවන්.

| | සිල්ලර මිල | තොග මිල |
|---|---|---|
| හීන් මිරිස් | 180 | 150 |
| මාළු මිරිස් | 340 | 300 |
| රාබු | 100 | 80 |
| පිපිඤ්ඤා | 50 | 30 |
| බටු | 100 | 80 |
| දඹල | 130 | 110 |
| පතෝල | 100 | 80 |
| ගෝවා | 110 | 80 |
| තලන බටු | 120 | 100 |
| වැටකොළු | 100 | 80 |
| මාළු කෙසෙල් | 60 | 40 |
| කැරට් | 130 | 100 |

(මේ මිල උච්ඡාවචනය විය හැකිය.)

සේයාරූ - සමන් ශ්‍රී වෙදගේ

පාරාදීසයේ කාන්තාවෝ



22 පිටුව

කඳු දෙකට මැදිවී අයිතිය වෙනුවෙන් කඳුළු සලන මිනිස්සු



24 පිටුව

සතියක් අත නොසේදූ මන්ත්‍රී බිරින්දෑවරු



28 පිටුව

# මැඩගස්කරයේ කොරෝනා පානය අසාර්ථකයි



මැඩගස්කර් ජනාධිපතිවරයා ජනතාවට කොවිඩ් පානය හඳුන්වාදෙමින්

**මැඩගස්කරය යනු අප්‍රිකා මහාද්වීපය අසලම ඉන්දියන් සාගරයේ පිහිටා ඇති සුන්දරත්වයෙන් අනූන දූපතකි. මේ දූපතේ ජනතාව ලොව පුරා කොවිඩ් පැතිර යන විට වයිරසයෙන් බේරීමට අපූරු ක්‍රමයක් යොදා ගත්හ. එය ඖෂධීය පානයකි. මේ පානය මැඩගස්කරයේ ඉතා පොහොසත් වන ගහනයෙන් සොයා ගත් 'ආර්ටිමිසියා' නම් පැළෑටියෙන් සාදන ලද ඖෂධීය පානයකි. මේ පානය මැලේරියාවට ප්‍රත්‍යක්ෂ බෙහෙතක් බවද කියැවේ.**

කෙසේවුවද මේ ඖෂධය ගැන තරයේම විශ්වාසය තැබූ මැඩගස්කර් ජනාධිපතිවරයා එම පානය රටපුරා ජනප්‍රිය කරවීමටත්, බෙදා හැරීමටත් කටයුතු කළේය. මේ පානය පාසල්වලටද බෙදා හැරි අතර දරුවන්ට එම පානය අනිවාර්ය කෙරිණි. මේ පානය තරමක් කටුක රසකින් යුක්ත නිසා එය පානය කිරීමට දරුවන් පෙලඹවීමට ලොලිපොප් ලබා දීම කෙරෙහි එරට අධ්‍යාපන ඇමතිවරිය පසුගිය අප්‍රේල් මාසයේදී අවධානය යොමු කළාය. ඒ වෙනුවෙන් ලොලිපොප් ටොන් ගණනක් විදේශයකින් ඇණවුම් කළ ඇයට ඒ හේතුව නිසාම තම ධූරයද හැර යෑමට සිදුවිය.

කෙසේ වුවද මේ පානය ජනතාව අතර බෙදා හැරීමේ අරමුණ මැඩගස්කර් ජනාධිපතිවරයා අත හැර දැමුවේ නැත. ඒ වෙනුවට ඔහු රට පුරා සංචාරය කරමින් ජනතාවට මේ පානය ලබා දුන් අතර ඇතැම්විට ජනතාවට සහල්, සීනි ආදිය ලබා දෙමින් ඒ සමඟ මේ පානය ලබා දුන් අවස්ථාද දැකගත හැකි විය.

කෙසේ වුවද දැන් වාර්තා වන්නේ මැඩගස්කර් බලධාරීන් කොතෙක් උත්සාහ දැරූවද මේ පානය කොවිඩ්වලට ඖෂධයක් ලෙස සාර්ථක වී නොමැති බවයි. මේ වන විට මැඩගස්කරයෙන් කොවිඩ් රෝගීන් විශාල වශයෙන් වාර්තා වෙමින් තිබේ. සම්පූර්ණයෙන් ආසාදිතයන් 13,000ක් සමඟ මරණ 168ක් මේ වන විට මැඩගස්කරයෙන් වාර්තා වී තිබේ.

මැඩගස්කර් ජනාධිපති ඇන්ඩ්‍රි රජෝලිනා තවදුරටත් මේ පානය කෙරෙහි විශ්වාසය තබමින් සිටියද එරට සෞඛ්‍ය අංශ හැකිතාක් කොවිඩ් රෝගීන්ට මේ පානය ලබා දීමෙන් වැළකී සිටින බවද වාර්තා වේ. රෝහල්වල කොවිඩ් රෝගීන් පිරී යමින් සිටින නමුත් එරට සෞඛ්‍ය අංශ සාමාන්‍ය රෝග ලක්ෂණ සහිත, බෝ නොවන රෝග නොමැති රෝගීන්ට පමණක් එම පානය ලබා දීමට නිර්දේශ කරන බවද වාර්තා වේ.

ලෝක සෞඛ්‍ය සංවිධානය මෙවැනි නිශ්චිත නොවන ඖෂධ භාවිත ප්‍රවේශම් සහගත නොවන බව තරයේ පවසා තිබේ. එහෙත් මැඩගස්කර් පාලකයන් 'කොවිඩ් - ඕර්ගනික්' නමින් ඔවුන්ම හඳුන්වා ඇති මේ පානය ලබා ගැනීමට දිගින් දිගටම එරට ජනතාව දිරි ගන්වමින් සිටින බව වාර්තා වන්නේ විශාල වශයෙන් ආසාදිතයන් සංඛ්‍යාව ඉහළ යමින් තිබියදීමය.

මේ අතර ලෝකයේ ඉතා හොඳින්ම කොවිඩ් පාලනය කළ රට ලෙසින් විරුදාවලි ලබා සිටි නවසීලන්තය වයිරසයට පරාජය වී තිබේ. පසුගියදා නවසීලන්තයේ ඕකලන්ඩ් ප්‍රදේශයෙන් එකම පවුලේ සාමාජිකයන් පිරිසක් වයිරසය ආසාදනයව සිටින බව සොයා ගැනිණි. ඒ සමඟම එරට අගමැතිනිය පවසා සිටියේ තවදුරටත් ආසාදිතයන් හමුවීමේ ඉඩක් පවතින බවයි.

වයිරසය සම්පූර්ණයෙන් පාලනය කර දින සියයකටත් වඩා ආසාදිතයන් වාර්තා නොකරමින් සිටි නවසීලන්තය මේ වන විට කොවිඩ් යනු කිසිසේත් ගැලවිය නොහැකි වයිරසයක් බවට ඉඟි සපයමින් සිටී. ඒ අනුව ඔවුන් තවත් දින කිහිපයකින් පැවැත්වීමට නියමිතව තිබූ එරට මැතිවරණයද කල් දැමීමට සූදානමින් සිටිති.

මේ අතර නවසීලන්තයේ පසුගියදා සොයා ගත් කොවිඩ් පොකුර 'භයානක' බව අමෙරිකානු ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් පවසා සිටි අතර එයට පිළිතුරු ලෙස නවසීලන්ත අගමැතිනිය ජසින්ඩා ආර්ඩන් පවසා ඇත්තේ අමෙරිකාවෙන් වාර්තා වන මිලියන ගණන් ආසාදිතයන් තරම් එම පොකුර භයානක නොවන බවයි.







# සේතු සමුද්‍රම් යළි ඇරඹීමට මෝදිට යෝජනා

## සක්වළගල

● ටිරෝනි වෑවලගේ

**කලාපයේ ප්‍රබලයා වීමට චීනය සමඟ තියුණු සටනක නිරතවී සිටින ඉන්දියාව චීනයට එරෙහි නවතම වෙළෙඳ සටනක් දියත් කිරීමට පැරණි ව්‍යාපෘතියක් යළි කැඳවීමට සූදානම් වෙමින් සිටී. ඒ අන් කිසිවක් නොව ශ්‍රී ලංකාව සහ ඉන්දියාව හරහා වැටී ඇති පෝක් සමුද්‍ර සන්ධිය හරහා ඉදි කිරීමට යෝජිත සේතු සමුද්‍රම් ව්‍යාපෘතියයි.**

පසුගියදා තමිල්නාඩුවේ ද්‍රවිඩ මුන්නේත්‍ර කළහම් පක්ෂයේ වත්මන් නායකයා වන බාලු අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි වෙත ලිපියක් යොමු කරමින් පවසා සිටියේ වහාම සේතු සමුද්‍රම් නෞකා මාර්ගය ඉදි කිරීමට කටයුතු කළ යුතු බව බවයි. ඔහු මේ ව්‍යාපෘතිය ආරම්භ කිරීමට හේතු ලෙස දක්වා තිබුණේ මේ වන විට චීනය ඉන්දියාවට එරෙහිව කටයුතු කිරීමයි. මේ නෞකා මාර්ගය විවර කර ගැනීමෙන් ඉන්දියාවට අති විශාල ආදායමක් උපයා ගත හැකි බව ඩීඑම්කේ පක්ෂයේ නායකයා අග්‍රාමාත්‍යවරයාට පවසා තිබේ. මේ ව්‍යාපෘතිය 2024ට පෙර, එනම් මෝදි අග්‍රාමාත්‍යවරයාගේ දෙවැනි ධූර කාලය අවසන් වීමට පෙර සම්පූර්ණ කළ යුතු බවද ඩීඑම්කේ පක්ෂ නායකයාගේ අදහස වී තිබේ.

ඔහු තවදුරටත් සිය ලිපියෙන් දක්වා ඇත්තේ අග්‍රාමාත්‍ය මෝදි සිය ධූර කාල දෙක සඳහා අවස්ථා දෙකකදී ඉදිරිපත් කළ ප්‍රතිපත්ති ප්‍රකාශවලදී සේතු සමුද්‍රම් ව්‍යාපෘතිය පණගන්වන බව සඳහන් කර ඇති බවයි.

ඩීඑම්කේ නායක බාලුගේ මේ ලිපිය මෝදි අග්‍රාමාත්‍යවරයාට එක්වරම බැහැර කිරීමේ හැකියාවක් නැති වන්නේ තවත් වසරක කාලයක් තුළ තමිල්නාඩුවේ මහමැතිවරණය පැවැත්වීමට නියමිත බැවිනි. එහිදී ප්‍රාන්තයේ බලය ලබා ගැනීමට බාලු වැනි ප්‍රාන්ත දේශපාලන ප්‍රබලයන්ගේ සහය ලබා ගැනීමට අගමැතිවරයාට සිදුවනු නිසැකය. එමෙන්ම චීනය මේ වන විට බූවල්ලකු සේ කලාපය පුරා ස්වකීය අඬුපඬු දිගු කරමින් සිටීම ඉන්දියාවට කිසිසේත් හිතකර වන්නේ නැත. එබැවින් ශ්‍රී ලංකාවේ හම්බන්තොට වරායට වෙනුවෙන් ආයෝජනය කළ චීනයට එකටඑක කිරීමක් ලෙස සේතු සමුද්‍රම් ගොඩනැංවීම කෙරෙහි අග්‍රාමාත්‍යවරයාගේ අවධානය යොමු වනු නිසැකය.

එහෙත් ගැටලුව වන්නේ දශක කිහිපයක් පුරා කිසිදු අග්‍රාමාත්‍යවරයකුට පණ ගැන්විය නොහැකි වූ, බොහෝ දෙනාගේ දෝෂ දර්ශනයට ලක් වූ සේතු සමුද්‍රම් ව්‍යාපෘතියට පණ දීමට මෝදිට හැකියාව ලැබේද යන්නයි.

සේතු සමුද්‍රම් යනු ඉන්දියාව සහ ශ්‍රී ලංකාව වෙන් කරන පටු නොගැඹුරු මුහුදු තීරයට ඉන්දියාව ලබා දී ඇති නමයි. මේ මුහුදු තීරය පාරිසරික සහ ජෛව විවිධත්වය අතින් මුළු ලොවටම ඉතා වැදගත් කලාපයකි. විශේෂයෙන්ම සාගර ජීව විවිධත්වය අතින් මේ ප්‍රදේශය ඉතා පොහොසත් වන අතර මේ කලාපයට ආවේණික මසුන්ද රාශියකි. ශ්‍රී ලංකාවේ වයඹදිග වෙරළාසන්න ප්‍රදේශයේ සිට ගලා යන මන්නාරම් දිය වැල ආශ්‍රිතව නම් කර ඇති මන්නාරම් සාගර ජීව ජාතික උද්‍යානය පිහිටා ඇත්තේද මේ අති සංවේදී සමුද්‍ර කලාපයේය.

සේතු සමුද්‍රම් මුහුදු තීරය නෞකා නාවික මාර්ගයක් බවට පත් කිරීමේ අදහස ඉන්දියාවට පහළ වූයේ මෑතකදී නොවේ. යුරෝපා ජාතිකයන් ලෝකය ගවේශනය කිරීම ඇරඹී ටික කලකින් ඔවුන් ආසියාවට පැමිණි තැන් සිට සේතු සමුද්‍රම් තීරය හරහා නාවික මාර්ගයක් ඇති කිරීමේ වැදගත්කම සාකච්ඡාවට බඳුන් විය.

මෙහිදී බොහෝ දෙනා අදහස් කර සිටියේ සුවස් ඇළ සහ පැනමා ඇළ පරිද්දෙන් යුරෝපයේ සහ අරාබියේ සිට පැමිණෙන නෞකාවලට ශ්‍රී ලංකාව වටා යාත්‍රා කිරීමෙන් තොරව ඉන්දියාව, බංග්ලාදේශය පසුකර නැගෙනහිර සහ ගිනිකොන ආසියාවට ප්‍රවිශ්ඨ වීමේ මාර්ගයක් තනා ගැනීමයි. මේ සම්බන්ධව ආරම්භක යෝජනවාක් ඉදිරිපත් වන්නේ 1861 තරම් ඈත අතීතයේදීය. ඒ ඉන්දියාව යටත් කරගෙන සිටි බ්‍රිතාන්‍ය ජාතිකයන්ගෙනි. ඔවුන්ගේ පෙරදිග ඉන්දියා වෙළෙඳ සමාගමේ නෞකාවලට අඩු කාලයකින් යුරෝපයේ සිට නැගෙනහිර ආසියාවට පිවිසීම සඳහා මේ මාර්ගය සකස් කළ යුතු බවට 1861දී 'ටවුන්ෂෙන්ඩ් යෝජනාව' නම් යෝජනාවක් මගින් ඉදිරිපත් විය. එතැන් සිට නරේන්ද්‍ර මෝදි අග්‍රාමාත්‍යවරයා දක්වා සේතු සමුද්‍රම් නෞකා මාර්ගය ඉදි කිරීම සම්බන්ධව ඉදිරිපත් වී ඇති යෝජනා කොතෙක්දැයි කිව නොහැකිය. 2010 වසරේදී මේ යෝජනාව ඉතා ප්‍රබල ලෙස ඉදිරිපත් වූ අතර එවකට අග්‍රාමාත්‍යවරයා කොංග්‍රස් පක්ෂයේ මන්මෝහන් සිං සේතු සමුද්‍රම් ක්‍රියාවට නැංවීමේ ප්‍රහල අධිශ්ඨානයෙන් ක්‍රියා කළේය. එතැන් සිට ඉන්දියාවේ අගමැති ධූරය සඳහා ජනතාවගෙන් බලය ඉල්ලා සිටි සෑම පුද්ගලයෙක්ම තම ප්‍රතිපත්ති ප්‍රකාශයට සේතු සමුද්‍රම් පණ ගැන්වීමේ යෝජනාව එක් කර සිටි නමුදු එය මේ දක්වා යෝජනාවක් පමණක්ම වී තිබේ.

**2010දී විද්වත් කමිටුව යෝජනාව ප්‍රතික්ෂේප කරලා**

**සංවේදී පරිසර පද්ධතියට අතිශයින් හානිකරයි**

**ටොන් 30,000ට වඩා බරින් යුතු නෞකාවලට ගමන් බෑ**


මෙතරම් වැදගත් යැයි පවසන ව්‍යාපෘතියක් යෝජනාවකට පමණක් සීමා වීමේ හේතුව කුමක්දැයි විමසා සිටින විට පෙනී යන කරුණු කිහිපයකි. ඒ අතරින් පෙරමුණේ පවතින්නේ පාරිසරික සාධකයයි.

2010 වසරේදී අග්‍රාමාත්‍ය මන්මෝහන් සිං විසින් සේතු සමුද්‍රම් නෞකා මාර්ගය ඉඳි කිරීම සඳහා වන පසුබිම පිරික්සා වාර්තාවක් ලබා දීම සඳහා කමිටුවක් පත් කරන ලද අතර එම කමිටු වාර්තාවේ නිර්දේශය වූයේ සේතු සමුද්‍රම් ඉඳි කිරීම ඉන්දියාවට පාරිසරික වශයෙන් මෙන්ම ආර්ථික වශයෙන්ද අහිතකර බවය.

ඉන්දියාව සහ ශ්‍රී ලංකාව යා කරමින් අතීතයේ පැවති ගොඩබිම් තීරුව වෙනුවට මේ වන විට පවතින්නේ වැලි පර තීරයකි. නෞකා මාර්ගය ඉඳි කිරීමට නම් මේ වැලිපර ඉවත් කළ යුතු වේ. එවිට සිදුවන පාරිසරික හානිය ගැන එම කමිටුවේ විශේෂ සැලකිල්ල යොමු වී තිබිණි. එමෙන්ම අති සංවේදී සමුද්‍ර කලාපයක් හරහා නෞකා ගමනාගමනය සිදුවීමෙන් එහි සමුද්‍ර දූෂණය සිදුවීම වැළැක්විය නොහැකි වනු ඇත. අනික් අතට මේ ප්‍රදේශයේ වැලි පර හාරා මාර්ගය සකස් කළද ගමන් කිරීමට හැකියාව ලැබෙනු ඇත්තේ ටොන් 30,000ට අඩු බරින් යුත් නෞකාවලට පමණක් වනු ඇත. ඊට වඩා වැඩි බරින් යුත් නෞකාවලට පුරුදු ලෙස ශ්‍රී ලංකාව වටා යාත්‍රා කිරීමට සිදුවනු ඇත. 2010 වන විටත් ලෝකයේ අලුතින් නිෂ්පාදනය කෙරුණු නවීන නෞකා සියල්ලම පාහේ ටොන් 30,000ට වඩා බරින් වැඩි නෞකා වූ අතර ඇතැම් නෞකා ටොන් 60,000ක් සහ තවත් නෞකා ටොන් 1,20,000 බරින් යුතු නෞකා විය. ඒ අනුව අධික වියදමක් දරා, විශාල පාරිසරික හානියක්ද සිදු කරමින් සේතු සමුද්‍රම් නෞකා මාර්ගය සැකසුවද එමගින් බලාපොරොත්තු වන තරමේ ආදායමක් ලබා ගත නොහැකි වනු ඇතැයි කමිටුව මන්මෝහන් සිං අග්‍රාමාත්‍යවරයාට නිර්දේශ කර සිටියේය. එහෙත් සේතු සමුද්‍රම් ඉඳි කිරීම සම්බන්ධව දැඩි තීරණයක සිටි මන්මෝහන් සිං අග්‍රාමාත්‍යවරයා කමිටු නිර්දේශ ඉවතලමින් නෞකා මාර්ගය සෑදීම ආරම්භ කිරීමට කටයුතු කළේය. එහෙත් ඒ ආරම්භය එහි පළමු පියවරෙන් කිසිදා ඉදිරියට නොගිය අතර, ඉන්පසු බලයට පැමිණි සෑම අග්‍රාමාත්‍යවරයකුම සේතු සමුද්‍රම් අරඹන බව පවසා සිටියහ.

නරේන්ද්‍ර මෝදි අග්‍රාමාත්‍යවරයා අයත් වන්නේද එකී දෙවැනි අග්‍රමාත්‍යවරුන් අතරටය.

දැන් මේ වන විට ඔහුටද සේතු සමුද්‍රම් යළි ඇරඹීමට යෝජනා ඉදිරිපත් වෙමින් තිබේ. එමෙන්ම එය කලින්ම යෝජනාවක් ලෙස ඔහුගේ ප්‍රතිපත්ති ප්‍රකාශයටද ඇතුළත් වී තිබේ. ඒ සමඟම ඔහු ඉදිරියේ පාරිසරික වාර්තා සමඟ අධි සංවේදී පරිසර පද්ධයක් විනාශ කිරීම කෙරෙහි ඉදිරිපත් වූ ප්‍රබල විරෝධතා රැසක්ද තිබේ. ඒ අතරින් ඔහු කුමක් අතට ගනීදැයි බලා සිටීම වටින්නේය.






**"ඉන්දියාව සහ ශ්‍රී ලංකාව යා කරමින් අතීතයේ පැවති ගොඩබිම් තීරුව වෙනුවට මේ වන විට පවතින්නේ වැලි පර තීරයකි. නෞකා මාර්ගය ඉදි කිරීමට නම් මේ වැලිපර ඉවත් කළ යුතු වේ. එවිට සිදුවන පාරිසරික හානිය ගැන එම කමිටුවේ විශේෂ සැලකිල්ල යොමු වී තිබිණි. එමෙන්ම අති සංවේදී සමුද්‍ර කලාපයක් හරහා නෞකා ගමනාගමනය සිදුවීමෙන් එහි සමුද්‍ර දූෂණය සිදුවීම වැළැක්විය නොහැකි වනු ඇත."**

# පෘථිවිය මත වාර්තා වූ වැඩිම උෂ්ණත්වය පසුගිය ඉරිදා ඇමරිකාවේ කැලිෆෝර්නියාවෙන්





මරණයේ නිම්නය

## කෙතරම් උණුසුම් වුවද මේ ප්‍රදේශයේ මිනිසුන් 576 දෙනෙකු වාසය කරයි

සක්වළගල

● ටිරෝනි වැවලගේ

**පෘථිවිය මත දැනට වාර්තා වී ඇති වැඩිම උෂ්ණත්වය පසුගියදා අමෙරිකාවේ කැලිෆෝර්නියාහි මරණයේ නිම්නයෙන් (Death Valley)වාර්තා විය. එය සෙල්සියස් අංශය 54කි. කැලිෆෝනියාවේ මරණයේ නිම්නය යනු උණුසුමට ආගන්තුක තැනක් නොවේ. එහි අවුරුද්දේ මාස දොළහෙන් වැඩි කාලයක් දැඩි උණුසුමෙන් කැකෑරෙමින් පවතින තැනකි. විශේෂයෙන්ම ජූලි සහ අගෝස්තු මාසවලදී මරණයේ නිම්නයේ පවතින්නේ දැරිය නොහැකි අධික උෂ්ණත්වයකි.**

එසේ වීමට බලපාන ප්‍රධාන හේතුව වන්නේ මේ නිම්න භූමියේ පිහිටීමය. එය සම්පූර්ණයෙන් කඳුවලින් වටවී ඇති මුහුදු මට්ටමෙන් අඩි 282ක් පහළින් පිහිටා ඇති භූමියකි. ශුෂ්ක බිමක් වන මෙහි ගස්වැල් කිසිවක් නොමැති අතර පතොක් වර්ගයේ ශාක කිහිපයක් පමණක් තැනින් තැන දක්නට ලැබේ. සෘජුව හිරු එළිය පතිත වීමෙන් කැකෑරෙන උණුසුම වාෂ්ප වීමක් සිදු නොවන අතර එම වායුව භූමියෙන් ඉවතට ගලා නොයන්නේ එහි අවට ඇති කඳුවැටි හේතුවෙනි. එහි අවසාන ප්‍රතිඵලය වන්නේ අධික උණුසුමක් නිරායාසයෙන්ම භූමිය මත පැවතීමය.

කෙතරම් උණුසුම් වුවද මේ වන විට මේ ප්‍රදේශයේ මිනිසුන් 576 දෙනෙකු වාසය කරන බව නවතම තොරතුරුවල සඳහන් වේ. කෙසේ වුවද විද්‍යාඥයන් පවසන්නේ සැබවින්ම මේ මිනිසුන් උණුසුම් අවන්එකක් තුළ ජීවත් වීමට අතිශයින් සමාන කළ හැකි බවයි.

දැනට ලෝකයේ ඕනෑම තැනක වාර්තා වී ඇති වැඩිම උෂ්ණත්වය මෙය බව ප්‍රකාශ වුවද එය නිශ්චිත ලෙස තහවුරු කිරීමට තවත් මාස කිහිපයක් ගතවන බවද පැවසේ.

කෙසේ වුවද මේ වසර පොදුවේ උෂ්ණත්වය වැඩිම වසරක් බවද එය දැනට පෘථිවිය මත වාර්තා වී ඇති උෂ්ණත්වය වැඩිම වසර කිහිපයෙන් එකක් බවද තහවුරු වී තිබේ. පෘථිවිය මත උෂ්ණත්වය දිනෙන් දින වර්ධනය වන බවත්, එයට මිනිස් ක්‍රියාකාරකම් සෘජුවම දායක වන බවත් තහවුරු වූයේ අදින් දශක කිහිපයකට ඉහතදීය. පසුගියදා ලෝක ආර්ථික සමුළුවට අදාළ වෙබ් අඩවියේ සඳහන් වූයේ 2020 මෙතෙක් ලෝක ඉතිහාසයේ වාර්තා වූ වැඩිම උෂ්ණත්වය සහිත වසර ලෙස ඉතිහාසගත වනු ඇති බවය. එහිදී 2020 වසර විසින් පරාජයට පත් කරණු ලබන්නේ 2016 වසරයි. මේ දක්වා දැනට වැඩිම උෂ්ණත්වය වාර්තා වී තිබුණේ 2016 වසරෙනි. දැනට මේ වසර තුළදී යුරෝපය සහ රුසියාවේ සයිබීරියා ප්‍රදේශවලින් සෙල්සියස් අංශක 7 -2 අතර උෂ්ණත්වය වැඩිවීමක් වාර්තා වී තිබේ. 1850 වසරෙන් පසුව පෘථිවිය මත වැඩිම උෂ්ණත්වය පසුගිය ජූනි මාසයේ වාර්තා වූ බවද වෙබ් අඩවියේ සඳහන්ව තිබිණි. පෘථිවියේ වායුසමීකරණය ලෙස ක්‍රියාකරන ධ්‍රැවීය අයිස් තට්ටු දියවීම වඩා වේගවත් වී ඇති අතර විශේෂයෙන්ම ආක්ටික් කලාපයේ අයිස් තට්ටු වේගයෙන් තුනී වෙමින් තිබේ.

ඕස්ට්‍රේලියාවද මේ උෂ්ණත්ව වාර්තා අතරට එක්වී ඇත්තේ දැඩි උණුසුම් වායු ධාරා හේතුවෙන් මාස කිහිපයක් පුරා පැතිරුණු ලැව්ගිනි සමඟිනි.

මේ සාධක මත විද්‍යාඥයන් පෙන්වා දෙන්නේ තවමත් මේ වසරේ ගතවී ඇත්තේ මාස හයක් පමණක් වුවද එය දැනට පෘථිවිය මත වාර්තා වූ වැඩිම උණුසුම් හෝ දෙවැනියට වැඩිම උණුසුම් වසර බවට පත්වීමට වැඩි ඉඩකඩ පවතින බවය.

# පැතුම් පතා විසි කළ කාසිවලින් ඇමරිකා සත්වෝද්‍යානයක් වියදම් පියවයි



**කොවිඩ් හේතුවෙන් මාස ගණනාවකට වසා දැමූ ඇමරිකානු සත්වෝද්‍යානයක් සතුන්ට ආහාර ලබා ගැනීම සහ බිල්පත් ගෙවීම සඳහා අපූරු ක්‍රමයකට මුදල් සෙවීමට පෙළඹී තිබේ. ඒ සත්වෝද්‍යානයේ ඇති අඩි 30කට වඩා උසැති දිය-ඇල්ලට නරඹන්නන් දමා ඇති කාසි එකතු කිරීමෙනි.**

මේ දියඇල්ලට කාසි විසිකිරීමෙන් තම පැතුම් සඵල වන බවට මතයක් සත්වෝද්‍යාන නරඹන්නන් තුළ තිබේ. එබැවින් වසර ගණනාවක් පුරා සත්වෝද්‍යානය නැරඹීමට පැමිණෙන මිනිසුන් එම දිය ඇල්ලට කාසි විසිකරමින් නොයක් ප්‍රාර්ථනාවන් කිරීමට පෙළඹී තිබේ.

මේ වසර ආරම්භයේ සිට කොවිඩ් ව්‍යප්තිය හේතුවෙන් සත්වෝද්‍යානය වසා දැමීමට සිදුවූ අතර එහි ප්‍රධාන ආදායම් මාර්ගය වූ ප්‍රවේශපත්‍ර අලෙවිය සත්වෝද්‍යානයට අහිමි විය. එබැවින් මාස කිහිපයක් පුරා සතුන්ගේ ආහාරපාන සැපයීම සහ සත්වෝද්‍යානයට අදාළ බිල්පත් ගෙවීම වෙනුවෙන් විකල්ප ආදායම් මාර්ග කෙරෙහි යොමු වීමට සත්වෝද්‍යාන බලධාරීන්ට සිදු විය.



ප්‍රථමයෙන්ම ඔවුන් සතුන්ගේ රූපරාමු අන්තර්ජාලය හරහා විකාශය කළ අතර සත්වෝද්‍යානය නැරඹීමට ලබා දෙන කාලය තුළ දක්නට ලැබෙන සතුන්ගේ හැසිරීම් රටාවලට අමතරව නරඹන්නන් නොදකින දුර්ලභ දසුන්ද ඒ අතර විය. එහෙත් ඉන් ලැබෙන ආදායම ප්‍රමාණවත් නොවන බැවින් විකල්ප කෙරෙහි අවධානය යොමු කිරීමට සත්වෝද්‍යාන බලධාරීන්ට සිදුවිය.

දිය ඇල්ලට දමා ඇති කාසි එකතු කිරීමේ අදහස ක්‍රියාවට නැංවෙන්නේ ඒ අනුවය.

සත්වෝද්‍යාන බලධාරීන් ප්‍රථමයෙන්ම දියඇල්ල වසා දැමීමට කටයුතු කළ අතර ඉන්පසු එහි පොකුණද හිස්කොට එහි තිබූ කාසි සියල්ලම මතුපිටට ගැනීමට කටයුතු කළහ. එහි කාසි විශාල ප්‍රමාණයක් තිබුණු අතර පසුව සත්වෝද්‍යාන බලධාරීන් මාධ්‍යයට ප්‍රකාශ කර තිබුණේ එහි කාසි ගැලුම් 100ක් පමණ තිබුණු බවයි. ඔවුන් ප්‍රථමයෙන් එම කාසි පිරිසුදු කර ඇති අතර ඉන්පසු ඒවා ගණන් කිරීමටද කටයුතු කරන බව පවසා තිබේ. ඔවුන් අන්තර්ජාලය හරහා තරගයක්ද සංවිධානය කරමින් පවසා ඇත්තේ එහි ඇති කාසිවල වටිනාකම අනුමාන කරන ලෙසයි. බොහෝ දෙනා ඒ තරගයට බොහෝ කැමැත්තෙන් එක්වෙමින් විවිධ අනුමානද ඉදිරිපත් කර තිබේ.

කෙසේ වුවද මේ කාසි වැය කිරීමෙන් තවදුරටත් කිසිදු ආදායමක් නොලබන සත්වෝද්‍යානයේ වියදම් පියවා ගැනීමට කටයුතු කරන බව සත්වෝද්‍යාන බලධාරීන් පවසා තිබේ. ඒ අනුව නොයෙක් ප්‍රාර්ථනා කරමින් නරඹන්නන් විසින් දිය ඇල්ලට විසි කරන ලද මේ කාසි ඔවුන්ගේ කෙසේ වෙතත් සත්වෝද්‍යාන බලධාරීන්ගේ නම් පැතුම් ඉටු කිරීමට සමත්ව ඇති බව පෙනේ.


මොරිෂස් දූපත් අසල දෙකඩ වූ නෞකාව

# තෙල් නැවේ අනතුරෙන් මොරීෂස් දූපත් අවට පරිසරය විනාශයි

## ඉතිහාසයේ සිදුවූ විශාලතම පරිසර හානිය මෙයයි. මොරීෂස් බලධාරීහු කියති

**පසුගිය ජූලි මස අවසානයේදී මොරීෂස් දූපත් අසල, ඉන්දියන් සාගරයේදී අනතුරට ලක් වූ ජපාන නෞකාව මේ වන විට මහත් පරිසර විනාශයක් සිදුකරමින් තිබේ. ඒ එමගින් ප්‍රවාහනය කරමින් තිබූ ඉන්ධන සාගරය වෙත ගලා ඒමෙනි.**

ජපානයට අයත් එම්වී වකාශියෝ නෞකාව ජූලි මස 25 වැනිදා සවස 4ට පමණ මොරිෂස් දූපත් අසල කොරල්පරයක ගැටුණේ අති විශාල තෙල් තොගයක් ප්‍රවාහනය කරමින් සිටියදීය. කොරල් පරයේ ගැටුණු සැණින් තෙල් මුහුදට ගලා යෑමක් සිදුවූයේ නැත. එබැවින් එය හුදෙක් නෞකා අනතුරක් පමණක් විය. නෞකාවට හානි සිදුවූ බැවින් එය කොරල්පරයෙන් ඉවත් කර ගැනීමට කටයුතු කරමින් සිටියදී පසුගිය අගෝස්තු 6 වැනිදා නෞකාවෙන් තෙල් මුහුදට ගලා යෑම ඇරඹී ඇති බව සොයා ගැනීමට නෞකාවේ කාර්ය මණ්ඩලයට හැකිවිය.

එවිට වහාම ක්‍රියාත්මක වූ ඔවුන් නෞකාවේ පැවති බොරතෙල් සහ ඩීසල් ටොන් ගණනාවක් ඉන් ඉවතට ගැනීමට කටයුතු ආරම්භ කළහ. කනගාටුවට කරුණ වූයේ නෞකාව අනතුරට පත්වූ ස්ථානය ආසන්නයෙන් ඇරඹී මොරිෂස් දූපත් සතු තවත් වටිනාම පාරිසරික සම්පතක් වන බ්ලූ බේ මුහුදු උද්‍යානය විහිදී යන අතර එය සංචාරක කලාපයක් ලෙසින්ද ප්‍රචලිතය. මේ හේතුවෙන් නෞකාවෙන් මුහුදට වැටෙන තෙල් ඉවත් කර ගැනීමට මෙන්ම නෞකාවේ කාර්ය මණ්ඩලයේ ආරක්ෂාව වෙනුවෙන්ද මොරීෂස් දූපත් හි බලධාරීහු ක්‍රියා කළහ. අමතරව ඉන්දියාවද අනතුර වූ ස්ථානයට ටොන් 28ක් පුරා තෙල් තට්ටු ඉවත් කිරීමේ උපකරණ සහ තෙල් සහිත මුහුදු වතුර ගලා ඒම වැළැක්වීමට යොදන බාධක ද එවීමට කටයුතු කළහ.

මෙලෙස අසල්වැසි රටවල සහයෙන් නෞකාවේ තිබූ තෙල් තොගයෙන් මෙට්‍රික් ටොන් 4000ක් පමණ ඉවත් කිරීමට නෞකාවේ කාර්ය මණ්ඩලයට හැකියාව ලැබුණද ඒ වන විටත් තෙල් ටොන් 1000ක් පමණ මුහුදට ගලා ගොස් අවසන් බවද හෙළිවිය. විය යුතු පරිසර හානිය ඒ වන විටත් සිදුවී අවසන්ය. ඉතිහාසයේ විශාලතම පාරිසරික හානියට සහ ආර්ථිකමය අලාභයකට මුහුණ දීමට මොරීෂස් දූපත්වලට සිදුවූයේ එලෙසින්ය.

අධිකව රළු වූ මුහුද නෞකාවෙන් තෙල් ඉවත් කිරීමට දිගින් දිගටම බාධා පැමිණවූ අතර බොහෝ විට අඩි 16ක් උසට විහිදී ගිය රළ පහරවලට හසුවෙමින් කටයුතු කිරීමට කාර්ය මණ්ඩලවලට සිදුවිය.

එසේ වුවද ඒ අතරින් තෙල් ටොන් 841ක් මුහුදු ජලය තුළින් යළි එක්රැස් කර ගැනීමට කාර්ය මණ්ඩලවලට හැකියාව ලැබී තිබිණි. ඔවුන් රැස් කර ගත් ඝණ ද්‍රව්‍ය ප්‍රමාණය ටොන් 400කට අධික විය.

පසුගිය අගෝස්තු 16 වැනිදා සිදුවීම තවතවත් බරපතළ කරමින් නෞකාව දෙකට කැඩී ගියේ තවත් ඝන මීටර් 150ක් නෞකාවේ ඉතිරිව තිබියදීය. නෞකාවේ කාර්ය මණ්ඩලය පවසා ඇත්තේ මේ තෙල් නෞකාවේ එන්ජින් කාමරය ආශ්‍රිතව පවතින බවයි. එමෙන්ම පරිසර හානිය අවම කර ගනු වස් නෞකාවේ කැබලි දෙකෙන් විශාලතම කොටස ටග් යාත්‍රා මගින් ඇදගෙන ගොස් සම්පූර්ණයෙන්ම ගිලී යන ලෙස ගැඹුරු මුහුදට දැමීමට කාර්ය මණ්ඩලය උත්සාහ කළද අයහපත් කාලගුණය හමුවේ එම උත්සාහය ද අසාර්ථක වෙමින් තිබේ.

සිදුවූ මේ තෙල් කාන්දුවෙන් බලවත්ම හානිය මොරීෂස් දූපත්වලට බව පැවසුවද සැබවින්ම එම හානිය මුළු මහත් පෘථිවියටම බව කිව යුතුය. මොරීෂස් බලධාරීන් පෙන්වා දෙන පරිදි අති සංවේදී කොරල්පර ආශ්‍රිත මුහුද තෙල්වලින් වැසී යෑම හේතුවෙන් එම කොරල්පරවලට දීර්ඝකාලීන හානි සිදුවීමට නියමිතය. එමෙන්ම ඔවුන් පවසන්නේ පරිසරයට සිදුවූ මේ හානිය යළි යථාවත් වීමට දශක ගණනාවක් සිදුවනු ඇති බවයි. ඇතැම් විට ඒ හානිය කිසිදා යථාවත් නොවනු ඇති බවද ඔවුන් අනුමාන කරයි.

# ශ්‍රී ලංකාවේ නම බබළවන 'ක්‍රිස්ටල් ස්ටෝන්'



● සුරේකා නිල්මිණී ඉලංගකෝන්

**සංවර්ධිත බොහෝ රටවල් ඒ තත්ත්වයට පත්ව ඇත්තේ එම රටවල ඛනිජ සම්පත්වල අගය වැඩිකිරීම ඉවහල් කරගෙනය. ශ්‍රී ලංකාවට ඛනිජ තෙල් වැනි ඛනිජ සම්පත් නැති වූවද මෙරටට සුවිශේෂී වූ සමහර ඛනිජ සම්පත් බහුල වීමේ වාසනාව හිමිය. ශ්‍රී ලංකාවේ මැණික් ලොව පතළ වීම නිසා එදා හෙළදිව 'රත්නදීපය' විය. ඊට අමතරව වැලි, මිනිරන්, හුණුගල්, තිරිවානා ගල් සහ පිඟන් මැටි ද රටට සම්පතකි.**

ඒ ආශ්‍රිත කර්මාන්ත බිහිකොට නිසි ප්‍රතිඵල ලැබුවේ නම් මේ වන විට ශ්‍රී ලංකාව ද සංවර්ධිත රටක් වීමට බොහෝ අවකාශ තිබිණ. රට සතු හූ සම්පත් නිසි ලෙස ප්‍රයෝජනයට නොගැනීමට මූලික හේතු වන්නේ ඒ සම්බන්ධ නිවැරදි තාක්ෂණ දැනුමක් සහ වෙළෙඳපොළ පිළිබඳ නිසි අවබෝධයක් ලංකාවේ ආයෝජකයන් සතු නොවීමයි. මෙරට ඇති බොහෝ ඛනිජවලින් කිසිදු භාණ්ඩයක් නිෂ්පාදනය නොකර අමුද්‍රව්‍ය ලෙස අපනයනය පමණක් සිදු කරයි. දියුණු තාක්ෂණයක් සතු රටවල් එම ඛනිජ ද්‍රව්‍යවලින් විවිධ භාණ්ඩ නිෂ්පාදනය කර විශාල මුදලක් උපයනවා පමණක් නොව එම නිෂ්පාදන යළි මෙරටට ද අපනයනය කරයි. එවිට ඉතා විශාල මුදලකට ඒවා මිලදී ගන්නට ශ්‍රී ලාංකිකයන්ට සිදු වේ. මෙතෙක් පැවති එම තත්ත්වය වෙනස් කරමින් ශ්‍රී ලංකාවේ ඛනිජ සම්පත්වලට ඉහළ වටිනාකමක් ලබා දීමට දැන් කාලය එළැඹ තිබේ.

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂයන්ගේ සෞභාග්‍යය දැක්මේ එක් පරමාර්ථයක් වන්නේ දේශීය කර්මාන්ත සහ කර්මාන්තකරුවන් ශක්තිමත් කිරීමයි. ඒ අනුව ආනයන අඩුකර අපනයන වැඩි කිරීමට රජය පියවර ගනිමින් තිබේ. පසුගිය මාස කිහිපයේ ඒ වෙනුවෙන් ක්‍රියාමාර්ග කිහිපයක් ගත් අතර කර්මාන්ත අමාත්‍යවරයා විසින් ටයිල් සහ සනීපාරක්ෂක නිෂ්පාදන සහ තවත් බොහෝ දේ ආනයනය තාවකාලිකව අත්හිටුවීමට පියවර ගනු ලැබිණ. දේශීය කර්මාන්ත නැංවීමේ අරමුණින් ගත් එම ක්‍රියාමාර්ගය තුළ ඇතැම් ක්ෂේත්‍රවල එතෙක් පැවති කළු වලා අතර රිදී රේඛා නැගෙමින් තිබෙනු දැකිය හැකිය.

**මේ ආනයන තහනම තව දිගු කරන්න, රජයට ඉල්ලීමක්**

තිරිවානා ආශ්‍රිත කර්මාන්ත ඒ සඳහා උදාහරණයක් ලෙස දැක්විය හැකිය. ලොව ඉතා පිරිසුදු තිරිවානා ශ්‍රී ලංකාව සතුවුවද තිරිවානා ගල් ආශ්‍රිත අවසාන නිෂ්පාදනය සඳහා ලොව විශාල වෙළෙඳපළක් පැවතියද මේ දක්වා ශ්‍රී ලංකාව එම අවස්ථාව ප්‍රයෝජනයට ගැනීමක් සිදු නොවීය. බොහෝ සමාගම් තිරිවානා ගල් කුඩුකර අපනයනය කරද්දී එම තත්ත්වය වෙනස් කර ඊට වැඩි වටිනාකමක් දීමට කටයුතු කර ඇත්තේ එකම ශ්‍රී ලාංකික සමාගමක් පමණි. ඒ හංසගිරි සමූහ ව්‍යාපාර අනුබද්ධ රුහුණු ලංකා මිනරල් සමාගමයි. ඔවුන් තිරිවානා (QUARTZ) ආශ්‍රිත අවසන් නිෂ්පාදනය ලෙස තෝරාගත්තේ ස්ලැබ්ය. තිරිවානා ස්ලැබ් ශ්‍රී ලාංකිකයන්ට තරමක වෙනස් අත්දැකීමක් වුවද ලෝක වෙළෙඳපොළේ ඒ සඳහා විශාල ඉල්ලුමක් පවතී. දිගු කාලයක් පුරා එම ස්ථානය දිනාගෙන තිබුණේ ග්‍රැනයිට් ය. ගෘහ අලංකරණයේදී මුළුතැන්ගෙය, නානකාමර, පොළොව ආදියට සුඛෝපභෝගී තේරීමක් ලෙස තිබූ ග්‍රැනයිට් පරදමින් තිරිවානා එම ස්ථානයට පත්වී තිබේ.

ඊට හේතුව ග්‍රැනයිට් ස්ලැබ්වලට වඩා වඩා තිරුවානා ස්ලැබ් භාවිතය පහසු සහ සෞඛ්‍යාරක්ෂිත වීමය. තිරිවානා ස්ලැබ් බවට පත්කරන්නේ උසස් තාක්ෂණික ක්‍රියාවලියක් යටතේ වන බැවින් එම ස්ලැබ්වල ඉතා සියුම් කුහර හෝ ඇති නොවේ. එම නිසා තිරිවානාවලින් නිෂ්පාදිත ස්ලැබ් තුළ දිය කාන්දු නොවන අතර පැල්ලම් නොරැඳේ. පිරිසුදු කිරීම සහ නඩත්තුව පහසු වන අතර දිගුකල් පැවැත්ම ද සහතික කළ හැකිය. ග්‍රැනයිට් සහ කිරිගරුඬ මත බැක්ටීරියා පහසුවෙන් වර්ධනය වන අතර තිරුවානා ස්ලැබ් තුළ එවැන්නක් සිදු නොවේ. එබැවින් මේ වන විට ජාත්‍යන්තර වශයෙන් ආහාරපාන ක්ෂේත්‍රයේ ග්‍රැනයිට් වෙනුවට භාවිත කරන්නේ තිරුවානාය. තිරිවානා ස්ලැබ් මත සීරීම් ඇතිනොවන බැවින් කාර්යාල කවුන්ටර් සඳහා ද අගනා තේරීමකි. එවැනි වටිනා නිෂ්පාදනයක් වන තිරිවානා ස්ලැබ් 'ක්‍රිස්ටල් ස්ටෝන්' නමින් දැන් දේශීය වෙළෙඳපොළට පැමිණ තිබේ. එම අභියෝගාත්මක කාර්යයේ නියමුවා වන රුහුණු ලංකා මිනරල්හි කළමනාකාර අධ්‍යක්ෂ බුද්ධික කාරියවසම්ගෙන් අප ඒ පිළිබඳ වැඩිදුරටත් විමසුවෙමු.




"වසර 20-25ක දිගු කාලයක් තිස්සේ තිරිවානා කුඩු කර පවුඩර් එකක් විදිහට අපනයනය කිරීම මෙරට විවිධ සමාගම් විසින් සිදුකළා. එවැනි තිරිවානා පවුඩර් කිලෝ එකක මිල රුපියල් 30ක් පමණ වනවා. මෙහෙන් යවන තිරිවානා පවුඩර්වලින් චීනය හෝ වෙනත් රටක් විසින් ස්ලැබ් නිෂ්පාදනය කර ආනයනය කරනවා. එවිට අපි රුපියල් 30ට යැවූ තිරිවානා කුඩු පවුර් එකට රුපියල් 150-160ක් වැනි මුදලක් වනවා. ඔවුන් ඒ ලාභය ලබන්නේ කම්කරු සහ කළමනාකාරීත්වයේ වැටුප් සහ අනෙකුත් අමුද්‍රව්‍යවලට සුළු මුදලක් වැය කරලයි. මේ තත්ත්වය අධ්‍යයනය කරද්දි අපි වටහාගත් දෙයක් තමයි තිරිවානා ස්ලැබ් අපි ලංකාවෙම හදනවා නම් ඒවා ආනයනය කිරීමේදී වැයවන රුපියල් 150ම ඉතිරිකර ගත හැකි බව. ඊට හේතුව අමුද්‍රව්‍ය, මානව ශ්‍රමය සහ තාක්ෂණය යන සියලු දේම සියයට සියයක්ම ශ්‍රී ලාංකිකයි. යන්ත්‍ර සූත්‍ර සහ තිරිවානා කුඩු මිශ්‍ර කිරීමට භාවිත කරන ගම් වර්ග හැරුණු විට යොදාගන්නා අනෙක් සියලුම දේවල් දේශීයයි. එවැනි තත්ත්වයක් තුළ තිරිවානා ස්ලැබ් රට ඇතුළතම නිෂ්පාදන කළ හැකි නම් ආනයනය සඳහා යන මුදල් රටට ඉතිරි වෙනවා. ඒ නිසයි අපි 'ක්‍රිස්ටල් ස්ටෝන්' නිෂ්පාදනය ආරම්භ කළේ."



**තිරිවානා ස්ලැබ් රට ඇතුළතම නිෂ්පාදන කළ හැකි නම් ආනයනය සඳහා යන මුදල් රටට ඉතිරි වෙනවා**




සරලව පැවසුවද එය අභියෝගාත්මක කාර්යයක් වූවාට සැක නැත. ඒ පිළිබඳ බුද්ධික කාරියවසම් මෙසේ කීවේය.

" අපේ සමාගම ව්‍යාපාර කටයුතු ආරම්භ කළේ ඉදිකිරීම් ක්ෂේත්‍රයෙන්. සිමෙන්ති ඇතුළුව ඊට අදාළ බොහෝ දෙවල් අප ආනයනය කළා. නමුත් ආනයනයෙන් ඔබ්බට ගොස් බොහෝ දෙනා පහසුවෙන් ආයෝජනය කරන තේ, ඇඟලුම් අංශ දෙකෙන් මිදී දේශීය අමුද්‍රව්‍යයකට වැඩි අගයක් දෙන නිෂ්පාදනයක් අපනයනය කිරීමට සමාගමක් විදිහට අප තීරණය කළා. එවැනි නිෂ්පාදන ගැන වැඩිදුර අධ්‍යයන රාශියක් කිරීමෙන් පසුව යන්තෝපකරණ මිලදී ගැනීමට චීනයට ගිය අවස්ථාවකදී තමයි ක්‍රිස්ටල් ස්ටෝන් නිෂ්පාදනය පිළිබඳ මූලික අදහස ඇතිවුණේ. ඉන්පසු ඒ පිළිබඳ තාක්ෂණය ඇතුළු සියලු දේ පිළිබඳ නිසි අධ්‍යයනයකින් සහ දැනුවත් වීමකින් පසුව අප ඒ සඳහා යොමුවුණා. නමුත් ව්‍යාපාරය ආරම්භ කරන විට අප අභියෝග රැසකට මුහුණ දුන්නා. චීනයෙන් යන්ත්‍ර ගෙනැවිත් අවුරුදු එකහමාරකට පස්සෙයි ඊට අනුමැතිය ලැබුණේ. ඊට හේතුව ක්‍රිස්ටල් ස්ටෝන් නිෂ්පාදනය ලංකාවට අලුත් නිසා සමහර නිලධාරීන් තීරණ ගැනීමට බය වුණා. ඒ වෙද්දිත් ආනයන සමාගම් 4ක් හිමි අපේ සමාගමට අපනයන ව්‍යාපාරයක් ඇරඹීම එතරම්ම දුෂ්කර වුණා. අලුත් ආයෝජනයක් සඳහා බැංකු ණය ගැනීම ඊටත් වඩා අසීරුයි. මුල් අවස්ථාවේදී අපට කමර්ෂල් බැංකුවෙන් ණය මුදලක් ලබාදුන්නා. දෙවැනි අදියරේදී ලංකා බැංකුව ණය ලබාදුන්නා. චීනය වැනි රටවල් බාල අමුද්‍රව්‍ය යොදාගෙන නිෂ්පාදන පිරිවැය අඩුකර ගත්තත් අපි භාවිත කරන්නේ සියයට 99.99ක්ම පිරිසුදු තිරිවානා, ඉහළම ගුණාත්මක තාක්ෂණය යටතේයි. ඇමෙරිකාවේදී අපේ නිෂ්පාදනවලට විශාල ඉල්ලුමක් පවතින්නේ අපගේ නිෂ්පාදන ගුණාත්මක බවින් ඉහළ නිසයි. දැනට ලංකාවේ එකම ක්‍රිස්ටල් ස්ටෝන් නිෂ්පාදන ආයතනය අප වන නිසා මෙම කර්මාන්තයට අදාළ සියලුම දේ අප විසින්ම කරගත යුතුව තිබෙනවා. මුලින්ම අපේ ඉලක්කය වුණේ ඇමෙරිකාව, ඔස්ට්‍රේලියාව ආදී විදේශීය වෙළෙඳපොළ. ඒ අනුව නිෂ්පාදනවලින් සියයට 50ක් ඉතා පහසුවෙන් අපනයන කිරීමට මුල් අවස්ථාවේදීම අපට හැකිවුණා. ඒ වගේම අපි දේශීය වෙළෙඳපොළ තුළත් ස්ථාවර වෙමින් තිබියදීයි කොවිඩ් 19 වසංගත තත්ත්වය ඇතිවුණේ. නමුත් රජය ටයිල් සහ සනීපාරක්ෂක නිෂ්පාදන ආනයනය තාවකාලිකව අත්හිටුවීමට පියවර ගැනීම නිසා අපට කර්මාන්තශාලාව වසන්නේ නැතිව පවත්වාගෙන යෑමේ හැකියාව ලැබුණා. රජය ඒ තහනම තවදුරටත් දීර්ඝ කරනවා නම් අපිට අපේ නිෂ්පාදන කටයුතු තවත් පුළුල් කිරීමට අවස්ථාව ලැබෙනවා." ඔහු පැවසුවේ කර්මාන්තයක් ලෙස ක්‍රිස්ටල් ස්ටෝන් නිෂ්පාදනය දියුණු විය යුතු බව ද අවධාරණය කරමිනි.

"විදේශ රටවල මෙය කර්මාන්තයක් විදිහට තිබෙන නිසා ස්ථාවර බවක් තිබෙනවා. කර්මාන්තයක් විදිහට අපේ රටෙත් මෙම නිෂ්පාදන පුළුල් වීම තුළ රටේ තවත් මෙවැනි කර්මාන්තශාලා ඇතිවනවා. පුහුණු ශ්‍රමිකයන් බිහිවනවා. ඒ වගේම යන්ත්‍රසූත්‍ර අමතර කොටස් ගෙන්වන්නන් බිහිවනවා. අපේ රටෙත් දැන් දේශීය වෙළෙඳපොළක් සැකසෙමින් තිබෙනවා. උදාහරණයක් විදියට පෝර්ට් සිටි සහ කොළඹ අලුත් අපාර්ට්මන්ට් රාශියක් හැදෙනවා. එවිට තිරිවානා ස්ලැබ් සඳහා විශාල ඉල්ලුමක් ඇතිවෙනවා. නමුත් ඒවා පිටරටින් ගෙන්වුණොත් දේශීය නිෂ්පාදකයාට ඒ අවස්ථාව ලැබෙන්නෙ නැහැ. එම නිසා ටයිල් ආනයනය රජය නතර කළා වගේ තිරිවානා ස්ලැබ් ගෙන්වීමත් නතර කරනවා නම් මේ ක්ෂේත්‍රයේ ආයෝජනය කිරීමට තවත් ව්‍යාපාරිකයන් නිරායාසයෙන්ම පෙලඹෙනවා. සාමාන්‍යයෙන් ක්‍රිස්ටල් ස්ටෝන් නිෂ්පාදනය කරන එක ප්‍රඩක්ෂන් ලයින් එකකට ඩොලර් මිලියන දෙකහමාරක් තුනක් ආයෝජනය කළ යුතුයි. දැනට අපේ කර්මාන්තශාලාව එක ප්‍රඩක්ෂන් ලයින් එකක් පැය 8යි වැඩ කරන්නේ. සේවකයන් 100ක් සේවය කරනවා. නමුත් වෙනත් රටවල් මේ වගේ ප්‍රඩක්ෂන් ලයින් එකක් අඩුමගානේ පැය 20ක් වත් වැඩකරනවා. සේවකයන් 100 දෙනකුගෙන් එක ලයින් එකක් වැඩ කරන අපිට පැය 16ක් වැඩ කරන තරමට දියුණු කරගන්න පුළුවන් නම් සේවකයන් සංඛ්‍යාවත් දෙගුණ කළ හැකියි. ඒ සඳහා අපිට දේශීය වෙළෙඳපොළේ ඇණවුම් වැඩිකර ගත යුතුයි."

දකුණු ලක ඇල්පිටිය රත්තොටුවිල අක්කර 22කින් යුතු සුන්දර භූමි පෙදෙසක පිහිටා තිබෙන ක්‍රිස්ටල් ස්ටෝන් කර්මාන්ත ශාලාව පරිසර හිතකාමී අයුරින් පවත්වාගෙන යන අයුරු දැකගත හැකි විය. විශාල රබර් වත්තක පිහිටි කර්මාන්තශාලවේ ශබ්දය පිටතට නොයන බැවින් ශබ්ද දූෂණයෙන් තොරය. වර්ෂා ජලය කර්මාන්තශාලාවේ කටයුතු සඳහා යොදාගැනෙන අතර එම ජලය ද නැවත නැවත ප්‍රයෝජනයට ගැනීම සිදුකරයි. සේවකයන් සහ කාර්ය මණ්ඩලය ද රත්තොටුවිල ගම්වැසියන් ය. ස්වාභාවික පරිසරයට කිසිදු හානියක් නොකර කර්මාන්තශාලාවේ නිෂ්පාදන කටයුතු පුළුල් කිරීමෙන් ගම්වැසියන්ට මෙන්ම ගමට ද යහපතක් සැලසෙන බව කළමනාකාරීත්වයේ අදහසයි. නිෂ්පාදන ධාරිතාව වැඩිවද්දී ඒ සඳහා තිරිවානා ගල් සපයන සැපයුම්කරුවන් ද වැඩිවන බැවින් ඒ හරහා ද තවත් රැකියා අස්ථාව වැඩිවේ. එමෙන්ම ක්‍රිස්ටල් ස්ටෝන් නිෂ්පාදනයට තිරිවානා කුඩු කිරීමෙන් පසු ඉතිරි වන තිරිවානාවලින් පෙබල්ස් නිෂ්පාදනය කිරීම ස්වයං රැකියාවක් ලෙස ග්‍රාමීය ජනතාවට හඳුන්වාදීමෙන් ගෘහ ආර්ථිකය ද නංවාගත හැකි බව බුද්ධික කාරියවසම් පැවසීය.

**නව නිපැයුමක සිරි අසිරිය**


තිරිවානා පෙබල්ස් මේ වන විට ගෘහ අලංකරණයේදී මෙන්ම අපල උපද්‍රවවලින් ආරක්ෂා වීමට පලඳන ජනප්‍රිය ආභරණයකි. ක්‍රිස්ටල් ස්ටෝන් විශාල නිවාස සහ හෝටල් සංකීර්ණ සඳහා බහුලව යොදාගැනුණද මෙරට සාමාන්‍ය ජනතාව අතර ඒවා භාවිත කළ හැකි ආකාරය පිළිබඳ ඇත්තේ අඩු අවබෝධයකි. ඒ පිළිබඳව අප කාරියවසම්ගෙන් විමසුවෙමු.

"දේශීය පාරිභෝගිකයන් බොහෝ විට පැන්ට්‍රි ටොප් එකට භාවිත කරන්න පුරුදු වෙලා ඉන්නේ ග්‍රැනයිට්. නමුත් අපි මුලින් කී හේතු නිසා දැන් ජාත්‍යන්තර වෙළෙඳපොළේ ග්‍රැනයිට් භාවිත කරන්නේ නැහැ. කවුන්ටර්, බාත්රූම්, කිචන් ටොප් වගේම මේස සඳහාත් ක්‍රිස්ටල් ස්ටෝන් භාවිත කළ හැකියි. ඒ වගේම දේශීය පාරිභෝගිකයන්ට දැරිය හැකි මුදලකට අලෙවි කරන්නත් පුළුවන්. ඒ සඳහා දේශීය වෙළඳපොළ පුළුල් විය යුතුයි වගේම කර්මාන්තයක් විදිහට එය රට තුළ ස්ථාවර විය යුතුයි. එවිට ක්‍රිස්ටල් ස්ටෝන් සඳහා විදෙස් වෙළෙඳපොළ ඉල්ලුම සපුරන්නට ශ්‍රී ලංකාවට අවස්ථාව ලැබෙනවා. එම නිසා අපි රජයෙන් ඉල්ලා සිටින්නේ මේ ආනයන තහනම තව මාස 6ක්වත් දිගු කරන්න. ඉන්පසු ආනයනය කරන ස්ලැබ් සඳහා අමතර බද්දක් පනවන්න. ඒ මගින් දේශීය වෙළෙඳපොළ නිෂ්පාදනය වැඩිවූ විට අපනයන ආදායම වගේම ආනයන වියදමත් අඩුකර ගැනීමෙන් මෙරටට විශාල සේවයක් සැලසීමට දේශීය ආයෝජකයන්ට හැකිවේවි"

දේශීය කර්මාන්ත නඟා සිටුවීමට රජය ගන්නා ක්‍රියාමාර්ග පිළිබඳ බොහෝ දේශීය ව්‍යවසායකයන් බලාපොරොත්තු දල්වා ගත් සිතින් පසුවෙති. ඔවුන්ගේ අපේක්ෂා ඉටු කරමින් සෞභාග්‍යයේ මාවත කරා රට ගෙනයෑම බලධාරීන්ගේ වගකීම බවද අවධාරණය කරමු.











# සමාජ සාධාරණය වෙනුවෙන් පෙනී සිටි සෙන්පතිනිය

# තේජා ගුණවර්ධන

● නීතිඥ කල්‍යාණන්ද තිරාණගම

**මේ රටේ වාමාංශික ව්‍යාපාරය තුළ නොමැකෙන කාර්ය භාරයක් ඉටු කළ, සමාජ සාධාරණය වෙනුවෙන් නැඟී සිටි අභීත සෙන්පතිනියක වු තේජා ගුණවර්ධන වාමාංශික ව්‍යාපාරයේ මුල් කාලයේ දී වාමාංශික ව්‍යාපාරය ගොඩනැඟීම සඳහාත් ආසියා අප්‍රිකා කලාපයේ රටවල් වල අධිරාජ්‍ය විරෝධී යටත් විජිත විරෝධී අරගල වලට සහාය දැක්වීම සඳහාත් ඉටු කළ ඉමහත් කාර්ය භාරය පිළිබඳව වත්මන් පරපුරේ බොහෝ දෙනෙකුට දැනුමක් නැත.**

තේජා ගැන මා පළමු වරට දැනගත්තේ වයස අවුරුදු 14ක සිසුවකු වශයෙන් ගාල්ලේ පාසැලක ඉගෙන ගන්නා කාලයේ දී තේජාට විරුද්ධව පවරා තිබූ ට්‍රයින් නඩුව පිළිබඳව පළ වූ පුවත්පත් වාර්තා කියැවීමෙනි. ට්‍රයින් නමින් සතිපතා පුවත්පතක් පළ කළ තේජා මේ රටේ ප්‍රථම ලාංකික අග්‍රාණ්ඩුකාරවරයා වූ සර් ඔලිවර් ගුණතිලක මහතා එම පත් වීමට මාසයකට පෙර මුදල් ඇමතිව සිටිය දී ණය ගිවිසුමකට එළඹීමේදී කොමිස් මුදලක් ලබා ගැනීමෙන් සිදු කරන ලද දූෂණයක් පිළිබඳ ව ප්‍රවෘත්තියක් පළ කර තිබුණි. එම ලිපිය පළ කිරීම සම්බන්ධයෙන් තේජාට විරුද්ධව ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන් තිදෙනෙකු ගෙන් සමන්විත විනිසුරු මඩුල්ලක් ඉදිරියේ සාපරාධි අපහාසයක් සිදු කිරීම පිළිබඳ නඩුවක් පවරා තිබුණි. ලංකා අධිකරණ ඉතිහාසයේ ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන් තිදෙනකු ගෙන් සමන්විත විනිසුරු මඩුල්ලක් ඉදිරියේ අපරාධ නඩුවක් විභාගයට ගත් ප්‍රථම අවස්ථාව එයයි. එම නඩුවේ තේජා වෙනුවෙන් පෙනී සිටියේ ලෝක ප්‍රකට බ්‍රිතාන්‍ය ජාතික රාජ නීතිඥයකු වූ ඩී. එන්. ප්‍රිට්ය. ප්‍රිට් බ්‍රිතාන්‍ය යටත් විජිතවාදයට එරෙහිව සටන් කළ විවිධ රටවල ජාතික නායකයන්ට විරුද්ධව පවරා තිබූ නඩු ගණනාවක පෙනී සිටි විශිෂ්ට නීතීවේදියෙකි. ඔහු පෙනී සිටි නඩු අතර කෙනියාවේ නිදහස් සටන මෙහෙයවූ ජෝමෝ කෙනියාටා ට සහ පසු කාලයේ සිංගප්පූරුවේ අගමැති වූ ලී කුවන් යූට විරුද්ධව පවරා තිබූ නඩු ද වේ.

පසු කාලයේ රාජ නීතිඥ ප්‍රිට් ලියූ එතුමන්ගේ අපදානයෙහි තේජා පිළිබඳව වෙනම ම පරිච්ඡේදයක් වෙන් කොට ඇත. තේජා ඉතා ඉහළ මට්ටමේ චරිත ශක්තියකින් යුත් විශිෂ්ට නායිකාවක ලෙස එහි විස්තර කොට ඇත. මේ නඩුව පැවරෙන විට තේජා වයස අවුරුදු තිස් පහක තරුණ කාන්තාවකි, තමාට මොන දඬුවමක් ලැබුණත් තමා ලියා ඇති දේ සම්බන්ධයෙන් සමාව ඉල්ලීමක් හෝ කනගාටුව පළ කිරීමක් නොකරන ලෙසත් එහි වචනයක් හෝ කොමාවක් පවා වෙනස් නොකරන ලෙසත් තමා කර ඇති චෝදනා අකුරටම ඔප්පු කරන ලෙසත් ඇය තමාට කියා සිටි බව ප්‍රිට් සඳහන් කරයි.

තේජාට විරුද්ධව පවරා තිබූ නඩුව මේ රටේ වමේ දේශපාලන ඉතිහාසයේ වැදගත් සන්ධිස්ථානයක් විය. ඒ පිළිබඳව රට පුරා ජනතාව මහත් උනන්දුවකින් බලා සිටි අතර එය එදා පැවති ආණ්ඩුවට විරුද්ධව ඉදිරිපත් කරන ලද චෝදනා පත්‍රයක් බවට ද පත් විය. නඩුවේ තීන්දුව ලබා දෙන දවසේ අලුත්කඩේ උසාවි භූමිය පුරා දහස් ගණන් ජනතාව රැස්ව සිටි අතර, ඒ නිසා තීන්දුව දීම විනිසුරු මඩුල්ල තුන් හතර වතාවක් කල් දැමූ බව ද විනිසුරු මඩුල්ලේ ඒකමතික තීරණය මත තේජා නඩුවෙන් නිදහස් කරන ලද අතර නිදහස ලැබූ ඇය දහස් ගණන් ජනතාවගේ කර පිටින් අධිකරණ භූමියේ සිට පෙළපාලියකින් බැහැරට රැගෙන ගිය බවද ප්‍රිට් සඳහන් කර ඇත.

## ලංකා - චීන මිත්‍ර සංගමයේ ආරම්භක සභාපතිනිය ඇයයි

තේජා ධනවත් පවුලකට අයත් කාන්තාවකි. මානගේ පියදාස නම් වූ ඇගේ පියා ලංකා ජාතික සම්මේලනයේත් මහා බෝධි සමාගමේත් බෞද්ධ පරමවිඥානාර්ථ සමාගමේත් සාමාජිකයකු විය. එළිසබෙත් පොන්වීර නම් වූ තේජාගේ මව අධ්‍යාපනඥයකු වූවාය. 1935 දී ලන්ඩන් මැට්රිකියුලේෂන් විභාගයට පෙනී සිටි තේජා ඒ සඳහා පෙනී සිටි විෂයයන් වූයේ ඉංග්‍රීසි භාෂාවල ප්‍රංස භාෂාවල ලතින් භාෂාවල භූගෝල විද්‍යාව හා ගණිතයයි. 1939 දී ඇය ලංකා විශ්වවිද්‍යාල ආයතනයෙන් ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ගෞරව උපාධියක් ලබා ගෙන තිබුණි. භාෂා ගණනාවක් පිළිබඳව හසළ දැනීමක් තිබූ ඇය 1960 දී කියුබානු විප්ලවය පිළිබඳ හැදෑරීම සඳහාම ස්පාඤ්ඤ භාෂාව ද හදාරා තිබුණි.

සරසවි අධ්‍යාපනය නිම කිරීමෙන් පසු සමාජ ක්‍රියාකාරිනියක බවට පත් වූ ඇය 1939 සිට 1945 දක්වා ලංකා මහිලා සමිතියේ ලේකම් වශයෙන් ද 1948 සිට 1958 දක්වා මහිලා සමිතියේ උප සභාපතිනිය හා ප්‍රධාන ජාතික සංවිධායිකාව ලෙස ද කටයුතු කළාය. මහිලා සමිති ව්‍යාපාරයට ඇය කළ මෙහෙවර පිළිගැනීමක් ලෙස ශ්‍රී ලංකාවේ ප්‍රථම අගමැති ඩී. එස්. සේනානායකගේ නිර්දේශය මත 1950 දී ඇමරිකානු රාජ්‍ය දෙපාර්තමේන්තුව මගින් එහි පුද්ගල හුවමාරු වැඩසටහන යටතේ ග්‍රාමීය සුබසාධන, අධ්‍යාපන, සංස්කෘතික සහ සමාජ විද්‍යාත්මක ක්ෂේත්‍රයන්ට අදාළ අධ්‍යයන සංචාරයක් සඳහා ඇය තෝරා ගෙන තිබුණි.

ඇමරිකා අධ්‍යයන සංචාරය නිම කොට පෙරළා පැමිණි වහාම මෙරට ජනතාවගේ ප්‍රගතිය වෙනුවෙන් සැලකිය යුතු කාර්ය භාරයක් ඉටු කිරීමට නම් මේ රටේ ප්‍රගතිශීලි ජනතා ව්‍යාපාරය තුළ ක්‍රියාකාරී කොටසක් රඟ පෑ යුතු බව තේජා අවබෝධ කර ගත්තාය. ශ්‍රී ලංකාවේ ජනතාව සහ සමාජවාදී රටවල් අතර මිත්‍රත්වය ඇති කරලීමත් එවක සමාජවාදී රටවල ජනතාව ලබා තිබූ සුවිශේෂී ජයග්‍රහණයන් පිළිබඳව ලාංකේය ජනතාව දැනුවත් කිරීමත් සඳහා ඇය පුරෝගාමී කාර්ය භාරයක් ඉටු කළාය.

1950 දී ඇති කළ ලංකා - චීන මිත්‍ර සංගමයේ ආරම්භක සභාපතිනිය වූයේ ඇයයි. ලංකාවේ හා චීනයේ ජනතාව අතර මිත්‍රත්වය වර්ධනය කිරීම සඳහා කාලය හා මුදල් වැය කරමින් ඇය 1950 සිට 1959 දක්වා වසර 10ක් ලංකා - චීන මිත්‍ර සංගමයේ සභාපති වශයෙන් ද 1959 සිට 1975 දක්වා තවත් වසර 16ක් උප සභාපති වශයෙන් ද කටයුතු කළාය. 1970 - 1974 දක්වා කාලය තුළ ඇය ලංකා - උතුරු වියට්නාම් මිත්‍ර සංගමයේ ද ලංකා - උතුරු කොරියා මිත්‍ර සංගමයේ ද ලංකා - කාම්බෝජ සංස්කෘතික පර්ෂදයේ ද උප සභාපතිනිය වශයෙන් කටයුතු කළාය.

1952 සිට 1962 දක්වා ඇය ලංකා සාම මණ්ඩලයේ ලේකම් ලෙස කටයුතු කළා ය. 1955 දී ඔස්ට්‍රියාවේ වියනා නුවර ලෝක සාම මණ්ඩලයේ කාර්යාල මණ්ඩලීය සාමාජිකාවක වශයෙන් ඇය තෝරා ගනු ලැබුවාය. ජපානයේ හිරෝෂිමා නාගසාකි පරමාණු බෝම්බ ප්‍රහාර මගින් සිදු කරන ලද මහා මිනිස් ඝාතන වලට එරෙහිව 1958 - 1962 දක්වා කාලය පැවති ජාත්‍යන්තර සම්මේලන 5 කට සහභාගි වූ ලාංකික නියෝජිත පිරිස් වල නායකත්වය දරන ලද්දේ ඇය විසිනි.



ඇය 1956 දී ඊජිප්තුවේ කයිරෝ නුවර පිහිටුවන ලද ආසියා - අප්‍රිකා සහයෝගිතා ලේකම් කාර්යාලයේ ආරම්භක සාමාජිකාවක වූවා ය. 1955 සිට 1958 දක්වා කාලයේ ලංකාවේ ආසියා - අප්‍රිකා සහයෝගිතා සංවිධානයේ සභාපති වූයේ ඇය යි. 1961 දී කයිරෝ නුවර පවත්වන ලද ආසියා - අප්‍රිකා කාන්තා සම්මේලනයට ඇය සහභාගි වූ අතර, 1958 -1964 කාලය තුළ ඊජිප්තුවේ ටැන්සානියාවේ හා සයිප්‍රසයේ පවත්වන ලද ආසියා - අප්‍රිකා සහයෝගිතා සම්මේලන වල දි අධිරාජ්‍යවාදයට හා යටත්විජිතවාදයට එරෙහි ආසියා - අප්‍රිකා සහයෝගිතාව ගොඩනැඟීම සඳහා වැදගත් කාර්ය භාරයක් ඉටු කළාය. කොළඹ දී පවත්වන ලද ආසියා ආර්ථික සමුළුවේ ආරම්භක රැස්වීමේත් 1963 දී කොරියාවේ පියොං යාං නුවර දී පවත්වන ලද දෙවන ආසියා ආර්ථික සමුළුවේත් මුලසුන දරන ලද්දේ ඇයයි. එසේම 1966 දී චීනයේ පීකිං නුවර පවත්වන ලද ආසියා අප්‍රිකා ලේඛක සමුළුවේදීද ඇය ප්‍රමුඛ කාර්ය භාරයක් ඉටු කළාය. ලංකා කොමියුනිස්ට් පක්ෂයේ කාන්තා සංවිධානය වූ ලංකා කාන්තා පෙරමුණේ ද ජීවනාලිය වූයේ ඇයයි.

මට තේජා පළමු වරට මුණ ගැසුණේ පේරාදෙනිය විශ්වවිද්‍යාලයේ පක්ෂ කණ්ඩායම නියෝජනය කරමින් ලංකා කොමියුනිස්ට් පක්ෂයේ සම්මේලනයට සහභාගී වීම සඳහා 1963 දී කොළඹට පැමිණි අවස්ථාවේදීය. ඒ චීන රුසියානු න්‍යායික මතභේද උත්සන්නව පැවති කාලයයි. ශ්‍රී ලංකාවේ වාමාංශික ව්‍යාපාරය තුළ ඇති වූ සෑම බෙදීමකදීම ඇය ප්‍රතිපත්ති මූලික ස්ථාවරයක් දැරුවාය. ඇය සෑම විටම ගත්තේ දුබලයාගේ දිළින්දාගේ සටන්කාමියාගේ නැඟී එන බලවේගයන්ගේ පැත්තය. ලෝක සාමය, අධිරාජ්‍ය විරෝධී අරගල, සමාජවාදි ලෝකයේ ජයග්‍රහණ සහ සමාජවාදි කඳවුර තුළ ඇති වූ න්‍යායික මතභේද ගැන ඇය විසින් ලියන ලද පොත් රාශියක් වේ. ඇය විසින් පළ කර ඇති පොත් අතර න්‍යෂ්ටික යුද්ධ තර්ජනයට එරෙහිවල කියුබානු විප්ලවයේ විජයග්‍රහණය පිළිබඳව, කොන්ගෝවේ ජන නායක පැට්රික් ලුමුම්බා මරා දමමින් කරන ලද අධිරාජ්‍යවාදි කුමන්ත්‍රණය ගැන, ඉන්දු - චීන සබඳතා ගැන, චීනයේ මහජන කොමියුනි ගැන, සෝවියට් දේශය තුළ සංසෝධනවාදය හිස එසවීම ගැන හා චීනයේ සංස්කෘතික විප්ලවය පිළිබඳව ලියන ලද කෘති වේ. මේ සියල්ල ඉංග්‍රීසියෙන් පළ කොට ඇති ගැඹුරු අධ්‍යයනයන් සහිත නිබන්ධයන්ය.

රටේ සාම්ප්‍රදායික නැටුම්කරුවන් ඉදිරියට ගෙන ඒමට මහත් වෙහෙසක් දැරූ ඇය ජාතික කලා පෙරමුණ පිහිටුවීමට මුලපිරුවා ය. අද හේවුඩ් කලායතනය නමින් හැඳින්වෙන පෙරදිග නැටුම් හා සංගීත විද්‍යාලය පිහිටුවීමෙහි ලා මුලිකත්වය ගත් කොමිසන් සභාවේ සමාජිකත්වය දැරූ ඇය මෙරට සංස්කෘතික ජීවිතයේ සංවර්ධනයට වැදගත් මෙහෙවරක් ඉටු කළා ය. 1975 දී සිංහල හා ඉංග්‍රීසි භාෂාවලින් පළ කරන ලද රාවණා වංශයේ නැටුම් කලා පිළිබඳව ලියන ලද කොහොඹ කංකාරිය ඇගේ සංස්කෘතික හා මානව විද්‍යාත්මක ක්ෂෙත්‍රයන්හි 42 වසරක පර්යේෂණයන්හි මුදුන් පෙත්ත සටහන් කරයි. එය විශිෂ්ට කලා කෘතියකි.

## ඇගේ ජිවිත කාලය ඇතුළත ඇය දැරූ එකම තනතුර වුයේ 1974-1977 දක්වා පකිස්ථානයේ හා ඉරානයේ ශ්‍රී ලංකා තානාපතිධුරය පමණකි

තේජා ලංකා ඉතිහාසයේ මුල් කාලය පිළිබඳව විශාල ලෙස පර්යේෂණ කළාය. ඇගේ පර්යේෂණ බොහොමයක් පැවතුණේ අත් පිටපත් ලෙස ය. ඉතිහාසය පිළිබඳව ඇගේ ලිපි සමහරක් සඟරා වලට ලියන ලද ලිපි වශයෙන් ද සම්මන්ත්‍රණ වලදී ඉදිරිපත් කරන ලද පත්‍රිකා වශයෙන් ද එළි දැක ඇත. 1978 දී කෞතුකාගාර මානව විද්‍යා සංගම් රැස්වීමට ඇය ඉදිරිපත් කළ එක් නිබන්ධයක් වූයේ 'ලංකාවේ ප්‍රාග් ඉතිහාස යුගයට උත්සව තුළින් විහිදෙන ආලෝකය' යන්නයි. 1987 දී රාජකීය ආසියාතික සංගමය හමුවේ ඇය කළ දේශනයේ තේමාව වූයේ 'ලංකාවට බුදු දහමේ සම්ප්‍රාප්තිය පිළිබඳ කවුළු දොරක්' යන්නයි. සිය පර්යේෂණයන් හා අධ්‍යයන තුළින් මත ගැටුමට ලක්වන කරුණු ඉදිරිපත් කිරිමට ඇය කිසිවිටෙකත් නොපැකුළුණාය.

තුළනාත්මක සමය සමාන්තරයන් පිළිබඳව ඇය ගැඹුරු අධ්‍යයනයන් කර ඇති ඇය බොහෝ කලක් පරම විඥානාර්ථ සමාගමේ සාමාජිකාවක් ලෙස කටයුතු කළාය.

තේජා සිය ජීවිත කාලය තුළ බලය, ප්‍රසිද්ධිය හෝ තනතුරු නො සෙව්වාය. ඇය එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක සහ සිරිමාවෝ බණ්ඩාරනායක යන අගමැතිවරුන් දෙදෙනාගේ ළඟම මිතුරියක වූවාය. එහෙත් ඇගේ ජීවිත කාලය ඇතුළත ඇය දැරූ එකම තනතුර වූයේ 1974 - 1977 දක්වා පකිස්ථානයේ හා ඉරානයේ ශ්‍රී ලංකා තානාපති ධුරයයි.

ලංකාවේ වාමාංශික කාන්තා ව්‍යාපාරයේ පුරෝගාමී නායිකාවකි; විවිධ විෂයයන් පිළිබඳව පළ කරන ලද පොත් ගණනාවක කතුවරියකි; විශිෂ්ට ගණයේ ඉතිහාසඥවරියකි; තමාගේ ම උසස් තත්ත්වයේ කලා කෘති නිර්මාණය කර ඉදිරිපත් කිරීම පමණක් නොව ජනතාවගේ උන්නතියට හේතුවන උසස් මට්ටමේ කලා කෘතීන් බිහිකිරීමට වෙනත් කලාකරුවන් දැරූ උත්සාහයන්ට ද නොමසුරුව අත හිත දුන් ප්‍රතිභා පූර්ණ කලාකාරිනියකි; පුවත්පත් හා සඟරා ගණනාවක් සංස්කරණය කළ ජනමාධ්‍යවේදිනියකි; විවිධ ආගම් හා දර්ශනවාද පිළිබඳව දැනුමක් හා අවබෝධයක් තිබූ කාන්තාවකි; ඕනෑම මතවාදයක් පිරික්සා බලා විමර්ශනය කිරීමට නොපැකිළුණු අභීත පර්යේෂිකාවකි.

ඉකුත් අඩ සියවස තුළ සිය සමාජ දේශපාලන ක්‍රියාකාරිත්වයෙන් තේජා ගුණවර්ධන ඉටු කළේ යුග මෙහෙවරකි.

---

## කියවන මුද්දර

# ජෝර්ජ් කීට් ආසියාවේ පිකාසෝ

● නිරෝෂන් පීරිස්

**ශ්‍රී ලාංකේය බිතු සිතුවම් කලාව අධ්‍යයනය කිරීමේදී අවබෝධ වන ප්‍රධාන කරුණ වනුයේ හුදී ජනයා තුළ බුද්ධාලම්බන ප්‍රීතිය සහ ධර්ම උපදේශ පිණිසත් ඒවා නිර්මාණය කළ බවකි. එම ස්වභාවය වෙනස් කරමින් විහාර සිතුවම් කලාවේ එතෙක් නොවූ අපූර්ව නිර්මාණ සම්ප්‍රදායක් හඳුන්වා දුන්නේ ජෝර්ජ් කීට්ගේ ගෝතමී විහාර සිතුවම්ය. 'කියවන මුද්දර' මෙවර තේමාව ඇතැම් විචාරකයන් 'ආසියාවේ පිකාසෝ' ලෙසින් හඳුන්වන ඒ අපූර්ව සිත්තම්කරුවා කියැවීමයි.**






















ඇන්ග්ලිකන් ලබ්ධික සුදු ජාතික මධ්‍යම පාන්තික පවුලකට දාව මහනුවර දිස්ත්‍රික්කයේ අම්පිටිය ග්‍රාමයේදී වසර 1901 අප්‍රේල් 17 දා ජෝර්ජ් පරසිවල් ස්ප්‍රවල් කීට් මෙලොව එළිය දුටුවේය. ඔහුගේ පියා රජයේ මිනින්දෝරුකරුවකු වන හෙන්රි කීට්ය. මහනුවර ප්‍රධාන ඉංග්‍රීසි පාසලක් වූ ත්‍රිත්ව විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය ලද කීට්, නිරන්තරව බටහිර සමාජය ඇසුරු කළ ද, ඒ හා සමානව නිරන්තර බොදු ඇසුර ද ප්‍රිය කළේය. ජෝර්ජ් කීට් කුඩා කල සිටම මහනුවර මල්වතු විහාරය ආශ්‍රිතව හැදීවැඩීම ඔහුගේ දිවියේ හැරවුම් ලක්ෂයකට පුරෝගාමී වූයේය.

කුඩා අවදියේ සිටම අධ්‍යාපනය සඳහා එතරම් උනන්දුවක් නොදැක්වූ කීට් ළදරුවා සිතුවම්කරණය සහ කියැවීම සඳහා විශේෂ සඳහා කැමැත්තක් දැක්වීය. සිංහල, පාලි හා සංස්කෘත භාෂා හැදෑරීමට ඔහු මහත් කැමැත්තක් දැක්වීය. පින්නවල ධීරානන්ද හිමියන්ගේ ඇසුරින් සහ බොරැල්ලේ ගෝතමී විහාරාධිපති පොල්වත්තේ මේධාලංකාර හිමියන්ගේ අවවාද අනුශාසනා නිරතුරුවම ලබමින් ඔහු දේශීය සංස්කෘතිය හා දේශීය අනන්‍යතාව පිළිබඳ පුළුල් දැක්මක් ලැබ ගත්තේය.

ඔහු සිය දෙවන විවාහයෙන් අනතුරුව ඉන්දියාවේ පදිංචියට ගිය අතර, එහිදී ඔහු සමීපව ඇසුරු කළ මිතුරන් වූයේ මහා කලාකරුවන් වන රවි ශංකර් හා උදය ශංකර් වැන්නවුන්ය. කලා විචාරකයින් පවසන පරිදි ජෝර්ජ් කීට්ගේ කලාව බිහිවන්නේ මහා භාරතයේ එන මිත්‍යා කතා හා ජනප්‍රවාද, බෞද්ධ ජාතක කතා, දකුණු ඉන්දීය කෝවිල් මූර්ති, අජන්තා සීගිරි තාත්වික චිත්‍ර සහ සොයන්, පිකාසෝ වැනි යුරෝපීය චිත්‍ර ශිල්පීන්ගේ නිර්මාණ ආභාසයෙනි. පසුව ඔහු තමන්ටම ආවේණිකවූ රමණීය චිත්‍ර ශෛලියක් නිර්මාණය කර ගත්තේය.

සැබැවින්ම බටහිරයන්ගේ ගෞරව සම්මානයට පාත්‍ර වූ ජෝර්ජ් කීට්ගේ සැබෑ ස්වරූපය නිර්ව්‍යාජ සිංහල ගැමිකම බව ඔහු ඇසුරු කළ වූවෝ දනිති. සිය දිවියේ පසු කාලීනව මහනුවර සිරිමල් වත්තේ ජීවත් වූ ඔහු නිරතුරුවම ගැමියන් ඇසුරු කළ නිදහස්කාමියකු විය.

ජෝර්ජ් කීට් පිළිබඳ සිංහල ජන සමාජයේ පොත්පත් පුවත්පත්වල සටහන් වූයේ අල්ප වශයෙන් වුවද ඔහු ජාත්‍යයන්තර වශයෙන් රටේ කීර්තිය ඔප් නැංවූ අපගේ සම්පතක් විය. ඉන්දියාව, ලන්ඩනය, යුරෝපය හා ඇමරිකාව වැනි රටවල් ගණනාවක සිතුවම් ප්‍රදර්ශන පවත්වා ඇති ජෝර්ජ් කීට්ගේ සිතුවම්, ලොව පුරා කලාගාරවල, කෞතුකාගාරවල සහ පෞද්ගලික එකතු වශයෙන් ලාංකීය අභිමානය තව දුරටත් ඉහල නංවමින් පවතින්නේය.

ලාංකේය විහාර බිතුසිතුවම් කලාව පිළිබඳව විමර්ශනය කිරීමේදී ජෝර්ජ් කිට් හා බැඳුනු ගෝතමී විහාරයේ සිතුවම් විශේෂ වැදගත්කමකින් යුක්තය. ජනාකීර්ණ බොරැල්ල නගරයට ආසන්නයේ නිහඬ පරිසරයක පිහිටා තිබෙන ගෝතමී විහාරය, දීර්ඝ ඉතිහාසයකට හිමිකම් නොකියන නමුදු විශිෂ්ඨ ඉතිහාසයකට හිමිකම් කියයි. ඉංග්‍රීසි ආධිපත්‍යයෙන් රට මුදවා ගැනීමට වෙහෙසුණු, රාජ්‍ය මන්ත්‍රණ සභාවේ සාමාජික ශ්‍රීමත් ජේම්ස් පීරිස් මැතිඳුන්ගේ මැණියන් වූ අපලොනියා ද සොයිසා පීරිස් මැතිණිය විසින් වර්ෂ 1900 දී මෙම පූජනීය ස්ථානය සඟුනට පුදන දෙන ලදී. ගෝතමී විහාරයේ සිතුවම් නිර්මාණය කිරීම සඳහා ජෝර්ජ් කීට්ට ඇරයුම් කරන ලද්දේ හැරල්ඩ් පීරිස් මහතාය. ඔහු අපලොනියා ද සොයිසා පීරිස් මැතිණියගේ මුනුපුරෙක් වූ අතර, සිය මිත්තනියට පින් පිණිස ගෝතමී විහාරයේ බිතුසිතුවම් නිර්මාණය කල බව සඳහන්ය.

කීට් විසින් ප්‍රථමයෙන් ගෝතමී විහාරයේ සිතුවම් රේඛා චිත්‍ර ලෙස නිර්මාණය කළ නමුදු, තෙල්වත්තේ ශ්‍රී අමරවංශ හිමියන්ගේ ඉල්ලීම පරිදි එම රේඛා සිතුවම් වලට වර්ණ මුසු කළ බව සඳහන්ය. එලෙස වර්ණ ගැන්වුවද විහාරයේ සිතුවම්, රේඛාව මත පදනම් විය. ප්‍රවීණ සිතුවම් නිර්මාණ ශිල්පියකු සහ විචාරකයකු වන ඇල්බට් ධර්මසිරි ගෝතමී විහාරයේ සිතුවම් හඳුන්වනුයේ රේඛා මධුර්යය (linear harmony) වශයෙනි. මේ කටයුත්ත කිසිදු මුදලක් අය නොකර සිදු කිරීමට තරම් කීට් කාරුණික විය.

ගෝතමී විහාරයේ චිත්‍ර නිර්මාණය සඳහා කීට්හට තවත් සුවිශේෂී සිත්තරකු වූ එල්. ටී. පී. මංජු ශ්‍රී ද සහාය වී තිබේ. ජෝර්ජ් කීට් විසින් නිර්මාණය කරන ලද බුදු සිරිතේ එන රාහුල කුමරු දායාද ඉල්ලීම, දම්සක් පැවතුම් සූත්‍රය, සම්බුද්ධ පරිනිර්වාණය යන සිතුවම් වලට පහලින් ඇති නෙලුම් පත් සහ නෙලුම් මල් සහිත ලියවැල් රටා නිර්මාණය කරන ලද්දේ මංජු ශ්‍රී විසිනි.

වසර 1943 වූ කලි ලංකේය කලා ඉතිහාසයේ අද්විතීය කාලයකි. හතලිස් තුනේ කණ්ඩායම (Group 43), වසර 1943 අගෝස්තු මස 29 වැනි දින කොළඹ කුරුඳුවත්තේ ගිල්ඩ්ෆෝඩ් චන්ද්‍රවංකයෙහි වූ ලයනල් වෙන්ට්ඩ් කලා ශිල්පියාගේ නිවහනෙහිදී රැස්ව පිහිටුවා ගත් කලා පවුල එම සුවිශේෂත්වයට මූලික කරුණයි.

වසර 1930 ජනවාරියේදී පැවති ජෝර්ජ් කීට්ගේ චිත්‍ර ප්‍රදර්ශනයක් නැරඹූ එවකට ලංකාවේ චිලී රටේ තානාපතිවරයා ලෙස කටයුතු කළ නොබෙල් සම්මානලාභී කවියකු වන පැබ්ලෝ නෙරූදා විසින් මෙසේ සටහනක් කොට ඇත. "කීට් ශ්‍රේෂ්ඨ සිත්තරකුගේ ජීවමාන හරය යැයි මම සිතමි. ඔහුගේ සියලු නිර්මාණවල, මෙතරම්මැ තරුණ කලාකරුවකුට අතිශයින් අනර්ඝ ගුණාංග වන පරිණත බවෙන් ලබන සංයමය, කාර්ය සාධනයෙහි සිත්ගන්නා සුලු ස්ථාවරත්වය දක්නට ලැබෙයි. අපූර්වාකාරයෙන් වර්ණ භාවිතා කරද්දී වුවද, අවධානයෙන් යුතුව මූර්තිධර පරිමා (plastic volume) විසුරුවද්දී වුවද, විශේෂයෙන්ම සිංහල ජනයා විත්‍රණයේදී කීට්ගේ සිත්තම් නාට්‍යමය පලසක් ජනනය කරයි.

මෙම විශ්ව කීර්තිධර සිත්තරාට පේරාදෙනිය විශ්වවිද්‍යාලයේ අචාර්ය උපාධියත්, කලා කීර්ති ගෞරව නාමයත්, ශ්‍රී ලංකා ජනරජය විසින් ප්‍රදානය කිරීම කලාව වෙනුවෙන් ඔහු කළ අද්විතීය සේවාව ඇගයීමකි.

බොරැල්ල ගෝතමී විහාරයේ සිතුවම් සිංහල ජනතාවට ජෝර්ජ් කීට්ගේ සිත්තම් කුසලතාව හඳුනා ගැනීමට ඇති හොඳම ස්ථානයයි. එම සිතුවම් පදනම් කරගෙන වසර 1983 මැයි 05 වැනිදා වෙසක් උළෙල වෙනුවෙන් නව මුද්දර හතරක් නිකුත් කර තිබේ.

**මහමායා දේවියගේ සිහිනය - වටිනාකම ශත 35**

**සිද්ධාර්ත කුමාර උපත - වටිනාකම ශත 50**


**සසර කලකිරීම - වටිනාකම රු.5.00**

**ගිහි ගෙයින් නික්මීම - වටිනාකම රු.10.00**

එමෙන්ම ජෝර්ජ් කීට්ගේ ජන්ම ශත සංවත්සරය නිමිත්තෙන් වසර 2001 අප්‍රේල් 24 වැනිදා ඔහුගේ සිතුවම් සහිත නව තැපැල් මුද්දරයක් නිකුත් කර ඇත. හංස ජාතකය ලෙසින් නම් කර ඇති එම සිතුවම සහිත මුද්දරයේ වටිනාකම රු.13.50 කි.

වසර 1990 මැයි 22 වැනිදා මංජු ශ්‍රී මහතා නමින්ද සමරු මුද්දරයක් නිකුත් කර ඇති අතර, ශ්‍රීමත් ජේම්ස් පීරිස් වෙනුවෙන්ද සමරු මුද්දරයක් වසර 1981 දෙසැම්බර් 20 වැනි දින නිකුත් කර තිබීම ජෝර්ජ් කීට්ගේ කලාව සහ සෞන්දර්යය රසාස්වාදය මුද්දර මඟින් හඳුන්වා දීමට මහගු උත්තේජනයකි.

කලාවේ නිම් වළලු ප්‍රසාරණය සඳහා විශාල කාර්ය භාරයක් ඉටු කරමින් සිටි ජෝර්ජ් කීට් වසර 1993 ජුලි 31 වැනිදා දැයෙන් සමු ගත්තේ කලා ලෝකයේ ඔහුගේ හිඩැස පිරවීම සඳහා කාලයට අවකාශය ලබා දෙමිනි. අපගේ මෙම උත්සාහය මඟහැරී ගිය එම සංස්කෘතික මෙහෙවර යළි පණ ගැන්වීම වෙනුවෙනි.



# ආදායම් අසමානතාවෙන් හා දරිද්‍රතාවෙන් මිදෙමින් සිටින

# එල් සැල්වර්දෝරය



● අනුර. බී. සෙනෙවිරත්න

**කුඩාතම සහ බෙහෙවින් අධික ජනගහණයකින් යුත් මධ්‍යම ඇමෙරිකානු රටක් වන එල් සැල්වදෝරය ඓතිහාසිකව ද කැපී පෙනෙන සමාජ ආර්ථික අසමානතාවෙන් යුත් රටකි. 19 වන ශතවර්ෂයේ අගභාගය වනවිට එහි ප්‍රධාන මුදල් බෝගය බවට කෝපි පත්ව තිබුණු**

අතර, රටේ ආදායමෙන් 95% ක් පමණ උත්පාදනය වූයේ එමගිනි. එහෙත්, මෙම ආදායම ජනගහනයෙන් 2% කට පමණක් සීමා වූ අතර, ඉන් වැඩි කොටස අයත් වූයේ, සුළුතරය වූ බලසම්පන්න ඉඩම් හිමිකමක් තිබූ ප්‍රභූ පැලැන්තියට ය.

වගා කළ හැකි ඉඩම්වලින් 77% ක් අයත් ව තිබුණේ, ජනගහනයෙන් 01% කට ය. එල් සැල්වදෝරයේ සිවිල් වැසියන්ගෙන් 35% කට ආසන්න ප්‍රමාණයක් යුද්ධය මගින් ඉතාමත් අසාධාරණ ලෙස ඉඩම් හිමිකාරිත්වයෙන් ඉවත් කරනු ලැබී ය. එනිසා, ඉඩම් හිමි පැලැන්තිය හා දුගී දුප්පත් බහුතරය අතර උග්‍ර බෙදීමක් ඇතිව තිබුණු අතර, මෙම බෙදීම නොකඩවා වර්ධනය වෙමින් පැවතිණි.

1929 දී එරට කොටස් වෙළඳපොල කඩාවැටීමෙන් කෝපි මිල පහත වැටීම නිසා එම බෙදීම තව-තවත් උග්‍ර වීය. එහි ප්‍රතිඵලය වූයේ 1932 දී පිහිටුවන ලද 'මධ්‍යම ඇමරිකානු සමාජවාදී පක්ෂය' රජයට එරෙහිව නැගී සිටි ගොවීන්ට හා ආදිවාසීන්ට නායකත්වය ලබාදීමට ඉදිරිපත් වීම ය. 1932 දී එවකට පැවති රජය විසින් 'සැල්වඩෝරන්' ගොවි සංහාරය මඟින් මෙම ජනතා කැරැල්ල කුරිරු ලෙස මර්දනය කරන ලද්දේ ය. එහි ආතතිය විසිවන සියවස පුරා ම වර්ධනය වූ අතර, එය වාමාංශික කණ්ඩායමක් වන 'ෆරාබුන්ඩෝ මාර්ටේ ජාතික විමුක්ති පෙරමුණ' 1970 ගණන්වල දී පිහිටුවීම දක්වා ගමන් කළේ ය.

1969 ජුලි 14 වන දින ඉඩම් ප්‍රතිසංස්කරණ නීති සම්බන්ධයෙන් එල් සැල්වදෝරය සහ හොන්ඩුරාස් රාජ්‍යය අතර සන්නද්ධ ගැටුමක් ඇති වී ය. 'පාපන්දු යුද්ධය' ලෙස හැඳින්වුණු දින හතරක් පැවති මෙම ගැටුම 'සැල්වඩෝරන්' සමාජයට දිගු කාලීන බලපෑම් ඇති කළේ ය. එල් සැල්වදෝරය සහ හොන්ඩුරාස් අතර වෙළඳාම කඩාකප්පල් වීම නිසා දෙරටට ම විශාල ආර්ථික හානි සිදුවී ය. මෙම යුද්ධය හේතුවෙන් සැල්වදෝරන්වරුන් 300,000 ක් අවතැන් වූ අතර, ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් හොන්ඩුරාස්වලින් පිටුවහල් කරනු ලැබූ හ. බොහෝ අවස්ථාවල දී 'සැල්වඩෝරන්' රජයට ඔවුන්ගේ අවශ්‍යතා සපුරාලීමට නොහැකි වීය. යුද්ධයෙන් පසු එල් සැල්වර්දොර් රජය ඊශ්‍රායලය, බ්‍රසීලය, බටහිර ජර්මනිය සහ එක්සත් ජනපදය වැනි රටවලින් ආයුධ මිල දී ගැනීම පුළුල් කළ හෙයින්, එරට හමුදා බලය ශක්තිමත් වූ අතර, දූෂණය ඉහළ නැංවීමට ද එය හේතු පාදක වීය.

1972 පැවති එල් සැල්වදෝර් ජනාධිපතිවරණය ජාතික සම්මුති පක්ෂ අපේක්ෂකයා වූ අර්ටුරෝ ආමන්ඩෝ මොලිනාට අනුග්‍රහය දැක්වූ දැවැන්ත මැතිවරණ වංචාවක් බවට පත්වී ය. එල් සැල්වදෝරයේ කොමියුනිස්ට් පක්ෂයේ ශාඛාවක් ලෙස 1970 දී පිහිටුවන ලද FPL නමැති මාක්ස්-ලෙනින්වාදී විප්ලවීය හමුදාව 1972 දී සැල්වදෝරයේ ගරිල්ලා මෙහෙයුම් ආරම්භ කළේ ය. ඉන් ආශ්වාදය ලබා 'මහජන විප්ලවවාදී හමුදාව' වැනි වෙනත් සංවිධාන ද වර්ධනය වීමට පටන් ගැනිණි.

මෙම වාමාංශික කැරැල්ල වර්ධනය වූයේ, 1973 තෙල් අර්බුදය නිසා ආහාර මිල ඉහළ යාම සහ කෘෂිකාර්මික නිෂ්පාදනය අඩුවීම වැනි දෑ හේතුවෙනි. මෙමගින් රටේ පැවති සමාජ ආර්ථික අසමානතාව වඩාත් නරක අතට හැරීම නිසා සමාජ නොසන්සුන්තා වර්ධනය වී ය. ඊට ප්‍රතිචාර වශයෙන් ජනාධිපති අර්ටුරෝ ආමන්ඩෝ මොලිනා සිදු කළේ ඉඩම් ප්‍රතිසංස්කරණ මාලාවක් ක්‍රියාත්මක කිරීම ය. විශාල ඉඩම් ප්‍රමාණයක් නැවත ගොවි ජනතාව අතර බෙදා හැරිය යුතු යැයි ගොවි ජනතාව ඉල්ලා සිටි අතර, ප්‍රතිසංස්කරණ අසාර්ථක වී ය. මේ නිසා, රජය කෙරෙහි පැවති දැඩි අතෘප්තිය තව තවත් වර්ධනය වී ය.

1977 මැතිවරණය ද, 1972 දී මෙන්, වංචනික එකක් වූ අතර, එය හමුදා අපේක්ෂකයෙකු වූ ජෙනරාල් කාලෝස් හම්බර්ටෝ රොමේරෝට පක්ෂපාතී වී ය. මේ හේතුවෙන් 1977 ජුලි 01 වන දින පැවති මැතිවරණය සහ ජනාධිපති රොමේරෝගේ සමාරම්භක උත්සවය අතර කාලපරිච්ඡේදය 'මහජන ව්‍යාපාරයේ' දැවැන්ත විරෝධතාවලින් පිරී පැවතිණි. ඒ අනුව, 1977 පෙබරවාරි 28 වන දින දේශපාලන උද්ඝෝෂකයන් පිරිසක් මැතිවරණ වංචාවට විරෝධය දැක්වීම සඳහා එරට අගනුවර වන සැන් සැල්වදෝරයට එක්රැස් වූ හ. එම ස්ථානයට පැමිණි ආරක්ෂක අංශ එම පිරිසට වෙඩි තබන ලද අතර, එහි ප්‍රතිඵලය ලෙස සිවිල් වැසියන් 1,500ක් පමණ ඝාතනයට ලක් වී ය.

ජනාධිපති රොමේරෝගේ පදවි ප්‍රාප්තියෙන් පසුව ද, මෙම මර්දනය දිගින්-දිගට ම පැවතිණි. ඒ අනුව, වාමාංශික යැයි සැක කෙරෙන වෘත්තීය සමිති නායකයින්, වෘත්තීය සමිති ක්‍රියාකාරීන්, සිසුන් සහ ගුරුවරුන් දහස් ගණනක් ඝාතනයට ලක්වී ය. එල් සැල්වදෝරයේ එවකට පැවති ප්‍රමුඛ පෙළේ මානව හිමිකම් කණ්ඩායමක වාර්තාවලට අනුව 1978 දී රජයේ හමුදා විසින් සිවිල් වැසියන් 687 දෙනෙකු ඝාතනය කර තිබේ. 1979 දී එම සංඛ්‍යාව 1,796 දක්වා ඉහළ ගොස් ඇත. මෙම මර්දනකාරී තත්ත්වය නිසා කතෝලික පල්ලියේ බොහෝ දෙනෙක් ආණ්ඩුව හෙළා දකින්නට පටන්ගත් අතර, ආණ්ඩුව ඊට ප්‍රතිචාර දැක්වූයේ, පූජකයන් ද මර්දනයට ලක්කිරීමෙනි.

එල් සැල්වදෝරයේ 1979 සිවිල් යුද්ධය ආරම්භ වන්නේ මෙවන් තත්ත්වයක් යටතේ ය. මිලිටරි ජුන්ටාව තම රජයේ අක්‍රමිකතාවලට එරෙහිව විරෝධතා දැක්වූ පුද්ගලයන් ඝාතනයට ලක්කිරීමට පටන්ගැනීම හේතුවෙන් 1979 ඔක්තෝබර් 15 වන දින මෙම යුද්ධය ආරම්භ වී ය. එල් සැල්වදෝරයේ මිලිටරි ජුන්ටාවට එරෙහිව මෙම සටනට නායකත්වය දුන්නේ වාමාංශික කණ්ඩායම්වල සන්ධානයක් වූ 'ෆරාබුන්ඩෝ මාර්ටේ' ජාතික විමුක්ති පෙරමුණ යි.

වසර 12 කට වැඩි කාලයක් පැවති මෙම සිවිල් යුද්ධයේ දී එක්සත් ජනපදයේ පුහුණුව ලත් රජයේ ඝාතන කණ්ඩායම් විසින් කතෝලික පල්ලියේ ප්‍රධාන පූජකවරුන් ඇතුළු සිවිල් වැසියන් බිය වැද්දීම, ළමා සොල්දාදුවන් බඳවා ගැනීම සහ වෙනත් මානව හිමිකම් උල්ලංඝණ රැසක් සිදු කරනු ලැබ තිබේ. 1979 සිට 1992 දක්වා කාලය තුළ පැවති එම යුද්ධයෙන් 75,000 කට වැඩි පිරිසක් මිය ගිය බව එක්සත් ජාතීන්ගේ සංවිධානය වාර්තා කරන ලද අතර, තවත් විශාල පිරිසක් අතුරුදන්ව තිබේ.

ඇමෙරිකා එක්සත් ජනපදයේ ජිමී කාටර් සහ රොනල්ඩ් රේගන් පරිපාලනය එල් සැල්වදෝර් රජයට දිනකට ඩොලර් මිලියනයක දෙකක පමණ මිලිටරි ආධාර ලබා දීමෙන් මෙම ගැටුමට දායක වී ඇති අතර, සැල්වදෝර් රජයේ හමුදාවන්ට සැලකිය යුතු යුද පුහුණුවක් ද ලබා දුන්නේ ය. එපමණක් නොව, 1983 මැයි මාසය වන විට එක්සත් ජනපද නිලධාරීන් රැසක් ද සැල්වඩෝරන් හමුදාවේ ඉහළ තනතුරු දරමින්, තීරණාත්මක තීරණ ගනිමින් යුද්ධය මෙහෙයවමින් සිටිය හ.

එක්සත් ජාතීන්ගේ තක්සේරුවට අනුව, මෙම සිවිල් යුද්ධයේ දී සිදු වූ සිවිල් වැසියන්ගේ ඝාතනවලින් 5% කට FMLN ගරිල්ලන් වගකිව යුතු අතර, අනෙකුත් ඝාතනවලින් 85% ක් ම සිදුකරනු ලැබ ඇත්තේ සැල්වදෝර් සන්නද්ධ හමුදා සහ විවිධ ඝාතන කල්ලි විසිනි. FMLN ජාතික විමුක්ති පෙරමුණ හිංසනය භාවිත කළ ආකාරය පිළිබඳ ප්‍රමාණවත් අධ්‍යයනයක් සිදුකර නොමැති වුව ද, 1980 දශකය තුළ ඔවුන් නගරාධිපතිවරුන්, තොරතුරු සපයන්නන් සහ ඔවුනට ද්‍රෝහී වූවන් කිහිපදෙනෙකු ඝාතනය කර තිබේ.

1992 ජනවාරි 16 වන දින මෙක්සිකෝවේ දී අත්සන් කරන ලද 'චැපල්ටෙපෙක්' ගිවිසුමත් සමඟ මෙම යුද්ධය අවසන් වී ය. එහෙත්, 2016 දී එල් සැල්වදෝර් ශ්‍රේෂ්ඨාධිකරණය තීන්දු කළේ 1993 පොදු සමාව පිළිබඳ නීතිය ව්‍යවස්ථා විරෝධී බවත්, එල් සැල්වදෝර රජයට යුද අපරාධකරුවන්ට එරෙහිව නඩු පැවරිය හැකි බවත් ය.

එල් සැල්වර්දෝර ඉතිහාසයේ 1972 දක්වා වූ කාලය තුළ පමණක් ජනාධිපතිවරුන් 37 දෙනෙකු එරට පාලන කර ඇත. 1979 සිවිල් යුද්ධයේ සිට මේ දක්වා තවත් ජනාධිපතිවරුන් 09 දෙනෙකු එල් සැල්වදෝරය පාලනය කර ඇති අතර, එහි 21

page

වත්මන් ජනාධිපතිවරයා වන්නේ 2019 ජූනි 01 වැනි දින බලයට පත් නයිබ් බුකලේ ය.

මධ්‍යම ඇමරිකාවේ කුඩාම රට වන එල් සැල්වදෝරය භූමිකම්පා සහ ගිනිකඳු පිපිරීම් ඇතුළු ස්වාභාවික උපද්‍රව වලට ඉතා ඉහළ නිරාවරණයක් හා අවදානමක් ඇති රටකි. ගංවතුර, නියඟ සහ නිවර්තන කුණාටු වැඩිවීම ඇතුළුව දේශගුණික විපර්යාස බලපෑම් වලට ද එල් සැල්වදෝරය බෙහෙවින් ගොදුරු වේ. එහි ජනගහනය මිලියන 6.4 ක් පමණ වන අතර, තවත් මිලියන 1.5 ක පමණ පිරිසක් විදේශගතව ජීවත් වෙති. එල් සැල්වදෝරයේ දළ දේශීය නිෂ්පාදිතය 2019 දී සියයට 2.3 දක්වා ළඟා වූ නමුත්, තවමත් රට අඛණ්ඩව අඩු වර්ධන වේගයකින් පීඩා විඳී. වාර්ෂික දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය 2000 සිට දෙවරක් පමණක් 3% ඉක්මවා ගිය අතර, මෑත වසරවල දී එය 2.3% දක්වා පහළ බැස තිබේ.


කෝවිඩ්-19 වයිරසයේ බලපෑම හේතුවෙන් රටේ ආර්ථිකය 2020 දී සියයට -4.3% ක ඍණ අගයක් ගත් අතර, 2021 දී එය 4.8% ක වර්ධනයක් අපේක්ෂා කරයි. එල් සැල්වදෝරයේ රාජ්‍ය ණය මට්ටම 2018 දී දළ දේශීය නිෂ්පාදිතයෙන් 70.7%ක ඉහළ අගයක් ගත්තේ ය. 2017 විශ්‍රාම වැටුප් ප්‍රතිසංස්කරණ නිසා රාජ්‍ය අංශයේ මූල්‍ය අවශ්‍යතා අඩු වූ අතර, එහි ප්‍රතිඵලය ලෙස ඉදිරි වර්ෂවල දී රාජ්‍ය මූල්‍ය හිඟය දළ දේශීය නිෂ්පාදිතයෙන් 2.5% කින් පමණ ස්ථාවර වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ලෝක බැංකුවේ නිල දත්ත සහ වෙළඳ ආර්ථික විද්‍යාවේ ප්‍රක්ෂේපනවලට අනුව එල් සැල්වදෝරයේ දළ දේශීය නිෂ්පාදිතය 2019 දී ඇමෙරිකානු ඩොලර් බිලියන 27.02 ක් බවට පත්ව තිබේ. එම වටිනාකම ලෝක ආර්ථිකයෙන් 0.02% කි. එරට වාර්ෂික ඒක පුද්ගල ආදායම මේ වනවිට ඇමෙරිකානු ඩොලර් 8,775.99 කි.

එල් සැල්වදොර් රජය ගෝලීය සැපයුම් දාමයන්ට එරට කර්මාන්ත සම්බන්ධ කරමින් දේශීය මූල්‍ය ස්ථාවරත්වයට කැප වූ ආර්ථික ප්‍රතිපත්තියක් අනුගමනය කරමින් සිටී. ඒ නිසාත්, මීට වසර කිහිපයකට පෙර එක්සත් ජනපදය සමඟ ඇතිකර ගත් 'මධ්‍යම ඇමෙරිකා නිදහස් වෙළඳ ගිවිසුම' නිසාත් එරට දරිද්‍රතාවයේ කැපී පෙනෙන අඩුවීමක් සිදුව තිබේ. ඒ අනුව, 2015 වසරේ එරට දරිද්‍රතා අනුපාතය 31.80%ක් වූ අතර, එය 2014ට වඩා 3.1% ක අඩුවීමක් පෙන්නුම් කළේය 2016 දී එම අනුපාතය 2015 ට වඩා 1.1% කින් ද, 2017 දී එම අනුපාතය 2016 ට වඩා 1.8% කින් ද, 2018 දී එම අනුපාතය 2017 ට වඩා 3.2% කින් ද අඩු වී තිබේ.

දේශපාලන වර්ධනයන් සම්බන්ධයෙන් ගත් කල ද, රට සැලකිය යුතු ප්‍රගතියක් ලබාගෙන ඇත. 1992 සිවිල් යුද්ධය අවසන් වීමෙන් පසු ප්‍රජාතන්ත්‍රවාදය සහ සාමය තහවුරු වී ඇති අතර, සාමකාමී ලෙස බලය හුවමාරුවීමත් සමඟ අඛණ්ඩව ප්‍රජාතන්ත්‍රවාදී ජනාධිපතිවරණ හයක් පවත්වා තිබේ. එපමණක් නොව, එල් සැල්වදෝරය රාජ්‍ය සේවය පුළුල් කිරීමට ක්‍රියාකිරීම තුළින් මානව සංවර්ධන ප්‍රතිඵල ඉදිරියට ගෙන යාමේ ප්‍රගතියක් ලබා ඇත. සෞඛ්‍ය පහසුකම් වර්ධනය වීම, අධ්‍යාපන පහසුකම් ඉහළ නැංවීම, නාගරික ප්‍රදේශ ලබා ඇති කැපී පෙනෙන දියුණුව, සාක්ෂරතා අනුපාතය ඉහළ යෑම මේ සඳහා නිදසුන් වශයෙන් දැක්විය හැකි ය.


සමානාත්මතාවෙන් ඉහළ රටක් බවට ද එල් සැල්වදෝරය පත්වෙමින් තිබේ. එරට ආදායම් බෙදීයෑමේ අසමානතාව පිළිබඳ දත්ත ඉදිරිපත්වන්නේ ගිනි සංගුණකය මත පදනම්ව ය. 2012 වන විට 48.3ක් වූ එල් සැල්වදෝරයේ ගිනි සංගුණකය 2017 වන විට 40 දක්වා 8.3 කින් අඩු වී ඇත. එහෙත්, අපරාධ සහ ප්‍රචණ්ඩත්වය එල් සැල්වදෝරයේ සමාජ සංවර්ධනයට හා ආර්ථික වර්ධනයට තර්ජනයක් වී ඇති අතර, එහි පුරවැසියන්ගේ ජීවන තත්ත්වයට ද, ව්‍යාපාර සහ ආයෝජනවලට ද එය අහිතකර ලෙස බලපා තිබේ. මෙම තත්ත්වය තවදුරටත් වර්ධනය කරගැනීමට නම් බුකෙල් රජය අතීතයේ පැවති සාර්ථක ආර්ථික උපාය මාර්ගවලට ආපසු යා යුතුව ඇති බව දේශපාලන විශ්ලේෂකයෝ පෙන්නා දෙති.



අර්ටුරෝ ආමන්ඩෝ මොලිනා



කාලෝස් හම්බර්ටෝ රොමෙරෝ



බයිබ් බුකලේ



ජිමී කාටර්



රොනල්ඩ් රේගන්

**කෝවිඩ්-19 වයිරසයේ බලපෑම හේතුවෙන් රටේ ආර්ථිකය 2020 දී සියයට -4.3% ක ඍණ අගයක් ගත් අතර, 2021 දී එය 4.8% ක වර්ධනයක් අපේක්ෂා කරයි. එල් සැල්වදෝරයේ රාජ්‍ය ණය මට්ටම 2018 දී දළ දේශීය නිෂ්පාදිතයෙන් 70.7%ක ඉහළ අගයක් ගත්තේ ය.**

---

# මිතුරු පවුර



● කමල් පෙරේරා

## මිතුරු තේ කහට විනිවිදන පවුර මානව සුගන්ධය

තේ නම් වදන ලාංකික ජනජීවිතය වගේම ආර්ථිකය සමුගත් තදින් බැඳී පවතින්නකි. සුදු අධිරාජ්‍යවාදින් විසින් මෙම අගනා ආර්ථික බෝගය අප රටට හඳුන්වා දෙනු ලැබූ බව අපි දනිමු. සුවඳ හමන තේ දල්ලත් සමඟ ලාංකික ඉතිහාසයේ නව පිටුවක් පෙරළුණ බවද අපි දනිමු. උඩරට වතුකරයේ සේවය පිණිස පැමිණි දහස් ගණනක ඉන්දියානු ශ්‍රමිකයන්ගේ ප්‍රශ්නය අදත් ලංකාවේ සමාජ දේශපාලන මෙන්ම ආර්ථික ගැටලු සමඟ දැඩි ලෙස වෙළී පවතින බව රහසක් නොවේ.

මෙවර මිතුරු පවුර තේ කහට වෙනුවෙන් වෙන් කිරීමට සිතුවේ එම වදන හා බැඳුණු සමාජ ක්‍රියාකාරකමක් ඉදිරි දිනවල වතුකරය ආශ්‍රිත ප්‍රධාන නගර කිහිපයක පැවැත්වෙන බව දැනගන්නට ලැබීම හේතුවෙනි. ඒ සමාජ කාර්යය වූ කලී තරුණ තරුණියන් 40කගේ නිර්මාණ ඇසුරෙන් පැවැත්වීමට කටයුතු යොදා ඇති කඳුකර දෙමළ ජනයාගේ ජන ජීවිතය පිළිබිඹු කරන ඡායාරූප ප්‍රදර්ශන මාලාවයි. අගෝස්තු 23 ඉරිදා තලවාකැලෙන් ඇරඹෙන මේ ප්‍රදර්ශනය අගෝස්තු 29 ඌවේ හයිලන්ඩ් වතු යායේදී හා සැප්තැම්බර් 04/05 දෙදින තුළ බදුල්ල නගරයේත් පැවැත්වීමට නියමිතය.

අධිරාජ්‍යවාදීන් සිය ලාබ ප්‍රයෝජනය තකා ඇති කළ මෙම ගැටලුවේ නෂ්ඨාවශේෂ අදටත් ඉතිරිව තිබුණත් මේ වන විට වතුකරයේ ජනතාව අපේ ජීවිත හා අනවරතයෙන්ම බැඳුණු සාමාජික පර්ෂදයක් බව කැමැත්තෙන් හෝ අකමැත්තනේ හෝ අපට පිළිගැනීමට සිදුව තිබේ. මේ ජනකොටස සමඟ සමාජීය හා සංස්කෘතික බන්ධනයන් ඇති කර ගැනීමටත් ඔවුන් වූ කලී අපේ ආර්ථිකයේ රුධිර නාලිකා වලට ජීවය සපයන ප්‍රධාන සංරචකයක් ලෙස තේරුම් ගැනීමටත් අපි ක්‍රමක්‍රමයෙන් හුරුවෙමින් සිටිමු.

හින්දු දහමේ බලපෑමෙන් හැඩගැසුණු මේ ජනකොටසේ ඇවතුම් පැවතුම් බහුතරයක් වූ සිංහල බෞද්ධයන්ගේ පිළිවෙත් වලට වඩා වෙනස් වුවත් සංස්කෘතික වශයෙන් සිංහල ප්‍රජාවට සමීප වීමේ වැඩි අවකාශයක් සහිත ජන කණ්ඩායමක් හැටියට හඳුනා ගැනීම අපහසු නොවේ. මීට වසරකට පමණ පෙර අපෙන් සමුගත් දෙමළ බස හා වතුකර ජනතාව පිළිබඳ මනා අවබෝධයක් තිබූ උපාලි ලීලාරත්න නම් ප්‍රවීණ ලේඛකයා ලියූ හින්දු සිරිත් විරිත් හා දෙවිවරු නම් ග්‍රන්ථයේ මේ සමීපකම අපූරුවට විස්තර කරයි.

එපමණක් නොව වතු ආර්ථිකය විසින්ම බිහි කරන ලද ක්‍රිස්ටීන් විල්සන් ලේඛිකාව ලියූ තිත්ත කෝපි නවකතාවේ සිට මෑතකදී සුන්දරම් සෞම්‍යන් පරිවර්තනය කළ හරිත මිරිගුව හා බන්දුල ජයරත්න ලියූ සෙක්කුවෙ බැඳි මිනිස්සු වැනි නවකතා දක්වා සාහිත්‍ය නිර්මාණ මාලාවක අපේ අසල්වැසි සහෝදර ජනතාව වන වතුකර ප්‍රජාව පිළිබඳව ඉතා ගැඹුරින් සාකච්ඡා කරයි. මීට අමතරව වතුකරයෙන්ම බිහිවූ විශිෂ්ට ලේඛකයන් රැසක්ම අපට සිටින බවද අමතක නොකළ යුතුය. තෙලිවත්තෙ ජෝසප්, ඇන්ටනි ජීවා, මු. සිවලිංගම්, මාතලේ මලරන්බන් හා මෑතකදී මිතුරු පවුරෙන් හඳුන්වා දුන් ආර්. ශඩගෝපන් මේ ලේඛකයන් අතරින් කැපී පෙනෙන කිහිප දෙනෙකි.



ලේඛකයන්ට සාපේක්ෂව සෙසු කලා මාධ්‍යයන් හසුරුවන කලාකරුවන් විසින් දිගු ඉතිහාසයක් පුරා අපත් සමඟ දුක සැප බෙදා හදාගෙන දිවි ගෙවන මෙම සහෝදර ජන පර්ෂදය පිළිබඳව නිසි අවධානයක් යොමු කරනු ලබුවේද යන පැනයද මෙවැනි අවස්ථාවක මතු කිරීම කාලෝචිත යයි සිතමි. විශේෂයෙන්ම සිනමාව හා සංගීතය වැනි වඩාත් ප්‍රබල මාධ්‍ය වලට වතුකරය තේමා වී ඇත්තේ ඉතා මඳ වශයෙන් බව කනගාටුවෙන් වුව පැවසිය යුතුය.

රූප මාධ්‍යය හා බැඳුණු තරුණ පිරිසක් වතුකරය වෙත සිය කැමරා කාච යොමු කිරීම පැසසිය යුතු කාර්යයක් වන්නේ මේ පසුබිම මතය. කඳුකර දෙමළ ප්‍රජාව, කඳුකර තරුණ ප්‍රජාව, ඌව ශක්ති ආයතනය, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය හා ඨෂ' ආයතනය වැනි සංවිධාන කිහිපයක් මේ සත්කාර්යයේදී අත්වැල් බැඳගෙන සිටිනු දක්නට ලැබීම සතුටට කාරණයකි.

අපේ පාලනයෙන් බැහැර වූ හෝ නොවූ හෝ හේතූන් මත අතීතයේ මෙන්ම වර්තමානයේත් සිදුවෙමින් පවතින සමාජ, සංස්කෘතික හා ආර්ථික විපර්යාසයන් දෙස බලාගෙන වහසි බස් දෙඩීමෙන්වත් සුසුම් ලෑමෙන්වත් කිසිදු වෙනසක් සිදු නොවන බව අත්දැකීමෙන්ම අපි දනිමු. එසේනම් සැබවින්ම කළ යුතු වන්නේ අඳුර ගැන මැසිවිලි නොදොඩා අඳුර මැඬලනු පිණිස එක් පුංචි පහන් සිළුවක් හෝ දැල්වීමට දායක වීමය. කඳුකර දෙමළ ජනයාගේ කටුකවූත් අසුන්දරවූත් ජීවන අන්දරය තේමා කරගනිමින් තරුණ ඡායාරූප ශිල්පීන් කණ්ඩායමක් විසින් අරඹනු ලැබ තිබෙන මේ සමාජ සංවාදය වෙනත් ක්ෂේත්‍ර කරාද පුළුල් කරමින් වතුකරයේ සහෝදර ජනතාව ඉටු කරන ජාතික මෙහෙවරට කෘතවේදිත්වය පළ කිරීම මානවදයාව ගැන කතා කරන අප කාගේත් වගකීමක් නොවේද?




සැකසුම: හර්ෂා සුගතදාස

**පිළිතුරු සැපයීම :-**
**කායික රෝග විශේෂඥ වෛද්‍ය**
**වරුණ ගුණතිලක**

## හිමොග්ලොබින් වැඩි වීම ප්‍රශ්නයක්ද




**ප්‍රශ්නය :-** මගේ පුතාගේ වයස අවු: 21කි. ඔහු සරසවි අධ්‍යාපනය ලබයි. ඔහුට උණ රෝගය වැළඳුණු අවස්ථාවක රුධිර පරීක්ෂණ කීපයක් සිදු කර ගැනීමට වෛද්‍යවරයා නිර්දේශ කළේය. එම රුධිර පරීක්ෂණ වාර්තා අනුව පුතුගේ හිමොග්ලොබින් මට්ටම 18 ලෙස සටහන් වී තිබිණි. පුතුගේ හිමොග්ලොබින් මට්ටම වැඩි බව වෛද්‍යවරයා පැවසුවත් එය අඩු කර ගත යුතු ද, පුතුගේ ශරීර සෞඛ්‍යයට එය අහිතකර ලෙස බලපාන්නේ ද යන්න කිසිවක් පැවසුවේ නැත. මා ඒ ගැන ඇසුවද බිය විය යුතු නැති බව පමණක් වෛද්‍යවරයා සඳහන් කළේය. එහෙත් හිමොග්ලොබින් මට්ටම වැඩිවීම ගැන මම බියෙන් පසුවෙමි. එය අහිතකර අන්දමට බලපාන්නේ ද නැතිද කියා විස්තරාත්මකව දැනගැනීමට කැමැත්තෙමි.

**සුවාරපොළ - අනුෂා ශිරානි වීරසිංහ**

**පිළිතුර :-** හිමොග්ලොබින් වැඩි වූ පමණින් රුධිරයේ හිමොග්ලොබින් ප්‍රමාණය වැඩි බව නිශ්චිතව පැවසිය නොහැකිය. රුධිරයේ අඩංගු හිමොග්ලොබින් ප්‍රමාණය වැඩි බව නිශ්චිතවම පැවසිය හැක්කේ සම්පූර්ණ රුධිර පරීක්ෂණ සටහනේ තවත් අනු පරීක්ෂණ කීපයක් ද පරීක්ෂා කිරීමෙන් අනතුරුවය. ඔබ පවසා ඇති පරිදි පුතුගේ රුධිර පරීක්ෂණ කර තිබෙන්නේ ඔහු උණ රෝගයට ගොදුරු වී සිටියදීය. එවැනි අවස්ථාවක ඔහු ප්‍රමාණවත් තරම් ජලය පානය කර නොසිටියා විය හැකිය. රුධිරයේ අඩංගු විය යුතු ජලය ප්‍රමාණය ප්‍රමාණවත් පරිදි නොමැති විටකදී හිමොග්ලොබින් ප්‍රමාණය ඉහළ යා හැකිය. සමහර ලෙඩ රෝගවලට හිමොග්ලොබින් ප්‍රමාණය වැඩි වේ. නමුත් වෛද්‍යවරයා බිය විය යුතු නැති බව පැවසීම නිසා මට සිතෙන අන්දමට ඔබේ පුතාගේ හිමොග්ලොබින් වැඩි වීම ප්‍රශ්නයක් විය නොහැකිය. ඔබේ සිතේ බිය පහ කර ගැනීමට අවශ්‍ය නම් පුතු නිරෝගීව සිටින අවස්ථාවක සම්පූර්ණ රුධිර පරීක්ෂාවක් (FBC) කරගෙන එම සටහන් සමඟ කායික රෝග විශේෂඥ වෛද්‍යවරයකු හමුවන්න.

## විළුඹේ කැක්කුම නිසා ඇවිදින්න අමාරුයි



**ප්‍රශ්නය :-** මම 62 හැවිරිදි කාන්තාවක්මි. මගේ උස අඩි 5 අඟල් 2කි. බර කිලෝග්‍රෑම් 78කි. මගේ දණහිස් සහ විළුඹවල වේදනාවක් පවතී. උදෑසනට ඇඳෙන් නැගිට ගැනීමට පවා අමාරුය. අධි රුධිර පීඩනය හැර වෙනත් රෝගයක් මට නැත. තිබෙන්නේ විළුඹ බිම තබා ඇවිදීමට අපහසුවයි. සහනයක් බලාපොරොත්තු වෙමි.

**තල්දූව - අයිරාංගනි ශ්‍රියාලතා**

**පිළිතුර :-** ඔබේ දේහ ස්කන්ධ දර්ශකය ඉහළ බව පෙනේ. ඔබේ වයස සහ උසට සරිලන බර පවත්වා ගැනීම ඉතා වැදගත්ය. උසට සරිලන බර වැඩි වී ඉහළ අගයක් ගැනීම නිසා ඔබේ සන්ධිවලට බර වැඩි වේ. ඒ නිසා සන්ධි ගෙවීමට ලක් වේ. සන්ධි ගෙවී යාමත් සමඟ ඇතිවන වේදනාව හෙවත් ඔස්ටියෝ ආතරයිටිස් තත්ත්වය ඇතිවේ. එබැවින් ඔබට දිය හැකි එකම උපදේශය, සිරුරේ බර අඩු කර ගැනීමයි. ඔබට විළුඹේ වේදනාව ඇති වන්නේ විළුඹේ ඇති අස්ථිය ප්‍රදාහය වීමෙනි. එය plantar Fasciosis ලෙස හැඳින්වේ. සිරුරේ බර වැඩි වීමෙන්, අඩි උස පාවහන් පැලඳීමෙන් හෝ සන්ධි රෝගවලදී මෙම තත්ත්වය ඇති වේ. ඒ සඳහා වෛද්‍යවරයකු හමු වී ප්‍රතිකාර ගත යුතුය.

## ඩෙංගු සනීප වුණත් ඇඟට අමාරුයි



**ප්‍රශ්නය :-** මම 38 වැනි වියේ පසුවන වඩු කාර්මිකයෙකි. ඩෙංගු රෝගය වැළඳී මීගමුව රෝහලෙන් නේවාසික ප්‍රතිකාර ලැබුවෙමි. ඩෙංගු රෝගය සුවපත් වී නිවසට පැමිණ මාස 4ක් පමණ ගත වී තිබේ. දැන් ඩෙංගු රෝගය නිට්ටාවට සුව වුවත් තෙහෙට්ටු ගතියක් දැනේ. ළඟදී වහලයක් ගැසීමට ගිය අවස්ථාවක ක්ලාන්ත ගතියක් ඇති විය. කෙඩෙත්තු ගතිය, අතපය කැක්කුම වැනි වේදනා ඇති වූයේ මා ඩෙංගු රෝගයට ගොදුරු වීමෙන් පසුවය. වෛද්‍ය උපදෙසක් බලාපොරොත්තු වෙමි.

**බඩල්ගම - දිලුක් සමීර ප්‍රනාන්දු**

**පිළිතුර :-** ඩෙංගු පමණක් නොව ඕනෑම වයිරසයකින් රෝගයක් වැලඳුණු විට සුවපත් වීමට කාලයක් ගතවේ. ශරීරයේ වයිරසය නොමැති වුවත් ඉක්මණින් යථා තත්ත්වයට පත්වන්නේ නැත. පශ්චාත් වයිරස තෙහෙට්ටු සින්ඩ්‍රෝමය ලෙස මෙය හැඳින්වේ. මෙම කාල සීමාවේදී අධික වෙහෙස, නින්ද නොයෑම, සිරුරේ අප්‍රාණික බව වැනි ලක්ෂණ ඇති විය හැකිය. මෙම කාලයේදී නිවැරදි පෝෂණය ලබා ගැනීම ඉතා වැදගත් වේ. එමෙන්ම ඔබේ රෝගය සුව වෙමින් පවතින අවස්ථාවක ඔබ සිටින බැවින් අධික ලෙස මහන්සි වීමෙන් වැළකිය යුතුය. ප්‍රතිකාරයන් අවශ්‍ය නැත.

# පාරාදීසයේ කාන්තාවෝ

● **නිලංකා ජයසූරිය**

**විවාපත් යුවතියක කුලුඳුලේ ගැබ් ගැනීම සැමරුම් නිමිත්තකි. එහෙත් දැරියක මල්වර වීම හා ඉන් අනතුරුව සිදුවන මාසික ආර්ථවය... එම සමාජයෙහිම ගොළුවත රැකිය යුතු තහනම් මාතෘකාවක් වී තිබීම අරුමයකි.**

මෙහි වඩාත් ශෝචනීය වන්නේ එලෙස 'ගොළුවත රැකීම' හේතුවෙන් බොහෝ දැරිවියනට තම සිරුරේ සිදුවන්නට යන වෙනස්කම් පිළිබඳ කරුණු කාරණා නිවැරදිව කල් තබා දැනගැනීමට ඉඩකඩ නොලැබීම හා එම නොදැනුවත්කම තුළ අනාගතයෙහි දී ඔවුන් විවිධ සෞඛ්‍යමය හා වෙනත් ගැටලුවලට මුහුණපෑමට ඇති අවදානමයි.

ගැහැනු දැරියක මෙලොවට බිහිවූ පසු ඇයගේ යෝනි මාර්ගයෙන් රුධිර බිඳුවක් පිටවීම ස්වාභාවිකය. එසේ පිට නොවුවහොත් කුමන අවස්ථාවකදී හෝ එම රුධිර බිඳුව පිටවිය හැකියි. එහෙත් මේ පිළිබඳ දැනුවත්ව නොසිටීම හේතුවෙන් ඇතැම් විට කුඩා දැරියකගෙන් පිටවන එවැනි රුධිර බිඳුව, ඇය වැඩිවිය පැමිණීමක් ලෙස ඇතැම් මවුවරුන් වරදවා වටහා ගනිති.

ගැහැනු දැරියකට රුධිර බිඳුවක් පිටවූ විට එය ඉදිරි මාසවලදී ද සිදුවේ දැයි විමසිලිමත් විය යුතු ය.

දැරියක වැඩිවිය පැමිණීමකදී රුධිරය පිටවීම ඇතැම් විට විනාඩි ගණනක, එසේත් නැතහොත් දිනක්, හමාරක ක්‍රියාවලියකි. නමුත්, දින ගණනක් රුධිරය පිටවනුයේ නම්, ඇය එයට ප්‍රථම වැඩිවිය පැමිණි දැරියකි. එහෙයින් ගැහැනු දැරියකගේ ජීවිතයෙහි තමන් මුහුණ දෙන්නට යන සිදුවීම් පිළිබඳ ඇය දැනුවත්ව තිබුණේ නම් වැඩිවිය පැමිණීමේදී එම සිදුවීම පිළිබඳ අවබෝධ කරගැනීම මෙන් ම අනවශ්‍ය බිය, තැති ගැන්මෙන් තොරව ඊට මුහුණ දෙන්නට ඇයට හැකිවනු ඇත.

වයස අවුරුදු 12 ත් 16 ත් අතර පාසල් දැරියන් එකසිය පනහක් පමණ සංඛ්‍යාවක් ඇසුරින් 'වැඩිවිය පැමිණීම සහ ආර්ථවය' සම්බන්ධ සනීපාරක්ෂාව පිළිබඳව කරන ලද විමසුමකදී ඔවුන් අතරින් වැඩිවිය පැමිණීම යනු කුමක්දැයි නිවැරදි ලෙස දැන සිටියේ 20% ක් වැනි වූ සුළු සංඛ්‍යාවකි. එමෙන් ම 'ඔසප් වීමේදී සිදුවන්නේ කුමක් දැයි නිවැරදිව පවසන්නට දැන නොසිටියහ.

වැඩිවිය පැමිණි දැරියක අනතුරුව සිදුවන මාසික ආර්ථවය අප සමාජයේ බොහෝ දැරියකට 'බියකරු' අත්දැකීමකි.

ඔවුන් තුළ ඇති බිය නැති කිරීමට දෝ; විවිධ සමාජයන්හි ඔසප් වීම හඳුන්වන්නට විනෝදජනක හා හාස්‍යජනක වදන් භාවිතා කරන බැව් ඇතැම් විට ඔබ නොදැන සිටින්නට ඇත.

ආර්ථවය යන්න බොහෝ විට සමාජය තුළ එළි පෙහෙළියෙහි කතා නොකරන 'නිහඬ මාතෘකාවක්' වීම තුළ ආසියාතික රටවල කාන්තාවන් හා දැරිවියන් බොහෝමයක් ඒ හා බැඳුණු තහංචි හා මිත්‍යාවන්, සෞඛ්‍ය සම්පන්න නොවන ක්‍රමවේදයන් හේතුවෙන් ගැහැනියක වී ඉපදීම ශාපයක් යැයි සිතන්නට පුරුදු වී සිටිති.

ආර්ථවය හා සම්බන්ධ සනීපාරක්ෂාව පිළිබඳව අපගේ විමසුමට යොමු කරගත් දැරියන් වැඩි දෙනෙකු අවම වශයෙන් පන්ති කාමරයේදී ගුරුතුමියගෙන් හෝ 'ඔසප් වීම' හෝ වැඩිවිය පැමිණීම පිළිබඳ විද්‍යාත්මක කරුණු දැන නොසිටියවුන් වූ අතර, බොහෝ දැරියන් පැවසුයේ ඔසප් රුධිරය අපිරිසිදු බැවින්, ගැහැනියක් නිතර අපිරිසිදු බැව් ය; එමෙන් ම රුධිර වහනය වන සමයේදී දේවස්ථාන කරා යා නොයුතු බැව් ඇතැමුන් සිතූහ.

ආර්ථවය හා බැඳුණු සත්‍යය පිළිබඳ කතා කරන්නට, තරුණ දියණියන් දැනුවත් කරන්නට බොහෝ කාන්තාවන් මැළි වන්නේ එය 'ලැජ්ජා සහගත මාතෘකාවක්' යන අදහසිනි. එහෙයින්ම ආර්ථවය හා බැඳුණු මිත්‍යාවන් තවු ගසමින් පියාසර කරති.

මාසික ඔසප්වීම හා බැඳුණු මිථ්‍යාවන් විශේෂයෙන් ම ආසියාකරයෙහි බොහෝ රටවලින් අසන්නට ලැබෙයි.

ඔසප්වීමේදී ශරීරයෙහි ඇති අපිරිසිදු රුධිරය පිටවන බව හා රුධිර වහනය අවසන් වනතුරු නෑමෙන් මෙන්ම මස්, මාළු වැනි කිළි සහිත ආහාරවලින් වැළකිය යුතුය යන්න එවැනි ඇතැම් මිථ්‍යාවන්ය. ඇතැම් සමාජයන්හි 'කිළි' නැත්නම් 'අපිරිසිදු' බැව් හේතුවෙන් රුධිරය පිටවීම අවසන් වනතුරු ඇයට මුළුතැන්ගෙයට ඇතුළුවීම තහනම්ය. නේපාලයෙහි ඇතැම් ප්‍රදේශයන්හි ඔසප් සමයෙහිදී කාන්තාව නිවසින් පිටත විසිය යුතු ය.

ආර්ථවය පිළිබඳ පවත්නා වැරැදි වැටහීම් හේතුවෙන් බොහෝ විට ගැහුනු දරුවන්ට හා කාන්තාවනට ලැජ්ජාවෙන් හා බියෙන් යුතුව කල් ගෙවීමට සිදුවීම වඩාත් කනගාටුවට කරුණකි. මෙම කාලය තුළ කාන්තාව මුහුණපාන ශාරීරික අපහසුතාවයන් පිළිබඳ පවුලේ අනෙකුත් සාමාජිකයන් දැනුවත් වීමට ඉඩකඩ නොමැතිවීම හේතුවෙන් සුපුරුදු පරිදි ගෙදර දොරේ සියලු කර්තව්‍යයන් සියලු අපහසුතා මැද වුව ද ඇය විසින්ම ඉටු කළ යුතුව ඇත.

ලෝකයේ ගැහැනුන් හා ගැහැනු ළමුන් අතරින් අවම වශයෙන් මිලියන පන්සියයකට තවමත් ආර්ථවය සම්බන්ධ සනීපාරක්ෂාව කළමනාකරණය සඳහා ප්‍රමාණවත් පහසුකම් නොමැත.

විශේෂයෙන් පාසල් පද්ධතිය තුළ 'ගැහැනු ළමයාගේ මෙම අවශ්‍යතාවය පිළිබඳ සිතා බලා අදාළ පරිදි සේදුම් කාමර, සබන් හා පාවිච්චි කොට ඉවතලන සනීපාරක්ෂක තුවා බැහැරලීමේ ක්‍රමවේදයන් සඳහා ඇත්තේ අවම සැලකිල්ලකි.

අතරමගදී පාසල් හැර ගිය සිසුන් පිළිබඳ වසර කිහිපයකට ප්‍රථම සිදුකරන ලද සමීක්ෂණයකදී පාසලෙහි වැසිකිළි පද්ධතින් ක්‍රියාන්විතව නොතිබීම හේතුවෙන් ඔසප් දිනයන්හි පාසල් නොයාම පුරුද්දක් කොටගත් දැරිවියන් රැසක් ම පදියතලාව වැනි දුෂ්කර ප්‍රදේශයන්ගෙන් හමුවිණි.

හැම මසකම දින තුන හතරක් පාසල් නොගොස් නිවසේ රැඳෙන මෙම සිසුවියන් මේ හේතූන් මත වසරකට පාසල් පවත්නා දින තිහක්වත් පාසලෙන් බැහැරව සිටිති. මේ අතරින් අධ්‍යාපනයට දුර්වලතාවයන් දක්වන දැරිවියන් ක්‍රමයෙන් පාසලෙන් බැහැරවී අතරමගදී පාසල් හැර යන්නවුන්ගේ සංඛ්‍යාවට එක්වෙති.

පාසලෙහි එක් වැසිකිළියක් හෝ පාවිච්චි කිරීමට සුදුසු තත්ත්වයක නොතිබීම හේතුවෙන් ඔසප් දිනයන්හි නිවසේ නතරවීම පුරුද්දක් කරගත් 'සඳලතා' සාමාන්‍ය පෙළ විභාගයට සූදානම් වෙමින් සිටි දැරියකි. විභාගයට පෙනී සිටින්නට ප්‍රථම, පාසලේදී පැවැත්වූ වාර විභාගයට පෙනී සිටීම අනිවාර්ය වූයෙන් එවර තම මාසික අපහසුතාවය පිළිබඳ පවසා පාසල් නොගොස් සිටීමට ඇයට හැකිවූයේ නැත.

විභාග ශාලාවෙහි අසුන්ගෙන සිටින අතර තුර තම සනීපාරක්ෂක රෙදිකඩ මාරු කර ගැනීමට දැඩි අවශ්‍යතාවයක් දැනුන ද, කර කියා ගත හැකි දෙයක් නොමැතිවූයෙන් නිහඬවූ ඇයගේ සුදු ගවුම පුරා ලේ තැවරී ඇති අන්දම දුටු සඳලතා ලැජ්ජාවත් කම්පනයත් හේතුවෙන් සිහි විසඥ වූවාය.

මුළු පාසල තුළම සඳලතා මුහුණදුන් අකරතැබ්බය පිළිබඳව පැතිර යන්නට වැඩි වේලාවක් ගතවූයේ නැත.

"තොත්ත බබෙක් වගේ ඉන්නෙ නැතුව තමන්ට අවශ්‍යතාවයක් තිබුණ නම් නැගිටල යන්න තිබුණනේ... පිරිමි ළමයිනුත් සේරමලා බලාගෙන සිටියෙ. අපිටත් විළි ලැජ්ජාවෙ බැහැ"... 'ලැජ්ජාව' පිළිබඳව මහා ඉහළින් සැලකූ වයස්ගත ගුරුවරියක විසින් සෙසු දැරිවියන් සමඟ පවසා තිබුණ ද; තම අවශ්‍යතාවය ඉටුකර ගනු පිණිස නැගිට යාමට එකඳු වැසිකිළියක් හෝ තිබුණේ ද යන්න ඇයට අමතක වූයෙන් එම 'අඳුරු සිදුවීමේදී' සඳලතා 'චූදිතයා'වීම නොවේ. තමන් මුහුණදුන් සිදුවීම හේතුවෙන් දැඩි ලෙස ලැජ්ජාවට පත් සඳලතා,... ඒ සිදුවීම හේතුකොට ගෙන පාසල් අධ්‍යාපනය අතරමගදී නතර කොට දැමීමය.

මේ අන්දමට ඔසප් දිනයන්හි නිහඬ අරගලයක යෙදෙන පාසල් සිසුවියන් අතරින්, අතරමගදී පාසල් හැරයන දැරියන් බොහොමයක් වුව ද ඔවුන් එසේ අධ්‍යාපනය අතරමග නතර කරන්නට බලපෑ හේතුන් පිළිබඳ සොයා බලන්නට කිසිවකු නොවීම කනගාටුවට හේතුවකි.

"අපේ වත්තෙ ගෙවල් විස්සකට විතරම තියෙන්නෙ 'ටැප්' දෙකයි. රෑ දොළහ විතර වෙනකම් වතුර ගන්න, රෙදි හෝදන්න කට්ටිය යන එන හින්දා, මාසෙ අමාරුව දවස්වලට දවසෙම ඇඳපු රෙදි හෝදන්නෙ පාන්දර තුනට විතර නැගිටලා..."

කොළඹ නගරයට නුදුරු පෙදෙසක වෙසෙන දාහත් හැවිරිදි රානීට 'ඔසප් සමය, ඉතා දුෂ්කර කාලයකි.

"මේ අසනීප දවස්වල අඳින 'රෙදි කඩ' එළි පෙහෙළියෙ දාන්න තරම් ඉඩක් නැහැ. "කාටවත් පේන්න රෙදි වනන එක ලැජ්ජාවක්" කියල අම්මා කියන්නෙ කාමරේම රෙදි වේළගන්න කියල."

මේ අන්දමට කාන්තාවන් හා ගැහැනු දරුවන්ගේ ඔසප් සනීපාරක්ෂාව තවමත් 'කතා නොකළ යුතු, රහසින් සිදු කළ යුතු වූවක් බැව් සමාජයේ බොහෝ දෙනෙකු තුළ ඇටුවම් බැහැ තිබීම හේතුවෙන් ඔසප්වීම සම්බන්ධ විද්‍යාත්මක කරුණු හා මෙම දිනයන්හි කළ යුතු හා නොකළ යුතු දෑ පිළිබඳ බොහෝ දෙනෙකු තුළ ඇත්තේ අල්ප දැනුමකි.

> ලෝකයේ ගැහැනුන් හා ගැහැනු ළමුන් අතරින් අවම වශයෙන් මිලියන පන්සියයකට තවමත් ආර්ථවය සම්බන්ධ සනීපාරක්ෂාව කළමනාකරණය සඳහා ප්‍රමාණවත් පහසුකම් නැත.

ඔසප් කාලය තුළ හොඳ සනීපාරක්ෂාවක් පවත්වා ගැනීම වඩාත් වැදගත් වන අතර, තෙත් සහ අපිරිසිදු ඔසප් රෙදි කඩ ඇඳුම් හෝ සනීපාරක්ෂක තුවා පැය හතරකට වැඩි කාලයක් භාවිතා කිරීමෙන් හානිකර බැක්ටීරියා වර්ධනය මෙන් ම, කල් ගත වීමේදී ගර්භාෂයේ රෝගී තත්ත්වයන් ඇතිවීමට ද හේතුවන බැව් බොහෝ දැරියන් නොදන්නා කරුණුය.

අපගේ සමීක්ෂණයට හසුකරගත් ඇතැම් දැරියන් ඔසප් සමයෙහි ඇතිවන ශාරීරික අපහසුතා, වේදනාවන් සමනය කර ගැන්මට 'අසමෝදගම් බීම වේදනාවට ගානා ප්‍රසිද්ධ වෙළෙඳ නාමයකින් යුතු බාම් වර්ගයක් ගෑම, අරක්කු, දෙහි, කෝපි බීමට පුරුදු වී සිටි අතර ඔවුන් මෙවැනි දෑ භාවිතයට පුරුදුව තිබුණේ තම මව, ඥාති කාන්තාවන් හෝ අසල් වැසි කාන්තාවන් ගෙනි.

ආර්ථව දිනයන්හි ජාඩි කරවල වැනි ලුණු අධික ආහාර, කැවුම් හා බදින ලද අර්තාපල් පෙති වැනි තෙල් බේරෙන ආහාර, කෝපි, දෙහි, අච්චාරු, චොකලට් වැනි ආහාර නොගත යුතු ආහාර ලැයිස්තුවටත්, මස්, මාළු, බිත්තර, පලතුරු, එළවළු, පලා, හාල්මැස්සන් වැනි දෑ ගතයුතු ආහාර ලැයිස්තුවටත් අයත් බැව් දැනසිටියේ සමීක්ෂණයට යොමුවූ දැරියන්ගෙන් ඉතාමත් සීමිත පිරිසකි.

නේපාලය ඉන්දියාව වැනි ආසියාතික රටවල ආර්ථවය සම්බන්ධව






පවත්නා මිත්‍යාවන් චාරිත්‍ර සැලකුමේදී තවමත් අප ඉදිරියෙන් සිටින බැව් ද පැවසිය යුතුය. ආසියාවේ ඇතැම් දිළිඳු සමාජයන්හි සනීපාරක්ෂක තුවා මිලදී ගැන්මට තරම් ආර්ථිකයක් නොමැතිවීම හේතුවෙන් ගස්වල පට්ටා, කපු, කොළ වර්ග මෙන් ම එවැනි ඕනෑම දෙයක් භාවිත කරන්නේ එහි ප්‍රතිවිපාකයන් පිළිබඳ කිසිදු අවබෝධයකින් තොරවය.

බොහෝ විට ආර්ථික වශයෙන් පවත්නා නොහැකියාව හේතුවෙන් ම මසකට වරක් අවම වශයෙන් එක් සනීපාරක්ෂක තුවා පැකට්ටුවක මිලදී ගැන්ම පවා දුෂ්කර බැවින්, දිළිඳු ආර්ථිකයක් ඇති පවුල්වල කාන්තාවෝ ඔසප් සමයේදී 'රෙදි කඩක්' භාවිතයට පුරුදුව සිටිති.

ගැටලුව වන්නේ, සනීපාරක්ෂාව සඳහා අවශ්‍ය ජලය හා අනෙකුත් පහසුකම් නොවීම, 'ලැජ්ජාව' හේතුවෙන් රෙදිකඩ සේදීමෙන් අනතුරුව හිරු එළියට නිරාවරණය කොට වියළා ගැන්මට මැළිවීම හා රෙදි කඩ සේදූ ජලය බැහැර කිරීමේ පවත්නා ගැටලු නිසි ලෙස රෙදි කඩ පිරිසිදු කිරීමට ආදී හේතුන් මත පහසුකම් නොවීම ඔවුන් සනීපාරක්ෂාව පිළිබඳව අවදානමකට මුහුණ පා සිටීමය.

එහෙයින්, කාන්තාවන්ට තම ආර්ථව සමය ගෞරවනීය ආකාරයෙන් හා මානසික ආතතියෙන් තොරව, එමෙන් ම සෞඛ්‍යමය ගැටලු ඇතිවීමේ අවදානමකින් තොරව ගත කිරීම සඳහා සමාජ පරිසරය, මෙන් ම භෞතික සම්පත් සැපයීම වඩා වැදගත් අවශ්‍යතාවකි.

මෙහිදී කාන්තාව විසින් අමතක නොකළ යුතු වැදගත් කරුණකි. එනම් ගැහැනුකම තවදුරටත් ශාපයක් නොවන බැවින් 'ගැහැනුකම ගෞරවයක්' යන මතය සමාජය තුළම ගෙනයාමේ මූලික වගකීම පැවරෙන්නේ අන් කිසිවෙකු වෙත නොව, කාන්තාව වෙතටම බවය.

# ඔබ පසුකරන්නේ කුමන අවදිය ද?

"රටකට ශ්‍රේෂ්ඨ ලේඛකයෙක් ඉන්නවා කියන්නේ හරියට ඒ රටේ තවත් ආණ්ඩුවක් තියෙනවා වගෙයි. කිසිම රාජ්‍ය පාලනයක් ශ්‍රේෂ්ඨ ලේඛකයකුට ආදරය නොකරන්නේ ඒ නිසයි. ඔවුන් සලකන්නේ අල්ප ලේඛකයන්ට විතරයි"

රුසියාව ම හෙල්ලුම් කෑ මේ ප්‍රකාශය කරන්නේ ඇලෙක්සැන්ඳර් ඉසායේවිච් සොල්සෙනෙත්සින් ය. ජෝශප් ස්ටාර්ලින්ගේ කෲර පාලන සමයේ හිරේ විලංගුවේ වැටුණු මේ නිර්භය ලේඛකයා හිරෙන් නිදහස් ව පැමිණ ලියූ දේවලින් මුළු රුසියාව ම හෙල්ලුම් කැවේ ය. සොල්සෙනෙත්සින් කියන්නේ තවත් ආණ්ඩුවක් යැයි අප පවසන්නේ එබැවිනි. ඔහු තම හෘදය සාක්ෂියේ ඇණවුම අකුරු බවට පෙරළුවේ ය. මා, ඔහුට පෙර කී ආණ්ඩු කතාව කීවේ ඔහුගේ 'First Circle ' නම් නවකතාවේ එන හෘදය සාක්ෂිය පෑරුණු වොලදින් නමැති විදේශීය සේවයේ නියුතු නිලධාරියාගේ මුවට නැංවුණු වදන් පෙළකිනි. සොල්සෙනෙත්සින් ආණ්ඩුවක් බවට පත්වන්නේ එලෙසිනි.

ලේඛකයා ප්‍රීති ප්‍රමෝදයට පත්වන්නේ ඔහුගේ හෘදය සාක්ෂිය අන්‍යන්ගේ හෘද සාක්ෂිය හා එකඟ වූ විට යැයි සැල්ටියොකොව් ෂෙඩ්රින් කරන ප්‍රකාශය මෙහිදී අප මනසට නැඟෙන්නේ නිතැතිනි.

බාධක හෝ දුෂ්කරතා හමුවේ ලේඛකයකුට කිසිසේත් ම පසුබැසිය නොහැකිය. සාහිත්‍ය නිමේෂයකට හෝ නිහඬ වීම ජාතියක මරණය හඟවන්නක් බැව් ෂෙඩ්රින් කියන්නේ එබැවිනි. ලේඛකයාට ලේඛනය හුදෙක් ශිල්පයක් හෝ වෘත්තිය මාර්ගයක් නොවෙයි. කිසිවකුත් ලේඛනයේ යෙදෙන්නේ තම මනසේ නැඟෙන උද්වේගයට පිළිතුරක් සපයා හදවත නිවා ගන්නට ය. හෘදය සාක්ෂියේ හඬත්, අනාගතය පිළිබඳ අචල විශ්වාසයකුත් ඇති යම් තැනැත්තකුට සිය අභ්‍යන්තරයේ ජනිත වන ලිවීමේ ආසාව මැඩගත නොහැකිය. සිය හදවතේ අසීමිත හඬගෑමට ඔහුට එකඟ වන්නට ම සිදුවනු ඇත.

මිනිසකු ලේඛකයකු බවට පත්වන්නට හදවතේ හඬගෑම පමණක් ප්‍රමාණවත් ද? පාසල් යන යෞවනයේ රිපන් බාලිකාවට යන කන්ද මඟ දෙපස වූ අරලිය මල් ගැන මම අනන්ත අප්‍රමාණ කවි පබැඳුවෙමි; ඒවා සාටෝපයෙන් බර ය. රිපන් බාලිකාවෙන් නික්ම කැලණිය සරසවියේ කන්ද නඟිද්දී මැයි මල්, ඇහැළ මල් යාය යටිනුත්, තල් වැටේ සෙවණ විඳිමින් ධර්මාලෝක ශාලාවට යන මඟ ගැනත් අනන්ත අප්‍රමාණ කවි පබැඳුවෙමි. සරසවියෙන් නික්මී ලේක්හවුසිය කරා පිය මනිද්දී ඒ මඟ පිරි ඇහැළ මල් කිණිති මගේ කවිවලට කෙතෙක් නම් වස්තුබීජ වන්නට ඇත් ද? අපූරු රොමෑන්තික බවකින් ඒ කවි පිරී තිබිණි. කුඩා කොළපාට පොහොට්ටු පොකුරු ක්‍රමයෙන් කහපැහැ ගැන්වී පෙති එකින් එක විකසිත වන අයුරු මම බලා සිටියෙමි. පිපුණු මල් කිණිත්ත මඳ සුළඟේ ලාලිත්‍යවත් ව සෙලවෙන විට ඒ මල්වල එල්ලී බඹරුන් ද පැද්දෙන හැටි මම දිනෙන් දින නිරීක්ෂණය කළෙමි. එය පියවරෙන් පියවර මගේ සිතට අමුතු ම හැඟීම් සමුදායක් එක් කළේ ය. එදා රිපන් බාලිකාවේ කන්දේ පිහිටි මල් ගැන ලියූ කවිවලට වඩා කැලණිය සරසවි බිමේ තල් වැට ගැන ලියූ කවි වෙනස් මුහුණුවරක් ගත්තේ ය: වඩාත් රොමෑන්තික වීය. ඒ දෙකට ම වඩා ලේක්හවුස් මාවතේ ඇහැළ මල් ගැන ලියූ කවි වෙනස් වීය. එදා ඒ ලියූ ඒවාට වඩා අද ලියන දෑ බෙහෙවින් වෙනස් ය: යම්කිසි ජීවන පරිඥානයකින් යුතුය.

ඕනෑ ම කෙනෙකු ඕනෑ ම දෙයක් සම්බන්ධයෙන් කාලයත්, අත්දැකීම් සම්භාරයත් හේතුවෙන් පරිණත වන්නේ ය: ලේඛකයා ද එසේම ය. ඔහු ද දිනෙන් දින ජීවන පරිඥානය ලබන්නේ ය. සිතා බලන්න, ඔබ එදා සිතූ විදියට නොවේ නේද අද සිතන්නේ. හෙට ඔබ මේ සියල්ලට ම වඩා වෙනස් ලෙසකින් සිතනු ඇත. තවත් වසර දහයකින් ඔබ වෙනස් ම කෙනෙකි. ඒ ගැන සැකයක් නැත. ලේඛකයා ද, ලේඛනය ද එපරිදි ය. ඔහු ද දිනෙන් දින පරිණත වෙයි. ඔවුහු ද තාරුණ්‍යයේ සාටෝප බවින් මිදී, වචනවල සුන්දරත්වයේ එතී මනහර බව ගැන ම සිතූ කාලය පසුකර ක්‍රමයෙන් ජීවිතේ ස්වභාවය ගැන සිතන්නට පටන් ගනිති. නිර්මාණය සමාන්‍ය දෙයෙහි අසාමාන්‍ය බවකුත්, අසාමාන්‍ය දෙයෙහි සාමාන්‍ය බවකුත් දකින්නේහි ය. ඒ ඒ ලේඛකයන්ගේ ඒ ඒ අවදිවලට අයත් කෘති කියවා බැලීමෙන් ඔබට මේ වෙනස හඳුනා ගත හැකිය.

නිර්මාණකරණයේ යෙදෙන්නට බලාපොරොත්තුවක් ඇත්නම් විවිධ කාලවලට ආවේණික සුන්දරත්වය ගැන ඔබට අවධානය යොමු කරන්නට සිදු වේ. ඕනෑ ම කෙනකු සාටෝපයෙන් පටන් ගෙන, රොමෑන්තික වීම ද: ඒ රොමෑන්තික පටලය ඇට මිදුළුවලට කා වැදුණු යුගයක් ද පසු කරන්නේ වෙයි. ඒ රොමෑන්තික බව සමහර විට නිර්මාණවලට අමුතු ම ප්‍රභාවක් එක්කරයි. එයට මල් පුබුදු වන්නට , පෙණ පිඬු නංවන්නට, තරු පායවන්නට පමණක් නොව, ආදරය, විරහව ඇති කරන්නට ද හැකිය. මේ සියල්ල ම එක සේ සුන්දර ය. ඒවා සුන්දර ලෙස දැනෙන්නේ ඒ වකවානු ගැන ඔබට අවබෝධයක්, ආදරයක් ඇත්නම් ය. හෘදය සාක්ෂිය වචනවලට පෙරළන්නේ නම් ඒ සිතුවිලි ඇතිවුණු නිසැක ය. සිතා බලන්න, ඔබ දැන් සිටිනුයේ , මේ අවදීන් හි කුමන අවදියේ ද කියා. නිර්මාණකරණයේ දී ඔබට එය ප්‍රයෝජනවත් වනු නිසැක ය.

sumudu.chathurani@lakehouse.lk

# ඇළේ වෙලේ සිටි අපේ මාළුවෝ
# වඳ වී යෑමේ අවදානමක



බන්දුල පෙතියා

● ජාලිය වීරක්කොඩි

**දශක තුනක හතරක කාලය බොහෝ දේ වෙනස් කර තිබේ. ඇළක පොදි ගැහෙන නලහඳයින්, වැලි ගොව්වන්, පෙතියන් සමඟ දිය කෙළියේ යෙදුණු ළමා කාලයේ මතක අතර ජීවත්වෙන අවසන් පරම්පරාව අප විය හැකිය. දේශීය මිරිදිය මත්ස්‍යයන් පිළිබඳ කෙරුණ නවතම පර්යේෂණ හෙළිදරව්ව ඒ අතීතයේ සිහින දෙදරවන්නේ බලවත් කම්පනයක් සමඟිනි.**

ඒ කම්පනය ඇති වන්නේ රටට ආවේණික මිරිදිය මත්ස්‍ය විශේෂවලින් හතරෙන් තුනක් වඳවීමේ තර්ජනයට මුහුණ දී සිටින බවට ලැබුණ අලුත්ම වාර්තාවත් සමඟිනි.

80 දශකයේ මුල් භාගයේ දී ලංකාවේ වියළි කලාපයේ බොහෝ ජලාශවල සිදු කරන ලද සමීක්ෂණවලින් පෙන්නුම් කළේ රටට ආවේණික නිදහස් ජලජ මත්ස්‍යයෙක් වූ තඹලවැන්නා (Labeo lankae)බහුලව එම ජලාශවල ජීවත් වූ බවය. මත්ස්‍ය වෙළෙඳපලේ ද ඔවුහු ඇති තරම් අලෙවි වූහ. නමුත් දශක කීපයකට පසු මෑතක කළ සමීක්ෂණයකින් හෙළිදව් වූයේ මේ සුලබව සිටි දේශීය මත්ස්‍යයා ඌ වාසය කළ ජලාශවලින් අතුරුදන් වී සිටි බවය. මේ පිළිබඳව කළ විමසීමකදී හෙළිදරවු වන්නේ තඹලවැන්නා මතු නොව, දේශීය ආවේණික මත්ස්‍ය ප්‍රභේදවලින් සියයට හැත්තෑ හතරක්ම වඳවීමේ තර්ජනයට මුහුණ දී ඇති බවය.



අශෝක පෙතියා



තඹලවැන්නා

වර්ගීකරණ සංශෝධන හේතුවෙන් මත්ස්‍ය විශේෂ එකතුවීම හෝ ඉවත් කිරීම නිසා ජාතික රතු ලයිස්තුව නිරන්තරයෙන් යාවත්කාලීන වන්නේය. වර්ෂ 2020 තක්සේරුව අනුව ශ්‍රී ලංකාවේ ආවේණික මත්ස්‍ය විශේෂ 61 කි. මේ වාර්තාවන්ට අනුව රතු ලයිස්තුගත කර ඇති ආවේණික විශේෂ අතුරින් මත්ස්‍ය විශේෂ 12ක් වඳ වී යෑමේ බරපතල අවදානමකය. 24ක් වඳවීමේ තර්ජනයට මුහුණ දී ය. මත්ස්‍ය විශේෂ 9ක් අවදානම් කලාපයේය. රතු ලයිස්තු සමාලෝචනයට අනුව විමසා බැලූ ආවේණික නොවන මිරිදිය මත්ස්‍ය විශේෂ 36ක් අතරන් විශේෂ 8ක් වඳවීමේ තර්ජනයට ලක්ව ඇත.

ශ්‍රී ලංකාවේ අයි. යූ. සී. එන් ආයතනයේ ජෛව විවිධත්ව හා ජාතික රතු ලයිස්තුවේ තක්සේරුකාර විද්වතෙක් වූ ජ්‍යෙෂ්ඨ ව්‍යාපෘති නිලධාරී සම්පත් ගුණතිලක මොන්ගාබේ (mongabay) වෙබ් අඩවියට ප්‍රකාශ කර තිබුණේ මෙම තක්සේරුව ගෝලීය රතු ලයිස්තුවේ නිර්ණායකයන්ට අනුව සිදු කළ බැවින් එය ගෝලීයව පිළිගන්නා බවය. "මෙම තක්සේරුව විවිධ මට්ටමේ තර්ජනයන්ට ලක් වූ සත්ව විශේෂයන්හි ලැයිස්තුවක් ලෙස පමණක් නොව, නිශ්චිත සංරක්ෂණ ක්‍රියාමාර්ග ගැනීමේ විද්‍යාත්මක භූමියක් ලෙසත් සැලකීම වැදගත්". සම්පත් ගුණතිලක මොන්ගැබේ වෙබ් අඩවියට පවසා තිබිණි.

ලංකාවේ භූමි ප්‍රමාණයන්ගෙන් සියයට 28ක් පමණ ආරක්ෂිත කලාප ලෙස නම් කර තිබේ. එම කලාප පාලනය කරන්නේ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව හෝ වන ජීවී දෙපාර්තමේන්තුව විසිනි. තර්ජනයට ලක්වූ බොහෝමයක් ආවෙනික හෝ ආවේණික නොවන මත්ස්‍ය විශේෂ මෙම ආරක්ෂිත ජාලයෙන් පිටත ජීවත් වන්නන්ය. මේ සතුන්ගේ ජීවිතවලට මිනිස් ක්‍රියාකාරකම් සෘජු ලෙස බලපා තිබිණි. මේ ප්‍රදේශවල ජීවත් වූ විශේෂ කීපයක් දේශීය වඳ වී ගොස් තියනවා. මෙම ප්‍රවණතාවය දිගටම පැවතුණහොත් සමස්ත ජීවීන්ම වඳ වී යාමට ද හේතු විය හැකිය." ගුණතිලක මොන්ගැබේ වෙබ් අඩවියට පැහැදිලි කර තිබිණි.

ලංකාවේ මිරිදිය මත්ස්‍යයන් පිළිබඳ විශේෂඥයෙක් සහ මීට පෙර අයි. යූ. සී. එන් හි ජීවි පැවැත්ම පිළිබඳ කොමිෂන් සභාවේ උප සභාපති ලෙස සේවය කළ ප්‍රමුඛ පෙළේ වර්ගීකරණ විද්‍යාඥයෙක් වූ රොහාන් පෙතියාගොඩට අනුව මේ ආරක්ෂිත කලාප මිරිදිය මත්ස්‍යයන්ට ආරක්ෂාව සපයා නැත. ඔහුට අනුව මත්ස්‍යයන්ගේ ඇළ දොළ දෙපස වාසස්ථාන අවදානමට ලක්ව ඇත. මිනිසා පරිභෝජනය කරන අපද්‍රව්‍ය හා කෘෂිකාර්මික රසායනද්‍රව්‍ය මගින් ගංගා හා ඇළ දොළ දූෂණය වීම, ගංගා දෙපස ස්වභාවික සෙවන නැති වීම, බරපතල ලෙස මිරිදිය මත්ස්‍ය විශේෂයන්හි පැවැත්මට බලපා තිබේ. "තෙත් කලාපයට ආවේණික සියලුම මත්ස්‍ය විශේෂ පාහේ සෙවණ සහිත දිය පහරවල් සමඟ දැඩි ලෙස සම්බන්ධ වී ඇති බව හඳුනා ගැනීම වැදගත්, "රොහාන් පෙතියගොඩ පැහැදිලි කර තිබිණි.

ඒ කෙසේ වෙතත් සම්පත් ගුණතිලකට අනුව තවමත් මත්ස්‍ය විශේෂ කීපයක ධනාත්මක වර්ධනයක් දක්නට ලැබේ. තඹලවැන්නා වැනි මත්ස්‍ය වර්ග කීපයක් බරපතල ලෙස වඳවීමේ තර්ජනයට ලක්ව ඇති බවට ලයිස්තුගත විය. අද වනවිට ඒ මත්ස්‍ය විශේෂවල සංරක්ෂණ තත්වය වඳවීමේ තර්ජනයට ලක් වීම දක්වා වෙනස් වී තිබේ. මීට හේතුව දියත් වූ සමීක්ෂණවලින් පසුව තඹලවැන්නාගේ විවිධ ගහණ සොයා ගැනීමය.

## මිරිදිය මසුන් සංරක්ෂණය

රොහාන් පෙතියාගොඩ ගේ අත්දැකීම් නම් මිරිදිය මත්ස්‍ය සංරක්ෂණ කටයුතු සමාජ දැනුවත් කිරීම් සමග තිරසාරව ආරම්භ කළ හැකි බවය. මිරිදිය මසුන්ගේ පැවත්මෙහි වටිනාකම ගැන ප්‍රාදේශීය ප්‍රජාව දැනුවත් කළ පසු ඔවුන් සංරක්ෂණ කටයුතුවලට දායක වීමට විශාල උනන්දුවක් දක්වන බව ඔහු පවසන්නේය. ශ්‍රී ලංකාවේ සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ ගලපිටමඩ හා කිතුල්ගල ප්‍රදේශයන්හි ප්‍රජාව විසින් වඳවීමේ තර්ජනයට ලක්ව ඇති අශෝක පෙතියා නොහොත් රන්මානිස්සා (Systomus asoka) සහ බන්දුල පෙතියා (Pethia bandula) දැන් රැකගන්නා ආකාරය ඔහු ගෙනහැර දක්වන උදාහරණය ය.

"වර්ෂ 1990 දි මේ විශේෂ දෙක ගැන ප්‍රදේශවාසීන්ව දැනුවත් කරන්න මට අවස්ථාවක් ලැබුණා. මා මේ මසුන් ප්‍රදේශවාසීන්ට පෙන්වලා කීවා මේ මත්ස්‍යයන් ඔබගේ ගංගාවට අනන්‍ය බව. ඔබගේ ඔයට අනන්‍ය බව. ඔවුන් ඒ සම්බන්ධව ඉතා දැඩි සේ උනන්දු වුණා. ඒ සතුන් ආරක්ෂා කරන්න එක් වුණා." රොහාන් පෙතියාගොඩ වැඩි දුරටත් පවසා තිබිණි. ඔහුට අනුව මෙවැනි සත්ත්ව විශේෂ සංරක්ෂණය කිරීම සඳහා හොඳම මෙන්ම එකම විකල්පය ප්‍රාදේශීය ප්‍රජාවට ඒ කටයුත්තේ වගකීම ලබා දීමය.

2020 මිරිදිය මත්ස්‍ය රතු ලයිස්තු තක්සේරු වාර්තාව මත්ස්‍යයන් සංරක්ෂණය සඳහා නිර්දේශ ද ඇතුළත් කර තිබේ. එකක් නම් මෑත කාලීන පරිණාමීය අධ්‍යයනවලින් හෙළි වී ඇති පරිදි මිරිදිය මත්ස්‍යයන් පිළිබඳ ක්‍රමානුකූල පරීක්ෂණයක් දියත් කිරීමය. දැනටමත් විස්තර කර ඇති විශේෂ කිහිපයක් සඳහා වර්ගීකරණය පැහැදිලි කරගැනීමය. තවත් නිර්දේශයක් වන්නේ අවම තර්ජනයට ලක්ව ඇති මත්ස්‍ය විශේෂවල ගහණය තක්සේරු කිරීමය. පුළුල් ඇගයීම් පරාසයක් සහිත, ජාතික වශයෙන් ඇගයීමට ලක්ව ඇති සමහර විශේෂ අයි. යූ. සී. එන් ඉදිරිපත් කරන තර්ජනයට ලක්වන බාණ්ඩ යටතේ ලයිස්තුගත කළ නොහැකි බව මෑත සිදුවූ ඇගයීම් ක්‍රියාවලියෙන් හෙළි වූ බව සම්පත් ගුණතිලක පවසා තිබිණි.

ශ්‍රී ලංකාවේ පමණක් දක්නට ලැබෙන තර්ජනයට ලක් වූ මත්ස්‍ය විශේෂ සඳහා සංරක්ෂණ ක්‍රියාකාරී සැලසුම් සංවර්ධනය කිරීම යෝජනා කර තිබේ. වඳවීමේ තර්ජනයට ලක්ව ඇති විශේෂයන් බෝ වීම සිදුවන තැන්වල ස්ථානීය සංරක්ෂණයේ ශක්‍යතාව තක්සේරු කිරීම ද යෝජනා අතර වේ.

"තර්ජනයට ලක් වූ ආවේණික වූ මිරිදිය මසුන් සඳහා අත්‍යවශ්‍ය හදිසි සංරක්ෂණ ක්‍රියාමාර්ග හඳුන්වාදීමට ජාතික රතු ලැයිස්තුගත කිරීමේ ප්‍රයත්නය සම්පතක් ලෙස භාවිත කිරීමට අපට අවශ්‍යයි," ශ්‍රී ලංකාවේ පරිසර හා වනජීවී සම්පත් අමාත්‍යාංශයේ ජෛව විවිධත්ව ලේකම් කාර්යාලයේ ප්‍රධානී පද්මා අබේකෝන් වරෙක පැවසුවාය.

මේ අත්‍යවශ්‍ය සංරක්ෂණ වැඩපිළිවෙල සඳහා අරමුදල් සම්පාදනය කිරීමේ ආයතන ලෙස, රටේ ප්‍රධාන රාජ්‍ය උපයෝගිතා සමාගම් දෙකක් වන ලංකාවේ විදුලිබල මණ්ඩලය (CEB) සහ ජාතික ජල සැපයුම් හා ජලාපවහන මණ්ඩලය (NWSDB) වෙත යෝජනා ඉදිරිපත් කිරීමට රොහාන් පෙතියාගොඩ යෝජනා කර ඇත. ආයතන දෙකම ඔවුන්ගේ මෙහෙයුම් සඳහා රඳා පවතින්නේ කැලණි සහ මහවැලි ගංගාවල මිරිදිය මත්ස්‍ය වාසස්ථාන මත ය. ඔවුන් පිළිවෙලින් ඩොලර් මිලියන 300 කට වඩා උපයන්නේ ජල විදුලිය හා නාගරික ජල සැපයුමෙනි. වර්තමානයේ ජල විදුලි උත්පාදනය හෝ ජල සැපයුම සඳහා භාවිත කරන ස්වාභාවික සම්පත් වෙනුවෙන් නැවත ආයෝජනය කිරීමේ යාන්ත්‍රණයක් මේ රට තුළ නැත.

"මෙම ස්වාභාවික සම්පත් සංරක්ෂණය සඳහා ආයෝජනය කිරීමත් ඔවුන්ට ප්‍රතිලාභයක්" යැයි රොහාන් පෙතියගොඩ පවසා තිබිණි. "ඉපැයීම් වලින් 1% ක් පමණක් සංරක්ෂණ කටයුතු සඳහා නැවත ආයෝජනය කළ හැකි නම්, එයින් විශාල වෙනසක් කළ හැකියි."

ජලය හා විදුලිය සඳහා 5% ක තීරු ගාස්තුවකින් වසරකට ඩොලර් මිලියන 15 ක් පමණ උපයා ගත හැකිව තිබේ. මෙම ගංගා දෙකේ ජලජ ජෛව විවිධත්වයට පමණක් නොව ජෛව විවිධත්වයෙන් පොහොසත් දිවයිනේ සියලුම ස්වාභාවික ජල මාර්ගවලට පරිවර්තනීය බලපෑමක් ඇති කරන්නට මේ අරමුල් මත දියත් වන විධිමත් ව්‍යාපෘති යාන්ත්‍රණයකට හැකි වන බව ඔහු වැඩිදුරටත් කීවේය.

එසේ මේ විද්වතුන් කියමින් ඇත්තේ සිහිනයක් වෙමින් තිබුණු ජීවිත මතකයක් සාධනීය යථාර්ථයක් කරගැනීමට තමත් අප පමා නැති බවය.


(mongabay වෙබ් අඩවිය ඇසුරිනි)




# සරච්චන්ද්‍ර කිත්ගොස

පුතු සෙනේ පිතු හද තුළම මිස නැත පුතුන් හද තුළ රඳන්නේ කිරෙහි සුද අමුතුවෙන් වැනිය යුතු නැතැයි පතළ පිරුළක් ඇති බැවින් මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර පිළිබඳ වත්මන් පාඨක ලෝකයට අමුතුවෙන් හඳුන්වා දීමක් අවශ්‍ය නැතැයි සිතා වත්මන් සමාජ සංස්කෘතික ප්‍රබෝධයට මඟ හෙළි කළ පුරා පුරුෂයන් පිළිබඳ ලියමින් සිටි මේ තීරු ලිපියට සරච්චන්ද්‍ර ගැන සැමරුම් මාත්‍රයක් නොපමාව ලිවිය යුතුය යන සිතුවිල්ල පහළ වූයේ එක් අම්හිරි සිදුවීමක් මුල් කොට ගෙනය. සරච්චන්ද්‍ර සම්මානිත මහාචාර්යතුමාගේ සූවිසි වන මෘත සංවත්සරය යෙදී තිබුණේ 2020 අගෝස්තු 16 වන දිනටය. එතුමන් පිළිබඳ වටිනා ඇගයුමකින් යුත් ලිපියක් සරච්චන්ද්‍ර ඇසුරේ ශිල්ප හදාළ කීර්තිමත් මහාචාර්යවරයකු විසින් ලියන ලදුව ඉරිදා පුවත්පතකට යොමු කෙරුණද අදාළ ලිපිය ඒ පුවත්පතෙහි පළ නොවිණ. දෙස් විදෙස්හි පතළ කිත් රැස් සහිත වියතකුගේ ලිපියකට එවන් ඉරණමක් අත්වීම පිළිබඳ අනාවැකි සරච්චන්ද්‍ර අතින් ලියවුණේ මෙරටෙහි ඊනියා ධර්මිෂ්ඨ දේශපාලන තන්ත්‍රය ස්ථාපිත වූ දා පටන්ය. "පුතු සෙනේ පිතු හද තුළම මිස නැත පුතුන් හද තුළ රඳන්නේ" යනුවෙන් සිංහබාහු නාටකයේ පැවසෙන සනාතන ප්‍රකාශය එතුමන්ගේ උදාර යුග මෙහෙවර නොහඳුනනා සාහිත්‍යකලා විහීන, අකෘතඥ මාධ්‍යකරුවන්ටද මැනවින් ගැළපෙන්නකි. නළු නිළියන්ගේ ඕපදූපවලින් පිරුණු අතිරේක පළ කෙරෙන පුවත්පතක නූතන කලා සංස්කෘතික ප්‍රබෝධයේ පුරෝගාමියකු පිළිබඳ ආවර්ජනයකට ඉඩ අහිමි වීම කෙබඳු සරදමක් ද?

නූතන කලා සංස්කෘතික පුනරුදයට දායක වූ ලාංකිකයන් අතලොස්ස අතුරින් සරච්චන්ද්‍ර මහාචාර්යතුමාට හිමි වන්නේ විශේෂ ස්ථානයකි. එසේ වුවද එතුමන් තරම් දෝෂ දර්ශනයට හා ගර්හාවට ලක්වුණු වෙනත් ශාස්ත්‍රඥයකු, විද්වතකු, කලාකරුවකු නැති තරම්ය. නූතන කලාත්මක සිංහල වේදිකා නාට්‍යය උපත ලබන්නේ නාට්‍ය කලාව සම්බන්ධයෙන් දශක කිහිපයක් තිස්සේ එතුමන් විසින් කරන ලද වෙහෙසකර පර්යේෂණ සහ අත්හදාබැලීම් සමුදායෙහි ප්‍රතිඵල වශයෙනි. පැරණි නාඩගම් ආකෘතිය විශ්ව කලා නිර්මාණවලින් ආභාසය ලැබ කාලානුරූපව සමතික්‍රමණය කොට සුසාධිත අභිරංග සම්ප්‍රදායක් සිංහල වේදිකාවට හඳුන්වා දීමට එතුමන් දැරූ දෘඪ ප්‍රයත්නය නොවන්නට සිංහල වේදිකා නාට්‍ය කලාව තවමත් ළදරු විය පසු නොකරන්නට ඉඩ තිබිණ. මනමේ හා සිංහබාහු නාටකද්වයයෙහි ලා උපයුක්ත නාට්‍යගත කාව්‍යමය වාග් විලාසය සිංහල භාෂාවෙහි අපූර්වතම නිර්මාණ විශේෂයක් ලෙස විද්වත් සම්භාවනාවට පාත්‍ර විය. පාලි විෂය හා සම්බන්ධ විශ්වවිද්‍යාල ආචාර්යවරයකුව සිටියදී සිංහල නවකතාව සම්බන්ධයෙන් එතුමන් විසින් ඉංග්‍රීසි භාෂාවෙන් පළ කරන ලද Modem Sinhalese Fiction නම් කෘතිය සිංහල කලාත්මක නවකතාව පිළිබඳ කෙරුණු ප්‍රථම බැරෑරුම් විචාර පරිශ්‍රමය විය. එවක ලියවුණු නවකතා ගොන්න අතරින් කලාත්මක නවකතාව මේ යැයි නිර්භයව අනාවරණය කෙරුණු ඒ පරිශ්‍රමය නොවන්නට සිංහල නවකතාව පිළිබඳ විනිශ්චයද වෙනස් මුහුණුවරක් ගන්නට ඉඩ තිබිණ.



මහාචාර්ය එදිරිවීර සරත්චන්ද්‍ර

එවකට පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙහි සිංහල මහාචාර්ය ධුරය ඉසිලූ ඩී. ඊ. හෙට්ටිආරච්චි විද්වතාණන් විසින් ගන්නා ලද ඉතා නිවැරදි වූත් දූරදර්ශී වූත් තීරණයක් වූයේ පාලි අධ්‍යයනාංශයේ සේවය කරමින් සිටි එදිරිවීර සරච්චන්ද්‍ර සිංහල අධ්‍යයනාංශයට අනුයුක්ත කර ගැනීමයි. එතැන් පටන් භාෂා අධ්‍යයනය, සම්භාව්‍ය සාහිත්‍ය අධ්‍යයනය යන විෂය ක්ෂේත්‍රවලට සමාන්තරව නාට්‍යය, නවකතාව, කාව්‍යය යන නූතන කලා ප්‍රවර්ග පිළිබඳවද පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සිංහල අධ්‍යයනාංශයේ සරච්චන්ද්‍ර මහාචාර්යවරයා පෙරටු කර ගනිමින් නව ප්‍රබෝධයක් ඇතිවනු දක්නට ලැබිණ. විෂය නිර්දේශවලට පරිබාහිරව විවිධ නිර්මාණ කුසලතා සහිත සිසුන් සරච්චන්ද්‍ර මහාචාර්යතුමාගේ නිර්මාණ පන්තියට සහභාගි වී ඉන් ලද උත්තේජනයෙන් පසු කලෙක නිර්මාණකරණයට අවතීර්ණ වූ අවස්ථා කොතෙකුත් තිබිණ. කලා පීඨයේ සිංහල විෂයක් ලෙස තෝරා නොගත් සිසුන් මෙන් ම වෙනත් පීඨවල සිසුන්ද නිර්මාණ පන්තියට සහභාගි වීම විශේෂත්වයකි.

එදිරිවීර සරච්චන්ද්‍ර අද්විතීය නාට්‍යකරුවකු වන්නා සේම තත් විෂයයෙහි අග්‍රේසර පර්යේෂකයකු ලෙසද පිළිගැනේ. සාම්ප්‍රදායික සිංහල නාට්‍ය කලා විෂයයෙහි කරන ලද විශිෂ්ටතම පර්යේෂණ ග්‍රන්ථය ලෙස සැලකෙන Sinhalese Folk Drama යන කෘතිය සහ එහි සිංහල සංස්කරණය වන සිංහල ගැමි නාටකය යන කෘති අභිභවනය කෙරෙන කෘතියක් මේ වන තෙක් රචනා වී නොමැත. සාහිත්‍ය නිර්මාණයෙහි ලා භාෂා භාවිතයෙහි සුවිශේෂ අංශ කෙරෙහි විමසා බැලෙන සාහිත්‍ය විද්‍යාව නමැති කුඩා ග්‍රන්ථය ගුවන්විදුලි ශාස්ත්‍රීය සංග්‍රහය සඳහා කෙරුණු කතා පෙළක සංස්කරණයකි. අදටත් සාහිත්‍ය නිර්මාණයක භාෂා ව්‍යවහාරය ගැන සිංහල භාෂාවෙන් එබඳු ග්‍රන්ථයක් රචනා වී නොමැත. කලා කෘතිය සහ රසිකයා අතර පවත්නා සහෘද සම්බන්ධතාව ඉතා සියුම් ලෙස පිරික්සා බැලෙන කල්පනා ලෝකය හෘදයග්‍රාහී නිර්මාණ කෘතියක් වැන්න. මීට දශකත්‍රයකට පමණ ඉහත මේ කෘතිය මුල් කොට ගෙන සාහිත්‍ය විචාර ප්‍රහාරයක් එල්ල වූයේ කෘතියේ නාම මාත්‍රය මිස හරය ගැඹුරු සැලකිල්ලකට ගැනීමකින් තොරව බව කාලය අපට පසක් කොට දී තිබේ. කලා නිර්මාණ හා සාහිත්‍යය ඉගෙන ගන්නා විද්‍යාර්ථීයා මුලදීම පරිශීලනය කළ යුතු කෘතියක් ලෙස මේ කෘතිය හැඳින්විය යුතුය.

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සරච්චන්ද්‍ර ඇසුරේ ශාස්ත්‍ර හදාළ විශාල සිසු පරපුරක් නවසිය පනහ දශකයේ මැද භාගයේ පමණ සිට දිවයිනේ නන් දෙස විහිදුණු පාසල්වල ගුරුවරුන් ලෙස සේවය කළ අතර ඒ ගුරුවරුන් වෙතින් ශිෂ්‍ය ප්‍රජාව වෙත ගලා ගියේ පේරාදෙණියෙන් විහිදුණු ශාස්ත්‍රාලෝකයයි. ඒ ගුරුන්ගෙන් ශිල්ප හදාළ සිසු පරපුරෙනි එකල මෙරට ප්‍රබුද්ධ රසික සමාජය නිර්මාණය වූයේ. නවසිය හැත්තෑව දශකයේ ආරම්භයත් සමගම විශ්වවිද්‍යාලයවල කලා පාඨමාලාවලට අත් වූයේ ඛේදජනක ඉරණමකි. බොහෝ කීර්තිමත් ආචාර්යවරු රට හැර ගියහ. සරච්චන්ද්‍ර තම විෂය පථයෙන් බොහෝ දුරස් රාජ දූත සේවයට එක් විණ. කෙමෙන් මෝදු වෙමින් පැවති සංස්කෘතික අන්ධකාරය නවසිය හැත්තෑහතේ බිහි කෙරුණු ධර්මිෂ්ඨ රාජ්‍ය සමයේදී එහි උපරිම තත්වයට ළඟා වීම ඇරඹී තිබිණ. නැවත ලංකාවට පැමිණි සරච්චන්ද්‍ර සිදු වෙමින් පැවති සංස්කෘතික විලෝපනය පිළිබඳ ධර්මිෂ්ඨ සමාජය නමැති කෘතිය රචනා කෙළේය. දේශපාලන නායකත්වය විසින් උසිගන්වනු ලැබූ මැරයෝ සරච්චන්ද්‍ර මහාචාර්යතුමා කානුවකට ඇද දමා රිසි පරිදි පහර දුන්හ. මහාචාර්ය සරච්චන්ද්‍රගේ සමාජීය ජීවිතයේ මේ පැතිකඩ අපගේ සමාජ ඉතිහාසයේද පැතිකඩකි. සරච්චන්ද්‍ර දිවි රඟ මඩලෙන් නික්ම ගියේ සියල්ල අළෙවි වන සමාජයක අළෙවිය සහ බලය යන සාධක දෙක වටා අපගේ ජීවිත භ්‍රමණය වන බව කියා දෙන නිර්මාණ ඉතිරි කර තබමිනි.

# රිටිගල කඳු පාමුල ජීවිත සොයන මිනිස්සු


පූජ්‍ය උණාගොල්ලෑවේ සීලානන්ද හිමි


එස්.ජී. පාවුල් අප්පු


එම්.එල්. ශාන්ති

● සටහන හා ඡායාරූප-තඹුත්තේගම විශේෂ-ඩබ්ලිව්. ප්‍රදීප්

**වැසි වැටෙන කාලය ගැන ඉහ නිකට පැසුණු ගැමියන්ට තිබුණේ හොඳ අවබෝධයකි. එහෙත් දැන් වැසි චක්‍රය ද වෙනස්වී ඇත. එහෙයින්ම වහින දොහක් ගැන හරියට කීමට දන්නා ගැමියන් දැන් ගම්මැදි වල ද අඩුවී තිබේ. මේ අවිනිශ්චිත කාලගුණික විපර්යාසය හේතුවෙන් රජරට යල කන්නය සමහර කාලයකදී වගාවකින් තොරව නිරායාසයෙන්ම මඟහැරී යයි. වසරකට එක කන්නයක් පමණක් වගා කරන තැනට කටයුතු යෙදී තිබේ. එහෙයින්ම වැහි එල අඩු යල් කන්නෙට වෙනම සමාජ, ආර්ථික සහ පාරිසරික ජීවන පෙවෙතකට හුරුවන්නට රජරට වන මායිම් ගම්මැදි ගැමියන්ට සිදුව තිබේ. වැව් සිඳී දිය උල්පත් අවහිර වන ඉඩෝරය මේ ගම්මැදිවල උදවියට දුෂ්කර කාලයකි. වැස්සට කප්පරක් රොන් මඩ පිරුණු වැව් තුළ එකතු වන වතුරින් මහේ කුඹුරු කරතත් යලේ එවැන්නකට මඟ පෑදෙන්නේ නැත. ඇති වතුර ටික ස්නානය ආදී කටයුතු සඳහා ද ඉතිරි කළ යුතුය.**

හොඳ ජල පෝෂක ප්‍රදේශයක් ලෙස පිළිගැනෙන රිටිගල කඳු සිරස පාමුල ගැමියන්ට මුහුණ පෑමට සිදුව ඇත්තේ ද මෙවැනි අභාග්‍යයකටය. අලගොල්ලෑව, උණගොල්ලෑව, පහළ අඹතලේ, ඉහළ අඹතලේ, මුරියාකඩවල, පණ්ඩිත රබාවැව, බමුණුගම, ඌත්තුපිටිය, අම්නිච්චිය ආදි ගම්මැදි ජනයා මේ ජීවන දුෂ්කරතාවයන්ට මැදිව දවස ගෙවති. මේ සාම්ප්‍රදායික ගම්මාන කැකිරාව සහ තිරප්පනේ ප්‍රාදේශීය ලේකම් කොට්ටාශවල පරිපාලනයට නතුව පවතී.

කිලෝ මීටර් 164 ක් නොඑසේනම් සැතපුම් 102 ක් පුරා මන්නාරම් තොට දක්වා ගලායන මල්වතු ඔය ගමන් අරඹනුයේ ද රිටිගල කඳු මායිමේ සිටය. එහෙත් කඳු සිරස පිරිවරා පවතින ගම් බිම් වසරේ වැඩි කලක් ජල අර්බුදයකට මැදිව පවතී. මේ කයෝර මහ පොළොව සමඟම ඔට්ටු වී වයසට ගිය අලගොල්ලෑව ගමේ අසූතුන් වියැති එස්.ජී. පාවුලු අප්පු රිටිගල කන්ද දෙස බලා සුසුම්ලයි. ඔහු මේ ගම්මැද්දේ පරම්පරා කිහිපයක ජීවන ඇවතුම්, පැවතුම්වල වෙනස්වීම මනාව දුටු අයෙකි.

"කිසි කරදරයක් නැතිව මේ වැව් ටික හොදට තියෙන කාලේ මිනිස්සු යල, මහ ගොවිතැන් කරගෙන ජීවත් වුණා. අදටත් මේ ගම්වල රස්සා කරන මිනිස්සු අඩුයි. ගොවිතැනක් බතක් කරගෙන තියෙන හැටියට ජීවත් වෙන්නේ. වැව් ටික ගොඩවෙන්ඩ ගත්තට පස්සේ මිනිස්සුත් අහේනියෙන් ඉන්නේ. ඔය හැම තැනම වැව් හදනවා කිව්වට මේ කඳු පාමුල තියෙන වැව් ටික හදලා දෙන්ඩ මනුස්සයෙක් නෑනේ. අපේ කාලේ දැන් කොහොමත් ඉවරයි. අපිට මහවැලි වතුර හම්බ වුණොත් නෑ. මොරගහකන්ද ජලාශේ ඉඳලා අනුරාධපුරේට කපන ඇළෙන් ගම්මැදි වැව් වලට වතුර දෙන කතාවක් ගියා. දැන් ඒකත් කෙරෙන පාටක් නෑ."

මුවන්, ඌරන්, හාවන්, මීමින්නන්, ඉත්තෑවන් මෙන්ම වන අලි ද දිය සොයා මේ ගම්මැදි වැව් කරා ඇදෙන දසුන මෙසමයෙහි දුලභ නොවේ. කැලෑ කොළයක් සමඟ හෝ බත් කෑමට වී ටික ගෙයි තිබීම ඔවුන්ගේ හිතේ බර අඩු කරයි. යලේ වී වගා නොකෙරෙන හෙයින් ඇති වී ටික තවත් මාස හය හතක් පරිස්සම් කරගත යුතුව ඇත.

මෙකල්හි බොහෝ විට සියඹලා, මුරුංගා, දිවුල් ආදිය වැඩියෙන් එල දරයි. කැලෑ රොදවල ඉඩෝරයට එළබටු එලදාවෙන් ගස් පිරෙයි. එලබටු ටිකකින් වේලක් පිරිමසා ගත හැකිය. ඉඩෝරයට හැඳුණු එලබටු අහුරක් සමහර වැව් කඳු පහළින් ද කඩාගත හැකිය. කරපිංචා පැවිල්ලට හසුවී මැළවී යන්නේ ඉතා කලාතුරකිනි. සියඹලා, කරපිංචා, දිවුල්, කෝන් ආදිය කඩා පොළට ගෙනයෑමට හෝ ගමට හුරුවුණු වෙළෙන්දෙකුට විකුණා කීයක් හෝ සොයාගැනීමට ගැමියන් සමහරෙකු ඔට්ටු වෙති. නැතිනම් ගැමියන්ම පාර අයිනට විත් දිවුල් ටිකක්, මුරුංගා මිටියක් දෙකක් විකුණා ගැනීමට වෙහෙසෙයි. වාසනාවකට තවමත් කෝන්, දිවුල් ආදි කැලෑ පලතුරු මේ ගම්මැදිවල හිඟ නොවේ. ගම්මැදි කුඩා වැව්වල දැල් එලා හෝ බිලීබෑමෙන් බතට මාලු දෙතුන්දෙනෙකු අල්ලා ගැනීම සිරිතය. හිඳෙන වැව් තාවුල්ලේ කංකුන්, මුකුණුවැන්න ආදිය දළුලා එයි.

උණගොල්ලෑව ශ්‍රී වේලුවනාරාම විහාරාධිපති උණගොල්ලෑවේ සීලානන්ද හිමියන් ගැමියන්ගේ මේ ඇවතුම්, පැවතුම් දකිමින් ඔවුන් පිහිට කොට වැඩ වසති. ගැමියන්ගේ ජීවන දුෂ්කරතා පිළිබඳව එහිමියන් පැවසුයේ කණගාටුවෙනි.

"අවුරුද්ද පුරාම ගලන මල්වතු ඔය මේ ගම්මැදි වටේට තියෙන රිටිගල කන්දෙන් පටන් ගත්තට කන්ද පහළ ඉන්න මිනිස්සුන්ට වතුර නෑ. මේ ගම්වල මිනිස්සුන්ට තියෙන ලොකුම අර්බුදේ තමයි මේක. වහින කොට වැව් පිරෙනවා. රොන්මඩ පිරිලා හින්දා වැඩි හරියක් වානෙන් අහකට යනවා. . වැව් හිඳෙන කොට වතුර හොයාගෙන අලි ගම් වදිනවා. මේවා පාරම්පරික ගම්මාන. ගොවිතැනෙන් තමයි වැඩි හරියක් මිනිස්සු ජීවත් වෙන්නේ. කන්නෙට ගොවිතැනක් කරගන්ඩ බැරිවුණොත් මේ මිනිස්සු ප්‍රශ්න ගොඩකට මැදිවෙනවා. කන්ඩ, බොන්ඩ හොයාගන්න එක පවා ලොකු ප්‍රශ්නයක් වෙනවා."


නිලන්ති කුමාරි

සීලානන්ද හිමියන් පැවසූ අන්දමට පෑවිල්ලට අලි ගම්වැදීම ගැමියන්ට ඇති ලොකුම වදයකි. සවසට අලි රංචු වැව් තාවුලු වෙත වදිනුයේ වතුර පිපාසයෙනි. කැලේ අලි, ඇතුන් උන් උන් ඇන කොටා ගන්නා අවස්ථාවන් මෙකල්හි සුලභ වේ. වියළි උඩු සුළඟ විටෙක පහළට එන්නේ ගම්මැදි ගුරු පාරේ දූවිලි අවුස්සමිනි. අඩ සඳ කඳු මුදුනෙන් ඉස්සෙන රාත්‍රියක තරු එළි මළානික වෙයි. හිටිහැටියේ ගම් මායිම දෙවනත් කරන වල් අලියෙකුගේ හඬින් ගහ කොල පවා තිගැස්සෙයි. ඒ හැම විඳිමින්, දකිමින් ජීවිතය ජීවත් කරවන්නට ගැමියන් දුක් විඳිති. සියල්ලට නොදෙවැනිව මෙසමයෙහි බොන වතුර හිඟකම මේ ගම්මැදිවල ඇවිලෙන ලොකුම ගැටලුවයි. සමහරෙකු අතේ ඇති කීයක් හෝ දී බොන වතුර ටික මිලට ගනියි. නැති බැරිකම ඉහවහා ගිය විට බොර වූ වැව් වතුර වුවත් පෙරා බීමට ගැමියන්ට සිදුවේ. පණ්ඩිත රබාවැව රිටිගල කඳු පාමුල පිහිටි පාරම්පරිකව වළං කර්මාන්තයේ

නියැළෙන ගැමියන් වෙසෙන ගම්මානයකි. සිය සැමියා හා එක්ව වළං නිෂ්පාදනයේ යෙදෙන නිලන්ති කුමාරි මහත්මිය පැවසුයේ පායන කාලේ ඇතිවන ජල අර්බුදය සිය ජීවනෝපාය සඳහා ද මරු පහරක් වී ඇති බවය. අලගොල්ලෑව ගමේ එම්.එල්. ශාන්ති මතුව ඇති ජල දුෂ්කරතාවය ගැන කරුණු කීවාය.

"මේ කාලෙට ගමේ ඔක්කොම ළිං හිඳෙනවා. හැම කෙනෙක්ම වගේ බොන්ඩ වතුර ගන්නේ සල්ලි දීලා. වතුර වාහනේ එන වෙලාවට අතේ සල්ලි තිබ්බේ නැත්නම් බොන්ඩ වතුර නෑ. කාලෙකට කලින් ගමට වතුර දෙන්න කියලා පටන් ගත්ත ව්‍යාපෘතිය නිකංම විනාශ වෙලා ගියා. හදපු ටැංකි දෙකක්, වතුර ගන්න ළිඳ ඔක්කොම විනාශයි.

ගමපුරා එළලා තියෙන්නේ බාල බට. ඒවත් දැන් නිකංම විනාශ වෙලා තියෙන්නේ. හැම ගෙදරකටම වගේ වතුර දෙන්ඩ කරාම හයිකෙරුවා. ඒවත් දැන් ගන්ඩම දෙයක් නෑ. බොන වතුර සල්ලි දීලා ගත්තත් උයන්ඩ පිහන්ඩ අනිත් දේවල් වලට වතුර ගන්නේ කොහෙන්ද ? ගමටම තියෙන්නේ එක පොදු ළිඳයි. මහවැලි වතුර මේ ගම්මැදි වැව් වලට ද දෙන මඟක් හැදෙන්නේ නම් ගැමියන්ට ඊට වඩා දෙයක් නැත. එහෙත් ඒ බලපොරොත්තු තවමත් ඔවුනට සිහින පමණකි.


හැන්දෑ අඳුර ගමට පාත්වන විට අලි ගම වටකරන හඬ පවා ගැමියන්ගේ සිත් සසල කරවයි. වතුර පිරවූ කළ,

බුලි රැගත් ගැමියන් ගම්මැදි පාර දිගේ නිවෙස් කරා ගමන් කරති. ඒ බීමට නොව එදිනෙදා ඕනෑ එපාකම් සඳහා ජලය ගෙනඑන්නට කොහේ හෝ දුරට ගිය පිරිසය. ලඳු කැලෑ, බඩ වැටි, වෙල් ලියැදි, උඩ පැල, බිම පැල මත ගෙවීයන මේ ගැමියන්ගේ ජීවිත වෙත හව්හරණක් අවැසිව ඇත. ඔවුන් සහනාධාර කිසිත් නොඉල්ලයි.

එහෙත් මේ ජීවන දුෂ්කරතාවයන් සඳහා යම් අතදීමක් ඉල්ලයි. ගැමි ජීවන සුවඳට ඇලුම් කරන සිරිල් සමරකෝන් දුකම සතුට කොට විඳින ගම්මැද්දේ ජීවිත අපට කීවේ මෙසේය.

"මොන කරදරේ තිබුණත් තාමත් මේ ගම්මැදිවල මිනිස්සු හවසට වතුර ටිකක් නාගෙන තියෙන දෙයක් හදාගෙන කාලා සැනසිල්ලේ ජීවත් වෙනවා. තද පෑවිල්ලක් එනකොට මිනිස්සු පුදුම තරම් දුකක් විඳින්නේ. යන්තන් පහුගිය මහ කන්නේ ගොවිතැනක් කරගත්ත එකෙන් කන්ඩවත් වී ටිකක් ගෙවල්වල ඉතුරු වෙලා තියෙනවා. වැස්සේ නැත්නම් යල් කන්නේ ගොවිතැනක් කරන්ඩ වෙන්නේ නෑ. අපිට තියෙන ප්‍රශ්න ගැන කාට කිව්වත් සහනයක් නෑ. හැම මනුස්සයටම ජීවත් වෙන්ඩ මොකක් හරි මාර්ගයක් තියෙන්ඩ ඕනනේ. ගොවිතැන් කරන අපිට ඕන වතුර. වතුර නැතිකමින් තමයි හැම අහේනියක්ම. කන්නෙට වගාවක් කර ගත්තොත් හිතේ සැනසිල්ලේ ඉන්න පුලුවන්. ඒ සැනසිල්ල කවදා එයිද කියලා තමයි හිතාගන්ඩ බැරි."

එක් පසෙකින් රිටිගල කන්දත් අනෙක් පසින් ලබුනෝරුව කන්දටත් මැදි වූ ගම්මුන් කොයි මොහොතේ හෝ ජනතා නියෝජිතයෙක් පැමිණ තම ගමට සෙතක් සලසනු ඇතැයි කියා බලා සිටි. ඒ ආවත් නැතත් කිසිවෙකුට දෙස් දොවොල් නොතබන ඔවුහු සියලු බැරි අමාරුකම් මැද දවස ගෙවති.





# නකල්ස් වන පෙතේ පෞද්ගලික ඉඩම් රජයට

● සටහන හා ඡායාරූප නාඋල සමූහ ඉන්දික අරුණ කුමාර

**නකල්ස් පාරිසරික ආරක්ෂණ කලාපයේ මාතලේ දිස්ත්‍රික්කයට අයත් පුද්ගලික ඉඩම් අක්කර 1600ක් අත්පත් කරගැනීමේ කටයුතු කඩිනමින් අවසන් කිරීමට රජය තීරණය කිරීම සම්බන්ධයෙන් හා නකල්ස් කළාපයේ ඇති පාරිසරික විද්‍යාත්මක වැදගත්කම සම්බන්ධයෙන් මේ දිනවල සමාජ කතිකාවක් නිර්මාණය වී තිබේ.**

මාතලේ අතිරේක දිස්ත්‍රික් ලේකම් ඉෂාන් විජේතිලක මහතා පසුගිය දා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් නකල්ස් පාරිසරික ආරක්ෂණ කලාපය තුළ පිහිටි පුද්ගලික ඉඩම් අත්පත් කරගැනීමේ වැඩසටහනේ ප්‍රගති සමාලෝචන රැස්වීමට සහභාගි වෙමින් දැක්වූ කරුණුවලට අනුව නකල්ස් සංරක්ෂණ කලාපයට අයත් ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් තිස්එක් දහසක් පමණ වෙයි.

නකල්ස් සංරක්ෂිත කලාපයේ මාතලේ පිටවල පතන ආශ්‍රිතව ඇති ගෝනමඩවත්ත නම් පුද්ගලික ඉඩමේ අක්කර 1600ක ප්‍රමාණයක් අත්පත් කරගැනීමේ කටයුතු මේ දිනවල සිදුවෙමින් පවතින බව ද ඉෂාන් විජේතිලක මහතා කියා සිටියේය.

මෙම පුද්ගලික ඉඩම් අත්පත් කරගැනීමේදී අයිතිකරුවන් සොයා ගැනීමට අපහසු වීම, අයිතිකරුවන් ඉදිරිපත් නොවීම වැනි ගැටළුද පවතින බව මෙම ප්‍රගති සමාලෝචන රැස්වීමේදී අනාවරණය විය. මේ වන විට ගෝනමඩවත්ත පෞද්ගලික ඉඩම් මිනුම් කටයුතු කර තක්සේරු කිරීමේ කටයුතු අවසන් අදියරේ පවතින බව ද මෙහිදී අනාවරණය විය.

විවිධ වකවානු වල ලංකාවේ හදවත බඳු වූ නකල්ස් වන පෙතට අඩන්තේට්ටම් කළෝ බොහෝය.

ඔවුන් අතරින් ඇතැමෙක් නකලස් හි වන සතුන් දඩයම් කළේය. වටිනා ගහ කොල විවිධ කරුණු අරභයා රැගෙන ගියෝය. පැවැති රජයන් විසින්ම නකලස් වන භූමියේ වටිනා ඉඩම් හිතවතුන්ට කුණු කොල්ලයට ලබාදීමට උත්සහා දැරිය. මහනුවර සහ මාතලේ දිස්ත්‍රික්කය වසා පැතිර පවතින නකලස් කඳුවැටිය දකුණින් සහ නැගෙනහිරින් මහවැලි නිම්නයෙන්දො, බටහිරෙන් මාතලේ නිම්නයෙන්ද,ශ්‍රී ලංකාවේ මධ්‍යම කඳු වැටියෙන් වෙන්ව පවතී.

කඳුවැටියේ බටහිර බෑවුමේ අධික බට වර් ග වලින් වැසි තිබෙන බැවින් පැරැන්නන් විසින් 'බටදඩුකන්ද ලෙසය.

උස් කඳු ශිකර නිතරම වාගේ මීදුමින් වැසි තිබෙන බැවින් 'දුම්බර කඳුවැටිය' ලෙසත් නකලස් කඳු පංතිය හඳුන්වනු ලබයි.

හෙක්ටයාර් 15000ක් මාතලේ දිස්ත්‍රික්කයට අයත් වන අතර, ඉතිරිය මහනුවර දිස්ත්‍රික්කයට අයත් වේ.

ශ්‍රී ලංකාවේ ගිනිකොණ සිට වයඹ දිශාවට ලග්ගල සිට ඌරුගල දක්වා සැ.12 පමණ දිගකට මේ කඳුවැටිය පැතිරී පවතී. ප්‍රධාන කඳුවැටියේ ඇති ශිකර කිහිපයක් නම් දෝතළුගල (5164), කොබෝනිගල (5098), නකල්ස් (6112), ගොම්බානිය (6248) වශයෙන් පිහිටා තිබේ.

මෙයට අමතරව ප්‍රධාන කඳුවැටියේ උතුරු කොටසින් ආරම්භ වී ඊසාන දිග දිසාවට විහිදෙන කළුපහන (5341), වාමාරපුගල (5150), ලකේගල (4324), සහ ලබුලැස්සපතන (4901) ද, දකුණු කොටසින් ආරම්භ වී ඊසාන දිසාවට විහිදෙන දුම්බානගල (5383), ගල්තුල (3784), ප්‍රධාන විහිදුම් ලෙස සලකනු ලබයි.

ප්‍රධාන කඳුවැටියත් ඒ ආශ්‍රිත විහිඳුනු කඳු පන්තියත් ඇතුළු ප්‍රදේශය දල වශයෙන් වර්ග සැතපුම් 62 පමණ වේ.

පාරිසරික වශයෙන් අතිශයින්ම වැදගත් වූ මෙරට පරිසර පද්ධති තුනක් කේන්ද්‍රකර ගනිමින් මෙම ශීඝ්‍රරය ලෝක උරුමයක් ලෙස ප්‍රකාශයට පත්කර තිබේ. බ්‍රසීලයේ බ්‍රසීලියා නගරයේ පැවැත්වුණු ලෝක උරුම කමිටුවේ 34 වැනි සැසිවාරයේදී මෙම නම් කිරීම සිදුකර ඇති අතර ඒ සමඟම ඇමරිකාවේ හවායි දූපත් සමූහයේ දූපත් කිහිපයක් ද ලෝක උරුම ලෙස නම්කර තිබේ.

හෝර්ටන් තැන්න ජාතික වනෝද්‍යානය සහ ශ්‍රී පාද අඩවි වනාන්තරයේ ශාක හා සත්ත්ව ප්‍රජාව සම්බන්ධයෙන් සිදුකරන ලද පුළුල් අධ්‍යයනයන් පදනම් කරගනිමින් මෙම යෝජනාව යුනෙස්කෝ සංවිධානයේ ලෝක උරුම කමිටුවට ඉදිරිපත් කර ඇත.

එංගලන්ත සුදු අධිරාජ්‍ය පාලන සමයේ දී නකලස් හි මහ වනය කපාතේ මෙන්ම එනසාල් වගා කර ඇති බවට සාක්ෂි කොතෙකුත් නකලස් පරිසර පද්ධතියේ ගමන් ගන්නා ඕනෑම අයෙකුට දැක ගත හැකිය.

ඉතිහාසය පිරික්සන්නෙකුට අනාවරනය වන කරුණු වලට අනුව එසේ කපන ලද වසර ගණනක් ඉපැරණි ශාක වෙනත් රටකට ගෙනයාමේ නොහැකියාව හේතුවෙන් (ප්‍රවාහන පහසුකම් නොමැතිකම) ගිණි තබා පුළුස්සා දැමූ බව ඉතිහාසයේ දැක්වෙයි.

එහෙව් පසුබිමක නැවත ජීවය ලබාදෙමින් වතු ආශ්‍රිත තේ කර්මාන්තය නගා සිටුවීමට වත්මන් රජය පිඹුරු පත් සකසද්දී මෙවර මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් අසන්නට ලැබුණේ නකල්ස් හි පෞද්ගලික භූමි රජයට අත්පත්කර ගැනීමට පියවර ගනිමින් සිටින බවයි.

ඒ සඳහා අවශ්‍ය පසුබිම දැන් වැටී තිබේ. වසර දහස් ගණනක් පැරණි අපේ ගහකොල මෙන්ම සතා සීපාවාටත් වඩා වැදගත් වන සත්ව විශේෂ මෙන්ම ශාක විශේෂ ද නකලස් පරිසර පද්ධතියේ පැවීම හේතුවෙන්ම එය ලෝක උරුමයක් බවට පත්වී තිබේ.

ලෝක සංරක්ෂණ සංගමය විසින් සිදුකළ අධ්‍යයනයන්ට අනුව කුල 141 කට අයත් සපුශ්ක ශාක විශේෂ 1033 ක් නකල්ස් රක්ෂිතයෙන් හඳුනාගත හැකිය.

ඒ අතුරින් ශාක විශේෂ 160ක් ශ්‍රී ලංකාවටම ආවේනික ශාක වීම අප ලද භාග්‍යයකි. දැවමය ශාක විශේෂ 225 ක් හා නකලස් රක්ෂිතයටම ආවේනික ශාක විශේෂ 6 ක් ද මේ අතර සොයාගෙන තිබේ.

රක්ෂිතයේ මිවන ශාක විශේෂ 42 ක් පමණ පවතින අතර ඉන් ශාක විශේෂ 6 ක් ලංකාවට පමණක් ආවේනික බව තහවුරු වී තිබේ. වර්ථමාන පෘෂ්ඨවංශි සත්ව විශේෂ අතරින් විශේෂ 16 ක් නකල්ස් රක්ෂිතයට පමණක් ආවේනිකව ජීවත්වෙති. මේ අතර උභයජීවී විශේෂ 08 ක්, උරග විශේෂ 05 ක් හා මත්ස්‍ය විශේෂ 03 ක්, ලංකාවට ආවේනික පක්ෂි විශේෂ 33 ක් අතරින් 30 ක් දුම්බරක දූකරයේ ජීවිතය ගත කරති.

එපමනක් ද නොව මහවැලි ජලයෙන් සියයට 30 ක් පමණ ආවරණය වන්නේ නකල්ස් රක්ෂිතය සතු වන වැස්ම මගින් වීම ද විශේෂත්වයකි. මොරගහකන්ද, කළුගඟ වාරි ව්‍යාපෘතියේ ප්‍රධාන ජල පෝෂක ප්‍රදේශය වන්නේ ද නකල්ස් රක්ෂිතයයි. ඒ තුළින් රජරට ස්වයංපෝෂණය වීම හරහා නකලස් වන වියන හරහා නිපදවෙන ස්වභාවික ජලය මුළු මහත් රටටම බත සැපයීමට දායක වීම ද සිදුවෙයි.

මෙවැනි වටිනාකම් රැසකින් සමන්විත නකලස් වන භූමියේ පෞද්ගලික ඉඩම් රජයට පවරාගෙන මානව ක්‍රියාකාරකම් වලින් තොර කිරිම හෝ සුදුසු වන වගාවන් ඇති කරලීම කාලීන මෙන්ම සමාජ වැදගත් කමකි.

වසර ගණනාවක් තිස්සේ ඇදි ඇදී යන මේ කටයුත්ත ඉටුකරන්නට මාතලේ රාජ්‍ය නිලධාරින් මේ වන විට සාධනීය පියවරයන් රැසක් ගෙන තිබීම කාලෝචිත ක්‍රියාවකි.

නකලස් වන පෙතේ පෞද්ගලික ඉඩම් අත්පත් කරගැනිමේ සමාලෝචන රැස්වීම සදහා ඉඩම් අමාත්‍යංශයේ සහකාර අධක්ෂ (අත්පත්කර ගැනීම්) කෝකිලා හේමචන්ද්‍ර , ලග්ගල ප්‍රාදේශීය ලේකම් එස්. විජේකුමාර් , නියෝජ්‍ය වන සංරක්ෂක ප්‍රියන්ත සේනාධීර, මාතලේ දිසා වන නිලධාරි එන්. ආර් ප්‍රසාද්, දිසාවන නිලධාරි අශෝක බණ්ඩාර හේරත්, වන පාලක කේ. ආර්. ඉලුක්කුඹුර යන) මහත්මින් ඇතුලු නිලධාරින් රැසක් සහභාගි විය.


ප්‍රගති සමාලෝචන රැස්වීම සඳහා සහභාගී වූ නිලධාරින් පිරිස.

සිළුමිණ වාණිජ මණ්ඩලී මෙම පිටු එකතුව ව්‍යාපාරික ඔබ වෙනුවෙන්ම සැකසෙන විශේෂ අතිරේකයකි.
ඔබේ දේශීය-විදේශීය ව්‍යාපාර පුවත්, ප්‍රවෘත්ති නිවේදන, ජායාරූප සහ නවතම පුවත් අප වෙත යොමු කරන්න.
සුළු, මධ්‍ය සහ මහා පරිමාණ ව්‍යාපාරික තොරතුරු සමාජයට විවර කිරීමට ඔබ පවත්වන මාධ්‍ය සාකච්ඡා සහ ගවේෂණ චාරිකාද යොමු කරන්නේ නම් මැනවි.
සියලු ලිපි පහත ලිපිනයට පමණක් එවිය යුතු වේ.
සිළුමිණ වාණිජ මණ්ඩලී, ලේක්හවුස් - කොළඹ 10.

## හෙට ලොවට මග කියන ව්‍යාපාරික අත්වැල

දුරකථන : කර්තෘ - 011 2429261
දැන්වීම් කළමණාකරු - 011 2429429 දිගුව 351
විද්‍යුත් ලිපිනය : edmediaunit@gmail.com

# වාණිජ මණ්ඩලී



# නායකත්ව හා මෘදු කුසලතා වර්ධනයට INSEE සිමෙන්ති සමාගම දායක වෙයි

**තාක්ෂණික විෂය වැඩසටහන් සඳහා මා.ස.අධි. හා කළම්බු බිස්නස් ඇන්ඩ් මැනේජ්මන්ට් ආයතනය සමඟ අවබෝධතා ගිවිසුමකට අත්සන් තබයි. ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම සිමෙන්ති නිෂ්පාදකයා වන INSEE සිමෙන්ති සමාගම පසුගියදා ශ්‍රී ලංකා මාර්ග සංවර්ධන අධිකාරිය සහ කළම්බු බිස්නස් ඇන්ඩ් මැනේජ්මන්ට් ආයතනය (CSBM) සමඟ විශේෂ අවබෝධතා ගිවිසුමකට අත්සන් තැබීය.**

මාර්ග සංවර්ධන අධිකාරියට අනුයුක්තව ශ්‍රී ලංකාව පුරා විසිරී සිටින 200කට අධික ඉංජිනේරුවන්ගේ නායකත්ව හා මෘදු කුසලතා දියුණු කිරීම එහි අරමුණ වේ. එහි දී ක්‍රමෝපායික වශයෙන් සැලසුම් කරන ලද තාක්ෂණික විෂය වැඩසටහන් පෙළක් ඔස්සේ එම ඉංජිනේරුවන්ගේ මූලික නායකත්ව හා කළමනාකරණ දක්ෂතා වැඩිදියුණු කෙරෙනු ඇත.

මෙම අවබෝධතා ගිවිසුම අත්සන් කිරීමේ අවස්ථාවට අදාළ පාර්ශ්ව නියෝජනය කරමින්, මාර්ග සහ මහාමාර්ග අමාත්‍යංශයේ ලේකම් ආර්. ඩබ්. ආර්. පේමසිරි, මාර්ග සංවර්ධන අධිකාරියේ සභාපති සී. පී. අහුළුවගේ හා අධ්‍යක්ෂ ජෙනරාල් කමල් අමරවීර, CSBM හි සභාපති මහාචාර්ය රංජිත් බණ්ඩාර, INSEE සිමෙන්ති සමාගමේ විධායක උප සභාපති- විකුණුම්, අලෙවි සහ නවෝත්පාදන යාන් කුනික් සහ INSEE සිමෙන්ති සාමාන්‍යාධිකාරී නන්දන අමුනුතුදුව යන අය සහභාගී වූහ. පසුගිය කාලය මුළුල්ලේම ඉංජිනේරුවන්, තාක්ෂණික නිලධාරීන්, පෙදරේරුවන් සහ සිසුන් ඇතුළු ප්‍රධාන පාර්ශ්වකාර කණ්ඩායම් සවිබල ගැන්වීමට INSEE සිමෙන්ති සමාගම විශාල දායකත්වයක් සපයා තිබේ. ඒ යටතේ විශේෂයෙන්ම නව දැනුම සහ විශේෂඥතාව පිරිනමමින් ඉදිකිරීම් ක්ෂේත්‍රය හා බැඳුණු මානව සම්පත්වල දක්ෂතා හා කුසලතා සංවර්ධනය කිරීමට INSEE සමාගමට හැකිවී ඇත.



# කොමර්ෂල් බැංකුවේ කාර්ය මණ්ඩලයෙන් තෙල්දෙණිය මූලික රෝහලට පරිත්‍යාගයක්

**කොවිඩ්-19 වසංගතය නිසා පීඩාවට පත් ජනතාව වෙනුවෙන් සහන සැලසීම සඳහා කොමර්ෂල් බැංකුවේ විධායක නිලධාරීන්ගේ සංගමයේ (ACBE) මූලිකත්වයෙන් සේවකයන්ගේ දිනක වැටුප පරිත්‍යාග කරමින් කොවිඩ්-19 ප්‍රතිකාර මධ්‍යස්ථානයක් බවට පත්කර තිබෙන තෙල්දෙණිය දිස්ත්‍රික් මූලික රෝහල සඳහා අත්‍යවශ්‍ය වෛද්‍ය උපකරණ පසුගියදා පරිත්‍යාග කිරීමට කටයුතු කරන ලදී.**



මෙම පරිත්‍යාගයට ඉක්මන් ප්‍රතිකාර ඒකකයට සහ හදිසි ප්‍රතිකාර ඒකකයට භාවිත කළ හැකි Video Laryngoscope යන්ත්‍ර දෙකක් සහ Multipara මොනිටර් 10ක් අයත් වේ.

කොමර්ෂල් බැංකුවේ ආයතනික කළමනාකාරීත්වය, මැදපෙළ කළමනාකාරීත්වය සහ විධායක මෙන්ම විධායක නොවන ශ්‍රේණිවල සේවය කරන බොහෝ පිරිසක් මෙම සත්කාරය සඳහා සහභාගී වූ අතර රුපියල් මිලියන 5.84 කට ආසන්න මුදලක් මේ සඳහා එකතු වූ බව බැංකුව සඳහන් කරයි. කොවිඩ්-19 අභියෝගයට හොඳින් මුහුණ දෙමින් එය ජයගැනීම සඳහා ඉතාමත් සාර්ථකව මෙම වසංගතය කළමනාකරණය කළ මෙරට සෞඛ්‍ය අංශයට ගෞරවයක් ලෙස කොමර්ෂල් බැංකුවේ විධායක නිලධාරීන්ගේ සංගමය විසින් කොවිඩ්-19 සමඟ පෙරමුණේ සටන් කරන අනිකුත් රෝහල් සඳහාත් මෙලෙස සහයෝගය දැක්වීමට සැලසුම් කර තිබෙන බව ද බැංකුව පවසයි.

මෙම වටිනා වෛද්‍ය උපකරණ මහනුවර ජාතික රෝහලේ අධ්‍යක්ෂවරයා වෙත කොමර්ෂල් බැංකුවේ ප්‍රධාන මෙහෙයුම් නිලධාරී සනත් මනතුංග සහ ආයතනික කළමනාකාරීත්වයේ සාමාජිකයින් විසින් නිල වශයෙන් ප්‍රදානය කරන ලදී.

# මහජන බැංකුවේ රාජගිරිය සේවා මධ්‍යස්ථානය නව පරිශ්‍රයකට



**මහජන බැංකුවේ රාජගිරිය සේවා මධ්‍යස්ථානය නව පරිශ්‍රයක විවෘත කිරීම පසුගියදා මහජන බැංකුවේ සභාපති සුජීව රාජපක්ෂ හා ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී රංජිත් කොඩිතුවක්කු යන අයගේ ප්‍රධානත්වයෙන් සිදුකෙරිණි.**

රාජගිරිය. පරණ කෝට්ටේ පාර, අංක 34 දරන ස්ථානයේ විවෘත කෙරුණු පුළුල් ඉඩ පහසුකමින් පිරි මේ සේවා මධ්‍යස්ථානය අති නවීන තාක්ෂණයෙන් සහ සුවිශේෂී සේවාවන්ගෙන් සමන්විතය. එමෙන්ම මෙහි ස්ථාපිත කර ඇති මහජන බැංකුවේ ස්වයං බැංකුකරණ ඒකකය (Self Banking Unit) තුළින් මුදල් ආපසු ගැනීමේ සහ මුදල් තැන්පත් කිරීමේ පහසුකම් සතියේ දින 7 පුරා, දිනපතා පැය 24 පුරාම අත්විඳිය හැකිය.

මෙම අවස්ථාවට ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ නියෝජ්‍ය නගරාධිපති ප්‍රේමලාල් අතුකෝරල, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් ශිරෝමි ජීවමාලා, මහජන බැංකුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පුද්ගල කේන්ද්‍රීය බැංකු කටයුතු) කේ.බී රාජපක්ෂ, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ශාඛා කළමනාකරණ) ලයනල් ගලගෙදරල නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිනි (ව්‍යවසායකත්ව බැංකු කටයුතු) ක්‍රිෂානි නාරංගොඩ, සහකාර සාමාන්‍යාධිකාරී (අලෙවිකරණ) ඒ.යූ.ඒ අන්සාර්, කොළඹ පිටත ප්‍රාදේශීය කළමනාකාරිනි තුෂාරි හේවාවසම්, සහකාර ප්‍රාදේශීය කළමනාකාර කළමනාකාරවරියන්, නුගේගොඩ ශාඛා කළමනාකාර ඩී. එල් ජයවර්ධන, රාජගිරිය සේවා මධ්‍යස්ථාන කළමනාකාරිණී රුවනි ඉලංපෙරුම යන අය හා ගනුදෙනුකරුවන් විශාල පිරිසක් සහභාගී වූහ.

# වෙස්ටර්න් යුනියන් සමාගම සෙලාන් බැංකුව සමඟ එක්වෙයි

WesternUnion WU

SEYLAN BANK PLC

**වෙස්ටර්න් යුනියන් සමාගම හා අත්වැල් බැඳගනිමින්, ලොවපුරා සිය ආදරණීයයන් සමඟ සම්බන්ධ වීමේ අවස්ථාව සියලු ශ්‍රී ලාංකික ජනතාව වෙත හිමිකර දීමට දැන් සෙලාන් බැංකුව කටයුතු සලසා දී ඇත.**

මෙමගින් දිවයින පුරා විසිරී ඇති 172 කට අධික සියලුම සෙලාන් බැංකු ශාඛා තුළින් ඔබේ විදේශ මුදල් ප්‍රේෂණය ලබාගැනීමට හැකියාව සලසා දී ඇත.

විදේශ මුදල් හුවමාරුවේදී වෙස්ටර්න් යුනියන් සමාගම සතු සුවිශේෂී හැකියාව නිසා ලොව පුරා බැංකු සමඟ ගනුදෙනු නොකරන සහ අඩු බැංකුකරණ පහසුකම් සහිත මිලියන ගණනක් වූ ගනුදෙනුකරුවන් එම සේවාවන් සැපයීමට හැකිවී ඇත. Agent Locator Link හරහා තම ගනුදෙනුකරුවන් හට ළඟම පිහිටි සේවා පරිශ්‍රය පිළිබඳ තොරතුරු ලබාගැනීමට සලසා ඇති බැවින් ඕනෑම සෙලාන් බැංකු ශාඛාවක් මගින් තම ප්‍රේෂණ මුදල් ලබාගැනීමේ අවස්ථාව සලසා දී ඇත.

වර්ධනය වන දේශීය මූල්‍ය ආයතන සමඟ සම්බන්ධවීම සඳහා වෙස්ටර්න් යුනියන් සමාගම සතු සුවිශේෂී හැකියාව හේතුවෙන් ලොව පුරා බැංකු සමඟ ගනුදෙනු නොකරන සහ අඩු බැංකුකරණ පහසුකම් සහිත මිලියන ගණනක් වූ ජනතාවකට එම සේවාවන් ළඟාකරවීමට හැකිවී ඇත.

# කුමාරිකා සහ බේබි ෂෙරමි සන්නාම නේපාලයට

**බේබි ශෙරමි (Baby Cheramy) සහ කුමාරිකා (Kumarika) සන්නාම නේපාල වෙළඳපොළට හඳුන්වා දීමට හේමාස් කන්සියුමර් බ්‍රෑන්ඩ්ස් සමාගම (Hemas Consumer Brands) පසුගියදා කටයුතු කළේය.**

නේපාලයේ එවරස්ට් හෝටලයේදී පැවති ඒ අවස්ථාව සඳහා නේපාලයේ හිටපු අගමැති ගරු ජාලා නාත් ඛනල්, හේමාස් මැනුෆැක්චරින් සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂ රෝයි ජෝසප්, නේපාලයේ හේමාස් බ්‍රෑන්ඩ්ස් විධායක බෙදාහැරුම්කරු හජුර්ලායි නමස්තේ ට්‍රේඩ් ලින්ක් සමාගමේ සභාපති ටාරා බහදූර් කුන්වාර් ඇතුළු සම්භාවනීය අමුත්තෝ රැසක් සහභාගී වූහ.



විශිෂ්ටත්වය වෙනුවෙන් හේමාස් මැනුෆැක්චරින් සමාගමේ (Hemas Manufacturing) ජාත්‍යන්තර ව්‍යාපාරික අංශය දක්වන කැපවීම තහවුරු කරමින් එම සමාගම 2019 වසරේ ජාතික අපනයන මණ්ඩල සම්මාන උළෙලේදී 'වෙනත් කර්මාන්ත නිෂ්පාදන කාණ්ඩය' යටතේ රන් සම්මානය ද, SLIM සන්නාම විශිෂ්ටතා සම්මාන උළෙලේදී වසරේ අපනයන සන්නාමයට හිමි සම්මානයෙන් පිදුම් ලැබීමටද සමත් විය. හේමාස් මැනුෆැක්චරින් සමාගම (Hemas Manufacturing) , වසර 70ක ප්‍රෞඪ ඉතිහාසයකට හිමිකම් කියන මෙරට විශාලම සමාගම් සමූහයක් වන හේමාස් හෝල්ඩින්ග්ස් සමූහයට අනුබද්ධිත සමාගමකි.

# Daraz සමඟ ශ්‍රී ලංකා තැපැල් සේවය එකඟතාවකට

**ශ්‍රී ලංකාවේ විශාලතම අන්තර්ජාලගත අලෙවි අවකාශය වන Daraz, පාරිභෝගිකයන් විසින් මිලදී ගත් භාණ්ඩ ආපසු බාරදීමේ ක්‍රියාවලිය වඩාත් පහසු කරන්නට ශ්‍රී ලංකා තැපැල් සේවය සමඟ අවබෝධතා ගිවිසුමකට එළඹ තිබේ.**

Daraz වෙනුවෙන් එහි කළමනාකාර අධ්‍යක්ෂ රබීල් ප්‍රනාන්දු සහ ශ්‍රී ලංකා තැපැල් සේවය වෙනුවෙන් තැපැල්පති රංජිත් ආරියරත්න යන අය පසුගියදා ශ්‍රී ලංකා තැපැල් මූලස්ථානයේදී ඒ සඳහා වන අවබෝධතා ගිවිසුමට අත්සන් තැබූහ. Daraz - ශ්‍රී ලංකා තැපැල් අවබෝධතා ගිවිසුමේ පළමු අදියරේදී මුළු දිවයිනම ආවරණය වන පරිදි තෝරාගත් තැපැල් කාර්යාල 650 කදී Daraz භාණ්ඩ ආපසු භාරගැනීමේ කටයුත්ත සිදුකෙරෙන අතර ඉදිරියේදී ශ්‍රී ලංකා තැපැල් දීප ව්‍යාප්ත කාර්යාල 2500 - 3000 ක ප්‍රමාණයකදී මෙම සේවාව ක්‍රියාත්මක වනු ඇත.




Daraz වෙබ් අඩවියේ https://bit.ly/returnsdropoff වෙත පිවිසීමෙන් ඔබට ළඟම තැපැල් කාර්යාලය තෝරාගනිමින් මිලදීගත් කිලෝ 3 දක්වා බරකින් යුතු භාණ්ඩ, දිවයින පුරා තැපැල් කාර්යාල 650 කදී ආපසු බාරදීමේ පහසුකම දැන් ක්‍රියාත්මකය.

# Samsung Sri Lanka වෙතින් අනගි අවස්ථාවක්

**Samsung විසින් 5G තාක්ෂණය සූදානම්ව ඇති වෘත්තීය කටයුතු සහ විනෝදාස්වාදය සඳහා ගැළපෙන අසමසම ස්මාර්ට් ජංගම දුරකථන වූ තම ප්‍රමුඛ පෙළේ Galaxy Note20 සහ Galaxy Note20 Ultra යන දුරකථන දෙක පෙර වෙන්කරවා ගැනීම් සඳහා විවෘත කරයි.**

Samsung හී අලුත්ම Note series එක මගින් පෙර ඔබ වැඩ කළ පිළිවෙළ හාත්පසින්ම වෙනස්කරයි. එසේම මෙහි ඇති S Pen5 සහ අසමසම Samsung Notes විශේෂාංග හරහා ඕනෑම තැනක දී ඕනෑම වෙලාවක දී ඔබේ වැඩ පහසුවෙන් කරගැනීමේ බලය ලබාදෙයි. තවද Samsung වෙතින් සෑම Note20 Ultra මිලදී ගැනීමකටම Buds Live සහ සෑම Note20 මිලදී ගැනීමකටම Galaxy Buds+ නොමිලේ ලබාදෙයි. මෙම දුරකථන යුගලය නව Mystic පැහැයකින් සහ soft neutral tone එකක් ඇති වෙනස්වෙන නවීන විලාසිතාවන්ට ගැළපෙන ආකාරයේ අසමසම නිමාවකින් සහ හැඩයකින් යුක්තව ඇඟිලි සලකුණු හෝ smudges ඇති නොවන ආකාරයේ මතුපිට haze effect එකක් ඇතිව නිර්මාණය කර තිබේ.




පහසුවෙන් හඳුනාගැනීම සඳහා සාප්පුව ඉදිරියේ Samsung සන්නාම පුවරුවක් සහිත, දිවයින පුරා විසිරී සිටින Softlogic Mobile බෙදාහැරීම් ජාලය සහ John Keells Office Automation බෙදාහැරීම් ජාලයට අයත් අලෙවිසැල්වලට ගොස් අගෝස්තු 14වැනිදා සිට 28වැනිදා දක්වා Galaxy Note 20 Ultra සහ Note 20 පෙර ඇණවුම් කිරීමේ අවස්ථාව ඔබට හිමිවේ.

60 Uswatte සිළුමිණ

උස්වත්ත කන්ෆැක්ෂනරි වර්ක්ස් සමාගම අනුග්‍රහයෙනි

## මොටාගෙදරගේ ගුරු ගෝල වෙනස - 73

ගුරු චිත්‍රය



ගෝල චිත්‍රය



චිත්‍ර ශිල්පී මොටාගෙදර වනිගරත්න මෙහි වම් පසින් ඇති චිත්‍රය නිර්මාණය කළේ ය. ඉන්පසු එබඳුම චිත්‍රයක් නිර්මාණය කරන්නැයි සිය ගෝලයකුට උපදෙස් දුන්නේය. එහෙත් ගෝලයා නිර්මාණය කළ චිත්‍රය ගුරුවරයාගේ චිත්‍රය හා සමාන යැයි බැලූ බැල්මට පෙනුණ ද එහි වෙනස්කම් දහයක් ඇත. ඔබ කළ යුත්තේ එම වෙනස්කම් දහය මොනවාදැයි අංක මගින් සලකුණු කිරීමයි. වෙනස්කම් සලකුණු කළ 'සිළුමිණ' පත්‍රයෙන් කපා ගත් ගෝලයාගේ චිත්‍ර සටහන තැපැල්පත්වල පමණක් අලවා උස්වත්ත ටිපිටිප් හෝ බිස්කට් ලාංඡන 2 ක් සමඟ පහත දැක්වෙන ලිපිනයට යොමු කරන්න. එක් පුද්ගලයකුට චිත්‍ර සටහන් එකකට වැඩි ගණනක් එවිය හැකි අතර ඒවා මුල් පිටපත් පමණක් විය යුතු ය. ජයග්‍රාහකයන්ට වටිනා මුදල් ත්‍යාග පිරිනැමේ. තැපැල්පත් අගෝස්තු මස 25වැනිදාට පෙර පහත ලිපිනයට එවිය යුතු ය. ගුරුගෝල වෙනස, 'සිළුමිණ', ලේක්හවුස්, කොළඹ 10

මෙතෙක් පැවැති ත්‍යාග රටාව වෙනුවට ජයග්‍රාහකයන්ට රුපියල් 2500 බැගින් ත්‍යාග 09 ක් පිරිනැමේ. උස්වත්ත කන්ෆැක්ෂනරි වර්ක්ස් ලිමිටඩ් අනුග්‍රහයෙනි.

සම්බන්ධීකරණය - ගාමිණී රූපානන්ද (අනුරූ මාධ්‍ය සේවා)

## රුපියල් විසිපන්දහසක තෑගි




පිළිතුරු එවීමේදී නම, නිවැරැදි ලිපිනය සහ දුරකතන අංකය සඳහන් කරන්න.

# හිල්ටන් 'ග්‍රේස් කිචන්' යළි ඔබ වෙත





සියලු සෞඛ්‍යාරක්ෂිත විධි විධාන අනුගමනය කරන සූපවේදීන්



● **ඉනෝකා පෙරේරා බණ්ඩාර**

**කොරෝනා වසංගතයත් සමඟ කඩා වැටුණු සංචාරක ක්ෂේත්‍රය යළි හෙමි හෙමින් පණ ගසන්නට පටන් ගෙන තිබේ. වෙන දා ආ ගිය තරමට සංචාරකයන් ගැවසුණේ නැතත්, තරු හෝටල් සියල්ල මහජනතාව වෙත විවෘත කර ඇති බව පෙනේ.**

කොළඹ හිල්ටන් හෝටලය ද, තම හෝටලය සතු අවන්හල් ගණනාව අතුරෙන් වඩාත් ජනප්‍රියත්වයක් හිමි කරගෙන තිබූ graze kitchen අවන්හල යළි මහජනතාව වෙත යළි විවෘත කොට තිබෙනුයේ, මෙවැනි පසුබිමක් යටතේය.

ඒ අනුව, වෙනදා දිවා සහ රාත්‍රී කාලයේ බුෆේ ක්‍රමයට ක්‍රියාත්මක වූ graze kitchen හි දිවා කාලය'අලාකාට්' ක්‍රමයටත්, රාත්‍රී භෝජන සංග්‍රහය, බුෆේ ක්‍රමයටත් මහජනතාව වෙත දැන් විවෘත කොට තිබේ.

සියලු සෞඛ්‍ය ආරක්ෂිත විධිවිධාන අනුගමනය කරමින්, ආහාර පිළිගැන්වීමේ රටාවට සහමුලින්ම වෙනස් මුහුණුවරක් එක් කොට ඇති අතර, ඒ සඳහා අවශ්‍ය නවීන ගෘහ උපකරණ පවා විශේෂ ආකාරයෙන්ම හඳුන්වා දී ඇති බව, හිල්ටන් හෝටලයේ අලෙවි සහ සන්නිවේදන කළමනාකාරිණී, ජීජී ද සිල්වා පවසයි.

" ඉස්සර අමුත්තන්ටම ආහාර බෙදා ගන්නට තිබූ ක්‍රමය, මේ පරිස්සම් විය යුතු කාල පරිච්ඡේදයේ අපි වඩාත් සෞඛ්‍යාරක්ෂිත කළා. දැන් ඕනෑම ආහාරයක් අමුත්තන් වෙත පිළිගන්වන්නේ, අපේ සූපවේදීන්.

ඉස්සර හොඳින් විවෘතව තැබූ ආහාර කවුන්ටර සියල්ල දැන් විනිවිද පෙනෙන අයුරින් ආවරණය කර තිබෙනවා. අවශ්‍ය ආහාරය අවශ්‍ය ප්‍රමාණයෙන් කියූ විට, අපේ සූපවේදීන් එය බෙදා දෙනවා. ඔවුන් පාවිච්චි කරන හැඳි පවා, දැන් ඉස්සරට වඩා මීටෙන් දිගයි. ඒ අය ආහාර බෙදා දුන්නා ම, අමුත්තන්ට පුළුවන් තමන්ට තව ඕනේ නම්, නැවත නැවතත් ඉල්ලා ගන්න.

මෙහෙම වුණාම ඒ ආහාර බෙදන හැඳි ගැරුප්පු අල්ලන්නේ, සෞඛ්‍ය ආරක්ෂිතව හැඳ පැලඳ සිටින අපේ සූපවේදියා පමණයි.අමුත්තන් හැම කෙනාම එකම හැන්ද අල්ලන්න ගියොත්, ආහාරවල සෞඛ්‍යාරක්ෂිත භාවය ගිලිහී යනවා.

අනික අපේ සූපවේදීන් හැම කෙනාම, මුව ආවරණ අත් ආවරණ වගේම හිසේ සිට පහළට මුහුණ ආවරණය වන පරිදි 'ෂීල්ඩ්' එකක් පැලඳ සිටිනවා. අවශ්‍ය පරතරය තබා ගන්නවා. ඒ නිසාම, වෙනදාට එකවර 250ක් අසුන් ගත් මේ අවන්හලේ, දැන් ආසන 150 කට අපි සීමා කළා.

නමුත් පවුලක් හැටියට ඊටත් වඩා ආරක්ෂිතව ආහාර ගන්නට අවශ්‍ය නම්, විනිවිද පෙනෙන තිරවලින්, ඒ පවුලේ කෑම මේසය අපි ආවරණය කොට තිබෙනවා. එවිට, පිටස්තර අයගේ කිසිදු බලපෑමක් ඒ කොටසට එල්ල වන්නේ නැහැ.හරියට ගෙදර ඉඳන් ආරක්ෂිතව ආහාර ගන්නවා වගේ. ඒ කෑම බෙදා ගන්න නැගිටින හැම වාරෙකම සෑම අමුත්තෙක්ම මුව ආවරණ පැලඳ සිටීමත් අනිවාර්යයි.

graze kitchen කියන්නේ, ලෝකයේ බොහෝ ජනප්‍රිය ආහාර වර්ග රැසක් පිරුණු තැනක්. ඒ අනුව, ඉතාලි, තායි, ජපන්, චීන, ඉන්දීයානු,මැලේසියානු සහ සහ ශ්‍රී ලංකා යන ඕනෑම රටක ආහාර වර්ගයක් රස විඳින්න මෙහි අවස්ථාව තිබෙනවා.

අනෙක් විශේෂම දේ තමයි, වෙනදා විවෘත බන්දේසිවල ප්‍රදර්ශනය කර තිබූ සලාද වර්ග සහ අතුරුපස සියල්ල දැන් වෙන වෙනම වීදුරු බඳුන් සහ බෝතල් ලෙස අසුරා පිළිගැන්වීම. එවිට, තමන් ගන්නා අතුරුපස අල්ලන්නේ එම කෙනාම පමණයි. එවැනි බඳුන් කිහිපයක් වුණත් එක් අයකුට ලබා ගන්න පුළුවන්.



අධ්‍යක්ෂ, අලෙවි සම්මේලන සහ සිදුවීම් - අරෝෂ පෙරේරා



අලෙවි සහ සන්නිවේදන කළමනාකාරිණී-ජීජී ඩි සිල්වා

ඒ වගේම, අපේ ඉතාලි ආහාර පාන අවන්හල වන,'ඉල්පොන්තේ...' ශ්‍රී ලංකා ආහාර රසය ඇති, 'කරි ලීෆ්' ...,ජපන් ආහාර රස ඇති, ' ඉකොයිතේ '..., රසකැවිලි සඳහාම ඇති ' කායි ' සහ බීම අවන්හල මෙවැනිම සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රමවේද යටතේ ක්‍රම ක්‍රමයෙන් මහජනතාව වෙත විවෘත වනවා.




ඉතින් අපිට කියන්න තියෙන්නේ, දැන් හිල්ටන් වෙත ආහාර වේලක් ගන්න එන්න ඔබ බිය විය යුතු නැහැ. ඔබ ගන්නා සෑම ආහාරයක්ම ආරක්ෂිත බවටත්, මේ හෝටලය ඇතුළේ ඔබ සුරක්ෂිත බවටත්, අපි සහතික වනවා.

ඒ වගේම, ඔබ වෙනුවෙන්ම සැකසූ විශේෂිත හෝටල් කාමර පැකේජ කිහිපයක්ද මේ දිනවල ක්‍රියාත්මක කර තිබෙනවා. ඒවායේ වෙනදා නොලැබුණු විශාල පහසුකම් ප්‍රමාණයක් නොමිලේ පිරිනැමෙනවා. මේ සියල්ල, යළි නැගිටින සංචාරක කර්මාන්තය වෙනුවෙන්, ඔබත් දායක කරගැනීම සඳහා දී තිබෙන විශේෂ වරප්‍රසාද. ඉතින්, වෙනදා වගේම ඔබ හිල්ටන් වෙත ඇවිත් යන්න.! ඔබේ පැමිණීම තුළ සංචාරක ක්ෂේත්‍රය යළි නැගිටින්නට පණක් ලැබෙනවා..."

එම අවන්හල් සේවයෙන් නොනැවතී, අති දුෂ්කර කොවිඩ් සමයේ ක්‍රියාත්මක වූවාක් මෙන්, මංගල උත්සව සඳහා ද අතිවිශේෂ ක්‍රමවේදයන් සකසා තිබෙන බව, හිල්ටන් හි අධ්‍යක්ෂ, අලෙවි සම්මේලන සහ සිදුවීම්, අරෝෂ පෙරේරා පවසයි.

" ජාත්‍යන්තර හෝටලයක් හැටියට අපි,' නව සාමාන්‍ය' නැත්නම් new normal කියන සංකල්පයට හැඩ ගැසීමට,සෞඛ්‍ය අමාත්‍යාංශයට අනුව ආරක්ෂාව සහ සනීපාරක්ෂාව සම්බන්ධ විවිධ මාර්ගෝපදේශ පියවර රැසක් අරගෙන තිබෙනවා.

අමුත්තන්ට සහ අනෙකුත් සේවා සපයන්නන්ට මෙන්ම, තුන්වන පාර්ශ්වයේ අයටත් මේ සියලු ක්‍රමවේදයන් ක්‍රියාත්මකයි. ඒ වගේම, බෑන්ඩ් කණ්ඩායම්... ඡායාරූප ශිල්පීන්... වීඩියෝ ශිල්පීන්... මල් සැකසුම් ශිල්පීන්... මනාලියන් හැඩ ගන්වන අයට වගේම, අෂ්ටක කියන අයටත් එකම ආකාරයෙන් මේ මාර්ගෝපදේශයන් සහ මග පෙන්වීම් ලබා දී තිබෙනවා.

මේ හෝටලයට ඇතුළු වන සියලු දෙනා, විවාහ මංගල උත්සවය නිමවන තුරු මේ සියලු සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේදයන්ට අනුගත විය යුතුයි.

ඒ වගේම, උත්සවය සංවිධානය කරන අයත් සෞඛ්‍යාරක්ෂිත බව පිළිබඳ ප්‍රකාශයක්,කොවිඩ් මැඩලීමේ, මග පෙන්වීම්වලට අනුව අත්සන් කර හෝටලයට බාර දීම අවශ්‍යයි. හැම අමුත්තෙක් ම හෝටලයට ඇතුළු වන අවස්ථාවේ ශරීර උෂ්ණත්වය පරීක්ෂා කිරීම, අත් සේදීම සහ සනීපාරක්ෂක සේදුම් භාවිතය අනිවාර්යයි. මුහුණු ආවරණය සහ සමාජ දුරස්ථභාවය පිළිබඳව අප වඩාත් සැලකිලිමත් වනවා. ඒ නිසාම, එක මේසයකට අසුන් ගැනීම, පස් දෙනකුට සීමා කොටත තිබෙනවා. බුෆේ භෝජන සංග්‍රහය සම්බන්ධයෙනුත් මෙවැනිම ක්‍රියාමාර්ග අප අනුගමනය කර තිබෙනවා. දුරස්ථභාවය තබාගනිමින් කෑම බෙදා දීම සිදු කරන්නේ, අපේ සූපවේදීන් විසින් පමණයි. ඒ වගේම,ආචාර කිරීමේ දී ස්පර්ශ නොවන පරිදි, 'ආයුබෝවන්' කියා ආචාර කිරීමත් අනිවාර්යයයි .

එසේම, මංගල උත්සවයේ අනිවාර්ය අංගයක් වන නැටුම් ගැයුම් සඳහා ද මේ සමාජ දුරස්ථභාවය අදාළයි. මීටරයක පරතරය තබා ගෙන,සෞඛ්‍ය නීති රීතිවලට අනුව ක්‍රියාත්මක වන්නේ නම් පමණයි, ඒ සඳහා අවස්ථාව හිමිවන්නේ.මංගල උත්සවයට සහභාගී වන පිරිස සීමාසහිත නිසා, මේ දුරස්ථභාවය තබාගෙන නැටුම් ගැයුම් ඉදිරිපත් කරන්නට, අමුත්තන්ට ඕනෑවටත් වඩා ඉඩකඩ තිබෙනවා.

ඉතින්, මේ වසර අවසන් වන තෙක්, මංගල උත්සව සඳහා විශේෂ පහසුකම් රැසක් නම්‍යශීලී ලෙස ලබා දීමට, අප සියලු කටයුතු සලසා තිබෙන නිසා, ඉන් උපරිම ප්‍රයෝජනය ගැනීමට ඔබටත් පුළුවන්..."



සෞඛ්‍යාරක්ෂිත දිගු හැඳි භාවිත කරමින්



විනිවිද පෙනෙන සේ ආවරණය කළ ආහාර කවුන්ටර



අතුරුපස, විදුරු බඳුන්වල වෙන වෙනම අසුරා ඇති අයුරු

**ඡායාරූප- සුලෝචන ගමගේ**

# අකාලයේ මිලින වූ දීපිකා මලවිආරච්චි



ප්‍රවීණ සිනමා නිළි පූජා උමාශංකර් සමඟ

● **සුමුදු චතුරාණී**

**ප්‍රියයන් නික්ම යන කල හදට නැඟෙන ළතැවුල වදන්වලට පෙරළන්නට සමතෙක් අප දැක නැත. ඒ ශූන්‍ය සාංකාව දින සති ඉක්මවා සම් මස් විනිවිද ගොස් ඇට මිදුළුවලට කාවැදී රිදුම් කන්නට වෙයි. මේ සංසාරය පුරා හමුවෙන අනේකවිද මිනිසුන් අතර සහෘදයන් ඇත්තේ අතළොස්සකි. හදවත සෙමෙන් ආදරයෙන් පිරිමදින ඒ සහෘදයන්ගේ නික්ම යෑම ඇට මිදුළුවලටම දැනෙන්නේ ඒ නිසාය. දීපිකා චාන්දනී මල්ලවාරච්චි සොයුරියද මේ දීර්ඝ සංසාර ගමනේ හමුවූ ළෙන්ගතු සහෘදිනියකි. ඇය සහෘදිනියක බව කියන්නට බලපෑ හේතු කාරණා ඔබ හමුවේ මා කෙටියෙන් සටහන් කරන්නේ සහෘදය සිත් කෙතරම් විරල දැයි අප සැමට අත්දැකීම් ඇති නිසාය.**




සුදු ඇඳුම ඇඳ එයට මුවා වී දහසකුත් එකක් මැරකම්, දූෂිතකම් කරන බොහෝ පිරිසක් අතර, ඇය ඇඳි සුදු ඇඳුමේ ප්‍රභාවත් බව සේම මනසින් පිරිසුදු වූවාය. ඇගේ ප්‍රභාවත් යෞවනයට ගිනි අවුළමින් පෙම්බර සැමියා වසන්ත ජයවර්ධන අකල්හි දිවියෙන් නික්ම ගිය කල තෝරා ගත් ඒ වර්ණයේ අර්ථයට ඇය බෙහෙවින් පර්යාය ය. ඒ වර්ණය විසින් ඇයට අනන්‍යතාවක් සේම තේජසක් එක්කර තිබිණි. සිය දිවි සැරියෙන් නික්ම යන මේ මොහොත දක්වාම දිවි සැරසූ සුදු වස්ත්‍රය සේම, සිය හදවතේ වූ ශ්වේතයද වියැකී යන්නට ඇය ඉඩ නොදුන්නාය. අප විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් කල ලේක්හවුස් පුස්තකාලය පරිශීලනය කරන්නට එන හැම මොහොතකම අප වෙනුවෙන් සිය ශ්‍රමය කැප කරන්නට බලා සිටි දෙදෙනෙක් විය. එක් සහෘදයෙක් කලින් ලේක්හවුස් ආයතනයෙන් විශ්‍රාම ගිය එස්. කේ. කේ සිරිසේනයන්ය. අනෙක් තැනැත්තිය මේ දීපිකා චාන්දනිය ය. මේ දෙදෙනාම කිසිදු ලෝබ කමකින් තොරව අපට අවශ්‍ය සෑම තොරතුරක්ම, දත්තයක්ම යුහුසුළුව සොයා දුන්හ. ඉදින් ශාස්ත්‍රය සොයන්නන්ට නොපැකිලව උදව් කරන එවන් අයට සහෘදයන් කියා ඇමතීම ඒ වදනට කරන ගෞරවයකි.

දීපිකා චාන්දනී මුවග නිරන්තරයෙන් සැරසුණේ මඳ සිනාවකිනි; ඇය මුදු ය; අනලස් ය; නොපැකිළ ය; අන් අය කෙරෙහි ගෞරව සම්ප්‍රයුක්ත ය; එනිසාම පෙරළා ඒ ගෞරවයෙන්, ආදරයෙන් ඇය ද පිදුම් ලැබුවාය. මේ ලියැවෙන අකුරක් පාසා ඇත්තේ ඇය කෙරෙහි වූ අප්‍රමාණ ආදරය ය; ගෞරවය ය.

විජය පුවත්පත් ආයතනයේ සහකාර පුස්තකාලයාධිපතිවරියක ලෙස සිය වෘත්තීය ගමනට පිළිපන් ඇය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ උපාධිධාරිණියකි; ලේඛකත්ව සන්නිවේදන ඩිප්ලෝමාධාරිණියකි. නික්ම යන මේ මොහොතේ ඇය ලේක්හවුස් ආයතනයේ ඩී. ආර්. විජේවර්ධන අනුස්මරණ පුස්තකාලයේ සහකාර පුස්තකාලයාධිපතිනිය ය. ඒ සැමටත් වඩා සිය වෘත්තීය නිපුණත්වය විසින් ඇයට මහා දැනුමක් එක් කර තිබිණි. පුස්තකාලයේ අප සොයන දෑ අදාළ ලිපිගොනුවේ නැති වුවහොත් අප හමු වන්නේ ඇයවය. ඇය අපට ඒ කරුණු අඩංගු විය හැකි විවිධ මූලාශ්‍රය සපයයි; නොපමාව ඒවා සොයා දෙයි. එනයින් බලන කල ඇගේ වියෝව අපට ඉමහත් පාඩුවකි. ඊටත් වඩා සහෘදය සිතක් අහිමි වීමකි.

ඈ ගෙවූ දිවිසැරිය වසර 54 කි. එය මහ ලොකු කාලයක් නොවේ. එහෙත් ඒ කාලයට වඩා කාලයක් ඈ ජීවත් වූ බවට වන සහතිකය ඇගේ මේ නික්ම යෑම අබියස සංතාපයට පත් හදවත් විඳින්නේය; අහිමි වීමේ වේදනාවෙන් විඳවන්නේය. ජීවිතය යනු කාලය ගෙවා දැමීමක් නොව යුතුකම් ඉටු කරන්නට ලැබුණු වේදිකාවක් බැව් ඇගේ දිවිසැරියෙන් ඈ නිහඬව පෙන්වූවාය. ඒ යුතුකම් ඉටු කරනා විට පැමිණි අනේකවිද දුක් කම්කටොළුද ඇය මල් සේම ආදරයෙන් පිළිගත්තාය. ආදරය කරන්නන්ට සේම නොතකා හරින්නන්ටද මඳ සිනාවෙන්, සමසිතින් සැලකුවාය. අකලට මුත් ජීවිතය අතහැරෙන විට ජීවත් වූ අයුරු ගැන ඇයට ළතැවිල්ලක් නොවූයේ එබැවිනි. එවැනි අමරණීය මතක ගොන්නක බර සිතේ දරාගෙන අප ඇයට අකාලික සුවය පතන්නේ රිදුණු සිත්වල බර දරා ගනිමිනි.

## සිළුමිණ Daintee X-TRA ප්‍රහේලිකා අංක 115 රුපියල් පනස්දහසක තෑගි





සිළුමිණ Daintee X-TRA ප්‍රහේලිකා අංක 115

සම්බන්ධීකරණය - ගාමිණී රූපානන්ද අනුරූ මාධ්‍ය සේවා

### උපකාරක පද

**හරහට**

1. ජල විදුලි බලාගාරයක් නිසා ම ප්‍රසිද්ධියට පත් දිය ඇල්ල
5. පාද නැති
7. නවරත්න
8. පතිව්‍රතා ධර්මය
9. 'ඇද' යන්න සමඟ වාක්ශ්ලිෂ්ටත්වය සඳහා යෙදෙන්නකි
10. රජ්ජුරුවෝ
11. ජගත් කීර්තියට පත් හිමිනමක් නිසා ප්‍රකට වූ මාතර දිසාවේ ගමකි
12. බඩුබාහිරාදිය ණයට ගැනීමේ දී ඉදිරිපත්කරන කාඩ්පත
14. ප්‍රකට වැදි ජනාවාස භූමියකි
17. තරුව
18. 'බැද්දෙගම' නවකතාවේ ප්‍රධාන චරිතය
20. මිනිත්තුවට මේවා හැටකි

**පහළට**

2. අහස-පොළොව ළං වී තිබෙන්නාක් මෙන් පෙනෙන ස්ථානය
3. 1818 කැරැල්ලෙන් පසු පලා ආ ජනයාගෙන් ජනාවාස වූ අම්පාර දිසාවේ වෙරළබඩ ගම්මානයකි
4. අලුත්
5. දුර්වර්ණ/ අඳුරුපාට
6. අලුයම / උදෑසන
8. මෙරට ප්‍රථම ලාංකේය පුරාවිද්‍යා කොමසාරිස්
13. ලෝකෙට ...... ගෙදර මරගාතේ
15. වේගපන්දුවත් අමුතු කොණ්ඩා විලාසිතාවත් නිසා ජනාදරයට පත් ක්‍රිකට් ක්‍රීඩකයා
16. අන්ධකාරය
19. උඳුන

### කොන්දේසි

(1) ප්‍රහේලිකාව සඳහා මසකට රුපියල් 50,000ක මුදලක් ජයග්‍රාහකයන් 10 දෙනකු අතර බෙදී යයි.

(2) පළමුවෙන්ම තෝරාගන්නා නිවැරැදි පිළිතුරු 10ට රුපියල් 5000 බැගින් මුදල් තෑගි පිරිනැමේ.

(3) සිළුමිණ පුවත්පතේ පළවන ප්‍රහේලිකාව විසඳා කූපනය පුරවා ලියුම් කවරයක බහා, එහි වම්පස ඉහළ කෙළවරේ ප්‍රහේලිකා අංක 115 යනුවෙන් සඳහන් කර ඩේන්ටී මයිලේඩි ටොෆී දවටන 10ක් සමඟ සිළුමිණ ප්‍රහේලිකාව, ලේක්හවුස්, කොළඹ 10. යන ලිපිනයට සැප්තැම්බර් 23 දිනට පෙර එවිය යුතුය. නිවැරදි ලිපිනය සහ දුරකතන අංකය ලියා එවන්න.

(4) ජයග්‍රාහකයන් තෝරා ගනු ලබන්නේ කුසපත් ඇදීමෙනි. ජයග්‍රාහකයන්ගේ නම් සහ ප්‍රහේලිකාවේ නිවැරැදි විසඳුම සැප්තැම්බර් 27දා සිළුමිණ පත්‍රයේ පළ වේ. ජයග්‍රාහකයන්ගේ ප්‍රතිඵල පුවත්පතේ පළ වී තෙමසක් ඇතුළත ත්‍යාග මුදල් පිරිනැමේ. ඔබේ ත්‍යාග මුදල නොලැබුණහොත් පමණක් සිළුමිණ කර්තෘ මණ්ඩලය අමතන්න. (දුරකතන අංකය - 011-2429265)

(5) ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ සහ ඩේන්ටි ආයතනයේ, සේවකයන්ට හෝ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ට තරගය සඳහා ඉදිරිපත් විය නොහැකිය.




ඩෙල්ෆ්ට්


ස්තූපයේ නටබුන්

# ඩෙල්ෆ්ට් දූපතේ ඓතිහාසික උරුමය


හිරිගලෙන් නිමවූ පරෙවි කූඩුව


සටහන හා ඡායාරූප
රැක්ෂිලා වෙත්තමුණි

**උතුරු පළාතේ යාපනය දිස්ත්‍රික්කයේ ඩෙල්ෆ්ට් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට මෙම දූපත අයත් වන අතර දිගින් කිලෝමීටර් 09 කින් හා පළල කිලෝමීටර් 06 කින් සමන්විතය. මුළු භූමි වපසරිය වර්ග කිලෝමීටර් 48.5 කි. ජනගහණය පවුල් 1500 කට ආසන්න බව සඳහන්ය. උතුරු පළාතේ පිහිටි දූපත් අතර කයිට්ස් විශාලතම දූපත වන අතර ඩෙල්ෆ්ට් දෙවෙනි වන්නේ කයිට්ස් දූපතට පමණි. යාපනයේ කුරිකට්ටුවාන් ජැටියෙන් ගමන් අරඹා පැයක පමණ මුහුදු ගමනකින් පසුව මෙහි පිවිසිය හැකිය. යාපනය අර්ධද්වීපයේ බටහිර දෙසින් පිහිටා ඇති ඩෙල්ෆ්ට් දූපත තැනිතලා බිමක් සහිත භූමියකි. මයෝසීන යුගයට අයත් යැයි පැවසෙන මෙහි වැලි සහ හුණුගල් සහිත පසකින් සැදි පාෂාණ වලින් යුක්තය.**

යාපනයට අයත් බොහෝ දූපත් යුරෝපීය නම් වලින් හඳුන්වා ඇත. 'තීව්' යන අරුතින් දමිළ භාෂාවෙන් දූපත හඳුන්වයි. ඒ අනුව නයිනතිව්, අනලතිව්,එළුවතිව්, කාරතිව්, කච්චතිව්, ඉරනතිව්, පලෙයිතිව්, පුන්කුඩුතිව් යනාදි ලෙස ඒසේ හැඳින් වූ දූපත් දැක්විය හැකිය. ද්‍රවිඩ බසින් ඩෙල්ෆ්ට් හඳුන්වා ඇත්තේ නෙදුන්තීව් ලෙසිනි.

ලන්දේසීන්ගේ ජන්ම භූමිය වූ නෙදර්ලන්තයේ පිහිටි නගරයක් වූ ඩෙල්ෆ්ට් යන නම මෙම දූපතට යොදා ඇති අතර විද්වතුන්ගේ අදහස වූයේ එම නගරයේ භූ විෂමතාවයට සමාන බවක් මෙහිද දක්නට ඇති බැවින් එසේ නම් කරන්නට ඇති බවය. පෘතුගීසීන් මෙම දූපත හඳුන්වා ඇත්තේ අයිෆා ඩාස් වැකාස් නමිනි.

පුරාවිද්‍යාත්මක වශයෙන් වටිනාකමක් උසුලන සාධක අතර මිගාමන් ලන්දේසි බළකොටුව, පැරණි ලන්දේසි රෝහල, රැජින කුලුන හෙවත් මිණුම්දෝරු කුලුන (ක්වීන්ස් ටවර්), පරවි කූඩුව, ස්තූප සහිත බෞද්ධ නටබුන්, හින්දු කෝවිල් නටබුන්, ගබඩා ගොඩනැගිලි, පැරණි අශ්වගාල, පැරණි සුසාන භූමිය හා බයෝබැබ් ගස යනාදිය ඩෙල්ෆ්ට් දූපතේ දක්නට ඇති ස්ථාන අතර ප්‍රමුඛත්වයක් ගනු ලබයි. පෘතුගිසි සහ ලන්දේසි යුග වලට අයත් යටත් විජිත රාජ්‍යන්හී නටබුන් බහුල වශයෙන් මෙහි දක්නට ඇති අතර බෞද්ධ ස්තූපවල නටබුන් පිහිටා තිබීම සුවිශේෂි කරුණකි.

2013 වසරේ අගෝස්තු මසදී මධ්‍යම සංස්කෘතික අරමුදලේ ගාල්ල ව්‍යාපෘතියට අයත් මුහුදු පුරාවිද්‍යා ඒකකය මගින් සිදුකළ ගවේෂණයක ප්‍රතිඵලයක් ලෙස සෙල්ලිපි තුනක් පිළිබඳව ප්‍රථම වතාවට අනාවරණය කර ගැනීමට සමත් විය. ඩෙල්ෆ්ට් දූපත පුරා විවිධ පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුත් පුරාකෘති විසිර ඇති අතර පෞරාණික වටිනාකමකින් යුක්ත ස්තූප තුනක සාධක මෙහි දක්නට ලැබේ. මෙම ස්තූප එකිනෙකට වෙනස් ප්‍රමාණයන් ගන්නා අතර ශේෂව ඇති විශාලතම ස්තූපයෙ සළ පතල මළුවෙ ගල් අතර තිබී මෙම සෙල්ලිපි තුන සොයා ගෙන ඇත.

ස්තූපය විශ්කම්භය මීටර 13.54 කින් යුත් මෙහි පරිදිය 31.93 ක් ද උස සෙන්ටිමීටර 58 ක් ලෙසින් සඳහන්ය. සෙල්ලිපි වලින් එක් ලිපියක් බ්‍රාහ්මී අක්ෂරයෙන් ද අනෙක් ලිපි දෙක දෙමළ අක්ෂර වලින් ද සටහන්ව ඇත. අභිලේඛනඥයින්ගේ අදහස වනුයේ බ්‍රාහ්මී ලිපිය ක්‍රි.ව.1-2 අතර කාලයට අයත් බවය. දෙමළ ලිපි දෙක අක්ෂරවල හැඩය අනුව ක්‍රි.ව. 14-15 කාලවකවානුවෙන් පසුකාලීන බව සඳහන්ය. රජරට විශ්වවිද්‍යාලයේ අභිලේඛන විද්‍යාව හා පුරා අක්ෂර විද්‍යාව පිළිබඳ කථිකාචාර්ය චන්දිම අඹන්වලගේ අදහස වූයේ බ්‍රාහ්මී ලිපිය සිංහල ප්‍රාකෘත බසින් ලියා ඇත යන්නය.

ඩෙල්ෆ්ට් දූපතේ පිහිටි පැරණිතම ස්ථානය ලෙසට මෙම බෞද්ධ නටබුන් සහිත භූමිය හැඳින්වේ. ක්‍රි.පූ. 2 වන සියවස දක්වා කාල වකවානුවට මෙහි ආරම්භය දිව යන බව සඳහන්ය. එසේම මෙම ස්තූප එදිරේසන්ගේ කොටුව නමින් හැඳින් වූ ප්‍රදේශයේ ගොඩනැගුවා යැයි සැලකේ. ප්‍රමාණයෙන් විශාල වූ ප්‍රධාන ස්තූපය කොරල් ගලින් නිමවා ඇති අතර මෙම ප්‍රදේශයේ පිහිටි උසම ස්ථානයේ එය ගොඩනංවා ඇත. අනෙකුත් ස්තූප දෙක මෙම ස්තූපයට බටහිරින් හා නැගෙනහිරට දිශානුගතව ඇත. දැනට ඒවායේ පාදම් පමණක් දක්නට ලැබේ. මේ අවට පරිසරය පුරාම කැඩී බිඳී ගිය වළං කටු හා පබළු අදටත් දැක ගැනීමට හැකිය.

යාපනයට අයත් දූපත් පිළිබඳව විවිධ මත දක්නට ඇති අතර ඉන් විශේෂිත මතයන් ලෙස, ලේඛක මසුදි 'රුවන් තණබිම' (Meadows of Gold) නම් සිය කෘතියේ දක්වන්නේ මෙම දූපත් අතීතයේ දී අරාබි වෙළඳුන්ගේ නැවතුම් පොළවල් වූ බවය. එල්.එදිරිසි 13 වන සියවසේ දී ප්‍රකාශ කරනුයේ යාපනයේ බොහෝ දූපත්වල පාලකයෙක් යැයි සැලකෙන ජාබේ නම් රජෙකු සිටි බවය. චීනය බලා ගමන් කළ නැව් මෙම දූපත්වලින් ජලය ලබා ගත් බව සටහන් වෙන මතයන් අතර වේ. ඉන් ගම්‍ය වනුයේ එකල මෙම දූපත්වල පරිභෝජනයට සුදුසු ජලය පවතින්නට ඇතැයි යන්නය. රාසනායගම්ගේ ගවේෂණ වාර්තාවේ එකී නැව් ජලය, වේලනෙයි දූපතේ බටහිර ඉවුරේ පිහිටි චීනාන් කෝවිල් නම් ස්ථානයෙන් ලබාගත් බව දැක්වේ.


පැරණි ලන්දේසි රෝහල


ඩෙල්ෆ්ට් බළකොටුවේ ඇතුළත


පාදම් කණුවක්

**ලේඛක මසුදි 'රුවන් තණබිම' (Meadows of Gold) නම් සිය කෘතියේ දක්වන්නේ මෙම දූපත් අතීතයේ දී අරාබි වෙළඳුන්ගේ නැවතුම් පොළවල් වූ බවයි.**

ඩෙල්ෆ්ට් දූපතේ විශේෂයෙන්ම දක්නට ලැබෙන තවත් ලක්ෂණයක් වන්නේ මෙහි ඇති නිවෙස් හි තාප්ප හිරිගල් වලින් ඉදිකර තිබීමය. මෙම දූපතේ බහුල ලෙස දක්නට ලැබෙන හිරිගල් ඉතා ආකර්ෂණීය ලෙස තම ගෘහ නිර්මාණ ශිල්පීය කටයුතු සඳහා යොදාගෙන තිබේ. දූපත පුරාම විවිධ ප්‍රමාණයෙන් යුතු හුණුගල් තට්ටු දකින්නට ලැබේ. මෙහි ඉදිකොට ඇති පැරණි ගොඩනැගිලි හුණුගල් වලින් නිමවා ඇති අතර විශේෂිතම සාධක ලෙස නටබුන්ව ගිය පැරණි ඕලන්ද බළකොටුව හා ඕලන්ද සමයේ ගොඩනැගූ අශ්ව ගාල දැක්විය හැකිය.

කොරල් ගල් භාවිතා කොට ඉදිකර ඇති මිගාමන් ලන්දේසි බළකොටුව ඩෙල්ෆ්ට් පැරණි ලන්දේසි රෝහල පිටුපස භූමියේ දක්නට ඇත. බිත්තියක ඝනකම මීටර් 2 ක් පමණ වූ අතර දිග මීටර් 30 ක් හා පළල මීටර් 26 ක් විය. මෙහි දැනට ශේෂව ඇති සාධක අනුව දෙමහල් හෝ තෙමහල්ව බළකොටුව පැවතියේ යැයි විශ්වාස කෙරේ. එහි පහත මාලයේ කුඩා ප්‍රමාණයේ කාමර සිරකුටි යැයි අනුමාන කරන අතර ඉහළ මාලයට නැගීමට පියගැට පෙළක් තිබී ඇත. මුහුද හොඳින් නිරීක්ෂණය කළ හැකි අයුරින් ඉදිකළ කාමරයක් ඉහළ මාලයේ දක්නට ලැබේ. මෙය බළකොටුවේ ආරක්ෂක කටයුතු සඳහා උපයෝගි කර ගන්නට ඇතැයි සැලකේ.

පැරණි අශ්වගාලක නටබුන් නැරඹීමට ඩෙල්ෆ්ට් ජැටියේ සිට බටහිර දෙසට යන මාර්ගයේ පුල්ලෙයාර් කෝවිල් හන්දියෙන් දකුණට මීටර් 500 ක් දුර ගමන් කළ යුතුය. දිගු ශාලාවක නටබුන් මෙහි දක්නට ඇති අතර එය මීටර් 150 ක් පමණ දිගට විහිදේ. වර්තමානය වන විට එහි ආරක්ෂා වී ඇති එක් මුදුන් බිත්තියක් දැක ගැනීමට හැකිය.

විශාල හතරැස් කුලුනු පේළි දෙකකට පිහිටුවා එක් පසෙකට කුලුනු 36 බැගින් ස්ථාපිත කර තිබී ඇතැයි සැලකේ. එක් කුලුනක් ඝනකමින් අඩි 3 ක් පමණය. ඇතැම් කුලුනු කොටස් කැඩී බිම විසර පවතී. මෙවැනි සුවිසල් අශ්ව ගාලක් පවත්වාගෙන යන්නට ඇත්තේ අශ්ව අභිජනන මධ්‍යස්ථානයක් ලෙස මෙම ස්ථානය පවත්වාගෙන ගිය නිසාවෙන් විය හැකිය. ඇතැම් විට මෙම අශ්වයින් අපෙ රටෙන් පිටතට රැගෙන යාමට මෙම ස්ථානයේ අභිජනනය කරන්නට ඇතැයි විශ්වාස කෙරේ.

වර්තමානය වන විට වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ඩෙල්ෆ්ට් දූපතේ ජීවත් වන අශ්වයින් ගැවසෙන පෙදෙස් ආවරණ කොට ජාතික උද්‍යානයක් ස්ථාපිත කොට තිබීම මෙම අශ්වයින්ගේ සුරක්ෂිතභාවයට බොහෝ ඉවහල් වී ඇත. මෙම සත්ත්වයින් ඩෙල්ෆ්ට් දූපත තුළ ශුෂ්ක කටුක ජීවිතයකට අනුවර්තනය වෙමින් ජීවත් වීම ද ඉතා සුවිශේෂීය. 2013-2014 අතර කාලය තුළ වනජීවී දෙපාර්තමේන්තුව විසින් සිදු කළ අශ්ව සංගණනයට අනුව ඩෙල්ෆ්ට් දූපතේ ජීවත් වූ කැලෑ අශ්වයින් ගණන 455 කි. වයස අවුරුදු එකට අඩු අශ්ව පැටවුන් 27 ක් ද වයස අවුරුදු එකත් දෙකත් අතර වයසේ පසු වන අශ්ව පැටවුන් 48 ක් සහ වැඩිවියට පත් වූ අශ්වයින් 380 ක් ලෙස එම සංගණනයට අනුව වාර්තා විය. ඩෙල්ෆ්ට් දූපත ඩෙල්ෆ්ට් ජාතික උද්‍යානය ලෙස 2015.06.22 වැනි දින ප්‍රකාශ වීමත් සමගම මෙම සත්ත්වයින් සංරක්ෂණ ක්‍රියාවලියට යොමු විය. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් ඩෙල්ෆ්ට් ජාතික උද්‍යානයේ පරිපාලනමය කටයුතු සඳහා වර්තමානයේ දී වනජීවී සංරක්ෂණ කාර්යාලයක් දූපත තුළ ස්ථාපිත කර ඇත.

වංශකතා අනුව අශ්වයන් ලබා ගැනීම සඳහා ඇත් දළ, අලි ඇතුන්, මුතු මැණික් මෙන්න කුළුබඩු ද හුවමාරු වී ඇතැයි සඳහන්ය. එමෙන්ම යටත් විජිත පාලන සමයේදී ඩෙල්ෆ්ට් අශ්වයන් තම ගමනා ගමන කටයුතු සඳහා උපයෝගි කොට ගත් බවට සාධයක් ලෙස 1811-1819 කාල වකවානුවේ දී බ්‍රිතාන්‍ය හමුදා කඳවුරේ සිටි අණදෙන නිලධාරී ලෙස සේවය කළ නෝලාන්ට් දැක්විය හැකිය. ඔහු අශ්ව ලෝලියෙක් ලෙස ප්‍රකටය. එසේම පෘතුග්‍රීසි පාලන සමයේ දී ඔවුන්ගේ ගමනා ගමනය පිණිස මෙම දූපතට අශ්වයින් රැගෙන ආ බව ද කියැවේ.

ඓතිහාසික වැදගත්කමක් සහිත ස්ථාන අතර පුරාවිද්‍යාත්මක සාධක ශේෂව ඇති නටබුන් ලෙස ක්‍රිස්තියානි පල්ලි 12 ක් හා හින්දු කෝවිල් 17 ක් පිළිබඳව තොරතුරු සඳහන්ය. මෙහි දූපතෙන් බටහිරට වෙරළාසන්නව පුක්කාඩු පෙදෙසේ හින්දු කෝවිලක නටබුන් සහිත භූමියක් දකින්නට ලැබේ. දේවකුටිය, අන්තරාලය, මණ්ඩපය හා පිවිසුම් ශාලාව යන ප්‍රධාන අංග වලින් හින්දු කෝවිල් සම්ප්‍රදාය අනුව ගොඩ නගා ඇත. හුණුගල් උපයෝගි කොට ගෙන මෙය නිමවා තිබීම විශේෂිතය.

හිරිගලින් නෙළා ඇති පරවි කූඩුව ඩෙල්ෆ්ට් නටබුන් අතර සුවිශේෂි ස්ථානයක් හිමිකර ගනී. අතීතයේ දී මිනිසුන් තම සන්නිවේදන අවශ්‍යතා සපුරා ගැනීමට සතුන් යොදා ගෙන ඇති ආකාරය පරවි හා සැලළිහිණි යන සංදේශය කාව්‍ය සාක්ෂි සපයයි.

ඒ අනුව ඩෙල්ෆ් දූපත තුළද එවැනි සාම්ප්‍රදායික සන්නිවේදන ක්‍රමයක් අනුගමනය කොට ඇති බවට මෙම පරවි කූඩුව සාධකයකි. මෙය ලන්දේසීන් විසින් ඉදිකරන ලදැයි සැලකේ. වර්තමාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට යාබද භූමියේ මෙම නිර්මාණය ස්ථාපිත කොට තිබේ. පැරණි වාර්තා අනුව එකල ඩෙල්ෆ්ට් වාසය කළ ලන්දේසීන් පණිවිඩ හුවමාරු කර ගැනීමේ කටයුතු සඳහා පරවියන් යොදා ගත් බව කියැවේ. ඔවුන් ඩෙල්ෆ්ට් හා අනෙකුත් දූපත් අතර එසේ පණිවිඩ හුවමාරු කොට ගෙන ඇත. මෙම පරවි කූඩුවේ සම්පූර්ණ උස මීටර් 4 ක් පමණය. හතරැස් පාදමක් මත ඉදිකොට ඇති මෙහි එක් පසෙක දිග මීටර් 1.65 ක් ලෙසින් සිව් පැත්තටම විහිදී යන අයුරින් නිමවා ඇත. කූඩුවේ සිව් පැත්තේම කුඩා කුටි දක්නට ලැබෙන අතර සමස්ත කුටි සංඛ්‍යාව 80 කි. ඒ අනුව පරවියන්ට ගිමන් හැරීමට හා ළැගුම් ගැනීමට මෙම පරවි කූඩුව උපයෝගි වූ බව අදහසයි.

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අනුමැතියට යටත්ව මධ්‍යම සංස්කෘතික අරමුදල විසින් මෑත කාලයේ දී පැරණි ලන්දේසී රෝහලේ සංරක්ෂණ කටයුතු සිදුකොට තිබේ. ලන්දේසි යුගයේ දී ඉදිකරන ලද මෙම ගොඩනැගිල්ල එකල රෝහලක් ලෙසින් ද පසුව බ්‍රිතාන්‍ය යුගයේ දී දූපතෙහි පරිපාලන මධ්‍යස්ථානයක් ලෙස ද භාවිතා කර ඇත. ඩෙල්ෆ්ට් පොලිසිය ඉදිරිපිට පිහිටි මෙම ලන්දේසී රෝහල ඉදිරිපසින් කුඩා විවෘත ආලින්දයක් දක්නට ලැබේ. පියස්ස සඳහා බැංගලෝරයේ නිෂ්පාදිත උළු භාවිතා කොට ඇති අතර එම උළුවල නිෂ්පාදිත වසර ලෙස 1865 සටහන් කොට ඇත. කොරල් සහ හුණු බදාමයෙන් පැරණි රෝහලේ බිත්ති සකසා තිබීම දැකිය හැකිය.

ඉංග්‍රීසි පාලන සමයේ දී ඉදිකරන ලද රැජින කුලුන හෙවත් මිණුම්දෝරු කුලුන (ක්වීන්ස් ටවර්) ඩෙල්ෆ්ට් දූපතේ දකුණු වෙරළ තීරයේ පිහිටා ඇත. ඉහළට යාමේ දී ප්‍රමාණයෙන් කුඩාවන පරිදි තට්ටු පහකින් නිමවා ඇති මෙය හතරැස් හැඩයෙන් යුක්තය. අඩි 55 ක් පමණ උස් වන අතර පොළොවට සම්බන්ධව ඇති මුල් කොටසේ ආරක්කු හැඩැති දොරටුවක් උතුරු දෙසින් දක්නට ලැබේ. මනාලෙස කපා සකස් කරන ලද හුණු ගල් කුට්ටි භාවිත කොට මෙම කුලුන සකසා ඇත.

මේ අනුව ඩෙල්ෆ්ට් යනු ඓතිහාසිකමය වශයෙන් ඉතා වටිනාකමක් උසුලන යාපන අර්ධද්වීපයේ පිහිටි සංචාරක ආකර්ෂණය දිනාගත් දූපතක් ලෙස හැඳින්විය හැකිය.



ප්‍රවීණ ජ්‍යෝතිෂවේදී සුබසෙත ජ්‍යෙෂ්ඨ කර්තෘ අජිත් ධර්මසිරි

**2020 අගෝස්තු 23 සිට අගෝස්තු 29 දක්වා**

## මේෂ ලග්නය - දැඩි සිත් තැවුලක්

මේෂ ලග්නය හිමි ඔබගේ කේන්ද්‍රයට අනුව චන්ද්‍රයා මෙම සතියේ 06 - 07 - 08 - 09 යන ස්ථානවල ගමන් කිරීමෙන් සතිය ආරම්භයේදීම කිසියම් සිත් තැවුලකට පත්වීමට බොහෝ දුරට ඉඩකඩ ඇති නිසා කල්පනාකාරි වන්න. ඔබ තුළින් සිදුවිය හැකි නොගැළපෙන කටයුත්තක් නිසා අන් අයගේ අප්‍රසාදයට ද බඳුන් වීමට සිදු වෙයි. මේ සතිය තුළ කුජ ලග්නගතව හිඳීමද දැඩි මානසික අසහනකාරි තත්ත්වයකට මුහුණ දීමට සිදු වෙයි. ශරීර සෞඛ්‍ය පිළිබඳ සිතනවා නම් මුත්‍ර ආපදා වකුගඩු ආපදා පවතින අයගේ එම රෝග උත්සන්න වීමක්ද දක්නට පුළුවන.

## වෘෂභ ලග්නය - නොසිතූ උවදුරක්

වෘෂභ ලග්නය හිමි ඔබගේ කේන්ද්‍රයේ චන්ද්‍රයා 05 - 06 - 07 - 08 යන ස්ථානවල මෙම සතිය තුළ ගමන් කිරීම නිසා විශේෂයෙන් ආරම්භයේ සුබදායක වන අතර සතිය මැද භාගයේ සිට අපහසුතා රැසකට මුහුණ දීමට සිදුවෙයි. තම දියණියකගේ අයහපත් කල්ක්‍රියාව නිසා තමාට සමාජයේ ගැරහුම් ලැබීමට පවා ඉඩ ඇති සතියකි. තමාගේ නොසැලකිලිමත්කම නිසා විය හැකි අතපසු වීමක් තම ආර්ථිකයට තදින් බලපානු ඇත. ලියකියවිලිවලට අත්සන් කිරීමේදි එබඳු අඩු ලුහුඩුකම් උදාවිය හැකි වෙතත් කල්පනාකාරි ලෙස කටයුතු කළහොත් එම අපහසුතා මඟහරවා ගැනීමට හැකිවේ.

## මිථුන ලග්නය - මුදල් ප්‍රතිලාභ

මිථුන ලග්නය හිමි ඔබගේ කේන්ද්‍රයට අනුව මෙම සතියේ චන්ද්‍රයා 04 - 05 - 06 - 07 යන ස්ථානවල ගමන් කරන නිසා මුදල් ප්‍රතිලාභයකට හේතුවෙයි. විශේෂයෙන් තමාට කලක් පැවති තිබූ ආර්ථික පාඩු අවම කර සතුටුදායක ආර්ථික ලැබීමකට හේතු මතු කරයි. නමුත් පපුවේ අධික සෙම ගතිය නිසා පීඩා විඳීමට බොහෝවිට ඉඩකඩ ඇති නිසා සීතල ආහාරපාන අවම කර සීතල ජලය ස්නානය අවම කර ශරීර සෞඛ්‍ය ගැන සැලකිලිමත් වීම වැදගත් වනු ඇත. සතිය අවසානයේ තම මවට යම්කිසි සෙම් අමාරුවකින් පීඩා විඳීමට ද සිදුවීමට පුළුවන. මවගේ ආරක්ෂාව පිළිබඳවද සිතට ගතයුතු සතියකි.

## කටක ලග්නය - නීතිමය ගැටලුවක්

කටක ලග්නය හිමි ඔබගේ ක්ෂේත්‍රයේ චන්ද්‍රයා මෙම සතියේ 03 - 04 - 05 - 06 යන ස්ථානවල ගමන් කරමින් කිසියම් නීතිමය ගැටලුවකට මුහුණ දීමට බොහෝවිට ඉඩ ඇති නිසා ප්‍රවේශම් වන්න. ඔබගේ නිවස ඉඩම පිළිබඳ බාහිර පාර්ශවයෙන් බලපෑම් එල්ලවීම නිසා එබඳු නීතිමය ගැටලු ඒමට පුළුවන් වුවද එය සතිය මැද භාගයේ සිට ඔබගේ සැනසිල්ලට හේතුවන කරුණු කාරණා බවට පත්වීමට හේතුවෙයි. කල්පනාකාරී ලෙස කටයුතු කිරීමෙන් විය හැකි අසුබ අවම කර ගැනීමට පුළුවන් වේ. උරහිස ආශ්‍රිත ස්නායුගත ආපදාවකට හේතු විය හැකි නිසා තදබල ලෙස බර ඉසිලීම වැනි දෙයින් වැළකී සිටීම ඔබගේ යහපත පිණිස වෙයි.

## සිංහ ලග්නය - දේපළ හිමිකමක්

සිංහ ලග්නය හිමි ඔබගේ කේන්ද්‍රයේ චන්ද්‍රයා මෙම සතියේ 02 - 03 - 04 - 05 යන ස්ථානවල ගමන් කිරීමද කුජ ග්‍රහයා 09 වැන්නේ සිට 3 වැන්නා සිය දෘෂ්ටිය හෙළමින් ඔබට ආර්ථික වාසියක් සමඟ ඉඩමක නිවසක හිමිකම උදා කරයි. තමාට හිමි වෙන්නට තිබූ අන්සතු ඉඩමක් හෝ නිවසක් වේ නම් එය තමාට හිමි වන ලකුණු පෙන්වන සතියක් බැවින් කල්පනාකාරි වන්න. සිකුරු ග්‍රහයා ද 11 වැන්නේ සිට සිය ආර්ථික ලැබීම තව තවත් තහවුරු කරන අතර විශේෂයෙන් ඔබට බොහෝ ඥාති හිතවතුන්ගෙන් ඒ සඳහා ඇප උපකාරද හිමි වෙයි.

## කන්‍යා ලග්නය - සිතේ සතුට උතුරා යයි

කන්‍ය ලග්නය හිමි ඔබට මේ සතියේ බොහෝ යහපත්කම් රැසක් උදාකර දෙන්නකි. විශේෂයෙන් චන්ද්‍රයා - ඔබගේ ක්ෂේත්‍රයට අනුව 01 - 02 - 03 - 04 යන ස්ථානවල ගමන් කිරීමම මෙම යහපතට හේතු වෙයි. සිතේ සතුට උතුරා යන කරුණු කෙරේ හේතු වෙයි. නිර්මාණශීලී අදහස් උදහස් සිතට පැමිණේ. විශේෂයෙන් කවි ගීත නිර්මාණ කරන අයකුට ඒ සඳහා සුදුසු පරිසරය ගොඩනඟන සතියකි. ඒ අයුරින්ම ඒ සඳහා ඔබට බොහෝ අයගේ ඇප උපකාර ලැබේ. ප්‍රවේශම් නොවුවහොත් පපුවේ හිසේ සෙම ගතිය උත්සන්න වීමට පුළුවන.

## තුලා ලග්නය- ජාත්‍යන්තර මට්ටමේ උපකාර

තුලා ලග්නය හිමි ඔබගේ කේන්ද්‍රයේ මෙම සතිය තුළ චන්ද්‍රයා 12 - 01 - 02 - 03 යන ස්ථානවල ගමන් කිරීම නිසා විශේෂයෙන් ජාත්‍යන්තර මට්ටමේ උපකාර ලැබෙන සතියකි. විශේෂයෙන් ඔබ අපේක්ෂා කරන ව්‍යාපාරයක් වෙත්නම් ඒ සඳහා ආයෝජනය කිරීමට සුදුසු සතියකි. විවාහ ස්ථානගත කිසියම් මතභේදයකට තුඩු දෙන කරුණු යෙදේ. එසේ වන්නේ සතිය පුරාවටම ඔබට නිවසින් බැහැරව කිරීමට සිදුවන රාජකාරියක් නිසා වන්නට පුළුවන. කෙසේ කාර්ය බහුල වුවද තම නිවැසියන් පිළිබඳ වැඩි සැලකිල්ල දැක්වීම තුළින් ඒ අපහසුතාද මග හරවා ගැනීමට ඔබට හැකිවේ.

## වෘශ්චික ලග්නය - සතිය පුරා සිතේ සතුට

වෘශ්චික ලග්නය හිමි ඔබගේ කේන්ද්‍රයේ චන්ද්‍රයා මෙම සතියේ 11 - 12 - 01 - 02 යන ස්ථානවල ගමන් කිරීම නිසා සතිය පුරාම සිතේ සතුට ඇති කරවන කරුණු කාරණා යෙදෙනු ඇත. කිසියම් ආර්ථික වාසියක් එළඹෙන සතියකි. අලුත් ඇඳුම් පැලඳුම් මිලදී ගැනීමට හේතු වන සතියකි. එසේම කිසියම් උත්සවශ්‍රීයක් ඔබ නිවස තුළ ඇති කෙරෙන සතියකි. බොහෝවිට එබඳු උත්සව කටයුතු නිසා ගත වෙහෙසා වැඩ කිරීමට සිදුවීමෙන් සතිය අවසානයේ විවිධ ශාරීරික අපහසුතා සහිතව කල්ගත කිරීමට ඔබට සිදුවෙයි.

## ධනු ලග්නය - රැකියා ප්‍රතිලාභ

ධනු ලග්නය හිමි ඔබගේ කේන්ද්‍රයේ චන්ද්‍රයා මෙම සතියේ 10 - 11 - 12 - 01 යන ස්ථානවල ගමන් කිරීමෙන් දණහිස ආශ්‍රිත උවදුරකට බොහෝවිට ඉඩ ඇති වේ. රැකියාවේ ප්‍රතිලාභයකට හේතු වෙයි. තමා කලක් පරිශ්‍රමයෙන් අපේක්ෂා කළ තනතුරු උසස් වීමක් මතුකර දෙන සතියකි. ඒ නිසාම සිතේ සතුට, අභිවෘද්ධිය, ආර්ථික වාසි හා ඒ තුළින් ඔබගේ කටයුතු රැසක් ඉටුකර ගැනීමට හැකිවනු සතියක් ද වෙයි. කෙසේ කොහොම වුවත් අන් අය ඔබ වෙත පැමිණ කරන උදව් උපකාර පිළිබඳ සෝදිසිය අවශ්‍යයි. නැතහොත් එබඳු අය ඔබගේ යහපතට බාධා ගෙන දෙනු ඇත.

## මකර ලග්නය - පෙර පින් මතු කෙරේ

මකර ලග්නය හිමි ඔබගේ කේන්ද්‍රයට අනුව චන්ද්‍රයා මෙම සතියේ 09 - 10 - 11 - 12 යන ස්ථානවල ගමන් කරමින් පෙර පින් මතු කරන සුළු සතියක් උදාකර දෙයි. විශේෂයෙන් දහමට නැඹුරු කරන අන්දමේ පිංකම් රැසකට ඔබට සහභාගි විය හැකි සතියකි. විශේෂයෙන් ඔබට කිසියම් දේපළක අයිතිවාසිකමක් හිමිවන බව පෙනේ. තමාට පිටරට සිටින අයකුගෙන් ලැබෙන උපකාරයක් නිසා ආර්ථික වශයෙන් ඔබ ගැටලු රැසකට මුහුණපා සිටි යුගය අවසන් කිරීමට හැකිවනු ඇත.

## කුම්භ ලග්නය - තුනටියේ ආපදාවක්

කුම්භ ලග්නය හිමි ඔබගේ කේන්ද්‍රයට අනුව මෙම සතියේ චන්ද්‍රයා 08 - 09 - 10 - 11 යන ස්ථානවල ගමන් කරමින් සතිය ආරම්භයේදීම තුනටියේ ආබාධයකට මුහුණ දීමට සිදුවනු ඇත. ඒ නිසාම කිසියම් ආර්ථික පාඩුවකට ද හේතු විය හැකිය. තම සහකාරිය හෝ සහකරුද ඔබ වෙතින් දුරස්වන ලකුණු පෙනෙන්නට තිබේ. තමාට තම දේපළක්, වාහනයක්, ඉඩමක් හෝ වෙනයම් භෞතික සම්පතක් විකුණා දැමීමට පවා කරුණු එළඹේ. තමා නොසැලකිල්ලෙන් කටයුතු කළහොත් මෙසේ සිදුවිය හැකිය. නමුදු ඉතා යහපත් සිහිකල්පනාවෙන් කටයුතු කළහොත් මෙම පාඩු අවම කර ගැනීමට ඔබට පුළුවන.

## මීන ලග්නය - මංගල යෝජනා ශක්තිමත්වේ

මීන ලග්නය හිමි ඔබගේ කේන්ද්‍රයට අනුව මෙම සතියේ චන්ද්‍රයා 07 - 08 - 09 - 10 යන ස්ථානවල ගමන් කිරීම ඔබට සුබදායක වෙයි. අවිවාහක අයට මංගල යෝග උදාකරන සතියකි. කලක් ඔබ වෙතින් ඈත්ව සිටි ආදරවන්තයා හෝ ආදරවන්තිය නැවත ඔබ කරා එන සතියකි. අඩාළවී තිබූ මංගල යෝග ශක්තිමත් වනු ඇත. තවද ආර්ථික වශයෙන් රැකියාමය වශයෙන් පීඩාවක්ව තිබූ කරුණු සමනයකට පත්වන කරුණු යෙදේ. තම ආගමික කටයුතු කෙරේ වඩ වඩාත් යොමු වීමෙන් ඒ සහනය ඉක්මන්ව ඔබට උදාකර ගත හැකි අතර ඉතා දැඩි විශ්වාසයෙන් යුතුව තම කටයුතු ඉටු කිරීමෙන් ඒ සහනය නොඅඩුව ළඟා කර ගැනීමට ඔබට හැකි වෙයි.

● නන්දසේන සූරියආරච්චි

# රැජින ඇල්ලූ අත සතියක් නොසේදූ මන්ත්‍රී බිරින්දෑවරු

**එක දවසක් ශ්‍රී නිශ්ශංක මන්ත්‍රණ සභාවට පැමිණියේ අමුතු ඇඳුමක් ඇඳගෙනය. කලිසම සමඟ ඇඳ සිටි කමිසය කරවැසිය හැකි නොවිය. කථානායකවරයා ලෙස එදා සිටියේ ප්‍රැන්සිස් මොලමුරේ ය. කථානායකවරයා ශ්‍රී නිශ්ශංකයන් කැඳවා මේ ඇඳුම ඇඳගෙන මන්ත්‍රණ සභාවට පැමිණිය නොහැකි යැයි දැන්වීය. මුළු මන්ත්‍රණ සභාවම සිනාසෙන්නට පටන්ගත් නිසා ශ්‍රී නිශ්ශංක පත්වූයේ දැඩි අසීරුතාවයකටය. ඔහු වහාම එළියට ගියේ ය. පැය භාගයක් යන්නට මත්තෙන් නිශ්ශංකයන් පැමිණියේ ටයි කෝට් ඇඳගෙන නොව බුරුම කබායකින් සැරසීය. බුරුම කබායේ කර වැසිය නොහැකි නිසා කථානායකට කිසිවක් කිව නොහැකිවිය. වට පිට බැලූ කථානායකවරයා දුටුයේ සභාවේ සියලු දෙනාම තමා දෙස බලා සිනාසෙන ආකාරයයි.**

වැලිමඩ ආසනයෙන් තේරී පත්ව ආ බඹරපනේ මන්ත්‍රීවරයා රෙදි කෝට් ඇඳ මන්ත්‍රණ සභාවට පැමිණි කෙනෙකි. වෙනත් මන්ත්‍රීවරුන් ජාතික හෝ යුරෝපීය ඇඳුමින් සැරසී පිළිවෙළකට ආවත් අර මන්ත්‍රීවරයා සභාවට පැමිණි දිනයේ රෙද්ද හැඳ, එයට උඩින් විශාල රතු පාට කැන්වස් පටියක් බැඳගෙන ආවේය. විශාල ගාන්චු දෙකක් බඳ පටිය ඉදිරිපිට විය.

මෙබඳු දේවල් පාර්ලිමේන්තුවේ තිබියදී, පැවති රැස්වීමකදී ආචාර්ය එන්.එම්. පෙරේරා කතාවක් පවත්වමින් “පාර්ලිමේන්තුවේ ඉන්නෙ පුදුම සත්තු” යැයි ප්‍රකාශ කළේ ය. මේ ප්‍රකාශය කොතෙක් දුර දිග ගිය එකක් ද යත්, පාර්ලිමේන්තුව අපහාස කිරීමේ චෝදනාවට උසාවියට යෑමට තරම් බලවත් වූ ප්‍රකාශයක් විය.

එදා බද්දේගම මන්ත්‍රීවරයා වූ සයිමන් අබේවික්‍රම මන්ත්‍රණ සභාවට පැමිණියේ යුද්ධ කාලයේ රට පුරා සහල් හිඟයක් වූ නිසා ලොකු බෝතලයකට හාල් එකක් පුරවා ගෙනය. කොතනක ගියත් ඔහුගේ මෝටර් රථයේ හාල් බෝතලයක් තිබිණ. මන්ත්‍රණ සභාවේදී දහවල් ආහාරයට බත් කෑ මන්ත්‍රීන් අතර සයිමන් අබේවික්‍රම ගැන ද සඳහන් කළ යුතු ය. අනෙක් බොහෝ අය ඉංග්‍රීසි තාලයට කෝසස් සාදවා ගෙන කති. සයිමන් අබේවික්‍රම එවක සිටි මන්ත්‍රීවරු අතර හදිසි කාරයෙකි. කාර් එකේ ඉඳගෙන ම තෝමස් අප්පු... චාර්ලිස් අප්පු... කියමින් කෑ ගසයි. කාර්යාල කාර්ය සහායකයකු “හාමුදුරුවනේ.... එනවා” යැයි කියාගෙන කාර් එක ළඟට දුව යයි.

මේ දිනවල සයිමන් අබේවික්‍රම පදිංචිව සිටියේ ගල්කිස්සේ ඔවුන්ගේ නිවසේය. දෙහිවල ගල්කිස්ස නගරාධිපතිවරයා හැටියට ද සිටි සයිමන් අබේවික්‍රමට ඡන්ද කාලයේදී උදව් කළ මාටින් නමැති පුද්ගලයකු සිටියේය. ඔහු ඒ වනවිට මැණික් කාරයන්ට ගයිඩ් වැඩ කළ පුද්ගලයෙකි. බොහෝ දෙනා ඔහුට කීවේ හුළං මාටින්, ගංජා මාටින් ආදී නම් ය. එහෙත් ඔහු සයිමන් අබේවික්‍රමගේ හිත දිනාගත් පුද්ගලයෙකි. මේ වනවිට එම ප්‍රදේශයේ ගම්මුලාදෑනි තනතුරකට ඇබෑර්තුවක් තිබිණ. දිනක් මේ හුළං මාටින් ද සයිමන් අබේවික්‍රම හමුවීමට පැමිණියේය.

“සර් උදව්වක් ඉල්ලන්නයි ආවේ”

“මොනවගේ උදව්වක්ද?”



එළිසබත් රැජින

“ගම්මුලාදෑනි කමකට ඇබෑර්තුවක් තියෙනව. ඒක මට අරගෙන දෙන්න”

අබේවික්‍රමට සිනා පහළ විය.

“උඹට මොන ගම්මුලාදෑනිකම්ද මිනිහෝ. උඹට වඩා ඒ රස්සාවට සුදුසු අය මේ රටේ නැද්ද?”

මාටින්ගේ මූණ ඇඹුල් විය. ඔහු විපිළිසර වී ගිය අයුරු දුටු අබේවික්‍රම, “මේ මිනිහ මට ගොඩක් උදවු කරපු කෙනෙක්. සුදුසුකම් නැතත් මම මේ මිනිහට මේ රස්සාව අරගෙන දෙනවා” යයි තීරණය කළේය.

“හරි මම ඒක කරල දෙන්නම්. උඹ අපිට ගොඩක් උදවු කරපු මිනිහෙක් නේ” යයි කීවේය.

පසුවදා සයිමන් අබේවික්‍රම හමුවීමට පළාතේ වැදගතකු හා ඉගෙන ගත් පුද්ගලයෙකු ලෙස නම ගිය කාර් හිමියෙක් ද පැමිණියේය. එදා කාර් එකක් අයිති පුද්ගලයා විශේෂ පුද්ගලයෙකි. ඔහු පැමිණියේද ගම්මුලාදෑනිකම අරගෙන දෙන ලෙස ඉල්ලා සිටීමට ය.

“මම පොරොන්දු වුණානේ මාටින්ට මුලාදෑනි රස්සාව අරගෙන දෙනව කියල. දැන් පරක්කු වැඩියි.”


“මොනව, මාටින්ට ගම්මුලාදෑනිකමක්?” ඔහු පුදුමයට පත් විය.

මේ මුලාදෑනිකම මාටින්ට නොදෙන ලෙස නගර සභාවේ යෝජනාවක් ද සම්මත විය. එහෙත් පොරොන්දු වූ දෙයක් කෙසේ හෝ කිරීම සයිමන් අබේවික්‍රමගේ පුරුද්දකි.

කිසි දිනක කිසි වැඩකට දෙතුන් ගමනක් නොයන අබේවික්‍රම මේ කරුණ සම්බන්ධව කතා කිරීමට දිසාපතිවරයා හමුවීමට තුන් වරක් ම ගියේ ය. කෙසේ හෝ එම පොරොන්දුව



සර් ජෝන් කොතලාවල



ෆැන්සිස් මොලමුරේ



ඇන්. ඇම්. පෙරේරා



එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක

### ආචාර්ය එන්.එම්. පෙරේරා කතාවක් පවත්වමින් “පාර්ලිමේන්තුවේ ඉන්නෙ පුදුම සත්තු” යැයි ප්‍රකාශ කරයි

### ඇර සොයිසා කතාව හැදුණේ එම්.පී. ද සොයිසා පාර්ලිමේන්තුවේදී බණ්ඩාරනායකට එරෙහිව කතා කළ මන්ත්‍රීවරයකුට ගහන්නට ගිය අවස්ථාවේලු

### සයිමන් අබේවික්‍රම මාටින්ට ගම්මුලාදෑනිකම දෙන්න දිසාපතිවරයා හමුවීමට තුන්වරක් යයි

ඉටු කළේ ය. මේ කාලයේ මන්ත්‍රීවරු අතරින් බස් රියේ ගමන් ගත් මන්ත්‍රීවරු අතර එම්.පී. ද සොයිසා ද විය. බලපිටියේ සිට කොළඹ බස් රියෙන් පැමිණෙන ඔහු ගෝල්ෆේස් පිටිය ඉදිරිපිට බස් නැවතුම් පොළෙන් බසයෙන් බසී. ගේට්ටුවෙන් මන්ත්‍රණ සභාවට ඇතුළුවීමට වඩා තාප්පයට උඩින් පැන ඒම මේ මන්ත්‍රීවරයාගේ පුරුද්දකි. බසයෙන් ආවත් සෑහෙන විශාල බෑග් එකක් රැගෙන ඒම මේ මන්ත්‍රීවරයාගේ සිරිතකි.

අදත් සුප්‍රකට කියමනක්ව පවතින “ඇරසොයිසා” කතාව ඇරඹුණේ මේ මන්ත්‍රීවරයා සම්බන්ධවය. බණ්ඩාරනායකයන් ගැන මොහු තුළ තිබුණේ දැඩි භක්තියකි. එක් දිනක් විරුද්ධ පක්ෂයේ කථිකයෙක් බණ්ඩාරනායකයන්ට අපහාස කතාවක් කියද්දී අසල තිබූ ආසනයක් රැගෙන ඔහු වෙතට දුව ගිය සොයිසා මන්ත්‍රීවරයා එම කතාව කියූ මන්ත්‍රීවරයාට පහර දෙන්නට හදත් ම බණ්ඩාරනායකගේ හිතවත්තු “ඇර සොයිසා... ඇර සොයිසා...” කියා සභාවම දෙවනත් කළේ ය.

සර් ජෝන් කොතලාවල අගමැති ලෙස සිටි කාලයේ මුල් වතාවට එළිසබත් රැජින ලංකාවට පැමිණියාය. රැජින අතින් පාර්ලිමේන්තු වාරය විවෘත කිරීමට විශාල උත්සවයක් පිළියෙල විණ. මැති ඇමැතිවරු සියලු දෙනාම රැජින හා අතට අතදී කතා කිරීමට සර් ජෝන් අවස්ථාව සලසා තිබුණි. “මේ ඉන්නේ අහවල් ඇමැතිතුමා, මේ පාර්ලිමේන්තු ලේකම් තුමා, මේ අහවල් මන්ත්‍රී තුමා” ආදී වශයෙන් රැජින හා මැති ඇමැතිවරුන් හඳුන්වා අතට අත දීම මෙහි විශේෂ අවස්ථාවක් විය. මේ අවස්ථාව මන්ත්‍රීවරුන්ට ලැබුණත් මන්ත්‍රීවරුන්ගේ භාර්යාවරුන්ට නොලැබිණ. එය සමහර මන්ත්‍රීවරුන්ගේ භාර්යාවන් මෙය දුටුවේ මදි පුංචිකමක් ලෙසිනි. සර් ජෝන් හමුවීමට මන්ත්‍රීවරුන් බොහෝ දෙනකුගේ භාර්යාවෝ පැමිණියහ. අගමැති කාමරය එදා මන්ත්‍රී භාර්යාවරු පිරී ගිය එකක් විය.

“ඇයි අපට අවස්ථාවක් දෙන්නෙ නැත්තෙ රැජිනට අතට අත දෙන්න?” යයි එක හඬින් කියා සිටියහ. මෙය සර් ජෝන්ට මහා හිසරදයක් විය. කළ යුතු එකම දෙය මෙය රැජිනට කීම යයි සර් ජෝන් කල්පනා කළේ ය.

“අපේ මන්ත්‍රීවරුන්ගෙ නෝන මහත්වරු ඔබ තුමියට සුබ පතන්න ඇවිත් ඉන්නවා. කරුණාකර ඇවිත් ඒ අය හමුවී කතා බස් කරන්න” යයි රජගෙදරට ගිය සර් ජෝන් රැජිනට කීවේය.

රැජින නැවත වරක් පාර්ලිමේන්තු ගොඩනැගිල්ලට ආවාය. මන්ත්‍රීවරුන්ගේ භාර්යාවෝ පෙළ ගැසී සිටියහ. අතට අත දීමට පොර කමින් ඉදිරියට ආහ.

වෛවාරණ ඇඳුම් පැලඳුම්වලින් සැරසී සිටි මේ බිරියන් අතරින් සමහරෙක් චිත්‍රපට නිළියන් දර්ශන රූපගත කිරීමට යද්දී වත්සුණු තවරා ගන්නා ලෙස වැඩිපුර කැපී පෙනෙන ලෙස සරසාගෙන සිටියහ. පළාතම විවිධ සුවඳින් පිරී තිබිණ.

අතට අත දීමෙන් පමණක් නොසෑහුණු මන්ත්‍රී බිරියන් පෙරළි පෙරළී වඳින අයුරු දුටු මන්ත්‍රීවරුන්ගේ මුහුණු රතු විය.

ඊට සතියකට පසු එක මන්ත්‍රීවරයෙක් තවත් මන්ත්‍රීවරයකුට මෙසේ කීය.

“අපේ නෝන මහත්තය රැජිනට දීපු අත හෝදන්ට දුකෙන් සතියක් අත හේදුවේ නෑ.”

“මමත් කියන්න හිටියෙ අපේ එක්කෙනාත් එදා ඉඳල තවම අත හේදුවේ නෑ.”

මුතුරාජවෙල සංවර්ධන සැලසුමක් ක්‍රියාත්මක කිරීමටත් ඒ සමඟම හැඳල ප්‍රදෙශයේ තෙල් පිරිසිදු කරන මධ්‍යස්ථානයක් ඇති කිරීමටත් අගමැති සර් ජෝන් කොතලාවල සැලසුම් කර තිබුණි. මේ සැලසුම යටතේ හැඳල ප්‍රදේශයේ ජනතාව සතු ඉඩකඩම් විශාල ප්‍රමාණයක් රජයට පවරා ගන්නා බවට රාවයක් පැතිරෙමින් තිබිණ.

එවකට වාරියපොළ මන්ත්‍රීවරයා පදිංචිව සිටියේ හැඳල ප්‍රදේශයේ ය. මන්ත්‍රීවරයා හමුවූ ගැමියෝ තමාගේ දුක් ගැනවිලි ඉදිරිපත් කොට කෙසේ හෝ අගමැතිතුමාගෙන් සහනයක් ලබා දෙන්නැයි ඉල්ලා සිටියහ.

එදා කොතලාවල මහතා පාර්ලිමේන්තුවට පැමිණ මෝටර් රථයෙන් බැස්සා පමණි. මහා සෙනගක් පිරිවරාගෙන ආ මන්ත්‍රීවරයා කොතලාවල මහතා ඉදිරියට ගියේ ය.

“අනේ සර්... මේ අයගෙ ඉඩකඩම් ආණ්ඩුවට ගන්න යනවලු. බලන්න මම දවස් තුනකින් නිදාගත්තෙත් නෑ. මට නිදාගන්න වෙලාවක් නෑ. රෑ එළිවෙනකම් මේ අය ඇවිත් මට කරදර කරනවා. මේ බලන්න සර්...” යයි කියමින් මහ හඬින් ඉකිබිඳිමින් හඬන්නට පටන් ගත්තේ ය.

කොතලාවලට යකා නැග්ගේය. “මොකද යකෝ අඬන්නෙ? එක්කො කියල ඉවර වෙලා අඬපන්. එහෙම නැත්නම් අඬල ඉවර වෙලා කියපන්.”

කොතලාවලගේ හඬින් මන්ත්‍රීවරයා බියට පත් විය. හැඬුම නවත්වා බයෙන් බයෙන් ජනතාවගේ දුක් ගැනවිලි ඉදිරිපත් කළේ ය.

“තමුසෙලා තුන් සීයයි. මම හදන්නෙ තුන් දාහකට රස්සාවල් දෙන්න. මගේ තීරණේ වෙනසක් නෑ” සර් ජෝන් කෙළින් ම තම කාමරයට ගියේ ය.

---

● සටහන හා ඡායාරූප
**ජයසිරි පේදුරුආරච්චි**
ගන්දර සමූහ

# “ව්‍යාපාරික ලෝකයෙන් දියවන්නාව තරණය කළ කරුණා මුදලාලි”

**මාතර යනු ව්‍යාපාරික ලෝකයට රජදහනකි. දේශපාලනයට හොඳ පොරපිටියකි. මෙම අංශ දෙකම පිළිබඳ ඈත අතීතයේ සිටම කතාබහට ලක්වන්නේ ව්‍යාපාරික ලෝකයේ හා දේශපාලන ක්ෂේත්‍රයේ මාතරින් ආ මිනිසුන් බොහෝ හපන්කම් පෙන්වා ඇති නිසාය. පසුගියදා අවසන්වූ පාර්ලිමේන්තු මහා මැතිවරණයත් සමග යළි මේ ක්ෂේත්‍ර දෙකම පිළිබඳව වැඩි වශයෙන් කතා කරන්නට පටන්ගෙන ඇත්තේ මැතිවරණයත් සමග ඇතිවූ මහා වෙනස්කම් ද සමඟය. ඒ මෙවර මහ මැතිවරණයේදී පළපුරුදු ජ්‍යෙෂ්ඨයන් රැසක් අබිබවා දියවන්නාව තරණය කරන්නට ව්‍යාපාරික ලොව ජයගත් මාතර මිනිසකුට හැකිවීම ඊට හේතුවයි. ඒ අන් කවරකුවත් නොව කරුණා සමූහ ව්‍යාපාරයේ අධිපති කරුණාදාස කොඩිතුවක්කුය.**

“මම ව්‍යාපාරිකයකු වන්නට පෙර අපේ මාමාගෙ කඩේ කැෂියර් විදියටයි වැඩ කළේ. මේ ගමන හරිම අමුතු එකක්. කලින් සැලසුම් කරපු එකක් නොවෙයි. මේක මගේ දෛවෝපගත දෙයක් වන්නට ඇති” කතාබහට මුලපුරමින් කරුණාදාස කොඩිතුවක්කු කීවේය.

හොරගොඩ මධ්‍ය මහා විද්‍යාලයේ අධ්‍යාපනය ලැබූ කොඩිතුවක්කු පාසල් කාලය හමාර කිරීමෙන් පසු කොළඹට පැමිණ ඇත්තේ ඇතුළුකෝට්ටේ තිබූ ජනතා ස්ටෝර්ස් නම් තම මාමාගේ කඩේ වැඩකරන්නට ය. ටික කාලයක් එහි වැඩකරණ කොඩිතුවක්කු මාමා යටතේ තිබූ කොළඹ වරායේ ආපන ශාලාවේ වැඩට එක්වන්නේ මුදල් අයකැමි විදියට ය. ඒ වයස දහ අටේදී ය. හැඩකාර, දඟකාරයකුවූ කොඩිතුවක්කු, මාමා සමඟ ඇතිකරගත් නොහොඳ නෝක්කාඩුවක් නිසා නැවත ගමේ එන්නට තීරණය කරන්නේ කොළඹ ජීවිතය අවසන් කරමිනි. එහෙත් එකට අධ්‍යාපනය ලැබූ ප්‍රේමසිරි නම් යාළුවා යෝජනා කරන්නේ ගමේ නොගොස් කොළඹ සිට කුඩා ව්‍යාපාර කටයුතුතක් අරඹමු කියාය. ඒ කොඩිතුවක්කු ගේ හැරවුම් ලක්ෂයයි.

“මම මාමගෙ කඩෙන් අයින්වෙලා ප්‍රේමසිරිගෙ යෝජනාව මත බිස්නස් එකක් පටන්ගත්තා. ඒ 1981 දී. පාසල් උපකරණ තමයි අපි විකුණුවේ. ඒක සාර්ථක වුණා. පසුව අපි සීසන් බිස්නස් වලටත් යොමුවුණා. ජනවාරියේ පාසල් උපකරණ, අවුරුදු කාලයට රෙදි, නත්තලට ඊට අවශ්‍ය දේවල්. ඒ වැඩේ බොහොම සාර්ථක වුණා. පසුව අපි තට්ටු බිස්නස් පටන් ගත්තා. තැන තැන තට්ටුවල බඩු දමා විකුණන එක. ඒකත් දිනෙන් දිනම සාර්ථක වන විට මගේම කියා කඩකාමරයක් ගත්තා. ඒ කොළඹ ඕල්කට් මාවතේ දෙසිය තිස්පහෙන් පහ අංකය දරණ කඩය. එය අපි භාවිත කළේ විකුණන්න ගන්න බඩු ටික ගබඩාකර තබාගන්නයි. පසුව පිටකොටුවේ තට්ටු කීපයක් පටන්ගත්තා. ඒ හැම උත්සාහයක්ම සාර්ථක වුණා” කරුණාදාස කොඩිතුවකක්කු තම ආරම්භය සතුටින් විස්තර කළේය.

මෙලෙස දිනෙන් දින ව්‍යාපාර කටයුතු දියුණුවක් ලබමින් වසර දෙකක් ගතවෙද්දී කොඩිතුවක්කු මහතාගේ අතෙහි ද යහමින් මුදල් ගැවසෙමින් තිබුනේ ඉතිරිකරන්නට ද ඔහු තුළ තිබූ සහජ හැකියාව ද සමගය. 1983 දී ඔහු තව ආයෝජනයක් කරා ගමන් කළේ



තම ව්‍යාපාරික කටයුතු පුළුල් කරමිනි. ඒ තවත් කඩ කාමර පහක් මිලදී ගනිමිනි. ටී ෂර්ට්, යට ඇඳුම්, සරොම්, කමීස ඒවායේ අලෙවිය සඳහා එක්කළේය. ඒ අතර තට්ටු බිස්නස් එක ද නොනවත්වාම පවත්වාගෙන ගියේ ඉන් වැඩි ලාබ ලැබෙනා නිසාය. ඒ අතර 1985 දී කොඩිතුවක්කු තම ව්‍යාපාරය තවත් පුළුල් කරන්නේ ය. ඒ මෙතෙක් අන් අයගෙන් මිලට ගෙන අලෙවි කළ කමීස වෙනුවට තමන්ම එය නිපදවා වෙළෙඳපොළට යොමු කිරීමෙනි.

“ අපි අසූ පහේදී අපේම කියා කමීස මසා වෙළඳපොළට දාන්න පටන් ගත්තා. ඉන් වෙනදාට වඩා හොඳ ආදායමක් ලැබුණු නිසා අපි එය තවත් වර්ධනය කළා. බොහොම සාර්ථක කඩ තුනක් ඒ නිෂ්පාදන අලෙවිය සඳහා යොදා ගත්තා. ඒ හැම උත්සාහයක්ම ඉතාම සාර්ථක වුණා”

මෙලෙස දිනෙන් දින දියුණුව කරා ගමන්කරමින් සිටි කොඩිතුවක්කු වසරින් වසර තම ව්‍යාපාරය පුළුල් කරමින් නව අංග එක්කරමින් සිටියේ තරුණ තරුණියන් රැසකට රැකියා වරම් ද ලබාදෙමිනි. ඒ අතර සුමදුර ප්‍රේමයක ප්‍රතිඵල මත කොඩිතුවක්කු විවාහ දිවියට එක්වන්නේ ගමේම රූමත් තරුණියකවූ අංහංගම විතානගේ කළ්‍යාණි සමඟයි. ඒ 1988 වසරේදී ය. එතැන් සිට තම ව්‍යාපාරික දිවිය වඩාත් ශක්තිමත් වීම කොඩිතුවක්කුට ඉහළ සතුටක් ගෙන දුන් අවස්ථාවක් විය.

“මගේ ගමනට ලොකුම ශක්තිය ලැබුණෙ මගේ නෝනගෙන්. එයා උපාධිය දක්වා අධ්‍යාපනය ලබා සිටියත් රැකියාවක් සඳහා නොගොස් හොඳ බිරිඳක් වුණා. ඒ නිසාම මගේ ගමන ගොඩාක් හොඳට ඉදිරියටම ගමන් කළා. ඇය මට හොඳ බිරිඳක් වගේම හොඳ ගෘහණියක්, හොඳ මවක් ද වුණා. ව්‍යාපාරිකයකු වශයෙන් අද මම ලබන ලොකුම සතුට වෙන මගේ දරුවන් පස්දෙනා රටට ලෝකයට ගැළපෙන හා බරක් නොවන විදියට ඇය හැදුවා. මගේ කාර්යබහුලත්වය තුළ කිසිසේත් දරුවන්ට අඩුවක් පීඩනයක් ඇතිවෙන්න ඇය ඉඩක් ලබා දුන්නේ නෑ. ඒ ශක්තිය නම් මට වචනයෙන් කියන්න තරම් අමාරුයි. ඒ තරමම වටිනවා. ඇය හැබෑම අම්මා කෙනෙක්; බිරිඳක්”.

“මම එකම දේ කරමින් දිගටම කටයුතු කළේ නෑ; ව්‍යාපාරයට නව අංග එකතු කළා. අලුත් වෙළෙඳසැල් ඇරඹුවා. ආනයනට හා අපනයනයට යොමු වුණා; තොග වෙළඳාම කළා. ඒ හැම එකකින්ම ඉදිරියක් ලැබුණා මිස පසුපසට යාමක් සිදුවුණේ නෑ. අද මම ආ ගමන ගැන මම ඉතාම තෘප්තිමත්” කොඩිතුවක්කු එසේ පවසන්නේ තෘප්තියෙනි.

ගමෙන් පැමිණ මෙරට ව්‍යාපාරික ලෝකය ජයගත් අයගේ දූ දරුවන් මුදල් මත යැපෙමින් අධ්‍යාපනයට දෙවැනි තැන දෙමින් ශක්තිමත් දෙවැනි පරම්පරාවක් වෙනුවට පියා ගොඩනැගූ මහා සම්පත් නිසි කළමනාකරණයකින් තොරව හුදු විනොදාස්වාදය වෙනුවෙන්ම යොදවමින් ඉදිරියක් නොදැක කටයුතු කර පියාගෙන් පසු ව්‍යාපර කඩාවැටුණු අවස්ථා අප කොතෙකුත් අසා ඇතත් කරුණා කොඩිතුවක්කු



### මාමාගෙ කඩේ කැෂියර් ලෙස පටන් ගත් ව්‍යාපාරික ගමන ටික කලෙකින්ම දෙස් විදෙස් පතළ වෙයි

### මගේ ගමනට ලොකුම ශක්තිය ලැබුණෙ මගේ නෝනගෙන් කරුණාදාස කියයි

එම තත්ත්වය වෙනස් කර ඇත්තේ තම ආදරණීය බිරිඳගේ කැපවීම ලබා ගනිමිනි. ඒ නිසාම කොඩිතුවක්කුගේ දියණියන් දෙදෙනා හා එක් පුතකු වෛද්‍යවරුන් වෙද්දී තවත් පුතකු ඉංජිනේරුවකු වූයේ ය. බාල පුතු උසස් පෙළ ඉහළින්ම සමත්ව විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨයකට ඇතුළත් වීමේ සූදානමින් සිටින්නේ ය.

“මගේ දරුවො ව්‍යාපාර සඳහා යොදවාගන්නවා වෙනුවට ඒ අයට හොඳට ඉගැන්වූවා. දූල දෙන්න ගියේ සිරිමාවෝ බණ්ඩාරනායක විද්‍යාලයට. පුතාල තුන්දෙනාම රාජකීය විද්‍යාලයට. මම ව්‍යාපාරික ලෝකය ජයගන්නා විට මගේ නෝනා ගෙදරත් දරුවන්ගේ අනාගතයත් හොඳට ගොඩනැගුවා. මට අමුතුවෙන් ඒ ගැන බලන්න වෙහෙසවෙන්න අවශ්‍ය වුණේ නෑ. ගමෙන් ආපු මම අද කොළඹ නගරයේ ඉන්නේ බොහොම සතුටින්” කරුණාදාස කොඩිතුවක්කු ආඩම්බරයෙන් පවසන්නේ ය.

ව්‍යාපාරික ලෝකය ජයගත් කරුණා කොඩිතුවක්කු මහතා 1980 සිට වාමාංශික දේශපානයේ යෙදෙන්නේ තරුණ හැඟීම් ද සමගය. ජනතාවාදී මතයක සිට කටයුතු කළ ද තම ව්‍යාපාරික අරමුණ සඵලකර ගැනීම විනා ක්‍රියාකාරී දේශපාලනයේ යෙදීමේ අදහසක් කරුණාදාස කොඩිතුවක්කු මහතාට තිබුණේ ද නැත. එහෙත් 2015 ජනාධිපතිවරණයේදී මහින්ද රාජපක්ෂ මහතා පරාජයට පත්වීමත් සමග එතුමා සමග සිටි පිරිස් වාසි අපේක්ෂාවෙන් යහපාලනයට එක්වද්දී දියත්කෙරුණ මහින්ද කඳවරු ශක්තිමත් කිරීමේ මහා මෙහෙයුමේ එක් අදියරක් ලෙස කරුණාදාස කොඩිතුවක්කු මහතා ක්‍රියාකාරී දේශපාලනයට පිවිසෙන්නේ ය. ඒ ශ්‍රී ලංකා පොදුජන පෙරමුන බිහිවීමත් සමගය.

“මහින්ද රාජපක්ෂ මැතිතුමා අතහැර මාතර අපේ කණ්ඩායමක් ගියාට පසු ආසන සංවිධායකවරුන්ගේ ප්‍රශ්නයක් ඇතිවුනා. එතකොට තමයි ඩලස් අලහප්පෙරුම හා කංචන විජේසේකර මහත්වරුන් මා සමග කතාකර ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ අකුරැස්ස ආසන සංවිධායකවරයා ලෙස පත්වුනේ. ඒ එක්කම ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ ආගමනයත් එක්ක මම තීරණය කළා රට හා ජනතාව වෙනුවෙන් වැඩක් කරන්න ක්‍රියාකාරීව දේශපාලනයට එන්න” කොඩිතුවක්කු මහතා දේශපාලන ගමන්මගේ ආරම්භය එලෙස කීවේය.

සක්‍රිය දේශපාලනයට පිවිසි කරුණාදාස කොඩිතුවක්කු මහතා ඉලක්ක මත වැඩකර වෙළඳ ලෝකය ජයගත් ආකාරයෙන්ම සිය දේශපාලනික ගමන ද ආරම්භ කළේ අරමුණුගත වැඩපිළිලෙක් සමගය.

“මගේ ව්‍යාපාරික ගමනේ බැංකු ණය නෑ. ඕඩී නෑ. අපි මහන්සිවෙලා උපයාගත් මදලින් තමයි සියලු ව්‍යාපාර ගොඩනැංවූයේ. මම ආසන සංවිධායකවු දින පටන් සැලසුමකට අනුව වැඩකළා. ව්‍යාපාරිකයකු වශයෙන් ලබාගත් දැණුම අත්දැකීම් ඒ සදහාත් යොදාගත්තා. ජනතා අවශ්‍යතා අපේ මට්ටමෙන් ඉටුකළා. ඩලස් අලහප්පෙරුම හා කංචන විජේසේකර මහත්වරු මට දිගටම උදව්කළා”

කරුණාදාස කොඩිතුවක්කු මහතා සක්‍රීය දේශපාලනයට එලෙස යොමුවුවත් වැඩිකලක් යන්නට පෙර පාර්ලිමෙන්තු මැතිවරණයට මුහුණදීමට සිදුවූයේ දේශපාලන පොරපිටියේ සටකපටකම්, නූල් සූත්තර, උප්පරවැට්ටි ආදී කිසිවක් පිළබඳ ප්‍රායෝගික අත්දැකීම් ලබන්නටත් පෙරය. එහෙත් ඔහු එයට සාර්ථකව මුහුණදුන්නේ ය. ඒ තනිවමය. එහෙත් මහ මැතිවරණයේ ප්‍රතිඵල මත කරුණාදාස කොඩිතුවක්කු මහතා මාතර දිස්ත්‍රික් ශ්‍රී ලංකා පොදුජන පෙරමුණු ජයග්‍රාහී ලැයිස්තුවේ දෙවැන්නා බවට පත්ව සිටියේ මනාප එක්ලක්ෂ දාහතරදහස් තුන්සිය දහනවයක් ලබාගනිමිනි. මෙරට මැතිවරණයකට ප්‍රථමවරට මුහුණදුන් අයෙකු ලෙස එලෙස ලැබූ ජයග්‍රහණය අද වන විට දැඩි කතාබහකට ලක්ව ඇත්තේය. ඒ දේශාපාලන පොරපිටියේ බොහෝ හරඹ පෑ ජ්‍යොෂ්ඨයන් අභිබවා නවකයකු ලෙස ලබාගත් විශිෂ්ට ජයග්‍රහණය නිසාය.

“මගේ ජයග්‍රහණය ගැන විපක්ෂය එක එක කතා කියයි. ඒත් මම ජයග්‍රහණය කළේ මට කරන්න පුළුවන් දේ ජනතාවට කියලා. එය ලියලත් දුන්නා. මන්ත්‍රීවරයෙකු ලෙස මටත් මගේ කාර්යමණ්ඩලයටත් ආණ්ඩුවෙන් දෙන දීමනා පෞද්ගලික පරිහරණයට නොගෙන ජනතා අවශ්‍යතා වෙනුවෙන් යොදවනවා. මම ඒ ගැන ජනතාවට ලිඛිත පොරොන්දුවක් ලෙසත් දුන්නා. ජනතාව එය පිළිගෙන මට මනාපය ලබා දුන්නා. ජනතාව මා කෙරෙහි තැබූ විශ්වාසය කඩ නොකර ජනතාවගේ අවශ්‍යතා ඉටුකිරීම වෙනුවෙන් කැපවෙනවා” කරුණාදාස කොඩිතුවක්කු තම අරමුණු හා අපේක්ෂා එලෙස ඍජු ලෙස පැවසුවේය.



මෙවර සතියේ කෙටි කතාව තෝරා දෙනු ලැබුවේ දෙවු ප්‍රවීණ පුවත්පත් කලාවේදී තිලකරත්න කුරුවිට බණ්ඩාරයන්ය. දශක පහකට අධික කාලයක් මාධ්‍යකරණයේ නිරත වන තිලකරත්නයන් සිළුමිණ ප්‍රධාන කතුවරයා ලෙස ද කිහිප වරක් කටයුතු කළේය. කාව්‍ය කෙටි කතා හා ශාස්ත්‍රීය පොත් ගණනාවක් ලියා පළකර කර ඇති හෙතෙම ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ මාධ්‍ය උපදේශක වශයෙන් වර්තමානයේ කටයුතු කරනු ලබයි. මේ දියණි කෙටිකතාව පිළිබඳ ඔහුගේ අදහසයි.

අඹුසැමි දෙපළකගේ වියෝග වේදනාව පළකෙරෙන අතීතාවර්ජනයකි. කල්පසුවී විවාපත් අඹුසැමියෝ උපන් හැටියේ ගැහැනු දරුවකු හදා වඩා ගන්නේ තමන් නමට උප්පැන්නයද ලියවාගෙනය. ඇයට උගන්වා ලොකු මහත් කර කණකර අබරණ සපයා ඉඩකඩම් ලිවීමෙන් පසු ඇය පෙම්වතකු සමඟ පළා යන්නීය.

අඹු සැමි දෙපළට දරාගත නොහැකි වන්නේ ඇගේ දෝෂාරෝපණයයි. තමන් අනාථ දරුවකු බව රහසක් ලෙස තබා ගැනීම ගැන ඇය දොස් තබයි. පන්ති ගිය ගමන් ඇය පළා යන්නේ කණකර අබරණත් - ඉඩම් ඔප්පුවත් රැගෙනය. සමස්ත කෙටිකතාව අඹුසැමි දෙපළගේ අතීතාවර්ජනයයි.

පාඨකයාට ඉතා සමීප අත්දැකීමක් වුවත් සමස්ත කතාව විකාශනය වීමේදී නාටකීය බවක් මතු කිරීමට රචකයා සමත් නොවන බව පෙනේ. සමස්ත අතීතාවර්ජනය දිවෙන්නේ සරල රේඛාවක් දිගේය. “දියණියගේ අතුරුදන් වීමත් - ඇය සෙවීමට දරන වෑයමත් - කණකර ඔප්පු ගෙනගොස් ඇති බව හෙළිදරව් වීමත් - ඇය ලියා තැබූ ලියමන හමුවීමත් තුළින් ඇතිවන කම්පනය ප්‍රබල ලෙස නිරූපණය කිරීමට රචකයා සමත් වී ඇතැයි නොහැඟේ. දරු දුක ප්‍රබල ලෙස දැනුණා නම් මෙතරම් පහසුවෙන් ඔවුනට අස්වැසිල්ලක් ලබා ගත නොහැකි වනු ඇත.

කෙටිකතාවක කතා වින්‍යාසය පිළිබඳ වැඩි අවධානයක් යොමු කිරීමේ වැදගත්කම අවබෝධ කරගත යුතුයැයි හඟිමි.




## කෙටිකතාව

# දියණි



● ටී.කේ. ලයනල්

කාර්යාලයේ වැඩ අවසන් කර නිවෙසට පැමිණෙන විට බෙහෙවින් තෙහෙට්ටුවට පත්වන්නේ සැතපුම් පහක දුරක් බස් රථයේ මඟින් අතර තෙරපීගෙන ගමන් කරන්නට සිදුවන නිසාය. නිවෙසට ගොඩ වදිනවාත් සමඟම බිරිඳ කණස්සල්ලෙන් පසුවන බව මට දැනිණ.

“මහත්තයා, දුව තාම ගෙදර ආවේ නෑ. පන්ති ඇරෙන්නෙ හතරට. මේ වෙනකොට එයා ගෙදරට එන්න ඕනෙ. මොකුත් කරදරයක්ද දන්නෙ නෑ.”

“කලබල වෙන්න ඕනෙ නෑ. අපි තව ටිකක් බලමු. සමහර වෙලාවට යාළුවෙකුගේ ගෙදර යන්න ඇති”

“එහෙම දවස්වල පන්ති යන්න කලින් මට කියලයි යන්නෙ. එහෙම ගියත් මෙච්චර රෑ වෙනකං ඉන්නෙ නෑ.”

බිරිඳ බෙහෙවින් කලබල වී සිටි නිසා මගේ ගතට දැනුණු තෙහෙට්ටුව නොසලකා එසැණින් මම මහ පාරට නැවත ගියෙමි. දියණිය බසයෙන් බැස සැතපුම් භාගයක දුරක් තනිව ගමන් කිරීමට අඳුරු වැටුණු පසු බියක් දක්වන බව දන්නා නිසා මම ගමන ඉක්මන් කළෙමි. පැයකට අධික කාලයක් තාර පාරේ බස් නැවතුමේ සිටියත් දියණිය නොපැමිණියෙන් මගේ සිතට දැනුණේ විශාල බියකි. නැවත නිවෙසට පැමිණි මට බිරිඳ කීවේ නගරයට ගොස් පොලිසියේ පැමිණිල්ලක් දැමීම සුදුසු බවය.

“සමහර විට දරුවා යාළුවෙකුගෙ ගෙදර යන්න ඇති. මොකක් හරි හේතුවක් උඩ එයාට එහෙ නවතින්න සිද්ධ වෙන්න ඇති. ඔයාලට දැනුං දෙන්න විදියක් නැතිවුණාද කියන්න බෑනේ. කෝකටත් හෙට දවසෙ එයා යන එන තැන්වලට ගිහින් හොයලා බලලා හෙට ඇවිත් පැමිණිල්ල දාන්න.” පොලිස් නිලධාරියා පැවසුවෙන් මම ආපසු ගියෙමි.

මා නැවත නිවෙසට ගොඩවනවිට යාබද ඉඩමේ සුගතදාස මල්ලීත් ඔහුගේ බිරිඳ මංගලිකා නංගීත් පැමිණ සිටි අතර මගෙන් විස්තර දැන ගැනීමට ඔවුන් නොඉවසිල්ලෙන් පසුවන බව පැහැදිලිය.

මගේ පැමිණිල්ල පොලීසියෙන් භාර නොගත් බවත් හෙට දින තවදුරටත් සොයා බලා පැමිණිලි කරන ලෙසත් මට උපදෙස් ලැබුණු බව ඔවුන්ට පැවසූ විට මංගලිකා නංගී කීවේ “ඒක හරි අපූරුයි. මේ දැරිවි ඇහට කණට පේන ළමයා. අද රටේ සිද්ධවෙන දේවල්වල හැටියට දරුවට මොනවා වුණාද කියලා අදම හොයන්න එපායැ. හෙට වෙනකොට මොන වගේ දෙයක් සිද්ධ වෙයිද කියලා කවුද දන්නෙ.”

“මටත් ඒක තේරුණා. කෝකටත් හෙට උදේම මම ගිහින් හොයන්න ඕනෙ. ගෙවල් කීපෙකට ගිහින් හොයලා පොලිසියේ පැමිණිල්ලක් දාන්න ඕනෙ.”

එදින රාත්‍රියේ දියණියගේ කාමරයට ගොස් ඇය පරිහරණය කළ පොත්පත්, ලිපි ද්‍රව්‍ය, ලියුම් සියල්ලක්ම පරීක්ෂා කළ මම ඇයගේ මිතුරියන් කීප දෙනෙකුගේම ලිපිනයන් සටහන් කර ගතිමි. මේ අතර බිරිඳ කාමරයට පිවිසියේ හඬාගෙනය.

“මහත්තයා, දරුවාගේ රත්තරන් බඩු

> බිරිඳ බෙහෙවින් කලබල වී සිටි නිසා මගේ ගතට දැනුණු තෙහෙට්ටුව නොසලකා එසැණින් මම මහ පාරට නැවත ගියෙමි. දියණිය බසයෙන් බැස සැතපුම් භාගයක දුරක් තනිව ගමන් කිරීමට අඳුරු වැටුණු පසු බියක් දක්වන බව දන්නා නිසා මම ගමන ඉක්මන් කළෙමි. පැයකට අධික කාලයක් තාර පාරේ බස් නැවතුමේ සිටියත් දියණිය නොපැමිණියෙන් මගේ සිතට දැනුණේ විශාල බියකි. නැවත නිවෙසට පැමිණි මට බිරිඳ කීවේ නගරයට ගොස් පොලිසියේ පැමිණිල්ලක් දැමීම සුදුසු බවය.

> මැතකදී මගේ ඥාතීන් කිහිපදෙනෙකුගෙන්ම ඇය අරන් හදාගත් අනාථ අයකු බව දැනගත් බවත් ඉන් ඇය බලවත් සේ ලජ්ජාවට පත්වූ බවත් ඉන්පසු අප දෙදෙනා කෙරෙහි එතෙක් තිබූ ගෞරවය තවදුරටත් පවත්වා ගැනීම ඇයට කළ නොහැකි බවත් පවසා තිබිණ. දියණියගේ කෙටි ලිපියේ අවසන් වශයෙන් සඳහන් කර තිබුණේ ඇයට බෙහෙවින් ආදරය කරන අයෙකු සමඟ ලස්සන ජීවිතයක් ගත කිරීමට යන බැවින් මින් ඉදිරියට තමා ගැන සොයා බැලීම අනවශ්‍ය බව ය.

ඔක්කොම නෑ. එයාගේ බැංකු පොතයි, උප්පැන්නෙයි දෙකම තිබුණේ මගේ අල්මාරියෙ. ඒවත් නෑ. ඒ විතරක් නෙවෙයි අපේ ඉඩමෙ ඔප්පුවත් නෑ.”

මගේ සිරුර ගැහෙන්නට වූයෙන් මම දියණියගේ ඇඳ මත වැතිරුණෙමි. මා සිතුවාට වඩා යමක් සිදුවී ඇති බව දැන් හොඳටම පැහැදිලිය.

මා විවාහ වූයේ විවාහ විය යුතු කාලසීමාව ඉකුත් වී ගිය පසුවය. මගේ බිරිඳ ද එසේමය.

අපට දරු සුරතල් බැලීමට හැකියාවක් නොමැති බව අප දෙදෙනාම දැන සිටියෙන් දරුවකු අරන් හදා ගැනීමට අප දෙදෙනාම තීරණය කර සිටියදී මගේ මිතුරකු අපට සුබ ආරංචියක් රැගෙන නිවහනට ගොඩවූ ආකාරය මගේ සිතට පිවිසයේ රූංගා ගෙනය. දරු ප්‍රසූතියට රෝහල් ගතව සිටින මවක දරුවා වෙනත් කෙනෙකුට දීමට කැමැත්තෙන් සිටින බැවින් හෙටම ක්‍රියාත්මක විය යුතු බව මිතුරා කීවේය.

ඔහුගේ බිරිඳ රෝහලේ හෙදියක් බැවින් ඇය මඟින් සියල්ලක්ම ඉටුකරගත හැකි බව මට පෙනිණ.

දරු ප්‍රසූතියට ඇතුළත්ව සිටි ගැබිනිය සිය කැමැත්තෙන් රෝහලෙන් පිටවූ බවට ලේඛන සකස්කොට නැවත ඇය රෝහලට ඇතුළු වූයේ මගේ බිරිඳගේ නමිනි. ඊට පසුදා ඇයට ලැබුණු බිලිඳිය මගේ වාසගම සහිතව උප්පැන්නය ලබා ගතිමි. එදා මෙදාතුර අප දෙදෙනා ඇය වෙනුවෙන් අපමණ වෙහෙස මහන්සි වී කටයුතු කිරීමෙන් ඇය මේ වන විට හොඳ මට්ටමින් අධ්‍යාපනය ලබන රූමත් යුවතියකව සිටියාය.

එදා සිට අද දක්වාම මාසික වැටුප ලබාගත් දිනයේම ඇගේ ගිණුමට සැලකිය යුතු මුදලක් තැන්පත් කිරීම නිසා සෑහෙන මුදලක් මේ වනවිට ගිණුම්ගතවී ඇත.

මගේ පියා විසින් ඔහුගේ දහඩිය මහන්සියෙන් වගාකරන ලද අක්කර දෙකක ඉඩමෙන් මේ වනවිට මා සෑහෙන ආදායමක් එක කන්නයකට ලබාගන්නා අතර නව නිවෙසක් මට ගොඩ නැඟීමට හැකිවූයේ මගේ පියාට පින් සිදුවන්නටය. මගේ බිරිඳගේ විනෝදාංශයක් වූයේ වරින්වර රන් භාණ්ඩ දියණිය වෙනුවෙන් මිලදී ගැනීම වුවද කිසිදාක ඊට පටහැනිව මා වචනයක් හෝ කථා කළේ නැත. කෙසේ වෙතත් දියණිය නිසා අපි අසීමිත තෘප්තියක් ලැබුවෙමු. ඇය අප දෙදෙනාගේම ජීවිතවල හිඩැස පිරවීම ගැන ඇඩිසේ ආඩම්බර දෙමාපියෝ වීමු.

පසුදින උදේම නිවෙසින් පිටවූ මා දියණියගේ මිතුරියකගේ නිවෙසට ගොස් විමසූ නමුත් ඇය කීවේ පෙරදින ඇය පන්තියට නොපැමිණි බවය.

තවත් ගැහැනු ළමයකුගෙන් කියවුණේද එම පිළිතුරම නමුත් තුන්වැනි ගැහැනු ළමයා ඊට වඩා යමක් මට පැවසුවෙන් මම අන්ද මන්ද වීමි. මගේ දියණියගේ පෙම්වතාගේ බලපෑම මත දියණිය ඔහු සමඟ යන්නට ඇති බවත් එම තරුණයා තමන් දැක ඇති නමුත් ඊට වැඩි යමක් තමන් නොදන්නා බවත් ඇය කීවාය.

අන්ත අසරණ වූ මා බිරිඳට කථා කළ විට දියණියගෙන් ලිපියක් ලැබී ඇති බැවින් වහාම ආපසු පැමිණෙන ලෙස ඇය කීවේ මහ හඬින් හඬමිනි.

තමා මෙලොවට බිහිකළ මව තමාව ප්‍රතික්ෂේප කිරීම නිසා තමා උස් මහත් කර අධ්‍යාපනය ලබාදීම ගැන දියණිය අප දෙදෙනාට මුලින්ම ස්තුති කරන බව ලියා තිබිණ.

එසේ වුවද තමා දැනුම් තේරුම් දරුවකු වූ පසු එය රහසක් ලෙස දිගින් දිගටම තබාගැනීම සදාචාරසම්පන්න නොවන නිසා ඇය අප දෙදෙනාට තදින්ම දෝෂාරෝපණය කරන බව පවසා ඇත.

මැතකදී මගේ ඥාතීන් කිහිපදෙනෙකුගෙන්ම ඇය අරන් හදාගත් අනාථ අයකු බව දැනගත් බවත් ඉන් ඇය බලවත් සේ ලජ්ජාවට පත්වූ බවත් ඉන්පසු අප දෙදෙනා කෙරෙහි එතෙක් තිබූ ගෞරවය තවදුරටත් පවත්වා ගැනීම ඇයට කළ නොහැකි බවත් පවසා තිබිණ. දියණියගේ කෙටි ලිපියේ අවසන් වශයෙන් සඳහන් කර තිබුණේ ඇයට බෙහෙවින් ආදරය කරන අයෙකු සමඟ ලස්සන ජීවිතයක් ගත කිරීමට යන බැවින් මින් ඉදිරියට තමා ගැන සොයා බැලීම අනවශ්‍ය බව ය.

ජීවිතයේ යම් යම් අවස්ථාවල සෑහෙන හැලහැප්පීම්වලට මුහුණ දුන් මා කිසිදා නැඬූ නමුත් අද මට මෙම සිදුවීම දරාගත නොහැකි වූයෙන් දෑසින් වැගිරෙන කඳුළු වැල් පාලනය කරගත නොහැකි විය. මම බොහෝ වේලාවක් කෑ ගසා ඇඬුවෙමි.

මගේ බිරිඳ මා අබියස සෙල්රුවක් සේ නිසලව, සසලවූ දෙනෙත් විදහා බලා සිටියේ ඇයට දරාගත නොහැකි වේදනාව සඟවාගෙනය.

“මහත්තයා.... අපි මොනතරං දුකක් වින්ඳද මේ දරුවා වෙනුවෙන්. දවසක්දා මහ රෑ දරුවට අසනීප වෙලා අපි දෙන්නා ටවුමටම දිව්වා දරුවා කරපින්නගෙන. දරුවට උගන්නන්න අපි කොච්චර මහන්සි වුණාද? ඒවා දන්නෙ උඩ ඉන්න දෙවියො විතරයි. අපි හරියකට ඇන්දෙ පැළැන්දෙ නැතිවට අපි දරුවගෙ ඇඳුම් පැලඳුම් වලට කණකර වලට කොච්චර වියදං කළාද? ඒ හැම දෙයක්ම ගඟට ඉණි කැපුවා වගේ වුණා. ඔහෙගෙ නෑදෑයන්ගෙ උත්සව වලට අපි දරුවව රත්තරං පෙරවලා හරි ආඩම්බරෙන් අරන් ගියා.

ඒ නෑදෑයො ඉරිසියාවටම තමයි දරුවගෙ හිත දූෂ්‍ය කරලා තියෙන්නෙ. අපි කොච්චර ආදරෙන්ද මේ ළමයා හැදුවෙ. ඒ වුණාට ඊයෙ පෙරේදා ළං වෙච්ච කොල්ලෙක් තමයි එයාට හරි ආදරේ වෙලා ලස්සනට ජීවත් වෙන්න ගිහින් තියෙන්නෙ. ඒ කොල්ලා දැනගන්න ඇති අපේ දරුවගේ වටිනාකම.

ඒ කොල්ලා අපේ දරුවව රවට්ට ගෙන අරන් ගිහින් තියෙන්නෙ අපි දෙන්නගේ දේපොළ ගැන හිතලම තමයි.

ඉඩම් ඔප්පුව අරන් ගියේ ඒ කොල්ලගෙ කියුම් බහට, අපේ දරුව හිතලා මතලා ගෙනිච්චා නෙවෙයි. මෑතක ඉඳලා දරුවා හරිම වෙනස් වුණා.

මට මහත්තයාට ඒක කියන්න තරං දෙයක් නෙවෙයි කියලා හිතුණ නිසයි නොකීවෙ. අපි අපේ දරුවට කොහොමද කියන්නෙ ඔයා අපේ ළමයෙක් නෙවෙයි. අරන් හදාගත්ත දරුවෙක් කියලා. ඇයි මහත්තයො... අපේ දරුවට ඒක තේරුම් ගියේ නැත්තෙ.

> දරුවෙකුගෙ හුරතල් බලන්න අපිට වාසනාවක් නෑ කියලා දැනගත්තට පස්සෙ අනුන්ගෙ දරුවෙක්වත් අරන් හදාගන්න ඕනි කියලා අපි දෙන්නටම ආසාවක් ඇති වුණා තමයි. අනුන්ගෙ දරුවෙක් අරන් හදන කොට එක පාරක් නෙවෙයි දහ දොළොස් වාරයක් අපිට හිතන්න තිබුණා. මං හිතුවෙ අපි වයසට ගියාම අපිට මේ දරුවා අත්වාරුවක් වේවි කියලයි. අසනීපෙකට බෙහෙත් පෙත්තක් කටට දාන්න කෙනෙක් ඉන්නවානං හොඳයි කියලයි මම හිතුවෙ.

අපි ඒ දරුවට අම්මා තාත්තා වෙලා පිහිට වුණා නේද කියලා ඇයි එයාට තේරුම් ගියේ නැත්තෙ. ඇයි එයා තේරුම් නොගත්තෙ අපි නොහිටියනං එයාට අනාථ නිවාසෙක නේද ජීවත් වෙන්න සිද්ධ වෙන්නෙ කියලා. එහෙම වුණානං එයාට ලැජ්ජාවක් ඇතිවෙන්නෙ නැද්ද අනාථ ළමයෙක් කියලා”

“නෝනෙ,.... අපි ඉහත ආත්මෙක මොකක්දෝ පවක් කරලා තියෙන්න ඇති. කමක් නෑ නෝනෙ... මගේ හිතට වාවන්නෙ නෑ තමයි. ඒත්.... අපි විඳගෙන ඉම්මු.

දරුවෙකුගෙ හුරතල් බලන්න අපිට වාසනාවක් නෑ කියලා දැනගත්තට පස්සෙ අනුන්ගෙ දරුවෙක්වත් අරන් හදාගන්න ඕනි කියලා අපි දෙන්නටම ආසාවක් ඇති වුණා තමයි.

අනුන්ගෙ දරුවෙක් අරන් හදන කොට එක පාරක් නෙවෙයි දහ දොළොස් වාරයක් අපිට හිතන්න තිබුණා. මං හිතුවෙ අපි වයසට ගියාම අපිට මේ දරුවා අත්වාරුවක් වේවි කියලයි. අසනීපෙකට බෙහෙත් පෙත්තක් කටට දාන්න කෙනෙක් ඉන්නවානං හොඳයි කියලයි මම හිතුවෙ. අනුංනෙ ළමයි අරන් හදන හැමෝටම මෙහෙම වෙන්නෙ නෑ. අපේ පූරුවෙ අවාසනාවකටම තමයි මේ වගේ දෙයක් වුණේ.... නෝනෙ ඔයාට මතකද මේ දරුවගෙ අම්මා මේ දරුවට කිරි උගුරක් දුන්නෙ නෑ නේද?

අර මිසී කොච්චර කිව්වත් ඒ ගෑනු ළමයා කිරි උගුරක් දරුවට දුන්නෙ නෑ නේද? සමහර වෙලාවට අම්මගේ ගතිගුණ දරුවටත් පිහිටනවා.

අපි එව්වා ගැන ඒ තරමටම හිතන්න යන්න ඕනි නෑ. නෝනෙ... අපේ තාත්තා මේ ඉඩම වෙනුවෙන් කොච්චර දුක් මහන්සිවුණාද වගා කරන්න. ඒත් එයා යනකොට ඉඩම අරන් ගියේ නෑ.

මම කිසිම මහන්සියක් නොවී ඉඩමෙ අස්වැන්න ගන්නවා. ඒ වගේ ඉඩම අපි ඉන්නකං භුක්ති විඳිමු. මොකද අපි දෙන්නා යනකොට මේක අරන් යන්නෙ නෑ. කවද හරි දුව ඇවිත් ඉඩමෙ එල ප්‍රයෝජන අරගෙන මේ ගෙයි පදිංචි වෙයි. අපිට දුක නෑ ඒ දරුවට ඉඩම ගියාට.

ඉඩමෙ ඔප්පුව දුව අරන් ගියා කියලා ඒකට විරුද්ධව කටයුතු කරන්න තරං අපි ඉක්මන් වෙන්න ඕනෙ නෑ. තව දෙයක් තියෙනවා.

අපි මේ ප්‍රශ්නෙ දිහා සුබවාදී පැත්තෙන් බැලුවොත් යම් කිසි කාලෙක දුව එයාගේ දරු පැටව් එක්ක මේ ගෙදරට අඩිය තිබ්බොත් අපිට දූගෙ දරුවො හුරතල් කරන්න වෙන්නත් පුළුවන් වේවි. තවත් විදියකට බැලුවොත් බෑණාගෙ ගති පැවතුම් අනුව මේ ගෙදරින් අපට යන්න වෙන තැනට කරුණු කාරණා සිද්ධ නොවෙයි කියලා කියන්නත් බෑ.

බැරිවෙලාවත් එහෙම දෙයක් සිද්ධ වුණොත් මම ආණ්ඩුවෙ රස්සාවක් කරන නිසා අපි දෙන්නා අනාථ වෙන්නෙත් නෑ නෙව. නෝනෙ... අපි අපේ පැරුණු හිත් හදාගෙන ඉතුරු කාලෙ පිනක් දහමක් කරගෙන ජීවත් වෙන්න බලමු.”

# සිනමා සොම්නස

# සිංහල චිත්‍රපට උලෙළ සැප්තැම්බර් 04-09 දක්වා

## අනුග්‍රහය සරසවි සහ ස්කෝප් සිනමා සංකීර්ණය



කතුරු මිතුරු







ගින්දරී 3

**ප්‍රසුගිය මාස තුනක පමණ කාල පරිච්ඡේදය තුළ කොරෝනාව විසින් ජනතාවගෙන් ඈත් කරන ලද සිනමාව යළි ඔවුනට සමීප කිරීමේ වෑයමක් වශයෙන් මෙතෙක් ප්‍රදර්ශනය නොකරන ලද අලුත්ම සිංහල චිත්‍රපට 6 ක සිනමා උළෙලක් පැවැත්වීමට සරසවි සහ ස්කෝප් සිනමා සංකීර්ණය තීරණය කර තිබේ. සැප්තැම්බර් මස 04 වෙනිදා සිට සැප්තැම්බර් 09 දක්වා අගනුවර ලිබර්ටි සිනමා හලේ දී මෙම සිනමා නිර්මාණ 06 ප්‍රදර්ශනය කෙරනු ඇත.**

ඒ අනුව සැප්තැම්බර් 04 ජයන්ත චන්ද්‍රසිරිගේ "මිදුණු විශ්වය", සැප්තැම්බර් 05 ගිරිරාජ් කෞශල්‍යගේ "කතුරු මිතුරු", සැප්: 06 චන්න පෙරේරාගේ "යුගාත්‍රා", සැප්: 07 මොහාන් නියාස්ගේ "ශ්‍රී වික්‍රම", සැප්: 08 සුසිරන්ද සිල්වාගේ මිස් ජෙනිස්". සහ සැප්: 09 උදයකාන්ත වර්ණසූරියගේ "ගින්දරී" යන චිත්‍රපට තිර ගතවනු ඇත.

ස්කෝප් සිනමා පුද්ගලික සමාගමෙහි අලෙවිකරණ සහ නිෂ්පාදක කළමනාකරුවන ජයරත්න ගලගෙදර මහතා පවසන්නේ මෙම චිත්‍රපට උළෙල සඳහා ඒ ඒ දිනවල ප්‍රදර්ශනය කෙරෙන චිත්‍රපට වල රංගනයෙහි යෙදෙන සිනමා නළු නිළියන් සියලු දෙනා ද එදින සහභාගි වන අතර ඔවුන්ගේ ප්‍රධානත්වයෙන් ඒ ඒ චිත්‍රපට ප්‍රදර්ශනය පැවැත්වෙන බවය. මේ නිසා ප්‍රේක්ෂක ජනතාවට ද ඔවුන් සමඟ අති සුඛෝපභෝගී සිනමාහලක් වන "ලිබර්ටි"හිදී මෙම චිත්‍රපට නැරඹීමේ දුර්ලභ අවස්ථාවක් උදාවන්නේ යයිද ගලගෙදර මහතා පවසයි.

මෙම උළෙලේ පූර්ණ මාධ්‍ය අනුග්‍රහය දෙරණ මාධ්‍ය ජාලය විසිනි. මෙම චිත්‍රපට නිර්මාණ පිළිබඳව සහ නළු නිළියන් ඇතුළු සෙසු කලා ශිල්පීන් පිළිබඳ සටහනක් ද ජයරත්න ගලගෙදර මහතා විසින් අපවෙත යොමුකර ඇති අතර, එම චිත්‍රපට පිළිබඳ තොරතුරු මෙයාකාරය.

ඒ අනුව සැප්තැම්බර් 04 වෙනිදා තිරගතවන ජයන්ත චන්ද්‍රසිරිගේ "මිදුණු විශ්වය" අප වෙත ඉදිරිපත් කරන්නේ මෙවැනි කතා පුවතකි.

රංගනය ඉතා සියුම් මානසික විද්‍යාවක් සේ සලකා ඒ ගැන ඉගැන්වීමේ යෙදෙන වරේණ්‍ය නැමැති ආචාර්යවරයාට තම පන්තියකදී සූමධ්‍යා නම් සුවිශේෂ ශිෂ්‍යාවක හමුවෙයි. අනෙක් සිසු සිසුවියන්ට වඩා ඇය තුළ වූ විශේෂත්වය වන්නේ රංගන අභ්‍යාස වලදී සමහර විටක සිදුවිය හැකි මෝහනීය තත්ත්වය ඉක්මවා ගිය වෙනස්ම මානසික තලයකට පිවිසීමට ඇයට හැකියාවක් ඇති බැවිනි. චිත්‍රපටයේ ගැටුම ආරම්භ වන්නේ මේ තත්ත්වය යටතේ අසාමාන්‍ය කාල විපරිවර්තනයකට ගොදුරුවන සූමධ්‍යා, මීට දශක පහකට පෙර එම ඉරණමට ම මුහුණ දුන් රාජිණී නම් සුප්‍රකට සිනමා තාරකාවගේ සංවේදන ප්‍රවාහිකාව බවට පත්වීමත් සමඟ ය. ඒ අනුව 1964 වසරේ රාජිණී දැන් 2020 වසරේ ජීවත්වන සූමධ්‍යාව සිය මාධ්‍ය ලෙස යොදා ගනිමින් ආචාර්ය වරේණ්‍ය වෙතින් රූපණ විද්‍යාව හදාරන්නට පටන් ගනී.

සාර්ථක සිනමා නිළියක වුවද අසාර්ථක විවාහ දිවියක් ගෙවන රාජිණී වරේණ්‍යගෙන් අධ්‍යාපනයට අමතරව ප්‍රේමයද ප්‍රාර්ථනා කරන්නීය. මෙය කාල දෙකක සහ යුග දෙකක ස්ත්‍රී පුරුෂ ප්‍රේමයකි. නමුත් එයට මහත්ම බාධාව වන්නේ අප්‍රකාශිතව වරේණ්‍යයට ප්‍රේමකළ සූමධ්‍යාට මේ ගැන සැළවීමත් සමඟය. ඒ නිසා මෙය දෘශ්‍යමාන ප්‍රේමය සහ අදෘශ්‍යමාන ප්‍රේමය අතර ගැටුමක්ද වෙයි.

අවසානයේ ඔව්හු තම ප්‍රේමය අරභයා ගැටලුවක් ඇතිකරනු ලැබුවේ දෛවය විසින් නොව කාලය විසින් බව වටහා ගනිති.

උද්දික ප්‍රේමරත්න, උදාරි වර්ණකුලසූරිය, බුද්ධික ජයරත්න, සුලක්ෂි රණතුංග, ශ්‍රියන්ත මෙන්ඩිස්, කුසුම් රේණු, දමිතා අබේරත්න, වසන්ති චිට්ටච්චි, උදිත ගුණරත්න, ගාමිණී ජයලත්, දිමුතු චින්තක, ඥාණාංග ගුණවර්ධන සහ ලක්ෂ්මි දමයන්ති ඇතුලු තවත් නළු නිළියන් ගණනාවක් රංගනයෙන් සහභාගි වෙති.

මෙහි කැමරා අධ්‍යක්ෂණය සහ සංස්කරණය ප්‍රවීන් ජයරත්න අතින් සිදුවන අතර සංගීත අධ්‍යක්ෂණය නවරත්න ගමගේ ගෙනි. පියරත්න අකුරම්බොඩ කලා අධ්‍යක්ෂණය කරයි. "මිදුණු විශ්වය" රුවන් ජයසිංහගේ නිෂ්පාදනයකි.

### කතුරු මිතුරු

ජනප්‍රිය සිනමා හා රූපවාහිනී රංගන ශිල්පියෙකු මෙන් ම ප්‍රකට චිත්‍රපට අධ්‍යක්ෂවරයෙකු ද වන ගිරිරාජ් කෞශල්‍ය මෙම චිත්‍රපටය අධ්‍යක්ෂණය කර තිබේ. පාරම්පරිකව පැවත එන බාබර් සාප්පුවක් සහ ටේලර් සාප්පුවක් පවත්වාගෙන එනු ලබන බාබර් කෙනෙකු සහ ටේලර් කෙනෙකුගේ දිවි පෙවෙත පදනම් කර ගිනිමින් ගොඩ නැඟුණු කතා පුවතක් මෙයට පදනම් වී ඇත.

බාබර් සහ ටේලර්ගේ දුව සහ පුතා විශ්ව විද්‍යාල අධ්‍යාපනය අවසන් කර ගමට පැමිණෙන්නේ රැකියා විරහිතයින් ලෙසය. ඔවුන් උසස් රැකියාවල නිරතවනු දැකීම මෙම පවුල් දෙකෙහිම වැඩිහිටියන්ගේ අභිප්‍රාය වුවත්, මොව්හු තම තමන්ගේ පියවරුන් කළ ව්‍යාපාර නවීකරණය කර පවත්වාගෙන යාමට කැප වෙති.





බාබර් සාප්පුවට සහ ටේලර් සාප්පුවට පැමිණෙන විවිධාකාර ගනුදෙනුකරුවන්ගේ චරිත මුල් කර ගනිමින් මෙය හාස්‍යෝත්පාදක කර චිත්‍රපටයක් සේ ඉදිරිපත් කිරීමට අධ්‍යක්ෂවරයා කටයුතු කර ඇත.

අප රටෙහි ටෙලි නාට්‍ය විස්සකට අධික ප්‍රමාණයක්ද, චිත්‍රපට හයක ප්‍රමාණයක් ද නිෂ්පාදක කර ඇති අලංකුලම ෆිල්ම්ස් හත්වන නිෂ්පාදනය වන්නේ ගිරිරාජ් කෞශල්‍ය අධ්‍යක්ෂණය කළ "කතුරු මිතුරු" චිත්‍රපටයයි. "අලංකුලම හෝල්ඩින්ස්" ආයතනයේ අධිපතිවරයා වන බාසුරු සිරිවර්ධන මෙහි නිෂ්පාදකවරයා වෙයි.

ජයලත් මනෝරත්න, මහේන්ද්‍ර පෙරේරා, සහ ජයනී සේනානායක ඇතුළු නළු නිළියන් පිරිසක් මේ සඳහා රංගනයෙන් දායකවේ. මෙහි කැමරාකරණය රුවන් කොස්තාගෙනි. දෙවන කැමරාකරණය තුසිත අනුරාධගෙනි. සංස්කරණය අජිත් රාමනායකගෙන්ද, කලා අධ්‍යක්ෂණය මනෝජ් වික්‍රමසිංහගෙන්ද වන අතර සංගීතය රෝහණ විරසිංහගෙනි.

### යුගාත්‍රා

ජනප්‍රිය සිනමා හා ටෙලි නාට්‍ය රංගන ශිල්පියෙකු වන චන්න පෙරේරා අධ්‍යක්ෂණය කළ "යුගාත්‍රා" පුනරුත්පත්තිය හා බැඳුණු කතා පුවතක් අන්තර්ගතව ඇත්තකි.

තරුණයෙකු වීමෙන් අනතුරුව නිරන්තරයෙන් එකම සිහිනයක් දැකීමේ අත් දැකීමකට මුහුණ දී සිටින විසල් තමාගේ ළඟම හිතවතියක වන අමායා හට ඒ බව පවසයි. විසල්ට දැඩි ලෙස ඇළුම් කරන අමායා එම අදහස සමච්චලයෙන් බැහැර කරයි. එහෙත් මෙම සිහිනයේ දකින සුරූපී යුවතිය කෙදිනක හෝ තමාට මුණ ගැසී ඇති බව ඔහු විශ්වාස කරයි.

මේ අතර දිනක් යම්කිසි රාජකාරී කටයුත්තක් සඳහා සිය ජීප් රථයෙන් කඳුකරයට ගමන් ගන්නා විසල්ට කාර්මික දෝෂයක් හේතුකොට ගෙන, සිය රථය මඟ නතර කර දමා රාත්‍රිය ගත කිරීම සඳහා කඳු මුදුනක වූ හුදෙකලා බංගලාවක රාත්‍රිය ගත කිරීමට සිදුවෙයි.

බංගලාවේ හිමිකාරිය වන මහලු කාන්තාව හොඳින් දැක පුරුදු අයෙකු මෙන් විසල්ට එහි නවාතැන් ලබාදෙන අතර, තමා සිහිනයෙන් දකින යුවතියගේ ඡායාරූප එහි තැනින් තැන තබා ඇති අයුරු දකියි. ඒ ගැන විමසීමේදී මහලු කාන්තාව පවසන්නේ ඒ තම දියණිය බවත්, ඇයද තමා සමඟ මෙම බංගලාවේ වාසය කරන බවත් ය. ඉන් අනතුරුව එම තරුණිය හමුවන විසල් ඇය හා පෙමින් බැඳී ජීවිතයේ සියලු කටයුතු පසෙකලා එහිම නැවතිමට තීරණය කරයි.

මෙහි තිර රචනය සහ අධ්‍යක්ෂණය චන්න පෙරේරාගෙන් වන අතර, ඉසුරු විජේසිංහ, ජානක එදිරිසූරිය ශ්‍රියානි සේනානායක, වසන්ත පෙරේරා සහ ආචාර්ය ජයන්ත ධර්මදාස මෙහි නිෂ්පාදකවරු වෙති.

මාෂි සිරිවර්ධන, අසංකිද සිල්වා, නදිකා ගුණසේකර, සනත් ගුණතිලක, ලක්ෂ්මන් මෙන්ඩිස් ඇතුළු නළු නිළියන් චරිත නිරූපණය කරන මෙහි කැමරාව බුද්ධික මංගලගෙන් වන අතර, සංගීත අධ්‍යක්ෂණය දිනේෂ් සුබසිංහගෙනි. අජිත් රාමනායක සංස්කරණයෙන් ද, ලෙස්ලි සිරිවර්ධන කලා අධ්‍යක්ෂණයෙන් ද සම්බන්ධ වෙති.

### ශ්‍රී වික්‍රම

ක්‍රි: වර්ෂ 1739 දී සිට කන්ද උඩරට රාජධානියට හිමිකම් කියූ නායක්කාර් වංශිකයින්ට එරෙහිව උඩරට සිංහල ප්‍රභූන් සහ රදළයින් විසින් දියත් කරනු ලැබූ දේශපාලන කුමන්ත්‍රණ පිළිබඳ සිදුවීම් පෙළක් මෙතුළින් ඉදිරිපත් වෙයි.

ජනප්‍රිය නායක්කාර් වංශික රජෙකු වූ ශ්‍රී වික්‍රම රාජසිංහයන් ඇහැළේපොලගේ දරුපවුල කෲර ලෙස ඝාතනය වන තැනට කටයුතු සලස්වා ඉංග්‍රීසීන් ලවා රජු බලයෙන් පහ කරවීමත්, එතුළින් රදළ වංශිකයින් මුදුන් පත්කර ගන්නට තැනූ අභිප්‍රායයන් ඉටු නොවූ ආකාරයත් ශ්‍රී වික්‍රම චිත්‍රපටය තුළි අන්තර්ගත වේ.

මොහාන් නියාස්ගේ අධ්‍යක්ෂණයෙන් ද, ගිහාන් ගොඩකන්දගේ නිෂ්පාදන දායකත්වයෙන් ද ඉදිරිපත් වන ශ්‍රී වික්‍රම අජිත් ධර්මසූරියගේ තිර රචනයකි.

සජිත් වීරප්පෙරුම කැමරා අධ්‍යක්ෂණයෙන් ද අනුර බණ්ඩාර සංස්කරණයෙන් ද, මෙම චිත්‍රපටය සඳහා සහය වෙති. මෙහි සංගීත නිර්මාණය ෆර්හාන් ශාන් ගෙනි.

"ශ්‍රී වික්‍රම" චිත්‍රපටය සඳහා ශ්‍රියන්ත මෙන්ඩිස්, අකිල ධනුද්ධර, චුලක්ෂ රණතුංග, ශ්‍යාම් ප්‍රනාන්දු, රෝෂාන් පිලපිටිය, බුද්ධදාස විතානච්චි සහ පාලිත සිල්වා සමඟ තවත් ජනප්‍රිය නළු නලියන් රැසක් රංගනයෙන් සහභාගී වෙති.

### මිස් ජෙනිස්

සාර්ථක ටෙලි නිර්මාණ ගණනාවක් රූපවාහිනිය මාධ්‍යයට එකතු කළ දක්ෂ අධ්‍යක්ෂවරයෙකු වන සුසිරින් ද සිල්වා විසින් තිර රචනය කොට අධ්‍යක්ෂණය කළ "මිස් ජෙනිස්" චිත්‍රපටය නව ආරක කතා පුවතක් සහිත නිර්මාණයකි.

පරිගණක වෙළඳ ආයතනයක කළමනාකරුවෙකු ලෙස සේවය කළ ලියොන් නැමැති මධ්‍යම පන්තිකයා තරුණ දරුවන් දෙදෙනෙකුගේ පියකු වන අතර, ආයතනයට පරිබාහිර පුද්ගලයෙකු වන තම මිතුරෙකු සමඟ සිදු කරන වංචාවක් නිසා රැකියාවෙන් නෙරපනු ලබයි. එසේ නෙරපීමෙන් නොනවතින ආයතනයේ කළමණාකාරිත්වය මුහුණ පොත හරහා ඉතා දැඩි ලෙස පහර දෙමින් ඔහුට කිසි තැනක රැකියාවක් ලබාගත නොහැකි තත්ත්වයට පත් කරයි.

මේ අවස්ථාවේ ඔහුට පිහිට වන මිතුරා දක්ෂ වේෂ නිරූපණ ශිල්පිණියක වන තම බිරිඳ ලවා මෙම ලියොන් නැමැත්තා රූමත් ස්ත්‍රියක ලෙස වෙස්වලා ගැනීමට සලස්වයි. සිනමා වෘතාන්තය ගලා යන්නේ මෙසේ ස්ත්‍රියක් ලෙස වෙස්වලා ගැනීම හේතු කොට ගෙන, ලියොන් නැමැත්තාට මුහුණ දෙන්නට සිදුවන අනෙක විධ ගැටලු මුල්කර ගනිමිනි.

දක්ෂ රංගනවේදියෙකු වූ අභාවප්‍රප්ත ජයලත් මනෝරත්න "මිස් ජෙනිස්" චිත්‍රපටයේ ජෙනිස් නම් කාන්තාව ලෙස සුවිශේෂී රංගනයක යෙදෙන අතර, සෙසු චරිත නිරූපණ දුලීකා මාරපන, රොෂාන් රණවන, උදාරි පෙරේරා, ජයලාල් රෝහණ, ගිරිරාජ් කෞශල්‍ය, ඇන්ජලෝ බාන්ස්, ඔෂධී හිමාෂා, මාධනී මල්වත්ත සහ කුමාර තිරමාදුර ඇතුළු නළු නිළියන්ගේ සහභාගීත්වයෙන් සිදුවේ.

මෙම චිත්‍රපටය සඳහා අයෙෂ්මන්ත හෙට්ටිආරච්චි කැමරා අධ්‍යක්ෂණයෙන් ද, මේස කොළඹගේ සංස්කරණයෙන් ද, ලකී විජේවර්ධන කලා අධ්‍යක්ෂණයෙන් ද, සම්බන්ධ වෙති."මිස් ජෙනිස්" සංගීත අධ්‍යක්ෂණය ලක්ෂ්මන් විජේසේකරගෙනි.

### ගින්දරී-3

ජනප්‍රිය චිත්‍රපට අධ්‍යක්ෂ උදයකාන්ත වර්ණසූරිය කතාව දෙබස් සහ තිර රචනය ලියා අධ්‍යක්ෂණය කරන "ගින්දරී"-3 ඔහුගේ ම නිෂ්පාදනයක් ද වේ.

මීට ප්‍රථම ඔහු විසින් ම නිර්මාණය කරන ලද "ගින්දරී-1 සහ ගින්දරී-2 යන චිත්‍රපටවල තුන්වන නිර්මාණය ලෙස එළිදකින මෙහිදී බොහෝ දුරට රඟපානු ලබන්නේද එම නළු නිළියන්ම වේ. නමුත් මීට ප්‍රථම තිරයට ආ "ගින්දරී" චිත්‍රපට වලට වඩා සුවිශේෂී සිදුවීම් රැසක් ඇතුළත් මෙම චිත්‍රපටය සඳහා මිනිසුන් සහ යක්ෂයින් අතර මෙන් ම දෙවිවරුන් සමඟ වූ සටන් ද ඇතුළත්ය. නුෂ්‍ය වේෂයෙන් සිටින අමනුෂ්‍ය ගැහැනියක වන ටිකිරිද ඇය හා විවාහ වී සිටින මනුෂ්‍යයකු වන බන්ටි ද නිසා ඔවුනට උපන් පුත්‍රයා සුවිශේෂී හැකියාවන් සහිත තැනැත්තෙකු වෙයි. සියලු ගැටලු ඇරඹෙන්නේ "සුපිරි" නම් මෙම දරුවා අමනුෂ්‍ය ලෝකයට රැගෙන යාමට පැමිණෙන යක්ෂණියන් තිදෙනෙකු හේතු කොට ගෙනය.

පබෝධා සන්දීපනී, මහේන්ද්‍ර පෙරේරා, රොඩ්නි වර්ණකුල, ටිශෝන් වැන්හොෆ්, ශ්‍රිනාත් මද්දුමගේ, සමන්ත පෙරේරා, තුලක්ෂි රණතුංග, ටීනා ෂනෙල්, චංචලා වර්ණසූරිය සහ තරින්දි ප්‍රනාන්දු ආදී නළු නිළියන් රැසක් මෙහි චරිත නිරූපණය කරති.

කැමරා අධ්‍යක්ෂණය කේ.ඩී. දයානන්ද ගෙන් වන අතර, සංස්කරණය හා ශබ්ද සැලැසුම් වලින් ප්‍රවීන් ජයරත්න ද කලා අධ්‍යක්ෂණයෙන් අරුණ ඩයස් ද සම්බන්ධ වන මෙහි සංගීතය ආනන්ද පෙරේරාගෙනි.

# පළමු වීනස් ජගත් සිනමා උලෙළේ හොඳම නළුවා සම්මානය ශ්‍රී ලංකාවේ ශ්‍යාම් ප්‍රනාන්දුට

**ප්‍රළමු වැනි හොළිවුඩ් අන්තර්ජාතික කෙටි චිත්‍රපට උළෙලේ හොඳම නළුවාට හිමි සම්මානය ශ්‍රී ලංකාවේ ශ්‍යාම් ප්‍රනාන්දු ට හිමි වී තිබේ. ඒ චතුර විමර්ෂ ප්‍රනාන්දු අධ්‍යක්ෂණය කළ ONEBLOOD, කෙටි චිත්‍රපටයේ ප්‍රධාන නිරූපණය උදෙසා ය.**

ශ්‍යාම් ප්‍රනාන්දුට මෙම සම්මානය හිමිව ඇත්තේ ලොව පුරා රටවල් 100 කට අධික ප්‍රමාණයකින් ඉදිරිපත් වූ තරගකාරී කෙටි චිත්‍රපට දහසකට අධික ප්‍රමාණයක් අතුරිනි.

කැලණි විශ්ව විද්‍යාලයේ සිව්වැනි වසර විද්‍යාර්ථයකුව සිටියදී චතුර ප්‍රනාන්දු තිර රචනය කොට අධ්‍යක්ෂණය කළ මෙම කෙටි චිත්‍රපටය පිය පුතු සබඳතා පිළිබඳව තමා විසින් කරන ලද මනෝවිද්‍යාත්මක අධ්‍යයනයක කලාත්මක එළි දැක්වීමක් බව අධ්‍යක්ෂවරයා පවසයි.

සිග්මන් ෆ්‍රොයිඩ් ඉදිරිපත් කළ ඊඩිපස් සංකීර්ණයද, ග්‍රීක පුරාණෝක්තිවල සඳහන් ක්‍රෝනස් සහ සියුස් අතර ගැටුමද, අපට සමීප සිංහබාහු කතාන්තරයේ සිංහයා සහ සිංහබාහු අතර ගැටුම ද, මූලික වශයෙන් "ONE BLOOD"ප්‍රස්තුතියට සමාන බැව් අධ්‍යක්ෂවරයා පවසයි.

Jaffna International film festival (2019), Agenda 14 film festival (2019), ලන්ඩනයේ pinwood studio London සංවිධානය කරන Life off global first-time filmmaker Sesson (2019) යන කෙටි චිත්‍රපට උළෙලවල අවසන් වටයේ නිර්මාණ අතරට චතුර ප්‍රනාන්දුගේ "One Blood" කෙටි චිත්‍රපටය නිර්දේශ වී ඇත.

ශ්‍යාම් පුනාන්දු, චරින්ද්‍ර චන්ද්‍රසේන, චච්රු පෙරේරා, මේ සඳහා රංගනයෙන් සම්බන්ධ වන අතර, බුද්ධික මනම්පේරි සහ විමුක්ති සෝලංගආරච්චි කැමරාකරණයෙන් යෙදෙති. සංගීතය හංස ප්‍රනාන්දුගෙනි.

කසුන් රජීව, කලා අධ්‍යක්ෂණයෙන් ද, ලක්ෂිත ජයකොඩි අංග රචනයෙන් ද, ඩිනාලි ලියනගේ තේමා ගීත ගායනයෙන් ද, ශෂික අනුෂාන් නිෂ්පාදන කළමනාකරණයෙන් ද, ප්‍රභාත් අංගම්පොඩි නිෂ්පාදන අධීක්ෂණයෙන් ද මේ සඳහා සහභාගි වන සෙසු ශිල්පීහු වෙති..













# ඇමෙරිකාවේ ලයනල් බැරීමෝලා සහ ලංකාවේ සැනට්ලා ශ්‍රියන්තලා

**ඇමෙරිකාවේ ප්‍රධාන පෙළේ වේදිකා සිනමා නළුවෙකු මෙන්ම ගුවන් විදුලි ශිල්පියෙකු හා සිනමා අධ්‍යක්ෂවරයෙකු වූද ලයනල් බැරිමෝගේ පවුලේ අනෙක් සහෝදරයා සහ සහෝදරියද රංගන කලාවෙහි ලා විශිෂ්ටයෝ වූහ. ඒ දෙදෙනා නම් ජෝන් බැරිමෝ සහ එතල් බැරිමෝ ය. 1879 දා උපන් එතල් බැරිමෝ අදටත් හඳුන්වන අන්වර්ථ නාමය වන්නේ ඇමෙර්කානු රඟහලේ ප්‍රථම කාන්තාව වශයෙනි.**

මේ කතාව සම්බන්ධ ලයනල් බැරිමෝ ද ජෝන් බැරිමෝ ද, යන්න මා හට අමතකය. එක් දිනක මේ බැරිමෝ කෙනෙකුට චිත්‍රපටයක ඉතා සියුම් අසීරු දර්ශනයකට පෙනී සිටීමට සිදුවිය. එනම් එක්තරා කාව්‍යයක අවසාන වචන පෙළ කියා අවසන්වනවාත් සමඟ ම ඔහුගේ වම් ඇසෙන් කඳුළු බිඳුවක් හෙළීමය.

කිසිදු චකිතයකින් තොරව අභියෝගය බාරගත් බැරිමෝ නළුවා පළමුවැනි රූපගත කිරීමේදී සිය වම් ඇසෙන් කඳුළු බිඳුවක් සැලෙන්නට ඉඩ හැරියේ ය.

සිය රූපගත කිරීම හිතුවාටත් වඩා සාර්ථක වීම ගැන සතුටට පත් අධ්‍යක්ෂවරයා මඳකට වැඩ නවත්වා තමාගෙන් බීම වීදුරුවක් පානය කරන්නට එන ලෙස බැරිමෝට ආරාධනා කළේය.

අධ්‍යක්ෂවරයා ඒ අතරදී ඔහුගෙන් විමසා සිටියේ මෙවැනි සියුම් චරිත නිරූපණයක් ඉදිරිපත් කිරීම කළ හැකි විස්මිත රහස කුමක්ද යන්නය.

කිසිවක් කතා නොකළ බැරිමෝ, අධ්‍යක්ෂවරයා අතවූ පද්‍යය යළිත් ඉල්ලා ගත්තේ ය. ඉක්බිති එහි අවසන් පද්‍යය ගායනා කරන අවස්ථාව වන විට සිය දකුණැසින් එක් කඳුළු බිඳුවක් වැටෙන්නට ඉඩ හැරියේ ය. අධ්‍යක්ෂවරයා විමතියෙන් ගල් ගැසී බලා සිටියදී ම ඔහු නැවත වරක් එම පද්‍යය ගායනා කළේ ය.

එවර එහි අවසාන පදය ගායනා කරද්දී ඔහු තම දෙඇසින් ම කඳුළු බිඳු දෙකක් ගලා හැළෙන්නට ඉඩ හැරියේ ය.

අවසානයේදී ඔහු අධ්‍යක්ෂවරයාට පැහැදිලි කර දුන්නේ මෙවැනි ඉතා සියුම් භාවයන් නිරූපණය කිරීම පිළිබඳ ව තමා මෙන් ම තම සහෝදරයා සහ සහෝදරියත් කණ්ණාඩියක් ඉදිරියේ දෛනිකව පුහුණුවක් ලබන බවය.

ශ්‍රී ලංකාවේ නාට්‍ය වේදිකාව ගැන කියවෙන මේ ඊළඟ කතාව එවැනි සංකීර්ණ හැඟීම් ප්‍රකාශනයක් ගැන නොවේ. නමුත් මෙය ද චිත්ත ඒකාග්‍රතාවය මුල්කරගත් වේදිකා නළුවන් දෙදෙනෙකුගේ සුවිශේෂී හපන්කමක් ගැන වූවකි.

ඒ දෙදෙනා සැනට් දික්කුඹුර සහ ශ්‍රියන්ත මෙන්ඩිස්ය.

අසූවේ දශකයේ මැද භාගයේ වේදිකා ගතවුණු ජයන්ත චන්ද්‍රසිරිගේ "අත්" නාට්‍ය අප රටේ ඉතාමත් ජනප්‍රිය නළු නිළි කැලකගේ රංගනයෙන් ඔපවත් වූ විශිෂ්ට නිර්මාණයක් විය.

ජැක්සන් ඇන්තනි, ශ්‍රියන්ත මෙන්ඩිස්, සැනට් දික්කුඹුර, කමල් අද්දරආරච්චි, ග්‍රැන්විල් රොද්‍රිගු සහ මහේන්ද්‍ර පෙරේරා මෙන්ම දැනට අපගේ ජනමාධ්‍ය අමාත්‍යාංශ ලේකම් තනතුර දරන ජගත් වීජේවීරද ඇතුළු නළු නිළියන් රැසක් චරිත නිරූපණය කළ මෙම නාට්‍යයේ වේදිකාව මධ්‍යයේ ලුවොලින් වැන්ඩවෝල් නම් නිර්මාණ ශිල්පියා විසින් තනන ලද කදිම බාර් එකක් ද වූ අතර, එහි බාර් කීපර්ගේ චරිතය නිරූපණය කරනු ලැබුවේ සැනට් දික්කුඹුර විසිනි.

වේදිකාව මතුපිට සිට බලන කලද අඩි හතරක් පමණ උස් වූ එහි බීම කවුන්ටරය ප්‍රේක්ෂකාගාරයේ සිට දකින්නෙකුට පෙනී යන්නේ ඊටත් වඩා උසින් පිහිටියාක් මෙනි.

නාට්‍යයේ පිටපතට අනුව බල්ලෙකුව සිට මිනිසෙකු වූ දඩබ්බරයෙකුගේ චරිතය නිරූපණය කළ ශ්‍රියන්ත මෙන්ඩිස් වරෙක අසීමිත ලෙස කෝප ගැන්වී කවුන්ටරයේ එහා පැත්තේ සිටින බාර් කීපර්ව දෙඅතින් අල්ලා ඔසවා ගනී. ඉක්බිති ඒ ගැන්මෙන් ම බාර් කිපර්ගේ දෙඅතින් අල්ලා, ලණුවක බැඳී ගලක් මෙන් තමා වටා තුන්වරක් කරකවා බිම අතහරින්නේ ප්‍රේක්ෂකාගාරයම තත්පර ගණනාවකට සංත්‍රාස රසයෙන් කුළු ගන්වමිනි. කෙටි කලක් තුළ සිදුව අවසන් වන මේ රංගන කටයුත්තේ දී දෙදෙනාගෙන් එක් අයෙකුට හෝ සීරීමක් පමණවත් ඇබැද්දියක් සිදු නොවූ අතර, ඊළඟට නියමිත දෙබස් ඛණ්ඩයන් උච්චාරණය කරමින් වෙහෙසකින් තොරව සිය භූමිකාවන් ඉදිරියට ගෙන යෑමේ හැකියාව ඔවුන් තුළවිය.

ඇත්ත වශයෙන් ම මෙය කිසිසේත් ම ඇගේ හයියෙන් පමණක් කළ හැක්කක් නොවේ. එය අක්‍රබැටි ශිල්පය මනාව ප්‍රගුණ කර ඇති සැනට් දික්කුඹුර නැමැති ප්‍රවීණයා තම කය හා මනස සැහැල්ලු කර ගනිමින් දෙපයට ගැම්මක් ගෙන නිවැරදිම තත්පරයේ දී ශ්‍රියන්තගේ දෙඅතට පැනීම නිසාත් ඒ වේගයම මැනවින් කළමනාකරණය කර ගැනීමට ශ්‍රියන්ත සතුව ඇති හැකියාව නිසාත් සිදුවන්නා වූ නාට්‍යමය ක්‍රියාදාමයකි. මෙතැනදී තම තමන්ගේ ශක්‍යතාවයන් තරමට ම කිසි ලෙසකින්වත් ශ්‍රියන්ත තමන්ව අත නොහරින්නේ යයි සැනට් තුළ ඔහු කෙරෙහි වූ තදබල විශ්වාසයත් ඊට මුල් වූ බව මේ ප්‍රවීණ නළු නිළි දෙපොළම පිළිගන්නා දෙයකි.

"අත්" නාට්‍යයේ පෙළ මතක් කර දෙන්නකු වශයෙන් අවසන් දර්ශනය දක්වා ම සම්බන්ධ වූ පුද්ගලයෙකු වූ මා ඉතා පැහැදිලිව ම දුටු දෙයක් වූයේ සැනට් ට පැමිණීමට නොහැකි වූ කිසිම දිනයකදී මෙහි සිටි අන් කිසිම නළුවෙකුට ශ්‍රියන්ත හා එක්ව එම අවස්ථාව නිරූපණය කිරීමට නොහැකි වූ බවය.

ඒ සෑම දිනකම සිදුවූයේ එදිනට බාර් කීපර් චරිතය රඟපෑ නළුවාව කවුන්ටරය මතින් ඔසවා බිම තැබීම පමණි!

## ධර්මය ජය ගත්තේ ද? අධර්මය පරාජය වුයේ ද?

ග්‍රන්ථය - යොද්ධ කල්කි විෂ්ණු මූර්තිය
පරිවර්තනය - පාලිත ජයකොඩි
මියුසස් ප්‍රකාශනයකි
මිල රු. 1250 (පිටු 576)



"ඔබට ඕනෙම තැනක යන්න පුළුවන් කල්කි. ඒත් අමතක කරන්න එපා ඔබ කොහෙන්ද ආවෙ. කොහොමද ඉන්න තැනට ආවේ කියන එක. මොකද අපි පුරුදු වෙලා ඉන්නවා තැනකට ආවට පස්සෙ හිටියෙ කවුරු එක්කද, හිටියෙ කොතන ද කියන එක අමතක කරල දාන්න." තවද "විපත්තියක් සිද්ද වෙන්නම ඕනෙ අපගෙ හොඳ දේවල් කොපමණක් නම් අප අතින් මග ඇරිල ගිහින් තියෙනවද කියල දැනගන්න."

ධර්මයොද්ධ කල්කි විෂ්ණු මූර්තිය මැයෙන් පාලිත ජයකොඩි අතින් පරිවර්තනය කෙරෙන ප්‍රබන්ධයේ මුල් ලේඛකයා වන්නේ කෙවින් මිස්සල් ය.

කල්කි යනු විෂ්ණුගේ දස අවතාරවලින් එකකි. පුරාණයේ සිටම ඉන්දියානු සාහිත්‍යයේ පවතින ප්‍රකට චරිතයකි.

කෙසේ වුව උක්ත ප්‍රබන්ධය ලියැවෙන්නේ ඊට එකතු කළ සමකාලීන දේශපාලන අරුත් ගැන්වීමක් සමග ය. එසේ ගත් කල්හි කල්කි සිටින්නේ නව සමාජ දේශපාලන කියවීමක් තුළ ය.

පොදුවේ ගත් කල ඉන්දියානු වීර කාව්‍යයන්හි එන අන්දමට දෙවියාව පිහිටුවන්නේත් මිනිසා විසින්ම ය. එවැනි දේව ප්‍රබන්ධයන් සැමවිටම මිනිසුන්ගේ පීඩනය, අසරණකම විසින් තහවුරු කරනු ලබන්නේය. එහෙත් යථෝක්ත කෘතියේ එන අන්දමට නම් කල්කි ස්ථානගත වන්නේ එවන් දේව ආස්ථානයක නොවේ. ගොවි දරුවකු හැටියට සාමාන්‍ය පවුලක ඔහු උපත ලැබුවත්, මෙය සාමාන්‍ය කතාවක් නොවන නිසා දෛවයෙන් ඔහුට පැවරුණ වගකීමක් ඇති බව කෘතියෙන් ගම්‍ය වේ. ඒ අධර්මයට එරෙහිව සටන් වැද ලෝකය ධර්මයේ පිහිටුවීමේ කාර්යභාරයයි. ඉදින් ඒ අනුව යමින් "හැම තිස්සෙම ආදරයයි කරුණාවන්තකමයි පතුරුවන්න උත්සාහ කරන්න. මොකද දේවල් තමයි ලෝකයේ අඩුවෙන්ම තියෙන්නෙ." යි මෙහි එයි.



පාලිත ජයකොඩි

මේ ආකාරයට ධර්ම යොද්ධයක අවශ්‍යතාව සකලවිධ අපරාධ හා දූෂණයන්ට එරෙහිව නිර්මාණය වෙයි.

නමුත් මෙතනදී අපට පැහැදිලි වන්නේ සාම්ප්‍රදායික දේව කතාවල මෙන් කල්කි උපත ලබන්නේ ඒ පිළිබඳව සංසාරගත අවබෝධයකින් ලද පූර්ව සුදානමකින් නොවේය යන්නය. ඔහුව ඒ වෙනුවෙන් සුදානම් කරන්නේ එකී අධර්මවාදී සමාජ දේශපාලනයයි.

කෘතියට අනුව ඉන්දියාවේ ඉලවර්ති නම් දේශයක් වෙයි. එහි වෙසෙන්නෝ මානවර් නමින් හැඳින්වෙති. එහි තේරුම මිනිස් වර්ගයා යන්න ය. මේ මානවර් සමාජය කාලිගේ ප්‍රහාරයට ලක්වන අතර මානවර් නායකයාව අත් අඩංගුවට ගෙන සිරගත කිරීම ද සිදු වේ.

මේ අතර නළලේ කැළැලක් ඇති මිනිසෙකු ද හැසිරෙනු දැකිය හැක. සංහාරය මුල් කොටගත් ගැටුම්හි පසුබිමේ නිර්මාතෘ ඔහු යැයි සිතෙන තත්වයක් ද දැකිය හැකි වේ.

එක් වනගත පෙදෙසක ගල් ගුහාවක හැංගී තිබෙන සෝම පානය නම් අමරණීය පානයක් ගැන ද අසන්නට ලැබෙන අතර උක්ත කෘතියේ දැක්වෙන අන්දමට එය ධර්මයේ හෝ අධර්මයේ පැවැත්ම තීරණය කරන්නා වූ පානයක් ද වේ. ඊට අනුව සෝම පානය වෛද්‍යමය පානයක් ද වන අතර එය පානය කරන්නා අධර්මවාදියෙකු නම් අධර්මය ද ධර්මවාදියෙකු නම් ධර්මය ද ලොවට ලබා දෙනු ඇත්තේ ය. එවන් පසුබිමක අධිරාජ්‍යවාදී ආක්‍රමණයට එරෙහිව දේශ විමුක්ති සටන මෙහෙවීමේ වගකීම කල්කි මත පැටවෙන්නේ කාලයේ නියමයක් අනුව ය. මක් නිසාද, කාලි සෝම පානය කොට ඇත්තේ ය.

පරිවර්තක පාලිත ජයකොඩි පවසන අන්දමට මෙහි මුල් කතුවරයා සිය ළමා කාලයේ දී ස්ටාර් වෝස්, ගෝඩ් ඔෆ් ද රිංග් හි එන ඒ වීර ආඛ්‍යායන වලට ඇලුම් කොට තිබේ. ඒ අනුව එහි ව්‍යංගාර්ථය වන්නේ මෙම නිර්මාණයේ ලා එවැනි ආස්වාදනීය හෙවණැලි ඔහු තුළ නොවුණේම නොවේ යැයි සිතමි.

අධර්මයට එරෙහිව මෙහෙයවුණ ඒ සටනේ ත්‍රාසය, ආදරය, පාවා දීම් වලින් යුතුව උන්මාදනීය මායාවන් තුළ ජීවිතය දර්ශනය වන ආකාරයක් ද දැකිය හැකි වේ. කෙසේ වුව අධර්මයට එරෙහිව සිදු කරනු ලබන්නා වු මෙම අරගලය තුළ කල්කි අනාගත දෙවියෙකු වීමේ ඒ ප්‍රතිලාබය ද අත් කරගන්නා පසුබිමක් ද දිස් වේ. සිය කාර්යභාරය හමුවේ මහසෙන් රජු සිය මරණින් පසු දේවත්වයට පත් වන්නේ ද මෙවන් තත්වයක් නිරූපණය කරමින් නොවේ දැයි ඉහත තත්වයට අදාළව සිතා බලනු වටී.

පාලිත ජයකොඩි ගේ හඳුනා ගැනීමට අනුව සාම්ප්‍රදායික දේව කතා මැදින් මැවෙන ඉන්දියානු ආඛ්‍යායන කියවීම මේ වන විට විශේෂයෙන්ම විදේශයන්හි වෙසෙන ඉන්දියානු පාඨකයන් අතර රැල්ලක් මෙන් පැතිර යන තත්වයක් දැකිය හැකි ය.

ඉංග්‍රීසියෙන් කියවන පාඨකයන් (සංඛ්‍යාත්මකව එතරම් නොවුණත්) අතර මේ තත්වයේ වැඩි දියුණුවක් දැකිය හැකි වේ. පොදුවේ ගත් කල මේ කියන සාහිත්‍යයික හැසිරීම තුළ විනෝද රසයක් දැකිය හැකි වුණත් කල්කි නම් චරිතය මෙහිදී ගොඩ නැගෙන්නේ පොදුවේ සමාජගතව හැදී වැඩෙන සාමාන්‍ය ජන පාන්තිකයෙකු හැටියට ය. නමුත් පසුව කාලි මුල් කොටගත් යක්ෂ, රාක්ෂ මෙන්ම නාග ආක්‍රමණයන් හමුවේ ඔහු අරගලකාරී චරිතයක් බවට පත් වන්නේ දෙවියන්ගේ කැමැත්ත එය වු හෙයින් යැයි නොසිතිය යුතුය. එය ද අර සමාජගත අවශ්‍යතාවයේ ප්‍රතිඵලයක් ම වේ.

එහි තේරුම විෂ්ණුගේ දස අවතාරයන්ගෙන් එකක් වන කල්කි ව එහි කතුවර කෙවින් මිස්සල් විසින් යොදාගෙන ඇත්තේ ඉන්දියානු සමාජයේ කාලීන සමාජ දේශපාලන අවශ්‍යතාවක් ලෙසින්ය යන්න ය. ධර්ම යොද්ධ කල්කි විෂ්ණු මූර්තියහි කියවීම තියෙන්නේ එතැන ය.

# රැයක් අවසානයේ... හිමිදිරිය ආසන්නයේ...... ටෙනසි විලියම්ස් ලියන්න පටන් ගනී

**නමක් චරිතයක් වශයෙන් ගත් කල ඔහු මහත් සේ ජනප්‍රිය චරිතයක් නොවිය හැක. එහෙත් අමෙරිකාව තුළ එමෙන්ම ඇතැම් අවස්ථාවක දී රජය ද මැදිහත් වන අයුරින් ඔහු විසින් ඇති කරන ලද්දේ කලබැගෑනියක් යැයි කිව හැකි තරමේ නිර්මාණ විෂයික තත්වයකි. අනිත් අතට අද වන විට අමෙරිකානු කලා ඉතිහාසයට එක් වී ඇති මේ නම විරල ගනයේ ප්‍රතිභාවක් සනිටුහන් කරන්නක් යැයි නොකීවොත් එය දුෂ්ඨ කමකි.**

ටෙනසි විලියම්ස් නම් ඔහුගේ කෙටිකතා ආඛ්‍යයන විලාසය සංගීත සංධ්වනියක් වැනි යැයි පෙන්වා දී ඇත. එමෙන්ම ඒ ස්වර සංධ්වනිය අවසානයේ දී එක් මධ්‍ය ලක්ෂයකට යොමු වන්නේ යැයි ද ඒත් සමගම පාඨකයා ඒ අසිරිමත් ග්‍රහණයට නතු වන්නේ යැයි ද තවදුරටත් එය විස්තරාත්මකව හඳුන්වා දී තිබේ.

කොහොම නමුත් කතාව තවමත් පවතින්නේ පටන්ගත් තැනම ය. මේ කතාව ඉදිරියට ගෙන යාම ද ඇතැම් විට සිතිය නොහැකි ආකාරයෙන් සිද්ධ විය හැකි යැයි සිතේ.

මනුෂ්‍ය පැවැත්මට අදාළව කෙනෙකු සමහන් සුවයෙන් තෘප්තිමත් වීම හෝ නොවීම බොහෝ විට රාත්‍රියත් සමගම ගෙවී යන සිහිනයක් වැනි ය. එහෙත් පොදුවේ ගත් කල එය වෙසෙසින් සිහි තබා ගැනීම කාට නම් වැදගත් වේද? එහෙත් එසේ ගෙවී යන රාත්‍රිය අවසානයේ දී හිමිදිරිය ආසන්නයේ දී ටෙනසි විලියම්ස් ලියන්නට පටන් ගනියි. එය වෙසෙස් වැදගත් කරුණක් ම වේ. ඒ වන විටත් මතකයෙන් ඈත් නොවන එවැනි අත්දැකීමක්....ගෙවී ගිය සිහිනයක්.... එවැනි අනුභූතියක් උදාවෙන අරුණෝදය හමුවේ පවතින්නේ ය. එසේ ලියාගෙන ලියාගෙන යන ඔහු අවසානයේදී පුටුව පසෙකට කොට නැගී සිටිනු ඇත්තේ ය. කඩදාසි සමූහයක් මේසය මත එක්රැස් වී තිබෙනු දැකිය හැක. ඒ අතරවාරයේ දී ඔහු මෙසේ පවසයි.



ටෙනසි විලියම්ස්

"එක වරක් විතරක් ලියලා දෙවරක් පරිසමාප්තියට පත් වෙන්න මට බැහැ. එය මගේ අනන්‍ය සාධාරණ ගුණයක් දැයි මා දන්නෙ නැහැ. ඒත් ඒක එහෙම තමයි."

පරිසමාප්තිය යන තැන සිට අපට මේ කතාව යළිත් පටන් ගත හැකි ය. ඒත් සමගම එය ඔහුගේ හැගීම්බර ගනුදෙනුවක් යැයි කීමට ද පුළුවන. මේ සම්බන්ධයෙන් ඔහු පවසන්නේ කුමක් ද?

"මිනිසෙක් ලෞකික වෂයෙන් සංවේදී වීම එකම ආකාරයේ (පැතලි) සමතලයක් මත තබා හඳුනාගත නොහැකි ය."

එය වෙනස් ආරයක නිර්මාණ ප්‍රවේශයක් යැයි පවසා ලිස්සා යාමට ටෙනසි විලියම්ස් නම් ඔහු ඉඩ සලසා නැත. ඔව් මෙහෙම හිතල බලන්න. එක්තරා ප්‍රාදේශීය නගරයක ප්‍රතිභාවක් ඇති නර්තන ශිල්පියෙකු සිටිනවා. මෙන්න ඔහු එක පාරටම මිය යනවා. (හදිසි මරණයක්.) ඉන් පසුව සිදු විය හැක්කේ කුමක් ද? එය පාදක කොටගෙන ඔහුගේ නිර්මාණ ඥාන මණ්ඩලයේ හදිසි පිපිරුමක් හට ගන්නවා. ඒ පිපිරුමත් සමග එතැන දී මතු වන්නේ සොරාගත නොහැකි සුවඳක්. එයම වේදිකාව මත සුපිපෙන සජීවි පරිවර්තනයක්..... ඒ තුළින්ම නිර්මාණය වන ජීවමාන ගැහැනියක්. එය අරුමැසි ඉදිරිපත් කිරීමක් වශයෙන් ද ගත හැකි යි. නමුත් මේ වනාහි ඕනෑම කලාකරුවෙකු සිය ආත්ම තෘප්තිය වෙනුවෙන් සිදු කරන්නා වු අනවරත අරගලය යි. ප්‍රතිඵලය කුමක් වුණත් සිද්ධ වෙන්නේ එය යි. ඔහු ඒ ගැන මෙසේ කිය යි.

"මම ආදරය වෙනුවෙන් වේදිකාව මත චරිත ප්‍රතිනිර්මාණය කළෙමි. එහෙත් ඒ චරිත ස්ත්‍රී පුරුෂ වශයෙන් බෙදී වෙන් වී නොසිටියහ."

එය වූකලී විස්මිත පැවැත්මක් ඇති පක්ෂියෙකුගේ පියා සැලීමක් වැන්න. (මේ කියන්නේ ඔහුගේ කතා කලාව ගැන යි.) ටෙනසි විලියම්ස්ව නැවත නැවත කියවන විට අර කීව පක්ෂියාගේ පියාසැලීම අපට හැගෙනවා. සිය ආධිපත්‍යය පතුරුවමින් පියාසලන මේ පක්ෂියා ....ඒ තමයි කාලය. ඔව් කාව්‍යය.... ජීවිතය.... මරණය හරහා සදාතනිකව ඒ පියා සැලීම සිදු කෙරෙනවා. ඔබට පුළුවන් නම් ඒ පක්ෂියාගේ හැඩ රුව දකින්න, ඒ වගේම උගේ පියා සැලීම ගැන අවබෝධයක් ලබා ගන්න, එතන තියෙනවා ප්‍රත්‍යක්ෂ හඳුනාගැනීමක්. කාලය ජීවිතය ගැන සිතුවොත්, අපේ ජීවන පැවැත්ම සමග එය සංසන්දනය කළහොත් (මේ මොහොතේ ටෙනසි විලියම්ස් සිටින්නේ රෝමයේ ය. ඔහු සිය මිතුරෙකු හා එක්ව සිය 37 වැනි උපන් දිනය සමරයි.) ඔහු මෙසේ පවසයි.

"ඒ ගැන මම මෙහෙම කියන්නම්. අද මගේ 37 වැනි උපන් දිනය. මම එහෙම ඔබට කිව්වත් මම ම එය බැහැර කරනවා. මට තාම වයස අවුරුදු 34 යි. එතකොට මේ සමරන්නේ මගේ 34 වැනි උපන් දිනය. මගේ උපන් වර්ෂය 1911 නෙවෙයි. 1914. ඒ මොකද දන්නව ද? මගේ ජීවිත කාලයෙන් අවුරුදු 3 ක්ම ගත වුණේ සපත්තු කර්මාන්ත ශාලාවක. නාට්‍යකරුවෙක් විදිහට මා ගත කළ කාලය....අන්න එතන ඉඳලා ජීවිතය පටන් ගත්තම අර අවුරුදු 3 මගේ ජීවිතයෙන් ඉවත් කළ යුතුයි. කොහොම නමුත් අපේ කායික නිරෝගිකම ඒකත් වැදගත්."

ටෙනසි විලියම්ස් අවසානයේදී "මෙමරීස්" (මතක) නම් කෘතිය ලිවීය. එහිදී ඔහු සිය ජීවිතයේ ඇතැම් ශෘංගාරාත්මක විචිත්‍රත්වයන් ද හෙළි කරන තැනට පැමිණෙයි. ඇත්ත වශයෙන්ම ටෙනසි විලියම්ස් කියල කියන්නෙ තමන්ගේ ජීවිතය තමන් තුළම ප්‍රතිනිර්මාණය කරගත්ත චරිතයක්. "ද මෑන් ඉන් ද පේපර් ස්ටෆ් වෙයාර්" නම් කෙටිකතා සංග්‍රහය ඊට කදිම නිදසුනක්. අත්දැකීම් වශයෙන් ගත් කල එහි පවත්නා වියළී ගිය දෑ, කටුක දෑ එසේ පවත්නා තරමටම එය ප්‍රති නිර්මාණය කොට ඇති අයුරු වෙසෙසින් හඳුනාගත හැකි ලාක්ෂණික තත්වයන් යැයි පෙන්වා දී තිබේ. තවද ඒ අත්දැකීම් සත්‍ය ලෙසින් වේවා කල්පිත ලෙසින් වේවා ඉදිරිපත් කරන ආකාරය ඔහුගේ කැමැත්ත මත සිදු වූවක් වේ. එයම ඔහුගේ නිර්මාණාත්මක ප්‍රකාශනයේ ක්‍රමවේදය ද වන්නේ ය. නමුත් මුලදීත් කියවුණ ආකාරයට ඔහුත්, රජයත් අතර ඇති වූ ගැටුම ද ඔහුගේ ජීවිත ආපදානයෙන් ඉවත් කළ හැක්කක් නොවේ.

"ඒක දේශපාලනිකයි." යි ඒ ගැන ඔහු පවසයි. "සැම අධිපති පන්තියකම පදනම වන්නේ බලය යි. එවැනි පසුබිමක ඔවුහු පොදු සමාජ පැවැත්ම අරබයා සේවා සපයන්නවුන් බවට පත් නොවෙති. එතන දී තමන් ඉලක්ක කරන පන්තියක ට එවැනි නිෂේධනයක් එල්ල කරන්නේත් ඒ නිසාම තමයි. ඒ සැම නිෂේධනයක් ම ව්‍යාජ යි. එහෙත් ඒ නිෂේධනයන් ට එරෙහි වීම ඔවුන් සලකන්නේ ව්‍යාජය පිටු දැකීමක් විදිහට නෙවෙයි. දඬුවම් ලැබිය හැකි වරදක් හැටියටයි. එතනදී අරමුණ වන්නේ සිය අධිපති බව රැක ගැනීම යි. ඒ තුළ ම ශුද්ධවන්තයින් ලෙසින් පෙනී සිටීම යි. එවැනි පසුබිමක මා වරදකරුවෙක් වීම මට දැනෙන්නේ රත්පිත් විකාරයක්, ආත්ම වධයක් ඔන්න ඔය විදිහට යි. ඒත් ඒ නිසා මා ලද පීඩනය බරපතළයි."

කෙසේ වෙතත් මේ වනාහි ටෙනසි විලියම්ස් සම්බන්ධයෙන් සිදු කළ සමස්ත හෙළිදරව්වක් නොවන බව ඔහු ගැන කියවීමක් ඇති පාඨකයන් හඳුනා ගන්නවාට සැක නැත. ඔහුගේ පැවැත්ම එය කුමක් ද?

ඒ ගැන එක් පෙන්වා දීමකට අනුව ඔහු වනාහි "ගමනාන්තයක් නොදත් යාත්‍රිකයෙකුගේ නෞකා ගමනකි."

තවද ඔහු තමන් ගැන නොකී එහෙත් ඔහු ගැන කී තවත් කියුමක් මේය.

"කිසිම සැකයක් නෑ, ඔහු ගත කළේ විරල ආකාරයේ ජීවිතයක්. කුසලා කුසල විග්‍රහයට අනුව තක්සේරු කොට එය අරාජික ජීවිතයක් යැයි කීමට යමෙකු ඉදිරිපත් විය හැකියි. ඒ කොයි හැටි වුණත් බාධා ගල්පර මැදින් නොපසුබට උත්සාහයන් සිය පැවැත්ම තහවුරු කරගත් මිනිසෙක් ඔහු තුළින් දැකිය හැකි වුයේ ය."

දීපානි

ඇසුර

මොහාන් ශ්‍රියන්ත ආරියවංශ
mohansriyantha@gmail.com

# ඒ අභියෝගය තවමත් විවෘතය

## ආචාර්ය ඒබ්‍රහම්. ටී කොවූර්

**ඔහුට ඔහු ගැනම ලිවීමට වුවමනාවක් තිබුණත් ඒ වෙනුවෙන් වැය කිරීමට කාලයක් තිබුණේ නැතැයි ඔහු පවසයි. එහෙත් සිය 110 වැනි උපන් දින සැමරුමේ දී ඔහු ඒ වෙනුවෙන් ආරම්භයක් ගත්තත් අවසානයේ දී ඔහුගේ ජීවන කතාව වශයෙන් ලියවී තිබුණේ ඔහු විසින් සිදු කරන ලද්දා වූ වංචනික මිථ්‍යාවාදයන්ට එරෙහි විද්‍යාත්මක ප්‍රවේශයේ කාර්යභාරයයි. එහෙත් එය ඔහුගේ වරදක් නොවේ ඔහු උත්පත්තිය ලබා තිබුණේම තමන් වෙත පැවරුණ කාර්භාරයක් ද සමඟ ය. හේතුව එය වේ. ඔහු ඒබ්‍රහම් ටී කොවූර් වන්නේ ද ඒ හේතු කොටගෙනම ය.**


ආචාර්ය කොවූර්ගේ සම්පූර්ණ නම ඒබ්‍රහම් තෝමස් කොවූර් (1898 -1978) ය. ලංකාවේ හේතුවාදීන්ගේ සංගමයේ පුරෝගාමියා ද ඔහු ය. එයට ද හේතුවක් තිබුණි. ඒ හේතුවකින් තොරව අහේතුක පිළිගැනීම් ඔහු ප්‍රතික්ෂේප කිරීමයි. පර්යේෂණාත්මක තත්වයකින් තොරව නිගමන පිළිගැනීම ඔහු ප්‍රතික්ෂේප කළේ ය. ඔහුගේ කුදු මහත් වූ සියලු ලියවිලි මෙන්ම පොතපත ඒ බව කියා පාන සාහිත්‍යයක් වැන්න. වැදගත්ම කරුණ එය ඔහුගේ ජීවිතය පුරාම විහිදුණ අනවරත අරගලයක් වීම ය.

කොවූර් අයිපෙ තොම්මා කට්ඨානාර් යනු ඔහුගේ පියා ය. එදවස ඉන්දියාවේ මලබාර් හි පිහිටි මාර්තොම්මා සිරියන් ක්‍රිස්තියානි දේවස්ථානයේ කනිෂ්ඨ දේවගැතිවරයෙකු වශයෙන් කටයුතු කළේ ය.

ආචාර්ය කොවූර් පවසන අන්දමට ඔහුගේ පියා ද අයත්වන සිරියන් ක්‍රිස්තියානි ධර්මය රෝමානු කතෝලික ධර්මයටත් වඩා පැරණි එකකි. නාසරත්හි සිට කේරළයට පැමිණි සාන්ත තෝමස් සිරියන්, ක්‍රිස්තියානි ධර්මය ප්‍රචාරය කළ බවත්, පෘතුගීසින් කේරළය යටත් කරගත් (1498) කල්හි එවකට පැවති සියලු නිකායන් රෝමානු කතෝලික ධර්මයට යටතට ගෙන ඇති බවත් සඳහන් වේ. කෙසේ වෙතත් 17 වන සියවස වන විට පෘතුගීසි බලය පිරිහී යන්නට වූ පසුබිමේ නැවතත් සිරියන් පූජකවරු සිය බලය තහවුරු කර ගැනීමට කටයුතු කළහ. මේ පූජකයන්ගේ අනන්‍ය ලක්ෂණය වුයේ රැවුල් වවාගෙන සිටීම ය. ඔවුන්ගේ අනුගාමිකයෝ ද ඒ දේ අනුකරණය කළහ. එසේම නක්ෂත්‍රය, කේන්දර පිටපත් මත ජීවිත පලාපල කියවීම මේ නිකායේ සිදු කෙරුණක් විය.

සිය පියා විසින් ඔහුගේ නිවසේදීම ආරම්භ කළ පාසැලෙන් මූලික අධ්‍යාපනය ලද ඒබ්‍රහම් කොවූර් උසස් අධ්‍යාපනය සඳහා කල්කටා හි බෙංගබාසි විශ්ව විද්‍යාලයට ඇතුළුව සත්ව විද්‍යාව සහ තෘණ විද්‍යාව විෂයයිකව කළ හැදෑරීම් වලින් සිය උපාධිය ලබා ගත්තේ ය. පසුව තවත් වසර දෙකක් ම වැය කරමින් හස්ත රේඛා සහ නක්ෂත්‍රය උගත් ඔහු එය පසුකාලීනව සිදු කරන්නට යෙදුන සිය ක්‍රියාකාරකම් වලට මහත් සේ සහාය වුයේ යැයි පවසයි.

ඉහත විස්තරය එසේ අප ඔබට ඉදිරිපත් කිරීමට අප කටයුතු කළේ ආචාර්ය කොවූර්ගේ කාර්යභාරය පසුබිමේ වු ජීවන පැවැත්ම හඳුන්වා දීමට ය. කෙසේ හෝ වේවා සිය අධ්‍යාපන කටයුතු අවසන් කොට වෘත්තීය වශයෙන් ගුරුවරයෙකු වන හෙතෙම සිය මුල්ම පත්වීම ලබන්නේ කොට්ටාරයම් හි සී. ඇම්. සී. විදුහලට ය. එහෙත් 1926 දී වෙසෙස් හඳුන්වාදීමක් මත ඔහු යාපනය විදුහලේ ගුරු මණ්ඩලයට ඇතුළුවන අතර පසුව ගාල්ලේ රිච්මන්ඩ් විදුහලටත්, ගල්කිස්සේ ශාන්ත තෝමස් සහ කොළඹ තර්ස්ටන් විද්‍යාලයන්හි සේවය කොට විශ්‍රාම යන ඔහු එතැන් සිට හේතුවාදීන්ගේ සංගමය පිහිටුවමින් මෙතෙක් තමන් පෞද්ගලික මට්ටමින් පවත්වාගෙන ගියා වූ ක්‍රියාකාරකම්හි සංවිධානාත්මක මට්ටමින් නියැළීම හේතු කොටගෙන ඔහු අතින් ලියවනු ලිපි පෙතපත, නිබන්ධන ප්‍රබල පර්යේෂණාත්මක සමාජ විද්‍යා සාහිත්‍යයක් බිහි කළේය. උක්ත කර්තව්‍යය සඳහා ඔහුව යොමු කෙරුණ පසුබිම ඔහුගේ ජීවත්වූ පරිසරය තුළම තිබුණි. ඒ සමාජගත අවිද්‍යාව යන්න ආයතනික ව්‍යුහ වශයෙන්ම පවතින ආකාරය ඔහු කුඩා වියේ සිටම ලද අත්දැකීමක් වූයේ ය. එවැනි මිථ්‍යා ඇදහිලි විසින් පොදු මිනිස් සමාජය සූරාකෑමටත්, එනිසාම පීඩනයටත් ලක් කිරීමටත් එරෙහිව සැබෑ විද්‍යා ආලෝකයත්, සමාජ සංවර්ධනයත් ලොව පුරා පැතිර යමින් තිබූ කාල වකවානුවක් ද විය එය. එකී මිථ්‍යාවාද පර්යේෂණයේත්, ගවේශනයේ සැත්කම් වලින් උපුටා දැමිය යුතු පිළිකා කාරකයන් වශයෙන් සැලකීමට ඔහු ව යොමු කළේ ඒ කාලයයි. මිනිසුන් බිය ද සන්ත්‍රාසය ද නිසා අභ්‍යාස ද ඇදහීමට යොමු වීම මිථ්‍යාවාදයක් ලෙසින් බෞද්ධ දර්ශනයෙන් ද උගන්වා ඇති පසුබිමක ආචාර්ය කොවූර්ගේ උක්ත ක්‍රියාන්විතය හේතුවාදයකින් තොරව ප්‍රතික්ෂේප කළ හැක්කක් නොවේ. අනිත් අතට එය ඔහුගේ සැබෑ ජීවිතය ද වුයේ ය. එනිසාම ඔහු ඒ සඳහා ඔහු සිය ජීවිතයෙන්ම සුදානම් වුණේ ය. විවාහය වෙනුවන් යුවතියක තෝරාගැනීමේ දී තම අදහස් අනුව පවතින, යන සාධකය වෙනුවෙන් මහත් සේ කල්පනාකාරී වුයේ ද ඒ නිසාම ය. අවසානයේ ඒ ආකාරයට සහකාරිය තෝරා ගන්නා ආචාර්ය කොවූර් දරුවන් නිර් ආගමික පසුබිමක එදා වඩා ගන්නට ද ඇයත් සමඟ එකඟතාවකට පැමිණියේ ය. ඒ දේ එසේම ද සිදු වුණේ ය.



> සියු පියා විසින් ඔහුගේ නිවසේදීම ආරම්භ කළ පාසැලෙන් මූලික අධ්‍යාපනය ලද ඒබ්‍රහම් කොවූර් උසස් අධ්‍යාපනය සඳහා කල්කටා හි බෙංගබාසි විශ්ව විද්‍යාලයට ඇතුළුව සත්ත්ව විද්‍යාව සහ තෘණ විද්‍යාව විෂයයිකව කළ හැදෑරීම් වලින් සිය උපාධිය ලබා ගත්තේ ය.

කෙසේ වෙතත් ආචාර්ය කොවූර්ගේ ප්‍රතිපාර්ශවය ඔහුට එරෙහිව පෙන්වා දෙන්නේ සමාජයක පවත්නා එමෙන්ම පැවතිය යුතු සංස්කෘතික සහ සමාජ චාරිත්‍ර වාරිත්‍ර වලට විරුද්ධව නිර්දය සාහසිකත්වයකින් යුතුව ඔහු කටයුතු කරන බව යි. ඒ අනුව කොවූර්ගේ අදහස් එක්තරා ආකාරයක නරුමවාදයක් ලෙසින් පෙන්වා දුන් අය ද ඒ අතර වුහ. නමුත් මෙහිදී අවධාරනයට ලක් විය යුතු කරුණ වන්නේ ආගම, මෙන්ම කුදුමහත් වු විශ්වාසයන්හි පවත්නා මිථ්‍යාවේ ජාවාරම්වාදය එය හඹා යමින් ආචාර්ය කොවූර් විසින් සිදු කරන්නට යෙදුනු විද්‍යාවර්ධනය එවැනි මතුපිට තර්ක වලින් ප්‍රතික්ෂේප කළ නොහැකි බවයි. අනිත් අතට එය ඔහුගේ අදහස් හා මත පිළිගැනීම තුළ ඇතැම් විට විවාදාත්මක බවක් තිබිය හැකි නමුත් නිසිදු විමසීමකින් තොරව ආගමේ, ඇදහීමේ මෙන්ම ප්‍රාථමික සංස්කෘතාංගයන්ට යටපත් වෙමින් ගෙවන්නා වු නූතනයට නොගැළපෙන මනුෂ්‍ය පැවැත්ම ට ඒ සදාචාර විරෝධී මිථ්‍යාවේ පීඩනයට එරෙහිව තර්කානුකූල විද්‍යා ප්‍රවේශයකින් කරුණු පැහැදිලි කිරීම අර තරම් සරල ආකාරයකින් ප්‍රතික්ෂේප කළ හැකි නොවේ.

අනිත් අතට අද වන විටත් මුළුමනින්ම අහෝසි නොවු තත්වයක පවත්නා මෙම මිථ්‍යා අධිකාරිය බුද්ධිමය වශයෙන් පරාජය කිරීමට ඔහු ගත් ඒ මග ප්‍රගතිශීලි කාර්යභාරයක් ලෙසින්ම සැලකිය යුතු වේය යන්න අපගේ කල්පනාවයි. විශේෂයෙන්ම විද්‍යාවේ අභිවර්ධනයත් සමග ඇති වු නව සමාජ සංවර්ධනය හමුවේ ප්‍රාථමික මිථ්‍යා විශ්වාසයන් ආගමික හෝ ඇදහිල්ලක නාමයෙන් හෝ එවැනි අධිකාරියකට යටපත් වීමෙන් පීඩනයට පත්වන මනුෂ්‍ය සමාජයකට විද්‍යා අවබෝධය වැටහෙන නුවණ පමණින්වත් ලබා දීමට කටයුතු කිරීම සද් කර්තව්‍යයක්ම වේ. ඒ අනුව ඔහුගේ නිබන්ධනයන්හි එන එක් යෝගිවරයෙකු රෝගියෙකු සුවපත් කිරීම අරබයා මිථ්‍යාමය ප්‍රබන්ධගත පූජාවකින් කටයුතු කරමින් ඊට මුදල් ලබාගත් ආකාරය, ඒ මුළා කිරීම මෙන්ම ඔලුමාඩු වනයේ සිටි කාදර් භූතයාගේ වංචාව, වීදුරුවකින් භූතයන් අමතන අනුවණ හැසිරීම් සංවර්ධිත සමාජයක නොපැවතිය යුතු දෑ වශයෙන් කල්පනා කොට කටයුතු කිරීම සංස්කෘතික විරෝධී නරුමවාදයක් නොවේ.

ඒ අනුව සිතන කල්හි ආචාර්ය කොවූර්ගේ ක්‍රියාන්විතය ඒ බුද්ධි ව්‍යාපාරය මූලික අරුතින්ම මානව හිතවාදී ව්‍යාපාරයක් වේය යන්න අපගේ කල්පනාවයි. ශ්‍රේෂ්ඨ නාට්‍යකරු විලියම් ශේක්ස්පියර්ගේ සිය ජුලියස් සීසර් නාට්‍යයේලා කියන කියුමක් මෙහිදී උපුටා දක්වන්නේ යට කියවුණ කරුණු වඩාත් නිර්මාණාත්මකව පැහැදිලි කර දීමට ය.

"මා ප්‍රිය බ්‍රැටස්, අප මෙහෙකරුවන් වී සිටින්නේ අපේම වරදින් මිස අහසේ තිබෙන ග්‍රහ තාරකාවල වරදින් නොවේ."

# දීපානි

## නොලියුණ කවි

හිරු නැඟ බහින දහවල තිස් පැයේ සිට
හුරු ගී තනු මවන විහඟුන් ලතා වට
සරු කල්පනා මැවූ දිය දම අගේ පිට
උරු මය රැදෙයි නොලියුන කවි සැබෑ කොට

මල් කුමරියන් විකසිත වන ලකුණු පෙනී
කල් යල් බලා බිඟු කැල සිප වැලඳ ගනී
ඇල් කේත හේන මැව් අසිරිය යසට දැනී
ඉල් පෙන හැඟුම් නොලියුන කවි තුළට පනී

ඇළ දොළ පොකුණ ගං කොමළිය මනහාර
වෙල ඉස්මත්ත ඕවිට බඩ වැටි නෑර
නැළ වෙන රන් කරල් කෙත් යායෙහි සාර
පෙළ ගස්සන වගයි නොලියුන කවි ආර

ඉපදුන විගස බිලිඳුන් ගෙන තුරුලු කොට
තැවරුණ තන පුඩුව සියුමැලි දෙතොල පිට
වැගිරුණ කිරි කඳුළ නොඉඳුල් උණුහුමට
උතුරන මවු සෙනෙහෙ පණ දුනි කවියකට

දරුවෙක් උකුලෙ තවකෙකු සිය කුසෙහි දරා
පිහිටක් යදින අසරණ මව කඳුළු පෙරා
සරණක් වන අයෙක් නෙතු යුග ගැටෙන තුරා
කවියක් නොලීවෙමි මේ ගැන සිතැගියුරා

සිය මව දමා ගොස් වැඩිහිටි නිවාසෙට
නොය නා දුව පුතා සැප දුක් බැලීමට
ඇය නෙත් කඳුළු වගුරා මඟ බලාසිට
ලියවේද නොලිව් කවි නොපනත් සමාජෙට

**අපරැක්කේ සුනිල්**

# විදෙස් කවිය

## කල්ලාගේ මරණය

අලුත් ජෙම්මා නැන්දණිය
බියට පත්වීද ?
තම දරුවන් නැසූ
සුසාන්
මන්ද වරද
කල්ලෙකු පිට ඇමූවේ

කල්ලා තම
උරපොදිය සමගම
දිවිනසා ගත යුතු වෙයිද
තවමත්
ගසක එල්ලී

යුක්තියද නැතහොත්
පළිගැනීමද මේ
මම
රුධිර සීනි බලන්නට
විද ගනිමි ඇඟිලි දිනපතා
එහි රුධිරය විනා
අන් යමක් වේදැයි
පිරික්සමි නිතොර

ජීවිතයට
ඇති හොඳම
මතක සටහන රුධිරයයි....

### වෙරිල් බෝයිස් ටේලර්

1950 දෙසැම්බර් 06 වැනිදා දකුණු ඇමරිකාවේ උපන් කළු ජාතික කිවිඳිය. ඕ නූතන දකුණු අමෙරිකානු කවීන් අතර පමණක් නොව සමස්ත ඇමෙරිකාවේ කැරිබියන් දූපත්වලත්, යුරෝපයේත් කවීන් අතර නිර්මාණශීලීත්වයෙන් ඉහළ කිවිඳියක් වශයෙන් ප්‍රකටය. මේ වන විට කාව්‍ය ග්‍රන්ථ 4 ක් ප්‍රකාශයට පත් කර ඇති ඇය 2021 දී සිය 5 වැනි කාව්‍ය ග්‍රන්ථය ප්‍රකාශයට පත් කිරීමට සූදානමින් සිටියි.
වර්ගවාදයට එරෙහිව පමණක් නොව ස්ත්‍රීන් කෙරෙහි වූ වෙනස්කම් හා ජාතිවාදයට ද එරෙහි සමාජ ක්‍රියාකාරිණියක් වන ඇය බොහෝ විශ්වවිද්‍යාල හා සමාජ කව වල ආරාධිත දේශිකාවක් වශයෙන් කටයුතු කරයි. කල්ලාගේ මරණය කාව්‍යයේදී ජෙම්මා නමින් සඳහන් කරන්නේ බයිබලයේ සටහන් වන ජොබ් නම් වක්තෘවරයාගේ සුරූපීම දියණියයි.
එමෙන්ම සුසාන් ස්මිත් දරුවන් ඝාතනය කොට සිරදඬුවම් විඳින ස්ත්‍රියකි. සුසාන් මූලික නඩු විභාගයේදී සාක්ෂි
දෙමින් කියා සිටියේ තම දරුවන් ඝාතනය කළේ ඇය දන්නා කළු මිනිසෙකු බවය. කිවිඳිය “කල්ලාගේ මරණය“ ලියන්නේ මේ වසරේ අගෝස්තු 10 දාය. වෙරිල් බෝයිස් ටේලර් කිවිඳිය මේ උපමා භාවිතා කරමින් කල්ලාගේ මරණය ගැන සමාජයට පණිවුඩයක් කියන්නට උත්සාහ දරන්නීය

**අනුවර්තනය : සමන් ගුණහේරත්**

## රැකියාලාභී උපාධිධාරියාගේ උදාන කාව්‍යය

දෙමාපිය මුව අගුළු සිරකර
හමාරය රළු බැණුම් බණවර
නිමාකර හද ලෙනෙහි ගණඳුර
අමාවක රෑ නැගුණු දිනකර

සමාවක් දෙමි නොමැති අසුනට
දමා සහතික පැරණි ගොනුවට
නිමාවක් නැත සිතමි හෙට සිට
පමා වී ආ වසත් සමයට

**සරත්වන්ද්‍ර බණ්ඩාර**

## සරුංගල්

සුව මාවත ඇවිද ඇවිද
බැරි බැරි ගාතේ වැනි වැනි
අබලන් වූ සවිය සොයමි
සැන්දෑ යාමේ

නීල වර්ණ වා පිටුවේ
මුඳුන් කකා කොම්බු ගසන
වෛවාරණ සරුංගල් ය
එල්ලී නූලේ

උඩ සුළඟට වාරු නැතිව
බිමට බාන අදින නූල
පැටලී පැටලී අවුල් ගොඩකි
දැක්කේ දෑලේ

**ඇල්බට් ඇම්. ලියනගේ**

## ආදරය ගින්නක් ය හදවත දවන

වසන්තය වසන්තය
සිනාසෙන දසන්තය
කළුපාට රුදු මුහුණ
ප්‍රේමයෙන් දේදුණු පාට වෙන
දුටුවාම අතාරින්නට බෑ කියන

හිතක් ළඟ හීළැව ගුළිවෙන
හැඟුම් මුල්ලක පිපි මල
ගිම්හානය නුදුටුවොත්
සීතලේටම මැදින් පීදෙන
පොරෝතලයක කෙටුණු
හදවතේ සලකුණ
හී මතින් ඉඳුල් වී
රතු පාටින් සිනාසිණි.

**චම්මින්ද වෙලගෙදර**

## හිමි නැති පෙම

ඉකිලන හදවත සනසාලන්නට
පැතුවද ඔබගෙන් සෙනෙහස පොදක්
පැතුමන් බොල් සුළඟේ පාවී ගොස්
වැටුණා දෙනෙතින් කඳුළු බිඳක්

අතීත සෙවණැලි මතකෙට අවුදින්
හද රිදවා පියමං කෙරුවා
අරුණලු විසිරෙන හිමිදිරි යාමේ
අකුණු ගසා විදුලිය කෙටුවා

පායන සඳ ගැන දිලිසෙන තරු ගැන
මොනවා කියන්නද හද ඇසුවා
කණාමැදිරි එළි නොපෙනෙන විලසට
අඳුරු වලාවෙන් නෙත වැසුවා

**වික්‍රම සෙනවිරත්න**

## සැඳෑ වැනුම්

දිවකත අතැර සමුදුර මැදුරට යන්ට
දිවයුරු හිමි හැරෙයි නිසකත එයි පෙරට
හිමකර රැස් දහර අත් දිගු කර ඇයට
ඉගිකළ විට ඉගිල යනු වෙහෙරෙන් පිටට

සමනල ගිරි හිසින් පහළට වැටෙන්නේ
ලක'ගන මුහුළ ලෙස හැම විට පෙනෙන්නේ
ඉඳ හිට පිරී ඉතිරී පිට ගලන්නේ
කැලණිය නදිය ළඟ තුර සිට බලන්නේ

වෙහෙස වෙලා ඇති ගත සිත නිවන අටින්
ගෙයක ගෙදිගු විලකට බැස හද සතුටින්
කමල කුමරියක දැක බස් දොඩා කොටින්
ඉසිඹු ලන්න ඉඩ දෙන තෙක් බලා සිටින්

සියපත් කුමරිගෙන් පැණි රොන් ටික බීලා
තුරුලට වැදී පෙති අතරට මැදි වීලා
සිටියත් ඇය උකුලෙ සුව යහනක ලීලා
හිරු දුටු විට බලනු එන්නට මි දීලා

මුනි පුදනට උදයෙම සැදැහැති පිරිසක්
එති වෙහෙරට පෙනේ එය තට වේ සතුටක්
දුර සිට බුදු ගුණ සිහිකර කර තෙවිටක්
ගමනට සැර සෙන්න මල් රොන් රැගෙන බිඳක්

**සුනිලා කටුවාවල**

(කොළඹ ආනන්ද බාලිකා විද්‍යාලයේ හිටපු විදුහල්පතිනිය වූ සුනිලා කටුවාවල කිවිඳිය පසුගියදා අභාවප්‍රාප්ත වූවාය. ඇය ගී පද රචිකාවක, කෙටිකතාකාරිනියක ද වේ. මෙයට කලකට පෙර ඇය විසින් ලියන ලද ‘බිඟු සදෙස‘ කාව්‍ය සංග්‍රහයෙන් තෝරා ගත් කවි පෙළකි මේ. )

**ඔබේ කවි නිර්මාණ පහත ලිපිනයට එවන්න. සිළුමිණ, කවි පිටුව, ලේක්හවුස්, කොළඹ 10. edmediaunit@gmail.com**

## කඳුළක රිදුම

"අනේ අම්මේ !
තාත්තා නම්
එවන්නට එපා
ආයෙමත් මගෙ පංතියට....
එයා බීලා හොඳට ම
මං බයෙන් ආවේ
මඟ දිගට....
ඒ ලොකු ලොරියේවත්
වැදෙයි කියා
අපේ බයික් එක....
ටීචර් ළඟට ම ගිහින්
කතා කරද්දී
දැනෙන්නට ඇති ටීචර්ටත්
තාත්තගෙ කටේ ගඳ...."
කඳුළු පිරි ඇගෙ පුංචි ඇස්
කීවේ ම ලොකු කතාවක්....
අනේ මගෙ පුංචි සුරංගනාවී
සමාවෙයන් ! මට
අසනීප නිසයි මට
නුඹ ගන්න එව්වේ..
අදට විතරක්
තාත්තා නුඹේ පංතිය ළඟට..
දියණියේ
මෙවන් පියකු ලද නුඹත්
මෙවන් සැමියකු ලද මමත්
නිවුණෝ නම් නොවෙයි
දැවුණෝ ම ය

**ධම්මි සාරා පෙරේරා**



## උදාන

පිබිද හිමිදිරියෙහි
රක්ෂා කරනුව සුතනඹුන්
කන්තෝරුවට යන්නෙමි
අට පැය ගැහැට කෙළවර
සැන්දෑග ගෙදර පැමිණෙත,
තරු පිරි අහස යට
මුදිත වෙයි හදවත
මධු විතක් සති අග
තොලගාන සඳ, කුමක් හෝ
ගී සරක් සෙමෙන් මිමිණෙයි

සවි බල සිඳෙන ගත
රෝගයට කැදැල්ලක් වද්දී
දත් දැඟි තරකොට
වැවෙමි
සාදා ගත් සිතින්

නිවස, සුතනඹු, ගම්පියස, කන්තෝරුව
තත් තත් තන්හි ඉන්නෙමි
වනගත එහි ඔහේ යන'තර
වනයට අත් ඇරුණු
තම පැරණි ගම් වදිනා
වල් වැදුණු ගෙරි සරකෙකු මෙන්

**සුනන්ද කරුණාරත්න**

## මල්

සෙව්වෙමි
පාට පාට මල්
ඇයට තිළිණ දෙන්නට
සොයමි
සුදු පාට මල්
හැන්දෑව මුණි පුදට

**චන්ද්‍ර වාකිස්ට**

## අහිමි වූ මැණික

කඳුබොඩ ගම කන්ද කපා පැයූ පුන්සඳ
සැඟව ගියා රහසේ ඔබ, වැලපෙයි මගෙ හද
පාළු සුසානේ තනිවම සැතපෙනවා අද
මට පාළුයි, මට පාළුයි නැගිටින් රන්කඳ

ගෙවුණු අතීතය සිහි වී එයි දුක් සිතුවිලි
මැවිලා පෙනෙයි, මට ඔබෙ මුව සුන්දර හසරැලි
දුන් ගින්දර වාවනු බැහැ හදවත යයි පැලී
ගුණ යහපත් බිරිඳක් වී එන්න මවෙත යළී

වියළී නැත හෙළු කඳුළු අදටත් නෙතු අග
සිත රවටා බලා හිඳිමි, ඔබ එන පෙර මග
ඇතිවෙන හැම දෙය නැතිවෙයි බුදු හිමි දෙසු වග
සිහිපත් වෙයි සත්තයි, අපි යමු සදහම් මඟ

**ජයන්ති අනුත්තරා**

## දෝණියේ

ගතට උණුසුම, සිතට සැනසුම් සුවය ගෙනදුන් දෝණියේ
කනට මිහිරක් ගෙනෙනයුරු මුදු වදන් තෙපලූ දෝණියේ
නෙතට රසඳුන, සිනාපිරි මුව, විටෙක හඬනා දෝණියේ
අපට නිවහනෙ එකම වස්තුව නුඹම පමණෙකි දෝණියේ

ඇහිඳ පොල්කටු, වෙමින් සුරතල් පිසූ වැලිබත් දෝණියේ
දෙවට අයිනෙන් අකුරු කෙරුමට ගුරු ගෙදර ගිය දෝණියේ
දිනෙන් දින සුදිලෙන සඳක් සේ රුවින් බැබළුණු දෝණියේ
බඹර නෙතකට බැඳුණු රහසක් සවන් වැකුණ දෝණියේ

දෙමින් ඔවදන් සිරස පිරිමැද හඬා වැටුණද දෝණියේ
රැගෙන ඔහු අත, අතැර අප සැම ඉගිළුණා නුඹ දෝණියේ
බිඳක් හෝ සැනසුමක්, සතුටක් ලබාගන්නට දෝණියේ
ඇවිත් හීනෙන් කියාපන් මට කොතැනකද නුඹ දෝණියේ

**බඹරැන්දේ ජගත් පත්මසූරිය**




## ඔරුව එන තුරු

ලැබුණත් පහසුකම් මගෙ දිවියට කුමන
ඊයෙට වඩා අද අපහසුමය ගමන
ලස්සන කරන්නට හැදුවත් හැකි පමණ
මල කෑ යකඩ බඩු මෙනි විසිකර දමන

ජීවත් වෙන්න වලිකෑවත් රැගෙන වෙර
කාලය ඉවර බව පවසයි කනට කර
සායම් උලා හැඩ කෙරුවත් මුහුණු වර
ළාහිරු වෙන්නෙ නැහැ බැසයන මහලු ඉර

ආ දුර වැඩියි යා යුතු දුර තව ටිකය
ඒ ටික දුරත් යා හැකිදැයි මට සැකය
සුව සෙත පවා දැන් මා හා විරසකය
වැඩියෙන් දැණුනෙ රෝ රකුසගෙ අණසකය

ජීවන සටන කරගෙන යන අතර තුර
කටයුතුවලට අතදී සුගතියට බර
ගෙන යනු පිණිස යන දවසට මෙලොව හැර
රැස් කළ කුසල් ඩිංගක් ඇත ඉතුරු කර

ඉස්සර සිරුරෙ පැවතුණ සවිබල දුරුව
ලී කොටයක් වගෙයි කය හොඳටම දිරුව
දිවි ගැල තවදුරට ඇදගෙන යනු බැරුව
එගොඩහ යන්න ඉන්නෙමි එන තුරු ඔරුව

**ප්‍රේමදාස නුගේගොඩ**

## බුදු හාමුදුරුවෝ

සොබා දහමට ආදරෙන්
නෙත් යොමා බලන කළ
මිහිකත හඬා වැටී
සිතුමට නිමේෂයක් තිබුණාද මිනිසුණේ
දුර ඈතට ගියාදෝ අපේකම

සතුට මිල කළ සමාජයේ
ළතැවිලි පමණයි ඉතිරි වුණේ
ලොවම බියෙන් වෙළිලා
උඩඟුව වෛරස් කොරෝනා

තුන්බිය දුරලූ විසල් නුවරට පවා
දෙසූ දම් ඔසුවෙන් බිඳක්
සුවපත් කරනට අප සිත්
වඩින්නට කාලයයි පින් බිමට
බුදු හාමුදුරුවෙන්

**සුජාතා බස්නායක**

# මුහුණු පොතෙන් කවියක්

## කිම්ද සුමිතුර

රට අඹ කදෙන් නිමකළ
මේ කුඩා කළු මේසය
ළඟින් යන හැම මොහොතක
කඳුළු පිරි බැල්මෙන
ඈ, කරා මා කැඳවන

" දිවියක මිහිරි සරුඵල
විද, ගිම් නිවන සකිසඳ
පවසනු මැනක් පිරිසිද

රට අඹ ලැලි පරපුර
දකින, හමුවන හැමතැන
පලු, කොස්, වීර කිතුගොස
නගා, තැන තැන පාන පෙළහර
කිම් ද සුමිතුර,
එකම කැළයක
එකම පොළවක
ගස් බෙදෙන්නට කාරණ .."


කියා යන,එන හැමවර
එකම පැනයම විමසන
ඒ කුඩා කළු මේසය
දමා අර අඳුරු මුල්ලට
පළායමි ,මම
අතීතයෙ මුඩු ඉඩමට

**අනුරාධා නිල්මිණී**

# සතියේ කවි පොත

**කෘතිය- යළි ගලායනු පිණිස**
**කර්තෘ- රංජිත් මල්ලියාවඩු**

මෙවර සතියේ කවි පොත ලෙසින් හඳුන්වා දෙන්නේ ප්‍රවීණ කවියකු වන රංජිත් මල්ලියාවඩුගේ යළි ගලායනු පිණිස කාව්‍ය සංග්‍රහයයි. ඔහුගේ පළමු කාව්‍ය සංග්‍රහ වන ඇස් ලැබීම නිකුත් වන්නේ 1989 දී ය. ඉන් පසු මංගල දියවර (1995) නිදි නැති ගඟ (2007), මෙන්ම සහෝදර මුහුණුවර (2018) නිකුත් විණි. මේ හැරුණ විට ගීත රචනා සංග්‍රහයක් සහ ළමා කෘති ගණනාවක්ද ලියා පළ කර ඇති රංජිත් වැඩි වශයෙන්ම කතා බහට ලක්වන්නේ කවියෙකු ලෙසිනි.





රංජිත් මල්ලියාවඩු

ඔහුගේ කවි අපූරුය. පාසල් වියේ සිටම කවියට පෙම් බැඳි ඔහු විවිධ අනුභූතින් ඔස්සේ කවි ලියන්නේය.
දැන් පහළ බාලාංශයේ පෙළ පොතේ සාමලා අමරලා නැත. එහෙත් මීට දශක කිහිපයකට පෙර බාලාංශ පොතේ සාමලා අමරලා සිටියහ. ඒ අතීතය සුන්දරය. සුන්දර අතීතයක් සිහි ගන්වමින් ප්‍රේමයක ළතැවිල්ලක් ගැන රංජිත් මෙලෙස ලියයි.
යළි ගලායනු පිණිස කාව්‍ය සංග්‍රහයේදී හමු වූ මේ කවිය බොහෝ මතකයන් අලුත් කරන්නා සේම සාමලා අමරලා සල් මල් හරහා නොපල ප්‍රේමයක සියුම් ළතැවිල්ලක් ඉතිරි කරයි.

**මාතෘකාව ‘සල් සුවඳ‘**

**තාත්තා හැමදා ම කියවන හන්දා**
**මං ගියා සොයා ගෙන සාමා නැන්දා**
**අමරගෙ පුතා බව කීවාම උන්දා**
**සුත පෙමින් මට පෑවේ පුර පෝදා**

**තාත්තා ලියූ කවි පොත් ගුලෙන් කැන්දා**
**නිමේෂයකින් කලා මසිත මනනන්දා**
**නොවන්නට ඒ සහෝදර පෙමට නින්දා**
**එන්න කලියෙන්ම මම දණ ගහලා වැන්දා**

**එන ගමන් අතර මග නැවතිලත් නන්දා**
**යන පාර මතකයේ නොමැකෙන්න ඇන්දා**
**අපේ මුල් පොත වෙනස් කළ එවුන් හින්දා**
**කී දෙනෙක් තවම දුක් විදිනවද මන්දා**

**මහ මැඳුරු යාන වාහන තැවුල් කන්දා**
**කුදලගෙන අපි මොනවා කරනවද මන්දා**
**එහේදිම පොලොවෙ ගහලා ඔළුව බින්දා**
**සල් මලක සුවඳ මම ඒ ටිකට වින්දා....**

බාලයන් සමග හැදි වැඩුණ මහ ගෙදර තරම් කිසි තැනක් සුවදායක නැත. කොතරම් අඩුපාඩුකම්, දුක් පීඩා තිබුණ ද මව් පියන් සමග ගෙවූ ඒ ජීවිතය සොඳුරුය. එක්කෙනෙක් දෙන්නෙක් නොව අද බොහෝ දෙනෙකු කියන කතාවකි ඒ අගහිඟකමින් පිරි නිවසේ සියලු මෙහෙවර කළ අම්මා ඇතකින් හුඹස් මැටි කපා ගෙනැවිත් අනා ගෙබිම ගෑ අපූරුව සිහිකරන ඔහුට සිතෙන්නේ ටයිල් බාස්ටත් වඩා අම්මා ඒ කාර්යයේ දක්ෂ බවය. අම්මාට පුදුම චරිතයකි. ඇය හැම දෙයක්ම මැන බලන්නේ හිතෙනි. මැටි ගාන විට අතේ ඇඟිලි වල පාර බිම සිටි. එහෙත් අම්මා ඒ රේඛා පාරවල් නැති වෙන සේ ටයිල් කැටයක් ලෙසින් මැට්ටෙන් බිම ඔප දමන්නට සමත්ය. ඒ යුගයේ අම්මලා කළ මේ හපන්කම නූතන අම්මලා කරන්නට නොදැන සිටීම දුකකි. හුඹස් මැටි කපාගෙන ඒවා ගෝනිය දා හිස තබාගෙන එන අම්මාගේ රුව හරි අපූරුවට පාඨක සිතේ මැවීමට කවියා සමත්ය. ඒ තරමට ඔහුගේ භාෂාව ප්‍රබලය. මාතෘකාව ‘ටයිල් බාස්.‘ කවිය කියවන විට එය විඳින විට මෙසන් හැන්ද , මට්ටම් ලීය ආදි ආම්පන්න රැගත් බාස් උන්නැහැ කෙනෙක් මෙන්ම අම්මා ද අපේ සිතේ මැවේ.

**“කුරුඳු කැලේ දණ ගහලා**
**නාග පොළොං විස මරලා**
**පරණ තුඹස බිඳ දමලා**
**හුඹස් මැට්ට ගෝනියේ ලා**
**කරඬුව සේ හිස තියලා**
**බරට බරේ ගෙදර ගෙනා අම්මා....“**

**“අත්ලේ රේඛා මකලා**
**ඒ‘රටා ගෙබිමේඇඳලා**
**හදේ සිසිල මැටි ගෙබිමේ**
**නිධන් කළේ අම්මා....“**

‘යළි ගලායනු පිණිස‘ කාව්‍ය සංග්‍රහයේ විවිධ මාතෘකා යටතේ ලියැවුණ කවි පන්ති හතළිස් තුනක් පමණ වේ. මේ හැම කවියක්ම එකකට එකක් වෙනස්ය. විවිධාර්ථ සහිතය.
පුවත්පත් කවි පිටු හරහා කවියෙකු ලෙසින් පාඨකයන් අතරට පැමිණි ඔහු පසු කාලීනව පළකරන ලද කාව්‍ය සංග්‍රහයන් විවිධ කාව්‍ය සම්මාන තරග නියෝජනය කළේය. පරිණත කවියකු වන රංජිත් ගේ කවිය පිළිබඳ සමාජය තුළ තවමත් නිසි ඇගැයුමක් නැතියි සිතේ.

වෂී 2020ක් වූ අගෝස්තු මස 23 වැනි ඉරිදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.

Tel: 2429351
Mobile: 071 7829018
Email:
Silumina.advt@lakehouse.lk

සිළුමිණ

# අධ්‍යාපන
Education

# අඩුම මුදලකට ඉහළම බ්‍රිතාන්‍ය උපාධි පිරිනමන Northshore Campus



මහාචාර්ය නාලක ජයකොඩි



ආචාර්ය උපාධියක් ලබා මහාචාර්යවරයකු බවට පත් වූ, පළමු හා එකම ශ්‍රී ලාංකික ජ්‍යෙෂ්ඨ නාවිකයා (මාස්ටර් මැරිනර්) වන, මහාචාර්ය නාලක ජයකොඩි උපකුලපති හා ප්‍රධාන විධායක නිලධාරී ලෙස කටයුතු කරන, නෝර්ත් ෂෝර් කැම්පස්, මෙරට විශ්වවිද්‍යාල පද්ධතියට එක් වූ අති නවීනම පෞද්ගලික විශ්වවිද්‍යාලයයි.

දේශීය හා ජාත්‍යන්තර වශයෙන් කීර්තියක් උසුලන දක්ෂ නාවිකයකු සහ ශාස්ත්‍රවේදියකු වන මහාචාර්ය ජයකොඩි, අධ්‍යාපනික ක්ෂේත්‍රයට දක්වා ඇති දායකත්වය අති විශාලය. උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ පුළුල් නායකත්ව පළපුරුද්දක් ඇති ඔහු මින් පෙර, සිනෙක් මැරිටයිම් කැම්පස් හි උප සභාපතිවරයා ලෙස කටයුතු කළේය. ශ්‍රී ලංකාවේ රාජ්‍ය හා පෞද්ගලික උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයටත් , වෙළෙඳ නාවික කේෂේත්‍රයටත් දැවැන්ත දායකත්වයක් ලබා දුන් ඔහු, ශ්‍රී ලංකාව දැනුම කේන්ද්‍රස්ථානයක් බවට පත් කිරීමේ ජාතික දැක්ම සාක්ෂාත් කරලීම උදෙසා සිය පූර්ණ දායකත්වය සපයනුයේ කොළඹ 15 පිහිටි, නෝර්ත් ෂෝර් කැම්පස් හරහා ය.

රටවල් අනූවකට අධික සංඛ්‍යාවක සංචාරය කළ පළ පුරුදු නාවිකයකු වන ඔහු, ජාත්‍යන්තර නාවික ක්ෂේත්‍රයේ බොහෝ දැවැන්ත ආයතනයන් හි ඉහළ තනතුරු දරා ඇත්තේ ය. ලොව මෙවැනි සුදුසුකම් ලත් නාවික මහාචාර්යවරු දහයකටත් අඩු අතළොස්ස අතරේ, ඔහුද කෙනෙකි. එහෙයින් ඔහු, ශ්‍රී ලංකාවට අභිමානයකි.

සිය වෘත්තීය ක්ෂේත්‍රයේ ඉහළටම ගිය මහාචාර්ය ජයකොඩි මත දැන් ඇත්තේ, රටට සේවය කිරීමෙන් ලබන්නා වූ ආත්මීය සතුටයි. නෝර්ත් ෂෝර් කැම්පස් හරහා ඔහු ක්‍රියාත්මක කරන්නේ, ඒ දැවැන්ත ජාතික මෙහෙවරයි.

මේ කතාබහ පෙළ ගැසෙනුයේ , අධ්‍යාපනයට ලැදි සෑම සිසුවකුටම නෝර්ත් ෂෝර් කැම්පස් වෙතින් උදාකරගත හැකි අලුත් ජීවිතය පිළිබඳවයි.

### ● නෝර්ත් ෂෝර් කැම්පස්, කවුරුන් සඳහාද...

අධ්‍යාපනයට ලැදි ඕනෑම කෙනෙක් වෙනුවෙන්. ඇත්තටම මෙහි මූලික පරමාර්ථය, රජයේ විශ්වවිද්‍යාලයකට යන්නට නොහැකි වූ සාමාන්‍ය පවුල්වල දරුවන්ට විශ්වවිද්‍යාල වරම් උදා කර දීමයි.

### ● මොනවද මෙහි හැදෑරිය හැකි උපාධි පාඨමාලා...

මෙහි පිරිනැමෙන්නේ ලොව පිළිගත් බ්‍රිතාන්‍ය උපාධි පාඨමාලා. ඊට අදාළ සියලු විෂය නිර්දේශ ක්‍රියාත්මක වන්නේත්, ප්‍රශ්න පත්‍ර හදන්නේත්, විභාග අධීක්ෂණය කරන්නේත් බ්‍රිතාන්‍යයෙන්.ඒ අනුව, බ්‍රිතාන්‍ය විශ්වවිද්‍යාලවලින් පිරිනැමෙන ඉංජිනේරු...සෞඛ්‍ය... කළමනාකර... අධ්‍යාපනික... පරිගණක... සහ තොරතුරු තාක්ෂණය පිළිබඳ ජාත්‍යන්තර උපාධි පාඨමාලා මෙහිදී හැදෑරිය හැකියි. ඒ වගේම, සංචාරක ක්ෂේත්‍රයට අදාළ wellness පාඨමාලාවත් ක්ෂේත්‍රයේ අවශ්‍යතාව හඳුනාගෙන ම, මා ඉදිරිපත් කළ අලුත් පාඨමාලාවක්.

### ● මේ තරම් දැවැන්ත විශ්ව විද්‍යාලයක් කොළඹ 15 වගේ ජනාකීර්ණ ප්‍රදේශයක ඉදි කළේ ඇයි...


අපේ රටේ පුද්ගලික විශ්වවිද්‍යාල හෝ උසස් අධ්‍යාපන ආයතන බහුතරයක් පිහිටා තිබෙන්නේ, මාලබේ. නව කොටසක් පන්නිපිටියේ. එහෙමත් නැත්නම්, බම්බලපිටියේ හෝ කොල්ලුපිටියේ. නමුත්, උතුරු කොළඹ සිසු දරුවන්ට එහෙම තැනක් නැහැ. දුර පළාත්වලින් එන සිසුන්ට පවා උතුරු කොළඹ කියන්නේ, ප්‍රවාහනය අතින් ඉතාමත් පහසු සංධිස්ථානයක්. ඉතින්, වැඩි සිසුන් පිරිසකට අඩුම ගාස්තු යටතේ අධ්‍යාපන පහසුකම් ලබා ගැනීමේ අරමුණ ඇතිවයි, කොළඹ 15, අක්කර හතරක සුවිසල් භූමිභාගයක 2008 වසරේ මේ දැවැන්ත විශ්වවිද්‍යාලය නිර්මාණය කළේ. 2013 වසරේ පටන් එහි අධ්‍යයන කටයුතු ඇරඹුණා.

### ● මෙහි තිබෙන්නේ, යුරෝපීය පෙනුමක්. චකිතය දනවන ගම්භීර බවක්...

උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ බොහෝ තැන්වල සැරිසරා ඇති මගේ අත්දැකීමේ හැටියට, මේ තමයි ලංකාවේ විශ්වවිද්‍යාල පද්ධතියේ ඇති, අති නවීන පහසුකම් සහිත සරසවිය. මෙහි සෑම ඉදිකිරීමක් ම, යටිතල පහසුකමක් ම, අංගෝපාංග සහ සෑම උපකරණයක්ම පිටරටින් ගෙන් වූ උසස් ම දේ. කොටින්ම ඇණ මුරිච්චි පවා එහෙමයි. අභ්‍යන්තරයත්, බාහිර පෙනුම හා සමානවම අති විශිෂ්ටයි.සිසුන්ට සළසා ඇති මේ සෑම පහසුකමක්ම ඉගෙනුමට සරිලන මානසිකත්වයක් ගොඩ නැඟෙන ආකාරයෙන් නිර්මාණයකොට තිබෙන්නේ, යුරෝපීය විශ්වවිද්‍යාලයක පෙනුම පසුබිම් කරගෙනයි.

අති නවීන විද්‍යාගාර... පුස්තකාල... දේශනශාලා... ක්‍රීඩාගාර.... 750 කට එකවර අසුන් ගත හැකි සුපිරි ශ්‍රවණාගාරය... සිසුන් සහ දෙමවුපියන් විස්මයට පත් කරන ආකාරයේ විශිෂ්ට නිමැවුම්. ඒ වගේම, එක වර වාහන 200ක් නවතා තැබිය හැකි, රථ වාහන අංගනයත් මෙහි තිබෙන විශේෂත්වයක්.

නමුත් බොහෝ සාමාන්‍ය පවුල්වල අය මේ නෝර්ත්ෂෝර් කැම්පස් හි පහසුකම් සහ අඩු ගාස්තු ගැන වැඩි අවබෝධයක් නැහැ.අනික, මෙතැන පෙනුම නිසාම හුඟදෙනෙක් හිතෙනවා, දරන්න බැරි ගාස්තු අය කරනවා කියලා. නමුත් මේ තමයි, වැඩිම පහසුකම් යටතේ අඩුම ගාස්තු ඇති,පුද්ගලික විශ්වවිද්‍යාලය.



මෙහෙ ඉංජිනේරු උපාධිය සම්පූර්ණ කිරීමට වසර තුන ටම යන්නේ, රුපියල් ලක්ෂ පහළොවයි. එය වෙනත් තැන් හා සසඳද්දී, රුපියල් ලක්ෂ 5ක පමණ ඉතිරියක්.

### ● මේ තරම් පහසුකම් ඇති විශ්වවිද්‍යාලයක් කොහොමද, අඩුම ගාස්තු යටතේ උපාධි පිරිනමන්නේ...

මෙය පරිපූර්ණ විශ්වවිද්‍යාලයක්. ඒ සඳහා කළ යුතු සමස්ත ආයෝජනයම සිදුකර අවසන්. ආයෙ මෙතැනට සල්ලි හොයන්න දෙයක් නැහැ.උපයන යමක් ඇත්නම්, එය යළි යළිත් යෙදවෙන්නේ සිසුන් ගේ අධ්‍යාපන කටයුතු පුළුල් කිරීම වෙනුවෙන් පමණයි. අපේ එකම අරමුණ තමයි, විශේෂයෙන් සාමාන්‍ය පවුල්වල දරුවන් වැඩි පිරිසකට උසස් අධ්‍යාපනය ලබා දීම . පසුගිය කොවිඩ් වසංගතය උග්‍ර වූ සමයේ, රට වෙනුවෙන් කැප වූ, සුව විරුවන්ගේ දරුවන්ට පවා, අප එම උසස් අධ්‍යාපන අවස්ථා උදාකර දෙන්න විශේෂ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කළා.

### ● මොනවද ඔබ ඔය කියන, සුව විරුවන්ගේ දරුවන්ට ලබා දෙන විශේෂ වරප්‍රසාද...

එය, covid - 19 ට එරෙහි සටනේ පෙරමුණ ගත් ත්‍රිවිධ හමුදාවන්ට, පොලීසියට සහ රජයේ සෞඛ්‍ය සේවා වෘත්තිකයන්ට උපහාර දක්වමින් ක්‍රියාත්මක කළ වැඩසටහනක්. ඒ අනුව, මෙම සුව විරුවන්ගේ දරුවන්ට 25% ක ගාස්තු අඩු කිරීමක් ලබා දෙන අතර එය, පරිගණක විද්‍යාව...සෞඛ්‍ය... කළමනාකරණය...සහ ඉංජිනේරුවේදය යන උපාධි පාඨමාලාවන් පදනම් කරගෙන ක්‍රියාත්මකයි. ඔබ සුව විරුවෙක් නම්, තවමත් ඔබට අවස්ථාව තිබෙනවා, ඔබේ දරුවාට මේ වටිනා වරප්‍රසාදය උරුම කරදීම වෙනුවෙන් ක්‍රියාත්මක වන්න.

### ● නෝර්ත් ෂෝර්, ආචාර්ය මණ්ඩලය ගැනත් කියන්න...

ඇත්තටම මං වඩාත් අවධානයක් දෙන්නේ, ප්‍රමිතිගත උසස් අධ්‍යාපනය කියන සංකල්පයට, ඒ අනුව, අපෙන් ඉගෙන ගන්නා සිසුවෙක් ආයෙ තවත් තැනක ඉගෙන ගත යුතු නැහැ. ඔවුන් අංගසම්පූර්ණ පුරවැසියන් ලෙසයි, මේ විශ්වවිද්‍යාලයෙන් පිට වන්නේ. ඔවුන්ට අවශ්‍ය ප්‍රායෝගික පුහුණුව... න්‍යායාත්මක දැනුම සහ ආකල්පමය වර්ධනය යන සියලු කාරණා මෙහිදී අප සම්පූර්ණ කරනවා. ඒ සඳහා අපිට සියලු සුදුසුකම්වලින් සපිරි ආචාර්ය මණ්ඩලයක් සිටිනවා. සුදුසුකම් රහිත කිසිවකු ආචාර්යවරු ලෙස නෝර්ත් ෂෝර් වෙත බඳවා ගන්නේ නැහැ.උදාහරණයක් ලෙස, රට වසා දැමුණු පළමු සතියේ පටන් අන්තර්ජාලය හරහා දේශන සහ අධ්‍යයන කටයුතු මෙහෙයවමින් සම්පූර්ණ අධ්‍යයන වාරයේම වැඩ කටයුතු,අතිසාර්ථකව අවසන් කරන්නට,අපේ විශ්ව විද්‍යාලයේ ආචාර්ය මණ්ඩලය සමත් වුණා. අංගසම්පූර්ණ සහ නවීන ඉගෙනුම් කළමනාකරණ පද්ධතියක් (Learning Management System) සහ මනා පුහුණුව ලත් කාර්යශීලී ආචාර්ය මණ්ඩලය නිසා ඉතා ඉක්මනින්, දුර සිට ඉගැන්වීමේ ක්‍රමවේදයන්ට අනුගතව ශිෂ්‍යයන්ට අධ්‍යාපනය ලබාදීමට සහ ඔවුන් සමග ඉතා සාර්ථකව සන්නිවේදනය කරමින් අධ්‍යාපන කටයුතු මෙහෙය වීමට නෝර්ත් ෂෝර් වෙත හැකියාව ලැබුණා.

ඇත්තටම, මෙතැන ඉගැන්වීම් කටයුතු සියල්ල සිදු වන්නේ, නවීන තාක්ෂණය ඇසුරෙන්. ඒ වගේම, සිසුන් ඇතුළත් කර ගැනීමේ සිට ඇගැයීම් දක්වා සියලු අධ්‍යයන කටයුතුවලදී ක්‍රියාත්මක වන්නේ, කඩදාසි රහිත (paperless) සංස්කෘතියක්. මේ සියලු විශේෂාංග නිසා, ඕනෑම දුෂ්කර කාල පරිච්ඡේදයක දී වුවත්, කඩාකප්පල් වීමකින් තොරව, අඛණ්ඩව අධ්‍යයන කටයුතු නිම කරන්නට නෝර්ත් ෂෝර් සිසුන්ට පුළුවන්.

ඒ වගේම, මෙම ඩිජිටල් අධ්‍යාපනික ක්‍රමවේදයන් වෙත යන්නට අපේ ගුරු මණ්ඩලයත් එක හා සමානව දායකත්වය දරනවා.

### ● ඔබ ඔබේ ජීවිතයේ,යන්නට පුළුවන් ඉහළම තැනට ගොස් අවසන්. තවත් මොනවද, ඔබට කරන්නට ඉතිරිව තිබෙන්නේ...

ඇත්ත. ආයෙ දිනන්නට දෙයක් මට නැහැ. මං සියල්ල දිනා අවසන්. දැන් මට ඉතිරිව තිබෙන්නේ, මගේ ආත්මීය සතුට වෙනුවෙන් යමක් කිරීම පමණයි, ඒ තමයි, රටට දැනෙන යමක් කිරීම.

උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයට පිවිසෙන්නට නොහැකිව.., සිය අනාගත වෘත්තීය මඟ නිසි ලෙස තෝරා ගන්නට නොහැකිව..,අතරමං ව සිටින මේ රටේ සාමාන්‍ය පවුල්වල දරු දැරියන් වෙත පුළුවන් තරම් උදව් කිරීමයි, මගේ දැන් එකම අරමුණ. විශ්වවිද්‍යාලය සිහිනය අහිමි වූ අයට විතරක් නෙවෙයි, සෞඛ්‍ය ක්ෂේත්‍රයට ඇල්මක් ඇති, අලුත් විදියට හිතන්න කැමති බොහෝ තරුණ පිරිස් වෙනුවෙන්, මං අලුත් පාඨමාලා හඳුන්වා දෙන්නට කටයුතු කරමින් සිටිනවා.ඒවා බොහොමයක්, ලංකාවේ පුද්ගලික විශ්වවිද්‍යාල අත නොගහන පාඨමාලා.

හේතුව, එවැනි පාඨමාලා සඳහා යන ආයෝජන අතිවිශාලයි. නමුත්, ජාත්‍යන්තරව ඇති ඉල්ලුම සහ පිළිගැනීම ඇති විශාලයි. මෙවැනි පාඨමාලා අපේ රටේත් ක්‍රියාත්මක විය යුතුයි. උදාහරණයක් ලෙස,public health...,cosmetic science..., Forensic හෙවත්, පශ්චාත් මරණ පරීක්ෂණ කටයුතු පිළිබඳ වන පාඨමාලා.., අතිශය මානුෂීය සහ සියුම් කලාවක් වන, එම්බාමින් උපාධිය...අධ්‍යාපනික...තාක්ෂණික... වැනි අලුත් පාඨමාලා ඉදිරියේ දී නෝර්ත් ෂෝර් වෙතින් හඳුන්වා දෙනවා. මේ සඳහා අති නවීන විද්‍යාගාර පහසුකම් අවශ්‍යයයි. අමාරු දෙයක් වුණත් මට ඕනේ එවැනි දේ අතරින් ප්‍රමිතිගත උසස් අධ්‍යාපනයක් සහ ලෝකයේ විශිෂ්ට ඉල්ලුමක් ඇති විරල රැකියා අවස්ථා, අපේ රටේ දරුවන්ට ලබා දෙන්නයි. අනික, ඒ වෙනුවෙන් මේ විශ්වවිද්‍යාලය තුළ ඕනෑම තීන්දු තීරණයක් ගන්නට මට හැකියාව සහ අවස්ථා තිබෙනවා. නෝර්ත් ෂෝර් වෙතින් බිහිවන අනාගත උපාධිධාරීන් ගේ යහපත වෙනුවෙන් මං ඒ දේ කරනවා.





### ● මේ රටේ විශ්වවිද්‍යාල පද්ධතිය තුළ තිබෙන අසීමිත නිදහස මෙතැනත් එලෙසම ද...

ඇත්තටම රජයේ විශ්වවිද්‍යාලවල තිබෙන ඔය කියන අසීමාන්තික නිදහස මෙහෙ නැහැ. හැම සිසුවකුම මෙහි නීති රීති පද්ධතියට යටත් විය යුතුයි. වරින් වර, අපි දෙමවුපියන් කැඳවනවා. සිසුන්ගේ ප්‍රගතිය නිරතුරු අධීක්ෂණය කරනවා. දෙමවුපියන් වෙත ඒ බව, දැනුම් දෙනවා, මේ භූමියට ඇතුළු වූ පසු, එම සිසුවා නෝර්ත් ෂෝර් දරුවෙක්. එහි සංස්කෘතියක් තිබෙනවා. ක්‍රියාත්මක නීති පද්ධතිය, විනය සහ ආචාරධර්ම ඔවුන් සියලු දෙනාටම අදාළයි.මෙහෙ හිතු හිතු දේ කරන්න බැහැ. අයාලේ යන්නත් බැහැ. ඔවුන් කරන සෑම දෙයක්ම උප කුලපතිවරයා ලෙස මට බලපානවා. ඒ නිසා, ඔවුන් සෑම විට ම කළ යුත්තේ යහපත් දේ පමණයි. විනයානුකූල දේ පමණයි. දෙමවුපියන් දුක් මහන්සියෙන් ගෙවන මුදලට උපරිම දේ ලබා දීමයි, අපේ වගකීම. ඒ සඳහා, අපි හැම කෙනෙක්ම වගකීමෙන් බැඳී සිටිනවා.

### ● කොහොමද, ඔබ ඒ ගැන සහතික වන්නේ...

මේ විශ්වවිද්‍යාලයට ඇතුළු වන සෑම දරුවෙක්ම, එතැන් පටන් නෝර්ත් ෂෝර් සම්පතක්. උපාධිය ලබා ගන්නා තෙක් සහ උපාධිය ලබා ගත් පසුවත් එය එසේමයි. මෙතැනින් එළියට යන සෑම සිසුවෙක්ම, කුසලතා... නායකත්ව... කළමනාකරණය... ආචාරධර්ම...සහ ඉංග්‍රීසි... කියන සෑම අංශයක් තුළින් ම පොහොසත් වනවා. අදාළ උපාධිය ඉංජිනේරු වුවත්, ඔහු මේ සෑම අංශයක්ම තුළින්ම ජීවිතය පෝෂණය කරගත යුතුයි. මොකද, ඔහු සමාජයේ දී Multitasking නොවුණ හොත්'... ප්‍රායෝගික මනුෂ්‍යයෙක් නොවුණහොත්... උපාධි කීයක් තිබුණත් වැඩක් නැහැ. අවුරුදු 3 හෝ 4 අවසානයේ මෙතනින් එළියට යන්නේ, රැකියාවට සුදුසු සහ රැකියාවට සූදානම් තරුණයෙක් හෝ තරුණියක්. ඔවුන් ඉංග්‍රීසි දැනුමෙන් පොහොසත්. ආකල්පවලින් පරිපූර්ණයි. කුසලතාවයන් පිළිබඳ විශ්වාසයක් තිබෙනවා. නායකත්වයට සූදානම්. ආචාරධර්ම ඔවුන්ගේ ජීවිතවල පෙළ ගැසී තිබෙනවා. නෝර්ත් ෂෝර් සිසුන් සමාජයේ කැපී පෙනෙන පිරිසක් බවට පත්වන්නේ, මේ ගුණාංග ඔවුන්ගේ ජීවිතයට මේ මුළු කාලය තුළම අප කාවද්දන නිසා. ඔවුන් වැඩිහිටියන් වූ පසු, ඊළඟ පරම්පරාවටත් ඒ ගුණදම් දායාද කළ යුතු බව අපි ඔවුන්ට අවධාරණය කරනවා.

### ● අන්තිමට කියන්න, මොනවද නෝර්ත් ෂෝර් වෙත ඇති අනාගත ඉලක්ක...

ශ්‍රී ලංකාව, දැනුමේ කේන්ද්‍රස්ථානයක් බවට පත් කරමින් යන මේ ගමනේ, ශ්‍රී ලාංකික සිසුන්ට පමණක් අධ්‍යාපනය ලබා දීමේ කොටු වූ අරමුණක අපි නැහැ. අපිට තිබෙන්නේ, ජාත්‍යන්තර සිසුන් ලංකාවට ගෙන්වා ගැනීමේ තරගයක්.ඉහළම ප්‍රමිතියෙන් යුතු බ්‍රිතාන්‍ය උපාධි පාඨමාලා වගේම, දේශීය උපාධි පාඨමාලා, ලෝකය තුළ ප්‍රවර්ධනය කිරීමයි, අපගේ මීළඟ ඉලක්කය. අප දැන් විශ්වවිද්‍යාලයේ නම International Northshore Campus ලෙස භාවිත කරන්නේත් ඒ කාරණය නිසයි.

පිට රටටත් ඒ ගෞරවාන්විත නම ව්‍යාප්තව, ජාත්‍යන්තරයට පවා දැනුම දෙන්න තරම් සෑම අංශයකින්ම පොහොසත්, කොළඹ නගර මධ්‍යයේ පිහිටි, නෝර්ත් ෂෝර් විශ්වවිද්‍යාලයෙන්, අපේ රටේ සිසුන් උපරිම ප්‍රයෝජනය ගන්න කියා අප ඉල්ලා සිටිනවා.

කෝටි ගණන් පිට රටට සල්ලි ගෙවා, විදෙස්ගතව උපාධි ගන්නවට වඩා, තමන්ගේ රටේ ජීවත් වෙමින්, වැඩ කරමින්,ගෞරවාන්විත විශ්වවිද්‍යාලයකින් බ්‍රිතාන්‍ය උපාධියක් ලබාගන්නට දැන් සාමාන්‍ය පවුල්වල දරුවන්ටත් පුළුවන්. එයයි, ඔබ වෙනුවෙන් අපට දෙන්න තිබෙන පණිවුඩය.

ඉනෝකා පෙරේරා බණ්ඩාර.

---

# ශ්‍රී ලංකා රසායන විද්‍යා ආයතනයේ 83 වැනි සභාපතිවරියගේ නිලාරම්භය

ශ්‍රී ලංකා රසායන විද්‍යා ආයතනයේ 83 වැනි සභාපතිවරිය වන, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ, ජීව රසායන විද්‍යා අධ්‍යනාංශයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සාගරිකා ඒකනායක මහත්මියගේ නිලාරම්භය වෙනුවෙන් සංවිධානය කරනු ලැබූ උත්සවය පසුගිය 15 වැනි සෙනසුරාදා දින පැවැත්විණි. 'ගෝල් ෆේස්' හෝටල් පරිශ්‍රයේදී අති උත්කර්ෂවත් ලෙස සංවිධානය වූ මෙම උත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස, ජාතික මූලික අධ්‍යයන ආයතනයේ බාහිර පර්යේෂිකාවක ලෙස කටයුතු කරනු ලබන, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ විශ්‍රාමික ගෞරවාන්විත මහාචාර්ය සවිත්‍රි කුමාර් මහත්මිය සහභාගී විය.

උත්සවයට සපැමිණි සියලුම සම්භාවනීය



මහාචාර්ය ටියුලි ඩී සිල්වා, පහන් දල්වමින්

අමුත්තන් පිළිගනු ලැබුයේ රසායන විද්‍යා ආයතනයේ 82 වැනි සභාපතිවරිය ලෙස කටයුතු කරනු ලැබූ, කැලණිය විශ්වවිද්‍යාලයේ රසායන විද්‍යා අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ප්‍රියානි පරණගම මහත්මිය විසිනි. මහාචාර්ය ජයන්ත වැලිහිඳ මහතා විසින් නව සභාපතිවරයා උත්සව සභාවට හඳුන්වා දුන් අතර, ඇය වෙනුවෙන් චූර්ණිකාවක් ද පැවැත්විය.

උත්සව සභාව ආමන්ත්‍රණය කළ මහාචාර්ය සාගරිකා ඒකනායක මහත්මිය ශ්‍රී ලංකා රසායන විද්‍යා ආයතනයේ අභිවෘද්ධිය වෙනුවෙන් තම ඉදිරි දැක්ම ඉදිරිපත් කළාය. රසායන විද්‍යාලයේ අධ්‍යයන මණ්ඩල සාමාජිකයන්ගේ ඉදිරිපත් කිරීම් කිහිපයකින් වර්ණවත් වූ මෙම උත්සවය, රාත්‍රී භෝජන සංග්‍රහයකින් අවසන් විය. රසායන විද්‍යා ආයතනයේ අභිනව සභාපතිවරිය ලෙස පත්වූ මහාචාර්ය සගරිකා ඒකනායක මහත්මියට අපගේ උණුසුම් සුබ පැතුම් !

යසිරු වින්දුල අල්විස්



මහාචාර්ය සාගරිකා ඒකනායක, රසායන විද්‍යා ආයතනයේ නව සභාපතිනිය ලෙස පත් වීමෙන් අනතුරුව මහාචාර්ය ප්‍රියානි පරණගම සමග

බිස්නස් නිවුස්

# වැලිබල් ෆිනෑන්ස් රුපියල් බිලියන 9.6ක වාර්තාගත ආදායමක් උපයයි

**විවිධ අභියෝග මධ්‍යයේ ලබාගත් අඛණ්ඩ වර්ධනයක්**
**වැලිබල් ෆිනෑන්ස් රුපියල් බිලියන 2.4 ක පෙර බදු ලාභයක්**
**බිලියන 51 ක වත්කම් ප්‍රමාණයක් හා බිලියන 9.6 ක ආදායම් වර්ධනයක්**

වර්තමාන මූල්‍ය වෙළෙඳපොළ තුළ ඇති අවිනිශ්චිත වාතාවරණය මධ්‍යයේ වුවද, මෙම මූල්‍ය වර්ෂයේ මාර්තු අවසානයේදී රුපියල් බිලියන 9.7 ක ආදායමක් ලබන්නට වැලිබල් ෆිනෑන්ස් සමත් වූයේ පසුගිය මූල්‍ය වර්ෂයේ පැවති රුපියල් බිලියන 8.7 අගය ඉක්මවා යමින්ය. පසුගිය වසරේ සිදුවූ පාස්කු ප්‍රහාරය මෙන්ම වර්තමානයෙහි පැතිර පවත්නා කොවිඩ්-19 වසංගත තත්ත්වය හමුවේ රටෙහි සමාජ-ආර්ථිකය තුළ යම් අභියෝගයක් ඇති වකවානුවකදී පවා මෙලෙස 11.12% ක වර්ධනයක් ලබන්නට සමත්වීම, ආයතනයෙහි දූරදර්ශී මෙහෙයුම් ක්‍රියාදාමය හා ජනතා විශ්වාසය මනා ලෙස පිළිබිඹු කරන සාධකයකි. මෙවැනි අභියෝගාත්මක කාලසීමාවක් තුළ දී වුවද සමාගමෙහි අක්‍රිය ණය අනුපාතය 5% ට වඩා පහළ අගයක් වීම, ඉහළ කළමනාකාරීත්වය තුළින් ලද ප්‍රතිඵලයක් සේ දැක්විය හැකිය.

රුපියල් බිලියන 38.9 ක්ව පැවති ණය ධාරිතාවය අදාළ කාලසීමාව තුළදී රුපියල් බිලියන 41.1 දක්වා, 5.4% ඉපැයීමක් ලෙස ඉහළ ගොස් ඇත. එමෙන්ම පසුගිය මූල්‍ය වර්ෂයේ රුපියල් බිලියන 3.3 ක වූ ශුද්ධ ණය පොලී ආදායම 20.64% ක කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් කරමින් රුපියල් බිලියන 4 දක්වා වර්ධනය වී ඇත.



**ධම්මික පෙරේරා**
**සභාපති**



**ජයන්ත රන්ගමුව**
**කළමනාකාර අධ්‍යක්ෂක**

තම මෙහෙයුම් ක්‍රියාදාමයෙහි සවිමත්භාවය යළිත් වතාවක් තහවුරු කරමින් ශ්‍රී ලංකාවේ වඩාත් කැපී පෙනෙන මූල්‍ය සමාගම් අතර කීර්ති නාමයක් ගොඩනගාගන්නට සමත්ව සිටින වැලිබල් ෆිනෑන්ස්, අභියෝගාත්මක කාලසීමාවන් තුළදී වුවද වත්කම් හා වගකීම් මනා ලෙස කළමනාකරණය කිරීම සඳහා සමාගමෙහි ඇති මෙහෙයුම් ශක්තිය සනාථ කරමින් අදාළ මූල්‍ය වසර තුළ රුපියල් බිලියන 2.4 ක පෙර බදු ලාභයක් ලබන්නට සමත්ව ඇත. එය පසුගිය වසරේ පැවති රුපියල් බිලියන 2.2 ට වඩා 6.93% ක වර්ධනයක් ලැබූ කැපී පෙනෙන සන්ධිස්ථානයකි.

මහජන විශ්වාසයෙහි මිනුම් දණ්ඩ වන තැන්පතු ශේෂය මෙම කාලසීමාවෙහිදී රුපියල් බිලියන 29 ක් වූ අතර, එය පෙර වකවානුවට වඩා 14.97% ක වර්ධනයකි. "ඉතා අභියෝගාත්මක මෙන්ම අවිනිශ්චිත කාල සීමාවන් තුළ පවා ගුණාත්මක බව හා ප්‍රමාණාත්මක බව යන අංශ දෙකෙහිම සාර්ථක වර්ධනයක් පෙන්නුම් කරන්නට අපට හැකිවී තිබෙනවා. මෙය අපගේ දක්ෂ කාර්ය මණ්ඩලයේ මනා හැකියාව, විනිවිදභාවය, ප්‍රබල වැලිබල් සමූහයේ ශක්තිය මෙන්ම අපගේ උකස් කාර්යසාධනය උපාය මාර්ග තුළින් ලැබූ ජයග්‍රහණයක්" බව කළමනාකාර අධ්‍යක්ෂ, ජයන්ත රන්ගමුව මහතා පැවසීය.

"අප පසුකරමින් සිටින්නේ අපේ රටේ පමණක් නොව මුළු ලෝකයේම ආර්ථිකයෙහි පසුබෑමක් ඇති අවධියක්. එහෙත් අප සියලු දෙනාම එයින් පසුබට නොවී සුපුරුදු මාවතට පිවිසීම හැකි ඉක්මණින් කළ යුතු දෙයක්. වැලිබල් ෆිනෑන්ස් හි දක්ෂ කළමනාකරණය නිසා සාර්ථකව ඉදිරියටම ගමන් කරන්නට හැකිවී තිබෙනවා. ඒ නිසාම තම ස්ථාවරය ඒ ආකාරයෙන්ම පවත්වා ගනිමින් රට පුරා සිටින ගනුදෙනුකරුවන් වෙනුවෙන් තම සේවාවන් විනිවිදභාවයෙන් යුතුව මනා සේ ඉටුකරමින් සිටිනවා. ප්‍රබල වැලිබල් සමූහයෙහි පෙර ගමන්කරුවා වන වැලිබල් ෆිනෑන්ස් මෙලෙස අඛණ්ඩව සාර්ථකත්වයේ ඉහළට ගමන් කිරීම අපට නිහතමානී ආඩම්බරයක්" යනුවෙන් සභාපති, ප්‍රකට ආයෝජක ධම්මික පෙරේරා මහතා තම අදහස් දැක්වීය.

ශ්‍රී ලංකාවේ විශිෂ්ටතම මූල්‍ය සන්නාමය 2020 සම්මානයෙන් පිදුම් ලැබූ වැලිබල් ෆිනෑන්ස්, තවද සන්නාම වර්ගීකරණ ශ්‍රේණිගත කිරීම (Brand Rating), 2019 වසරේදී A+ දක්වා ඉහළ නැංවීය. සාපේක්ෂව කෙටි කාලයක් තුළදී ශක්තිමත් හා ගෞරවණීය නාමයක් ලෙස එහි කීර්තිය පුළුල් ලෙස වර්ධනය කරගන්නට සමාගම සමත්ව සිටී.

## සෞඛ්‍ය මාර්ගෝපදේශ පිළිපදිමින් HNBA තම කාර්ය මණ්ඩලය අගයයි

HNB ඇෂුවරන්ස් PLC (HNBA) සහ එහි පූර්ණ අනුබද්ධිත HNB ජෙනරල් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් (HNBGI) එහි 2020 සභාපති සහ දීර්ඝ කාලීන සේවා ඇගයීම් සම්මාන උළෙල පසුගියදා කොළඹ ටජ් සමුද්‍රාහි පැවැත්වූවේය. කාර්ය මණ්ඩලයේ විශිෂ්ටත්වය සැමරීම සඳහා පවත්වන ලද මෙම උත්සවය සියලුම සෞඛ්‍ය හා ආරක්ෂිත මාර්ගෝපදේශයන්ට අනුකූලව සහ සීමිත අමුත්තන් පිරිසකගේ සහභාගිත්වයෙන් යුතුව පැවැත්විත. සභාපති සම්මානලාභීන් 12 දෙනෙකු සහ දීර්ඝ කාලීන සේවා සම්මානලාභීන් 08 දෙනෙකු හට සම්මාන ප්‍රදානය සඳහා මෙම විශේෂ අවස්ථාවට HNBA සහ HNBGI හි ජ්‍යෙෂ්ඨ කළමනාකරණයේ සාමාජිකයින් සහ අනෙකුත් සම්භාවනීය අමුත්තන් සහභාගි විය.

මෙම අවස්ථාව පිළිබඳව අදහස් දක්වමින් HNBA සහ HNBGI හි ප්‍රධාන විධායක නිලධාරී ප්‍රසන්න ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කළේ, "සෞඛ්‍ය හා ආර්ථිකය යන දෙඅංශයේම අවිනිශ්චිතතා ඉහළ කාල වකවානුවක් මධ්‍යයේ වුවත්, HNBA සමූහය රක්ෂණ ක්ෂේත්‍රයේ විශිෂ්ටත්වය කරා යන ගමනේ අපගේ සියලුම පාර්ශ්වකරුවන් හට ඉහළ වටිනාකමක් නිර්මාණය කිරීම සහ සේවක යහපැවැත්ම යන ව්‍යාපාරික ප්‍රමුඛතා විශ්වාසදායක ලෙස ඉටු කිරීමට සැම විටම කටයුතු කර ඇත. මෙවැනි කාලයක අපගේ කාර්ය මණ්ඩලයේ ජයග්‍රහණ, නොසැලෙන වීර්ය හා කුසලතා සැමරීම අභියෝගාත්මක වුවත්, සමූහයේ සාර්ථක්වය සඳහා මූලික වන අපගේ වටිනා සේවාදායකයින්ගේ අතිමහත් කැපවීම සහ ප්‍රශංසනීය උත්සාහයන් අගය කිරීමට අපි එක්ව කටයුතු කරමු. තම කාර්ය මණ්ඩලය උදෙසා, සමූහයේ කැපවීම, මෑත කාලයේදී ලත් හොඳම සේවා ස්ථානය (Great Place to Work) ඇගයීම් සහතිකය සාක්ෂි දරයි. තවද, අපගේ කාර්ය මණ්ඩල සාමාජිකයින් සතු කුසලතා වර්ධනය කර ගැනීමට සැම විටම මග පෙන්වීමටත් සහය දැක්වීමටත් අප නිරන්තරයෙන් උනන්දු වෙමු. එය ඔවුන්ගේ පුද්ගලික වෘත්තීය සංවර්ධනය මෙන්ම අපගේ ව්‍යාපාර දියුණුව සඳහා බෙහෙවින් වැදගත් වී ඇත. එබැවින්, සියලුම ජයග්‍රාහකයින් උදෙසා මාගේ හෘදයාංගම සුබ පැතුම් පිරිනමන අතර ඔවුන්ගේ ඉදිරි කටයුතු සඳහා ද සුබ පතමි".

සිය අදහස් බෙදා ගනිමින් HNBA සහ HNBGI හි ප්‍රධාන මානව සම්පත් නිලධාරී දිනුක පැටිකිරිආරච්චි මහතා මෙසේ පැවසීය. "සුවිශේෂී සේවකයෙකුගේ වටිනාකම හඳුනා ගැනීම සහ අගය කිරීමේදී, සමාගමක සමස්ත කාර්යසාධන ප්‍රමිතීන් මත හෝ අදාළ වර්ෂයේ ආර්ථික පසුබිම මත තීරණය නොකළ යුතුය. COVID-19 වසංගතය සෑම ව්‍යාපාර ක්ෂේත්‍රයන් සඳහා අභියෝගාත්මක බලපෑමක් ගෙන ආ අතර, වසංගතයට පෙර අත්දුටු වර්ධන අනුපාත කරා ළඟාවීම සඳහා සෑම ව්‍යාපාරයක් වෙර දරති. එසේ වුවද, සේවය කිරීම සඳහා හොඳම රැකියා ස්ථානයක් ගොඩ නැගීමට ඇති අපගේ කැපවීම තුළ සේවාදායකයින් ඇගයීමට සැම විටම ප්‍රමුඛස්ථානයක් හිමිවනු ඇත".

## RDB වෙතින් 'පුනර්ජීවන ණය යෝජනා ක්‍රමය'




මෑත ඉතිහාසයේ ශ්‍රී ලාංකේය ජනතාව විවිධ ආපදාවලට මුහුණ දුන් යුගයක් විය. ලෝකයම මුහුණ දුන් කොවිඩ් වසංගතය පමණක් නොව රටේ ආර්ථිකයේ බොහෝ අංශ නවතා දමමින් 2019 වසරේ පාස්කු දින මුහුණ දුන් ත්‍රස්තවාදී ප්‍රහාරයත්, වසර ගණනාවක් අත්විඳි නියඟය, ගංවතුර වැනි ස්වභාවික ආපදා තත්ත්වයනුත් හේතුවෙන් ජනතාවගේ ආර්ථික ක්‍රියාකාරකම් අඩපණ විය. දේශීය ව්‍යවසායකයින් පමණක් නොව ගොවි ජනතාව, කෘෂිකාර්මික, නිෂ්පාදන හා සේවා කර්මාන්තයේ සේවා නියුක්තිකයින් ද එයින් පීඩාවට පත්විය. ඒ නිසාම, ව්‍යාපාරික හා වෙනත් අවශ්‍යතා සඳහා බැංකුවලින් මූල්‍ය පහසුකම් ලබා ගත් බොහෝ ගනුදෙනුකරුවන් ණය ආපසු ගෙවීමේ අපහසුතාවට පත්විය. වසර 35 ක අභිමානවත් ඉතිහාසයකට ප්‍රාදේශීය සංවර්ධන බැංකුව (RDB බැංකුව) උරුමකම් කියන්නේ එදා සිට අද දක්වා ජනතාවගේ දුක් කම්කටොළු බෙදා හදා ගත් බැංකුවක් ලෙසය. තම ගනුදෙනුකරුවන් සමග ඉතා සමීප සබඳතාවක් පවත්වා ගෙන යන RDB බැංකුව ඉතිහාසයේ බොහෝ අවස්ථාවලදී තම ගනුදෙනුකරුවන් වෙත නොමසුරු සහාය ලබා දී ඇති බැංකුවකි.

එබැවින්, වර්තමාන සමාජ ආර්ථික තත්ත්වය තුළ බැංකු ගනුදෙනුකරුවන්ට සහන සැලසීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් හඳුන්වා දුන් සහන වැඩසටහන් ක්‍රියාත්මක කරන අතරම ඉන් ඔබ්බට තවදුරටත් ගනුදෙනුකරුවන් වෙත අවශ්‍ය සහාය මෙම දුෂ්කර සමයේ ලබාදෙමින් ඔවුන්ට ශක්තියක් වීම සඳහා නව මූල්‍ය පහසුකම් සැලසීමේ වැඩසටහනක් "RDB පුනර්ජීවන" නමින් RDB බැංකුව විසින් දියත් කිරීමට කටයුතු කර ඇත.

එම ණය වැඩසටහන යටතේ තම ගනුදෙනුකරුවන් හා ඔවුන්ගේ ව්‍යාපාර මුහුණ දී ඇති ව්‍යාපෘති බිඳවැටීම්, කාරක ප්‍රාග්ධන ඌණතා, සේවක වැටුප් ගෙවීමේ ගැටලු, නැවතුණු ව්‍යාපාර නැවත ආරම්භ කිරීමට මූල්‍ය පහසුකම් නොමැතිවීම, වෙනත් ව්‍යාපාරයකට මාරුවීමට මූල්‍ය පහසුකම් නොමැතිවීම වැනි ගැටලුවලට පිළියම් පමණක් නොව ලබා ගෙන ඇති ණය ගෙවීම් ප්‍රමාදවීම් සඳහාද සහන ලබාදීමට කටයුතු යොදා ඇත.

එසේම, පසුගිය කාලයේ ආර්ථිකය තුළ පැවති ඉහළ පොලී අනුපාත යටතේ මූල්‍ය පහසුකම් ලබා ගත් ගනුදෙනුකරුවන් වර්තමානයේ අඩු පොලී අනුපාත සහිත ආර්ථිකයක් තුළ මුහුණ දෙන පොලී පිරිවැය පීඩනය හා එමගින් ඇතිවන ණය සේවා කිරීමේ අපහසුතාවට පිළියම් ලෙස විවිධ සහන ලබාදීම ද මෙම වැඩසටහන මගින් සිදු කෙරෙනු ඇත. අවම පොලී අනුපාතයක් ලබාදීම, ව්‍යාපෘතියේ ආදායම් උත්පාදනය සතුටුදායක වන තෙක් සහන කාලයක් ලබාදීම, ණය ගෙවීමේ කාලය දීර්ඝ කිරීම හා ව්‍යාපෘතිය යථාවත් කිරීමට අවශ්‍ය අමතර මූල්‍ය අවශ්‍යතා ලබාදීම වැනි විවිධ සහන එමගින් භුක්ති විඳීමට ගැටලුවලට මුහුණ දුන් ගනුදෙනුකරුවන්ට හැකියාව ලැබෙනු ඇත.

## ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් වෙතින් රු.බි.8.2ක දැවැන්ත බෝනස් දීමනාවක්

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් පියගෙ මෙන් මිවන මෙන්

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් මෙරට රක්ෂණ ඉතිහාසයේ දැවැන්තම බෝනස් දීමනාව වන රු. බිලියන 8.2 ක ජීවිත රක්ෂණ බෝනස් දීමනාව සිය ජීවිත රක්ෂණ සැලසුම් හිමියන් වෙත ප්‍රදානය කරන අතර, 2005 වසරේ සිට මේ දක්වා රුපියල් බිලියන 64.6 ක මුදලක් බෝනස් දීමනාව ලෙස ප්‍රදානය කොට තිබේ.

මෙම බෝනස් දීමනාව ප්‍රකාශයට පත් කිරීමත් සමගින් ජීවිත රක්ෂණ වෙළඳපොළ තුළ වැඩිම ප්‍රතිලාභ ලබාදෙන ජීවිත රක්ෂණය ලෙස ඔප්පු හිමියන් විසින් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් වෙත තබා ඇති විශ්වාසය නැවත තහවුරු වී තිබේ.

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් සතු ක්‍රමවත් ආයෝජන කළමනාකරණ උපායමාර්ග හා රු. බිලියන 116 වන රක්ෂණ ක්ෂේත්‍රයේ දැවැන්ත ජීවිත රක්ෂණ අරමුදල සිය ජීවිත රක්ෂණ සැලසුම් හිමියන්ට ඉහළ ප්‍රතිලාභ ලබාදීම සඳහා හේතුවී ඇති අතර, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් මේ වන විට රු. බිලියන 211 ක් වන රක්ෂණ ක්ෂේත්‍රයේ අසමසම වත්කම් සම්භාරයකටද හිමිකම් කියයි.

සමාගම ආරම්භයේ සිට ජීවිත රක්ෂණයක් ලබාගැනීමේ වැදගත්කම ශ්‍රී ලාංකීය ජනතාවට අවබෝධ කරදීම සිය අරමුණු අතර ප්‍රමුඛ ස්ථානයක ලා සලකන ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් මේ වන විටද ශ්‍රී ලංකාවේ සෑම ප්‍රදේශයකටම ජීවිත රක්ෂණයේ පණිවුඩය රැගෙන යන මෙහෙවරේ පෙරගමන්කරු ලෙස ක්‍රියා කරයි.

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් පරම්පරා ගණනක් මුළුල්ලේ දිනාගත් ජනතා විශ්වාසය තහවුරු කිරීමට සමාගම විසින් ළඟාකරගෙන තිබෙන ගෞරව සම්මාන සාක්ෂි දරන අතර 2020 වසරේද බ්‍රෑන්ඩ් ෆිනෑන්ස් මගින් වසරේ "වඩාත්ම ජනාදරයට පත් රක්ෂණ සන්නාමය" ලෙසත් වසරේ "වඩාත්ම ජනාදරයට පත් පාරිභෝගික සන්නාම" අතර තෙවන ස්ථානය ලෙසිනුත් ගෞරවයට පාත්‍ර වීම මෑතකදී ලබාගත් ඉහළම ජනතා සම්මානය ලෙස දැක්විය හැකිය.

මෙම සුවිශේෂී ඇගයීම හා ජයග්‍රහණ අතරට සිය දිගුකාලීන මූල්‍ය ස්ථාවරත්වය වෙනුවෙන් ෆිච් ශ්‍රේණිගත කිරීම්වල AAA(lka) ශ්‍රේණිගත කිරීම ලබාගනිමින් අඛණ්ඩව දෙවන වරටත් එම ශ්‍රේණිගත කිරීම තහවුරු කරගත් ශ්‍රී ලංකාවේ එකම රක්ෂණ ආයතනය බවට පත්වීමට ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් සමත්ව තිබේ.

පාරිභෝගිකයා කේන්ද්‍රකරගත් රක්ෂණ ආයතනයක් ලෙසින් නව රක්ෂණ සැලසුම් හා සේවාවන් පාරිභෝගිකයාට ඉදිරිපත් කරමින් සිය මෙහෙයුම් ක්‍රියාවලියේ ඵලදායීතාව වැඩිකරගැනීම සඳහා ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් තවදුරටත් කැපවන අතරම 158 ක් වන සිය ශාඛා ජාලය තවදුරටත් පුළුල් කරමින් විශිෂ්ට පාරිභෝගික සේවාවක් සැපයීමට සූදානමින් සිටී.

## ශ්‍රවණ උපකරණ තාක්ෂණය කෙතරම් වැදගත් ද?

මදක් සිතන්න, ආදරණීයන්ගේ කටහඬ නෑසී ගිය හොත් ජීවිතයේ කෙතරම් සොඳුරු අවස්ථා ඔබට මග හැරී යා හැකි ද ? ඔබ නොදැක ඔබ වෙත එන වාහනයක හඬ ඔබට නැසුණහොත් ඔබගේ ජීවිතය කොතරම් අවදානමකට ලක් විය හැකි ද? අප එතරම් අවධානය නොදෙන කන මෙන්ම, ඉන් ඇසෙන ශබ්දවලට ඔබේ ජීවිතයේ ගුණාත්මක භාවය කොතරම් දුරට තීරණය කළ හැකි බව ඔබ දන්නවාද?

ඇසීමේ අපහසුතාවලින් අත් මිදීමට අප "ශ්‍රවණ උපකරණ" භාවිතා කරනු ලැබේ. ශ්‍රවණ උපකරණයක් මගින් මූලිකව සිදු කරන්නේ අපගේ කනට නෑසෙන මට්ටමේ ඇති ශබ්දයන් වර්ධනය කර, කන වෙත ලබා දීමයි. අනෙකුත් උපකරණවල මෙන්ම තාක්ෂණයේ දියුණුවත් සමග ශ්‍රවණ උපකරණවල ද ඉතා සිත් ගන්නා සුළු දියුණුවක් සිදු වී ඇත. උදාහරණයක් ලෙස, කාලයත් සමග දුරකථනයේ සිදුවුණු තාක්ෂණික අංශවල දියුණුව හා සංසන්දනය කළ විට, ඒ හා සමාන දියුණුවක් ශ්‍රවණ උපකරණවල ද සිදු වී ඇත.

කාලයත් සමග මෙම උපකරණවල සිදුවන තාක්ෂණික දියුණුව මගින්, එය භාවිතා කරන පුද්ගලයන් හට ලබා දෙන පහසුකම් ජීවිතය තව තවත් පහසු කරමින් ජීවිතයේ ගුණාත්මක භාවය (Quality of Life) වැඩි කරවන ලෙස සිදු කර ඇත.

එයට කදිම උදාහරණයක් නම්,දැනට වසර පහකට පමණ පෙර තිබූ තාක්ෂණයේ ප්‍රමුඛ පෙළ ගත් ශ්‍රවණ උපකරණ, අද වන විට මූලික පහසුකම් සහිත ප්‍රාථමික උපකරණ ලෙසට පත් වී තිබීමයි. ඒ වෙනුවට සිත්ගන්නා සුළු හුරුබුහුටි නවීන පහසුකම් සහිත ඩිජිටල් තාක්ෂණික ශ්‍රවණ උපකරණ ඉදිරියට පැමිණ ඇත.

නවීන ශ්‍රවණ උපකරණවල පහසුකම් කිහිපයක් ලෙස, පෙර පැවති විශාල ශ්‍රවණ උපකරණවලට වඩා ඉතා කුඩා ප්‍රමාණ වලින්, වඩා දියුණු ලෙස ඝෝෂාව අවම කළ හැකි, දුරස්ථ පාලක හැකියාවන් සහිත, අන්තර්ජාලය ඔස්සේ සුසර කළ හැකි,දෛනික සෞඛ්‍ය මිනුම් වැනි විවිධ පහසුකම් සහිත වීම පෙන්වා දිය හැකිය. වෙනදාට වඩා ශ්‍රවණයේ ඇති සුපැහැදිලි බව හා විවිධ වටපිටාවන්වලදී පහසුවෙන් භාවිත කිරීමේ හැකියාව මෙම නවීන ශ්‍රවණ උපකරණ වලින් සැලසෙන වාසිදායක තත්ත්වයන් වේ.

එනිසා, තාක්ෂණය සමග යල් පනිමින් පවතින පැරණි ශ්‍රවණ උපකරණවලට වඩා ඔබ කරන ආයෝජනයේ උපරිම ප්‍රතිඵල ලබා ගැනීමට, ඔබ තෝරා ගන්නා ශ්‍රවණ උපකරණයේ ඇති පහසුකම් පිළිබඳ සැලකිලිමත් විය යුතුමය. එය හොඳ ආයෝජනයක් වන්නේ ඔබේ ආදරණීයයන් ගේ සන්නිවේදනයේ ගුණාත්මක බව ඔබේ තේරීම මත රඳා පවතින බැවිනි.

"ඇබකසය" සොයා ගත් දා සිට තාක්ෂණය සිදුවූ දියුණුව නිසා "Desktop පරිගණකය" සොයාගත් මිනිසුන්, එතැනින් නොනැවතී, තවදුරටත් භාවිතය පහසු "Laptop පරිගණකයේ" සොයා ගත් නිසා එහි ඇති පහසු බව ඔබත් මමත් අද අත් විඳිමු. එසේම, පැරණි ශ්‍රවණ උපකරණ වෙනුවට දියුණු තාක්ෂණයන්ගෙන් වැඩිදියුණු වූ සුපැහැදිලි නවීන ඩිජිටල් තාක්ෂණික ශ්‍රවණ උපකරණවල පහසුව ඔබේ ආදරණීයයන් හට අත් විඳීමට ඉඩ ලබා දීමට මෙය සුදුසුම කාලය යි. ශ්‍රවණ උපකරණය සඳහා ඔබ කරනු ලබන ආයෝජනය හැකි සෑම විටම නවීන තාක්ෂණික උපකරණයක් තෝරා ගැනීම පිණිස සිදු කිරීමට සැලකිලිමත් වන්න. එය ඔබ කරනු ලබන ආයෝජන වඩා ඵලදායී කරවනු නියතයි.

## ශ්‍රවණාබාධයෙන් පීඩා විඳින ඔබට අපෙන් ආදරණීය අත්වැලක්...



VISION CARE OPTICAL SERVICES

විශ්ව නිර්මාණය තුළ පුද්ගලයන් වශයෙන් අප සෑම පුද්ගලයකු තුළම කුමක් හෝ අඩුපාඩුවක් ඇත. අප සැවොම අංග සම්පූර්ණ පුද්ගලයන් නොවෙනු ඇත. ඒ අතරින් ප්‍රධානතම ගැටලුව වූ අක්ෂි සහ ශ්‍රවණාබාධ සහිතව පීඩාවිඳින වැඩිහිටි කුඩා ඔබ සැමට ආදරණීය අත්වැලක් සැපයීම උදෙසා විෂන්

කෙයා අපි ඔබ සමග නිරතුරුවම සමීපයෙන් සිටිමු. අපගේ ප්‍රධානතම සේවාවක් ලෙස ඔබට ලබාදුන් අක්ෂි සේවාවට අමතරව දැන් ශ්‍රවණ ආබාධයන්ගෙන් පීඩාවිඳින්නන් සඳහාද සුහදශීලි සේවාවක් රැගෙන ඒමට අපි සූදානම්ව සිටිමු. ශ්‍රවණාබාධ සම්බන්ධයෙන් අවුරුදු 10ක් පුරාවට අඛණ්ඩ සේවාවක් සපයා ඇති අප ඉදිරියේදී ද මෙම අපහසුතාවලින් මිදී පවුල සහ සමාජය සමග කිසිදු අපහසුතාවයකින් තොරව වැඩකටයුතු කිරීමට අවශ්‍ය අඛණ්ඩ සහයෝගය අපි ඔබට ලබාදෙමු.

ඒ සඳහා අපේ සේවාවන් ලබා ගැනීමට දැන් ඔබ කොළඹටම පැමිණිය යුතු නැත. ඔබේ පහසුව උදෙසා ලංකාවේ සියලුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි සකස් වී ඇති අපේ ශාඛාවන් තුළින් දැන් ඔබට ඔබේ ගමේ නගරයේ ඇති ශාඛාවෙන්ම ඒ සඳහා කාලය වෙන්කර ගත හැක. එපමණක් නොව ඔබේ ගැටලු උදෙසා ඔබට ඔබව පරීක්ෂා කිරීමට ඒ සම්බන්ධයෙන් මනා පළපුරුද්දකින් යුතු විශේෂඥ හොඳ ශ්‍රවණවේදී මණ්ඩලයක්ද අප සතුව ඇති බව දන්වන්නේ හොඳම නිවැරදිම දේ ඔබ අතට පත්කිරීම සඳහායි. නිවසේදී පමණක් නොව ඔබ සමාජයේදීද මේ නිසාම ඔබ මානසික අපහසුතාවයට පත්වන්නට ඇතිබව නොඅනුමානයි. නමුත් ඔබ එසේ සිතමින්, තමන් ගැන තිබෙන ආත්ම විශ්වාසය පලුදු කරගත යුතු නැත. ඒ සෑම අපහසුතාවයක්ම සමගින් උදවු කිරීමට සෑම මොහොතකම අප කැපවී සිටිමු.

විශේෂයෙන් පසුගිය දිනවල ඇඳිරිනීති සමය තුළ ඔබට දුෂ්කරතා රාශියකට මුහුණපෑමට සිදුවන්නට ඇත.

මෙවැනි අවශ්‍යම කාලයක ඔබට මෙම සේවාව ලබා ගැනීමට නොහැකිව අසරණවන්නට සිදුවූවාද? ශ්‍රවණ උපකරණ සඳහා බැටරි මිලදී ගැනීමට, අමතර කොටස් මිලදී ගැනීමට එහි උපදේශන සේවාවක් ලබා ගැනීමට නොමැතිවීම, මෙම දිනවල නිවස තුළටම වී සිටින ඔබට ඇති වූ මානසික මට්ටම දෙගුණ තෙගුණ කිරීමට සමත්වූවාට සැක නැත. මෙසේ පීඩාවිඳින්නේ ඔබේ මව, පියා, හෝ පවුලේ වෙනත් ආදරණීයකු විය හැක. කිසිම විටක ඔවුන් එම අපහසුතාවය නිසා සමාජයේ පවුලේ කොන්වීමකට ලක්වනබව දැනෙන තනිකම ඔවුනට කිසිසේත්ම දැනෙන්නට ඉඩ නොතබන්න. මෙම සියලුම අපහසුතාවයන් සඳහා සුහද සේවාවක් සැපයීමට දිවයිනේ ප්‍රමුඛතම ශ්‍රවණ උපකරණ සපයන්නන් වන විෂන් කෙයා ආයතනයේ අප සූදානමින් සිටිමු.

විශේෂයෙන් මෙම කාලය තුළ ඔබට හිතුමතේ ගමන් බිමන් යාමටත් හිතුමතේ කටයුතු කිරීමටත් නොහැකි කාලයක් නිසා ඔබ ඔබේ ශ්‍රවණ උපකරණ පිළිබඳව වෙනදාටත් වඩා සැලකිල්ලක් යොමුකිරීම ඉතා වැදගත් වේ. එහි ප්‍රවේසම පිළිබදව ඔබ අවධානය යොමුකළ යුතු වේ. මොකද මෙම මොහොතේ ඔබට එය වඩාත්ම අත්‍යවශ්‍ය වන බැවින් ඒ සඳහා ඔබ නියමිත පරිදි බැටරි මාරු කළයුතු වේ. ජලයෙන්, බිම වැටීමෙන් පෙරටත් වඩා ආරක්ෂා කර ගත යුතු වේ. එමෙන්ම ශ්‍රවණ උපකරණය භාවිත නොකරන සෑම අවස්ථාවකම බැටරි දෙර ඇර තබා බැටරි ක්ෂය වීම අවම කරගත යුතු වේ. ඔබ ශ්‍රවණ උපකරණ දෙකක් භාවිතා කරන අයකු නම් අවස්ථානුකූලව එක් උපකරණයකට යොමුවීමෙන් එක් බැටරි කාඩ් පතක් වැඩි කාලයක් භාවිතා කළහැකි වේ. මේ ආකාරයට ඔබ මෙම උපකරණය නිසි ආකාරයෙන් ප්‍රවේසමෙන් පරිහරණය කිරීමෙන් වැඩි කාලයක් කිසිදු ගැලුකින් තොරව ඔබට එය භාවිත කළහැකි වනු ඇත.

ඔබගේ නිරෝගී සුවය අපේ එකම පැතුම වන බැවින් මෙම තත්ත්ව වලට අමතරව ද ඔබට ගැටලු පවතින්නේ නම් අපගේ සුහදශීලී කාර්ය මණ්ඩලය අමතා විසඳුම් ලබාගත හැක. අපි ඔබ වෙනුවෙන් අවශ්‍ය සහයෝගය නිරන්තරයෙන් ඔබට ලබාදෙන අතර, ඉදිරියේදී මේ පිළිබඳ නව තවත් ඔබව දැනුවත් කිරීමට බලාපොරොත්තු වෙමු.

## ප්‍රයිම් 36 වැනි Apartment ව්‍යාපෘතිය The Beach Front - I

ශ්‍රී ලාංකීය දේපළ වෙළෙඳම් ක්ෂේත්‍රයේ පුරෝගාමීත්වය උසුලන සම්මානලාභී ප්‍රයිම් සමූහය සිය Apartment ව්‍යාපෘතීන් අතරින් තවත් සුවිශේෂ ව්‍යාපෘතියක සියලු ඉදිකිරීම් නිමකොට පසුගිය 25වැනි දා උත්සවාකාරයෙන් පාරිභෝගිකයන් අතට පත් කළා. වත්තල උස්වැටකෙයියාව නිල් සමුදුරට මුහුණලා මනස්කාන්ත තැනක ඉදිවූ The Beach Front - I උස්වැටකෙයියාව නිදහසේ සුඛෝපභෝගීව කල් ගත කළ හැකි නවීනතම නිවාස 72 කින් සමන්විතයි. ප්‍රයිම් සමූහය සම්පූර්ණයෙන් ඉදිකිරීම් නිමා කළ 36 වන සහාධිපත්‍ය ව්‍යාපෘතිය (Apartment Project) වන The Beach Front සියලු මූලික අනුමැතීන් සහ අනුකූලතා සහතිකය ද ලබා ගත් ව්‍යාපෘතියක් වේ.

මනරම් වෙරළට මායිම්ව මනා ඉඩකඩකින් යුක්ත නිදන කාමර 2 ක් සහිතව ඉදිවූ The Beach Front - I උස්වැටකෙයියාව සයුරු රළෙහි චමත්කාරය නිරායාසයෙන් අත්විඳිය හැකි සුවිශාල සඳළුතලයකින් ද සමන්විතයි. ඉන්දීය සයුරේ නිල් දියවර අබියස පිහිටි සුඛෝපභෝගීත්වය වෙත කොළඹ නගරයේ සිට විනාඩි 30 කින් ළඟාවිය හැකි Beach Front - I උස්වැටකෙයියාව සිත සනසන නිවාඩු නිකේතනයකට සුදුසුම ස්ථානයක්.

ප්‍රයිම් සමූහයට ආවේනික අද්විතීය ගෘහ නිර්මාණ කෞශල්‍යයන්ගෙන් හා ව්‍යුහාත්මක ගුණාංගයන්ගෙන් පරිපූර්ණ The Beach Front I සියලු පාරිභෝගිකයන් හට නවමු අත්දැකීමක් ලබා දීමට සමත් වේ.

ආරක්ෂාව, අලංකාරය මෙන්ම සුවපහසුව ඇතුළු සියලු සේවාවන් සහිතව නවීන ගෘහ නිර්මාණ ක්‍රමවේද හා නවතම ගෘහ අංගෝපාංගයන්ගෙන් යුතු මනා ඉඩකඩක් සහිත තමන්ගේම නිවසක සිට සාගරයේ හා පහසුවෙන් පිවිසිය හැකි වෙරළේ අසිරිය විඳින්නට හැකි අයුරින් The Beach Front - I උස්වැටකෙයියාව නිර්මිතයි. ඉදිකිරීම් කටයුතු නිමකොට ප්‍රයිම් සමූහයේ 25 වන සංවත්සරය සමරන මොහොතේ The Beach Front - I උස්වැටකෙයියාව පාරිභෝගිකයින් අතට පත් කරන්නට ලැබීම අපට කිසිදා අමතක නොවන අත්දැකීමක්. මේ සියලු සාර්ථකත්වයන් සමග The Beach Front - I උස්වැටකෙයියාව දෙවන අදියර ආරම්භ කරන්නේ තවත් අති අනර්ඝ නිර්මාණයක් පාරිභෝගික හවතුන් වෙත ලබා දීමේ අරමුණින් යැයි ප්‍රයිම් සමූහයේ සම සභාපති සඳමිණී පෙරේරා මහත්මිය සඳහන් කළාය.

සමූහයේ ස්ථාවරත්වය හා සාර්ථකත්වයන් මූලික කොට ගෙන දෙවන අදියර දැනටමත් හඳුන්වාදී ඇති අතර, සයුරට මුහුණලා මනා ඉඩ කඩින් යුතු නිදන කාමර 1ක්, 2ක් හා 3ක් සහිතව ද, ඉහළ මාලයේ Penthouse 4 ක් ඇතුළු නිවාස 116 කින් ද මෙය සමන්විතයි.

උස්වැටකෙයියාව මනස්කාන්ත වෙරළ තීරයට මායිම්ව 24 පැය පුරාම ආරක්ෂාව සහිතව, පිවිසුම පාලනය කළ හැකි (Access Controlled) විදුලි සෝපාන ,අමුත්තන් සඳහා වෙන් වූ පරිශ්‍ර, රැස්වීම් සඳහා වෙන්වූ පරිශ්‍ර,ව්‍යායාම් මධ්‍යස්ථාන,යෝගා ව්‍යායාම පරිශ්‍ර, BBQ පහසුකම්, Infinity Pool ආදී විශේෂ සුව පහසුකම් අංග 15 කට වඩා මෙම ව්‍යාපෘතියේ අන්තර්ගතව පවතී. මූලික ඉදිකිරීම් දැනටමත් ආරම්භ කර ඇති The Beach Front-I හඳුන්වාදීමේ විකුණුම් මිල මිලියන 17.5 න් ආරම්භ වූ අතර, මුදල් ගෙවීම සඳහා මාස 24 ක පොලී රහිත කාලයක් පාරිභෝගිකයන් වෙත ලබා දේ. දර්ශනීය සයුරට හා වෙරළ තීරයකට හිමිකම් කියන නිස්කලංක වටපිටාවක් සහිත උස්වැටකෙයියාව, ශීඝ්‍රයෙන් සංවර්ධනය වන යටිතල පහසුකම් සපිරි නගරයන්ට මායිම්වබණ්ඩාරණායක ජාත්‍යන්තර ගුවන් තොටුපළේ සිට විනාඩි 20 කින් ළඟාවිය හැකි, කෙරවලපිටිය හා ජා - ඇල අධිවේගී පිවිසුම් මාර්ගවලට විනාඩි 5 ක් වැනි සුළු කාලයකින් පිවිසිය හැකි, ලංකාවේ ප්‍රධානතම ව්‍යාපාරික නගරය වන කොළඹට හා විනෝදාස්වාදයට සුප්‍රසිද්ධ මීගමුව නගරයටද නුදුරින් ද පිහිටා ඇත.

ජනාකීර්ණ පරිසරයෙන් මිදුණු නිදහස් සුවපහසුව කරා ඉතා ඉක්මණින් ළඟා විය හැකි ගමනාන්තයක් වන උස්වැටකෙයියාව, ස්වභාව සෞන්දර්යයේ චමත්කාරය විඳිය හැකි නිදහස් තෝතැන්නක්ද වේ.

### ප්‍රයිම් සමූහය

ප්‍රයිම් ව්‍යාපාර සමූහය මුළුමනින්ම ශ්‍රී ලාංකීය ව්‍යාපාරයක් වන අතර, LMD සඟරාව විසින් 2019 වසරේදී මෙරට ව්‍යාපාරයන් අතර, ගෞරවණීය ව්‍යාපාරික නාමාවලියට ඇතුළත් කළ සමාගම් සමූහයට අයත් විය. එමෙන්ම ප්‍රයිම් සමූහයේ සභාපතිවරයා සහ සම සභාපතිවරිය LMD ව්‍යාපාරික සඟරාව මගින් 2019 වසරේදී මෙරට විශිෂ්ටතම ව්‍යාපාර 100 ට අයත් Realty Visionary and Power Woman ලෙසින් ඇගයුමට ලක් කළ අතර, කීර්තිමත් Property Guru Asia Property Awards සම්මාන උළෙලේදී "Beat Developer" සහ "Best Luxury Condo Delelompment' යන සම්මාන ද්විත්වය දිනා ගැනීමට ද ප්‍රයිම් සමූහය සමත් විය. Asia One සඟරාව විසින් ඇගයීමට ලක් කරන ආසියාවේ විශිෂ්ටතම සන්නාම අතරට සහ 2018 වසරේ ශ්‍රී ලංකාවේ විශිෂ්ටතම ව්‍යවසායකයා බවට පත්වීමට ද ප්‍රයිම් සමූහයට හැකි විය. ශ්‍රී ලංකාවේ සම්මානණීය සමූහ ව්‍යාපාරයක් වන ප්‍රයිම් ව්‍යාපාර සමූහය ශ්‍රී ලංකාවේ සේවය කළ හැකි හොඳම සමාගම් 25 අතරට අඛණ්ඩව 5 වතාවක් තේරී පත් වූ අතර LMD ව්‍යාපාරික සඟරාව මගින් වඩාත් ගෞරවණීය සමාගම් ලැයිස්තුවට 2016 වසරේ සිට මේ දක්වා අඛණ්ඩව තෙවරක් ඇතුළත් කර ඇත.

# සිළුමිණ රැකියා අවස්ථා


## විදුලි / වෙල්ඩින් කාර්මික ඇබෑර්තු

දිවුලපිටිය ප්‍රදේශයේ පිහිටි අපනයන කර්මාන්තශාලාවක් සඳහා වෙල්ඩින් සහ විදුලි කාර්මික වැඩ දන්නා කාර්මික ශිල්පියෙකු උවමනා කර තිබේ.

අමතන්න.
011-5660300, 011-5922722

---

කොළඹ පිහිටි වැඩබිමක් සඳහා
**මේසන්, ටයිල්, පේන්ට් වැඩ සඳහා බාස්වරුන් හා උප කොන්ත්‍රාත්කරුවන් අවශ්‍යයි.**

අමතන්න
ශානක - 0762737544
කසුන් - 0778976351
සලිත - 0711311548

---

## පුරප්පාඩු
## උප විදුහල්පති (විද්‍යා අංශය)

**බස්නාහිර පළාතේ ජනප්‍රිය පෞද්ගලික පාසලක ද්විතීය අංශයට**

## උප විදුහල්පතිවරයෙකු අවශ්‍යයි

**සුදුසුකම්:**

- පිළිගත් විශ්වවිද්‍යාලයක විද්‍යා උපාධි/ පශ්චාත් උපාධි
- රජයේ පාසල් ද්විභාෂා විෂය නිර්දේශය පිළිබඳ දැනුම
- ඉංග්‍රීසි බස හැසිරවීමේ හැකියාව
- වසර දෙකකට වඩා පාසල් පරිපාලන කටයුතුවල නියැලී සිටීම.
- වයස් සීමාවක් නොමැත.

සම්පූර්ණ ජීවදත්ත ඇතුළත් අයදුම්පත 2020 සැප්තැම්බර් 30ට පෙර කළමනාකරු, 75/4, ඕපන්ස් පෙදෙස, කොළඹ 07 ලිපිනයට හෝ findajobwp@gmail.com විද්‍යුත් ලිපිනයට යොමු කරන්න.

විමසීම්: 070 317 1107 (කාර්යාල වේලාවන් තුළ පමණි)

---

## ඇබෑර්තු

**ගොඩනැගිලි නඩත්තු කාර්මික ශිල්පී (පිරිමි)**

කොළඹ 03 පිහිටි ආයතනයක කාර්යාලීය ගොඩනැගිලි නඩත්තු කටයුතු සඳහා කාර්මික ශිල්පීන් කඩිනමින් බඳවා ගනු ලැබේ.

**සුදුසුකම්**

- වයස අවු. 40 අඩු වීම.
- අ.පො.ස සාමාන්‍ය පෙළ සමත්වීම.
- අවුරුද්දක අවම පළපුරුද්ද **සහ** පිළිගත් ආයතනයක විදුලි හෝ වායුසමීකරණ පාඨමාලාවක් හදරා තිබීම. **හෝ** අවුරුදු 5 ක අවම පළපුරුද්ද
- පැය 8 ක සේවා මුරයක වැඩ කළ හැකි වීම. (දිවා / රාත්‍රි)

**2020 අගෝස්තු 31 වන දිනට පෙර (සසිඳු) 0715145825 හෝ 0112376500 අමතන්න.**

---

## නඩත්තු කාර්මික ශිල්පී

ISO තත්ත්ව සහතිකයලත් ටයර් නිෂ්පාදන ආයතනයක් වන ඉයු - රිටෙක් පෞද්ගලික ආයතනය සඳහා නඩත්තු කාර්මික ශිල්පීන් වහාම අවශ්‍යයි.

**සුදුසුකම් :**

- ♦ වසර 03 ක රබර් ආශ්‍රිත කර්මාන්ත ශාලා නඩත්තුව පිළිබඳව මනා පළපුරුද්ද.
- ♦ වෘත්තීය පුහුණු පාඨමාලාවක් හදරා තිබීම (CGTTI, ATI, NAITA හෝ පිළිගත් ආයතනයක).
- ♦ හයිඩ්‍රොලික් සම්බන්ධ මැෂින් පිළිබඳව මනා පළපුරුද්ද.

**අතිරේක සුදුසුකම්**

- ♦ පැස්සුම් සහ පිරිසැකැසුම් වැඩ පිළිබඳ දැනුම.

**ඉහත සඳහන් සුදුසුකම් වෙතොත් පහත සඳහන් ලිපිනයට අයදුම් කරන්න.**

**මානව සම්බන්ධතා අංශය,**
**ඉයු - රිටෙක් පෞද්ගලික ආයතනය,**
**නො. 349/5, පළාතොට පාර,**
**නාගොඩ, කළුතර.**
විද්‍යුත් තැපෑල : shashika.peiris@continental.lk

Continental The Future in Motion — Eu-Retec (Pvt) Ltd Industrial Tyre Technology

---

## ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
## ඇබෑර්තු

පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයේ පහත දක්වා ඇති තනතුරු සඳහා මනා සෞඛ්‍ය තත්ත්වයකින් හා විශිෂ්ට චරිතයකින් යුතු ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. **නියෝජ්‍ය සම්බන්ධීකරණ ඉංජිනේරු**
02. **හැන්සාඩ් වාර්තාකරු**
03. **වායු සමීකරණ සහ ශීතකරණ කාර්මික ශිල්පී**

මෙම අයදුම්පත් කැඳවීමට අදාළ දැන්වීම 2020 අගෝස්තු මස 21 වැනි දින ගැසට් පත්‍රයෙහි පළකර ඇති අතර, එම ගැසට් නිවේදනයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍ර ප්‍රකාරව සකස් කරගන්නා ලද අයදුම්පත් 2020 සැප්තැම්බර් මස 04 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ **"පාර්ලිමේන්තුවේ මහ ලේකම්, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ අයදුම්කරන තනතුර සඳහන් කළ යුතුය. මෙම දැන්වීම www.parliament.lk වෙබ් අඩවිය ඔස්සේද ලබාගත හැකිය.

**පාර්ලිමේන්තුවේ මහ ලේකම්,**
**ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,**
**ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.**
**2020 අගෝස්තු මස 23 වැනි දින.**

---

## වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය
අධ්‍යාපන අමාත්‍යාංශය

**රත්මලාන, අනුරාධපුර හා යාපනය විශ්වවිද්‍යාල විද්‍යායතනයන්හි අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිළධාරී තනතුරු සඳහා අයදුම්පත් කැඳවීම.**

ඉහත තනතුරු සඳහා
අයදුම්පත් කැඳවා ඇති අතර
අදාළ පුවත්පත් දැන්වීම
**2020 අගෝස්තු මස 23 වන දින**
Sunday Observer පුවත්පතේ පළ කර ඇත.

වැඩිදුර තොරතුරු සඳහා
විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවියට පිවිසෙන්න.
www.univotec.ac.lk

**නියෝජ්‍ය ලේඛකාධිකාරී**
**වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය**
**නො.100, කඳවල**
**රත්මලාන.**


දුරකතන : 011-2630706
2020 අගෝස්තු 23

---

## සුමේධ විද්‍යාලය - ගම්පහ
(Ed.dep.- ASN 1290 / Ex.dep. -08449)

## විශ්‍රාම වැටුප් ලබන රජයේ ගුරුවරයෙකු වීමට ඔබට අවස්ථාවක්

**අධ්‍යාපන ක්ෂේත්‍රයේ වසර 15කට වැඩි පළපුරුද්දක් ඇති රජයේ අනුමත පාසලක ද්විතීය අංශය සඳහා රජයේ පාසල් ද්විභාෂා විෂය නිර්දේශය පිළිබඳ දැනුම ඇති ගුරුවරුන් අවශ්‍ය කර තිබේ.**



## ගුරු පුරප්පාඩු

**O/L සහ A/L (ඉංග්‍රීසි සහ සිංහල මාධ්‍ය )**

- විද්‍යාව, ගණිතය, වාණිජ විද්‍යාව, තාක්ෂණ විද්‍යාව, කලා විෂයයන්, දෙමළ, ඉංග්‍රීසි සහ ඉංග්‍රීසි සාහිත්‍යය

**අවම සුදුසුකම්:**

- උසස් පෙළ සමත් වීම
- පිළිගත් විශ්ව විද්‍යාලයකින් උපාධියක් හැදෑරීම හෝ සම්පූර්ණ කිරීම.
- ඉගැන්වීමේ පළපුරුද්ද අමතර සුදුසුකමක් වේ.
- වයස් සීමාවක් නොමැත.

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය: 2020 සැප්තැම්බර් 20

**ආකර්ෂණීය වැටුප් හා දීමනා**

අයදුම්පත යොමුකරන්න. ydcnawaloka@gmail.com

**විදුහල්පති, සුමේධ විද්‍යාලය, ගම්පහ.**

විමසීම්: 077 766 3625, 071 040 5760

---

## ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය

## ඇබෑර්තු

### ජ්‍යෙෂ්ඨ මහාචාර්ය/ මහාචාර්ය තනතුර

**වෛද්‍ය පීඨය**

**විෂය ක්ෂේත්‍ර** : ව්‍යවච්ඡේද විද්‍යාව, භෛෂජවේදය, පරපෝෂිත විද්‍යාව, ක්ෂුද්‍ර ජීව විද්‍යාව, ව්‍යාධිවේදය, මහජන සෞඛ්‍ය සහ පවුල් වෛද්‍ය විද්‍යාව, අධිකරණ වෛද්‍ය විද්‍යාව, ඖෂධවේදය, මනෝ චිකිත්සාව, වෛද්‍ය අධ්‍යාපනය

**ඉංජිනේරු පීඨය**

**විෂය ක්ෂේත්‍ර** : සිවිල් ඉංජිනේරු විද්‍යාව, විදුලි ඉංජිනේරු විද්‍යාව, ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු විද්‍යාව, විදුලි සන්දේශ ඉංජිනේරු විද්‍යාව, නාවික ඉංජිනේරු විද්‍යාව, ගගන ඉංජිනේරු විද්‍යාව, ගණිතය සහ සංඛ්‍යානය, යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව* (ජ්‍යෙෂ්ඨ මහාචාර්ය තනතුර සඳහා පමණි.*)

**නීති පීඨය**

(ජ්‍යෙෂ්ඨ මහාචාර්ය තනතුර සඳහා පමණි.*)

විෂය ක්ෂේත්‍රය : නීතිය

**ආරක්ෂක හා උපක්‍රමික අධ්‍යයන පීඨය**

(ජ්‍යෙෂ්ඨ මහාචාර්ය තනතුර සඳහා පමණි.*)

**විෂය ක්ෂේත්‍ර** : ජාත්‍යන්තර දේශපාලනය, ජාත්‍යන්තර සම්බන්ධතා

**කළමණාකරණ, සමාජ සහ මානව ශාස්ත්‍ර පීඨය**

(ජ්‍යෙෂ්ඨ මහාචාර්ය තනතුර සඳහා පමණි.*)

**විෂය ක්ෂේත්‍ර** : සමාජ විද්‍යාව, භූගෝල විද්‍යාව, කළමණාකරණය, මානව සම්පත් කළමණාකරණය, ඉංග්‍රීසි භාෂාව සහ සාහිත්‍යය, ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම

**සම සෞඛ්‍ය අධ්‍යයන පීඨය**

**විෂය ක්ෂේත්‍ර** : වෛද්‍ය රසායනාගාර විද්‍යාව, හෙද විද්‍යාව, භෞත චිකිත්සාව සහ වෘත්තීය චිකිත්සාව ඖෂධවේදය, ව්‍යවච්ඡේද විද්‍යාව, විකිරණවේදය සහ විකිරණ චිකිත්සාව* (ජ්‍යෙෂ්ඨ මහාචාර්ය තනතුර සඳහා පමණි.*)

**පරිගණක විද්‍යා පීඨය**

(ජ්‍යෙෂ්ඨ මහාචාර්ය තනතුර සඳහා පමණි.*)

**විෂය ක්ෂේත්‍ර** : පරිගණක විද්‍යාව, පරිගණක ඉංජිනේරු විද්‍යාව, ගණිතය, සංඛ්‍යානය, පරිගණක විද්‍යාව සහ තාක්ෂණය

**නිර්මිත පරිසරය හා අවකාශීය විද්‍යා පීඨය**

**විෂය ක්ෂේත්‍ර** : GIS සහ රිමෝට් සෙන්සින්, භූ මිතික විද්‍යාව, කැඩැස්තර, GNNS සහ ඡායා රේඛන මිතිය, වාස්තු විද්‍යාව සහ ප්‍රමාණ සමීක්ෂණය* (ජ්‍යෙෂ්ඨ මහාචාර්ය තනතුර සඳහා පමණි.*)

**වැටුප් පරිමාණ**

01. ජ්‍යෙෂ්ඨ මහාචාර්ය තනතුර : U-AC 5 (I) රු. 139,175-11x2,925-171,350 p.m
02. මහාචාර්ය තනතුර : U-AC 5 (II) රු. 117,350-13x2,700 – 152,450 p.m.

**වෙනත් ප්‍රතිලාභ**

සප්තවාර්ෂික නිවාඩු සහ පර්යේෂණ දීමනාව, පර්යේෂණ ප්‍රතිපාදන, නොමිලේ සෞඛ්‍ය රක්ෂණාවරණයක්, වාර්ෂික දිරි දීමනා, සේවකයින්ගේ දරුවන් සඳහා ශිෂ්‍යත්ව, විශ්වවිද්‍යාල රෝහලෙහි ප්‍රතිකාර ලබා ගැනීමේ දී ප්‍රමුඛතාවය, සේවක අර්ථසාධක හා සේවක භාරකාර අරමුදල් සඳහා දායකත්වය සහ වෙනත් වරප්‍රසාද

අයදුම්කරුවන් විසින් වෙබ් අඩවියෙන් බාගත කළ හැකි විසින් සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය අදාළ සහතිකපත්හි ඡායා පිටපත් සහිතව **2020.09.22** වන දින හෝ ඊට පෙර ලේඛකාධිකාරී, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය, රත්මලාන යන ලිපිනයට එවිය යුතු ය.

අයදුම්පත් බහාලූ ලිපිකවරයේ වම් පස ඉහළ කෙළවරේ අයදුම්කරනු ලබන තනතුර සඳහන් කළ යුතු ය.

* ජ්‍යෙෂ්ඨ මහාචාර්ය තනතුර සඳහා පමණක් අදාළ විෂය ක්ෂේත්‍ර - මහාචාර්ය/සහකාර මහාචාර්ය තනතුරු සඳහා **2020.08.16** වන දින පළ කරන ලද දැන්වීම වෙත යොමුවන්න.

සුදුසුකම් සහ වැඩිදුර විස්තර සඳහා විශ්ව විද්‍යාල වෙබ් අඩවිය, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක. 05/2015,916,04/2010 සහ අදාළ සංශෝධන හෝ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී (ආයතන), ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය වෙත යොමු වන ලෙස අපේක්ෂකයින්ට උපදෙස් දෙනු ලැබේ.

වැඩිදුර විස්තර සඳහා පිවිසෙන්න :- www.kdu.ac.lk.

අවසාන දිනය 2020. 09. 22

**අයදුම්පත් එවිය යුතු ලිපිනය :**
ලේඛකාධිකාරී
ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය
රත්මලාන

# දිවයින රැකියා අවස්ථා


**සේවකයකු අවශ්‍යයි**

ගෙදර නැවතී වැඩ කිරීමට ගැහැණු හෝ පිරිමි අයෙකු සොයනු ලැබේ.

ටෙලි.
0778313423

**සිසුදූත**

Domestic Express (Pvt) Ltd

0760 99 88 96
0777 60 30 30

**සතර පෝදා එළිදකින සදහම් ප්‍රදීපය**

බුදුසරණ

**සේවක ඇබෑර්තු**

බ්‍රේකර් - ඔපරේටර්වරු
කම්කරුවන්
ගල්මෝලක වැඩ කරන
පළපුරුදු අය විශේෂයි
කෝන් ක්‍රෂර්
හොරණ
034-4928192

**ඇබෑර්තු**

| | |
|---|---|
| මේසන් බාස්වරු | 2700 - 2500 |
| අත් උදව්කරුවන් | 1800 |
| පේන්ට් බාස්වරුන් | 2500 - 2700 |
| සයිට් සුපවයිසර් | 25000/- |

(අවු.24-25, බයික් තිබිය යුතුයි)

ඉතා ඉක්මනින් අවශ්‍යයි

Homes 365 (Pvt) Ltd.
077 500 3119 / 077 3171089
070 350 5144 / 077 8775937

**ඇබෑර්තු**

එස්. එම්. එල් ඉන්ජිනියර්ස් ඇන්ඩ් මැනුෆැක්චරර්ස් සමාගම වෙත පහත සඳහන් තනතුරු සඳහා අයදුම්පත් ලැබීමට සළස්වන්න.

**Workshop සුපවයිසර්වරු**

- ලේත්, මිලින්, ෂේපින් මැෂින් සහ ෆිටින්, පිළිබඳ මනා දැනුමක් සහිත අයදුම් කරුවන් විය යුතුය.
- CNC ලේත් මැෂින්, මිලින් මැෂින් සහ මෝල්ඩ් එකලස් කිරීම පිළිබඳ දැනුමක් තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

**EDM මැෂින් ඔපරේටර්වරු**

- EDM මැෂින් ඔපරේටර්වරයකු ලෙස සේවා පළපුරුද්දක් තිබිය යුතුය.

**පැස්සුම්කරුවන්**

- ආර්ක් සහ ටිග් වෙල්ඩින් පිළිබඳ පළපුරුද්දක් තිබිය යුතුයි.

එස්. එම්. එල් ඉන්ජිනියර්ස් ඇන්ඩ් මැනුෆැක්චරර්ස් සමාගම.
නො. 116, මිගමු පාර, අම්බලන්මුල්ල, සීදුව.
දුරකථන අංක : 011-2253327 / 0722040689
ඊමේල් : HR@smlengineers.com

**කොළඹ අවට නිවාස සංකීර්ණ / ආයතනවල යෙදවීම සඳහා ආරක්ෂක නිලධාරී ඇබෑර්තු ඇත**

නොමිලේ නවාතැන් පහසුකම් / සහන මිලට ආහාර
ආරක්ෂක ක්ෂේත්‍රයේ ඉහළ වැටුප් හා දීමනා

**OIC / SSO / JSO / LSO**

සම්මුඛ පරීක්ෂණ සඳහා විමසීම්
**නො. 31, හෝර්ටන් පෙදෙස, කොළඹ 07.**
**077-7225685 - සමන්ත**
**076-8414155- සුභ්‍රාර්තෝ**
**077-3613933 - කුමාර**

**පුරප්පාඩු ඔපරේටර්**

ඒකල ජාඇල පිහිටි අප කර්මාන්ත ශාලාවේ සේවය සඳහා ඔපරේටර් මහතෙකු අවශ්‍යය. ඔබ වයස අවුරුදු 45 - 55 අතර, අ. පො.ස (සා. පෙ) සමත් අයෙක් නම් දින 10 ක් ඇතුළත පහත ලිපිනයට අයදුම් කරන්න. ගම්පහ, මිනුවන්ගොඩ, ජාඇල අවට විශේෂයි.

**කර්මාන්ත ශාලා කළමනාකරු**
**යුනියන් කෙමිකල්ස් ලංකා පී.එල්.සී**
**4 වන මහල, සාරතී ගොඩනැගිල්ල,**
**නො. 50, හයිඩ් පාර්ක් කෝනර්,**
**කොළඹ 02.**

**ගල්කිස්ස මහින්ද අවමංගල අධ්‍යක්ෂකවරු හට පාරිභෝගික සේවය සහ අවමංගල කටයුතු කළමනාකරණය සඳහා උගත් නිහතමානී මහතෙකු අවශ්‍යයි**

**(වයස 25 - 60 අතර)**

**ඉංග්‍රීසි සහ දෙමළ භාෂා නිපුණකම විශේෂයි.**

**හෝටල්, ගාමන්ට්, සුපිරි වෙළඳ සැල්, ආරෝග්‍ය ශාලාවල පළපුරුදු බවද සෑහේ.**

**පළපුරුදු නැති වුද නිහතමානීව ඉදිරිපත් විය හැක.**

වැටුප : පළපුරුදු රු. 65000/= රු. 85,000/= දක්වා
සාමාන්‍ය රු. 45,000/= රු. 65,000/= දක්වා

**25 අගෝස්තු 2020 සිට 10 සැප්තැම්බර් 2020 දක්වා දිනවල දහවල් 12.00 සිට සවස 7.00 දක්වා දුරකථන ඇමතුමකින් හමුවීමට කාලය වෙන්කරවා ගන්න.**

**0775733869, 0771507495**


**පත්‍රය බාරේ පළවන දැන්වීම් සඳහා එවන පිළිතුරු සාමාන්‍ය තැපෑලෙන් එවිය යුතුයි**


## ඔබ මසකට රු. 200,000/- ඉපයීමට කැමතිද?

**අළෙවි විධායක / බෙදාහරින්නන්**

අළෙවි විධායක / බෙදහරින්නෙකු ලෙස කුඩා ප්‍රදේශයක කටයුතු මෙහෙයවීම සඳහා පත්කිරීමට, පළපුරුද්ද ඇති හෝ නැති දිවයිනපුරා අළෙවි විධායක / බෙදහරින්නන්ගේ සේවය, සීඝ්‍රයෙන් අළෙවිවන පාරිභෝගික භාණ්ඩ (FMCG) සමාගමකට උවමනායි.

**වැටුප් හා දීමනා**

★ බෙදහැරීමේ කොමිෂන් - 12.5% (බෙදහරින්නකු වීමට කැමැත්තක් දක්වන අයෙකුට ඉහළ ආදායමක් - සාමාන්‍ය මාසික ඉපයීම රු. 50,000/-)
★ ලොරි / කුඩා වාහන - මාසික කුලිය / RD දීමනා (සාමාන්‍ය 62,500/-)
★ අනෙකුත් දළ මාසික ආදායම රු. 50,000/-.

**අවශ්‍යතා**

★ අපොස සා/පෙළ
★ සිංහල සහ හෝ දෙමළ
★ වලංගු යතුරුපැදි හෝ රියදුරු බලපත්‍රය
★ සීඝ්‍රයෙන් අළෙවිවන පාරිභෝගික භාණ්ඩ (FMCG) ක්ෂේත්‍රයේ පළපුරුද්ද අමතර සුදුසුකමක් වනු ඇත.

කරුණාකර ඔබගේ සියලු විස්තර සහිත ජීව දත්ත යොමු කරන්න. info@amogha.eu

**විමසීම් : 0112334335 (ඒෂානි පෙරේරා)**

Paradise Toys



**ජර්මනියට අනුබද්ධ පැරඩයිස් ටොයිස් (පුද්) සමාගමේ**

- නො. 165, කෙරවලපිටිය පාර, හැඳල, වත්තල. දු. අංක - 0112 933 195 / 6
- උනවැලිවත්ත, පුබුදුගම, මදුරන්කුලිය. දු. අංක - 0322 268 111 / 0772 103 713
- අලවීවේගම, කොබෙයිගනේ. දු. අංක - 0764 735 733 / 0772 103 713

**යන ශාඛාවන් සඳහා**

✓ මහන මැෂින් ක්‍රියාකරවන්නියන් (SEWING MACHINE OPERATOR)
✓ EMBROIDERY මැෂින් ක්‍රියාකරවන්නනියන්

බඳවා ගන්නා බැවින් සම්මුඛ පරීක්ෂණ සඳහා ඔබගේ ජාතික හැඳුනුම්පත සහ උප්පැන්නය සමඟ සතියේ දිනවල පෙ.ව. 8.00 ත් ප.ව. 5.00 ත් අතර පැමිණෙන්න.

E-Mail: hr@paradisetoys.biz
www.facebook.com/ParadiseToys


## තනතුරු ඇබෑර්තු
## ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය - අනුරාධපුරය

මෙම විශ්වවිද්‍යාලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් ඉල්ලුම්පත් භාරගනු ලැබේ.

**බෞද්ධ අධ්‍යයන පීඨය**

01. ප්‍රමුඛ මහාචාර්ය (බෞද්ධ දර්ශනය) - (තනතුරු 01)
02. ප්‍රමුඛ මහාචාර්ය (පාලි) - (තනතුරු 01)

**ප්‍රායෝගික බෞද්ධ අධ්‍යයනාංශය**

03. බෞද්ධ මනෝවිද්‍යාව හා උපදේශනය පිළිබඳ තාවකාලික කථිකාචාර්ය (පුරප්පාඩු තනතුරු 01)

**භාෂා හා සංස්කෘතික අධ්‍යයන පීඨය**

**සමාජීය විද්‍යා හා තුලනාත්මක අධ්‍යයනාංශය**

04. ආධුනික කථිකාචාර්ය / කථිකාචාර්ය (සේවය තහවුරු නොකළ) / ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II/I ශ්‍රේණිය (අධ්‍යාපන විද්‍යාව) - (තනතුරු 01)
05. ආධුනික කථිකාචාර්ය/ කථිකාචාර්ය (සේවය තහවුරු නොකළ) / ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II/I ශ්‍රේණිය (පුරා විද්‍යාව) - (තනතුරු 01)

වැදගත් - පුරාවිද්‍යා, විද්‍යාගාර භාවිතය හා පුරා අස්ථි විද්‍යාව පිළිබඳ දැනුම ඇති අපේක්ෂකයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

**භාෂා අධ්‍යයනාංශය**

06. ආධුනික කථිකාචාර්ය / කථිකාචාර්ය (සේවය තහවුරු නොකළ) / ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II/I ශ්‍රේණිය (සංස්කෘත) - (තනතුරු 01)
07. ආධුනික කථිකාචාර්ය/ කථිකාචාර්ය (සේවය තහවුරු නොකළ) / ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II/I ශ්‍රේණිය (ඉංග්‍රීසි) - (තනතුරු 01)

**සැ. යු.**

- ඉහත අධ්‍යයන තනතුරු සඳහා ඉල්ලුම් කළ හැක්කේ බෞද්ධ භික්ෂුන් වහන්සේට පමණි.
- තනතුරු සඳහා අයදුම් කරන ස්වාමීන් වහන්සේට ඉංග්‍රීසි හා සිංහල යන භාෂා දෙකෙන්ම ඉගැන්වීමේ හැකියාව තිබීම විශේෂ සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.
- ඉහත අංක 04, 05, 06 හා 07 හි සඳහන් තනතුරකට පත් කළහොත් එසේ පත් කළ දින සිට ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයට අවම වශයෙන් වසර 10ක් සේවය කළ යුතු අතර, මේ සඳහා විශ්වවිද්‍යාලය සමග ගිවිසුමකට එළඹිය යුතුය.

08. ඉංග්‍රීසි භාෂා උපදේශක (III ශ්‍රේණිය) - (තනතුරු 01)

**පරිපාලන / අධ්‍යයන තනතුරු**

09. පුස්තකාලයාධිකාරී

සැ. යු. - පුස්තකාලයාධිකාරී තනතුරට අයදුම් කළ හැක්කේ ගිහි බෞද්ධයන්ට පමණි.

**පරිපාලන / අනධ්‍යයන තනතුරු**

10. සහකාර ලේඛකාධිකාරී - (තනතුරු 01)

**ප්‍රතිලාභ**

- ඉහත සඳහන් තනතුරු සඳහා වැටුප්වලට අමතරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමත අනෙකුත් දීමනා ද හිමි වේ. අධ්‍යයන හා පුස්තකාලයාධිකාරී තනතුරු සඳහා අධ්‍යයන දීමනා හා පර්යේෂණ දීමනා ගෙවනු ලැබේ.
- විශ්වවිද්‍යාල සේවයට බඳවා ගනු ලබන අයට විශ්වවිද්‍යාලය මගින් පවත්වාගෙන යනු ලබන සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකත්වය ලැබේ. (අර්ථසාධක අරමුදල සඳහා නිලධාරියාගේ වැටුපෙන් 10% ක මුදලක් සහ විශ්වවිද්‍යාලය මගින් 15% ක මුදලක් බැර කෙරේ.) සේවක භාරකාර අරමුදලට 3% ක මුදලක් විශ්වවිද්‍යාලය මගින් බැර කරනු ලැබේ.

**අයදුම්පත්**

i. අයදුම්පත් හා අනෙකුත් විස්තර 2020.09.15 දිනට පෙර මෙම විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී (ආයතන) වෙතට ඉල්ලුම් කරන තනතුර ඇතුළත් ලිපියක් සමග සෙ.මී. 23X10 ප්‍රමාණයේ ලිපිනය සහිත, මුද්දර ඇල වූ ලියුම් කවරයක් එවීමෙන් ලබාගත හැකි අතර, අයදුම්පත් හා බඳවා ගැනීමේ මූලික සුදුසුකම් ඇතුළු විස්තර **www.busl.ac.lk** වෙබ් අඩවියෙන් ද බාගත හැක.

ii. එක් තනතුරකට වඩා අයදුම් කිරීමට බලාපොරොත්තු වන අයදුම්කරුවන් එක් එක් තනතුර සඳහා වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුවේ.

iii. මහාචාර්ය තනතුර සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 916, 4/2014 හා චක්‍රලේඛ ලිපි අංක 4/2010 ප්‍රකාරවද, පුස්තකාලයාධිකාරී තනතුර සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 921 ප්‍රකාරවද අදාළ අයදුම්පත්‍රය සකස් කර ගත යුතුය.

**අයදුම් කරන පිළිවෙළ**

I. සම්පූර්ණ කරන ලද අයදුම්පත් සහතික කරන ලද සහතික පිටපත් සමග ලියාපදිංචි තැපෑලෙන් **ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී, (ආයතන) ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, පුත්තලම් පාර, අනුරාධපුර** යන ලිපිනයට 2020.09.22 දින හෝ ඊට පෙර ලැබෙන සේ එවිය යුතුය. ප්‍රමුඛ මහාචාර්ය හා පුස්තකාලයාධිකාරී තනතුරු සඳහා පමණක් අයදුම්පත් භාරගන්නා අවසන් දිනය 2020.10.07 දින වේ.

II. අයදුම්පත් බහාලන කවරයේ වම් පස ඉහළ කෙළවරේ **අයදුම් කරන තනතුර** සඳහන් කළ යුතුය.

III. විශ්වවිද්‍යාල/රජයේ දෙපාර්තමේන්තු/සංස්ථා සහ ව්‍යවස්ථාපිත ආයතනවල සේවයේ නියුතු අය තම අයදුම්පත් අදාළ ආයතන/දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

IV. නියමිත ආකෘතියෙන් ඉදිරිපත්කර නොමැති, ඉහත අවශ්‍යතාවන්ට පටහැනිව ඉදිරිපත් කරන ලද අසම්පූර්ණ හා ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

V. අයදුම්කරුවන් කෙටි ලේඛන ගත කිරීම හා එම අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවීමේ අයිතිය විශ්වවිද්‍යාලය සතුවේ.

**ලේඛකාධිකාරී,**
**ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය,**
**අනුරාධපුර.**
**2020.08.23**

## ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
## ඇබෑර්තු
## නියෝජ්‍ය සම්බන්ධීකරණ ඉංජිනේරු තනතුර

පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයේ පුරප්පාඩුව පවතින **"නියෝජ්‍ය සම්බන්ධීකරණ ඉංජිනේරු"** තනතුර සඳහා මනා සෞඛ්‍ය තත්ත්වයකින් හා විශිෂ්ට චරිතයකින් යුතු ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

අදාළ අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘතිය www.parliament.lk වෙබ් අඩවියේ පළකර ඇති අතර, ඒ අනුව පිළියෙල කරගත් අයදුම්පත් 2020 සැප්තැම්බර් මස 04 වන දින හෝ ඊට පෙර ලැබෙන සේ **"පාර්ලිමේන්තුවේ මහ ලේකම්, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ **"නියෝජ්‍ය සම්බන්ධීකරණ ඉංජිනේරු"** යනුවෙන් සඳහන් කළ යුතුය. (මෙම තොරතුරු සහ ආදර්ශ අයදුම්පත්‍රය 2020 අගෝස්තු මස 21 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ ද පළකර ඇත)

**01. වැටුප් පරිමාණය :**

2016.11.07 දිනැති අංක 06/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රු. 62,595 - 7 x 1,630 / 6 x 2,170 - 87,025/- වේ. (වරලත් ඉංජිනේරු දීමනාව සහ අනෙකුත් අතිරේක දීමනා සහිතව මෙම වැටුප් පරිමාණයට අදාළ අවම ආරම්භක දළ මාසික වැටුප රු. 150,000.00 පමණ වේ)

**02. වයස් සීමාව :**

අයදුම්පත් භාරගැනීම අවසන් වන දිනට වයස අවුරුදු 30 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයේ සේවය ස්ථිර කර ඇති අයදුම්කරුවන් සඳහා සහ රාජ්‍ය / පළාත් රාජ්‍ය සේවයේ සේවය ස්ථිර කර ඇති අයදුම්කරුවන් සඳහා ඉහත උපරිම වයස් සීමාව අදාළ නොවේ)

**03. අධ්‍යාපන සුදුසුකම් :**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගනු ලබන විශ්වවිද්‍යාලයක ඉංජිනේරු විද්‍යාවේදී (විදුලි / ඉලෙක්ට්‍රොනික්) උපාධිධාරියෙකු වීම.

**04. වෘත්තීය සුදුසුකම් :**

2017 අංක 4 දරන ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සභාවේ පනතට අනුව ස්ථාපිත පිළිගත් ඉංජිනේරු ආයතනයක වරලත් ඉංජිනේරු සාමාජිකත්වය ලබා තිබීම.

**05. පළපුරුද්ද :**

විදුලි / ඉලෙක්ට්‍රොනික් ඉංජිනේරු ක්ෂේත්‍රයේ පළපුරුද්දක් ලබා තිබිය යුතුය. ගොඩනැගිලි නඩත්තු අංශයේ පළපුරුද්දක් ඇති අය කෙරෙහි වැඩි සැළකිල්ලක් දක්වනු ලැබේ.

**සටහන : ඉහත (3) හි සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇති පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයේ වසර 10 කට නොඅඩු පළපුරුද්දක් සහිත සාමාජික / සාමාජිකාවන්ට ද මේ සඳහා අයදුම් කළ හැක.**

**06. බඳවා ගැනීමේ ක්‍රමය :**

සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

**07. සේවා නියමයන් හා කොන්දේසි :**

(i) මෙම තනතුර ස්ථිරය. මෙම තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට අයදුම්කරුවන් යටත් විය යුතුය. තෝරා ගනු ලබන අයදුම්කරුවන් මූලිකව වසර තුනක (03) පරිවාස කාලයකට යටත්ව පත් කරනු ලබන අතර, රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරක සේවය ස්ථිර කරනු ලැබූ පුද්ගලයෙක් තෝරා ගනු ලැබුවහොත් ඔහු / ඇය වසරක වැඩ බැලීමේ කාලයකට යටත්ව පත් කරනු ඇත.

(ii) තෝරා ගනු ලබන අයදුම්කරුවන් පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයට අදාළ වන මූල්‍ය හා දෙපාර්තමේන්තු රෙගුලාසිවලට යටත් වනු ඇත.

(iii) තෝරා ගනු ලබන අයදුම්කරුවන්, රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයකට අනුව වැන්දඹු / වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට තම වැටුපෙන් දායක මුදල් ගෙවිය යුතුය.

(iv) තෝරා ගනු ලබන අයදුම්කරුවන් වෛද්‍ය පරීක්ෂණයකට භාජනය විය යුතුය.

(v) තෝරා ගනු ලබන අයදුම්කරුවන් පත් කරනු ලැබීමට පෙර ඔවුන් පිළිබඳව ආරක්ෂක නිශ්කාෂණ තොරතුරු වාර්තා ලබා ගනු ඇත.

08. අයදුම්කරුවන් විසින් පහත සඳහන් සහතිකවල පිටපත් (මුල් පිටපත් නොවේ) සිය අයදුම්පත්වලට ඇමිණිය යුතු අතර, ඉල්ලා සිටින විටෙක මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය.

(අ) උප්පැන්න සහතිකය
(ආ) අධ්‍යාපන සුදුසුකම් සනාථ කෙරෙන සහතික
(ඇ) වෘත්තීමය සුදුසුකම් සනාථ කෙරෙන සහතික
(ඈ) පළපුරුද්ද සනාථ කෙරෙන සහතික

09. රාජ්‍ය / පළාත් රාජ්‍ය ආයතනවල සේවය කරන අයදුම්කරුවන් සිය අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියා හරහා එවිය යුතුය.

10. තනතුර ලබා ගැනීමේ අරමුණින් කවර හෝ ආකාරයකින් බලපෑම් කිරීම තනතුර සඳහා නුසුදුසුකමක් වනු ඇත.

11. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව එවනු ලබන හෝ ඉහත සඳහන් කළ සහතිකවල පිටපත් රහිතව එවනු ලබන හෝ දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියා හරහා එවනු නොලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව ලැබෙන දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් ද, ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල නොකරන ලද අයදුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**ඩබ්ලිව්. බී. ඩී. දසනායක**
**පාර්ලිමේන්තුවේ මහ ලේකම්.**

**ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,**
**ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.**
**2020 අගෝස්තු මස 23 වැනි දින.**

# සිළුමිණ රැකියා අවස්ථා

## මෝටර් රථ විදුලි කාර්මික ශිල්පී

ISO තත්ත්ව සහතිකයලත් ටයර් නිෂ්පාදන ආයතනයක් වන ඉයු - රිටෙක් පෞද්ගලික ආයතනය සඳහා ස්වයංක්‍රීය විදුලි කාර්මිකයෙකු වහාම අවශ්‍යයි.

**ප්‍රධාන වගකීම් :**

- මෝටර් වාහනවල විදුලි හා විද්‍යුත් දෝෂ අලුත්වැඩියා කිරීම.
- අවශ්‍ය වූ විට හානියට පත් / දෝෂ සහිත කොටස් ප්‍රතිස්ථාපනය කිරීම.
- අලුත්වැඩියා කටයුතුවල සාර්ථකත්වය තහවුරු කිරීම සඳහා පරීක්ෂණ සිදු කිරීම.
- මෝටර් වාහනවල විදුලි හා විද්‍යුත් පද්ධති එකලස් කිරීම සහ ස්ථාපනය කිරීම.
- කාලය හා පිරිවැය පිළිබඳ ඇස්තමේන්තු සකස් කිරීම.

**සුදුසුකම් සහ අත්දැකීම්**

- ස්වයංක්‍රීය විදුලි පිළිබඳ පිළිගත් වෘත්තීය පාසලකින් සහතිකපත්‍ර පාඨමාලාවක් හැදෑරීම.
- ස්වයංක්‍රීය විදුලි කාර්මිකයෙකු ලෙස වසර 03 කට වැඩි පළපුරුද්ද.
- මෝටර් වාහනවල විදුලි ගැටලු හඳුනා ගැනීමේ හැකියාව.
- ෆෝක්ලිෆ්ට් ඇතුලු පෙට්‍රල් සහ ඩීසල් වාහනවල විදුලි රැහැන් පිළිබඳ දැනුම.
- හොඳ විශ්ලේෂණාත්මක හා ගැටලු විසඳීමේ කුසලතා.

**ඉහත සුදුසුකම් වෙතොත් පහත සඳහන් ලිපිනයට අයදුම් කරන්න.**

**මානව සම්බන්ධතා අංශය,**
**ඉයු - රිටෙක් පෞද්ගලික ආයතනය,**
**නො. 349/5, පළාතොට පාර,**
**නාගොඩ, කළුතර.**
**විද්‍යුත් තැපෑල : shashika.peiris@continental.lk**

Continental The Future in Motion
Eu-Rotec (Pvt) Ltd Industrial Tyre Technology

## නිෂ්පාදන සුපරීක්ෂකවරු (Production Supervisor) අවශ්‍යයි

- අ.පො.ස. සා.පෙළ සහ උසස් පෙළ සමත් අය විය යුතුයි.
- අවුරුදු 2-3 සේවා පෙර දැනුම වඩාත් සුදුසුයි.
- රාත්‍රී කාලයේදී සේවය කළ හැකි අය විය යුතුයි.

වැටුප සාකච්ඡා කරගත හැකියි.
සුදුසු අය ඔබගේ ජීව දත්ත
hr@sunindustries.lk යන ඊමේල් ලිපිනයට හෝ
**The Director**
**Sun Industries (Pvt) Ltd**
**104/11, Grandpass Road, Colombo - 14.**
**යන ලිපිනයට තැපෑලෙන් එවන්න.**



ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම ප්ලාස්ටික් නිෂ්පාදකයා වන ෆීනික්ස් ඉන්ඩස්ට්‍රීස් ආයතනයේ මාකඳුර කර්මාන්ත ශාලාව සඳහා පහත සඳහන් සේවක පුරප්පාඩු පවතී

### යන්ත්‍ර ක්‍රියාකරු - PVC නිෂ්පාදන අංශය

- අ.පො.ස. (සා.පෙළ) දක්වා හදාරා තිබීම.
- PVC Extruder යන්ත්‍ර ක්‍රියාකරුවකු ලෙස අවම වශයෙන් වසර 01 -2 ක පළපුරුද්ද තිබීම

### නිෂ්පාදන සුපරීක්ෂක - PVC නිෂ්පාදන අංශය

- අ.පො.ස (සා.පෙළ) දක්වා හදාරා තිබීම
- නිෂ්පාදන සුපරීක්ෂකවරයෙකු ලෙස වසර 05 ක පළපුරුද්ද

ෆීනික්ස් ආයතනය තුළදී ,

- නොමිලේ නවාතැන් පහසුකම්
- නොමිලේ නිල ඇඳුම්
- උදේ/දිවා/රාත්‍රී ආහාර
- ඇතුළු පහසුකම් රැසක් හිමි වේ.

සිත් ගන්නා වැටුප් සමගින් විශ්වාසනීය වෘත්තීමය අනාගතයකට පිවිසීමේ හැකියාව

ඔබගේ අයදුම් පත් careers@phoenix.lk හෝ පහත ලිපිනයට දින 7 ක් ඇතුලත එවන්න කවරයේ ඉහල වම්පස ඔබගේ තනතුර සඳහන් කරන්න

**ෆීනික්ස් ඉන්ඩස්ට්‍රීස් ලිමිටඩ්**
මාකඳුර කර්මාන්ත කලාපය
මාකඳුර,ගෝනවිල
ඇමතුම්- 0114726000 / 0776235633

සත වෙත සිරිසෙත සලසන සතිපත
දෝ සතර
වෙද සතර
දත් නොදත්
කාටත්
මහඟු මිණකි
සුබසෙත
සත වෙත සිරිසෙත සලසන සතිපත

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
## නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය
AIIB

## කොළඹ නාගරික පුනර්ජීවන ව්‍යාපෘතියට සහයදීම - AIIB

### පුරප්පාඩු - ව්‍යාපෘති අධ්‍යක්ෂ 01

අඩු ආදායම්ලාභී ප්‍රජාවගේ නිවාස තත්ත්වයන් වැඩිදියුණු කිරීම සහ කොළඹ ඉඩම් භාවිතයේ කාර්යක්ෂමතාවය වැඩි කිරීම සඳහා නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය රජය විසින් 2011 වසරේදී ආරම්භ කරන ලදී. දැරිය හැකි නිවාස 50,000 ක් ඉදිකිරීම සහ ගොඩකරන ලද ඉඩම් ප්‍රතිසංවර්ධනය කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වේ. කොළඹ නාගරික පුනර්ජීවන ව්‍යාපෘතියට සහාය දීම (SCURP) යටතේ නිවාස ඒකක 5,500 ක් ඉදිකිරීම සහ කොළඹ නගරයේ සහ නගරාසන්න ප්‍රදේශයේ ඉඩම් සංවර්ධනය සඳහා මූලාධාර ලබාදීමේ මෙම ප්‍රාරම්භය සඳහා ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව උපකාර කරයි. SCURP සඳහා වන මුළු පිරිවැය ඇමරිකානු ඩොලර් මිලියන 280 කි. එහි ඇ.ඩො. මිලියන 200 ක් ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව (AIIB) විසින් ලබාදෙනු ලැබේ. මෙම ව්‍යාපෘතිය නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැරවීම හා ප්‍රජා පවිත්‍රතා රාජ්‍ය අමාත්‍යාංශය විසින් ඉටුකරන අතර, නාගරික සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාත්මක කෙරේ.

ව්‍යාපෘති අධ්‍යක්ෂ තනතුර පිරවීම සඳහා ශ්‍රී ලංකාවේ සුදුසුකම් හා පළපුරුද්ද ලත් පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**කළමනාකරණ චක්‍රලේඛ අංක 01/2019 පරිදි PS level 1, 5th Band**
(පහත 1 හෝ 2 හෝ 3)

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන අදාල ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් සාර්ථකව සම්පූර්ණ කර තිබීම

හෝ

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අදාල ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක් ලෙස පිළිගනු ලබන සුදුසුකමක්

හෝ

අදාල ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය / සමාන වෘත්තීය සුදුසුකමක් ලබාතිබීම

සහ

කළමනාකරු මට්ටමේ අවම වශයෙන් වසර 16 ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්දක් ලබා තිබිය යුතු අතර, එයින් වසර 8 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරු මට්ටමේ විය යුතුය.

02. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන අදාල ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් සාර්ථකව සම්පූර්ණ කර තිබීම

හෝ

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අදාල ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක් ලෙස පිළිගනු ලබන සුදුසුකමක්

හෝ

අදාල ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය / සමාන වෘත්තීය සුදුසුකමක් ලබා තිබීම.

සහ

අදාල ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයක් වෙතින් ආයතනික / වරලත් සාමාජිකත්වය හෝ සමාන වෘත්තීය සුදුසුකමක් හෝ අදාල ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් ලබා තිබීම.

සමග

කළමනාකරු මට්ටමේ අවම වශයෙන් වසර 14 ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්දක් ලබා තිබිය යුතු අතර, එයින් වසර 07 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරු මට්ටමේ විය යුතුය.

03. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන අදාල ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් සාර්ථකව සම්පූර්ණ කර තිබීම

හෝ

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අදාල ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක් ලෙස පිළිගනු ලබන සුදුසුකමක් ලබා තිබීම.

සහ

අදාල ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් ලබා තිබීම

සමග

අදාල ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයක් වෙතින් ආයතනික / වරලත් සාමාජිකත්වය හෝ සමාන වෘත්තීය සුදුසුකමක් ලබා තිබීම

සමග

කළමනාකරු මට්ටමේ අවම වශයෙන් වසර 12 ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්දක් ලබා තිබිය යුතු අතර, එයින් වසර 06 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරු මට්ටමේ තිබිය යුතුය.

**වැටුප් පරිමාණය සහ පොදු කොන්දේසි :**

වැටුප්, 2019.03.15 දතම කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2019 සහ අනෙකුත් අදාල කළමනාකරණ සේවා චක්‍රලේඛ ප්‍රකාරව පදනම් වේ. අයදුම්කරුවන් ශ්‍රී ලාංකීය පුරවැසියන් විය යුතු අතර, වයස අවුරුදු 64 ට වැඩි නොවිය යුතුය.

**සේවා නියමයන් හා කොන්දේසි :**

රජයේ සේවකයන් 2019 මාර්තු 15 දතම අංක 01/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛ 2.3.3 වගන්තිය ප්‍රකාරව බඳවා ගනු ලබන අතර, රාජ්‍ය සේවාවට පිටස්තර අයවලුන් කොන්ත්‍රාත් පදනම මත බඳවාගනු ලැබේ. පත්වීම් කොන්ත්‍රාත් පදනම මත සිදු කරන අතර, එය මුලින් වසරක කාලයක් සඳහා වන අතර, අපේක්ෂකයාගේ කාර්යසාධනය මත වාර්ෂිකව කොන්ත්‍රාත්තුව අලුත් කරනු ලැබේ.

**තෝරාගැනීමේ ක්‍රමය :**

සුදුසුකම් හා පළපුරුද්ද මත කෙටි ලැයිස්තුගත කළ අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

**අයදුම්පත් :**

සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සම්පූර්ණ විස්තර හා දුරකථන අංකය හා ඊමේල් ලිපිනය ඇතුළු අනෙකුත් අදාල තොරතුරු සඳහන් කරමින් A4 ප්‍රමාණයේ කඩදාසියේ අයදුම්පත තමන් විසින්ම සකසා ගන්නාමෙන් අපේක්ෂකයන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. අයදුම්පත්, 2020 සැප්තැම්බර් 07 වෙනි දින හෝ ඊට පෙර ලැබෙන පරිදි පහත සඳහන් ලිපිනය වෙත ලියාපදිංචි තැපැල් මගින් එවිය යුතුය. අයදුම්පත බහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "SCURP - ව්‍යාපෘති අධ්‍යක්ෂ තනතුර සඳහා අයදුම්පත" යනුවෙන් සඳහන් කළ යුතුය. රාජ්‍ය / ආයතනික අංශයේ අයදුම්කරුවන් ස්වකීය අයදුම්පත් තමන්ගේ ආයතන ප්‍රධානීන් මගින් යොමු කළ යුතු අතර, පහත සඳහන් ලිපිනය වෙත පිටපතක් කෙළින්ම කලින් යොමු කළ යුතුය.

**ලේකම්,**
**නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය,**
**17 වන මහල, සුහුරුපාය,**
**බත්තරමුල්ල.**

## ලංසු කැඳවීම

### ශ්‍රී ලංකා ගුවන් හමුදාව සඳහා භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනය

1. ශ්‍රී ලංකා ගුවන් හමුදා ප්‍රසම්පාදන කමිටු සභාපති විසින් පහත සඳහන් භාණ්ඩ සඳහා යෝග්‍යතාපූර්ණ සහ සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

| ටෙන්ඩර් අනන්‍යතා අංකය | විස්තරය | ටෙන්ඩර් අවසන් වන/ විවෘත කරන දිනය සහ වේලාව | ආපසු නොගෙවනු ලබන ලංසු ගාස්තුව (රු.) |
|---|---|---|---|
| AHQ/20/PUB/CLO/1008 | 2021 වර්ෂයේ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ වාර්ෂික නිල ඇඳුම් නිකුත් කිරීම සඳහා Chevrons සහ Shoulder Flashers මිලදී ගැනීම. | 2020 සැප්තැම්බර් මස 09 වන දින පැය 1030 | රු. 2,000/- |
| AHQ/20/PUB/CLO/1009 | 2021 වර්ෂයේ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ නිලධාරීන්, නිලධාරිනියන්, ගුවන් භටයින් සහ සිවිල් නිලධාරීන් සඳහා ශාරීරික අභ්‍යාස කලිසම් (Track Bottom) මිලදී ගැනීම. | 2020 සැප්තැම්බර් මස 09 වන දින පැය 1030 | රු. 2,000/- |
| AHQ/20/PUB/CLO/1011 | 2021 වර්ෂයේ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ නිලධාරීන් සහ නිලධාරිනියන් වෙත වාර්ෂික නිල ඇඳුම් නිකුත් කිරීම සඳහා ඩබල් ස්ටිෆ් කොලරය (Doubled Stiffed Collar) සහිත අත් කොට කමිස මැසීම. | 2020 සැප්තැම්බර් මස 09 වන දින පැය 1030 | රු. 2,000/- |
| AHQ/20/PUB/CLO/1012 | 2021 වර්ෂයේ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ නිලධාරීන් සහ නිලධාරිනියන් වෙත වාර්ෂික නිල ඇඳුම් නිකුත් කිරීම සඳහා කලිසම් මැසීම. | 2020 සැප්තැම්බර් මස 09 වන දින පැය 1030 | රු. 2,000/- |

2. ලංසු කැඳවීම ජාතික තරඟකාරී ලංසුකරණ පටිපාටියට අනුව සිදුකරනු ලැබේ.

3. මෙම ප්‍රසම්පාදන පිළිබඳ උනන්දුවක් දක්වන ලංසුකරුවන් හට ශ්‍රී ලංකා ගුවන් හමුදා **www.airforce.lk** වෙබ් අඩවියෙහි පළකර ඇති ලංසු ලේඛන පරීක්ෂා කිරීමෙන් අනතුරුව **2020 අගෝස්තු මස 19** වෙනි දින සිට **2020 සැප්තැම්බර් මස 08** වෙනි දින දක්වා සතියේ වැඩ කරන දිනවලදී **1000 පැයේ** සිට **1400 පැය** දක්වා කාලය තුළ [illegible]

4. මුද්‍රා තබන ලද ලංසු පිටපත් දෙකකින් යුක්තව ලංසුව අවසන් වන වේලාවට පෙර "දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති" වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ [illegible]

5. [illegible]

6. ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ කටුනායක කඳවුර වෙත සැපයීම සිදු කළ යුතු ය. [illegible]

7. මේ පිළිබඳ වැඩිදුර විස්තර පහත දුරකථන අංක වලට අදාළ නිලධාරීන් ඇමතීමෙන් ලබාගත හැක. ප්‍රධාන ප්‍රසම්පාදන නිලධාරී - (දුරකථන - 011-2325468) හෝ ප්‍රසම්පාදන නිලධාරී (ටෙන්ඩර්) (011-2441553 හෝ 011-2441044 දිගුව 23569 ෆැක්ස් අංක- 011-2441553 සහ 011-247694).

8. ඉහත සියලු කරුණු සඳහා පහත දැක්වෙන ලිපිනය භාවිතා කළ හැක.

ශ්‍රී ලංකා ගුවන් හමුදාව
අංක 140,
සර් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,

**ගුවන් හමුදා මූලස්ථානය**
**තැ.පෙ. 1592,**
**කොළඹ - 02**

**ගුවන් හමුදාපති**

සිළුමිණ சிழுமின The Silumina

# ටෙන්ඩර් හා අනෙකුත් දැන්වීම්

## විකිණීමට
## Mazda – 3
## Brand new – Japan

සී. ඩබ්ලිව්. මැකී පී.එල්.සී විසින් තාවකාලිකව ගෙන්වන ලද Mazda – 3, අලුත්ම, 2011 වසරේ නිෂ්පාදිත කාර් රථය විකිණීමට ඇත.

2020 අගෝස්තු මස 24 වන දින සිට සැප්තැම්බර් මස 04 වන දින දක්වා පෙ.ව. 9.00 සිට ප.ව. 4.30 දක්වා පහත සඳහන් ලිපිනයේදී වාහනය පරීක්ෂා කළ හැකිය.

ටෙන්ඩර් පත්‍රිකා ආපසු නොගෙවන රු.200/- ක ගෙවීමක් මත පහත ලිපිනයේ කාර්යාලයෙන් ලබාගත හැකිය.

2020 සැප්තැම්බර් මස 04 වන දින ප.ව. 4.30 ට ටෙන්ඩරය වසනු ලැබේ.

සාමාන්‍යාධිකාරී - සමූහ භාණ්ඩාගාර

**සී. ඩබ්ලිව්. මැකී පී.එල්.සී.**

නො. 36, ඩී.ආර්. විජේවර්ධන මාවත, කොළඹ 10.
දුරකථන: 011 2423554

## මිල ගණන් කැඳවීමයි.

**ප්‍රධාන පෙළේ රබර් කිරි නිෂ්පාදන ආයතනයක ලීටර් 1,000,000ක (දශලක්ෂයක්) කිරි ගබඩා කිරීමට විශාල ප්‍රමාණයේ යකඩ ටැංකි සෑදීම සඳහා මිල ගණන් කැඳවනු ලැබේ.**

**විමසීම් : 071 682 32 38**

විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය
**සීමාසහිත ලංකා කෝල් (පුද්ගලික) සමාගම**

## ලංසු කැඳවීම

**LCC/HV/CH/20-22/2**

**කොලුවල, සීමාසහිත ලංකා කෝල් (පුද්ගලික) සමාගම සඳහා බදු පදනම මත TOYOTA වර්ගයේ ඩබල් කැබ් රථයක් කුලියට ගැනීම.**

කොලුවල, සීමාසහිත ලංකා කෝල් සමාගමේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින්, එම ආයතනයට වසර දෙකක කාල සීමාවක් සඳහා බදු පදනම මත TOYOTA ඩබල් කැබ් වර්ගයේ වාහනයක් කුලියට ගැනීමට ලංසු කැඳවනු ලැබේ.

1. සීමාසහිත ලංකා කෝල් සමාගම සඳහා TOYOTA ඩබල් කැබ් වර්ගයේ වාහනයක් (2000 cc) බදු පදනම මත ලබා ගැනීම අවශ්‍ය වේ.
   - නිෂ්පාදිත වර්ෂය 2019/2020 හෝ ලියාපදිංචි නොකළ විය යුතුය.
2. යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන්හට **රු. 500.00** ක ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව සම්පූර්ණ ලංසු අයදුම්පත් කට්ටලයක් සීමාසහිත ලංකා කෝල් සමාගමේ ප්‍රසම්පාදන අංශය මගින් **2020.08.26** වන දින සිට **පෙ.ව. 9.00 - ප.ව. 4.00** දක්වා කාලය තුළ ලබා ගත හැකිය.
3. මුද්‍රා තබන ලද ලංසු **2020 සැප්තැම්බර් මස 09** වන දින **පෙ.ව. 10.00** ට හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනයට ගෙනවිත් භාරදිය යුතු අතර ලංසු භාරගැනීම අවසන් වූ විගස ලංසු විවෘත කිරීම සිදු කරනු ලැබේ.

   **සභාපති/ප්‍රසම්පාදන කමිටුව**
   **සීමාසහිත ලංකා කෝල් සමාගම**
   **අංක: 51/3, පුරහිමල පෙදෙස, දුටුගැමුණු වීදිය,**
   **කොහුවල/දෙහිවල, ශ්‍රී ලංකාව 10350**
4. ලංසුව විවෘත කරන අවස්ථාව සඳහා ලංසුකරු හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකු (එක් පුද්ගලයෙකු) පමණක් සහභාගී විය හැකි ය.
5. වැඩිදුර විස්තර සඳහා සහකාර ප්‍රසම්පාදන කළමනාකාර, සීමාසහිත ලංකා කෝල් සමාගම දුරකථන : 011-2824681/2 හෝ +94-777875219 ෆැක්ස්: 011-2824689, විද්‍යුත් තැපෑල : sujantha.pm@lankacoal.lk මගින් ලබාගත හැකිය.

සභාපති / ප්‍රසම්පාදන කමිටුව
සභාපති හා කළමනාකාර අධ්‍යක්ෂ කාර්‍යාලය,
**සීමාසහිත ලංකා කෝල් (පුද්ගලික) සමාගම**
අංක. 51/3, පුරහිමල පෙදෙස, දුටුගැමුණු වීදිය,
කොහුවල/දෙහිවල, ශ්‍රී ලංකාව 10350.

## රත්මලාන
## කාර්මික දේපළක් විකිණීමට

(01) කර්මාන්ත ශාලාවකට / කාර්යාල සංකීර්ණයකට ඉහළ පරිමාණයේ දේපළ සංවර්ධනයකට යෝග්‍යයි.

(02) දේපළ ගාලු පාරට මීටර් 500 දුරින් තෙලවල පාරට මායිම්ව පිහිටි 738 ක ඉඩමකි.

(03) ඉඩමේ ව.අඩි. 58469 එකතුවක කාර්යාල ගොඩනැගිලි හා ගබඩා පහසුකම් ඇත.

(04) මිල සාකච්ඡා කරගත හැක.

**අමතන්න - ධනුෂ්ක**
**ජංගම දුරකථනය : 076-6714333**

## දැන්වීමයි !
## වරාය හා නාවික අමාත්‍යාංශය

වරාය හා නාවික අමාත්‍ය ගරු රෝහිත අබේගුණවර්ධන මැතිතුමාගේ උපදෙස් හා මග පෙන්වීම අනුව මෙම අමාත්‍යාංශය හා ඒ යටතේ පවතින ආයතනයන් වන ශ්‍රී ලංකා වරාය අධිකාරිය, ශ්‍රී ලංකා නැව් සංස්ථාව හා වෙළඳ හා නාවික ලේකම් කාර්යාලය යන ආයතනයන්ගේ නාමයන් භාවිතා කර සිදුකරනු ලබන මූල්‍ය සහ විවිධ වංචා සහගත සිදුවීම් වළක්වා ගැනීමේ අරමුණින් එවැනි කාරණා සම්බන්ධව තොරතුරු ලබාදීම සඳහා පහත දුරකථන අංකයන් හා සම්බන්ධ විය හැකි බැව් දන්වා සිටිමි.

| තනතුර | ආයතනය | දු. අංකය |
|---|---|---|
| ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | - වරාය හා නාවික අමාත්‍යාංශය | 011-2323258 |
| අධ්‍යක්ෂ (සේවා සැපයුම්) | - ශ්‍රී ලංකා වරාය අධිකාරිය | 011-2324096 |
| සහකාර සාමාන්‍යාධිකාරී (මානව සම්පත්) | - ලංකා නැව් සංස්ථාව | 011-2449236 |
| නීති නිලධාරී | - වෙළඳ හා නාවික ලේකම් කාර්යාලය | 011-2449236 |

**ලේකම්,**
**වරාය හා නාවික අමාත්‍යාංශය.**

# කොළඹ විශ්වවිද්‍යාලය

## ලංසු ආරාධනයයි

### විද්‍යාගාර උපකරණ සහ යන්ත්‍රෝපකරණ / පරිගණක යන්ත්‍ර / ටැබ්ලට් පුද්ගලික පරිගණක යන්ත්‍ර / ලැප්ටොප් පරිගණක යන්ත්‍ර

කොළඹ 03, කොළඹ විශ්වවිද්‍යාලයේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු මහා පරිමාණ, කුඩා පරිමාණ), සභාපති විසින් ඉහත සඳහන් භාණ්ඩ සහ සේවාවන් සැපයීම සහ ගෙනැවිත් භාරදීම සඳහා යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන් වෙතින් මුද්‍ර තබන ලද ලංසු කැඳවනු ලැබේ.
මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් පහත වගුවේ 04 වන තීරුවේ ස්ථානය වෙතින් වැඩිදුර තොරතුරු ලබාගත හැකි අතර, එම ස්ථානයේදී පෙ.ව. 9.00 හා ප.ව. 3.30 අතර, නොමිලේ ලංසු ලිපිලේඛන පරීක්ෂා කර බැලිය හැකි අතර, http://www.cmb.ac.lk යන විශ්වවිද්‍යාල වෙබ් අඩවියෙන් ලිපිලේඛන පරීක්ෂා කර බැලිය හැකිය.

ලංසු භාරගැනීමේ අවසාන දිනයට පෙර දින දක්වා කාර්යාල වේලාව තුළදී (ඕනෑම රාජකාරී දිනයක පෙ.ව. 9.00 සහ ප.ව. 3.30 අතර) ලංසු ලිපිලේඛන එක් කට්ටලයක් සඳහා පහත වගුවේ 05 වන තීරුවේ සඳහන් ආපසු ගෙවනු නොලබන ගාස්තුව ගෙවීමෙන් අනතුරුව ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් ඉංග්‍රීසි බසින් සකස් කරන ලද ලංසු ලිපිලේඛන සම්පූර්ණ කට්ටලයක් මිලදී ගත හැකිය. ඕනෑම මහජන බැංකු ශාඛාවක 505170600013 යන යොමු අංකය භාවිත කරමින් තිඹිරිගස්යාය මහජන බැංකුවේ පවත්වාගෙන යනු ලබන කොළඹ විශ්වවිද්‍යාලයේ ප්‍රධාන රැස්කිරීමේ ගිණුම වෙත ආපසු ගෙවනු නොලබන ගාස්තුව ගෙවිය හැකිය.

ලංසු භාරගැනීමේ අවසාන දිනට පෙර ලැබෙන පරිදි ලංසු කොළඹ විශ්වවිද්‍යාලයේ රෙජිස්ට්‍රාර් කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලීමට හෝ ලියාපදිංචි තැපැල් මගින් කොළඹ 03, කුමාරතුංග මුණිදස මාවත, අංක 94, කොළඹ විශ්වවිද්‍යාලයේ විදුහල් ශාහයේ රෙජිස්ට්‍රාර් කාර්යාලය වෙත ලැබෙන්නට සැලැස්විය යුතුය. පහත වගුවේ 02 වන තීරුවේ සඳහන් ලංසු භාරගැනීමේ අවසාන දිනය හා වේලාව ඉක්මවූ වහාම එම අවස්ථාවට පැමිණ සිටින ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන් ඉදිරියේ ලංසු විවෘත කරනු ලැබේ. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**DPC - දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව**

| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 |
|---|---|---|---|---|---|---|---|
| ලංසු අංකය / අයිතම් විස්තරය | ලංසු භාරගන්නා අවසාන දිනය හා වේලාව | ප්‍රසම්පාදන කමිටුව | ලංසු ලිපිලේඛන ලබාගත හැකි ස්ථානය / දුරකථන අංකය | ආපසු ගෙවනු නොලබන ගාස්තුව (රු.) | ලංසු ඇපකරයේ වටිනාකම (රු.) | අරමුදල් මූලාශ්‍රය | ඇස්තමේන්තුගත පිරිවැය (රු.) |
| SAB/FOT/NCB/2020/07<br>කොළඹ විශ්වවිද්‍යාලයේ තාක්ෂණ පීඨයේ මෙවලම් හා ස්වයංක්‍රීය තාක්ෂණ අංශයේ යාන්ත්‍රික වැඩහල (අංක 01) සඳහා යන්ත්‍රාගාර සහ යන්ත්‍රෝපකරණ සැපයීම, ගෙනැවිත් භාරදීම, ස්ථාපනය හා ක්‍රියාත්මක කොට පෙන්වීම. | 2020.09.17 දින<br>වේලාව :<br>ප.ව. 2.30 | DPC | ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී,<br>ගිණුම් ශාඛාව,<br>තාක්ෂණ පීඨය,<br>කොළඹ විශ්වවිද්‍යාලය.<br>දුරකථනය : 0112078646 | රු. 12,500/- | රු. 505,000/- | භාණ්ඩාගාර අරමුදල් | රු. 50,200,000/- |
| SAB/FOT/NCB/2020/08<br>කොළඹ විශ්වවිද්‍යාලයේ තාක්ෂණ පීඨයේ මෙවලම් හා ස්වයංක්‍රීය තාක්ෂණ අංශයේ යාන්ත්‍රික වැඩපල (අංක 02) සඳහා යන්ත්‍රාගාර සහ යන්ත්‍රෝපකරණ සැපයීම, ගෙනැවිත් භාරදීම, ස්ථාපනය හා ක්‍රියාත්මක කොට පෙන්වීම. | 2020.09.17 දින<br>වේලාව :<br>ප.ව. 2.30 | DPC | ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී,<br>ගිණුම් ශාඛාව,<br>තාක්ෂණ පීඨය,<br>කොළඹ විශ්වවිද්‍යාලය.<br>දුරකථනය : 0112078646 | රු. 12,500/- | රු. 540,000/- | භාණ්ඩාගාර අරමුදල් | රු. 54,000,000/- |
| SAB/FS/NCB/2020/01<br>කොළඹ විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨයේ රසායන විද්‍යා අංශය සඳහා FTIR Spectrophotometer 01 ක් සැපයීම, ස්ථාපනය, ක්‍රියාත්මක කොට පෙන්වීම සහ පුහුණු කිරීම | 2020.09.17 දින<br>වේලාව :<br>ප.ව. 2.30 | DPC | ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී,<br>ගිණුම් ශාඛාව,<br>විද්‍යා පීඨය,<br>කොළඹ විශ්වවිද්‍යාලය.<br>දුරකථනය : 0112500474 | රු. 2000/- | රු. 55,000/- | රසායන විද්‍යා අංශයේ සංවර්ධන අරමුදල් | රු. 5,500,000/- |
| CCUC/AB/NCB/2020/1<br>කොළඹ විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨය සඳහා All in One පරිගණක යන්ත්‍ර, ටැබ්ලට් පුද්ගලික පරිගණක යන්ත්‍ර සහ ලැප්ටොප් පරිගණක යන්ත්‍ර සැපයීම හා ගෙනැවිත් භාරදීම | 2020.09.17 දින<br>ප.ව. 2.30 | DPC | සහකාර මූල්‍යාධිකාරී<br>RMU<br>කොළඹ විශ්වවිද්‍යාලය,<br>දුරකථනය : 0112505759 | රු. 3,500/- | රු. 100,000/- | උත්පාදනය කළ අරමුදල් | රු. 6,225,000/- |

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**කොළඹ විශ්වවිද්‍යාලය,**
**94, කුමාරතුංග මුණිදාස මාවත,**
**කොළඹ 03.**

## ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව

### අභිලාෂය ප්‍රකාශ කිරීම් සඳහා ආරාධනය

**සැපයුම් සේවා සංග්‍රහ සහ විදුලි පාරිභෝගික අයිතිවාසිකම් හා වගකීම් ප්‍රකාශය යාවත්කාලීන කිරීම සඳහා උපදේශන සේවා සැපයීම**

සැපයුම් සේවා සංග්‍රහ සහ විදුලි පාරිභෝගික අයිතිවාසිකම් හා වගකීම් ප්‍රකාශය යාවත්කාලීන කිරීම සඳහා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවට සහාය වීම සඳහා සුදුසුකම්ලත් පාර්ශ්වයන්ගෙන් අභිලාෂ ප්‍රකාශ කිරීම් කැඳවනු ලැබේ.

අභිලාෂ ප්‍රකාශ කිරීම් ඉදිරිපත් කිරීම සඳහා පරිශීලනය කළ යුතු මාර්ගෝපදේශ ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ වෙබ් අඩවියෙන් බාගත හැකිය. (www.pucsl.gov.lk).

අභිලාෂ ප්‍රකාශ කිරීම් 2020 සැප්තැම්බර් මස 8 වැනි දින පස්වරු 4.00 ට පෙර ඉදිරිපත් කළ යුතු වේ. අභිලාෂය ඉදිරිපත් කරන ලිපි කවරයෙහි ප්‍රසම්පාදනයේ මාතෘකාව සඳහන් කළ යුතුය.

**සභාපති,**
**දෙපාර්තමේන්තු උපදේශන ප්‍රසම්පාදන කමිටුව,**
**ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව,**
**6 වන මහල, ලංකා බැංකු වෙළඳ කුලුන,**
**අංක 28, සාන්ත මයිකල් පාර, කොළඹ 03.**

**දුරකථන : + 94-112392607/8 ෆැක්ස් : +94-112392641**
**ඊමේල්: regulate@pucsl.gov.lk, pucsl.regulate@gmail.com**
**දිනය: 2020.08.23**

---

## කොළඹ වරායේ සිට ලොරි රථ මගින්

කිරුළපන, නුගේගොඩ, කොහුවල, කෝට්ටේ ආදී ප්‍රදේශවලට

**සිමෙන්ති ප්‍රවාහනය කිරීම සඳහා මිල ගණන් කැඳවනු ලැබේ.**

ඊමේල් : cemdist1947@gmail.com

---

## කළුගලක් සහිත ඉඩමක් බලපත්‍ර සමඟ විකිණීමට

වැලිමඩ ලුණුවත්ත ප්‍රදේශයේ තනි කන්දක පිහිටි තනි කළු ගලක් සහිත ඉඩමක් ගෙයක් සහ තෙකලා විදුලිය සමග විකිණීමට ඇත. කැනීම් සහ වෙළඳ බලපත්‍ර සහිතයි.

0777700123

---

## විසඳුම් නැති ප්‍රශ්න?

ඔබ හෝ දරුවන් දුම්වැටි මත්පැන් හෝ මත් ද්‍රව්‍යයට ඇබ්බැහි වී මිදීමට නොහැකිද?

අසහනය හෝ හද ගිනි ඇවිලේද?

කළණ මිතුරාට ඔබගේ දුරකථන අංකය ලියා සිරිසඳහම් සිසිල ලැබ සුවපත් දිවියක් අරඹන්න.

**තැ. පෙ. අංක 01, දැඩිගමුව.**

---

Aitken Spence

## ටෙන්ඩර් නිවේදනය

**ඉවතලන කඩදාසි (Waste Paper) සහ කපා වෙන්කරන ලද බෝඩ් සහ කඩදාසි කොටස් (Off Cuts) විකිණීම සඳහා මිල ගණන් කැඳවීම**

ඉවතලන කඩදාසි (Waste Paper) සහ කපා වෙන්කරන ලද බෝඩ් සහ කඩදාසි කොටස් (Off Cuts) [illegible] රු. 300.00 [illegible]

[illegible] 8.30 [illegible] 4.30 [illegible]

[illegible] 2020 අගෝස්තු මස 26 [illegible] 2976312 [illegible]

[illegible]

Aitken Spence Printing

---

## පාදුක්ක නිවසක් සහිත ඉඩමක් විකිණීමට ඇත

නිවසක් සමග අක්කරයක ඉඩම විකිණීමට ඇත. නිවස නිදන කාමර 5 කින්ද නාන කාමර තුනකින්ද විශාල මුළුතැන්ගෙයකින්ද, ගබඩා කාමරයක් සහ අමතර කාමරයකින්ද සමන්විතය. ළිං ජල පහසුකම් සහිතය. ගරාජ් දෙකකින්ද සමන්විත අතර, අවශ්‍ය නම් මාර්ගයෙන් සැපයෙන ජල පහසුකම්ද ලබාගත හැක. අඹ රඹුටන්, මැංගුස් ඇතුළු පළතුරු වර්ග වලින්ද තැඹිලි, පොල්, කොස්වලින්ද සමන්විත වත්ත අක්කරයක් ඇත. පැමිණ බැලීමට හැකිය. වත්ත දෙපසින් බස් මාර්ග ඇත. වැඩි විස්තර සඳහා විමසන්න.

0726951852

---

## වකුගඩු දෙකම අක්‍රිය වී ඇති රෝගියකුට

ජීවිතය අවදානම් තත්ත්වයක පසුවන බැවින් හැකි ඉක්මණින්ම O වර්ගයේ වකුගඩුවක් අවශ්‍ය බව වෛද්‍යවරු පවසයි. එම නිසා O වර්ගයේ වකුගඩුවක් ලබාදීමට කැමති පරිත්‍යාගශීලී අයකු සිටී නම් වහාම අමතන්න.

**දුර අංක: 0701163257 (දිල්රුක්ෂි)**

---

## ප්‍රසම්පාදන දැන්වීමයි

### මාතර බෝධි ආරක්ෂක සභාව

මාතර බෝධි ආරක්ෂක සභාවහි ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පහත සඳහන් වැඩ (කාර්ය) අයිතම සඳහා **මාතර බෝධියේ, මාතර බෝධි ආරක්ෂක සභා කාර්යාලයේදී 2020 සැප්තැම්බර් මස 14 වන දින පෙ.ව. 10.30 දක්වා** මුද්‍රා තබන ලද ලංසු භාරගනු ලැබේ.

මුද්‍රා තබන ලද ලංසු පැමින සිටින ලංසුකරුවන්ගේ ඔවුන්හෝ බලයලත් නියෝජිතයින් ඉදිරියේදී මාතර බෝධි ආරක්ෂක සභා කාර්යාලයේදී 2020 සැප්තැම්බර් මස 14 වන දින පෙ.ව. 11.00 ට විවෘත කරනු ලැබේ.

| විස්තරය | අවශ්‍ය ලියාපදිංචි ශ්‍රේණිය | ආපසු ගෙවනු ලබන ටෙන්ඩර් තැම්පතුව (රු.) | ඉදිකිරීම් කාල සීමාව (දින) | ආපසු ගෙවනු නොලබන ටෙන්ඩර් ගාස්තුව (රු.) | ඉංජිනේරු ඇස්තමේන්තුව (වැට් බදු රහිතව) |
|---|---|---|---|---|---|
| කොටවිල අපේක්ෂා පියස- "මාතර" වාට්ටුව (Ward) ඉදිකිරීම අදියර I | C4 හෝ ඉහළ ශ්‍රේණි | රු. 300,000.00 | දින 180 | රු. 2,000.00 | රුපියල් මිලියන 36 |

01. අපේක්ෂිත ලංසුකරුවන්හට, ලංසු ලිපි ලේඛන, මෙම ආරාධනා ලිපිය හා ලියාපදිංචි පොත් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව **2020 සැප්තැම්බර් මස 10 වන දින ප.ව. 4.30 දක්වා** කාර්යාල වේලාවන් තුළදී, මාතර බෝධියේ, මාතර බෝධි ආරක්ෂක සභා කාර්යාලයේදී ලබා ගත හැකිය.

02. ලංසු බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ, කර්මාන්තයේ නම පැහැදිළිව සටහන් කළ යුතුය. ලංසු අනුපිටපතකින්ද යුක්තව (පිටපත් 2) **2020 සැප්තැම්බර් මස 14 වන දින පෙ.ව. 10.30 ට හෝ ඉන් පෙර ලැබෙන සේ මාතර බෝධි ආරක්ෂක සභාවේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති** වෙත භාර දිය යුතුය. ලංසු විවෘත කරනු ලබන අවස්ථාවට පැමිණ සිටින ලෙස ලංසුකරුවන්ට හෝ බලයලත් නියෝජිතයින් හට ආරාධනය කරනු ලැබේ. සියලු අසම්පූර්ණ ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03. ලංසු වලංගු කාල සීමාව මාස 3 ක් (තුනක්) වනු ඇත.

04. සියලුම ලංසු සමග රුපියල් 300,000.00 (තුන් ලක්ෂයක) වටිනාකමින් යුත්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කර ඇති පිළිගත් බැංකුවකින් ලබාගත් හෝ ඉදිකිරීම් ඇපකර අරමුදල (CGF) මගින් අනුමත කර ඇති ලංසු සුරක්ෂණ ඇපකරයක්ද ඉදිරිපත් කළ යුතුය. එම ලංසු සුරක්ෂණය 2021 ජනවාරි 11 වන දින දක්වා වලංගු විය යුතුය.

**ගරු සභාපති,**
**මාතර බෝධි ආරක්ෂක සභාව.**
**දුරකථනය : 041-2222983**
**2020-08-23**

**ගරු ලේකම්,**
**මාතර බෝධි ආරක්ෂක සභාව.**

---

## වෙළඳ අමාත්‍යාංශය

## සමුපකාර තොග වෙළඳ සංස්ථාව

**සතොස විසින් ආනයනය කරන ලද කුඩා ප්‍රමාණයේ සහල් සැකසුම් යන්ත්‍ර 140 ක් ටෙන්ඩර් (Korean Donyan AM 15 - Single Phase) කැඳවා අලෙවි කිරීම**

ඉහත සඳහන් සහල් සැකසුම් යන්ත්‍ර සතොස, මැකලම් ගබඩා පරිශ්‍රයේදී 2020.08.24 වනදින සිට 2020.09.11 වනදින දක්වා රජයේ කාර්යාල වැඩ කරන දින තුළ පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 පරික්ෂා කර බැලිය හැකි අතර, අදාළ ටෙන්ඩර් අයදුම්පත් මුදල් අයකැමි වෙත ආපසු නොගෙවනු ලබන රු. 1,000.00 ක් හා ආපසු ගෙවනු ලබන රු. 5,000.00 ක් ගෙවීමෙන් පසු ප්‍රසම්පාදන අංශයෙන් ලබාගත හැක.

ටෙන්ඩර් අයදුම්පත් 2020.09.14 වන දින 14.00 පැයට ප්‍රථම අංක 20 දරන ටෙන්ඩර් පෙට්ටියට බහා ලීමට කටයුතු කළ යුතු අතර, එම අවස්ථාවේදීම මිල ගණන් විවෘත කරනු ලැබේ. එම අවස්ථාවට අයදුම්කරුට හෝ ඔහුගේ බලයලත් එක් නියෝජිතයෙකුට සහභාගි විය හැකිය.
වැඩිදුර තොරතුරු සහ පරික්ෂා කිරීමට පහත සඳහන් දුරකථන අංකය අමතන්න.

- ඩී.ජී.එම්. චන්දන මයා - 071-4420427

අවසන් තීරණය ටෙන්ඩර් මණ්ඩලය සතුවේ.

**සභාපති,**
**ප්‍රසම්පාදන කමිටුව,**
**සමුපකාර තොග වෙළඳ සංස්ථාව,**
**අංක 27, වෝක්ෂෝල් වීදිය, කොළඹ 02.**

---

# කොළඹ විශ්වවිද්‍යාලය (UOC)

# ලංසු සඳහා ආරාධනයයි (IFB)

## ඉදිකිරීම් කොන්ත්‍රාත්තු, කොළඹ විශ්වවිද්‍යාලය

කොළඹ 03, කොළඹ විශ්වවිද්‍යාලයේ, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (ප්‍රධාන / සුළු පරිමාන), හි සභාපති විසින්, **පහත සඳහන් ඉදිකිරීම්, නව්‍යකරණ හා අලුත්වැඩියා කිරීම් කොන්ත්‍රාත්තු** සඳහා, යෝග්‍යතාපූර්ණ හා සුදුසුකම්ලත්, ලංසුකරුවන් (කොන්ත්‍රාත්කරුවන්) වෙතින් මුද්‍රා තබන ලද ලංසු දැන් කැඳවනු ලැබේ.

අභිලාෂී, යෝග්‍යතා සපිරි, නිපුන ලංසුකරුවන්හට, වැඩිදුර තොරතුරු විස්තර ලබා ගැනීමත්, ලංසු ලිපි ලේඛන පරීක්ෂා කර බැලීමත්, පහත වගුවේ 04 වන තීරුවේ සඳහන් අදාළ ස්ථානයේදී / ස්ථානවලදී, පෙ.ව. 9.00 සිට ප.ව. 3.30 දක්වා අතරතුර, ගාස්තු ගෙවීමකින් තොරව, නොමිලේ, සිදු කරවාගත හැකිවන අතර, නැතහොත් ලංසු ලිපි ලේඛන, විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවිය වන http://www.cmb.ac.lk වෙත පිවිසීමෙන්ද පරීක්ෂා කර බැලිය හැකිය.

අභිලාෂී, සුදුසුකම් ලත් ලංසුකරුවන් හට, ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කරන ලද අංග සම්පූර්ණ ලංසු ලිපිලේඛන කට්ටලයක්, එක් එක් ලංසු ලිපි ලේඛන කට්ටලය සඳහා, පහත වගුවේ 05 වන තීරුවේ දක්වා ඇති ආපසු ගෙවනු නොලබන ගාස්තුව ගෙවීමෙන් හා පහත ලිපිනයට ලිඛිත ඉල්ලීමක් / අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව, කාර්යාල වේලාවන් තුළදී, (ඕනෑම රාජකාරී දිනයකදී – පෙ.ව. 9.00 සිට ප.ව. 3.30 දක්වා අතරතුර), ලංසු භාර ගන්නා අවවසාන දිනට පෙර දින දක්වා මිලදී ලබා ගත හැකිය. එම ආපසු ගෙවනු නොලබන ගාස්තුව, කොළඹ විශ්වවිද්‍යාලයේ ප්‍රධාන රැස්කිරීමේ ගිණුමට (මහජන බැංකුවේ, තිඹිරිගස්යාය ශාඛාවට) ඕනෑම මහජන බැංකු ශාඛාවකින්, යොමු අංක 505170600013 භාවිතා කරමින්, ගෙවිය හැකි වනු ඇත.

සම්පූර්ණ කරන ලද ලංසු, **කොළඹ 03, කුමාරතුංග මුනිදාස මාවතේ, අංක 94 හි, කොළඹ විශ්වවිද්‍යාලයේ, විද්‍යාල මන්දිරයේ, ලේඛකාධිකාරි, කාර්යාලය** වෙත ලැබෙනසේ, එම ලංසු භාර ගන්නා අවසාන දිනය හා වේලාවට හෝ ඊට පෙර ලැබෙන සේ එවීම හෝ කොළඹ විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරි කාර්යාලයේ මේ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම හෝ කළ යුතුය. ලංසු, එම ලංසු භාරගන්නා අදාළ අවසාන දිනය හා වේලාව ඉක්මවූ වහාම (ඉහත වගුවේ 02 වන තීරුවේ සඳහන් කර ඇති පරිදි, පැමිණ සිටින ලංසුකරුවන් සහ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින් ඉදිරියේදී, විවෘත කරනු ලැබේ. ප්‍රමාද ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 |
|---|---|---|---|---|---|---|---|
| **ලංසු අංකය / අයිතම විස්තරය** | **ලංසු භාරගන්නා අවසාන දිනය හා වේලාව** | **ප්‍රසම්පාදන කමිටුව** | **ලංසු ලිපි ලේඛන මිලදී ගත හැකි ස්ථානය / එහි දුරකථන අංක** | **ආපසු ගෙවනු නොලබන ටෙන්ඩර් ගාස්තුව (රු.)** | **ලංසු සුරක්ෂණ ඇපකරයේ වටිනාකම (රු.)** | **අරමුදල් ප්‍රභවය** | **පිරිවැය ඇස්තමේන්තුව** |
| MD/MR/C/16/2020 කොළඹ විශ්වවිද්‍යාලයේ නීති පීඨයේ ප්‍රධාන ගොඩනැගිල්ලේ වහල අලුත්වැඩියා කිරීම | 2020-09-17 වන දින වේලාව ප.ව. 2.30 දක්වා | දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (DPC) | ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී, පීඨාධිපති කාර්යාලය, නීති පීඨය කොළඹ විශ්වවිද්‍යාලය, ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී (SAR) දුරකථන : 0112-500942 | රු. 5,000/- | රුපියල් 200,000/- | භාණ්ඩාගාර අරමුදල් | රු. 23,000,000/- |
| MD/MR/B/17/2020 සුහුරු පංති කාමර නව්‍යකරණය (කාමර අංක 118) ශාස්ත්‍ර පීඨය | 2020-09-17 වන දින වේලාව ප.ව 2.30 දක්වා | දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (DPC) | නියෝජ්‍ය ලේඛකාධිකාරී / විධාපති කාර්යාලය, ශාස්ත්‍ර පීඨය කොළඹ විශ්වවිද්‍යාලය, නියෝජ්‍ය ලේඛකාධිකාරී දුරකථන : 0112-500442 | රු. 1,500/- | රුපියල් 50,000/- | කොන්ෆියුසිස් ආයතන අරමුදල් | රු. 4,000,000/- |

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (DPC),**
**කොළඹ විශ්වවිද්‍යාලය (UOC),**
**අංක 94, කුමාරතුංග මුනිදාස මාවත,**
**කොළඹ 03.**

# කුකුළු නිෂ්පාදකයන්ගේ ගැටලු නිසා අහස උසට නඟින

# බිත්තර මිල



● සුභාෂිණී ජයරත්න

**ලංකාවේ කුකුළු මස් හා බිත්තර ව්‍යාපාරය බෙහෙවින් ලාබ ලබන මෙන්ම රජයට බදු අය වන ආදායම් මාර්ගයක් වන අතර මෙම ව්‍යාපාරය හරහා සෘජු හා වක්‍ර ආදායම් මාර්ග උපයන මිලියනයකට ආසන්න ජීවිත ප්‍රමාණයක් කොරෝනාවේ අතුරු විපත් හමුවේ මේ වන විටත් දැඩි ජීවන අරගලයකට මුහුණ දුන් බව නොරහසකි.**

කොවිඩ් වසංගත පාලනයට පසුගිය කාලයේ රට පුරා පැනවූ ඇඳිරි නීතිය නිසාවෙන් බොහෝ පළාත්වල බිත්තර සියයට 60 ක ප්‍රමාණයක් ඉතුරු වූයෙන් එදා බිත්තරයක් සිල්ලර මිලට විකිණුයේ රුපියල් 8-10 වැනි ඉතා අඩු මිලකටය. බිත්තර ලාබදායි අඩු වියදමකින් වේල පිරිමසා ගත හැකි ආහාරයක් නිසාවෙන් පසුගිය කාලයේ බොහෝ දෙනෙක් බිත්තර ආහාරයට එක්කර ගැනීමට හුරු විය. අදත් බිත්තරවලට විශාල ඉල්ලුමක් පැවතුණද පසුගිය කාලයට සාපේක්ෂව මේ වන විට බිත්තරයක මිලද අතිශයින්ම ඉහළ ගොස් ඇත. මේ වන විට කොළඹ මැනිං වෙළෙඳ පොළේ බිත්තරයක තොග මිල රුපියල් 21.50 ත් දුඹුරු බිත්තරයක මිල රුපියල් 22.50 ත් වෙයි. මේ අනුව බිත්තරයක සාමාන්‍ය සිල්ලර මිල රුපියල් 23- 24 ක් පමණ වෙයි.

## දිනකට බිත්තර ඉල්ලුම ලක්ෂ 85 ක්; ඒත් දෙන්න පුළුවන් ලක්ෂ 65 යි

එදා වැලේ වැල් නැතුව සිටි මේ කුකුළු මස්, බිත්තර ව්‍යාපාරිකයන් දැන් අතිශයින්ම ලාබ ලබන තත්ත්වයකට පත්ව ඇතැයි පාරිභෝගිකයන් මැසිවිලි නඟන්නේ අඩු ලාබදායි පෝෂ්‍ය ආහාරයට හෙණහුරා ලැබූ නිසාය.

" කොරෝනා වසංගත කාලයේ බිත්තර මිල ගොඩාක්ම අඩුවුණා. අපිට මතක ඇති කාලයක එහෙම බිත්තරයක මිල අඩු වුණේ නැහැ. මේ නිසා ගෙවල්වල ඇති තරම් බිත්තර ගෙනත් තියා ගන්න පුළුවන් වුණා. ඇඳිරි නීතිය තිබුණත් මස් මාළුවල අඩුවක් දැණුනේ නැහැ.

ඒත් දැන් බිත්තරයක් ලොකු ගණනකින් වැඩි වෙලා. මේ මිල දරා ගන්න බැහැ. එක පාරටම රුපියල් 10 කින් විතර මිල ඉහළ ගිහින්. දැන් බිත්තරයත් රුපියල් 23 කට වඩා ගණන්. සමහර තැන්වල විවිධ මිල ගණන්වලට විකුණනවා. ඒ වගේම වෙනදා තරම් බිත්තරය රස නැහැ. බිත්තර විවිධ ප්‍රමානයෙන් වගේම ගුණාත්මක බවිනුත් අඩු බවයි අපිට පේන්නේ. ....." මේ පාරිභෝගිකයෙකු වන කුරුණෑගල මාලතී සෙනෙවිරත්න මහත්මියගේ අදහසයි.

පාරිභෝගිකයෝ සිතන පරිදි බිත්තර වෙළෙන්දෝ දැන් පොහොසත්වීද? කොරෝනාවෙන් පසු බිත්තර මිල මෙසේ ක්ෂණිකව ඉහළ ගියේ ඇයි? මේ සියල්ලටම විසඳුම් ගෙනෙන ඔවුන්ගේම කතාවක් ඇත්තේය. බිත්තරය කාගේත් පෝෂණීය ආහාරයක් නිසාවෙන් ලංකාවේ ආහාරයට පමණක් නොව හෝටල් ක්ෂේත්‍රයටද දෛනික පරිභෝජනයට බිත්තර ලක්ෂ 70-75 ක් පමණ අවශ්‍ය වෙයි.

## බඩ ඉරිඟු මිල ඉහළ යෑම බිත්තර මිල ඉහළ යෑමට ප්‍රධානම හේතුවයි

නමුත් පසුගිය කාලයේ බිත්තරවලට ඇති විශාල ඉල්ලුම් හේතුවෙන් මේ විට බිත්තර ඉල්ලුම ලක්ෂ 85 දක්වා ඉහළ ගොස් ඇත්තේය.

එහෙත් කොතරම් බිත්තර මිල ඉහළ ගියද අවශ්‍ය ඉල්ලුමේ තරමට සැපයුම ලබා දෙන්නට බිත්තර වෙළෙන්දන්ට නොහැකි වී ඇති අතර මේ වන විටත් ඉල්ලුමට දිය හැක්කේ බිත්තර ලක්ෂ 65 ක ප්‍රමානයකි. බිත්තර මිල ඉහළ යාම පිටුපස බොහෝ දෙනා නොදන්නා අඳුරු කතාවක් ඇත්තේය. ඒ කොරෝනාවෙනුත්, කුකුළු ආහාර නිපදවීමට අවශ්‍ය ප්‍රධාන අමුද්‍රව්‍ය වන බඩ ඉරිඟු අහිමි වීමෙන් සිදු වූ අතුරු විපාකයන් නිසාය.

" බිත්තර මිල වැඩි වීමට හේතු කිහිපයක් බලපෑවා. ප්‍රධාන හේතුව තමයි , කුකුළු ආහාර නිෂ්පාදනයට අවශ්‍ය ප්‍රධාන අමුද්‍රව්‍ය වන බඩ ඉරිඟු නොමැතිකම.

කුකුළු ආහාර කිලෝ 100 ක් හදන්න බඩ බරිඟු කිලෝ 60 ක් යනවා. බඩ ඉරිඟු එකතු කිරිමෙනුයි, ඒ ආහාරය ශක්ති ජනක වෙන්නේ.

ඒ වගේම බිත්තරයේ කහ මදයේ වර්ණය ගෙන දෙන්නේ බඩ ඉරිඟු එකතු කිරීමෙන්. අවුරුද්දකට බඩ ඉරිඟු ලක්ෂ 6 ක් නිෂ්පාදනය කළ යුතු වුණත් දේශීයව නිෂ්පාදනය කරන්නේ ලක්ෂ 3 යි. ඒ මහා කන්නයේ හෙක්ටයාර් 80,000ක 90% ක් හා යල කන්නයේ හෙක්ටයාර් 20,000 ක 10% ක් වශයෙන්. නමුත් පසුගිය කාලයේ සේනා දළඹු ප්‍රශ්නය නිසා අපේක්ෂිත නිශ්පාදනය ලැබුණේ නැහැ. ඒ වගේම බඩ ඉරිඟු ගොවීන්ට වතුර ප්‍රශ්නය ආවා. යල කන්නයට වතුර නැති නිසා ඒ හේන් ලඳු කැළෑ වෙනවා. මේ නිසා පසුගිය රජයෙන් නීතියක් දැම්මා ලඳු කැළෑ වගා නොකරන ලෙස.

මේ නිසා කුකුළු ආහාර නිශ්පාදනයට අවශ්‍ය බඩ බරිඟු නොමැති වුණා. පසුව සමහර වෙළෙන්දන් හට විකල්පයක් ලෙස සුණු සහල් යොදා ගත්තා.

පසුව රුපියල් 35 ට තිබුනු සුණු සහල් කිලෝව රුපියල් 65 ක් දක්වා වැඩි වුණා.

අපි මේ ප්‍රශ්නය ගැන දිගින් දිගටම අපි රජය සමඟ කතා කළා. මේ වන විට බඩ ඉරිඟුවලට උපරිම සිල්ලර මිලක් නියම කළත් ගොවීන් ඒවා සඟවා ගත්තා.

කොරෝනා කාලයේ මේ ප්‍රශ්නය උග්‍ර වුණා පමණක් නෙමෙයි, බිත්තර විකුණා ගන්නත් බැරිවුණා. මේ වන විට මේ ප්‍රශ්නයට විසඳුමක් වශයෙන් බඩ ඉරිඟුවලට ආදේශකයක් සපයමින් තිරිඟු ලංකාවට ගෙන්වීමට තීරණය කළා. මේ වන විට තිරිඟු මෙට්රික් ටොන් 1,85,000 ක් මේ මස අගදී ලංකාවට ගේනවා. ඒත් තිරිඟු ගෙන්වීම මේ ප්‍රශ්නයට ආදේශකයක් නොවෙයි...". ඒ සමස්ත ලංකා කුකුළු මස් ව්‍යාපාරිකයින්ගේ සංගමයේ සභාපති අජිත් එච්. ගුණසේකරය.

සමස්ත ලංකා කුකුළු මස් ව්‍යාපාරිකයින්ගේ සංගමය පවසන්නේ තිරිඟු ගෙන්වීමෙන් බිත්තර ප්‍රශ්නයට විසඳුමක් නොලැබෙන බවයි.

මේ වන විට බිත්තර වලට හොඳ වෙළෙඳ පොළක් නිර්මාණය වී ඇත්තේය. ඒ මැද පෙරදිග වෙළෙඳ පොළයි.

නමුත් ඒ වෙළෙඳ පොළට සරිලන පරිදී බිත්තර නිශ්පාදනයට හැකියාව ලැබේද යන්න ප්‍රශ්නයකි.

සත්ව ආහාර සඳහා බඩ ඉරිඟු නොමැති වීම නිසා ගුණාත්මකව හොඳ බිත්තරයක් නිශ්පාදනයට නොහැකි වන අතර බිත්තරයක අපේක්ෂිත වර්ණයන් ගැන්වීමට රසායනිකද එක් කරන්නට සිදුවන බවයි.

" බිත්තර මිල ඉහළ යාමට සත්ත්ව කෑම ප්‍රශ්නය තමයි ප්‍රබලව බලපෑවේ. ජනතාව හිතන්නේ අපි වැඩි මිලට දෙන්නේ ලාභ තියාගෙන කියලයි.

## බිත්තර කහ මදයේ වර්ණ ගන්වන්න රසායනිකත් පාවිච්චි කරන්න සිදු වෙනවා.

දැන් අපිට ගොඩාක් ප්‍රශ්න. කුකුළන්ට දෙන කෑම වලට බඩ ඉරිඟු නොදැමීම නිසා බිත්තර කහ මදයේ වර්ණය ලැබෙන්නේ නැහැ.. මේ නිසා බිත්තර කහ මදයේ අපේක්ෂිත වර්ණය ගන්වලා විකුණන්න කැරටීන් කියන කෘතිම රසායනිකය ගන්වන්න සිදු වෙනවා. මේ රසායනිකය කිලේ 1 ක් රුපියල් 20,000 ක් වෙනවා.

එහෙම නැතිනම් මෙරිගෝල් කියන දාස් පෙතියා මලින් සකස් වූ ස්වභාවික රසායනිකය හෝ පාවිච්චි කරන්න සිදු වෙනවා. බඩ ඉරිඟු ගෙනාවොත් මේ මිල යම් ප්‍රමානයකින් අඩු කරන්න පුළුවන් වෙයි. අමුද්‍රව්‍ය මිල ඉහළ නිසා අපි පාඩුවට තමයි බිත්තර මස් දෙන්නේ. සාමාන්‍යයෙන් බඩඉරිඟු සීසන් එක ජනවාරියේදි කැඩෙනවා. ඒ වෙන කොට තොග වෙළෙන්දෝ බඩඉරිඟු රැස් කර ගන්නවා. ඒ බඩඉරිඟු ඔවුන් ළඟ තියාගෙන වැඩි මිලට විකුණනවා...."

ඒ කුලියාපිටියේ බිත්තර වෙළඳාමේ නියුතු ව්‍යාපාරිකයකු වන එස්. එම්. ඒ. ඩබ්ලිව් මායාදුන්නේය.

සත්ව ආහාර නිශ්පාදනයේ මිල ඉහළ යාම නිසා මේ වන විටත් මේ කර්මාන්තය දැඩි කඩා වැටීමකට ලක්ව ඇත.

විශේෂයෙන්ම සත්ත්ව ආහාර නිෂ්පාදනයේදි දැඩි අවශ්‍යතාවයක් පවත්නා බඩ ඉරිඟු මිල අධිකව ඉහළ යාම නිසාත් ආනයන ගැටලු මතුවිම නිසාත් මේ තත්ත්වය මතුව ඇත.

තවත් පැත්තකින් මේ අරගලය දිනා ගැනීමට නොහැකි නිසා බොහෝ කුකුළු ගොවිපළ රැසක් වැසී ගොස්ය. එය සියයට 40 ක් පමණය.

සමහරක් පිරිස් ගොවිපළේ සතුන්ගේ කෑම වියදම් දැරීමට නොහැකි නිසා විකුණා දමා ඇත්තේය.

මේ වන විට මවු සතුන්ගේ දැඩි හිඟයක් පවතින්නේ මේ හේතුව නිසාය.

එදා බිත්තර සඳහා වූ මවු සතෙකුගේ වියදම රුපියල් 150 ක් වුවද අද එය රුපියල් 300 කි. දිනකට කිකිළියකට නියමිත ප්‍රමිතියේ සලාක ආහාරය ලබා දුනහොත් වසරකට බිත්තර 300 ක් පමණ ලබා ගත හැකි වුවද දැන් මේ ප්‍රමානය සියයට 30 කින් පහත බැස ඇත.

" අපිට ෆාම් කරගෙන යන්න බැරි තත්ත්වයක් උදාවුණා. මට දවසකට රුපියල් 15,000 ක් පමණ අතින් වියදම දරන්න සිදුවුණා.

අපිට එක් දවසකට කුකුලෙකුට පමණක් ආහාර දීමට රුපියල් 15.50 ක වියදමක් දරන්න සිදු වෙනවා.

දැන් ගොඩාක් බිත්තර ෆාම් නතර වෙලා. ඒ අයගේ බැංකු ණය ගොඩ ගැහැලා. මේ නිසා කුකුලෝ විකුණන්න සිදුවුණා. මගේ ෆාම් එකේ 3000 ක් විතර විකිණුවා. එදා මම දවසකට බිත්තර 10,000 ක් විතර ගත්තා . අද ලැබෙන්නේ 6000 ක් පමණයි. මේ ප්‍රශ්නය හැම තැනම තියෙනවා.

මේ නිසා බිත්තර ඉල්ලුමට අනුව ලබා දෙන්න බැහැ. බිත්තර මිල ඉහළ යාමට ඒ ප්‍රශ්නයත් බලපෑවා. ඒ වගේම බඩ ඉරිඟු කිලෝ එකක් ලැබෙන්නේ රුපියල් 90 කට. රුපියල් 55 කට ලැබුණොත් කිසිම කතාවක් නැතුව රුපියල් 16-18 කට බිත්තර දිය හැකියි. තිරිඟු ලංකාවට ගෙන්වීමෙන් මේ ප්‍රශ්නයට විසඳුම් දෙන්න බැහැ.

තිරිඟු පිටි ආහාරයට එක් කළත් බිත්තර කහ මදය වර්ණ ගැන්විමට රසායනික පාවිච්චි කරන්න සිදු වෙනවා. මේ තිරිඟු ලංකාවට පැමිණි පසු අපි කුමක් කරනවද කියා තාම විසඳුමක් නැහැ....."ඔහු සමස්ත ලංකා කුකුල් මස් ව්‍යාපාරිකයින්ගේ සංගමයේ අධ්‍යක්ෂවරයෙකු වූ ඩී.ඩබ්ලිව්. පී මුණසිංහ මහතාය.

## පසුගිය කාලයේ කුකුළු ගොවිපළ 40% වැහුවා; කුකුළෝ විකිණුවා.

මේ නිසා බිත්තර මිල සහනය කවදා ලැබේදැයි අපේක්ෂා කළ නොහැක.

බිත්තර ගොවීන්ගේ මේ ව්‍යාපාරය කොරෝනාවෙන් පසුවටද නොවිසඳෙන ප්‍රශ්න ගණනාවකි.

විශේෂයෙන් ඔවුන් පීඩා විඳින සත්ත්ව ආහාර මිල ගණන් අවම විම මේ ප්‍රශ්නයෙන් ගැලවීමේ එකම මාර්ගයකි. රජයට වාර්ෂිකව රුපියල් බිලියන 10 ක් බදු වශයෙන් ගෙව්වද තමන්ට කිසිදු සහනාධාරයක් නොලැබෙන බව ඔවුහු චෝදනා නඟති.

රජයට විශාල වශයෙන් ලාභ හිමිවන මේ කර්මාන්ත වැටෙන්නට නොදී රැක ගැනිම රජය සතු වගකීමක් බව මේ අය ප්‍රකාශ කරති.

අද වන විට වාර්ෂිකව එක් අයකුගේ බිත්තර භාවිතය බිත්තර 115 කි. ලංකාවේ බිත්තර නිෂ්පාදනයෙන් සියයට 30 ක් යැවෙන්නේ සුපිරි වෙළෙඳ සැල්වලටය.

බිත්තර අඩු මුදලට ලොකු පොඩි කාටත් ප්‍රෝටීන් බහුල ආහාරයකි. එහෙත් කුකුළු නිශ්පාදකයන්ගේ ගැටලු තවමත් විසඳි නැත්තේය. ලොකු පොඩි කාගේත් බත්පතට එක්වන මේ බිත්තරයේ මිල අවම කරන්නට ගුණාත්මකව හොඳ බිත්තරයක් ලබා දිමට මේ ගැටලුවලට විසඳුම් ලබා දිය යුතුය.


## වෙළඳ අමාත්‍යාංශය

## සමුපකාර තොග වෙළඳ සංස්ථාව

## බදු පදනම මත කාර්යාල පරිශ්‍ර ලබාදීම සඳහා මිල ගණන් කැඳවීම

සමුපකාර තොග වෙළඳ සංස්ථාවට අයත් පහත සඳහන් කාර්යාල පරිශ්‍ර බදු පදනම මත ලබාදීම සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබේ.

| අනු අංකය | ස්ථානය | ව. අ. ප්‍රමාණය |
|---|---|---|
| 01 | 274, ශ්‍රී ජයවර්ධනපුර පාර, රාජගිරිය. | 508 |
| 02 | 165, සංඝරාජ මාවත, කොළඹ 10 - ගොඩනැගිලි අංක 1 | 1,560 |
| | - ගොඩනැගිලි අංක 2 | 4,977 |
| | - ගොඩනැගිලි අංක 3 | 6,400 |
| | - ගොඩනැගිලි අංක 4 | 223.44 |
| | - ගොඩනැගිලි අංක 5 | 90.44 |
| | - ගොඩනැගිලි අංක 6 | 130 |
| | - ගොඩනැගිලි අංක 7 | 3,450.6 |
| 03 | 160, සතොස ගබඩා සංකීර්ණය, මාළිගාවත්ත, කොළඹ 10 - ගොඩනැගිලි අංක 1 | 2,190 |
| | - ගොඩනැගිලි අංක 2 | 117 |
| | - ගොඩනැගිලි අංක 3 | 100 |
| 04 | 595, සතොස ගබඩා සංකීර්ණය, මීගමුව පාර, වැලිසර | 286 |

මුදල් අයකැමි වෙත ආපසු නොගෙවනු ලබන **රු. 1,000.00 ක** ගාස්තුවක් ගෙවීමෙන් ප්‍රසම්පාදන අංශය වෙතින් ටෙන්ඩර් අයදුම්පත් ලබා ගත හැකිය. ටෙන්ඩර් ඉදිරිපත් කිරීමේදී **රු. 10,000.00 ක** ආපසු ගෙවන ටෙන්ඩර් තැන්පතුවක් **2020.09.11 වන දින පෙ.ව. 10.00ට** පෙර ගෙවිය යුතුය.

ටෙන්ඩර් අයදුම්පත් **2020.09.11 වන දින පෙ.ව. 12.00** පැයට ප්‍රථම අංක 01 දරන ටෙන්ඩර් පෙට්ටියට බහාලීමට කටයුතු කළ යුතු අතර, එම අවස්ථාවේදීම මිල ගණන් විවෘත කරනු ලැබේ. එම අවස්ථාවට අයදුම්කරුට හෝ ඔහුගේ බලයලත් එක් නියෝජිතයෙකුට සහභාගි විය හැකිය.

කාර්යාල පරිශ්‍ර පරීක්ෂා කිරීම **2020.08.24 වන දින සිට 2020.09.10** වන දින දක්වා රජයේ කාර්යාල වැඩ කරන දින තුළ **පෙ.ව. 9.00 සිට ප.ව. 3.00** දක්වා සිදු කළ හැකිය. වැඩිදුර තොරතුරු හා කාර්යාල පරිශ්‍ර පරීක්ෂා කිරීම සඳහා පහත සඳහන් දුරකථන අංකය අමතන්න.

**ආර්. එම්. දිසානායක මයා. (ප්‍රාදේශීය සුපරීක්ෂක) - 0714952323**

අවසන් තීරණය ටෙන්ඩර් මණ්ඩලය සතුය.

**සභාපති, ප්‍රසම්පාදන කමිටුව,**
**සමුපකාර තොග වෙළඳ සංස්ථාව,**
**අංක 27, වොක්ෂෝල් වීදිය, කොළඹ 02.**







## ලලාට ධාතු නිකිණි මහා පින්කම

ගෞතම බුදුරජාණන් වහන්සේගේ ශ්‍රීමත් ලලාට ධාතුන් වහන්සේ නිදන්ගත ඓතිහාසික සේරුවිල මංගල මහා චෛත්‍ය රාජයාණන් වහන්සේ උදෙසා වාර්ෂිකව සිදු කෙරෙන ලලාට ධාතු පූජා නිකිණි මහා පිංකම මෙවරත් 26 වැනි දින සිට සැප්.02 දක්වා පුරා සතියක් පැවැත්වේ.

## දෙසැත්තෑ ඥාන පූජාවක්

කුඹල්ඔලුව ශ්‍රී සුදර්ශනාරාම විහාරස්ථානයේදී පවත්වන දෙසැත්තෑ ඥාන පූජාව සැප්. 01 වැනිදා බිනර පොහොදා පස්වරු 4.30 ට ආරම්භ කෙරේ.

## යෙහෝවා සාක්ෂිකරුවන්ගේ වාර්ෂික සමුළුව

යෙහෝවා සාක්ෂිකරුවන්ගේ ශ්‍රී ලංකාවේ සමුළුව මෙවර පැවැත්වෙන්නේ අන්තර්ජාලය ඔස්සේය. මීට සහභාගීවීමට කැමති අයට www.jw.org හරහා කොටස් හයකින් ඊට සම්බන්ධවිය හැක. මීට කිසිදු අයකිරීමක් නැති අතර සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා තුනෙන්ම එය පැවැත්වේ. සමුළුවේ අවසාන දෙදින වන්නේ අගෝස්තු 29 සහ 30 වනදාය.




තරුණ හා ක්‍රීඩා ඇමැති නාමල් රාජපක්ෂ සුබ මොහොතින් වැඩ අරඹමින්... (ඡායාරූපය - සුලෝචන ගමගේ)

# නාමල්, අපි දැන් වැඩ කරමු

**වර්ග කිලෝමීටර් හැටපන්දහසක් වන ලාංකේය භූමි භාගයේ ජව සම්පන්න නිරෝගිමත් සහ විනය ගරුක තරුණ පරපුරක් බිහි කිරීම සඳහා ක්‍රීඩාශීලී ජීවන රටාවකින් යුත් පරපුරක් නිර්මාණය කිරීමේ නව රජයේ වගකීම පැවැරී ඇත්තේ තරුණ සහ ක්‍රීඩා අමාත්‍ය නාමල් රාජපක්ෂටය. බහිරවයන් ගිලගෙන සිය ප්‍රාණ ඇපයේ තබා ගෙන ඇති ලාංකේය ක්‍රීඩාව එක් රැයකින්, අංශක තුන්සිය හැට පහකින් අනෙක් පසට හැරවිය හැකි යෂ්ටියක් තරුණ සහ ක්‍රීඩා අමාත්‍යවරයා අත නැති බව දනිමු. නමුත් ඒ සඳහා ඇවැසි ශක්තිය, උත්සහය හා කැපවීම නොඅඩුව ඇති බව ද දනිමු. අමාත්‍යවරයාට මේ නරා වළේ වැටී ඇති ලාංකේය ක්‍රීඩාව ඉන් ගොඩ ගෙන වැඩ කිරීමට නම් ඇවැසි වන්නේ වැඩකාරයන් මිස අඳ බිහිරි ගොළුවන් නොවේ.**

දැනටමත් කයිවාරුකාරයන් විවිධ වර්ණයන්ගෙන් හැඩ ගන්වන ලද සැලසුම් ඇතුළත් ලිපි ගොනු දුසිම් ගණන් ඔබ අතට පත් කිරීමට ඇඟිලි ගණිනවා විය හැකිය. දැනටමත් ලබා දී තිබේ නම් අපි ඒ ගැන ද පුදුම නොවෙමු. මන්ද යත් මේ කයිවාරුකාරයන් ඒ තරම් කටින් බතල කොළ සිටුවීමට දක්ෂයන් බව අප දන්නා බැවිනි. මේ කයිවාරුකාරයන් පසුගිය දශකයක, දෙකක පමණ කාලය පුරාම කළේ ලාංකේය ක්‍රීඩාව තනිකරම බඩගෝස්තරවාදයක් කර ගැනීමය. ක්‍රීඩාවෙන් ජීවත්වන මේ පරපෝෂිතයන් ඉවත් කළ යුතුය.

කුණු වී ගඳ ගසන ආකල්පයන්ට තිත තැබිය යුතුය. ඔලිම්පික් පදක්කම් දෙකක්, ක්‍රිකට් ලෝක කුසලාන දෙකක්, බිලියඩ් සහ කැරම් ක්‍රීඩාවලින් දිනා ගෙන ඇති ජාත්‍යන්තර විජයග්‍රහණ දෙස විමසිලිමත් වන විට අද අපට සාග් කලාපයේ පදක්කමක් දිනා ගැනීමටත් මරාගෙන මැරෙන සටනක් දීමට සිදුව තිබෙන බව රහසක් නොවේ.

මේ වැරැදි සියල්ල නිවැරැදි කර ගත යුතුය. මෙතෙක් කාලයක් කාලයෙන් කාලයට පත්වූ ක්‍රීඩා අමාත්‍යවරු මේ බහිරවයන්ට සියුම්ව ගොදුරු වූ බව අපි දනිමු. නාමල් මේ පුහු ආටෝපවලින් වැඩ දමාගෙන ඉන්න බහිරවයන්ට ගොදුරු නොවන තාක් කල් ගමන පැහැදිලිය.

# ජාතික ක්‍රීඩා සභාවේ සුක්කානම මහේලට

## ක්‍රීඩා

බන්දුල ජයමාන්න
kreeda@lakehouse.lk

**ලාංකේය ක්‍රීඩාවේ දියුණුව, එහි ප්‍රතිපත්ති සහ ජාතියේ ක්‍රීඩා ප්‍රමිතිය හා ඒ ආශ්‍රිත යටිතල පහසුකම් නඟා සිටුවිය හැකි ආකාරය පිළිබඳ ක්‍රීඩා අමාත්‍යවරයාට උපදෙස් දීම 1973 වසරේ ක්‍රීඩා පණත (25 වන වගන්තිය 4 වන වගන්තිය) යටතේ වසර දෙකක කාලයක් සඳහා පත් කරනු ලබන අභිනව ජාතික ක්‍රීඩා සභාවේ සභාපතිධුරය ශ්‍රී ලංකාව බිහි කළ විශිෂ්ට ක්‍රිකට් ක්‍රීඩකයකු වන මහේල ජයවර්ධනට පවරා තිබේ.**

ක්‍රීඩා අමාත්‍යවරයාගේ නියමය පරිදි නව ක්‍රීඩා පනතක් හා ජාතික ක්‍රීඩා ප්‍රතිපත්තියක් සැකසීමට අවශ්‍ය මූලික කටයුතු සම්පාදනය කිරීම, ඉලක්කගත ජයග්‍රහණ සඳහා සැලසුම් සකස් කිරීම, ක්‍රීඩකයින් වෘත්තීමය තත්ත්වයකට නන්වාලීම උදෙසා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම, ජාතික සංචිත තේරීමේ දී අමාත්‍යවරයාට අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීම, පාසල් ක්‍රීඩා සහ අධ්‍යාපන අමාත්‍යාංශය හා එක්ව පාසල් ක්‍රීඩා නැංවීමේ සැලැස්මක් සකස් කිරීම, ක්‍රීඩාවේ පාරිශුද්ධභාවය සහ විනිවිදභාවය සුරකෙන ආකාරයෙන් කටයුතු කිරීමට අවශ්‍ය වටපිටාවක් නිර්මාණය කිරීම, නව ප්‍රවණතාවන් හා ඊ-ස්පෝර්ට්ස් වැනි නව අංශ හරහා ක්‍රීඩා ආර්ථිකයක් ගොඩ නැඟීමට කටයුතු සම්පාදනය කිරීම යන කරුණු මූලික කර ගත් විශේෂ වැඩසටහන් සඳහා මග පෙන්වීමද ජාතික ක්‍රීඩා සභාවේ වගකීම් අතර වේ.ජාතික ක්‍රීඩා සභාව සඳහා අලුතින් පත් කරන ලද සාමාජික සාමාජිකාවන් ශ්‍රී ලංකාවේ ක්‍රීඩාව ශක්තිමත් කිරීම සඳහා එක්ව තිබේ.

නාමිකව උපදෙස් පමණක් ලබා දෙන ක්‍රීඩා සභාවක් වෙනුවට වඩාත් ශක්තිමත් කාර්යශූර, ශ්‍රී ලංකාවට වඩාත් ඵලදායී ප්‍රතිපල හා ජයග්‍රහණයන් අත්කරදීම උදෙසා, ක්‍රියාකාරී බලතල සහිත ජාතික ක්‍රීඩා සභාවක් ලෙස අභිනව පත් කළ ජාතික ක්‍රීඩා සභාවට කටයුතු කළ හැකි බව අමාත්‍යවරයා පෙන්වා දෙයි.

නව ක්‍රීඩා සභාව බහුවිධ අංශවල පළපුරුදු වෘත්තිකයන්ගෙන් සමන්විත වන අතර, ඔවුන් සිය වෘත්තිය පුරා ශ්‍රී ලංකාවේ හා ජාත්‍යන්තරව ශක්තිමත් ක්‍රීඩා සංස්කෘතියක් නැවත ගොඩනැංවීම හා පුනර්ජීවනය කිරීම සඳහා අඛණ්ඩව දායක වූ අයවෙති.



### මහේල ජයවර්ධන
### සභාපති (ක්‍රිකට්)

මහේල ජයවර්ධන යනු ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාවේ හුරු පුරුදු මුහුණක් මෙන්ම ඔහුගේ නායකත්ව දක්ෂතා නිසා ජනප්‍රිය වූ ක්‍රීඩකයෙකි. ඔහුගේ නායකත්වය යටතේ ශ්‍රී ලංකාව 2007 අයි. සී. සී. එක්දින ලෝක කුසලාන අවසන් මහා තරගයට සුදුසුකම් ලැබීය. මහේල මේ වන විට ඉන්දීය ප්‍රිමියර් ලීග් (අයි.පී.එල්) කණ්ඩායමක් වන මුම්බායි ඉන්ඩියන්ස් ප්‍රධාන පුහුණුකරුවාය. එමෙන්ම අයි. පී. එල්. ද්විත්ව ශූරතා මහේලගේ පුහුණුව යටතේ මුම්බායි ඉන්ඩියන්ස් හිමිකර ගත්තේය.



### රොහාන් ප්‍රනාන්දු
### (ප්‍රධාන විධායක නිලධාරී - ශ්‍රී ලංකා ටෙලිකොම්)

ශ්‍රී ලංකා ටෙලිකොම් නව සභාපතිවරයාය. හෙතෙම ප්‍රකට තේ අපනයනකරුවකු වන අතර හෙළිදිව් තේ සන්නාමයේ නිර්මාතෘවරයා ද වේ. ඔහු ශ්‍රී ලංකා තේ අපනයනකරුවන්ගේ සංගමයේ හිටපු සභාපති මෙන්ම වත්මන් කමිටු සාමාජිකයෙකි. රොහාන් ශ්‍රී ලංකා ආධුනික ඔරු පැදීමේ සංගමයේ සභාපතිවරයාත් වේ.



### යශ්වන්ත් මුත්තෙට්ටුවගම
### (පැසිපන්දු)

පැසිපන්දු හෙවත් බාස්කට්බෝල් ක්‍රීඩාවේ ප්‍රකට චරිතයකි. අන්තර්ජාතික පැසිපන්දු සම්මේලනයේ (ෆීබා) තාක්ෂණික මඩුල්ලට පත්වූ ළාබාලතම ආසියාතිකයාය. හෙතෙම 32 හැවිරිදිය.



### සංජීව වික්‍රමනායක
### (ඊවයිස් - සභාපති)

තොරතුරු තාක්ෂණයට අදාළව පුරා දශක තුනකට වඩා අත්දැකීම් තිබෙන සංජීව ඊවයිස් සහ ටොපැන් සමාගම්වල සභාපතිවරයාය. ඔහුට ක්‍රීඩාව කෙරෙහි දැඩි උනන්දුවක් තිබේ. ගතවූ දශක කිහිපයක කාලය තුළ දී දේශීය ක්‍රීඩාවේ දියුණුවට මහඟු සේවයක් ඔහු කර තිබේ.



### රුවන් කෑරගල
### (අධ්‍යක්ෂ - මාස්)

රුවන් හාවඩ් ව්‍යාපාර පාසල සහ ඉන්සීඩ් විශ්වවිද්‍යාලයෙන් විධායක සහ වෘත්තීමය සුදුසුකම් ලැබීය. ආසියානු බොක්සිං සංගමයේ සහතිකපත් ලාභී ජාත්‍යන්තර බොක්සිං පුහුණුකරුවෙකි. එමෙන්ම ශ්‍රී ලංකා බොක්සිං සංගමයේ භාණ්ඩාගාරික ලෙසටත් ක්‍රියා කර තිබේ.




### ලුතිනන් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා
### (ශ්‍රී ලංකා යුද්ධ හමුදාපති)

ඔහු වත්මන දී වැඩ බලන ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදාපතිවරයා ලෙසට මහඟු කාර්යභාරයක් ඉටු කරයි. එමෙන්ම ජාතික ක්‍රීඩා තේරීම් කමිටුව, ආරක්ෂක සේවා හොකී කමිටුව සහ යුද්ධ හමුදා හොකී කමිටුවලත් සභිපතිවරයාය.



### කස්තූරි විල්සන්
### (ප්‍රධාන විධායක නිලධාරිනි - හේමාස්)

කස්තූරි ඇන්ජෙලා විල්සන් ප්‍රකට ව්‍යාපාරික කතකි. එමෙන්ම ක්‍රීඩාවටත් විශාල දායකත්වයක් ලබා දී ඇත. ජාතික දැල්පන්දු සහ පැසිපන්දු කණ්ඩායම්වල ක්‍රියාශීලී සාමාජිකාවකි. එහි දී 1989 වසරේ දී ජාතික කාන්තා පැසිපන්දු කණ්ඩායමේ නායකත්වයත් දැරුවාය.



### කුමාර සංගක්කාර
### (ක්‍රිකට්)

ක්‍රිකට් ක්‍රීඩා ඉතිහාසයේ විශිෂ්ටතම පිතිකරුවෙක් බවට සංගක්කාර සැළකෙයි. 2012 අයි.සී.සී. වසරේ ක්‍රිකට් ක්‍රීඩකයා වූයේත් සංගාමය. හිටපු ශ්‍රී ලංකා ක්‍රිකට් නායකයෙකි. 2019 වසරේ දී සුප්‍රකට එංගලන්තයේ මාර්ලිබෝර්න් ක්‍රිකට් සමාජයේ (එම්. සී.සී.) සභාපති ධුරයට පත් විය. 1787 - වසරේ දී පිහිටු වූ මෙම සමාජයේ සභාපති ධුරයට පත් වූ බ්‍රිතාන්‍ය නොවන ප්‍රථමයාත් සංගා වේ.



### සුපුන් වීරසිංහ
### (ප්‍රධාන විධායක නිලධාරී - ඩයලොග්)

ඩයලොග් ආෂියාටා පී.එල්.සි. සමාගමේ ප්‍රධාන විධායක නිලධාරී සහ අධ්‍යක්ෂවරයකු ද වේ. ශ්‍රී ලංකාව තුළ ඊ - ක්‍රීඩාව ජනප්‍රිය කිරීමට හෙතෙම විශාල දායකත්වයක් ලබා දෙයි.



### රාජිත අම්පෙමොහොට්ටි
### (පැරාලිම්පික්)

මේජර් ජෙනරාල් රාජිත 1990 වසරේ දී යුද ක්‍රියාන්විතයේ දී ආබාධයට ලක් විය. එසේ වුවත් පසුව විවිධ ක්‍රීඩා රැසකින් ඔහු සිය දක්ෂතා දැක්වූයේය. ඊට වෙඩි තැබීම, මලල ක්‍රීඩා, බැඩ්මින්ටන්, මේස පන්දු, දුණු විදීම, රෝද පුටු මැරතන් වැනි ක්‍රීඩා අයත්ය. මේ වන විට ඔහු ශ්‍රී ලංකා පැරා ඔලිම්පික් කමිටුවේ සභාපතිවරයාය.



### ජුලියන් බෝලිං
### (පිහිනුම්)

ජාත්‍යන්තර තරගවල දී සුපිරි දස්කම් දැක්වූ බෝලිං ශ්‍රී ලංකාව බිහි කළ විශිෂ්ටතම පිහිනුම් තරුවයි. 1984 - 91 අතර කාලය තුළ දී ඔහු දකුණු ආසියානු ක්‍රීඩා උලෙළවල්හි දී හිමිකර ගත් රන් පදක්කම් ගණන 15කි. එමෙන්ම ඔහු ඔලිම්පික් ක්‍රීඩා උලෙළවල් ත්‍රිත්වයකටත් සහභාගි විය. තවද 2010 වසරේදි බෝලිං ජාතික ක්‍රීඩා සභාව නියෝජනය කළේය.



### රොවේනා සමරසිංහ
### (ක්‍රීඩා නීතිඥ)

පාපන්දු, ජාත්‍යන්තර මලල ක්‍රීඩා, මෝටර් ක්‍රීඩා මෙන්ම ඔලිම්පික් ක්‍රීඩා සම්බන්ධයෙන් දශකයටත් වැඩි කාලයක් ක්‍රීඩා නීතිය සම්බන්ධයෙන් අත්දැකීම් සහිත නීතිවේදිනියකි.



### ඒ.ජේ.එස්.එස්. එදිරිසූරිය
### (ක්‍රීඩා අධ්‍යක්ෂ ජෙනරාල්)

වෘත්තියෙන් නීතිවේදියකු වන අමල් එදිරිසූරිය මේ වන විට ක්‍රීඩා අධ්‍යක්ෂ ජෙනරාල් ලෙසට කටයුතු කරයි. ඔහු කැලණිය විශ්වවිද්‍යාලීය උපාධිධාරියෙකි. එමෙන්ම රාජකීය ආදි සිසුවෙකි. 2000 වසරේ සිට හෙතෙම ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිරතව සිටියි.



### ඩිලන්ත මාලගමුව
### (මෝටර් රථ ක්‍රීඩා)

ලොව විවිධ රටවල පැවැති තරගවලට සහභාගි වෙමින් ජයග්‍රහණ රැසක් අත්කර ගත් විශිෂ්ටතම ක්‍රීඩා තරුවකි. මෝටර් රථ ක්‍රීඩාවෙන් ලෝක ශූරතාවක් හිමි කර ගත් ප්‍රථම සහ එකම ශ්‍රී ලාංකිකයා ඩිලන්තය.



පුංචි පැංචියන් සඳහා
පත්තර මහගෙදරින් පිදෙන
අධ්‍යාපන තිළිණ
LAKE HOUSE
අතුරු මිතුරු
Athuru Mithuru அதுருமிதுரு
මුතු ඇහුර 1 ශ්‍රේණිය දරුවන් සඳහා
මුතු ඇහුර 2 ශ්‍රේණිය දරුවන් සඳහා
මුතු ඇහුර 3 ශ්‍රේණිය දරුවන් සඳහා
මුතු ඇහුර 4 ශ්‍රේණිය දරුවන් සඳහා
ඔබේ පිටපත
අද ම වෙන්කරවා ගන්න
විදුනැණ
නිසැක ශිෂ්‍යත්ව ජය
5 ශිෂ්‍යත්ව
පත්තර මහගෙදරින්
පිදෙන
අධ්‍යාපන තිළිණ
10 - 11 ශ්‍රේණි සඳහාමයි
සා/පෙළ
සිත්මිණ
උසස් පෙළට නියත වරම්
ඔබේ පිටපත අද ම වෙන්කරවා ගන්න


ගඟ දිගේ උරුමය
අලුත් ගඟකින්, අලුත් ඇහැකින්, අලුත් පරපුරට
සිව් මහා ගංගාවන්ගේ ශෘංගාර ගංගාව
උකුල පළල් වූ ගංගාවී
කළු ගඟ දිගේ
ජැක්සන් ඇන්තනීගේ අලුත්ම සංචාරය
සෑම සෙනසුරාදාවකම රාත්‍රී 7:00 ට ස්වර්ණවාහිනියෙන්
swarnavahini.lk
Swarnavahini
Swarnavahini




## මනාලයෝ


කොළඹ බොදු ගොවි වයස 26 උස 5' 7'' කඩවසම් කොළඹ ප්‍රසිද්ධ පාසලක උගත් කළමනාකරණ උපාධිය අවසන් කර ඇත. පවුලේ එක් පිරිමි සහෝදරයෙක් සිටී. දෙමාපියන් ප්‍රසිද්ධ ව්‍යපාර කරන අතර මොහු එම ව්‍යාපාරවල කළමනාකාර අධ්‍යක්ෂකවරයෙකු ලෙස කටයුතු කරමින් තමාගේම පිළිගත් ව්‍යාපාරයක්ද කරනු ලබයි. නිවාස වාහන සියලු දේ හිමිය. මොහු ආගම දහමට ඉතා ලැදි සුරා සූදුවෙන් තොර අයෙකි. අප සොයනුයේ උගත් ගුණවත් ආගම දහමට ලැදි අයෙකි. ආගම් කුලභේද නොසලකන අතර, කුජ රවි 8ට ගැළපෙන අයෙක් නම් වඩාත් සුදුසුයි.

**C/O SI 49507**
**සිළුමිණ බාරේ,**
**ලේක්හවුස්, කොළඹ.**









# සංචාරක කර්මාන්තයේ ආයෝජන අවස්ථාවක්

## සංචාරක හා ගුවන් සේවා අමාත්‍යාංශය

## ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය
## සංචාරක සංවර්ධනය සඳහා ඉඩමක් බදු දීම

**සංචාරක සංවර්ධන කර්මාන්තය ලෝකයේ විශාලතම කර්මාන්තවලින් එකක් වන අතර, එහි 2018 වර්ෂය සඳහා වන ගෝලීය ආර්ථික දායකත්වය ඇමෙරිකානු ඩොලර් ට්‍රිලියන 8.8 ට වැඩියි. 2018 වර්ෂයේදී ලෝකය පුරා ජාත්‍යන්තර පැමිණීම 6% ක් දක්වා වර්ධනය වූ අතර, එය සංචාරකයන් බිලියන 1.4 විය. 2018 වර්ෂයේදී ශ්‍රී ලංකාවට පැමිණි ජාත්‍යන්තර සංචාරකයන්ගේ සංඛ්‍යාව මිලියන 2.3 වන අතර, සංචාරක සංවර්ධනය සඳහා වන හැකියාව ශ්‍රී ලංකාවේ වැඩි වෙමින් පවතී.**

**දිවයිනේ සංචාරක සංවර්ධනය සඳහා වගකිව යුතු ජාතික සංචාරක සංවිධානය ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියයි. (SLTDA), සංචාරක නිෂ්පාදන සංවර්ධනය සඳහා මහජනතාවට බදු දීම සඳහා රජයේ ඉඩම් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය වෙත පවරා ඇත. බෙන්තොට, වරාහේන පිහිටි "අවන්හල" ඉඩමත් සංචාරක සංවර්ධනය සඳහා යෝජිත එක් ඉඩමකි. එම "අවන්හල" ඉඩම උසස් තත්ත්වයේ අවන්හලක් සහිත සංචාරක විනෝදකාමී ප්‍රදේශයක් ලෙස සංවර්ධනය කිරීම සඳහා සම්භාව්‍ය ආයෝජකයන් වෙතින් යෝජනා කැඳවන්නට ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය අපේක්ෂා කරයි.**

**සංවර්ධනය කිරීමට අපේක්ෂා කරනු ලබන ඉඩමේ ප්‍රමාණය අක්කර 0 රූඩ් 2 පර්චස් 2.07 ක් වන අතර උසස් තත්ත්වයේ මුහුදු ආහාර අවන්හලක් සහිත වන අතර, එහි ළමුන් සඳහා ක්‍රීඩා කිරීමේ පෙදෙසක්, අමුත්තන් රැඳී සිටීමේ / අසුන් ගැනීමේ පෙදෙසක් සහ පොදු වැසිකිළිවලින් සමන්විත වේ.**

**වහලය, ඉහළින් පිහිටුවන ලද ජල ටැංකිය යනාදිය ඇතුළුව ගොඩනැගිල්ල සඳහා අවසර දෙනු ලබන උපරිම උස, බිම් මට්ටමේ සිට මීටර් 10 (Ground + 1) නොඉක්මවිය යුතුය.**

බදු කාලය අලුත් කිරීම සඳහා වන විධිවිධාන සහිතව මූලිකව, ඉඩම බදු දෙනු ලබන කාලසීමාව වසර (10) දහයකි. වාර්ෂික බදු කුලිය මුළු ඉඩමේ වටිනාකමින් 4% ක් වන අතර, එය රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව මගින් ලබාගැනේ. ව්‍යාපාරයේ පැවැත්ම සහ බදු ලබා දුන් අරමුණ උදෙසා ඉඩම් භාවිතය සලකා බලා බදු කාලය අලුත් කිරීමේ ක්‍රියාවලිය පිළිබඳව තීරණය කරනු ලැබේ.

**යෝජනා ඇගයීමේ නිර්ණායකයන් පහත දක්වා ඇති පරිදි වේ.**

01. සමාන උසස් තත්ත්වයේ නිෂ්පාදන හා සැසඳීමේ නිර්මාණාත්මක භාවය
02. මධ්‍යම හා ඉහළ පංතියේ ආගන්තුකයන් / සංචාරකයන් සඳහා වන වෙළඳපොළ ඉලක්ක කිරීම සඳහා වන සංකල්පයේ අද්විතීය භාවය
03. ආයෝජනයේ වටිනාකම සහිත ව්‍යාපාරික යෝජනාව
04. සංචාරක අංශයේ මූල්‍ය විශ්වසනීයත්වය
05. සංචාරක අංශය පිළිබඳ කලින් පළපුරුද්ද
06. පරිසරය හා අනුකූලතාවය
07. පුනර්ජනනීය බලශක්තිය හා ප්‍රතිචක්‍රීකරණය කළ ජලය යනාදිය භාවිත කිරීමේදී නිෂ්පාදනයේ තිරසාර බව.

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් මූලික ඇගයීම සඳහා සංකල්ප යෝජනා ඉදිරිපත් කරන ලෙස සියලුම දේශීය හා ජාත්‍යන්තර ආයෝජකයන් වෙත ඇරයුම් කරයි. විස්තරාත්මක ව්‍යාපෘති යෝජනාවක් ඉදිරිපත් කරන ලෙස තෝරාගනු ලබන ආයෝජකයාගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

උනන්දුවක් දක්වන ආයෝජකයින් කාර්යාල වේලාවන් තුළදී 0112348887 හෝ 0112426800 – දිගුව 409 හරහා සහකාර අධ්‍යක්ෂ නිකේතන පාලන අමතන්න.

පිටපතක් සහිත මුද්‍ර තබන ලද යෝජනා දින 30 ක් තුළ පහත සඳහන් ලිපිනය වෙත ලියාපදිංචි තැපැල් මගින් එවීමට හෝ අතින් ගෙනැවිත් භාර දීමට හැකිය. යෝජනා බහා එවනු ලබන කවරයේ වම් පස ඉහළ කෙළවරේ "**අවන්හල / බෙන්තොට**" යනුවෙන් සඳහන් කළ යුතුය. මේ සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසාන තීරණය වේ.

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය,**
**අංක 80, ගාලු පාර, කොළඹ 03.**


වර්ෂ 2020ක් වූ අගෝස්තු මස 23 වැනි ඉරිදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.